©

මෙම කෘතිය කතුවරයාගේ පූර්ණ අනුමැති සහිතව
sinhalaebooks.com වෙබ් අඩවිය විසින්
පාඨකයන්ගේ කියවීම උදෙසා නොමිලේ බෙදාහරින ලද කෘතියකි.

Published with Author Consent.

# 01 කොටස

මිදුලටම තියෙන්නේ එකම ගහයි... මගේ වෙලාවට ඒක ජම්බු ගහක්... මිදුලක් කිව්වට ඇති මිදුලකුත් නෑ... යන්තම් පොඩි තීරුවක් පොලොව පේනවා...

ජම්බු ආච්චාරුවක් හදාගෙන සෙටිය උඩින් වාඩි උනා කකුල් දෙකත් උඩට අරන්... ජන්ගල් බුක් යනවා ටීවී එකේ... කටහඩවල් ටික වෙනස් කරල මෙලෝ රහක් නෑ. වෙන බලන්න දේකුත් නැති නිසා ඒක බලන්න පටන් ගත්තා...

මං ආරාධ්‍යා සේමිනී සෙනෙවිරත්න.. වයස 21 යි... ගෙවල් තියෙන්නේ බිබිලේ.....දැන් අයියත් එක්ක පානදුරේ ඉන්නේ... අම්මයි තාත්තයි දෙන්නා ඉන්නෙ බිබිලේ.... දෙන්නම ගමේ ඉස්කෝලෙ ටීචර්ස්ලා... කෝස් එකක් කරන්න මෙහෙ ආවේ... කොහෙද කැම්පස් යන්න ලකුනු මදි උනානේ....

දොරට ගහන සද්දෙට මං ගැස්සිලා මේ ලෝකෙට ආවේ... මා ප්‍රියාදර සහෝදරයානන් වැඩලද කොහෙද... ඒත් ඇයි මෙච්චර කලින් අද... හෙමීට දොර පොඩ්ඩක් ඇරලා බැලුවා අයියමද කියලා.... කියන්න බෑනේ කවුරුහරි මාව උස්සන් යන්න ආවොත්... තාත්තිගේ සුදු දෝනි පව් හ්ම්ම්..

නෑ නෑ අය්යන්ඩියම තමයි... ඒත් දෙර ඇරියා විතරයි මට දවල් තරු පෙනුනා... අයියට පිටිපස්සෙන් තවත් කවුද්ද් අයියා කෙනෙක්. මං එක පාරටම මගේ ඇග දිහා බලලා ජම්බු පිගානත් එක්ක උසේන් බෝල්ට් වගේ කාමරේට පැනලා දෙර වහගත්තා... මට ශුවර් දෙන්නම කට ඇරන් බලන් ඉන්න ඇති මොකද උනේ කියල...

ජම්බු පිගාන ඇද උඩින් තියලා කන්නාඩියෙන් බැලුවේ මං දිහා... විලි ලැජ්ජාවේ සන්තෝසෙ බෑ මං ඇදන් හිටියේ වියතක් විතර දිග ශෝටා කැල්ලකුයි ස්කිනර් එකකුයි.... කොන්ඩේ පිස්සෙක් ගේ වගේ... අයියා විතරනේ ඉන්නේ ඉතිම් මට ඔවා ගානක් නෑ... එක්කෝ මේ මෝඩයා කලින් කියන්න එපැයි...

"ආරු.. ආරු.. දෙර අරින්න මොකද උනේ.... "

අයියා දෙරට තඩි බානවා.. දන්නෙම නෑ තොත්ත බබා මොකද උනේ කියලා....

මං විලිබ ලගටම දිග ඉරි කලිසමක් ඇදලා ටී ශර්ට් එකකුත් ඇදගත්තා ඇදන් හිටපුවා උඩින්ම... ආපු මොකා හරි ඉක්මනට යයි නේ එතකොට තියෙන්නේ ඔය දෙක කොහෙන්හරි විසී කරලා දන්න.. සරලයි පහසුයි... කොන්ඩෙත් රවුමට අබරලා ගහගත්තා කට්ටක්.. ඊට පස්සේ දෙරත් ඇරන් සාලෙට ගොඩ බැස්සේ ඩිස්නි ප්‍රින්සස් කෙනෙක් වගේ සාන්ත දන්න විදිහට...

අයියා හිසේ සිට පාදන්තය දක්වා බැලුවේ නිකම් පිටසක්වල ජීවියෙක් දිහා බලනවා වගේ... මං දත් තිස්දෙකම පේන්න විරිත්තුවා...

"නිතිනු... මේ මගේ නංගි ආරු.. ආරු මේ මගේ හොදම යාලුවා නිතිනු.."

මං කට ඇරන් බැලුවේ අයියා දිහා... යකෝ මෙච්චර කල් නිතිනු කියල එකෙක් ගැන අහලවත් තිබ්බෙ නෑ මෙන්න මෙයා දැන් කියනවා හොදම යාලුවලු. ඕනෙ මගුලක් කියලා බැලූවේ නිතිනු කියන ඩයල් එක දිහා... අයියට දපු ඒ හිනාවමම එයාටත් දැම්මා..... හෙපෝ දපු මෝඩකම කියලා හිතුනා... මං දිහා බැලුවේ නිකම් කැරපොත්තෙක් දිහා බලනවා වගේ... මූනේ ලේ කදුලක් නෑ... උදේක දැක්කොත් කැදත් නෑ...

"ආරු තේ එකක් හදගෙන එනවකෝ... "

හිනා උනාට හිනාවෙන්න දන්නේනෑ.. තව තේත් හදපන්කෝ මොනා කරන්නද.. ගිහින් තේ දෙකක් හදලා ස්ටූල් එක උඩින් තියලා කාමරේට ආවා...

ඇදෙන් හාන්සි වෙලා ෆෝන් එක ගත්තා... එෆ් බී පැත්තේ යන්න... මොන එහෙකටද මන්ද අර හෝහපුටාගෙ මූනම මැවිලා පේනවා... මොනා උනත් අමුතු කියුට් ලුක්

එකක් තිබ්බා... පොඩ්ඩක් හිතා උනා නම් මාර හැන්ඩ්සම් ඇති.

"ආරු ආරු මොන විකාරද තමුන් මේ හිතන්නේ.... විකාරෙන්ද... "

මං ඔලුවට එකක් ගහගෙන පියවී සිහියට ඇවිත් එෆ් බී නවල් එකක් කියවන්න පටන් ගත්තා... මාරම ලස්සන කතාවක්... මේ කියවන්නේ කී වෙනි වතාවද මන්ද.. ඒ තරම් ඇඩික්ට් වෙලා ඒ කතාවට... මගේ වැඩේ නවල් එකක් කියවලා මනෝ පාරක් ගහන් ඉන්න එක තමයි... දවසින් දවස එක එක නවල් වල කොල්ලෝ ගැන හිතලා හීන මවනවා හැබැයි හැබෑ ලෝකෙන් නම් මට කොල්ලෝ එපා... කෙලින්ම තටු කපලා දැම්මා වගේ තමයි... ඉතින් සින්ගල් ලයිෆ් එක මට හොඳයි...

මගේ මනෝ ලෝකේ බිඳගෙන අයියා කාමරේට ආවා...

"ආරු... අර අම්මලා ආවම ඉන්න කාමරේ පොඩ්ඩක් අස් කරන්නකෝ.. "

"ඒ මොකෝ අම්මලා එනවා කිව්වද අයියා.. ඒත් තාම නිවාඩු නෑනේ... මේ පෙබරවාරි මාසේ??

"නෑ නෑ බත් නිතිනු ටික දවසකට මෙහෙ ඉන්නවා... ඒකයි.."

"මොකක් අයියා ඔයාට පිස්සුද... එයා කොහොමද මෙහෙ ඉන්නේ... අනික මන් ගෑනු ළමයෙක් මන් කොහොමද පිට පිරිමියෙක් එක්ක එක ගෙදර ඉන්නේ... විකාරෙන්ද... "

"ඒ මගේ හොදම යාලුවා... ඒකා මොන වගේද කියල මන් දන්නවා..... ඌ එහෙම ජරා එකෙක් නම් මං මගේ නංගි ඉන්න තැන තියන්නේ නෑනේ... ඌට පොඩි ප්‍රශ්නයක් ඒ නිසා ලගින්ම ඉන්න ඕනේ... අනික ඌට කෙල්ලන්ව පේන්න බෑ... ඒ නිසා බය නැතිව ඉන්නවා... "

"ඒත් අයියා..... "

කොහෙද කියන්න කලින් ගියානේ.... දැන් ඉතින් මං විදවන්න ඕනේ.... කොච්චර ප්‍රශ්න තියනවද මට.... මගේ ජාතික ඇදුම වෙච්ච ස්කිනර් එකයි ශෝටයි අදින්න බෑ..., දෙන්නෙට වෙනුවට තුනකට උයන්න ඕනේ.... තව කොච්චර දේවල් තියේද? හයියෝ

පොඩ්ඩක් ඉන්න පොඩ්ඩක් ඉන්න මොකක්ද ඒ කෙල්ලන්ව පේන්න බෑ කිව්ව කතාව... බැරි වෙලාවත් එයා... එහෙම කෙනෙක් ද... ඒව්.. අපරාදේ අර හැන්ඩ්සම් මූන... ඒත් ඇයි එයා අපේ අයියත් එක්ක ඉන්නේ අපේ අයියත් එහෙමද අනේ දෙවියනේ අපේ අම්මගේ සුදු පුතා... තාත්තිගේ පරම්පරාව ගෙනියන්න ඉන්න අවසානයා...

ආරු ආරු මොනාද මේ උබ හිතන්නේ.... ගිය සතියෙත් එයා මගේ යාලුවෙක්ට පැනි හැලුවේ... එහෙම නැතුව ඇති.... ඒත් බැරි වෙලාවත් එහෙම උනොත් කමක් නෑ මං ඉන්නවනේ පරම්පරාව ඉස්සරහට ගෙනියන්න.

මං එක එක විකාර හිත හිතා කාමරෙන් එලියට ආවේ අනිත් කාමරේට යන්න... අර අයියා වැලමිට කකුල් දෙකේ තියන් අත් දෙකේ මූන ගහන් ඉන්නවා... අයියා එයාගේ පිටට තට්ටු කරනවා..

ඇත්තටම ප්‍රශ්නයක් ද කොහෙද... නැත්තම් කොල්ලෙක් ඔහොම ඉන්නේ නෑනේ... පවු..

ගෙදරටම තියෙන්නෙ කාමර තුනයි... ආයෙ සාලෙයි කෑම කාමරෙයි කුස්සියයි... ඇටෑච් බාත් රූම් නෑ එක බාත්‍රූම් එකක් තියෙන්නේ.. මගේ කාමරේ තියෙන්නේ කෑම කාමරේ ලග... අයියගේ කාමරෙයි අනික් කාමරෙයි තියෙන්නේ එක ලග....

මං ඒ රූම් එකට ගිහින් පොඩ්ඩක් අස් කරලා දැම්මා..... අස් කරා කිව්වට බෙඩ් ශීට් මාරු කරලා අතුගාන්න විතරයි තිබ්බේ... ඒ ඔක්කොම කරලා ආවේ කුස්සියට... දැන් ඉතිම් උයපන්කෝ තුන්දෙනෙක්ට... උයන්න දෙයක් තේරෙන්නෙත් නෑ... වෙනදනම් මොනා හරි දෙයක් උයනවා.. මං මොනා ඉව්වත් අයියා සද්ද නොකර කනවා... පිට මනුස්සයෙක් ඉද්දි එහෙම බෑනේ...

ෆ්‍රිජ් එක ඇරලා බැලුවා..... චිකන් තියනවා එහෙනම් චිකන් උයලා පරිප්පු හදමු වැඩේ ශේප්... ෆෝන් එක අරන් ඩාන්ස් කරන්න පුලුවන් සින්දුවක් දාගෙන ඉයර්ෆෝන් එක ගහගෙන ෆෝන් එක කලිසමේ සාක්කුවට දාගත්තා... දැන් අවුලක් නැතිව වැඩේ කරන්න පුලුවන්... මං සාමාන්‍යයෙන් වැඩක් කරන වෙලාවට ඩාන්ස් කරන්න පුලුවන් සින්දුවක් දාගන්නවා... එතකොට හැමදේම අමතක් කරලා ඩාන්ස් කර කර වැඩේ කරන්න පුලුවන්... දන්නෙත්නෑ වැඩේ ඉවරයි... මේ මොහොතේ සතුටින් ඉන්න ඕනේ.... තමන් දැනගන්න ඕනේ තැන මොකක් උනත් සතුටින් ඉන්න පුලුවන් විදිහට එතන හදාගන්න... මං නම් හිතන්නේ එහෙම...

පරිප්පු ටික සෝදලා තියලා පොල් ගාන්න ගත්තා... වෙනදනම් අයියා පොල් ගාලා දෙනවා... කොහෙද අද මේ හෝහපුටා ආවනේ.. ඒත් ඉතින් චිකන් කපන්න නම් අයියා එනකම් ඉන්න වෙනවා.. මං කැපුවොත් චිකන් එක්ක මිනීමසුත් කන්න පුලුවන්...

පොල් බෑයෙන් බාගයක් ගාද්දි ටිකිරිලියා සෝන්ග් එක යනවා... ඉතින් නටන්නේ නැතුව ඉන්නේ කොහොමද පොල් බෑයත් අතේ තියන්ම පොඩ්ඩක් කැරකිලා අනික් පැත්ත හැරෙද්දිම....

# 02 කොටස

අනික් පැත්ත හැරෙද්දිම අයියයි නිතිනු අයියයි එතන... ලැප්ජාව බාල්දියෙන් එකයි... මන් ඒ දෙන්නා දිහා බලන් හිටියා හිටපු විදිහටම.. ලැප්ජාවට ඇස්වලින් කඳුලුත් එනවා...

"ඒ ඒ මොකද මේ අඩන්නේ.. අය්යෝ ඕක මොකක්ද මෝඩ්... ආරු මොකද මේ අඩන්න එපා... "

අයියා මාව බදාගෙන ඔලුව අතගානවා....... ඒ උනාට ඒ මෝඩයා හිතාවෙනවා තාම මං අයියාගේ තුරුලෙ ඉන්න ගමන් බැලුවේ නිතින්නු අයියා දිහා... එයා නම් හිනාවෙන්නේ නෑ... ඒ නිසා මට පොඩි සහනයක් දැනුනා.. අනේ ඇත්තට මේ මනුස්සයා හිනාවෙන්න දන්නේ නැද්ද... එයා අපි දිහා බලන් හිටියේ දුකකින් වගේ... සමහරවිට එයාට පවුලේ අයව මතක් වෙන්න ඇති.... මතක් උනා නම් ගිහින් බලන එක නේ තියෙන්නේ.. මෙහෙ මොකට ඉන්නවද

ටික වෙලාවක් එහෙම්ම ඉදලා එයා බාත්‍රූම් එකට ගියා... බාත්‍රූම් එකට යන්න ඕනේ කුස්සියේ දොර පහුකරන්...

"අයින් වෙනවා අයින් වෙනවා.. අලි බබා.. එනවා මෙතන හුරතල් වෙන්න... "

"මං බබා තමයි... අම්මියි තාත්තියි කියන්නේ බබා කියලනේ හ්ම්ම්.. ඉන්නවකෝ මං තාත්තිට කියන්න බනිනවා කියලා...."

"කියල කොරය්.. මෙන්න මෙහෙ එනවා උයන්න... පරිප්පුද උයන්න යන්නේ.... "

"ඔව් පරිප්පු උයලා චිකන් හදමු..."

"දෙකක් මදිනේ ඕයි පිට මනුස්සයෙකුත් ඉන්නවා... "

"අනේ මේ ඔයාට ඕනේ නම් තව ඒවා උයා ගන්න මට නම් බෑ... එයාට කන්න බැරි නම් නිකන් ඉන්න කියන්න"

"එයාලා අපි වගේ නෙවෙයි නංගා ගොඩක් සල්ලි තියන මිනිස්සු... ඉතිම් ඌට එහෙම කන්න දෙන එක හරි නෑනෙ... ඔයා ඉන්නකෝ මං තව මොනාහරි හදන්නම්..."

අයියා එහෙම කිව්වාම නම් මට දුක හිතුනා... පව් එයා... උදේ ඉදලා වැඩකරලා මහන්සි වෙලා ඇවිත් උයන්නම් කියන්නේ පුලුවන් කමකට නෙවෙයිනේ.. මාව මහන්සි කරන්න බැරි නිසා...

" ඔයා චිකන් ටික කපලා පොල්ගාලා දෙන්නකෝ අලබැදුමකුත් හදලා පපඩම් බදිමු... එතකොට හරිනේ..."

"ඔයාට පුලුවන්ද නංගා... කවදාවත් ඔච්චර ගොඩක් හදලා නෑනේ... "

"වෙය්ට් ඇන්ඩ් වොච් බ්‍රදර්... මේ වෙෆ් ආරූ අද හදන ඩිනර් එක ගත්ත කෙනෙක් ආයේ පබලිස්ගේ කෑමවත් රහයි කියන එකක් නෑ... "

මං කිව්වේ දබර ඇගිල්ලයි මැද ඇගිල්ලයි මගේ ඇස් දෙක ලග ඉදලා එයාගේ ඇස්ලගට කරලා කොලර් එක උස්සන ගමන්... ඇත්තටම කිව්වොත් කොලර් එකක් තිබ්බේ නෑ... ටීශර්ට් එකේ කර තමයි ඉස්සුවේ අයියා හිනාවෙවී මගෙ කොන්ඩේ අවුල් කරා....

කොහොමහරි කෑම ටික හදලා ඉවර වෙද්දි 8 ත් පහු වෙලා... කෑම ටික මේසෙට තියලා ඉවරවෙලා වොශ් එකක් දාගන්න ගියා... දාඩිය බේරෙනවා... කවදා පුරුදු දේවල්ද කරේ....

මං ආයේ කෑම මේසෙට එද්දි අයියා තිනිනු අයියා එක්ක වාඩිවෙලා එයාට බත් බෙදනවා... ඒකට නම් මට ඉරිසියා හිතුනා... මාත් අයියා ලගින්ම වාඩි වෙලා පිගාන අරන් එයාට දුන්නා....

"මේ මොකෝ..."

"මටත් බත් බෙදලා ඕනේ"

අයියා හිනාවෙවී බත් බෙදනවා... මං ගෙදර බාලයා නිසා අම්මගෙයි තාත්තගෙයි අය්යගෙයි ආදරේ මදි නොකියන්න ලැබුනා... ඒත් මෙහෙ ආවට පස්සේ අයියා විතරක් ඉන්න නිසා එයාගේ ආදරේ මට ගොඩාක් ඕනේ.... කාත් එක්කවත් ඒක බෙදාගන්න කැමති නෑ මං..... කාටහරි ඒක විහිලුවක් බොලද දෙයක් වෙන්න පුලුවන් ඒත් ඒ මගේ හැටි... අයියා ඒ ගැන දන්න නිසාමයි මුකුත් නොකියා බත් එක බෙදලා දුන්නා....

"නංගා තමයි අද ඉව්වේ... ඒ හින්ද අඩුපාඩුවක් තිබ්බොත් මුකුත් හිතන්න එපා... තාම පොඩි කෙල්ලනේ"

අයියා ඒ අයියට එහෙම කිව්වාම එයා මන් දිහා බැලුවේ නිකම් කීයටවත් වෙන්න බෑ වගේ බැල්මක්.. ඊට පස්සේ අයියා දිහා බලලා පොඩි හිනාවක් දැම්මා..... මං හිතන්නේ තොල් දෙක අංශකයක් හෙල්ලෙන්න නැතිව ඇති.... ඒකත් තප්පරයක්වත් තිබ්බේ නෑ... ඒත් විශ්වාස කරන්න ඒ මූනෙ ලස්සන මට අතට ගත්ත බත් කට ගිලින්නත් අමතක් උනා...

බත් කටවල් දෙක තුනක් කාලා එයා එක පාරට පුටුවෙන් නැගිට්ටා.... මමයි අයියයි කටත් ඇරන් බලන් හිටියේ

මොකක්ද උනේ කියලා.... බත් පිගාන එහෙම්මම තියෙද්දි කෑම කාමරේ තිබ්බ සින්ක් එකෙන් අතත් හෝදන් වතුරවත් නොබී කාමරේට ගිහින් දොරවහගත්තා...

ඒ වෙලාවේ නන් මට ගොඩක් දුක හිතුනා... ආසාවෙන් බලන් හිටියේ පලවෙනි වතාවට පිටකෙනෙක් මං හදපු කෑම කද්දී රසයි කියයි කියලා හිතාගෙන...

"ඇයි රස නැද්ද අයියේ.. ඒකද එයා කෑවෙ නැත්තේ....."

"අනේ නෑ ආරු.. කෑම ටික ගොඩක් රහයි පැටියෝ... ඒ අයියා මේ ටිකේ හොදින් නෙවෙයි ඉන්නේ... ඒ නිසා යන්න ඇත්තේ... "

අයියා වම් අතින් මගේ ඔලුව අතගාලා කෑම එක ඉක්මනට ඉක්මනට කෑවා..... එයාට අර අයියා ලගට යන්න ඕනේ උනත් එයා බත් එක නොකා ගියොත් මට දුක හිතෙයි කියල තමයි එයා ඉක්මනට කන්නේ... ඒක මට රහසක් නෙවෙයි.... අයියා ඉක්මනට කාලා ඉවරවෙලා අර අයියගේ කාමරේට ගියා...

මං සුසුමක් පිට කරලා කෑම ටික අස් කරා... බාගෙට කාලා දලා ගියපු පිගානත් අස් කරන්න ඕනේ මං..... අස් කරලා දලා කාමරේට ආවා... වෙනදනම් මේ වෙලාවට අයියා මාත් එක්ක ෆිල්ම් එකක් බලනවා.... නැත්තම් පොඩි චැට් එකක් දනවා... ඒත් අද කොහෙද යන එකෙක් නිසා

මං තනියම.. මට නිතිනු අයියා ගැන තරහක් ආවා...

ඒත් එක පාරටම මතක් උනේ එයාගේ හිනාව... ඒ තොල් කලු පාට වෙච්ච තොල් වල අතරින් පතර කලින් රෝස පාට ලස්සන දෙතොලක් තිබ්බ බවට නටබුන් තිබ්බා... සිගරට් බීලා තොල් කලු වෙලා ඇත්තේ... ඒත් ඔය කියන ප්‍රශ්නේ නිසා වෙන්න ඇති.... රැවුල කොන්ඩේ හරිම අපිලිවෙලයි... ඇත්තටම මොකක් වෙන්න ඇත්ද ඒ ප්‍රශ්නේ...

"ආරු ආරු මොකද මේ අදේ අනික් පැත්තට... හොදටම පරක්කුවෙලා... අයියා වැඩට යනවා... අර අයියත් යනවා. දෙරවහත් පරිස්සමෙන් ඉන්න..."

හීනෙන් වගේ මට ඇහුනා අයියා මොනාදෝ කියනවා.. ඔලුවත් අතගානවා වගේ දැනුනා.. හෙමීට ඇස් ඇරලා බලද්දී තමයි දැක්කේ උදේ වෙලා කියල... ඊයෙ රෑ කල්පනා කර කර ඉදලා ඇදේ අනික් පැත්තටම නින්ද ගිහින්...

නැගිටල වොශ් එකක් දත් කුස්සියට ඇවිත් බැලුවා..... ඊයේ උයපුවා තියනවා එහෙම්මම... කෑම ටික රත් කරලා ගත්තා... අයේ මොකට උයනවද... මං විතරනේ ඉන්නේ.

හැමදාම මං උදේට නැගිට්ටින්නේ අයියා යන්න ලෑස්ති වෙලා කාමරේට ආවම... ඒත් ඉතින් එයා ගියාම ආයේ 10 වෙනකම්වත් නිදාගන්නවා කෝස් එක නැති දවසට...

දවසම ඔහේ ගෙවලා දැම්මා..... ෆිල්ම් එකක් බල බල ඉදලා එහෙම්ම නින්ද ගිහින් ඇහැරුනේ අයියගේ කට සද්දෙට... අයියා එතනින් යනකොට නිදි විකාරෙන්ම අතින් අල්ලන් ඇදලා පුටුවෙන් වාඩි කරලා ඔඩොක්කුවෙන් ඔලුව තියාගත්තා...

"ඔලුව අතගානවකෝ මෝඩයෝ ඔලුව රිදෙනවා.... "

මං ඇස් පියාගෙනම දෙඩෙව්වා... මිහු ඔබ ඇමතූ ග්‍රාහකයා මේ මොහොතේ ප්‍රතිචාරයක් නොමැත...

ඇස් අරින්න හදද්දිම මෙන්න මේකා මාව තල්ලු කරා... ගෙම්බා පොලේ ගැහුවා වගේ මන් බිම... අනේ දෙවියනේ ඒ අයියා නෙවෙයි.... නිතිනු අය්යා.. මං උනේ මොනාද කියලා හිතාගන්න බැරුව එහෙම්මම හිටියා කොන්දත් අතගගා... අතත් බිම ඇනුනා...එයා ගියා නිකන් කුලප්පු වෙච්ච මීමෙක් වගේ... එතකොටම අයියා ආවා බාතෲම් එක පැත්තේ ඉදලා..

"ආරු මොකෝ මේ බිම.... වැටුනද බිමට"

අයියා කියන්නේ මාව නැගිට්ටවන ගමන්...

"අයියෙ මන් ඔයා කියල හිතලා අර අයියගේ ඔඩොක්කුවෙන් ඔළුව තියාගත්තා... එයා මාව බිමට තල්ලු කරා... අත ඇනුනා බිම... රිදෙනවා.... ඉහි ඉහි ඉහි"

මං අයියගේ තුරුලට වෙලා ඇඩුවා... ඇත්තටම මට ගොඩක් රිදුනා... වැටෙද්දිම අත තිබ්බ නිසා අත කෙටිලා වගේ... පුදුම නපුරු කමක් නේ තියෙන්නේ.. අපේ ගෙදරට ඇවිත් මටම පාට් දනවා...

"කෝ බලන්න ගොඩක් රිදෙනවාද"

අයියා එහෙම අහද්දිම වගේ යෙතිනු අයියගේ කාමරෙන් මොනාද පොලේ ගහනවා වගේ ඇහුනා...

මේ මනුස්සයට මොනා වෙලාද... තරහ යන්න ඕනේ මටයි ඒත් බඩු පොලේ ගහන්නේ එයා... යකූ අනික ඒ අපේ ගෙදර බඩු...

"එයාට මේ ගෙදරින් යන්න කියන්න... නැත්තම් මං යනවා අශීලාගේ ගෙදර... අම්මාවත් මට ගහලා නෑ... ඒත් මෙයා මාව තල්ලු කරලා දැම්මා..... මං හිතලා කරා යැය්... වැඩේමයි එයාගේ ඔඩොක්කුවේ වාඩි වෙන්න... රිදෙනවා අත ගොඩක්.. ඔයාටත් එයාව තමයි ලොකු මං අම්මට කියනවා.. "

මං පොඩි ලමයෙක් වගේ හයියෙන් අඩ අඩ කාමරේට ඇවිත් කොට්ටයක් බදාගෙන ඇඩුවා... අත හරවන්න බෑ රිදෙනවා.... එතකොටම කාර් එකක සද්දයක් ඇහුනා... අයියට කාර් එකක් නැති නිසා මට ඒ ගැන ගානක් ගියේ නෑ...

"ආරු.. පැටියෝ... අයියා දිහා බලන්නකෝ........ කෝබලන්න අත ගොඩක් රිදෙනවද... ඒ අයියට තියෙන්නේ ගෑනු ලමයෙක්ගේ ප්‍රශ්නයක්... ඒක නිසා එයා ගෑනු ලමයිට කැමති නෑ... හැමෝම එකවගේ කියලා හිතන්නේ.... ඒක නිසා එයාට තරහ යන්නැත්තේ... පවු ආරු එයා... යන්න කියන්න එපා... පොඩ්ඩක් මාව තේරුම් ගන්නකෝ... ඇයි අයියව අසරන කරන්නේ... ම්ම්ම් මං දෙපැත්තෙන් තැලෙනවා... ඒ මගේ හොදම යාලුවා... එයා ආයෙත් මොනාහරි කරගන්න හැදුවොත් මට කවදාවත් මගෙන්ම සමාවක් නැති වෙයි.. "

"අයෙත් කිව්වේ... ?? එයා කලින් පාරකුත් එහෙම මොනාහරි කරගන්න හැදුවද.. "

# 03 කොටස

"ඔව්... එයා එකපාරක් බෙල්ලවැල දාගන්න ගියා... "

අයියා ඒක කියද්දි නම් මට උඩගිහින් නැගිට්ටුනා...

"මොකක් ඈ.. ඈ..යි එයා එහෙම කරේ.... "

"ඒක දිග කතාවක් නංගි.. "
අයියා කිව්වේ සුසුමක් පිට කරන ගමන්...

"ඉතින් කියන්නකෝ.... "

"හපෝ තමුසෙටත් ඉතින් ඕපයක් නම් වෙන මුකුත් මතක නෑ... කෝ දැන් අතේ අමාරුව..."

අයියා මගේ නහය මිරිකන ගමන් කියන්නේ...
මං පැන්නා එයාගේ ඔඩොක්කුවට.... ඔඩොක්කුවෙන් ඔලුව තියාගෙන මං හරිබරි ගැහිලා දිගැරුනා කතාව අහන්න...

" කියන්න බලන්න දැන් කතාව. ඊට පස්සේ මං තීරනය කරන්නම් එයාට ඉන්න දෙනවද නැද්ද කියල... "

"හරි එහෙනම් ලේන්සුවකුත් අතට ගන්නවකෝ"

"ඒ මොකටද"

"මොකද මේක ඇහුවට පස්සේ තමුසේ අඩනවා ශුවර් එකටම ඒකයි..."

"මං එහෙම අඩන්නෑ"

"අපෝයි ඔව් පෙරේදා මං බය උනා තමුසේ අඩනවා දැකලා එතකොට තමයි දැක්කේ නවකතාවක් කියවනව කියලා.... "

මං ඉතිම් දත් තිස් දෙකම පෙන්නලා හිනාඋනා... විලිලැජ්ජයි

"අපි ඇයි ඔය පරන දේවල් ගැන කතා කරන්නේ... අර අයියගේ කතාව කියන්නකෝ " මං කිව්වේ මාතෘකාව වෙනස් කරන්න ඕනේ නිසා....

"හරි එහෙනම් අහගන්නවකෝ..."

"නිතිනුයි මායි මීට් උනේ යුනිවසිටි එකේදී.. ඔහොම හිටියට ඌට මාර සල්ලි.... විසිකරන්න තරම් සල්ලි තිබ්බා... දන්නවද එච්චර සල්ලි බිස්නස් තියෙද්දී ගවමන්ට් කැම්පස් එහෙකට ආවේ ඇයි කියල... ආදරේ නිසා..

ඉස්කෝලෙ කාලේ ලව් එක... කෙල්ල අපි වගේ මිඩ්ල් ක්ලාස් ෆැමිලි එකක කෙල්ලෙක්... එක්ස්සෑම් පාස් වෙලා කලම්බු කැම්පස් එකට සිලෙක්ට් උනා කෙල්ල.... ඒත් මූට හොඳ රිසාල්ට් එකක් ගන්න බැරි උනාලු.... ඊට පස්සේ අයෙත් සැරයක් කරලා කොහොමහරි කැම්පස් එකට තේරිලා... කන්නේ බොන්නේ නැතුව පාඩම් කරලා තිබ්බා ඌ... මොකද කලම්බු යුනිවසිටි එකට ඉසෙඩ් එක වැඩියෙන් බලනවනේ... බැරි වෙලාවත් යන්න බැරිවෙයි කියලා බයටම පිස්සුවෙන් වගේ පාඩම් කරාලු.. මට කිව්වේ හේශාන් අයියා ඌ මූගේ කසින් කෙනෙක්..."

හෙශාන් කියන්නේ අයියගේ හොඳම යාලුවෙක්... එයාව මන් දන්නවා..... අපේ ගෙදරත් ඇවිත් තියෙය්... දැන්නම් මෙහෙ නෑලු...

"මේකා කෙල්ලට පන යන්න ලව් කරා... මන් දන්නෑ මං ෆිල්ම් එකකවත් දැකලා නෑ ඒ වගේ ආදරයක්... ඒ කෙල්ලව පරිස්සම් කරේ මැනිකක් වගේ... අපාර්ට්මන්ට් දෙකක් අරන් එකක ඒ කෙල්ලව නවත්තල අනිකේ ඌ හිටියේ... පස්සෙ අපි දෙන්නවත් එක්ක ගත්තා ඒ අපාර්ට්මන්ට්කට... කෙල්ල දිහා බලන්නවත් දෙන්නෑ මොකෙක්ටවත්... ඉල්ලන ඉල්ලන හැමදේම ගෙනත් දෙනවා... සමහර දවස් වලට ලක්ශගනන් ඒ කෙල්ලට වියදම් කරනවා.. "

"ඉතින් අයියෙ එයාගේ අම්මල තාත්තල හොයන්නැද්ද ඒ සල්ලි වලට මොනාද උනේ කියලා.... "

මං එහෙම කිව්වම අයියා බර හුස්මක් අතෑරලා ජනේලෙන් අහස දිහා බැලුවා.....

"හොයලා බලන්න අම්මා තාත්තා ඉන්න එපැයි සුදූ"

අනේ දෙවියනේ එයාගේ අම්මා තාත්තා නැද්ද ඒ කියන්නේ... ඒක ඇහුවම මගේ ඇස් වලට කඳුලුත් ආවා... අම්මා තාත්තා දෙන්නගේම ආදරේ නැතුව ඉන්න තියා හිතන්නවත් මට බෑ...

"අනේ අයියෙ මොනා වෙලාද එයාගේ අම්මටයි තාත්තටයි..."

"දන්නෑ සුදූ පොඩිකාලේ ඉදන්ම ඒ දෙන්නා නෑලු... මං අහන්න ගියේ නෑ ඒ ගැන...මතක් කරලා ආයෙත් දුකක් දෙන්න බැරි නිසා.... පොඩිකාලේ ඉදල තියෙන්නේ ලොකු අම්මා ලගලු... උගේ නමට දේපොල තිබ්බ නිසා සලකලා තියෙන්නේ... "

"අනේ පව් අයියෙ එයා.. "

"හ්ම්ම්... අම්මලා නැති නිසාමද කොහෙද අර කෙල්ලට පිස්සුවෙන් වගේ ආදරේ කරේ.... ඒත් අපිට තේරුනා ඒ

කෙල්ල මූව පාවිච්චි කරනවා කියලා.... හරියටම කිව්වොත් ඒකිට මූව ඇවිදින ATM එකක් වෙලා තිබ්බේ... අපි කොච්චර කිව්වත් ඌ ගනන් ගත්තේ නෑ... අනන්තවත් අපිට බැන්නා.... ඒත් යාලුවා නිසා අපි ඉවසන් හිටියා... පස්සේ ට්‍රේනින් යනකාලේ මටයි හේශාන්ටයි ආරන්චි උනා ඒ කෙල්ලට තව සම්බන්ධයක් තියනවා කියල... අපි ෆොටෝ පවා ගිහින් පෙන්නුවා... ඒත් මූ විශ්වාස කරේ නෑ... මාර විදිහට අන්ද වෙලා හිටියේ... පස්සේ පස්සේ මූ ඇස් දෙකෙන්ම දැකලා තිබ්බා... පිස්සෙක් වගේ ඇඩුවා... අරක්කු බොන්න සිගරට් බොන්න පටන් ගත්තා... කොටින්ම කිව්වොත් නාස්ති උනා... ඒ කෙල්ල ආයෙ සමාව ඉල්ලන් ආවා... විශ්වාස කරන්න සුදූ මූ ඒකිට සමාව දීලා ආපහු බාරගත්තා... ඒ කාලේ තමයි මූ බිස්නස් එකට මැදිහත් උනේ.... අවුරුදෙන් කම්පැනි එක උඩටම ගේන්න පුලුවන් උනා... මාවත් උගේ කම්පැනි එකේම වැඩට ගත්තා... ඒත් මේ ලගදි සතියක් එක දිගට ඔෆිස් ආවේ නෑ... ෆෝන් ආන්ස කරන්නේ නෑ... ඒක නිසා මං ගෙදරට ගිහින් බැලුවා..... මං යනකොට.....

අයියා එතනින් නවත්තලා හොද හුස්මක් ගත්තා...

"මං යන්කොට පුටුවක් උඩ හිටගෙන බෙල්ලට තොන්ඩුව දනවා... සුදූ... මං තව විනාඩි පහක් පරක්කු උනානම් මොනාවෙයිද කියල හිතාගන්නවත් බෑ... මං බේරගත්තා කියලා මට ගැහුවත් එක්ක... අතත් කපාගෙන හැමතැනම... තනියෙන් තියන්න බැරි නිසා මෙහෙ අරන් ආවේ...

හේශානුත් මෙහෙ නෑනේ... මොකක්ද උනේ කියල මටවත් කිව්වේ නෑ... ඒ තරම් ඒකිට ආදරෙයි... ඒකිගේ වැරැද්දක් හොදම යාලුවෙක් වෙච්ච මටවත් කියන්නෑ.. අරකිගේ වැඩ නිසා දැන් ඌ හිතන්නේ ගෑනු ඔක්කොම සල්ලි කඩා ගන්න වටේ යන උන් කියල... ඒක නිසා ඌට කෙල්ලො පේන්න බෑ... උගේ සකට්‍රි හිටියේ ගෑනු ළමයෙක් ඒ ළමයව මාරු කරලා කොල්ලෙක්ව ගත්තා අද එතන්ට... ඒ තරම් කෙල්ලෝ එපා වෙලා... ඒ නිසා ඒක ගනන් ගන්න එපා සුදූ... "

අයියා කිව්වා වගේ කතාව කියල ඉවරවෙද්දි මන් හිටියේ අඩලා නහයත් බර වෙලා....

"තාමත් කියන්නේ ගෙදරින් යවන්න කියලද එයාව... ම්ම්"

"නෑ අයියේ එයාට ඉන්න කියන්න... අපි මොනා හරි කරලා ඒ බුම්මට්ටව හිනා ගස්සමු..."

"හිනාවක්..." ඒ වචනෙ එයාට ගොඩක් දුරයි සුදු... ඉස්සර හිනාව පිරිලා තිබ්බ ඒ මූන අද හිනාව කියන්නේ මොකක්ද කියල අදුරන්නේවත් නෑ... උගෙ හදවතේ තුවාලේ ගැඹුරු වැඩියි... සැරින් සැරේ පෑසව පෑසව ඌට තවත් රිදවනවා...කාලෙටවත් බෑ ඒ තුවාලේ සුව කරන්න... ඒත් අපි උත්සහ කරමු අඩුමගානේ පෑරෙන්න දෙන්නේ නැතුව ඉන්නවත්"

අයියා ජනේලේ දිහා බලන්ම ලොකු හුස්මක් අතෑරියා.. ඊට පස්සේ මගේ දිහා බැලුවා.....

"කෝ බලන්න අත ගොඩක් රිදෙනවද... බෙහෙත් ගේන්න යමුද"

ඒ වෙනකොටත් අත හොදටම ඉදිමිලා රතුවෙලා තිබ්බේ... ඒත් බෙහෙත් ගේන්න යන්න කම්මැලියි අප්පා..

"බාම් මොනාහරි ගෑවම හරි යයි... මට බෑ බෙහෙත් ගේන්න යන්න" මං එහෙම කියද්දිම කාර් එකක් ගේට්ටුවෙන් දානවා වගේ ඇහුනා...

"කවුද මේ රෑ ආවේ... " මං ඇහුවේ අයියගෙන්...

"නිතිනු වෙන්න ඇති ආරු.. එයාගේ කාර් එකෙන් අද ආවේ අපි.... ඒත් මූ කොහෙද මේ රෑ ගියේ... "

ටික වෙලාවකින් නිතිනු අයියා කාමරේ ලගට ආවා... කාමරේ දොර ලග එහාට මෙහාට ඇවිදිනවා.. ඔලුවත් කහ කහ...

"නිනුවා මොකෝ.."

අයියා කතා කරාම එයා අයියා ලගට ඇවිත් මං දිහත් බලලා පොඩි ක්‍රීම් එකකුයි පැනඩෝල් වගයකුයි අයියා අතට දීලා කිශනිකව එතනින් ගියා...

මං බලන් හිටියේ ඒ ඇස් දිහා... පුදුම තරම් අහිංසක කමක් තිබ්බේ ඒ ඇස් වල... ඒ වගේ කොල්ලෙක් ඉද්දි වටේ යනවා නම් ඒ කෙල්ල තරම් මෝඩියක් මේ ලොකේ ඉන්න පුලුවන්ද...

"දැක්කනේ සුදූ ඌ එච්චර නරක එකෙක් නෙවෙයි.... විහින් නපුරු වෙන්න දගලනවා... ෆීලින්ග්ස් නැති මනුස්සයෙක් කියලා ලෝකෙට පෙන්නන්න ඌට ඕනේ.... ඒත් එහෙම වෙන්න බෑ මොකද හදවත ඒ තරම් ලස්සනයි.. "

අයියා මගේ අතේ බෙහෙත් ගාලා කාමරෙන් ගියේ ලොකු බරක් මගේ පපුව උඩින් තියලා... මං ඇඳේ හාන්සි වෙලා කල්පනා කරා මේ ජීවිතේ ගැන.... මනුස්සයෙක්ට එච්චර ප්‍රශ්න එන්න පුලුවන් ද... ඒ අතින් මට මොනාද තියන ප්‍රශ්න... ජීවිතේ දුක කියන දේ මං කවදාවත් විදලා නෑ... ලොකු ලොකු මන්දිර නැති උනාට මට කවදාවත් අඩුපාඩුවක් දැනෙන්න දුන්නේ නෑ මගේ අම්මයි තාත්තයි... "ආදරේ" ආදරේ මගේ වටේට ඕනෙවටත් වඩා තිබ්බා... ඇත්තටම මං දුක කියන දේ දන්නේ නෑ... ඒත් එයා සතුට කියන දේ දන්නේ නැතුව ඇති.... ආදරයක් නැතුව පොඩි කාලේ ඉදන් කොච්චර අසරන වෙන්න ඇත්ද...

ආදරේ කියලා හිතාගෙන පනටත් වඩා විශ්වාස කරලා පස්සෙන් ගියේ මිරිගුවක් පස්සේ කියල දැනගත්තාම හදවත කොච්චර රිදෙන්න ඇත්ද... පලවෙනි වතාවට මට ජීවිතේ ගැන කලකිරීමක් ඇති උනා... මං හිතාගෙන හිටපු තරම් ලෝකේ සුන්දර නෑ කියලා තේරුනා...

## 04 කොටස

නිතිනු අයියා එනකොට කෑමත් ගෙනල්ලා තිබ්බා... ඒ නිසා රෑට උයන්න ඕනෙ උනේ නෑ... උයන්න ඕනෙ උනත් උයන්න විදිහකුත් නෑනේ... අයියා බත් කැව්වේ මට අතින් කන්න බැරි නිසා.. නිතිනු අයියා මන් දිහා බලන් හිටියේ පසුතැවීමෙන් වගේ.... හැබැයි කිසිම වෙලාවකවත් ඒ ඇස් මගේ ඇස් වල ගැටෙන්නේ නැතිවෙන්න එයා පරිස්සම් උනා...

කාලා නිදගන්න ආවත් නින්ද යන්නේ නෑ... අත ඇදුම් දෙනවා... පන්ඩිත කමට පෙනඩෝල් බිව්වෙත් නෑනේ... 12 විතර ඇති වෙලාව... පෙනඩෝල් දෙකත් අරගෙන කුස්සියට ආවේ වතුර එකක් ගන්න... ඒත් කුස්සියේ දෙර ඇරලා... ලයිට් එකවත් දලා නෑ...

එලියේ පේමට් එක වගේ කොටසෙ කලුවට මනුස්සයෙක්ගේ ඡායාවක් පේනවා... උඩට ගත්තු හුස්ම පහලට දන්න බැරුව මං බය වෙලා බලන් හිටියේ ඒ චායාව දිහා... බලලා තියෙන හොල්මන් කතා ඔක්කොම පේලියට මතක් වෙද්දී මට දුවන්න ඕනේ උනත් කකුල් දෙක පොලවට ඇලිලා වගේ දැනෙන්නේ...

ඒත් එක්කම එතන හිටපු මනුස්සයා ලයිටරයකින් සිගරට් එකක් පත්තු කරා... ලයිටරේ එලියට මං දැක්කේ ඒ මූන... වෙනකවුරුත් නෙවෙයි නිතිනු අයියා.. අම්මපා තව පොඩ්ඩෙන් මේ මනුස්සයා හාට් ඇටෑක් හදවලා මරන්නේ මාව....

මං හිතෙන් බනින ගමන් කුස්සියේ ලයිට් එකය් එලියේ ලයිට් එකයි දැම්මේ එයා ගැස්සිලා මගේ පැත්ත බලද්දී... මං දැක්කෙ නැති විදිහට සින්ක් එකෙන් වීදුරුව තියල වම් අතෙන් වතුර එකක් ගත්තා... වතුර එක ගන්න ගමන් හොරෙන් බැලුවේ එයා දිහා... මං ආපු නිසාද කොහෙද සිගරට් එක එහෙමම බිම දලා පෑගුවා... මං එයාට නොපෙනෙන්න හිතාවෙන ගමන් පෙනඩෝල් දෙක අතට ගත්තා... අතට ගත්තට මොකද දැන් ඉතින් වම් අතෙන් මේක කඩන්නේ කොහොමද...

පෙනඩෝල් එකත් එක්ක ඔට්ටු වෙවී හිටපු මං ගැස්සිලා ගියා පිටිපස්සෙන් ආපු අතක් නිසා.. මං ක්ෂනිකව පිටිපස්ස හැරිලා බැලුවා..... නිතිනු අයියා මගේ

පිටිපස්සෙන් හිටගෙන පැනඩෝල් දෙක අතට ගත්තා... මං හිටියේ පැන්ට්‍රියටයි එයාටයි මැදි වෙලා... හරි අමුතුම හැඟීමක් හිත පුරා ගලාගෙන යද්දි මන් තාමත් බලන් හිටියේ ඒ මූන... සිගරට් ගඳ පරයා යන අමුතු සුවඳක් දැනුනා මට එයා ලගින්... ඒක විස්තර කරන්න අමාරු හැඟීමක්....

මං පියවි සිහියට ආවේ එයා පැනඩෝල් දෙක කඩලා අත උඩින් තියනකොට... ඒ ස්පර්ශය මගේ අතට දැනෙද්දි මාව හිරිවැටිලා ගියේ ඇයි කියල මන් දන්නේ නෑ... මං අත දිහා බලලා එයා දිහා බලනකොට එයා ගිහිනුත් ඉවරයි... මං අවසිහියෙන් වගේ පැනඩෝල් දෙකත් බීලා කාමරේට ආවා...

නින්ද අහලකවත් නෑ... අනේ වේදනාව අඩු වෙලා තිබ්බත් හිත අමුතුම හැඟීම් වල පැටලිලා... මැව් මැවී පේන්නේ එයාගේ රූපේ... ඒ ගනකම ඇහිබැම ලස්සන දිලිසෙන ඇස්, සති ගානකින් කපලා නැති අපිලිවල කොන්ඩෙයි රැවුලයි මගේ හිතපුරාම ඇදිලා.... අනේ මන්ද මට මොනා වෙලාද කියලා....

"එයා ඉස්සර කොහොම ඉන්න ඇත්ද??"

මං කල්පනා කරලා බැලුවා..... ඒත් හිතාගන්න බෑ.. එතකොටම මතක් උනේ ෆෝන් එක...

ෆේස්බුක් තියෙද්දී ඇයි මං එච්චර දුක් විදින්නේ... ෆෝන් එක අරන් මං ගියේ අයියගේ එකවුන්ට් එකට... ෆ්‍රෙන්ඩ් ලිස්ට් එකේ පල්ලෙහාට පල්ලෙහාට ගියා... ආ මේ තියෙන්නේ..

නිතිනු සෙහංස

ප්‍රොෆයිල් එක දැක්කම මගේ හිතට ලොකු බරක් දැනුනා.. ඒකේ හැමතැනම තිබ්බේ එයාගේ ගර්ල් ෆ්‍රෙන්ඩ් කියන්න පුලුවන් ගෑනු ලමයෙක් එක්ක ගහපු ෆොටෝස්... එ හැම ෆොටෝ එකකම එයා ලස්සනට හිනාවෙලා හිටියා... ගානට කපපු කොන්ඩේ රැවුල එක්ක ඒ මූනේ තිබ්බේ දගකාර බවක්.... දෙපාරක් බලන්න හිතන තරම් කඩවසම් මූනක් ඒක...න්ඒ ඇස් වල ආදරේ පුරෝගෙන ඒ ගෑනු ලමයා දිහා බලාගෙන හිටියේ හැම ෆොටෝ එකකම වගේ... එක්කෝ එයාව ටැග් කරලා නැත්තම් එයාව මෙන්ශන් කරලා... ෆ්‍රොෆයිල් එක පුරාම තිබ්බේ ඒවා විතරයි..

ඒ ගෑනු ලමයාගේ එකවුන්ටත් ගිහින් බැලුවා..... ෆ්‍රොෆයිල් පික්වෙකට දලා තිබ්බේ මැදිවියේ වගේ පෙනුමක් තිබ්බ පිරිමි කෙනෙක් එක්ක ගත්තු පොටෝ එකක්... සනුදි දිහාරා තමයි නම තිබ්බේ... පොශ් ලස්සනක් තියන සුදුම සුදු කෙල්ලෙක්... රූපෙන් නම් නිතිනු අයියට හොදට ගැලපෙනවා.... ඒත් ඉතින් රූපෙ ලස්සන උනාට වැඩක් නෑනේ හිත කැතයි නම්...

මං ෆෝන් එක පැත්තකින් තියලා කල්පනා කරේ ඒ ගෑනු ළමයා ගැන රූපෙන්,චරිතෙන් මොනාගෙන් බැලුවත් අඩුවක් නැති නිතිනු අයියව දලා වෙන කෙනෙක් එක්ක යන්න තරම් එයා කොච්චර මෝඩද... ඒ වගේ ආදරේකට පිටුපාන්න තරම් කොච්චර දරුනුද...

ඇදෙන් නැගිටලා කාමරේ ජනේලේ ඇරියා.... සීතල හුලගක් ඇවිත් ඇග වටේ දැවටුනේ හරියට මාව පිළිගන්න වගේ... තරු පිරිච්ච අමාවක රැයක්... කොච්චර තරු තිබ්බත් සද නැති අඩුව මකන්න නම් පුලුවන් වුනේ නෑ... හරියට නිතිනු අය්යගේ ජීවිතේ වගේ... මට හිතුනේ එහෙම.... ජනේලේ කම්බි ගහල තිබ්බේ නැති නිසා උඩින් ඉදගත්තා.... ගමේදි තරම් ලස්සනට පෙනුනේ නැති උනත් අහස හරි පැහැදිලිව පෙනුනා...

මේ අහසට හදක් ආවම කොච්චර ලස්සනද... ඒ වගේ එයාගේ මූනට හිනාවක් ආවොත් ගොඩක් ලස්සන වේවි.... ඔව් මට පුලුවන් ඒ මූනට හිනාවක් ගේන්න.... මං ඒක කරනවා.. මේක මං මටම දෙන පොරොන්දුවක්....

# 05 කොටස

"ආරු ආරු නැගිටින්න සුදු අද කෝස් එකට යන්න ඕනේ නේද... නැගිටිනවා කම්මැලි කෙල්ල"

උදේන්ම අයියා එලාම් එක ගහනවා... ගෙදරදි අම්මා මෙහෙදි මෙයා... මං එක ඇහැක් ඇරලා ෆෝන් එකෙන් වෙලාව බැලුවා..... 6.10 වෙලාව... මගේ ටයිම් එක 6.15 ඉතින් තවත් විනාඩි පහක් තියනවනේ...මං එහෙම හිතලා අනික් පැත්ත හැරිලා නිදාගත්තා... අයෙත් උඩ ගිහිල්ලා ඇහැරුනේ අයියා කෑ ගහනකොට.... මේ පාරනම් ටිකක් දරුනුයි වගේ... වෙලාව බැලින්නම් 6.25 යි... හරිනේ අමාරුව 6.30 ට වත් ලෑස්ති වෙලා ඉන්න ඕනේ.... කොලබටම යන්න එපැයි... අනේ අම්මපා අපෙ අයියටත් කොලබින් ගෙයක් හොයාගන්න බැරි උනානේ...

මං හිතෙන් අයියටත් බැන බැන වෙනදා පුරුද්දට නිදගෙන හිටපු ඇදුමින්ම ඔලුව කහ කහ එලියට ආවා... තව පොඩ්ඩෙන් නිතින් අයියගේ ඇගේ හැප්පෙනවා... මං ගැස්සිලා එයා දිහා බැලුවා..... අපි දෙන්නා හිටියේ මූනට මූන. පලවෙනි වතාවට ඒ ඇස් මගේ ඇස් එක්ක පැටලුනා... මං වශීවෙලා වගේ බලන් බලන් හිටියා ඒ ඇස් දිහා... මැනික් කැටවගේ දිස්න දෙනවා ඒවා.... නාපු ගමන් නිසා වතුර බින්දු ගලාගෙන යනවා මූන දිගේ... උඩට

ගත්ත උස්ම පහලට දාන්නත් අමතක වෙලා මං හිටියේ... එයා ලගින් ආපු සුවද... මගේ නහය දිගේ ඇවිත් හදවතටම දැනුනා...

එයා මගේ දිහා ඔරවලා බලලා ඔරෝගෙන එතනතින් යනකොට තමයි මං මේ ලෝකෙට ආවේ...

"හපොයි ආරු මේ මොනාද කරේ.... ශිට් දැන් එයාට ආයේ මූන දෙන්නේ කොහොමද.. අය්යෝ අය්යෝ මෝඩියේ තාම ඉන්නේ නින්දෙන් නැගිට්ට ගමන් නේද... "

මං බාත්‍රූම් එකට ගිහින් දෙර වහගත්තා... කියන්න සතුටුයි මගේ මූන දැක්කම මටත් එපා උනා... ඒ තරම් ලස්සනයි... දැන් ඉතිම් මොනා කරන්නද පලවෙනි දවසේ මාව දැක්කෙත් පිස්සෙක් වගේනේ එහෙම හිතලා මං හිත හදාගත්තා...

කොහොමහරි දඩ බඩ ගාලා වොශ් එකකුත් දාන් කාමරේට ආවා... ඊයේ රෑ අදින ඒවා ඔක්කොම ලෑස්ති කරලා තිබ්බේ... මට උදේට පරක්කු වෙනවා කියල මං දන්නවනේ.....

කලුපාට පසුබිමේ රෝස පාට ලොකු මල් තියන දනිස්ස ලගට කොට ගවුම ඇදලා. කොන්ඩෙට පොඩි කට්ටක් ගහල කොඩි ශූස් දෙක දාගත්තා... ඒ අස්සේ අයියා එලියේ ඉදන් බෙරිහන් දෙනවා... තව චුට්ටක් වෙලා ගියොත්

ගුටිත් කන්න පුලුවන්... ඉක්මනට ලා රෝස පාට ලිප්ස්ටික් එක ඇඟිල්ලේ ගාලා පේන නොපෙනෙන ගානට තොල් වල තවරගෙන රෝස්පවුඩර් චුට්ටක් උලා ගත්තා... පෆෙක්ට්... ඔය ඉන්නේ නැචුරල් ලුක් එකට... කන්නාඩියෙන් පේන මගේ රූපෙට ෆ්ලයින් කිස් එකක් දීලා දුවගෙන එළියට ආවා හෙල්මට් එකත් අරන්... අයියට තියෙන්නේ බයික් එකක්නේ...

“සුදූ හෙල්මට් එක තියලා එන්න නිතිනු අයියගේ කාර් එකේ යන්නේ.... "

අයියා මට කතා කරන සද්දෙට නිතිනු අයියා මං දිහා බැලුවා..... එයා මගේ යට ඉඳලා උඩට බලලා කොන්ඩෙ ගාව ඇස් නවත්ත ගත්තා... මාව මෙච්චරකල් මෙහෙම දැකලා තිබ්බේ නෑනේ... මං ගෙදරට අදින්නේ තඩි කලිසම් ටීශර්ට් නේ... අනික එයා මගේ කොන්ඩේ කඩලා තියනවා දැකලා නෑ... මට තිබ්බේ දනිස්ස ලගට විතර දිග කොන්ඩයක්... ගොඩක්ම කර්ලුත් නෑ ස්ට්‍රේටුත් නෑ.. මං එයා දිහා බලන් ඉන්නවා දැකපු නිසා මූනට තපුරු පාට පූරවන් අහක බලා ගත්තා... අම්මෝ ලොකු කම... ඉන්නකෝ මං මෙයාව හදලා ගන්න...

හෙල්මට් එක තියලා දුවලා ආවා... එද්දි නිතිනු අයියා කාර් එක ස්ටාට් කරලා... දැන් තමයි මං හරියට කාර් එක දැක්කේ... දෙවියනේ අවුඩියක් නේද... පලවෙනි වතාවට අවුඩියක් ලගට දැක්කේ...

අර රවුම් හතරෙන් තමයි යන්තම් වාහනේ මොකක්ද කියල දැනගත්තේ නැත්තම් මං වාහන ගැන මෙලෝ දෙයක් දන්නේ නෑ.

තාත්තගේ පරන ඇල්ටෝ කාර් එකේ විතරක් ගිහිල්ලා තිබ්බ මං පලවෙනි වතාවට අවුඩියකට නැග්ගා... ඇල්ටෝ එකට වඩා ගොඩක් වෙනස්.... මං මෝඩයෙක් වගේ කට ඇරන් හතර වටේම ඇස් යැව්වා... මං පියවී සිහියට ආවේ අයියා ගේට් එකත් වහන් කාර් එකට නගිද්දි...

කොහොමහරි 8ට විනාඩි පහක් තියලා කෝස් එක තියන තැනට එන්න පුලුවන් උනා... උදේ නිසා ට්‍රැෆික් එක වැඩි නේ...

"අයියා මං යනවා... බුදු සරනයි..."
අයියට එහෙම කියල මං කාර් එක ඩෝර් එක ඇරලා ආයෙත් ඉස්සරහ බැලුවා.....

"තිතිනු අයියා.. බායි බුදු සරනයි"

මං එහෙම කිව්වාම එයා ඇස් දෙක දෙබගෙඩි සයිස් කරන් මං දිහා බැලුවා..... මං හිනාවත් තද කරන් කාර් එකෙන් බැස්සා... බැහැලා ඉස්සරහට යද්දිම වගේ අයියා කතා කරනවා වගේ ඇහිච්ච නිසා මං පිටිපස්ස බැලුවා.....

"සුදූ.. මොන ලෝකෙද ඉන්නේ ආ.. මේ ෆයිල් බෑග් එක කාර් එක ඇතුලේ දලා ගිහින්"

හපොයි දැන්නේ මතක් උනේ ඒක... මං දත් තිස් දෙකම පේන්න විරිත්තලා ෆයිල් බෑග් එක අරන් යන්න හදලත් අයේ අයියා දිහා හැරුනා... එයාගේ ශර්ට් එකේ උඩ බොත්තම ඇරිලා... මං ඒකත් දලා ටයි එකත් හදලා අයියා දිහා බැලුවා..... මගේ අය්යා හොද හැන්ඩ්සම් කොල්ලෙක් ඉතින් මට පොඩි ආඩම්බරයක් දැනුනා.. අය්යා මගේ ඔලුවත් අතගාලා එතනින් ගියා... එයා දිහා බලන් හිටපු මන් උඩ ගියේ පිටිපස්සෙන් කවුරුහරි කඩන් පැන්න නිසා.. ඔව් ඔව් වෙන කවුද ඉතිම් මගේ අතිජාත මිතුරිය ශනූ කෙල්ල...

"මොනාද බං කරන්නේ... තව චුට්ටෙන් මං මැරෙන්නේ හාට් ඇටෑක් හැදිලා... "

ශනූ බඩ අල්ලන් හිනාවෙනවා...

"ඉතින් හොදයිනෙ බත් පෝශන සතිය එතකොට අපිට"

"අනේ අනේ තොපිලා වගේ යාලුවෝ පොල්පිත්තෙන් කපාගන්න තිබ්බා... "

"ඒ මේ ඒක නෙවෙයි අද උබලා ආවේ මොකේද මන් දැක්කේ නෑනේ අයියගේ බයික් එක"

"ආ අද අපි ආවේ නිතිනු අයියගේ කාර් එකේ "

"කව්ද නිතිනු කියන්නේ අර බූට් කාපු එක්කෙනාද"

මං ශනුට එයා ගැන සම්පූර්න විස්තරේ කියල තිබ්බේ...

"හ්ම්ම් එයා තමයි... "

"කොහොමද පොර හැන්ඩ්සම් ද"

"හැන්ඩ්සම් කියන්නේ බන් ටර්කිශ් ඩ්‍රාමා වල ඉන්න නලුවෙක් වගේ... "
මං කිව්වේ එයාගේ රූපෙ හිතේ මවාගන්න ගමන් මටත් නොදැනීම මගේ මූනට ලා මදහසක් ආවා...

"අම්මෝ කෙල්ලගේ මූනෙ තියන පැනිපාට.... හරි හරි ඔහොම යමුකෝ..."

ශනූ එහෙම කිව්වම මං එයාටත් ඇද කර කර ගේට් එකෙන් ඇතුලට ආවා... වෙනදනම් කවුරුහරි මට පිරිම් ලමයෙක් එක්ක ආදලා මොනා හරි කිව්වාම තරහ යනවා... ඒත් අනේ මන්ද අද මට තරහ ආවේ ආවේ නෑ...

------------------------------

හවස අයියට එන්න බැරි නිසා ශනු එක්ක බස් එකෙ ආවේ... ශනු ඉන්නේ කලුතර නිසා අපි දෙන්නටම එක බස් එකේම එන්න පුලුවන්නේ... බස් එකෙන් බැහැලා ටිකක් ඇතුලට එන්න ඕනේ ගෙදරට... තැලිලා තැලිලා ඇවිත් ඒ ටික පයින් යනවා කියන්නේ හොද ගනන්... මං වැනී වැනී ඔහේ හෙමීට පාර මැද ආවේ... පිටිපස්සෙන් ඇහුන හෝන් සද්දෙට මං ගැස්සිලා පිටිපස්ස හැරිලා බැලුවා..... කලුපාට අවුඩියක්. ඒක නිතිනු අයියගේ කියන්න මට කිසිම සැකයක් නෑ... හොදටම හෙම්බත්වෙලා හිටපු මට නිතුනු අයියා පෙනුනේ දිව්‍ය ලෝකෙන් දිව්‍ය රතයක් අරන් ආපු දෙවියක් ගානට.. මං පාර අයිනට වෙලා හිනාවක් දගෙන හිටියා... ඒත් ඒ මෝඩයා මං කියලා ජීවියෙක් පාරෙ පේන්නවත් හිටියේ නැති ගානට යන්න ගියා... මට ලග තිබ්බ ගලක් අරන් ගහන්න හිතුනත් ඉවසන් හිටියේ ඕකේ කෑල්ලක් කැඩුනොත් මටයි අය්යටයි වකුගඩු උකස් තියලා මිසක් වෙන ගෙවන්න විදිහක් නැති නිසා

ටික දුරක් ගිහින් මට දෙයක් මතක් වෙලා බෑග් එක අවුස්සලා බැලුවා..... ආ මේ තියෙන්නේ බාන්ඩේ.. මිස්ටර් නිතිනු සෙහංස ඔයා වැරදි කෙනා එක්ක හැප්පුනේ මං යතුර ඇගිල්ලකට දලා කරකවන ගමන් ෆෝන් එක අතට ගත්තා... පුලුවන් තරම් හෙමින් අඩි තිය තියා ගේම් එකක් ප්ලේ කරා... කොහොමහරි ගෙදර ලගට එනකොට විනාඩි 15 ක් විතර යන්න ඇති....

මං යද්දී එයා ගේට් එක ලග එහාට මෙහාට යනවා කාර් එක පාරේ නවත්තගෙන පව් වැඩේ... මං තවත් හෙමින් ඇවිදගෙන ආවා දැක්කේ නැති ගානට.. ගේට් එකත් ඇරලා මං නැවතුනේ ජම්බු ගහ යට... මගේ වෙලාවට ටිකක් උඩින් ජම්බු ගෙඩියක් තිබ්බා... ඒක කඩන විදිහට මං උපරිම රංගනයක නියැලුනා... එයා දෙර ලග එයාට යනවා මෙහාට යනවා... තියන ලොකුකම නේ කිව්වනම් දෙර අරින්නේ නැතුව ඉන්නවැය්... ටික වෙලාවක් බොරුවට දගලලා ජම්බු ගෙඩිය කඩාගෙන කන්න කට අරිද්දිම කෝල් එකක්..

"හෙලෝ සුදූ නිතිනු අයියා එලියේ ඉන්නවා දෙර අරින්නකෝ... එයාට ඉම්පෝටන් ඩොකියුමන්ට් එකක් ගන්න තියනවා... "

"ආ හරි අයියා.. "

"බය වෙන්න එපා සුදූ ඒ අයියා නරක කෙනෙක් නෙවෙයි මිම් එයා ඩොකියුමන්ට් ටික අරන් ආපහු එනවා... "

එහෙම කියලා අය්යා ෆෝන් එක තිබ්බා... අයියා කියපු දේට මට හිනත් එක්ක.. මාව පේන්න බැරි මිනිහා මට කරදර කරන්න එයිද මං එයාටත් ඔරෝගෙන ගිහින් දෙර ඇරියා.... අනිවාර්යයෙන්ම මෙයා මැසේජ් එකක් දලා කියන්න ඇති අය්යට... එයා ඉස්සරහින් යද්දි ඒම් කරලා ගැහුවා ජම්බු ඇටෙන්... හරියටම ඔලුවටම වැදුනා..

යෙස්.. එයා මගේ දිහා බැලුවාම මං අහිංසක හිනාවක් දගෙන කාමරේට ආවා...

---------------------------

රෑට අයියයි මමයි ලෑස්ති උනේ නූඩ්ල්ස් හදන්න... මං නූඩ්ල්ස් ටික තම්බනකම් අයියා ලීක්ස් කැපුවා... ඒත් එක්කමයි නිතිනු අයියා කුස්සියට ආවේ... වතුර එකක් බීලා එයා යන්න හදද්දිම මං එයා ඉස්සරහට පැන්නේ කැරට් අලේකුත් අරන්...

06 කොටස

"ආ මේක ග්‍රේට් කරල දෙන්න.."
මං කිව්වේ නිතිනු අයියට ලොකු කැරට් අලයක් දික් කරන ගමන්...

නිතුනු අයියා ඇස් දෙකත් ලොකු කරන් අයියා දිහා බැලුවා..... අයියා කට ඇරන් මං දිහා බලන් ඉන්නවා මං දෙන්නවම ගනන් ගන්නේ නැතුව ෆ්‍රිජ් එක ඇරලා චිකන් ටික ගත්තා...

"අයියා ඔයා මේක කපන්නකෝ... මං ලීක්ස් කපන්නන්"

"සුදු.. නිතිනු අයියා කැරට් ග්‍රේට් කරන්න දන්නේනෑ.. "

"ඉතිම් ඉගෙන ගමු... ඒක එච්චර ලොකු වැඩක් යැය් මෙන්න මේක අරන් එහාට මෙහාට කරන්න තියෙන්නේ ... අපි කෑම හදලා දෙනකම් ඉන්න මෙයා මහ එජාන්ත උන්නැහේ යැය්?"

මං හොරෙන් බැලුවේ එයා දිහා... මං දිහා බලන් ඉන්නවා නිකන් මරන් කනවද අමුවෙන් කනවද වගේ... මං දැක්කේ නැති විදිහට මගේ වැඩේ කරා...

එයා හිතන්න ඇති මන් හවස වෙච්ච දේට පලිගන්නවා කියලා.... ඒත් ඇත්තටම ඕනෙ උනේ එයාව තනි නොකරන්නයි... කාමරේ අස්සට වෙලා තනියම ඉන්න ඉන්න එයාට පරන මතක තව තවත් රිද්දන එක විතරයි වෙන්නේ... මට ඕනේ එයත් අපේ පවුලේ කෙනෙක් වගේ පෙන්නන්නය්.... ඒත් ඉතින් අපේ මෝඩ අයියට ඕක තේරෙන්නේ නැති හැටි... දගෙන ඔරවනවා...

නිතිනු අයියා අත හෝදන් පැන්ට්‍රිය උඩ තියන පිගානත් අරන් කැරට් අල ටිකත් අරගත්තා.... ඒත් ඊලගට කරපු වැඩේට නම් මං ඔලුවේ අත ගහගත්තා... කැරට් අලේ පොත්ත පිටින්ම ග්‍රේට් කරනවා

"අය්යෝ ඕකේ පොත්ත අයින් කරන්න ඕනේ මෝඩයෝ..."

මං කැරට් ටික අරන් පොත්ත සුද්ද කරලා හෝදලාම දුන්නා.... නැත්තම් ග්‍රේට් කරලා ඉවරවෙලා හෝදන්නේ කියල හිතුවොත්....

කොහොමහරි බොහොම අමාරුවෙන් එයා කැරට් ටික ගාලා ඉවරවුනා... ඒත් අලේ උඩම ටික ගාගන්න බැරුව දගලනවා... මං අත දික් කරාම එයා මගේ අතෙන් ඒක තිබ්බා... මං ඒක දෙපාරක් හිතන්නේ නැතිව ඒක කටේ දගත්තේ නිතිනු අයියා කන්න වගේ මගේ දිහා බලන් ඉද්දි...

"මෙහෙම තමයි දරුවා කැරට් අලේ අන්තිම ටික ග්‍රේට් කරන්නේ..."

මං ඇහැකුත් ගහලා ඒක කියපු තාලෙට එයාට හිනා යන්න ආවත් ආයාසයෙන් ඒක පාලනය කරගත්තා කියල මට තේරුනා... ඊට පස්සේ පුරුදු නපුරු මූනත් මවාගෙන කුස්සියෙන් එලියට ගියා... මට උඩ පැන පැන නටන්න තරම් හිතුනා... ඇයි දෙය්යනේ මේ ආඩම්බරකාරයා මං කරපු දග වැඩ වලට හිනා උනානේ.... කෙනෙක්ගෙ මූනට හිනාවක් ගේන එක මෙච්චර සතුටක් කියලා මත් දැනන් හිටියේ නෑ...

"ආරු මොනාද ඔයා ඒ කරේ ගෙදරට ආපු අමුත්තෙක්ට කියල වැඩ ගන්නවද ආ"

ඔන්න අයියා කුනු කුනු ගාන්න පටන් ගත්තා... ඇත්තමයි ආයේ දෙකක් නෑ එයාට ඇවිත් තියෙන්නේ අම්මගේ ජාන... අපෙ අම්මත් ඔහොමමය්...

"අනේ මගේ මෝඩ අයියේ ඔයා දැක්කෙ නැති උනාට මං දියමන්තියකටත් වඩා වටින දෙයක් දැක්කා.. "

"මොකක්"

"හිනාවක්"

"හිනාවක්...? කාගෙද...?"

"මං කැරට් අලේ කාපු වෙලාවේ එයාට හිනායන්න ආවා... ඒත් ඉක්මනට එයා ඒක හංගාගත්තා... "

"ඔයා ඇත්තද කියන්නේ සුදු මේ අපේ නිතුනුවා හිනාවුනා... ?

"හ්ම්ම්.... ඔව් එහෙම තමයි මේ ආරුගේ වැඩ"

"ඇත්තටම ඔයාට පින් සුදු ඒ මූනට හිනාවක් ගෙනාවොත්... ඌ ඔහොම ඉන්න ඕනෙ එකෙක් නෙවෙයි"

"අපෝ අපෝ මට පින් නම් එපා... මට මේ බුම්මට්ටෙක් එක්ක එක ගෙදර ඉන්න බෑ ඒකයි මං මෙහෙම කරන්නේ... බලන්නකෝ අදම මං ඔය බුරුසු රැවුලයි කොන්ඩෙයි කප්පවන හැටි... "

"හ්ම් හ්ම් බලමුකෝ..."

රෑට කාලා ඉවරවෙලා හැමදම වගේ දෙන්නම ගුහාවට රින්ගන්න හදනකොටම මං කතා කරා...

"අය්යෝ මොකක්ද අනේ කාපු ගමන් කාමරේට රින්ගන්නේ... අපි සෙල්ලමක් කරමුකෝ...."

මං කිව්වේ අයියට ඇහැක් ගහල ඉගිකරන ගමන්... අයියට වැඩේ තේරුනා...

"හ්ම්ම්... හරි දැන් මොනාද අපි කරන්නේ... "

"අපි බූරුවා හොයමු... ඉන්න මන් කාඩ් පැක් එක අරන් එන්නනම්"

පැක් එක අරන් එද්දි අයිය කොහොමහරි නිතිනු අයියව කැමති කරවගෙන සෙට්යේ වාඩි වෙලා හිටියා...

"ඔන්න බූරුවා වෙන එක්කෙනා අනික් දෙන්නා කියන දේ කරන්න ඕනේ හොදේ... අයියා ඔයාට විශ්වාසයි නේද ඔයාගේ යාලුවව... නැත්තම් බූරුවා උනාට පස්සේ කරේ නැත්තම්.. "

"ඔයා මොනා කියනවද සුදු අපේ මේ නිතිනු වචනයක් දුන්නොත් දුන්නා.... අනික පිරිමියෙක් උනාම දුන්න වචනේ පිලිගන්න ඕනේ.... "

අන්න අයියා ගැහුවා හොදම තුරුම්පුව

කොහොමහරි කලහොද පස්සෙන් එනවා කියල ඉස්සල්ලාම සැරේ බූරුවා උනේ මම... ඉතින් දවස් පහක් එක දිගට පොල් ගාන්න වෙනවා මට. ඊගාව වටේදි මමයි අයියයි හොර කරපු නිසා බූරුවා උනේ නිතිනු අයියා.. ඉතින් දැන් තමයි මගෙ ප්ලෑන් එක ක්‍රියාත්මක වෙන්නේ...

මං ටික වෙලාවක් කල්පනා කරනවා වගේ ඉදලා නිතිනු අයියා දිහා බැලුවා.....

"ඔයාගේ ඔය නත්තල් සීයගේ වගේ තියන රැවුලයි කොන්ඩෙයි කපන්න ඕනේ.... "

ඒක කිව්වට පස්සේ එයා එක පාරටම අයියා දිහා බැලුවා

“ඔව් ඔව් මචන් දැන් ඉතිම් කිව්ව දේ කරන්න වෙනවා.. වචනෙනන් වචනේ"

අයියා එහෙම කිව්වාම මූනත් බෙරි කරන් එයා කාමරේට ගියා... අයියයි මමයි පහක් දලා කටවහන් හිනා උනා...

ඇදට ගිහින් ටික වෙලාවක් යද්දි තමයි මතක් උනේ රෙදිටික වැලේ කියලා.... හය්යෙන් අපු සීතල සුලගත් ගොරවන සද්දෙත් කියාපෑවේ වැස්සක පෙර නිමිති...මං ෆෝන් එකේ ටෝච් එක ගහන් කුස්සියට ගියේ කුස්සිය දෙරෙන් එලියට යන්න... හුලග නිසාද කොහෙද කරන්ට් එකත් නෑ... එදා වගේම දෙර ඇරලා... අදත් එයා සිගරට් බොන්න යන්න ඇති... මං සුසුමක් හෙලලා ෆෝන් එකේ ටෝච් එකත් ඕෆ් කරලා පොඩ්ඩක් එබිලා බැලුවා..... ඒත් ඒ දැක්ක දසුනෙන් මගේ පපුවම ඇවිලිලා ගියා...

එයා හිටියේ බිත්තියට හේත්තු බිම ඉදගෙන ෆෝන් එකෙන් අර ගෑනු ලමයගේ ෆොටෝ එකක් බල බල සිගරට් එකක් බොනවා... ඇස් වල කදුලු.. ජිවිතේට පිරිමියෙක්ගේ කදුලු දැකලා තිබ්බේ නැති මට ඒ දැක්ක දේත් ලොකු වේදනාවක් දැනුනා.. මටත් නොදැනීම මගේ දෙපා නැවතුනේ එයා ලග... මං ලගට ගියත් එයාට දැනුනේ නෑ... එයා හිටියේ වෙනමම ලෝකෙක.. දැන් තමයි මන් ඒ ෆොටෝ එක හරියට දැක්කේ... ඒකෙ තිබ්බේ ඒ ගෑනු ලමයා

නිතිනු අයියට කිස් එකක් දෙනකොට ගහපු ෆොටෝ එකක්... මං කවදාවත් දැකලා නැති නිතිනු අයියාගේ හිනාව ෆොටෝ එකේ මූනෙ පිරිලා තිබ්බා...

මං හෙමීට එයා ලගින් වාඩි උනා... එතකොට තමයි එයා මාව දැක්කේ ... කලබලෙන් වගේ සිගරට් එක පැත්තකට විසිකරලා කඳුලු මගෙන් හංගන්න ලොකු උත්සහයක් දැරුවා... ඒත් පුදුමෙකට වගේ එයා එතනින් නැගිටලා ගියේ නෑ... මං හොද හුස්මක් අරන් බිත්තියට ඔලුව හේත්තු කරගත්තා... හිමින් ඔලුව උස්සලා අහස දිහා බැලුවා..... කලුවලාකුලු පටලයකින් අහසම වැහිලා ගිහින්... ලග ගෙදරක ලයිට් එකක් නිසා යන්තම් ආලෝකයක් අපි දෙන්නා ඉන්න තැනට වැටිලා තිබ්බා...

"වහින්න වගේ... "

මං කටහඩ අවදි කරා... එයා මුකුත් නොකියා අහස දිහා බැලුවා..... තාමත් කඳුලු කැටයක් කම්මුල දිගේ පල්ලම් බහින්න පොර කනවා...

"ඉස්සලා මං බලද්දී ලස්සනට හද පායලා තිබ්බා... ඒත් දැන් මුලු අහසම අඳුරුයි... කලු වලාකුලු වලට හද වැහිලා ගිහින්... ඒකේ තේරුම ආයේ හද ආපහු පායන්නෑ කියන එක නෙවෙයි... ආයෙත් අනිවාර්යයෙන්ම හද පායයි... මුලු අහසම එලිය කරාවි තරු ගොඩක් මැද ඉදගෙන.. සමහර

විට කලින්ටත් වඩා ලස්සනට....

ජීවිතේ මිනිස්සුන්ට ප්‍රශ්න දෙනවලු හොදම දේ දෙන්න කලින්... ගොඩක් මිනිස්සු මගදී හති වැටිලා නතර වෙනවලු.. ඒත් කොහොමහරි දරාගෙන ඉදිරියට යන මනුස්සයාට හිතා ගන්න බැරි ලස්සන ජීවිතයක් හම්බෙනවලු... මොකද මේ ලෝකේ පරාජිතයට සොබාදහම උනත් කිසිම දෙයක් දෙන්න කැමති නැති නිසා.. "

මං එයා දිහා බැලුවා.... එයා මත් දිහාම බලන් ඉන්නවා... කඳුලු අතරින් ඒ දිලිසෙන ඇස් දකිද්දී මගේ හදවත වේගෙන් ගැහෙන්න ගත්තා... මං ඒ බව නොපෙන්නා එතනින් නැගිට්ටා.... ගේ ඇතුලට යන්න ගිහින් මං ආපහු හැරිලා එයා දිහා බැලුවා..... එයා අහස දිහා බලන් හිටියේ...

"තව ටිකකින් වහී ගේ ඇතුලට එන්න... තෙමුනොත් ලෙඩ වෙයි.. "

මං එහෙම කියලා ගේ ඇතුලට ආවා...

# 07 කොටස

හවස මන් හිටියේ ගාෆීල්ඩ් බලන ගමන් කිරිකෝපි එකක් බිබී... කාර් එකක් ආපු සද්දයක් ආවත් මං ගනන් ගත්තේ නැත්තේ අයියා ලග යතුර තියන නිසා.. ඒත් බෙල් එක ගහපු නිසා අයියටත් බැන බැන මං දොර ඇරියා.... අදහන්න බෑ දොර ලග අයියට ඉස්සරහ හිටියේ ලස්සනම ලස්සන ලොකු බව්වෙක්.... එයා මගේ ලගට ඇවිත් කකුල් දෙක ඉවකරල බලල බුරන්න පටන් ගත්තා... මං ශේප් එකේ ඉස්සල්ලාම ඔළුවට අත තිබ්බා... එච්චර අවුලක් නෑ වගේ... ඊටපස්සේ හෙමීට බෙල්ල අතගෑවා... ඔන්න දැන්නනම් බිරිල්ල නවත්තලා කෙදිරිගාන්න ගත්තා... සාලෙ බිම ඉදගත්ත ගමන් එයා එයාගේ ලස්සන වලිගේ හොල්ලල හොල්ල මගේ මූන ලෙවකන්න පටන් ගත්තා.... ඊට පස්සේ මගේ දිහා බලන් කුක් කුක් ගානවා. මං එයාගේ බෙල්ල වටේ අතක් දලා බදා ගත්තා... ජර්මන් ශේප්ඩ් එක්කෙනෙක් නිසා ගොඩක් උසයි...

"මං කිව්වේ නිතිනුවා මේකට දූන්නම් බලාගනී කියල... ඔය පේන්නෑ මාවවත් මතක නෑ... "

අයියා කියන්නේ නිතිනු අයියා දිහා බලාගෙන.. ඒත් මට ඒ කිසි දෙයක් ගැන උවමනාවක් තිබ්බේ නෑ...

"අයියා මෙයා කාගෙද.. මොකක්ද එයාගේ නම"

"ඕකා නිතිනු අයියගේ... නමක් නම් නෑ... "

"මොකක් නමක් නැති බල්ලෝ ඉන්නවද අනේ... ඉන්න මං එයාට නමක් දාන්න.. මෙයා කෙල්ලෙක් ද කොල්ලෙක් ද"

"කොල්ලෙක් කොල්ලෙක්"

"ආ ම්...ම් අපි එහෙනම් එයාට චූෆි කියමු"😃

"මොකා...??"

"ඇය් මෝඩයෝ චූෆි.. අර ෆූෆි මගේ බලු පැටියා හිටපු හැටියේ පනයනවා අයේත් පන මතු වෙනවා චූෆි පුන්චි මගේ පැටියා වැහ් වැහ් වැහ්... ඒකේ ඉන්නේ... "

මං තාලෙට ඒක කිව්වාම අයියා මහ හය්යෙන් හිනාවෙන්න ගත්තා... විකාරද මන්ද.. ඒත් එක්කම මං දැක්කේ නිතිනු අය්යා.. කොන්ඩෙයි රැවුලයි ගානට කපලා.... ඒ විතරක් නෙවෙයි එයා හිනා වෙනවා.. සත්තයි එයාගේ හිනාව දැකලා මට ලෝකෙම අමතක වුනා.. ඇස් දෙක චූටි වෙලා එක පැත්තේ කම්මුලක් වල ගැහෙනවා... පුදුම ලස්සනක්... මං මෝහනය වෙලාවගේ එයා දිහා බලන් ඉන්නවා දැකලා එයා හිනාව හංගගෙන ඉක්මනට කාමරේට ගියා... ඒත් එක්කම මන් දැක්කේ කටත් ඇරන්

නිතින් අයියා ගියපු දිහා බලන් ඉන්න අයියව..

"ආරු ඕ.. ඔයා දැක්කද නිතිනු හිනාවෙනවා ඌ හිනාවුනා... අද කොන්ඩේයි රැවුලයි කපලා ඔෆිස් එකට ආවම මන් පුදුම උනා... ඊයේ ගේම් එකට එහෙම කිව්වට ඇත්තටම කරයි කියලා හිතුවේ නෑ... මාස ගානකට පස්සේ මං ඔය හිනාව දැක්කේ... කිව්වා වගේම ඔයා ඒක කරා සුදූ... ඇත්තමයි මට පුදුම සතුටක් දැනෙන්නේ... "

එහෙම කියලා අයියා මගේ ලගට එන්න හැදුවේ මගේ කොන්ඩේ අවුස්සන්න වෙන්නැති... ඒත් උනේ නම් කවුරුත් හිතපු නැති දෙයක්...

මෙච්චර වෙලා මගේ ඇගේ දැවටි දැවටි හිටිය වූෆියා අයියට බුරන්න පටන් ගත්තා... අයියට ලගටවත් එන්න දෙන්නේ නෑ...

"යකෝ මේක හරි වැඩක් නේ.. මට මගේ නංගි ලගට යන්න නෑ මේ බලුතඩියෙක් නිසා.. උබටත් මාව හොදයි ඒ කාලේ සතියකට සැරයක් ගෙනිච්ච බිස්කට් එක කන්න... කෙල්ලෙක් දැක්කාම ඔක්කොම අමතකයි..."

අයියා කියන්නේ බව්වට ඇද කර කර බාතෲම් එකට යන ගමන්... හැමදාම ඔහොමය් ඔෆිස් ඇරිලා ආපු ගමන් බාතෲම් එකේ... ඊටපස්සේ ටවල් එක ගෙනත් දෙන්න කියල හූ තියනවා...

"සුදූ.... ටවල් එක දෙරේ එල්ලන්ඩෝ"

හිතුවා විතරයි ඔන්න කෑ ගැහුවා... මං ටවල් එක ගේන්න නැගිට්ටින්න හැදුවත් චූෆි කකුල උඩ හොම්බ තියාගෙන ඉන්නවා... එයා ඉන්න විදිහ දැක්කාම මට දුක හිතුනා... සමහරවිට නිතිනු අය්යා ඉන්න තත්වේ එක්ක මෙයාව බලාගන්න බැරි වෙන්නැති... සත්තු උනත් ආදරේට ගොඩක් කෑදරයි... එයාලට ආදරේ තියන තැන දැනෙනවා... ඒකයි මං ගාවම දැවටෙන්නේ... මං ඒ සිතුවිල්ලෙන්ම එයාගේ ඔලුවේ මැද සිපගත්තා...

පොල්ගගා ඉන්න අයියා ලගට කිට්ටු උනේ චූෆිගේ කතාව දැනගන්න... ඔට්ටුවේ විදිහට මං පොල්ගාන්න ඕනෙ උනත් එයා මට ඒක කරන්න දුන්නේ නෑ. මං කෙලින්ම අහන්නේ නැතුව එහාට මෙහාට කැරකි කැරකි හිටියා...

"දැන් ඔය හොරගල් අහුලන්නේ අර බලූ තඩියාගේ කතාව අහගන්නනේ..."

අයියා හරියටම මගේ හිත කියෙව්වා...මං එයා දිහා බලලා මෝඩ හිනාවක් දැම්මා..... අයියා පොල්බෑයත් පැත්තකින් තියල බර සුසුමක් පිට කරා...

"ඔය බල්ලා නිතිනුවා ලග......"

"ඇයි අනේ බල්ලා කියන්නේ... ඒක හරි කැතයි නේ.. අර ලස්සන මූන බලන් එහෙම කියන්නේ කොහොමද.... පව් මගේ චූඟි "

අයියා කියන්න හදපු එකත් කියන්න නොදී මං එහෙම කිව්වේ ඇත්තටම ඒක අහන්නත් කැත නිසා.. හරියට බනිනවා වගේ

"යකෝ බල්ලට බල්ලා නොකියා වෙන මොකක් කියන්නද... අනික මං උගේ මූන බලන් කිව්වැය්.. මල විකාර... අහන් ඉන්නවනම් අහන් ඉන්නවා... "

"අපෝ හරි හරි කියන්ඩකෝ"

"ඔය මොකාද චූඟි ද මොකාද එකා ගොඩක් කල් ඉදන් හිටියේ නිතිනුවා ලග.. කැම්පස් යන කාලෙත් හිටියා එතකොට පැටියා කාලේ... නිතිනුවා මාර ආදරෙයි ඌට... හැබැයි ඌට නමක් නම් තිබ්බේ නෑ... ඉස්සර හෙශාන් අයියා ඌට කිව්ව නිකමා කියලා.... නමක් කියල කතා කරන්න ඕනෙ උනේ නෑ... මොකද කොයි වෙලෙත් ඌ හිටියේ නිතිනු ලග... නිතිනු ඌට තිබ්බ ආදරේ දෙවැනි උනේ සනුදිට විතරයි... ඒත් සනුදි කැමති නෑ බල්ලන්ට.. ඒකි නිතිනු අයියට බලපෑම් කරා ඌව ගෙදරින් යවන්න කියල... ඒ කාලේ ආදරෙන් අන්ද වෙලා හිටපු මේ ගොනා

බල්ලව හේශාන්ට දුන්නා.... නිතිනුවා නැතුව සාංකාවට ඕකට අසනීපත් උනා... හේශානුත් බල්ලන්ට වැඩිය කැමති නැති උනත් කන්න බොන්න දීලා ඌව බලා ගත්තා... ඒත් ඌ රට ගියපු නිසා මට දුන්නා.... මට බලාගන්න විදිහක් නැති නිසා මං බල්ලෝ බලාගන්න තැනකට දුන්නා.... ඒ කාලේ ඔයා හිටියෙත් නෑනේ... ඒත් මං සතියකට සැරයක් යනවා බිස්කට් එකක් අරන්... අද එතනින් මට කතා කරලා කිව්වා එයාලා එතන වහනවා කියලා මෙයාව අරන් යන්න කියලා.... මං නිතිනුවත් එක්ක ගියා ඌව ගන්න.. මං තමයි කිව්වේ අපේ ගෙදර ගේමු අපේ හොල්මන බල්ලෝ පූසන්ටයි මාර පෙරේතයි එයා බලාගනියි කියලා.... කිව්ව පමාවට ඌ කැමති උනා... මං හිතන්නේ ඔය ඇදුම් දැකලම ඌටත් තේරෙන්න ඇති ඔයාගේ මානසිකත්වේ

අයියා අන්තිම ටික කියලා හිනාවෙද්දි මං බැලුවේ ඇදන් ඉන්න ටීශර්ට් එක දිහා... කිව්වත් වගේ ඒකේ කලුපාටින් "i love dog" කියල ප්‍රින්ට් කරලා 0 අකුරේ බව්වෙක්ගේ ඔලුවක් ඇදලා තියෙන්නේ.. මගේ ගොඩක් ටී ශර්ට් වල ඉන්නේ බල්ලෝ පූසො තමයි... මං අයියටත් රවන් සාලෙට ගියේ චූෆි ව හොයන්න... එයාගේ කතාව අහල මගේ පපුවට ලොකු බරක් දැනුන නිසා මට ඕනෙ උනේ එයාට පුලුවන් උපරිමෙන් ආදරේ දෙන්න..

සාලේ චූෆි හිටපු නැති නිසා මං දෙරෙන් එලියට ඔලුව දැම්මා..... ඒත් මං දැක්කේ කීයටවත් බලාපොරොත්තු

වෙච්ච දෙයක් නම් නෙවෙයි.... ජම්බු ගහයට වූරිව බදගෙන හිටියේ වෙනකවුරුත් නෙවෙය් නිතිනු අයියා.. ඒත් එක්කම මට ඇහුනේ මං කවදවත් අහලා නැති එයාගේ කටහඬ

"මගේ කොල්ලා මත් නැතුව පාලුවෙන්ද හිටියෙ..මං හරි නරකයි නේද උබව අතෑරියා බොරු ආදරයක් වෙනුවෙන්... මට අමතක උනා උබ මට ආදරේ කරේ බොරුවට නෙවෙයි කියල... කොටින්ම උබ ආදරෙයි වගේ රගපාන්න දන්නේ නෑනේ... "

මං බිත්තියට මුවා වෙලා අහන් හිටියේ ඒ ගැබුරු හඩින් පිටවෙන ආදරනීය වදන්...

"ආ මට අමතක් උනානේ.... දැන් අපේ කොල්ලට නමකුත් තියනවනේ... වූරි නේද... "

එයා එහෙම කියද්දිම වූරි දෙපාරක් බිරුවා එයා දිහා බලන් හරියට ඔව් කියනවා වගේ... වූරි දිහා බලන් ලස්සනට හිනාවුනා... ඔව් එයා හිනාවුනා... ලස්සනට මූනේ පැත්තකින් වල ගැහෙන්න එයා හිනා උනා.. මං ඒ හිනාව දිහා බලන් හිටියේ පුදුම ලෝබකමකින්... ඒත් එක පාරටම මතක් වෙච්ච දෙයක් නිසා මං ගියේ කාමරේට... කාමරේ තිබ්බ ෆෝන් එකත් අරන් මං අයෙත් හිටපු තැනටම ආවා... ඒ එනකොට වූරි එයාගේ මූන පුරාම ලෙවකනවා... ඒ ලස්සන හිනාව තාමත් මූනේ... මං ඉක්මනට ලස්සන

ෆොටෝ ටිකක් ගහගත්තා...

"අම්මෝ අපේ චූටි කොල්ලගේ දංගලේ... මොකද අර ලස්සන අක්කා අද නමක් දාපු නිසාද.."

"ලස්සන අක්කා"? එයා එහෙම කිව්වේ මට නේද... මට දැනුනේ මාව පාවෙනවා වගේ... දන්නෑ මං කොච්චර ලස්සනයි කියල කියනවා අහල තිබ්බත් මේ මූනටවත් නොකියපු එකට මට අසීමිත ලෙස සතුටු හිතුනා...

"මේ දැක්කද ඒ පිස්සු කෙල්ල මගේ රැවුලයි කොන්ඩෙයි කැප්පෙව්වා කොහොමහරි... වෙලාවකට හැසිරෙන්නේ පොඩි ළමයෙක් වගේ... ඔයා දන්නවද චූටි ආරධ්‍ය ගොඩක් වාසනාවන්තයි... එයාට අම්මගේ තාත්තගෙයි ආදරේ තියනවා... තව චූටි දගකාර නංගි කෙනෙක්ගේ ආදරේ තියනවා... මටත් නංගි කෙනෙක් හිටියානම් ඒ වගේ දගකාරකම් කර කර මාව හිනස්සයි නේද... ඔයා එයා ලගම ඉන්න.. මං වගේ එයා ඔයාව දාලා යන එකක් නෑ... ඔයත් ආසයි නේද එයාට... එයා සනුදි වගේ ඔයාට නපුරු වෙන එකක් නෑ... "

එයා එහෙම කියල ඊට පස්සේ කරපු දේටනම් මගෙ හුස්මත් හිරවුනා...

# 08 කොටස

එයා චූටි ගේ මූන දෝතින් අරන් හිස මැද සිප ගත්තා... මටත් නොදැනීම මගේ අත ගියේ තොල් දෙකට.... ඒ එතනමය්... මං චූටිව කිස් කරපු තැනමයි එයා කිස් කරේ.... හරියට ඉන්ඩිරෙක්ට් කිස් එකක් වගේ... මගේ මූන රතු වෙන්නැති... මොකක්දෝ කෝල කමක් දැනෙද්දි මං කාමරේට ගිහින් දොර වහගත්තා... හදවත වේගෙන් ගැහෙනවා... දොරටම හේත්තු වෙලා මං ඇස් පියාගෙන හිටියේ සන්සුන් වෙන්න... ඒත් මට මැවිලා පෙනුනේ නිතිනු අයියගේ මූන.... එයා මාව කිස් කරනවා මට මැවිලා පේනවා... මං ඔලුවට තට්ටුවක් දගත්ත්තේ විකාර පේන එක නවත්තන්න... ලොකු උත්සහකට පස්සේ නොසන්සුන් වෙච්ච බව බාහිරෙන් විතරක් අඩු කරගන්න මට පුලුවන් උනා...

රෑ කෑමට වාඩි උනත් මගේ හිත තාමත් නොසන්සුන්.... මේසෙට ඇවිත් නිතිනු අයියා කැරකි කැරකි මොනාද හොයනවා... ඒත් ඒ මොකක්ද කියන එක මට රහසක් නෙවෙයි...

"මං වූෆිට කෑම දුන්නා.... එයාගෙත් මාර ලොකු සීන්නේ තියෙන්නේ.. සාලයෝ දෙන්නෙක් බැදලා දෙනකම් බත් එක දිහා බැලුවෙවත් නෑ... අයිතිකාරයාගේ ගතිමයි තියෙන්නේ..."

අන්තිම ටික කියද්දි එයාට කැස්සක් ඇවිත් පලවෙනි බත් කටම හිරවුනා... කෑම මේසෙ වතුර තිබ්බේ නැති නිසා මං දුවලා ගිහින් වතුර එකක් අරන් ආවා... එයා වතුර එක දිහා බලලා මත් දිහත් බැලුවා..... මෙයා ගෑනු ළමයි දෙන වතුර බොන්නෙත් නැද්ද දන්නෑ... මල විකාර මං උයන ඒවා කන්න හොදයි... මං එහෙම හිතල ග්ලාස් එක මේස උඩින් තියන්න යද්දිම එයා ඒක අතට අරන් බීගෙන ගියා... ඒත් එයාගේ කැස්ස නැවතුනේ නෑ... ඒ නිසා මත් දෙපාරක් හිතන්නේ නැතුව එයාගේ පිටට තට්ටු කරා... ඒත් එයා මං දිහා ඇස් දෙක ලොකු කරලා බලද්දී තමයි මට කරපු වැඩේ බරපතලකම තේරුනේ... මං බැලුවේ අයියා දිහා... අයියත් කට ඇරගෙන බලන් ඉන්නවා... මං ක්ශනිකව එයාගේ පිටෙන් අත ගත්තා...

"සො..සොරි මං පුරුද්දට කරේ.... "

ඇත්තමයි මං ඒක පුරුද්දට කරේ.... ගෙදරදි කාටහරි එහෙම උනාම කරන නිසා.... මොකක්දෝ හේතුවකට එයාව මට පවුලේ කෙනෙක් වගේ දැනුනා.. මං හිතුවේ එයා නොකාම නැගිටල යයි කියල ඒත් එයා ගියේ නෑ...

කාලා ඉවරවෙච්ච ගමන් පුරුදු විදිහට එයා කාමරේට රිංග ගත්තා... මං චූෆිත් එක්ක එයාගේ කාමරේ ලග සාලේ බිම වාඩි උනා... චූෆිගේ බෙල්ල ලගින් ඔලුව තියාගෙන බිම හාන්සි උනා... මේ දවස් වල රස්නේ නිසා ටයිල් පොලොව සනීපයි... ඊටපස්සේ මං ෆේස්බුක් එකට ගිහින් හෙව්වේ ඊයේ සේව් කරපු ආර්ටිකල් එක... ඒකේ තිබ්බේ සිගරට් බීම නිසා සිරුරට සිදුවන බලපෑම පිලිබද විද්‍යාත්මක විග්‍රයක්... මං දෙක වසරේ ලමයෙක් පොත් කියවනවා වගේ හයියෙන් හැමෝටම ඇහෙන විදිහට ඒක කියෙව්වා... ටික වෙලාවකින් නිතිනු අයියා කාමරෙන් එලියට ආවේ මං කියන ඒවා අහන් ඉන්න බැරි නිසා වෙන්න ඇති....

එයා කාමරෙන් එලියට ඇවිත් මං දිහා බැලුවේ අමුතු ජීවියෙක් දිහා බලනවා වගේ... ඇයි මන් හිටියේ චූෆිත් එක්ක බිම නිදාගෙනනේ... ඒත් එක්කම චූෆිත් මාව පෙරලගෙන නැගිට්ටා.... එයාගේ ලෑස්තිය නිතිනු අයියත් එක්ක යන්න... ඒවා කොහෙද මාත් එක්ක මං එයාගේ බෙල්ලෙන් බදගත්තා යනවට...

"කොහෙද යන්නේ... මතක නැද්ද මං තමයි කන්න දුන්නේ.... මං තමයි අද දවසෙම බලා ගත්තේ... ජරා කරපුවත් අයින් කරා... දැන් මාව දලා යන්නේ.... ඉන්නවා... "

මං එයාව කොච්චර තදට අල්ලන් හිටියත් එයා යන්නම දගලනවා... ඒ නිසා මූනත් එයාගේ බෙල්ලෙන් තියන් තද කරලා බදා ගත්තා...

"ආරු මොකද මේ කරන්නේ... ඕකට යන්න දෙන්න"

අයියා කියන්නේ හිනාවෙවී...

"බෑ..... එයා මගේ.. එයාට ඉන්න කියන්නකෝ.... එයා නිතිනු අයියා පස්සෙන් යනවා... මෝඩ චූටි දගලන්නේ නැතුව ඉන්නකෝ...."

"අය්යෝ මෝඩියේ නිතිනු අයියා කොහෙවත් යන්නෑ..... ඕකා එයත් එක්ක එළියට ගිහින් එයි... ඕකව අතෑරින්නවා"

මං අයියා දිහා බලන්න යද්දිම මන් දැක්කේ නිතිනු අයියා හිනාවෙනවා... අතෙන් කට වහන් හිනාව හංගන්න පුදුම උත්සහයක් දරන්නේ... මං දැක්කා කියලා දැක්ක නිසා පුරුදු විදිහටම එතනින් මාරු වෙන්න හැදුවේ.... ඒත්...

"ආ.................... ආවි අම්මා......... "
චූටි මගේ අත හැපුවේ මට හිතන්නවත් වෙලාවක් නොදී...

"සුදූ.. මොකද උනේ.... ඇයි මේ.. මොකද උනේ.... "

"හැ.. හැපුවා.. රිදෙනවා.... "
මං කෑගහද්දි අයියා ලගට ඇවිත් මගේ අත එයාගේ අතට ගත්තා... නිතිනු අයියත් ඇවිත් එතනින් දන ගහගත්තා... චූටි හොදටම බය වෙලා මගේ ලගට ඇවිත් ඉව කරනවා.. බුරනවා... මං තාමත් අත දිහා බැලුවේ නෑ... බලන්න බයයි...

"හරිනේ ඕකටනේ මෙච්චර වෙලා නැටුවේ... කෝ නැගිටිනවා අතහෝදන්න යන්න... මේ ලේ එනවා... "

අයියා මාව නැගිට්ටවගෙන සින්ක් එක ලගට ඇවිත් අත වතුරට ඇල්ලුවා...

"ආ..ස්ස් රිදෙනවා.... "

මං කදුලු ගලන මූනෙන් බැලුවේ අත දිහා... මැනික් කටුව ලගින් ලොකුවට දත් පාරක් හිටලා.. ඒකෙන් ලේ එනවා...

"රිදෙනවා තමයි අනේ ඇත්තට ලැජ්ජ නෑනේ... මේ කීවෙනි වතාවද... තාත්ති දන්නවනම් මාව මරන් කනවා මහලොකු සුදු දේනි බලාගත්තේ නෑ කියලා.... "

අයියා කියන්නේ ඔරවා ඔරවා... එයාට හොදටම තරහා ගිහින්...

"ආරාධ්‍ය... හොස්පිට්ල් යන්න වෙයි නේද... ඉක්මනට නංගිවත් ලෑස්ති කරන් වරෙන්කෝ.. මං වූහිට බෙහෙත් විදපු කාඩ් ටික හොයන් එන්නම්"

මං ඔක්කොම අමතක කරලා බැලුවේ නිතිනු අයියා දිහා... මෙන්න බොලේ මෙයා මත් ඉන්න තැන කතා කරනවා

"බෙහෙත් විදින්න ඕනෙද බන්... මෙයාට ගිය අවුරුද්දේ බෙහෙත් විද්දද කොහෙද... මේ මත් හිතන්නේ පස්වෙනි වතාව බල්ලො කවාගත්ත... අනික වූහිට බෙහෙත් විදලනේ තියෙන්නේ.. "

"පස්වෙනි වතාව "

නිතිනු අයියා ඇස් ලොකු කරන් මත් දිහත් බලලා අයියගේ දිහා බැලුවා..... ඇත්තටම කිව්වොත් පස්පාරක් මගේ බල්ලෝ කාලා නෑ හයපාරක් තමයි කෑවේ

"ඔව් බන් අපෙ ගෙදර ගොව්පල වගේ.. බල්ලෝ පූසෝ හැමතැනම... මෙයා තමයි ඔක්කොම ගෙන්න ගන්නේ.. ගේන ගේන හැම එකාටම කියලා කවාගන්නවා... "

අයියා එහෙම කිව්වාම එයා තොල්පට හපාගෙන අතින් කටවහන් අහක බලලා අයේ අයියා දිහා බැලුවේ නිකම් හිනාව පාලනය කරගන්න වගේ... ඒකේ හිනාවෙන්න දෙයක් තියනවැය්.. මල විකාර...

"ඒ උනාට ගිහින් බලන එක හොදයි නේ.. හොස්පිට්ල් එකෙන් මොනා හරි කියනැතැයි"

එයා එහෙම කියලා එතනින් ගියා...

"ආවි..  "
මෙච්චර වෙලා රිදුනේ නැති තුවාලේ දැන් තමයි රිදෙනේ මොකද මෙච්චර වෙලා හිටියේ මේ ලෝකේ නෙවෙයි නේ... අයියා සබන් දලා දගෙන හෝදනවා... වුෆි තාමත් පැත්තක ඉදන් මං දිහා බලාගෙන කුක් කුක් ගානවා.....

මං කොච්චර බෑ කිව්වත් අයියා මාව හොස්පිට්ල් අරන් ආවා... රෑ නිසා ආවේ ප්‍රයිවට් හොස්පිට්ල් එකකට ඇරත් නිතිනු අයියනේ ඩ්‍රයිව් කරේ එයා ගවමන්ට් හොස්පිට්ල් එකකට ආසාවටවත් ගිහින් නැතුව ඇති.... මං නිකන් මහ ලෙඩා වගේ අයියගේ උරහිසට ඔලුව තියන් ආවා... එයා සනීපෙට ඔලුව අතගානවා.......

කලින් බෙහෙත් විදපු කාඩ් එකේ ෆොටෝ එකක් අයියා අම්මට කියලා එවා ගත්තා... මං හිතුවේ ඒක නිසා බෙහෙත් විදින්න ඕනේ නැති වෙයි කියලා.... ඒත් ඒක එහෙම උනේ නෑ ඩොක්ටර් කිව්වා එක බෙහෙත් එකක් විදින්න තියනවා කියලා....

බෙහෙත් විදින කාමරේට මං ගියේ මරන්න ගෙනියන හරකෙක් වගේ... ඒ තරම් බයයි මං ඉන්ජෙක්ශන් වලට.. කටුව දැක්ක විතරයි මට හය්යෙන් ඇඬුනා... මං අඩපු නිසා අයියත් ඇතුලට ආවා... හොද වෙලාවට ප්‍රය්වට් හොස්පිට්ල් එකක් උනේ නැත්තම් හොදවගෙන් අහගන්නවා... කොහොමහරි වදෙන් පොරෙන් ඉන්ජෙක්ශන් එක විදගෙන මං එලියට ආවේ කදුලු පෙරාගෙන... එතන ඉස්සරහින් වාඩි වෙලා ඉන්න කිව්වා පැයක් යනකන්... ඇලජ් රියැක්ශන් එකක් එයිද බලන්න එහෙම ඉන්න කියන්නේ...

අපි එලියට එද්දි නිතිනු අයියා වාඩි වෙලා හිටියේ... මාව එතනින් වාඩි කරවලා අයියා ගියේ වතුර එකක් ගේන්න... ඉන්ජක්ශන් එක නිසා දැනන අප්‍රාණික ගතිය මග ඇරගන්න මං අත් දෙකේ ඔලුව ගහගෙන හිටියේ... ඒත් එක්කම මට දැනුනේ ලෝකෙම කැරකෙන ගතියක්.. කොහෙට හරි හේත්තු වෙන්න ඕනෙ උනත් හේත්තුවෙන්න තැනක් තිබ්බේ නෑ... වැඩි වැඩියෙන් කරකැවිල්ල දැනෙද්දි මට සේරම බොදවෙලා පේන්න ගත්තා... මං නිතිනු අයියා දිහා බැලුවත් එයා වෙන පැත්තක් බලාගෙන හිටියේ... කතා කරන්නවත් මට පනක් තිබ්බේ නෑ... එයා හිටියේ මට එක පුටුවක් එහායින්... මං නැගිට්ටින්නේ නැතුව ලිස්සලා වගේ අනික් පුටුවට ආවා... හෙමීට එයාගේ අත අල්ලද්දිම එයා ගැස්සිලා වගේ මන්දිහා බැලුවා..... මං හෙමීට එයාගේ උරහිසෙන් ඔලුව තියාගත්තේ වෙන

කරන්න දෙයක් නැති නිසා..

"ආරු... ආ යූ ඕකේ... ඇයි මේ මොනාහරි වෙනසක් දැනෙනවද"

එයා අහන්නේ මගේ පැත්ත හැරිලා මාව වත්තම් කරගන්න ගමන්... මං හිටියේ සිහියත් අසිහියත් අතර දැනෙන වෙහෙසකාරී බව නිසාම මම එයාගේ පපුවේ මූන හොවාගත්තා... ඒත් මට එහෙම ඉන්න නොදී කවුරුහරි මාව වඩාගන්නවා වගේ දැනෙද්දිම මගේ ඇස් පියවුනා...

## 09 කොටස

සිහිය එනකොට මං හිටියේ හොස්පිට්ල් එකේ ඇදක් උඩ.. අයියා එහා පැත්තේ වාඩි වෙලා හිටියේ... නිතිනු අයියා නම් පේන්න හිටියේ නෑ... සමහරවිට මං කලන්තේ දාපු වෙලාවේ අයියා එන්නැති... එයා තමයි මාව උස්සන් එන්න ඇත්තේ... ඒත් මං ඒ වෙලාවේ නිතුනු අයියාගේ පපුවට හේත්තු උනාද... නැත්තම් ඒ මට මැව්ලා පෙනුන දෙයක්ද... ඕව් මට මැව්ලා පේන්නැති නැත්තම් මං එයගේ උරහිසට ඔලුව තියපු වෙලාවෙම තල්ලුකරලා දාවි...

ඒත් අනේ මන්ද ඒක මට ඇත්ත වගේ දැනෙනවා...

එච්චර ලොකු අමාරුවක් නැති නිසා ඉක්මනට ගෙදර එන්න පුලුවන් උනා... ඒත් තාමත් දැනෙන තෙහෙට්ටුව නිසා මං අයියගේ උරහිසට ඔලුව තියන් නිදාගත්තා... අයියා මාව ඇදෙන් තියද්දි තමයි ඇහැරුනේ..

දවසක්ම මං චූටිව ගනන් ගත්තේ නෑ... මං එයාට කොච්චර ආදරෙයි ද ඒත් එයා මාව හැපුවා... හැබැයි එයාට වැරද්ද තේරිලා තිබ්බේ... කොයි වෙලෙත් මගේ පස්සෙන් එනවා...මං දිහා බලාගෙන දුක හිතෙන විදියට කෙදිරිගානවා.. එක කෝලමයි.. ඒත් මං නපුරු වෙනෝ හ්ම්ම් පොඩ්ඩක් අගේ පෙන්නන්න එපැය්...

හවස මං සෙට්එකේ වාඩි වෙලා බිස්කට් එකක් කකා හිටියේ චූටි ඇවිත් මගේ දනිස්ස උඩින් කකුල් දෙක තියලා කුක් කුක් ගානවා

"යනවා යන්න මෝඩයා මාව හපලා එනවා මෙතන හුරතල් වෙන්න... මේ බලනවා තුවාලේ"

මං චූටිට තුවාලේ පෙන්නලා බොරුවට බැන්නා... පව් එයා බිම දිග ඇදිලා වදිනවා වගේ ඉදගෙන බුරනවා... මං අහක බලාගෙන හිටියා බොරුවට.. ඒත් එක්කම එනන්ට

නිතිනු අයියා ආපු නිසා චූටී එයා ලගට දුවගෙන ගියා...බුර බුර එයාට මොනාදෝ කියනවා..සමහරවිට මං තරහයි කියනවා ඇති  නිතිනු අයියා නැවිලා එයාගේ ඔලුව අතගාලා කාමරේට ගියා. බැරි වෙලාවත් මං දිහා බැලුවේ නෑ..දැන්නම් ශුවර් අර වෙලාවේ මං දකින්න ඇත්තේ හීනයක් .

එයා ගියා විතරයි චූටී අයේත් මං ලග. කාමරේට ගියපු නිතිනු අය්යා ආපහු එලියට ආවේ ගමනක් යන්න වගේ ඇඳන් ෆයිල් එකකුත් අතේ තියන්..

"නිතිනු උබ කොහේ යන්නද මේ..."

"ඔෆිස් එක ලගින් චූටිව බලාගන්න තැනක් හම්බුනා.. දීලා එන්න යන්නේ.."

එයාගේ උත්තරෙන් මං ගැස්සිලා ගියා.. චූටිව ගෙනියන්න දෙන්න බෑ.. එයා කොහොමද ආයෙත් එහෙම තැනක ඉන්නේ

"පිස්සුද බං ඕකා මෙහෙ හිටපුදෙන් උබට විකාරෙද"

"ඒ උනාට උබලට කරදරයිනේ... අනික අපි ඔෆිස් ගියාම චූටි තනියම නේ..."

"උබේ ඔලුව කොහෙ හරි වැදුනද යකෝ නංගි ඉන්නේ... "

"ඒත් බං නංගි දැන් චූෆිට කැමති නෑනේ... මං මෙහෙ ඉදන් වද දෙනවා මදිවට චූෆිත් වද දෙනවා... සොරි බන් ඊයේ වෙච්ච දේට... නංගිට කලන්තෙත් දැම්මානේ.. මන් එච්චර දෙයක් හිතුවේ නෑ චූෆිව අරන් එද්දි... දැන් කතා කරපු තැන කලින් තැනට වඩා හොදයි... අනික ඔෆිස් එකට ලග නිසා හවසට බලලා එන්නත් පුලුවන් නේ.."

මං ඒ වචන අහන් හිටියේ හීනෙන් වගේ... අනේ එයා චූෆිව ගෙනියන්නද යන්නේ.... මං එයත් එක්ක තරහයි තමයි... ඒත් එයා නැතුව ඉන්න බෑ දැන්... මං පැනපු ගමන් චූෆිව බදාගත්තා..

"අනේ බෑ මං චූෆිව දෙන්නෑ... එයා පව් එයාට එහෙම තැන්වල ඉන්න බෑ... එයා කෑවෙ නැත්තම් සාලයෝ දලා දෙන එකක් නෑ... අය්යේ එයාව ගෙනියන්න එපා කියන්නකෝ.... එයා හැපුවට මං තරහා නෑ... දැන් එයා හොද ලමයෙක්... අනේ එයාව ගෙනියන්න එපා... "

හීනියට ආපු කදුලු ඉකිගහන ඇඩුමක් වෙන්න තත්පරයක් වත් ගියේ නෑ... චූෆි මාව ලෙවකනවා... මගේ උරහිසට ඔලුව තියන් මොනාදෝ කියනවා.. . මං ආපහු යාලුවෙච්ච නිසා එයා ඉන්නේ ගොඩක් සතුටින්... ඉතින් කොහොමද එයාව යවන්නේ... එයා පවු.. මං කදුලු පිරිච්ච ඇස් වලින් තිතිනු අය්යා දිහා බැලුවා... එයා පුදුමෙන් වගේ මන් දිහා බලන් ඉන්නවා...

"අනේ ඔයා චූෆිව ගෙනියන්නෑ නේද... මං එයාට වී අකුර ගහපු කරපටියකුත් ඕඩර කරා... ගෙනියන්න එපා පිලීස්.."

"දැන් උබ මේ ඕකට ගෙනියන්න හදන්නේ ආරු එකා එක්ක තරහ නිසාද... ඔය පේනවනේ එයා තරහ වෙන්න දන්නෙවත් නෑ බත් ඔය බොරුවට පුප්ප පුප්ප හිටියට කෑම වතුර ඔක්කොම දැම්මේ මෙයා තමයි... ඔන්න ඕකට ඉන්න ඇරපන්.. පේනවනේ ඌත් ඒරියල් එක වන වන ඉන්න ලස්සන... කනක් ඇහිලා ඉන්න ඕනේ නැත්තම් අරන් පලයන්.. හැබැය් පුතේ මෙයා උන හැදෙනකන් අඩනවා...."

එයා අයියා දිහා බලලා ලොකු සුසුමක් පිටකරා... මං නහයත් උඩට ඇද ඇද එයා දිහා බලන් හිටියා... එයා කාමරේ පැත්තට යනකොට මමත් තාරාවෙක් වගේ එයා යන යන පැත්තට කැරකුනේ එයාගේ උත්තරෙ දැනගන්න... කාමරේ ලගට ගිහින් ආපහු හැරිලා මං දිහා බැලුවා..... තාමත් මං ඉන්නේ චූෆිව බදගෙන කදුලු බේරි බේරි... එයා මං ලගට ඇවිත් පොඩ්ඩක් මං දිහාට නැවුනා... මං ඇස් ලොකු කරන් බලන් හිටියේ එයා දිහා...

"අඩන්න එපා... මං එයාව ගෙනියන්නේ නෑ" එයා එහෙම කිව්වේ මගේ ඔලුව අතගාලා...

පොඩි ලමයෙක්ට එයා ආසම අයිස්ක්‍රීම් එක ගෙනත් දුන්නම වගේ මං එයා දිහා බලලා හිනාවුනා... එයත් මං

දිහා බලලා ලස්සනට හිනාවෙලා කාමරේට ගියා... මං තාමත් එයා ගියා බලන් හිටියේ තාමත් ඒ හිනාව පිටින්...

" ඒ මොකක්ද සුදූ ඒ උනේ.... මට පේන හැටි වැරැද්දක් ද නැත්තම් දැක්ක හැටි වැරැද්දක් ද"

මං පියවී සිහියට ආවේ අයියගේ කටහඬින්... ඒත් මොක්කද ඒ කිව්ව අපභ්‍රන්සේ පේන හැටි ??? දැක්ක හැටි???? දෙකම එක නෙවෙයි ද

" ආ නෑ මං අහන්න ගියේ මට පේන හැටි වැරැද්දක් ද නැත්තම් අරුගේ ඔලුව කොහෙහරි වැදිලද"

"මං හිතන්නේ ඊයේ හොස්පිට්ල් ගියපු වෙලේ මූලග්ගින්නට ඉන්ජෙක්ශන් ගහලද කොහෙද "

“ඔව් ඒකනන් වෙන්න පුලුවන් තමයි... මොනා උනත් මට මාර සතුටුයි සුදූ... ඌ ටික ටික වෙනස් වෙනවා.. ඔක්කොම ඉතින් අපේ ආරූ කෙල්ල නිසා තමයි... ඔයා දන්නවද සුදූ ඔයාගේ වෙලාවේ තියනවාලු යන යන තැන හිනාවෙන් පුරවනවා කියලා.... මං ජෝතිශ්‍ය ගැන විශ්වාස කරන්නැති උනාට ඒකනම් විශ්වාස කරන්නම වෙනවා.. "

අයියා එහෙම කිව්වාම උඩ ගියපු පාර මගේ ඔලුවත් වහලේ වැදුනා දැන් ඉතිම් මේකෙන් ප්‍රයෝජනයක් ගන්න ඕනේ.... අයියා නැගිට්ට ගමන් මං එයාගේ කරට පැන්නා...

"අම්මෝ තව පොඩ්ඩෙන් මගේ කොන්ද ඉවරයි බන්... මොකද මේ.."

"ලූනු කරේ යං "

“තාම පහ වසරේ නෙවෙයි සුදූ ඔයා ඉන්නේ... "

"ඉතිම් මං පහේදි ඔයා 11 හේනේ ඒකාලෙත් ගෙනිච්ච නම් දැන් බැරි ඇයි... මහලොකුවට ජිම් යනවා නේද... යං යං "

අයියා මාව පිටේ තියන් කුස්සියට ආවා... චූටිත් එක එක කෝලන් දන් අපේ පස්සෙන් ආවා...

---

නිදගන්න ගියාට නින්ද යන්නේ නෑ... හැමවෙලාවෙම මතක් වෙන්නේ එයා මගේ ඔළුව අතගාපු හැටි... ඒ ලස්සන ඇස්වලින් මං දිහා බලපු හැටි... කොහොම අමතක කරන්නද දෙය්යනේ... ඇදේ එයාට මෙහාට හැරී හැරී හිටියා... මොකක්ද හේතුවකට එයාගේ මූන දකින්න ඕනේ උනා මේ දැන්මම... හිත හරිම නොසන්සුන්....

කාමරේ හද එළිය නිසා ආලෝකමත් වෙලා... ජනේලෙ බීරලු අතරින් අහස ලස්සනට පේනවා... ඒත් එක්කම මට

මතක් උනේ මේ වෙලාවට තිතිනු අයියා එලියේ ඉන්නවා නේද කියලා.... සිගරට් බොන්න යනවනේ...
මං දඩිබිඩ් ගාලා නැගිටලා දෙර ලගට ගිහින් ආපහු හැරිලා ඇවිත් ඇදන් හිටපු ස්කිනර් එක උඩින් ටී ශර්ට් එකක් දාගත්තා... තවපොඩ්ඩෙන් අමතක වෙනවා..

හිතුවා වගේම කුස්සියේ දෙර ඇරලා... මං පොඩ්ඩක් ඔලුව දාලා බැලුවා..... එයා වෙනදා තැනම ඉන්නවා සිගරට් එකත් අතේ තියන්... හැබැයි අද තනියම නම් නෙවෙයි චූටිත් එයා ලගට වෙලා අහස දිහා බලන් ඉන්නවා... සීතල හුලගක තාලෙට එයාගේ කොන්ඩේ එහාට මෙහාට යනවා... කියන්න තේරෙන්නැති හැඟීම් ගොන්නක් හිතපුරාම දුවද්දි මං ඇතිවෙනකන් ඒ රූපේ රස වින්දා... ඒත් මගේ දැහැන බිදුනේ චූටි මාව දැකලා බුරන්න ගත්ත නිසා.. තවත් මෙතෙන හිටියොත් ලැජ්ජවෙන නිසා මං දැන් ආවා වගේ එයාලා ඉන්න තැනට ආවා...

"අහලා නැද්ද සිගරට් බොන අයට වඩා ලග ඉන්න අයටයි හානී වෙන්නේ කියලා.... මේ අහිංසකයත් ලග තියන් කැහිකූර ගහනවා... "

මං එයාට බොරුවට ඔරෝලා අතේ තිබ්බ සිගරට් එක අරන් බිමට දාලා පෑගුවා ෆිල්ම් වල වගේ... සනීපයි කකුල පිච්චුනා...

"ආඅව් අම්මා......"

නිතිනු අයියා තොල් දෙක එකට කරන් හිනාව පාලනය කරගත්තා.... අර්ර්ර් මෝඩයා... මං තනි කකුලෙන් හිටගෙන බිත්තියට හේත්තු වෙලා අනික් කකුල දිහා බැලුවා..... ඒත් එක්කම නිතිනු අයියා ගේ ඇතුලට ගියා... දුක නොහිතුනා කිව්වොත් නම් බොරු... ඒත් ඉතින් එක පාරක් හොඳින් කතා කරා කියලා හැමදාම බලාපොරොත්තු වෙන්න බෑනේ.....අනික මං එයාගේ සිගරට් එකත් විසි කරානේ....

කොහොමහරි පැන පැන වතුර එකක් ජොග්ගුවට අරන් එලියට ඇවිත් හෙමීට වක්කරා.. ගලා යන ජලයට නේ අල්ලන්න කියන්නේ... වොශ් රූම් එකට යන්න බයයි එකේ මැද්දේ වැටුනොත් එහෙම... ඇත්තමයි මට සෙනසුරු ඒරාශ්ටකේ ද මන්ද.. කොයි වෙලේ බැලුවත් ලෙඩක්

මං වතුර දලා ඉවරවෙලා හැරෙද්දිම දෙර ලග හිටියේ නිතුනු අයියා.. මං බය වෙච්ච පාර වැටෙන්නත් ගියා...

" මොකද මෝඩයෝ භූතයෙක් වගේ ඔතන හිටන් ඉන්නේ... තවපොඩ්ඩෙන් මට හාට් ඇටැක් හැදෙනවා.. "

එයා බුම්මගෙන ඇවිත් මගේ අත අරන් ඒක උඩින් ක්‍රීම් එකක් තියලා යන්න ගියා... එතකොට එයා ඒක ගේන්නද ගියේ... බොරුවටනේ බැන්නේ හැම එකටම බෙහෙත් දන්නවා ඩොක්ටර් බූතයෙක් වැහිලද මන්ද..

# 10 කොටස

කාලය ගෙවිලා ගියේ හිතන්නවත් බැරි වේගෙන්.. නිතිනු අයියා අපේ ගෙදර ඇවිත් දැන් මාසයක් විතර වෙනවා.. දැන් ඉස්සර තරම් නපුරු නැති උනත් සමහර වෙලාවට වෙස් පෙරලෙනවා...

බස් එකෙන් බැහැලා ගෙදරට එනගමන් මං කල්පනා කරේ අද ශනූ කියපු දේ ගැන

"උබ මොකක් හරි කතාවක් පටන් ගත්තොත් ඉවරවෙන්නේ නිතිනු අයියගෙන්... මට පේන්නෝ ආරු උබ එයාට ආදරේ කරනවද කොහෙද "

ඒ වෙලාවේ මං ශනූට බැන්නත් අනේ මන්ද හැම වෙලාවෙම ඒක මතක් වෙනවා.. බැරි වෙලාවත් එයා කියපු දේ ඇත්තක්ද... නෑ නෑ එහෙම වෙන්න බෑ... මං එයාට අනුකම්පා කරනවා.. ඔව් ඒක තමයි... මට එයා ගැන තියෙන්නේ අනුකම්පාවක් නැතුව ආදරයක් නෙවෙයි....

මං පියවි සිහියට ආවේ ඉස්සරහින් යන මිනිස්සු දෙන්නගේ අසභ්‍ය වචන හුවමාරුව නිසා..

"මොනා උනත් මොහානයා හොඳ එකා... කරට් කැඩෙන්න ගහන්න ගල් ගෙනාවා නේ... නැද්ද මචන් "

සරමක් ඇඳගත්ත මනුස්සයා අනික් මනුස්සයාට කියන්නේ...

"නැතුව නැතුව හු$$ කාලෙකින් ඇති පදමට ගැහුවා... "

වැනී වැනී යන ඒ දෙන්නා දැක්කම බයක් හිතුන නිසා මං මගේ වේගය බාල කරා... අතුරු පාරක් නිසා පේනමානෙක කවුරුත් නෑ... පාර දෙපැත්තෙම ගෙවල් තිබ්බත් මේ වෙලාවට බොහෝදුරට මිනිස්සු නෑ... මොකද වැඩට යන මිනිස්සු ගෙදර එනකොට රෑවෙන නිසා.... අනික හැමතැනම තාප්ප ගහල නිසා පේන්නෙත් නෑ... මගේ පපුව මටම ඇහෙන තරම් වේගෙන් ගැහෙනවා...

"අද නම් ෆුල් ආතල් එකක් ගත්තේ... තව බඩුවක් වත් සෙට් උනා නම් සුරලොකෙම යන්න තිබ්බා... "

"සල්ලි නෑ බන් ඕවට... වේලි වේලි ඉන්නේ..."

ඒ මිනිස්සු දෙන්නගේ වචන වලට මගේ බය තවත් වැඩි උනා... ඒත් එක්කම කලිසමක් ඇඳන් හිටපු මිනිහා පිටිපස්ස හැරිලා බැලුවේ මගේ ඇගම සීතල වෙලා ගියා...

"බඩු මොකටද හු$$$ අර එන්නේ රෝස මලක් දැක්කම වෙරිත් හිදෙනවා..."

ඒ මිනිහා කිව්වේ මගේ ඇඟ දිහා කෑදර බැල්මක් හෙලන ගමන්... මං පාරේ අනෙක් අයිනට ගිහින් පය ඉක්මන් කරේ කොහොමහරි මෙතනින් බේරිලා ගෙදර යන්න හිතාගෙන... ඒත් මට කලින් උන් දෙන්නා ඉක්මන් උනා...

"මොකද කෙල්ලේ හදිස්සි... කැමති නැද්ද සුරලෝකෙ ගිහින් එන්න... කොන්ඩේ ගහක් දෙකක් පැහුනට අපිත් එලකොල්ලෝ තමයි... "

"අම්මෝ චීස් කෑල්ල වගේ... බලපන්කෝ ඇඟ මෙතනම රස බලන්න හිතෙනවා... "

මට යන්න නොදී උන් දෙන්නා මගේ පාර හරස් කරගෙන ඉන්නේ... මගේ ඉහින් කනින් දඩිය දාන්න පටන් ගත්තේ කදුලු පොකුරු පිටින් ගලද්දී....

"මට යන්න දෙනවා... මගේ අයියා තමුසෙලාව මරලා දායි මොනාහරි උනොත් මට"

වචන අල්ලගන්න පුලුවන් තත්පරේ මං කිව්වේ... ඒත් මට ලැබුනේ සමච්චල් හිනාවක්

"බලපන්කෝ මේනක මේකිගේ අයියා අපිට මොනාද කරනවලු මට බයෙත් බෑ... "

"අයියා එනකොට නංගි ඉදීද කවුද දන්නේ... මෙන්න මේකිව උස්සගනින්"

ගෙදර යන අදහස අත්හැරපු මං අනෙක් පැත්ත හැරිලා දුවන්න හැදුවත් ඒ හැඩිදැඩි අතක ග්‍රහනයට ලක් වුනා.. මාව එතන තාප්පෙකට තියලා එක මිනිහෙක් මගේ බෙල්ලෙන් අල්ලගත්තා... ජීවිතේ කවදාවත් නැති තරම් මං බයවෙලා හිටියේ... කොච්චර දැගලුවත් නෑ මට බුරුලක් ලැබුනේ.... ඇගේම හය්ය දලා තල්ලු කරා... ඒත් ඒ මනුස්සයා හෙල්ලුනේවත් නෑ...

"බලෙන් රස බලන එක පට්ට ආතල් වගේ බන්... "

මගේ බෙල්ලෙන් අල්ලන් හිටපු මනුස්සයා අනෙක් මනුස්සයාට කිව්වේ හිනාවෙවී... කෙල්ලෙක් ආත්ම ගරුත්වය බේරගන්න දගලන එක උන්ට විහිලුවක් වෙලා..

"අතැරපන් තිරිසනා.. මට යන්න දීපන්... තොපිලට අක්කලා නංගිලා නැද්ද... "

"අක්කලා නංගිලා හිටියය උන් එක්ක නිදගන්න බෑනේ කෙල්ලේ... ඒකනේ උඹව හොයාගත්තේ..."

මට ඒ මිනිහා ගැන දැනුනේ දරාගන්න බැරි පිලිකුලක්.. කොහෙද්දෝ තිබ්බ ශක්තියක් ඇගට එද්දි මං කකුල නවලා යටිබඩට වේගෙන් පාරක් ගැහුවේ ඒ මිනිහා බඩ අල්ලන්

බිමට නැවෙද්දි... ඒත් එක්කම මත් එතනින් පැනගන්න හදද්දි අනෙක් මිනිහා මගේ කොන්ඩෙන් අල්ලා ගත්තා... ලස්සන දිග කොන්ඩෙම මට මාරක අපලයක් උනා... ආයෙත් මාව තාප්පෙට හේත්තුවෙද්දි දරාගන්නවත් බැරි තරම් වේගෙන් කම්මුල් පාරක් වැදුනේ මට හිතන්නවත් තත්පරයක්වත් නොතියා...

"තෝ බැ$ල්$ලි බලපිය මං තොට කරන දේ... මං තෝව නොමරා මරනවා.. තොට මං පෙන්නන් අපාය මොකක්ද කියලා.... මේ වගේ ලස්සන කදක් ගන්න මොනරු එය් පාවෙලා... මේනක මේකිව අරන් යමන් උබේ තැනට... මුලින්ම මට මේකිව ඕනේ.... "

"අනේ මට යන්න දෙන්න ප්ලීස්... මං කාටවත් කියන්නේ නෑ... "

මං අත්දෙක එකතු කරලා ඒ මිනිස්සුන්ට වැන්දේ කොහොමහරි මගේ ආත්මගරුත්වේ බේරගන්න හිතාගෙන... ඒත් ඒ තිරිසන්නුන්ට මගේ විලාපෙන් වැඩක් තිබුනේ නෑ... උන් හිටියේ ආශාවෙන් අන්දවෙලා...

"යන්න දෙන්න හහ් හා යන්න දෙන්න තමයි හිටියේ සැපක් අරන්... ඒත් ඉතින් දැන් ඒවා සුම්මා"

එහෙම කියලා එක මිනිහෙක් මාව උස්සගන්න හදද්දි කාර් එකක් ඇවිත් එතනින් නැවැත්තුවෙ උන් දෙන්නා කලබල

වෙද්දී... කාර් එක බැහැලා ආපු නිතිනු අයියා දකිද්දි තමයි මගේ ඇගට ලේ ටිකක් ඉනුවේ... මං අර මිනිහවත් තල්ලු කරගනම දුවන් ගිහින් නැවතුනේ නිතිනු අයියා ලග...ඉකිගගහා අඩ අඩා මං එයාගේ විසල් පපුවට තුරුල් උනා... තාත්තිගෙන් දැනෙන ආරක්ශාව ඒ විදිහටම දැනෙද්දි මං තව තවත් ඒ පපුවට තුරුල් උනා... මෙච්චර වෙලා දැනුන අසීමිත බය කදුලු වලට හරවලා එයාගේ ශර්ට් එක තෙමෙනකන් ඇඩුවා... මුලින්ම ගල් පිලිමයක් වෙලා හිටපු එයා මගේ උරහිස් වටා අත්දලා මාව ලංකර ගත්දි මට දැනුනේ හරියට "බය වෙන්න එපා මං ඔයාට මුකුත් වෙන්න දෙන්නෑ " කියනවා වගේ...

"ආරු උන් ගියා... අපි ගෙදර යන්... කාර් එකට නගින්න"

එයා කියන දේ ගැන අවදනේ යොමු කරන්න මට ඕනේ උනේ නෑ... මට ඕනේ උනේ ඒ පපුවෙන් දැනෙන ආරක්ශාව විතරය්.. මන් තවත් තදට තුරුල් උනා... ඒත් එයා මගේ අත් දෙකෙන් අල්ලන් මාව එයාගේ ඇගෙන් ඈත් කරා... තාමත් කදුලු බේරෙන ඇස් වලින් මං එයා දිහා බැලුවා...එයා මගේ දිහා බලලා මගේ කදුලු පිහදැම්මා.. පිහදපු කම්මුල් ආයෙත් කදුලු වලින් තෙමෙනවා..

"අපි ගෙදර යං.. ගිහින් අයියට කතා කරමු ම්ම්ම්... කෝ නගින්නකෝ කාර් එකට.."

එයා කටින් කියපුවට වඩා මට තේරුනේ ඇස් වලින් කියපු දේවල්... මං එයාට අවනත වෙලා කාර් එකට නැග්ගා... එයා මන් ඉන්න පැත්තේ දොර වහලා අනික් පැත්තෙන් ඇවිත් ඉදගන්න ටික මට දැනුනේ කල්පයක් වගේ... ආපු ගමන් මං ඒ අත අරන් පපුවට තුරුල් කරගත්තා.... එයා බය වෙලා වගේ මං දිහා බැලුවා..... ඒත් මට ඒ ගැන හිතන්න ඕනෙ උනේ නෑ... කොටින්ම මේක හරිද වැරදිද මොකක්ද මට වැඩක් නෑ... මට ඕනෙ උනේ බය නැති කරන්න ශක්තියක් විතරයි.. පපුව ගැහෙන වේගේ සාමාන්‍ය අතට ගන්න...

ගෙදරට ඇවිත් එයා මගෙන් යතුර ඉල්ලුවත් මට ඒක ගැන මතක් කරන්න සිහියක් තිබ්බේ නෑ... එක අතකින් එයාගේ අත තුරුල් කරන් වෙව්ලන වමතින් මං මගේ බෑග් එකේ තිබ්බ සේරම එකින් එක එළියට ඇද්දේ යතුර මගේ ඔඩොක්කුවට වැටිලත් ගානක් නොවෙද්දි...

"නංගි රිලැක්ස්.. උන් ගියා... ඔයා දැන් සේෆ්.. මිම්මි දැන් බය වෙන්න දෙයක් නෑ... අපි අයියට කතා කරමුකෝ.. එයා ආවම සේරම හරි.. එතකන් මං ඔයාගේ අයියා කියලා හිතාගන්නකෝ... මං ඔයාට මුකුත් වෙන්න දෙන්නේ නෑ... කෝ දැන් මගේ අත අතාරින්න.. මං ගේට් එක ඇරලා ඉක්මනට එන්නම්..."

එයා අනෙක් අතෙන් මගේ ඔලුව අතගාන ගමන් කිව්වත් මං එයාගේ අත හය්යෙන් අල්ලගෙන ඔලුව දෙපැත්තට

වැනුවා... මට එයාට යන්න දෙන්න බයයි.. ඒ ඩිංගටත් කවුරුහරි ඇවිත් මාව අරන් යයි කියලා හිතෙනවා... එයා කොහොමහරි හෙමින් අත නිදහස් කරගෙන කාර් එකෙන් බැස්සා... මාත් කාර් එකෙන් බැහැලා එයාගේ පස්සෙන් ආවා... ගෙට් එකට යන්න තියෙන අඩි පහ හයත් මං ගියේ එයාගේ අත අල්ලන්.. එයා ගේට් එක අරිනකන් මං එයාගේ ශර්ට් එකෙන් අල්ලගෙන පාර දෙපැත්ත බැලුවා..... මං ගැස්සිලා ගියේ නිතිනු අයියා මගේ උරහිසෙන් අත තියපු නිසා.. එයා මන් දිහා බලලා ලොකු හුස්මක් පිට කරා...

ගේ ඇතුලට ගිහින් මාව වාඩි කරවලා එතනින් යන්න යද්දී මං එයාගේ අතින් අල්ලගත්තා... මේ වගේ වෙලාවට එයා ගෙදර එන්නේ මොනාහරි අමතක උනාම.. ඉතින් එයා ඒ දේ අරන් යන්නද යන්නේ

"අනේ යන්න එපා මාව දලා... උන් ආයේ එයි... මට බයයි.. යන්න එපා... "

එයා ටික වෙලාවක් මන් දිහා බලන් ඉදලා මගේ ලගින් වාඩි උනා... මං ආයෙත් එයාගේ පපුවට තුරුලු උනේ එයා බයවෙලා වගේ බලන් ඉද්දි...

"යන්නෑ නේද... මට බයයි.. "

මං හිමීට අකුරු ගලපද්දි එයා මගේ ඔලුව අතගෑවා...

"හෙලෝ ආරාධ්‍ය ඉක්මනට ගෙදර එන්න... පොඩි හදිස්සියක්.. "

.....................

"නෑ නෑ ලොකු ප්‍රශ්නයක් නෑ ඒත් උබ ඉක්මනට එනවනම් හොදයි... මේ වෙලාවේ ආරුට උබව ඕනේ.... "

.....................

"අපි ගෙදර ඉන්නේ උබ වරෙන්කෝ.. මං තියනවා... "

ගේට් එකත් ඇරන් කවුරුහරි එන සද්දෙට මට තවත් බය හිතුනා... ඒ මිනිස්සු ගෙදර හොයාගෙන ඇවිත්ද නිතිනු අයියට ගහලා මාව අරන් යයිද.. ගේට් එක වැහුවෙත් නෑ දෙර වහලත් නෑ... එක එක විකාර හිතේ මැවෙද්දි මං තව ටිකක් නිතිනු අය්යට ලංවුනා.... ඒත් ඒ ආවේ අයියා කියලා දැක්ක ගමන් මගේ කදුලු අලුත් වෙලා වාන් දන්න පටන් ගත්තා... නිතිනු අයියාව අතෑරලා මං දිව්වේ අයියා ලගට.. එයාගේ බෙල්ලේ එල්ලිලා ඉනවටේ කකුල් ඔතාගෙන හයියෙන් ඇඩුවා...

"සුදු... මොකද උනේ.... ඇයි මේ ඇයි ආරු මේ තොල ඉදිම්ලා මූනේ ඇගිලිපාරකුත් තියනවා... මාව බය කරන්න

එපා නංගි.. ඇයි මේ... තිතුනුවා කියපන් මගේ නංගිට මොනාද උනේ මට කියපන් එක එක විකාර හිතෙනවා බන් මට.. සුදූ කියන්න මැනික මට.. මොකද උනේ.... "

අයියා හොදටම බය වෙලා... මට කියන්න ඕනෙ උනත් කියන්න විදිහක් නෑ... අඩලා වැඩි නිසා හුස්ම හිරවෙනවා...

"ආරාද්‍ය මෙතනින් ඉදගනින්කෝ... බයවෙන්න එපා මුකුත් උනේ නෑ... "

"මුකුත් උනේ නැත්තම් ඇයි සුදූ අඩන්නේ.. ඇයි මූන තුවාල වෙලා.. මට කියපන් මොකද උනේ.... "

"නංගිට මොක්කුද එවුන් දෙන්නෙක් කරදර කරන්න හැදුවා... හොද වෙලාවට මං එතනින් ආපු නිසා බේරගත්තා... එයා ගොඩක් බයවෙලා ඉන්නේ ඒකයි"

"මොකක්... මොක්කුද ඒ තිරිසන්නු මං ඕකුන්ව මරනවා අද.. උන් කොහොමද මගේ නංගිට අත තියන්නේ... මං ඕකුන්ව පෙති ගහනවා... කාලකන්නි.."

අයියා හයියෙන් කෑ ගහද්දි මට තවත් බය හිතුනා... එයා කවදවත් එහෙම කෑ ගහලා නෑ...

"මචන් රිලැක්ස් පො....

" රිලැක්ස් වෙන්නේ කොහොමද යකෝ මේ මගේ නංගි.. මගේ පන... අම්මටත් වැඩිය මං ආදරේ මේකිට.. අපි මේකිව හැදුවේ මලක් වගේ බන්... තැලිලා පොඩිවෙලා නෑ පොඩ්ඩක්වත්.. මගෙ පොඩි එකී.."

අය්යගේ හඩ බොද වෙලා එයා අඩනවද....

"මට තේරෙනවා උබ කියන දේ... ඒත් පොඩ්ඩක් බලපන් නංගි ඉන්න විදිහ.. එයා බය වෙලා ඉන්නේ... දැන් පැයකටත් වැඩී... තාම අඩනවා.... හුස්ම හිරවෙයි ඔය කෙල්ලගේ... ඉස්සල්ලා එයාව නලවලා ඉදපන්..."

අයියා මාවත් අරන් වාඩි උනා...

"සුදූ කෝ අඩන එක නවත්තන්නකො අයියා ඉන්නවනේ ම්ම්ම්.. මගේ නංගිට මුකුත් වෙන්නේ නෑ... අඩලා ඔයා ලෙඩ වෙයි සුදූ... අපේ ආරූ කෙල්ල ස්ට්‍රෝන්ග් නේ නේද... අඩන්න එපා දැන්."

කදුලු පොඩ්ඩක් අඩු උනේ අයියා ලග ඉන්න නිසා.. එයාගේ ඔඩොක්කුවෙන් ඉදන් උරහිසෙන් ඔලුව තියාගත්තේ සැනසීම හෙමින් මං කරා එද්දී

# 11 කොටස

"උබට පිං බන් මගේ නංගිව බේරගත්තට.. මං දන්නෑ උබට කොහොම ස්තූති කරගන්නද කියලා.... "

"ඇති බන් දැන් ඕක කී සැරයක් කිව්වද... අනික උබ කරල තියන උදව් වල හැටියට මේක මොකක්ද"

"මං එනකොට සුදූ උබව බදාගෙන නේද හිටියේ... සොරි බන් මුකුත් හිතන්න එපා... කෙල්ල බයවෙලා ඉන්න ඇත්තේ... ඒකයි"

"ඒකට කමක් නෑ බන්... "

මං සාලෙට එද්දි අයියයි නිතිනු අයියයි කතාවක.. දැන් නම් බය අඩු වෙලා... ඒත් හිතට නිදහස් නෑ... ලොකු බරක් දැනෙනවා හිතට.. ඔක්කොටම වඩා නිතිනු අයියට මූන දෙන්න ලැජ්ජයි.. ඒ වෙලාවේ මෙලෝ සිහියක් නැතුව තුරුල් වෙලා හිටියා වගේ නෙවෙයි දැන්නම් කන් වලිනුත් දුන් දානවා වගේ... ඒත් ඒ පපුවේ දැනුන උනුහුමට , ආරක්ශාවට හිත ලෝබකම් කියන්න පටන් අරන්...

මං එයා දිහා නොබලාම අයියා ලගට ගිහින් එයාව බදාගත්තා..

"සුදූ... ඔයා නැගිට්ටද... බලන්නකෝ අයියා පීසා ඕඩර් කරා... ඔයා ආසයනේ"

"මට ගෙදර යන්න ඕනේ.... "

"හ්ම්ම් අපි යන්කෝ... දැන් කාලා ඉන්නකෝ"

"බෑ මට තාත්තිව ලගට යන්න ඕනේ... හෙට යමු"

"ඇයි සුදූ තාම ඔයා බයේද ඉන්නේ... "

"නෑ ඒත් මට ගෙදර යන්න ඕනේ.... "

"හෙට උදේ පොඩි වැඩක් තියනවා... ඒක ඉවර කරලා අපි යමුකෝ"

"ඔයා කොහෙද හෙට යන්නේ.... මට බෑ තනියම ඉන්න "

"මං ශනූට කෝල් කරලා කියන්නම් එන්න කියලා.... වැඩේ ඉවර කරද්දි දවල් වෙයි සුදූ... ඉතින් රෑ යන්න බෑනේ බස්වල අපි අනිද්දා උදේ යමුද.."

"ඇයි බස් එකේ යන්නේ නිතිනු අයියගෙ කාර් එක තියෙන්නේ.. "

මං ඒක නම් කිව්වේ අය්යගේ මූන දිහා බලාගෙන..

"අය්යෝ මෝඩියේ නිතිනු අයියගේ කාර් එක අපිට දුන්නම එයා ඔෆිස් යන්නේ මොකේද"

අයියා කියන්නේ හිනාවෙවී... ඒත් මං අදහස් කරේ ඒක නෙවෙයි....

"ඇයි අපි එයාව දලද යන්නේ.... එයාවත් එක්ක යන් අපේ ගම පෙන්නන්න"

මං අයියා දිහා බලාගෙන එහෙම කිව්වාම අයියා නිතිනු අයියා දිහා බැලුවා.....

"නිතිනු උබ මොකද කියන්නේ යමන් අපේ ගමේ... පොඩි වෙනසකටත් එක්ක"

"ඕන්නෑ බන් උබ පලයන් නංගිත් එක්ක.. කාර් එක අරන් .. මං වාහනයක් ගෙන්නගන්නම්"

"උබට පිස්සුද යකෝ.. තොගේ වාහනෙන් අපිට වැඩක් නෑ උබට එන්න කිව්වේ... ලෑස්ති වෙයන් හෙට අර වැඩේට පස්සේ අපි ගෙදර යනවා... "

උදේම අයියා මගට ගිහින් ශනූව එක්කන් ආවා... වෙනදනම් එයා තනියම එනවා... ඒත් මට වෙච්ච දේ නිසා එයාට තනියම එන්න කියන්න බයයි.. අයියා එක්ක ශනූ හිනාවෙවී එද්දි මට පොඩ්ඩක් ඉරිසියා හිතුනා... ශනූට අයියලා නැති නිසා එයා අපෙ අයියට හරි ආදරෙයි.. අයියත් එයාට සලකන්නේ එයාගෙම නංගි කෙනෙක්ට වගේ... ඉතිං මට ඉරිසියයි..

ශනූයි අයියයි ගේ ඇතුලට එද්දිම වගේ නිතිනු අයියා කාමරෙන් එලියට ආවේ... ඔන්න ඔතනදි තමයි ශනූට වල දාගන්න හිතෙන වැඩේ උනේ....

"හායි... "

නිතිනු අය්යා ශනූ දිහා බැලුවේ හරියටම පලවෙනි දවසේ මට දාපු බැල්මෙන්මයි... කිසිම දෙයක් ඇහුනේ නෑ වගෙ එයා මන් දිහාට ආවා... ඊයේ ඉඳන් මං එයාට මූන දීලා තිබ්බේ නෑ... එක පාරටම එයා මන් දිහාට එනකොට ලොකු අපහසුතාවයක් මට දැනුනේ.. එයා මගේ ලගට ඇවිත් ඔඩොක්කුවෙන් මගේ බෑග් එක තිබ්බා... මට ලගින්ම පේන ඒ රූපේ දිහා මන් බලන් හිටියේ හැමදාම වගේ වශී වෙලා.. එකපාරටම මට මතක් උනේ මං එයාගේ තුරුලේ හිටිය හැටි... නුහුරු හැඟීමක් හිතපුරාම වෙලිලා යද්දි මං පියවී සිහියට ආවේ එයා එතනින් ගියපු නිසා..

දැන් තමයි බෑග් එක මතක් උනේ මට.. බෑග් එක උඩ තව ක්‍රීම් එකකුත් තිබ්බා... එයා එහෙමම එළියට ගියේ ශනූ දිහා බැල්මක්වත් පා නොකර.. ශනූ තාමත් හායි කියන්න අත උස්සගත්ත ගමන්... අයියත් නිතිනූ අයියගේ පස්සෙන් ගියා ශනූගේ උරහිසට තට්ටුවක් දලා... ගල් පිලිමේ වගේ හිටපු ශනූ මේ ලෝකෙට ආවේ අයියා අපි දෙන්නව ඇතුලට දලා දෙර එළියෙන් වහද්දි...

"ඒ මොකක්ද බන් ඒ උනේ.... ජීවිතේ පලවෙනි වතාවට මට මෙහෙම දෙයක් උනේ.... "

"ඒ නිතිනූ අයියගේ හැටි ශෙනූ මටත් ඔහොමයි.. මං කිව්වේ... "

ශනූ ඇවිත් මගේ ලගින් වාඩි උනා..

"පොලිසී ගියේ නැද්ද ආරු"

"ගනන් ගන්නේ නැති එකට පොලිසී යන්න පුලුවන්ද බන්... උබට විකාරද.."

ශනූ ඔලුවේ අතගහගත්තා...

"මෝඩියේ මන් ඇහුවේ.... ඊයේ වෙච්ච දේ ගැන.. අනේ උබ වගේ ගොනෙක්.."

එක පාරටම ශනු ඒක කිව්වාම මගේ මූනේ තිබ්බ හිනාව ශනිකව මැකිලා ගියා... ඒ අත්දැකීම මතක් කරන්නත් මං බයයි.. ශනුගේ උරහිසට හේත්තු වෙලා බොහොම අමාරුවෙන් කදුලු පාලනය කරගත්තා....

ශනු කියන්නේ ආදරනීය චරිතයක්.. එයා මත් වගේ නෙවෙයි බොලද නෑ... සමාජෙ එක්ක ගැටිලා අත්දැකීම් තියනවා... සමහරවිට එයා එදා ඉදන් කොලඹ පරිසරයේ හැදී වැඩුන කෙනෙක් නිසා වෙන්න ඇති.... එයා කිසිම දේකට බය නෑ අසාදුරනය වෙනුවෙන් ඕනෙම වෙලාවක නැගී ඉන්න කෙනෙක්.. එයාට මෙහෙම දෙයක් උනා නම් මං වගේ අඩ අඩ ඉන්න එකක් නෑ... ලෝකෙ කොහේ හරි ගිහින් යුක්තිය ඉල්ලයි... මම හිතන්නේ කෙල්ලෙක් ඉන්න ඕනේ එහෙමයි.. ඒත් මට ඒ තරම් පෞර්ශත්වයක් නෑ... ඒක මගේ දුර්වලතාවයක්.. මං දන්නවා..... තාත්තියි අයියයි මට තියන ආදරේ නිසා ඕනෙවට වඩා මාව පරිස්සම් කරා... එ නිසා මං වැඩුනේ බොලද සියුමැලි තරුනියක් විදිහට... ඒක හරිද වැරදිද මත් දන්නේ නෑ...

"දන්නෑ ශනු අයියා මොනාහරි කරයි."

"ඔව් මටත් හිතෙන්නෑ අයියා මේක නිකම් අතාරියි කියලා.... අම්මපා මං එතන හිටියා නම් ඕකුන් දෙන්නගේ අ'හ'ව'ල් එක කුඩුපට්ටන් වෙන්න දෙනවා... "

වෙන වෙලාවක නම් මට ශනු කියන ඒවට මට හිනා

යයි... ඒත් මේ වෙලාවේ හිනාවෙන්න තරම් හිත නිදහස් නෑ...

"හොයේ හොයේ මෙන්න නිතිනු අයියා මෙයාට බෙහෙත්තුත් දීලා ... අම්මෝ ඒ ආදරේ බලන්න එපැය්... "

ශනු කියන්නේ බෙහෙත් එකත් අතට ගන්න ගමන්

"අනේ පලයන් යන්න එහෙම දෙයක් නෑ... එයාට මං ගැන දුක හිතෙන්න ඇති.... "

"හරි හරි අපි එහෙම හිතමුකෝ. මේ ඒක නෙවෙයි නිතිනු අයියලූ නේ උබව බේරගත්තේ... පොරව දැක්කම හිතන්න බෑ එච්චර දෙයක් කරයි කියලා.... ඉතින් කියහන්කෝ හීරෝ ඇවිත් බියුටිව සේව් කරගත්ත එක්ස්පීරියන්ස් එක මොන වගේද කියලා.. අර හින්දි ෆිල්ම් එකක වගේ දුවල ගිහින් එයාගේ පිටිපස්සෙන් හිටගෙන ශර්ට් එකෙන් අල්ලන් හිටියද"

ශනු ඒක අහද්දි නම් මාව රතු වෙලා යන්නැති... නිතුනු අය්යා එතනට ආපු තැන ඉදන් නම් මතක් කරන්න මං හරි ආසය්... මං බිම බලාගෙන ඔලුව දෙපැත්තට වැනුවා...

"නිකම්ම කාර් එකට දන් එක්කන් ආවද... හප්පෝ මදැය් රොමැන්ටික් සීන් එකක් අහන්න හිටියා... "

"මං..... මං එයාව බදාගත්තා.."

දිනිති මන් දිහා බැලුවේ ඇස් දෙක ලොකු කරලා කටත් ඇරන්.. මං තාමත් බිම බලාගෙන

"නෑනේ.. උබ කියන්නේ අර ආඩම්බරකාරයාව උබ බදාගත්තා.. ? ඉතින් ඉතින් ඊට පස්සේ මොකද උනේ.... පොර උබව තල්ලු කරේ නෑනේ... යකෝ මන් හිතුවට වඩා උබ දුර ගිහින්නේ.."

"තල්ලු කරේ නෑ... ඔලුව අතගෑවා... "

"මොකක් ඔලුව අතගෑවා... එහෙනම් පූතේ මෙතන මොකක් හරි තියනවා... "

"අනේ එහෙම නෑ... ඒ වෙලාවේ මාව තව බයකරන්න බැරි නිසා එහෙම ඉන්න ඇති.... "

මං එහෙම කියලා එතනින් නැගිටල කාමරේට ආවේ ලැජ්ජ හිතුන නිසා....

"හරි හරි අපිත් මෙහෙනේ ඉන්නේ... බලමුකෝ.."

ශනු කෑ ගහද්දී මං කන්නාඩියෙන් බලන් තොල ලග තුවාලේ බෙහෙත් ගෑවා.... ඊට පස්සෙ ඒ ක්‍රීම් එකත් ෆස්ට් ඒඩ් බොක්ස්එකේ අනික් ක්‍රීම් දෙක ලගින්ම තිබ්බා...

"මොනාද මං උබ මේ ක්‍රීම් තුනක් බලන් හිනාවෙන්නේ... පිස්සුද... "

මංගැස්සුනා කන ලග ඉදන් ශනූ කෑ ගහපු නිසා.. ඇත්තටම මං ඒක දිහා බලලා හිනා උනාද... ?

මං ශනූගෙන් මූන හංගන්න ඕනෙවට නිතුනු අය්යා දුන්න මගේ බෑග් එක බොරුවට ඇවිස්සුවා

ඒත් ඒකේ මගේ වතුර බෝතලේ වෙනුවට තිබ්බේ ග්ලාස් වලින් හදපු ලස්සන බොට්ල් එකක්... ඒත් ඒක කොහොමද වෙන්නේ?? මේක කොහෙන්ද මගේ බෑග් එකට... නිතිනු අයියගේ එකක් වැරදිලා ආවද...?ඒත් එයාට කොහෙන්ද ගෑනු ලමයිගේ බොට්ල් එකක්... ? මගේ දහසකුත් ප්‍රශ්න වලට උත්තර හම්බුනේ ශනූගෙන්...

"වාව් උබ අලුත් බොට්ල් එකක් ගත්තද.. මාත් මේ ජාතියේ එකක් ගන්න හිටියේ... උබ කිව්වෙවත් නෑ ගත්තා කියලා...."

"ඕක මගේ නෙවෙයි ශනූ.."

"එතකොට ආරු කියන්නේ මන්ද?"

ශනූ කිව්වේ බොට්ල් එකේ එක සයිඩ් එකක ගහල තියන

නම පෙන්නලා... මං ඒ වෙලාවේ තමයි ඒක දැක්කේ... ඒ කියන්නේ නිතිනු අයියද මට ඒක ගත්තේ...?? මගේ ජ්ලග දැවෙන ප්‍රශනේ උනේ ඒක... ඒත් ප්‍රශ්න අමතක කරන බෙහෙත එතන්ට ආපු නිසා මට ඒක අමතක උනා... ඔව් ඔව් වූෆී තමයි එතන්ට ආවේ.

-----------------------------------

12 ට විතර අයියලා ගෙදර ආවා... ඒත් ඒත් ඒ දෙන්නා හිටපු විදිහ දැක්කම මගේ හුස්මත් හිරවුනා.

## 12 කොටස

අය්යගේ නලලෙන් ලේ එනවා තොල ලගත් තුවාල වෙලා...

"අනේ අය්යේ මොකද මේ උනේ.. ඇයි මේ තුවාල වෙලා... "

"මුකුත් නෑ සුදූ මේක පොඩි තුවාලයක් නේ... මේ ලේ ගෑවිලා තියෙන්නේ පේන තරම් ලොකු නෑ... බය වෙන්න එපා... ඉස්සල්ලා අපිට ගේ ඇතුලට යන්න දෙන්නකෝ.."

අයියා මොනා කිව්වත් මගේ බය නම් අඩු උනේ නෑ... මං දුවගෙන ගිහින් ෆස්ට් ඒඩ් බොකස් එක අරන් ආවා... අය්යව ඇදන් ගිහින් වාඩි කරවද්දි නිතිනු අයියත් ඇවිත් ඉස්සරහින් වාඩිවුනා... ශනූ දෙන්නටම වතුර අරන් ආවා...

අයියගේ තුවාලෙ සජිකල් දලා පිරිසිදු කරලා බෙහෙත් දැම්මා..... එයා කිවා හරි එච්චර ලොකු තුවාල නෑ... ඒත් මොනාද උනේ....

"මොනා කරන්න ගිහින්ද තුවාල උනේ අයියේ.. "

"පොඩි ඇක්සිඩන්ට් එකක් සුදූ... එක පාරටම වාහනයක් දාපු නිසා බ්‍රේක් කරා ඉතිම් ඔලුව වැදුනා.. "

"ශීට් බෙල්ට් එක තියෙද්දී කොහොමද ඔලුව වැදුනේ"

"ආ... මේ මේ ශීට් බෙල්ට් එක දගන්න අමතක උනා"

අයියා කිව්වේ මගේ ඇස් මග හරිමින්... එයා බොරුවක් කියන්නේ මට ඒක තේරෙනවා... අනික කවදාවත් එයා ශීට් බෙල්ට්ටෙක දන්නේ නැතුව යන්නෑ.....

"එහෙනම් නිතුනු අයියගෙත් තුවාල වෙන්නෙපැය්"

"ඇයි ඔය තුවාල වෙලා තියෙන්නේ.. "

අයියා කියපු සැනින් මං නිතිනු අයියා දිහාට හැරුනා... එයාගේ පිටි අල්ල තුවාල වෙලා... මං බලපු නිසා එයා හෙමීට අත හංගගත්තා...

"අත දෙනවා මෝඩයෝ බෙහෙත් දාන්න.. "

මං ටිකක් සැරෙන් කියපු නිසාද කොහෙද එයා අත දික් කරා... බයවුනා මං හිතන්නේ....

තුවාලේ වෙලා ගොඩක් වෙලා ගිහින් නිසා ලේ කැටි ගැහිලා.. සුද්ද කරන්න ටික වෙලාවක් යන නිසා එයාගෙර් අත එක අතකින් අල්ල ගත්තා... හෙමීට පිබ පිබ තුවාලෙට බෙහෙත් දාලා නැගිට්ටනකොට ශනු ඉන්නවා තොලත් හපාගෙන අමුතු හිනාවක් එක්ක.. දැන්නේ මතක් උනේ මං එයාගේ ඇත අල්ලගෙන තේ හිටියේ... තුවාලෙ දැකල මට මෙලෝ සිහියක් තිබ්බේ නෑනේ... මං ශනුගේ ඇසුත් මග හැරලා කාමරේට ආවා... ශනුත් කාන්දම වගේ මගේ පස්සෙන් ආවා...

"ආරු උබ දන්නවද මං නිතිනු අයියට වතුර එක දුන්නම එයා ඒක මට ටේබල් එක උඩින් තියන්න කිව්වා.... උබ දන්නවද ඇයි කියලා.... "

"ඇයි"

"වතුර එක ගද්දි මගේ අත ගෑවෙයි කියලා.. ඒත් උබ එයාගෙ අතින් අල්ලන්ම හිටියත් ඌ මුකුත් කරේ නෑ... ඒ මදිවට උබේ මූන දිහා කන්න වගේ බලන් හිටියා... මං නම් කියන්නේ නිතිනු අය්යගේ හිතෙ උබ ඉන්නවා... "

ශනු කියන කතාවේ වරදකුත් නෑ... එයා මුකුත් නොකියා අත දුන්නා මට.. අනිත් එක ශනු කියනවා වගේ එයා මං දිහා බලන් හිටියද... වෙන්න බෑ... එයා මොකටද මන් දිහා බලන් ඉන්නේ... ශනුගේ මනෝ විකාර.. එයා මං බෙහෙත් දානකං ඉන්න ඇත්තේ අයියා නිසා වෙන්න ඇති.... එදත් කිව්වනේ අයියා කරලා තියන උදව් නිසා මාව බේරගත්තේ කියලා....

"හරි එයාව පැත්තකින් තියමුකෝ අයියගේ තුවාලේ දැකලා ආපු කඳුලු නිතිනු අයියගේ අත දැක්කම අලුත් උනේ ඇයි... අනිත් එක පොඩි බබෙක්ට වගේ පිබ පිබ බෙහෙත් දාපු විදිහ... උබ එයාට කැමතියි ආරු.. මං උබේ හොදම යාලුවා... මට කොලේ වහන්න උබට බෑ... "

ශනු මොනාද මේ කියන්නේ... ඇත්තටම මට ඒ වෙලාවේ කඳුලු ආවද... මට මතක නෑනේ... ඒත් එයාව මතක් වෙන හැමවෙලාවෙම මට සතුටු හිතෙනවා... හීනෙනුත් එයාව පේනවා මට... මැවී මැවී පේනවා එයාගේ තුරුලේ හිටපු හැටි... ඔව් ඇත්ත මගේ හිතේ "අයියගේ යාලුවෙක්" කියන තැනට වඩා තැනක් තියනවා එයා වෙනුවෙන්... ඒත් ඒක ආදරේද?? මං කවදවත් විදලා නැති ආදරේ කියන හැඟීම

ඒ වගේ ද?? මං දන්නෑ... මං කිසිම දෙයක් තේරෙන්නේ නෑ...

——————————

මං එපා කියද්දිම අයියා ගමේ යන්න ලෑස්ති උනා තුවාල පිටින්ම... ඒත් එක අතකින් මට ඒ ගැන තිබ්බේ සැනසීමක්.. ඒ ශනූ කෝල් කරලා කියපු දෙ නිසා..

"ආරු මං කියන දේ අහලා බය වෙන්න එපා... අයියලා අද උදේ ගිහින් තියෙන්නේ උබට කරදර කරන්න හදපු උන්ට ගහන්න.. අයියා මාව දන්න ගියපු වෙලේ එයාට කෝල් එකක් ආවා... මං හිතන්නේ ඒ කෝල් කරේ ලෝයර් කෙනෙක් හරි පොලීසියේ යාලුවෙක් හරි.. එයා කතා කරපු දේවල් වලින් මට තේරුනේ... මං ඉන්නවා කියලා ගානක් ගියේ නෑ අයියට"

මට බයයි අයියට මන් හින්ද ප්‍රශ්නයක් වෙයි කියලා... ඉස්කෝලෙ යන කාලෙත් මගේ පස්සෙන් ඇවිත් වද දීපු කොල්ලෙක්ට ගහලා අයියට පොලිසි යන්න උනා... බොහොම අමාරුවෙන් ගොඩින් බේරගත්තේ ප්‍රශ්නේ... ඒත් මේ මිනිස්සු කම්ප්ලේන් කරොත් අයියගේ නම පොලිස් පොතේ ලියවෙයි.. ඊටත් වඩා ඒ මිනිස්සු මගේ අයියට කරදරයක් කරොත්

"මේ ආරුගේ බෝතලේ නේද... මේක මෙතන මොකෝ"

අයියා එහෙම කියද්දියි මං පියවී සිහියට ආවේ... අයිය හිටියේ ඉස්සරහ ශීට් එකේ... මමයි චූටියි පිටිපස්සේ ශීට් එකේ...

"ආ ඕක ඊයේ මං යතුර හොයද්දි වැටෙන්න ඇති.... "

"හ්ම්ම් ඒක තමයි පැලිලා තියෙන්නේ... "

ඒ කියන්නේ බෝතලේ පැලිලද.. ඒ නිසාද නිතිනු අයියා මට අලුත් එකක් ගෙනත් දුන්නේ... මං බෑග් එකේ තිබ්බ අලුත් බෝතලේ අතට ගත්තා...

"අයියා වතුර ඕනිද"

"කෝ දෙන්න"

මං බැලුවේ නිතිනු අයියා දිහා... එයා මොනාද කරන්නේ බලන්නමයි මං ඒක අයියට දුන්නේ.... එයා බොටිල් එක දිහා බලලා මදහිනාවක් මූනට අරන් පාර ඉස්සරහ බලා ගත්තා... ඒ කියන්නේ එයා ඒක මටම තමයි අරන් තියෙන්නේ

------------------------

අපි මොනරාගලට එද්දි රෑ වෙලා... පැය ගානක් තිස්සේ ඇවිත් ඇගට හරි මහන්සියි.. ඒත් කලුවර මැදින් පේන කදු පන්ති දකිද්දි දැනුනේ ලොකු සතුටක් දැනෙන්නේ... ගෙදර ආවා කියන හැගීම දැන්මම දැනෙන්න පටන් අරන්...

බිබිල කියන්නේ මොනරාගල දිස්ත්‍රික්කයට අයිති ගමක්.. අපි ගෙදරට එද්දී අම්මයි තාත්තියි මිදුලට වෙලා හිටියා... මම දන්නවා උදේ ඉදන්ම මග බල බලඉන්න ඇත්තේ... ඒ තමයි දෙමාපියන්ගේ ආදරේ... කිසිම දෙයක් ආපිට බලාපොරොත්තු නොවී අසීමිතව ආදරේ දෙන්නේ අම්මයි තාත්තයි විතරයි... අයියත් ඉන්නවා හැබැයි.

මන් කාර් එකෙන් එලියට ආපු ගමන් ආවේ තාත්ති ලගට.. ආවා කිව්වට දිව්වා... වදුරු පැටියෙක් වගේ එල්ලුනා එයාගේ බෙල්ලේ.... එයාත් මාව උස්සගත්තා පොඩි කාලේ වගේ තාමත් එයාට මාව දරාගන්න පුලුවන්... මාව ආරක්ෂා කරන ඒ මහා පවුර තාත්තා... ඒ ආදරේට ආරක්ෂාවට උපමා මට නම් හම්බෙලා නෑ...

"අනේ අනේ ඔයා පොඩි ලමයෙක් නෙවෙයි චූටි.... තාත්තිට ඔයාව බරයි..."

අම්මා කියන්නේ මගේ පස්සට එකක් ගහන ගමන්...

"අපේ නිමල් කොල්ලාට හොදට ෆිට්නස් තියනවා රේනුකා කෙල්ලේ.. නැද්ද නිමල් කොල්ලෝ.."

මං තාත්ති දිහා බලන් කියද්දි එයා මගේ මූනම බලන් ඔලුව උඩට පහලට කරා... තාත්ති මට අයියට වඩා ආදරෙයි.. ඒක ගෙදර හැමෝම දන්න රහසක්.. අනෙක් අතට අම්මා අයියට මට වඩා ආදරෙයි..
අපි ආපු සතුටට තාත්ති ගොලුවෙලා.. මාස තුනකින්නේ අපිව දැක්කේ... එයා පිරිමියෙක් නිසා සතුට දරාගෙන ඉන්නවා... ඒත් අම්මා නම් සතුට දැනටමත් කඳුලු කරලා ඉවරයි... එයා ගොඩක් සංවේදියි හරියට මං වගේ...

"අනේ අනේ ඔහොමද තාත්තිට කතා කරන්නේ... "
අම්මි කඳුලු අතරින් හිනාවෙනවා...

වෙනදනම් අයියා ආපු ගමන් එයාට තුරුල් වෙනවා.. අද එයා එහෙම නොකලේ නිතිනු අයියා නිසා වෙන්න ඇති.... එයාට දුක හිතෙයි කියලා වෙන්න ඇති....
ඒත් මන් නම් ගෙට ගියේ තාත්තිගේ කරෙන්මය්..

"ඒය් මෝඩි දැන්වත් බිමට බහිනවා තාත්තිගේ කොන්දේ අමාරුව හැදෙය් තමුසෙව උස්සන් ඉදලා.. අලිබබා.. "

පැහැදිලි ඉරිසියාව.. එහෙදි ආරු , සුදූ මෙහෙදි මෝඩි බූරි වෙනවා.. වෙනමොකටවත් නෙවෙය් ඉරිසියව තාත්තිට තාම 48 ය්.. ඒක මහලොකු වයසක් ඇය්.. ඔය ඒ වයසින් මිනිස්සු කසාදත් බඳින්නේ... අනික දෙය්යන්ගේ පිහිටෙන් මගේ තාත්තිට ඉහෙන් බහින ලෙඩක් නෑ... ඉස්සර මං

අම්මගේත් කරේ තමයි හිටියේ... ඒත් එක දවසක් අම්මා තාත්තිත් එක්ක කියනවා ආහුනා මට මාව වඩාගත්ත නිසා කොන්ද රිදෙනවලු.. ඒත් එයා මට වචනයක් කිව්වේ නෑ... එතකොට මං අට වසරේ.. එදායින් පස්සේ කවදාවත් මං එයාට වඩාගන්න කියලා නෑ..

මං අයියට විරිත්තලා එහෙමම හිටියා... නිතිනු අයියත් අහක බලන් හිනා වෙනවා.. ඒත් ඒ හිනාව ඇතුලේ තියෙන වේදනාව අඳුර ගන්න මට බැරි උනේ නෑ... එයාටත් එයාගේ පවුල මතක් වෙන්න ඇති.... අනේ ඇයි සොබාදහම එයාට ඒ තරම් ලොකු දුකක් දුන්නේ....

රෑ කෑමට හදලා තිබ්බේ කිරි කොසුයි, මඤ්ඤොක්කා කොල මැල්ලුනුයි, වැව් මාලුයි, බටු මෝජුයි.. මගෙයේ අය්යගේ ආසම කෑම... මට තාත්තිමය් කෑම කැව්වේ. අයිය ඉරිසියාවට මැදින් පැනපු නිසා තාත්ති දෙන්නටම කැව්වා... මට ඒත් එක්කම මතක් උනේ නිතිනු අයියව... මං හිතුවා හරි එයා පිගාන දිහාම. බලාගෙන ඉන්නවා... පව්...

එයා හිටියේ අම්මගේ එහා පැත්තේ නිසා මං ඉන්න තැනින් නැගිටලා අම්මා ලගට ආවා...

"අම්මා ඔයා මට කවන්න.. අරයා මැද්දෙන් පැන්නා... "

මං කිව්වේ බොරුවට අයියට ඔරවන ගමන්... අම්මා හිනාවෙලා මට බත් කටක් කැව්වා... ඒගාව කට

කවනකොට මං කටේ බත් පුරවන් අම්මට ඇහෙන් නිතිනු අයියව පෙන්නුවා...

"මං මේක කනකන් ඕක අරයට කවන්න"

මං එහෙම කිව්වම නිතිනු අයියා ඇස් ලොකු කරලා මං දිහා බලලා අම්මා දිහා බැලුවා..... අම්මා ලොකු බත් කටක් අරන් එයාට කැව්වා... එයා හරි ආසාවෙන් ඒක කෑවේ... ඒත් බත් කට කටට ගන්නවත් එක්කම කඳුලු පොකුරක් කම්මුල් තෙමාගෙන ගියා... ඒ කඳුලු වලට මට රිදුනේ නෑ කිව්වොත් බොරු... පපුවම දනවා වගේ... මං ආපහු හිටපු තැනටම ගිහින් ඉඳගත්තා.... කරන්න ඕනේ ඉතිරි ටික අම්මා කරයි...

"ඇයි පුතේ පුතාට අම්මා මතක් උනාද... අඬන්න එපා දරුවෝ ඔය බත් ටික හිරවෙයි... මං ඔයාගේ අම්මා කියලා හිතාගන්නකෝ... කෝ දෙන්න මං බත් එක කවන්න... "

අම්මා එයාගේ පිට අතගානවා... වම් අතින්

"ඔන්න අපේ මහත්තයා අපිට දැන් කොල්ලෝ දෙන්නෙක්ම ඉන්නවා... "

අම්මා එහෙම කියද්දි කඳුලු අතරින් නිතුනු අයියගේ ඇස් දිලිසෙනවා...

"ඔව් මේ හොටු කෙල්ලෝ වගේද හයේ හතරේ කොල්ලෝ දෙන්නෙක් ඉද්දි දැනෙන ආඩම්බරේ.. නැද්ද අම්මා.."

ඔන්න ඔන්න මිස්ට ආරාධ්‍ය දැන්නම් රෝන්ග් සයිඩ් යනවා...

"මං නැති උනා නම් අගේ දැනෙයි කෙල්ලෙක් ගේ අගේ නේද තාත්ති"

"ඔව් ඔව් මගේ කෙල්ලට කවුරුත් මොකුත් කියන්නෑ.. මට වතුර උගුරක්වත් දෙන්න ඉන්නෙ කවදහරි මගෙ කෙල්ල විතරයි.. "

"ඇයි දැන් අපි දෙන්නේ නෑ කිව්වද"

"ඒ උනාට උබලා කවදහරි ගෑනු කියන පදේට නටයි.. ඉතිරි වෙන්නේ කෙල්ල තමයි මට"

මන් අයියට දිව කරලා ඇද කරද්දි එයා ඔරවනවා.. ඒ අතරේ අම්මව සම්පූර්ණයෙන්ම නිතිනු අයියා බදු අරන්... එයා අම්මා දිහාම බලන් බත් කනවා... අම්ම කෙනෙක්ගේ ආදරයක් ලබන්න එයා කොච්චර ආසාවෙන් ඉන්න ඇත්ද... වෙන කෙනෙක් මගේ අම්මත් එක්ක හිටියනම් මට අනිවාර්යයෙන් ඉරිසියා හිතෙයි... ඒත් මට නිතිනු අයියා ගැන පොඩි ඉරිසියාවක්වත් දැනුනේ නෑ... දැනුනේ ලොකු

සතුටක්... මන් නිසා එයා සතුටින් කියන හැගීමට මං ගොඩක් ආසා කරා...

## 13 කොටස

ගෙදරදි අඩුම ගානේ 7.30 ටවත් නැගිටින්න ඕනේ.... නැත්තම් ගිහින් දෙලේ ඔබනවලු... තාත්ති තමයි කියන්නේ... හැබැයි තාම කරලනම් නෑ... ඒත් ඉතින් කියන්න බෑනේ ඇත්තටම උදේ පාන්දර දෙලේ එබුවොත් එහෙම ගල් වෙලා මැරෙයි මාව... ආදරේ වගේම තමයි එයාට තරහ ගියාම හරි වසයි..

බොහොම අමාරුවෙන් 7.45 ට නැගිට ගත්තා... නිදි විකාරෙන්ම කුස්සියට ගියේ අම්මව හොයන්.. කුස්සියට ඇතුලට නොගිහින් මග නැවතුනේ නිතිනු අයියා හිටපු නිසා..

"මේ මොනාද අම්මා.."

අම්මගෙන් අහන්නේ නිතිනු අයියා.. "අම්මා " කියලා නේද කිව්වේ...

"ඕවාට කියන්නේ හතාවාරිය කියල පුතේ... කොල කැදවලට දනවා... ගොඩක් ගුනයිලු.. ගැස්ට්‍රයිටීස් වලට, සෙමට, ස්නායු වලට, ඇස් වලට ඔය හැමදේකටම හොදයි... තරුන ලමයි ඔය වගේ දේවල් කෑමට එකතු කරගන්න ඕනෙ.. එතකොට ඉතිම් වයසට යද්දි ලෙඩක් දුකක් නැතිව ඉන්න පුලුවන්.. කොහෙද ඉතිම් කොලඹ පැත්තේ මේවා තියනවා කියලැයි... ඒකයි මං මේ ආපු වෙලාවේ කැද හදන්න ගත්තේ... "

අම්මා කියන හැමදේම එයා අවදනයෙන් අහන් ඉන්නවා... කැද හදන්න ගෙනාපු කොලෙන් කොලේ පෙන්න පෙන්න එයා විස්තර අහනවා.. අම්මත් හරි ආසාවෙන් කියලා දෙනවා... කොහොමත් අම්මා හරි ආසයි කෑම වල ගුන ගැන කවුරුහරි අහන් ඉන්නවම්... මොකද එයා උගන්වන සබ්ජෙක්ට් එකත් සෞඛ්‍යය නේ...

"පුතා පුලුවන් නම් මට සුදු ලූනු ගෙඩියක් අරන් දෙන්න"

"කොහෙද අම්මා තියෙන්නේ.. "

"ෆ්‍රිජ් එකේ ඇත්තේ පුතා... "

එයා ෆ්‍රිජ් එක ඇරලා ගත්තේ බී ලූනු ගෙඩියක්.. ඒක ගෙනිහින් අම්මට දුන්නා.... මං හිනාව පාලනෙ කරගෙන හිටියේ බොහොම අමාරුවෙන්

"ආ හ් මේක බී ලූනු ගෙඩියක් නේ පුතේ... ඉන්න මං පෙන්නන්නම් සුදු ලූනු "

අම්මා ෆ්‍රිජ් එකෙන් සුදු ලූනු ගෙඩියක් අරන් එයාට පෙන්නුවා... තිකමටවත් අම්මා එයාට හිනා උනේ නෑ...

"පුතා උයන්න දන්නේ නෑ නේද... කෑදයක් හදන්න වගේ දෙයක් ඉගෙන ගන්න.. කවදහරි වයිෆ් අසනීප වෙච්ච වෙලාවක හදලා දෙන්න පුලුවන්නේ... එතකොට එයා ගොඩක් සතුටුවෙයි.. වැඩට කට්ටිය හිටියට කමක් නෑ ඔයා අතින් දෙන දෙයක් එයාට හැමදේටම වඩා වටියි.. "

"තාත්ති අම්මට එහෙම හදලා දෙනවද"

මෙන්න බොලේ මෙයා අම්මව විතරක් නෙවෙයි තාත්තත් අයිති කරගන්න යනවා...

"ඔව් පුතේ... අසනීප වෙලා ඉන්න වෙලාවට එයා හදලා දෙන දේ තරම් රස කෑමක් මේ ලෝකෙ නැති තරම්.. සමහර වෙලාවෙට ලූනු වැඩියි... සමහර වෙලාවට ලූනු අඩුයි... ඒත් මට හරිම රසයි.."

අම්මා කියනකොට එයා හරි ආසාවෙන් අහන් ඉන්නවා... එතන ඉන්නේ වෙනදට රවන ගොරවන තිතිනු නෙවෙයි.. අම්මගේ ආදරේ හොයන. පොඩි කොල්ලෙක්... එයා

ලස්සනට හිනාවෙලා ඉන්නේ... ක්මිමුල් වල ගැහිලා.. මිරිකන්න හිතෙන තරම් හුරතල්..

"මට කැරට් ගාන්න නම් පුලුවන් අම්මා.."

ලොකු වැඩක් පුලුවන් වගේ එයා ඒක කිව්වේ...

"ආ ඒ මොකෝ කැරට් ගාන්න විතරක් පුලුවන්"

"එක දවසක් ආරු මට කැරට් ගාන්න කිව්වා මං දන්නේ නැති නිසා එයා කියල දුන්නා.... "

"අනේ අනේ අපේ දේනි පුතාගෙනුත් වැඩ ගන්නවද.. මේ කෙල්ලනම්.."

"නෑ අම්මා එද විතරයි.. අයේ මුකුත් කියලා නෑ අම්මා.."

"අම්මා" කියන වචනෙට ආස නිසාදෝ එයා හැම වාක්‍යටම අම්මා කියන කෑල්ල දනවා...

"ඔයා දන්නවද අම්මා එයා අන්තිම ටික ගාන්න කියලා දුන්න හැටි... "

"කොහොමද.."

"නංගි ඒක කටේ දගෙන මට කියනවා එහෙමලු අවසාන ටික ගාන්නේ.."

"මේ කෙල්ලනම් කවදා හැදෙයිද මන්දා.. තාම හැසිරෙන්නේ පොඩි එකා වගේ... ඇයි ඉතින් අයියයි තාත්තයි කොයි වෙලේ බැලුවත් හුරතල් කරනවනේ.."

"මං තාම පොඩ්යි තමයි... "

මං ඇතුලට ගිහින් අම්මව පිටිපස්සෙන් බදාගන්න ගමන් කිව්වේ...

"හොද පොඩි.. ඔය වයසෙදි මට අයියත් හම්බෙලා... "

"ඒ ඒකාලෙනේ අප්පා.. අනික තාත්තිට ඔයාව දැක්කම ඉක්මනටම බදින්න හිතෙන්නැති.."

"ඔව් ඉතින් අපි ඒ කාලේ ලස්සනට හිටියනේ.. පොඩ්ඩක් කන්නාඩියෙන් මූන බලන්නකෝ ගිහින්.. ගවුමක් වගේ ශර්ට් එකක් ඇදලා උඩටත් නැති පල්ලටත් නැති කලිසමක් ඇදලා... ඒ විතරක් නම් මදැයි ඔලුව උඩින් තවත් ඔලුවක් තියලා වගේ කොන්ඩේ..ඉතින් කොල්ලෙක්වත් බලයි ඇයි... අනික මෙතන මේ අයියත් ඉන්නවා... පිලිවලකට ඇදුමක් අදින්නකෝ චූටි බබා.. "

"අනේ මෙයා හිටියට මොකෝ මෙයා පිටකෙනෙක් යැයි..."

මං එහෙම කිව්වා නෙවෙයි කියවුනා..

"අ..මේ මං කිව්වේ අම්මමනේ කිව්වේ එයා ඔයාගේ පුතා කියලා.... "

මං කොහොමහරි බේරිලා කුස්සියෙන් එලියට ආවා... තව ඔතන හිටියොත් මං මොනා කියය්ද දන්නැ..

හවස අපි දෙලේ නාන්න ගියා... ගල් අතරින් ලස්සනට වතුරපාර ගලනවා.. ඒ සද්දෙ පවා මනසට සුවයක්.. ඒත් අද නම් මට මානසික සුවයක් උනේ ගමේ ලස්සන නෙවෙයි.. නිතිනු අයියගේ හිනාව..

නිතිනු අයියා කොහෙන්දෝ පැනපු මොකෙක්ද වගේ වටපිට බල බල ඉන්නවා... ඇයි ඉතින් කවද දැකපු දේවල්ද.. මන් හිතන්නේ ස්විමින්ග් පූල් එකේ ඇරෙන්න මෙහෙම තැනකින් කවදවත් නාලා නැතුව ඇති....

ගෙදර ඉදන්ම ශෝටකුයි ටී ශර්ට් එකකුයි ඇදන් ආපු නිසා මමනම් කෙලින්ම දෙලට පැන්නා... එහාට මෙහාට පීනලා මං නිකමට අනික් පැත්ත හැරුනේ.. හැබැයි නිතිනු අයියා දැක්කා විතරයි මට පිස්සු හැදුනේ නැති ටික

විතරයි..

එයා ශර්ට් එක ගලවලා අයියත් එක්ක දෙලට බහිනවා.. නිකම් ෆිල්ම් එකක හීරෝ කෙනෙක් වගේ ඇග.. ගානට මේන්ටේන් කරල තියෙන සික්ස් පැක් බොඩි එක.. දැක්කම පිස්සු හැදෙන්නේ නැතුව තියෙයැය්.. මං කටත් ඇරන් එයා දිහා බලන් හිටියා... අපේ අයියටත් තියෙන්නේ ජිම් ගිහිල්ලා හදා ගත්ත බොඩි එකක් තමයි... ඒත් නිතිනු අයියා ඇරෙන්න මට මේ ලෝකෙ දෙයක් පෙනුනේ නෑ... මගේ හිතුවක්කාර ඇස් ඒ උඩුකය පුරාම දුවනවා.. මේ දැනෙන හැඟීම් වල තේරුමක් මං දන්නේ නෑ... ඒත් මං හරි ආසයි ඒ හැඟීමට..

වතුර යටටම එබිලා හුස්ම හිරවෙනකම්ම හිටියේ සන්සුන් වෙන්න.. මතුපිටින් සංසුන් උනත් මගේ ඇස් මටත් හොරෙන් එයා දිහාට යනවා... එයා එක පාරක් වතුරෙ එබිලා උඩට ආවා... වතුර බේරෙන කොන්ඩේ එයා අතින් පිටිපස්සට කරා... හරියටම ෆිල්ම් එකක් පටන් ගන්නකොට හීරෝව පෙන්නනවා වගේ...
දැන්නම් මට හොදටම පිස්සු...

"හපොය් තමුසෙගෙ මේ බලු නගුට ගන්නවකෝ ආරු.. මගේ කටෙත් එක්ක"

මගේ අවට තවත් ලෝකෙයක් තියනවා කියලා දැන් තමයි මට මතක් උනේ.... අයියා එයාගේ මූනේ තියෙන මගේ

කොන්ඩේ අයින් කර කර කෑ ගහනවා... කොන්ඩේ දිග හින්ද මං කොහෙවත් කොන්ඩේ කොහෙවත්.. අනික රැලි කොන්ඩේ නානකොට තවත් දිගයිනේ... ඇත්තටම මට නම් මේක හරි කරදරයක්..

"ඒකනේ මං කිව්වේ මේක කපලා දන්නම් කියලා.. කොටට කපලා ස්ට්‍රේට් කරා නම් ලස්සනයිනෙ.. "

"කපනවා තමුසෙගේ බෙල්ල.. කොන්ඩෙට අත තිබ්බොත්.. තියන දේ අගේ නෑ තමුසෙට.. කොච්චර කෙල්ලෝ නහින්න හදනවද කොන්ඩේ නෑ කියලා.... "

මං අයියට ඔරවලා නිකමට නිතිනු අයියා දිහා බැලුවා... මෙන්න බොලේ මෙයත් මට ඔරවනවා.. එයාට හැදුනු පිස්සුව මොකක්ද..

අයියා කොහෙන්ද මන්ද ටෙනිස් බෝලයක් හොයාගෙන තිබ්බ නිසා අපි සෙල්ලම් කරා... අයියයි නිතිනු අයියයි එක පැත්තක මමයි තාත්තියි එක පැත්තක.. හැම සැරේම අපි දෙන්නා තමයි පැරදුනේ.. තියන තරහටත් එක්ක මං දෙන්නගෙම ටී ශර්ට් අරගෙන එතනින් පැන්නා...

යනකොට මගදි ඉස්කෝලේ කාලේ යාලුවෙක් හම්බුන නිසා මන් එයත් එක්ක කතා කර කර හිටියේ.. ටික වෙලාවකින් අයියයි නිතිනු අයියයි ඈතින් එනවා... අපේ අයියා නිකම් අතවරයකට ලක්වුනු ගෑනු ළමයෙක් වගේ

අත් දෙකෙන් පපුව වහන් එනවා නිතිනු අයියනම් දැන් ලෝකෙ බේරගෙන එන වීරයෙක් වගේ හෙන ගැම්මෙන් එනවා... මන් නිකමට බැලුවේ මගේ යාලුවා දිහා... කන්න වගේ බලන් ඉන්නවා නිතිනු අයියා දිහා... අර අපේ අයියත් හැන්ඩියා වගේ ඉන්නේ... එයා දිහා බලපන්කෝ ඒකත් නෑ නිතිනු අය්යා දිහාම බලන් ඉන්නවා... පුදුම ඊර්ෂ්‍යාවක් දැනුනේ මට

තත්පරයක් වත් නොඉද ආපස්සට හැරිලා මං ගියෙ අය්යලා ඉන්න පැත්තට.. අය්යලා දෙන්නා කටත් ඇරන් බලන් ඉන්නේ මං ගහන්න වගේ එන නිසා වෙන්න ඇති.... නිතිනු අයියගේ ටී ශර්ට් එක එයාගේ අතෙන් තියලා අයියගේ ටී ශර්ට් එකත් දීලා ගස්සගෙන ආවා එතනින්.. ආයේ යාලුවා දිහාවත් බැලුවේ නෑ...

"අපි හෙට යමු නේද සුදූ... දැන් ඇවිත් දවස් තුනක් වෙනවනේ.."

අයියා මගෙන් ඇහුවේ දවල්ට කෑම ගන්න ගමන්... මේ දවස් තුනේම නිතුනු අයියනම් හිටියේ අම්මා ලගම තමයි... ඉස්සර වගේ නෙවෙයි දැන් ඒ ඇස් දිස්නේ ගහනවා... අම්මත් මටත් වඩා එයාට ආදරෙයි ද කොහෙද්ෝ..

"අනේ අපි තව ටික දවසක් ඉමුකෝ අයියා.. "

"බැනේ සුදූ මගේ ලීව් ඉවරයි අනික ඔයාටත් කෝස් එකේ වැඩ තියනවනේ... "

"කෝස් එකේ වැඩ නම් ශනූගෙන් අහගන්න පුලූවන්නේ... අනික මේ නිතිනු අයියා ඉන්නේ එයානේ ඔයාගෙ බොස්.. එයාගෙන් ලීව් ඉල්ලගන්න... අනේ නිතිනු අයියේ තව දවස් දෙකක් ඉමුකෝ... ප්ලීස් ප්ලීස්"

"තව දවස් දෙකක් ඉදලම යමු ආරාධ්‍ය... මං එච් ආර් එකට ඉන්ෆෝම් කරන්නම්"

"හා එහෙනම් ඉමුකෝ... "

අම්මා නිතිනු අයියගේ ඔලූව අතගානවා... මේක හරි කෝලමක් උනානේ....

"ආ අම්මට දැන් අපිව මතක නෑනේ... ආපු වෙලාවේ ඉදන් එයාවමය් ලග තියන් ඉන්නේ..."

"මං ඒත් බැලූවා මොකද පරක්කු කියලා.. වෙනදට මං පොඩි බබෙක්ව අතට ගත්තත් ඉරිසියා කරන එක්කෙනානේ"

"මං එහෙම නෑ "

"අනික ඔයාට වඩා නිතිනු අයියා හොදයි තමයි... ඔයා මං කියන දෙයක් අහනවත්ද.. මට වෙන කෙල්ලෙක් හිටියනම් එයාට බන්දලා දීලා මගේ බෑනා කරගන්නවා.."

"ආ... ඇයි වෙන දුවෙක්.. මොකක්ද මගේ තියන අඩුව"

කිව්වා නෙවෙයි මගේ කටට බ්‍රේක් නැති උනා... අම්මයි අයියයි තාත්ති නිතිනු අයියයි ඔක්කොමල ගල් ගැහිලා මං දිහා බලන් ඉන්නවා... වලක් කපලා වලදගන්න හිතෙනවා දැන් නම්..

"ආ මේ මේ මන් ඒක නිකම් කිව්වේ.. මේ එච්චර හිතන්නැතුව කිව්වේ... අම්මා වෙන දුවෙක් එහෙම හිටියනම් කිව්ව නිසා කිව්වේ... මට මේ නිතිනු අයියා ගැන එහෙම අදහසක් නෑ... "

බොහොම අමාරුවෙන් තටමලා වචන ටිකක් එලියට දැම්මේ... ඒක අම්මලා පිලිගත්තද නැද්ද මන්ද..

--------------------

රෑ නිදගන්න ගියත් නින්ද යන්නේ නෑ නිතුනු අයියවම මතක් වෙනවා.. ඇදේ එහාට මෙහාට පෙරලි පෙරලි කල්පනා කරා... එයාගේ හිනාව මගේ වටේම පේනව පේනවා වගේ... ඇය් එයාගේ බොඩි එක අනේ මෝඩයෝ මට මේ මොනාද කරේ.... හොදට හිටපු මාව මානසික

රෝගියෙක් කරලා...

ශනු කිව්වා වගේ මං එයාට ආදරේ කරනවද.. මං එයාව දකින්න කැමති.. එයා ලග ගැවසෙන්න කැමතියි.. එයා හිනාවෙනවට කැමතියි වෙන කවුරු හරි බලනවට ඉරිසියයි.. ඉතින් ඒ ආදරේ නිසාද.. මං නිතිනු අයියට ආදරේ කරනවා එතකොට මගෙ පලවෙනි ආදරේ එයාද.. ඔව් මට විශ්වාසයි මං එයාට ආදරෙයි. එයා ලගදි මගේ හදවත ගැහෙන විදිහ පවා වෙනස්... ඒත් එයාට මං ගැන එහෙම දැනෙනවද? අනික එයා මටවඩා අවුරුදු 7 ක් වැඩිමල්.. මගේ අයියටත් වඩා වැඩිමල්.. එයා හයික්ලාස් ෆැමිලි එකක ලමයෙක්... ඒත් මං සාමාන්‍ය මිඩ්ල් ක්ලාස් ෆැමිලි එකක ලමයෙක් ඉතින් අපි ගැලපෙයිද? එයා මං වගේ කෙල්ලෙක්ට කැමති වෙයිද?

# 14 කොටස

ගමට ගියපු ආරු නෙවෙයි ආපහු ආවේ ඒකපාර්ශවික පෙම්වතියක්.. හවස් වෙනවට මං පුදුම ආසයි නිතිනු අයියා එන නිසා.. එයා කාමරේට යනවට මං හරි තරහයි.. එතකොට එයාව දකින්න නෑනේ එයාගේ මග් එකේ තමයි මං තේ බොන්නෙත්..

එයා දන්නෙ නෑ... දන්නවනම් ආයේ ඒකෙන් වතුරවත් බොන එකක් නෑ...

අද නිතිනු අයියා කම්පැනි එකට ගියේ නෑ... ටිකක් සනීප නැහැලු.. අයියා තනියම ගියා... අයියට නිතිනු අයියව ගොඩක් විශ්වාසයි නැත්තම් කීයටවත් මාව එයත් එක්ක තියලා යන්නේ නෑ... එයාගේ ලෙඩේ මොකක්ද කියලා කිව්වෙත් නැති නිසා අද දවසෙම මගේ හිත කලබලයි... දහස්වතාවකට වඩා මං එයාගේ කාමරේට යන්න හදන්න ඇති.... ඒත් මං කොහොමද කොල්ලෙක් තනියම ඉන්න කාමරයකට යන්නේ.... එයා මං ගැන මොනවා හිතයිද. අනික ඕනෙම අසනීප මනුස්සයෙක්ට ඕනෙ නිදහසේ ඉන්න.. මාව එයාට වදයක් උනොත්..

දහසක් සිතිවිලිවලින් පිරිලා හිත දැඩි ලෙස නොසන්සුන් වෙද්දී මං එයාගේ කාමරේ ලග බිමින් වාඩි උනා...

"පුලුවන් නම් මරපන් මාව.."

"මරනවා තමයි ගෑනියේ.. ඉතිරි කරන්නෑ උබව.. තෝව මරලා හිරේ යනවා මම.. "

පිටිපස්සේ ගෙදර මිනිස්සු දෙන්නා අදත් රන්ඩු වෙනවා.. සතියකට සැරයක් වගේ ඒ දෙන්නා මරාගන්න හදනවා... ඇත්තටම කවුරු හරි මැරෙයි කියලා මට බය හිතුනවාර අනන්තයි.. ඒ පිරිමි එක්කෙනා තනිකර බේබද්දෙක්..

රස්සාවට කරන්නේ මාලු අල්ලන එකද කොහෙද.. එයාලා කෑ ගහන ඒවාගෙන්ම තමයි මං හොයාගත්තේ මිනිහා හොදටම බීලා ගෑනු එක්කෙනාට ගහනවද කොහෙද... ගොඩක් දවස් වලට ගෑනු කෙනා අඩනවා ඇහෙනවා....

රත්ඩුව ගැන මගේ අවදනේ බිදුනේ නිතිනු අයියගේ කාමරයෙන් ඇහුන සද්දෙ නිසා.. වීදුරුවක් බිදෙන සද්දයක් ඇහුනේ.. මං දෙපාරක් හිතන්නේ නැතුව එයාගේ කාමරේට ගියා... ඒත් මං දැක්කේ කීයටවත් බලාපොරොත්තු නොවෙච්ච් දසුනක්..

කාමරේ මුල්ලක ගුලි වෙලා හිටියේ නිතිනු අයියා.. එයා අත් දෙකෙන් කන් දෙක තද කරගෙන එයාට මෙයාට දගලනවා... මං කවදවත් කවුරුත් එහෙම ඉන්නවා දැකලා නෑ...

"එපා.. එපා... අම්මා.... එපා... අම්මා.. එපා තුවාල වෙයි.. ගහන්න එපා... නැගිටින්න.. යන්න එපා... අම්මා අම්මා..."

එයා අවසිහියෙන් වගේ මොනාදෝ කියනවා.. තව තවත් බිත්තිය මුල්ලටම යනවා... අනේ දෙවියනේ මොනාද එයාට වෙලා තියෙන්නේ.. ඇය් එයා එහෙම

මං හෙම්හිට එයා ලගින් වාඩි උනා... එයා දැක්කේ නෑ මං එනවා... තාමත් එයා බයේ කෑ ගහනවා... හිමින් මගේ අත එයාගේ ඔලුවෙන් තිබ්බා... එයා ගැස්සිලා මගේ දිහා

බැලුවා... ඒ ලස්සන ඇස් වලින් කඳුලු බේරෙනවා... හරියට පොඩි ළමයෙක් වගේ බයේ ගැහෙනවා... මූනේ තිබ්බේ පුදුම අසරන පාටක්.. හදවත ගැලවිලා යනවා වගේ වේදනාවක් මට දැනුනේ..

මට හිතන්නවත් තප්පරයක් නොතියා එයා මගේ පපුවට තුරුල් වුනා මාව ගැස්සිලා ගියේ උනෙ මොනාද කියලා හිතාගන්න බැරුව.. දියෙන් ගොඩ දාපු මාලුවෙක් ගානට ගැහෙන මගේ පපුවට එයා කිටියේ තුරුලු උනේ ආරක්ශාවක් බලාපොරොත්තුවෙන් වගේ... මගේ බය කම්පනය පරයා යන ආදරයක් දැනුනා ඒ වෙලාවෙ මට.. ආදරයටත් වඩා ඒක සෙනෙහසක් කිව්වොත් හරි.. ඒක මගේ පපුවට නම් කුලුදුල් හැඟීමක්....

නිරායාසයෙන් ම මගේ දෑත්එයා වටා බැඳුනේ තව තවත් පපුවට එයාව තුරුල් කරගන්න ගමන්...

"එපා කියන්න... එයාට රිදෙයි. අඩනවා.... එපා කියන්න.. අම්මා.. ගහන්න එපා කියන්න.."

"ශ් ශ් කෝ අඩන්න එපා හොද ළමයනේ.. කවුරුත් කාටවත් ගහන්නෑ... මිම් අපි දෙන්නා විතරයි ඉන්නේ... කවුරුත් නෑ... ශ් ශ් මං ඉන්නවනේ... Its ok.. Everything is fine.. Its ok.. මං ඉන්නවා ඔයා ලග"

කවදවත් පොඩි බබෙක්වත් තලවල නැති මට එයාව සනසන්න වචන කොහෙන්දෝ ගලන් එනවා... මං එයාව පපුවට හිර කරගෙන හෙමින් සැරේ බිත්තියට හේත්තු උනා... එයා තව තවත් මගේ පපුවටම තුරුල් උනේ මවකගේ උනුසුමට ගුලිවෙන පුංචි දරුවෙක් වගේ... මට රිදෙන තරමට තදින් මාව බදාගෙන ඉන්නේ... ඒත් මට මගේ වේදනාව ගැන අවදානයක් තිබ්බේ නෑ... ඊටවඩා දහස් ගුනයක් වැඩි එයා ගැන හදවතේ ඇතිවෙන වේදනාව..

"යන්න එපා මාව දාලා... මට බයයි.. යන්න එපා... ප්ලීස්... මං ගාව ඉන්න.. මං බයයි.. "

"මං යන්නෑ..... ඔයා ගාවමයි ඉන්නේ... කොහෙවත් යන්නෑ..... "

මගේ වචන වලින් එයා සංසුන් වුනා.. මූන එහෙ මෙහෙ කරලා මගේ ලමැදේ සුවපහසු ආරය හොයන් ඇස් පියාගත්තා... දැන් ඉස්සර වෙලා වගේ ගැහෙන්නෙ නෑ එයා.. ඇඟිලි තුඩු වලින් එයාගේ හිස පිරිමදින ගමන් හිමින් පිටට තට්ටු කරමින් එයාව සන්සුන් කරා... එයා කෑගැහුවේ "අම්මා" කියලා.... ඒ කියන්නේ එයාට එයාගේ අම්මා නැති උන විදිහ මතක් උනාද... ?? ඒත් මේක නෝමල් ශොක් එකක් වගේ පේන්නෑ.. හරිම අමුතුයි.. එයා අසාමාන්‍ය බයකින් හිටියේ...

කොච්චර වෙලා මං එයාව තුරුල් කරන් හිටියද මතක නෑ... එයාට නම් හොඳටම නින්ද ගිහින්... එකම තාලයට එයා හුස්ම ඉහල පහල දනවා... ඒ සද්දෙ පවා මට නම් සැනසීමක්..

බොහොම අමාරුවෙන් බෙඩ් ශීට් එකේ කොනකින් හිමීට ඇදලා ඇදලා කොට්ටයක් අතට ගත්තා... දැන් එයාව බිමින් තමයි හාන්සි කරන්න වෙන්නේ... එයාව උස්සලා ඇඳෙන් තියන්නනම් දසමහ යෝදයන්ගෙන් එකෙක් ගේන්න වෙයි.. කොට්ටෙ බිමින් තියලා එයාව හාන්සි කරා පරිස්සමෙන්.. තුරුල් කරගෙනම ඉන්න ආසයි මට.. ඒත් මොනා කරන්නද අයිති නැතේ... ඒ වෙලාවේ එයාට සැනසීමක් ලබා ගන්න මගේ ලගට ආවට සිහියෙන් හිටියනම් කීයටවත් එන්නෙ නෑ...

එයාගේ මූනට එබිලා මං බැලුවේ ඒ මූන දිහා.. කඳුලු වලට ඒ ලස්සන මූන තෙමිලා ගිහින්... පිරිමියෙක් වෙලත් මේ තරම් අඬන්න එයාගේ හිතේ කොච්චර වේදනාවක් ඇත්ද... එයාගෙ නලලෙන් මගේ කුළුදුල් හාදුව තිබ්බේ ආදරය සෙනෙහස එකට එකතු කරලා... එයාගේ ගන ඇහිබැම දිගේ මගේ ඇගිලි ගෙනියන ගමන් මන් තනියම හිනාවුනා... ඒ ඇහි පිහාටු තහය කලු වෙච්ච තොල්දෙක පිලිවලට මං ඇඟිල්ලෙන් රටා ඇන්ද.. ඒ මූනම මගේ දෙතොල් වලින් තෙත් කරන්න තිබ්බනම්...

ඇස් දෙකෙන් කඳුලු රූරලා ගියේ මට වත් නොතේරෙන්න.. ඒක පාර්ශවික ආදරය සුන්දරයි කිව්වට ඒක එහෙම නෑ... ඒක මහම මහ වේදනාවක්.. මේ හැඟීම් හිතට හරි බර වැඩියි... මට ආසයි එයාට ලං වෙන්න.. ඒ උනුසුම විඳින්න.. එයාගේ ලෝකෙම වෙන්න.. ඒ උන්මත්තකක ආදරේ මගේ කරගන්න.. ඒත් කොහොමද එහෙම කරන්නේ. එයාගේ හිතේ මට තියෙන්නේ යාලුවගේ නංගි කියන තැන විතරයි..

අනේ මට ඔයාව ඕනෙ නිතිනු අයියේ.. ඇයි දෙය්යනේ මට මෙහෙම කරේ... එයාව මට දෙන්න බැරි නම් ඇයි මට එයා ගැන ආදරයක් දැනෙන්න දුන්නේ.... එයා මට මිරිගුවක් වගේ.. කිසිම විදිහකට අපි දෙන්නා ගැලපෙන්නෑ.. ඒත් මට එයාට ආදරේ කරන එක නවත්තගන්න බෑ.. හදවත දංවැල් දලා හිරකරන්න පුලුවන් උනා නම් කොච්චර හොදයිද..

එයා දිහා බලාගෙන නැගිටින්න හැදුවත් හිතුවක්කාර හිත ඒකට ඉඩ දෙන්නෑ... මං එයාගේ මුලු මූනම මගේ දෙතොල් වලින් තෙත් කරෙ උමතුවෙන් වගේ... ආදරෙදිය් යුද්දෙදිය් හැමදේම සාදුරනය්ලු.. මං කරන්නේ වැරැද්දක් කියලා මං දන්නවා.. එයා නින්දෙන් ඉද්දි මං මෙහෙම හැසිරෙන්නේ.. ඒත් මට ඒ මුකුත් වැඩක් නෑ... මට ඒ මූන කිස් කරන්නම ඕනෙ උනා... එච්චරයි.

ඉක්මනට එයා ඇහැරෙන්න කලින් මගේ කාමරේට ආවා...

තාමත් ඇස් වලින් කදුලු එනවා... ඇය් කියලා මං දන්නේ නෑ... කාමරේ දෙර ලොක් කරලා ඇදෙන් හාන්සි උනා... දෙර ලොක් කරාට හිත ලොක් කරන්න බෑනේ... එයාව හොයාගෙනම යනවා...

## 15 කොටස

මම ගැස්සිලා ඇහැරුනේ අයියා ඇවිත් මූනට තට්ටු කරද්දි...

"සුදූ.. ඇයි මේ කවදාවත් නැතුව හවස නිදාගෙන.? සනීප නැද්ද... වෙනදා මේ වෙලාවට ඔයා කාටූන් බලනවනේ... නිතිනු අයියා එක්ක වලියක්වත් ඇල්ලුවද.. මේ ඇසුත් ඉදිමිලා වගේ... "

මං සාමාන්‍යයෙන් හවසට නිදා ගන්නේ නෑ... අයියා එන වෙලාවට හැමදාම ඉන්නේ කාටූන් බල බල.. ඉතින් එයාට මගේ වෙනස දැනෙන්න ඇති.. මගේ පුන්චි වෙනසක් උනත් අදුරගන්න එයාට වැඩි වෙලාවක් යන්නේ නෑ... මං ඇස් පියාගෙනම එයාගේ උරහිසට හේත්තු උනා...

"කවදාවත් නැතුව හවස නින්ද ගිය නිසා වෙන්න ඇති ඇස් ඉදිමිලා වගේ ඇත්තේ... ෆෝන් එක ඔබ ඔබා ඉද්දි නින්ද ගියා... "

"ආ ඒකද.. මං බයවුනා අසනීපයක්ද කියලා.... නිතිනු අයියා කාමරෙන් එලියට ආවේ නැද්ද සුදූ.. එයාට දැන් කොහොමද දන්නෑ... "

මං අයියාගේ උරහිසට මූන තියාගෙනම ඔලුව දෙපැත්තට වැනුවා... ඇස් පියාගෙනම හිටිය එක හොදට ගියා... නැත්තම් එයා මගේ හොරේ අල්ල ගනියි..

"කෑම කන්නවත් එලියට ආවේ නැද්ද සුදූ... පොඩ්ඩක් බලන්න එපැයි... "

අයියා කිව්වහම තමයි මට ඒක මතක් උනේ.... අඩුමගානේ මමවත් කෑවෙ නෑ... දැනගත්තොත් මට ගුටි කන්න තමයි වෙන්නේ බත් වෙනුවට.. මං අයියට උත්තරයක් නොදී ඇස් පියාගෙනම හිටියා..

"කෝ පොඩ්ඩක් අයින් වෙන්නකෝ.. මං ගිහින් නිතිනු අයියව බලන්න.."

අයියා නිතිනු අයියා බලන්න කාමරේට ගියපු නිසා මං කුස්සියට ගියේ තේ එකක් හදන්න හීටර් ජග් එක ප්ලග් කරද්දිම අයියා ආවා...

"පව් හොදටම නිදි සුදූ එයා.. බිම කොට්ටයක් තියාගෙන නිදි.. රස්නෙද දන්නෑ... එහෙ ඉතිම් ඒසි රූම් වල නේ හිටියේ... "

ඒ කියන්නේ එයා තාමත් නිදිද.? පව් දෙය්යනේ...

"මොකක්ද සුදූ ඔයාට වෙලා තියෙන්නේ... මං දවස් කීපයක ඉදලා බලන් ඉන්නේ... හැමවෙලාවෙම කල්පනා කරනවා.. මොකක්හරි ප්‍රශ්නයක් ද.. ප්‍රශ්නයක් නම් කියන්න සුදූ... අයියා ඉන්නවනේ ඔයා ලග.. ම්ම්ම්... "

මං අයියගේ දිහා බලන් ඉදලා ඇගිලි තුඩු වලින් ඉස්සලා කම්මුලට කිස් එකක් දුන්නා.... ඕනෙම ප්‍රශ්නෙකදි එයා මත් ලග ඉන්න නිසා මට ආදරේ හිතුනා... ඒත් එයා නම් ශොක් වෙලා බලන් ඉන්නවා...

"මුකුත් නෑ අනේ... මන් කල්පනා කරේ නිතිනු අයියා ගැන.. පව් එයා.."

මං කිව්වේ බාගෙට ඇත්තක්... නැත්තම් මං කියන්නේ කොහොමද එයාගේ යාලුවට එහෙම නැත්තම් බොස්ට මං ආදරෙයි කියලා....

අයියා මං දිහා විමසිලිමත් බැල්මක් දලා යන්න ගියා...

රෑ කෑමට තිතිනු අයියා කාමරෙන් එළියට ආවත් බැරි වෙලාවත් මන් දිහා බැලුවේ නෑ.. එක අතකින් මට සැනසීමක් දැනුනා.. මොකද මමත් හිටියේ එයාට මූන දෙන්න බැරුව..

සතියක් ගෙවිලා ගියත් තිතිනු අයියා මං දිහ බැලුවෙවත් නෑ... ආපු මුල් දවස්වල වගේ එයා මට තපුරුකම් කරන්න අරන්... අඩුම ගානේ මගේ අතින් දෙන වතුර එකක්වත් එයා බිව්වේ නෑ... මගේ දුක කඳුලුවලට හරවන්නේ නැතුව ඉන්න මට ලොකු වෙහෙසක් දරන්න උනා... මුලින්ම මං හිතුවේ මට මූන දෙන්න බැරුවට එහෙම කරනවා කියලා.... ඒත් පස්සෙ පස්සෙ මට තේරුනා එයාට ඕනෙ මාව මගහරින්න කියලා.. හරියට වයිරයක් පිරිමහනවා වගේ... මං වුෆිත් එක්ක ඉන්නකොට එයා වුෆිවත් අරන් යනවා එයාගේ කාමරේට.. මට තේරුම් ගන්න බැරි ඒකට හේතුව මොකක්ද කියලා....

"ආරු මට සමාවෙයන් බන් උබ මෙහෙම දුක් විඳින්න මමත් එක හේතුවක්.."

ශනු කියන්නේ මගේ දිහා දුකින් වගේ බලාගෙන.. මං එයාට හැමදේම කිව්වා.... මේ වෙලාවේ මගේ දුක කියන්න එයා විතරයි හිටියේ...

"ඇයි ශනු ඔයා සමාව ඉල්ලන්නේ.. අඩුම තරමේ මංවත් මෙතන වැරැද්දක් කරලා නෑ... "

"ඒ උනාට උඹ නිතිනු අයියා ගැන හෝප්ස් තියාගන්න මං කියපුවත් හේතුවක් වෙන්න ඇති.... "

"එහෙම නෑ ශනු මං කොහොමත් එයා ගැන බලාපොරොත්තු තියාගෙන නෙවෙයි ආදරේ කරේ.... මුල ඉදන්ම දැනන් හිටියා මොන පැත්තෙන්වත් අපිව ගැලපෙන්නෑ කියලා.... ඒත් මොලේ කියන දේ හදවත අහන්නැත්තන් මොනා කරන්නද.. ඒත් එයා එකපාරටම වෙනස් උන එකයි මට තියෙන ප්‍රශ්නේ... අඩුම ගානේ මං දිහා බලන්නෙවත් නෑ ශනු.. මට දුකයි.. ඒත් අඩන්නත් බෑ... හිතලා බැලුවම මේක පිස්සුවක් වගේ... මිරිගුවක් කියලා දැන දැනම වතුර කියලා හිත රවට්ටගෙන දුවල දුවලා හති වැටිලා හුල්ලනවා.. මං වගේ මෝඩයෙක් කොහෙවත් නැතුව ඇති.... "

"එහෙම නෑ මැනික ආදරේදි වැඩ කරන්නේ හදවත විතරයි.. හැඟීම් ලග මිනිස්සු අසරන වෙනවා.. ඒකයි ගොඩක් ගෑනු ලමයි ජීවිතේ පවා විනාස කරගන්නේ.. එහෙම බැලුවොත් මිනිස්සු ඔක්කොම මෝඩයෝ තමයි... ආදරේ ඉස්සරහ මොන ජගතත් දන ගහනවා... "

මං ශනුගේ කතාව අහගෙනම පොලවට හිනාඋනා... අපි පාර මාරුවෙනවා කියලවත් මට ගානක් තිබ්බෙ නෑ... ශනු

මගේ අතින් අල්ලන් පාර මාරු උනේ....

මාවත් ඇදන් ශනු ආවේ ෆුඩ් සිටි එකට... එයා මොනාද ස්නැක් වගයක් තෝර තෝර ඉද්දි මං වටපිට බැලුවා.. ඈතින් දැක්ක රුව පස්සෙන් මං ගියේ ඒ මං හිතන කෙනාමද බලන්න..

මං හිතුවා හරි ඒ හිටියේ තිතිනු අයියා.. තනියම නම් නෙවෙයි තව ගර්ල් කෙනෙක් එක්ක.. ඇගේ ගානට ස්ලීව් ලස් ගවුමක් ඇදලා ස්ට්‍රේට් කරපු කොන්ඩේ ,පොඩි මේකප් එකක් දලා හිටිය ඒ ගර්ල් හරිම ලස්සනයි.. හරියට ඉන්දියන් ඇක්ට්‍රස් කෙනෙක් වගේ... සනුදි අක්කට වගේ සංකර පෙනුමක් නම් එයාගේ නෑ... ගෑනු ලමයෙක් දිහා ඇහැක් ඇරලා බලපු නැති එයා ඒ ගර්ල් එක්ක ලගින්ම හිටන් හිටියේ... එයාගේ අතේ එල්ලීගෙනම ඒ ගර්ල් ශැම්පූ වර්ග තෝරනවා.. ඉතින් තවත් පැහැදිලි කිරීම් මට ඕනෙද... ? ඒ තමයි මං හොයපු හේතුව..

කදුලු කැටයක් කම්මුල් තෙත් කරද්දිම මං ගැස්සිලා ගියේ ශනු උරහිසෙන් තිබ්බ අත නිසා..

"ආරු ඇයි මේ.. මං හැමතැනම හෙව්වා උබව.. ඇයි මැතික මේ අඩන්නේ.. "

ශනූ මට කතා කරන ගමන් මං බලන් ඉන්න දිහා බැලුවා.....

"නිතිනු අයියා නේද... කවුද ඒ ගර්ල්.. දැන් උබ ඒ නිසාද අඩන්නේ.. අය්යෝ බන් නැදෑ කෙනෙක් වෙන්න ඇති.... බොරුවට කඳුලු ඉස්සර කරගන්න එපා... "

"නෑ බන් එයාට සනුදි අක්කා ඇරෙන්න වෙන කවුරුත් හිටියේ නෑලු... නෑයොවත් යාලුවොවත් කවුරුත් ගර්ලා හිටියේ නෑලු... අයියා මාත් එක්ක කිව්වා.... "

"ඒතකොට උබ කියන්නේ මේ එයාගේ ගර්ල් කියලද... "

"තවත් සාක්ෂි ඕනෙද ශනූ.. අර බලන්න.."

ඒ වෙලාවේ ඒ ගර්ල් හිටියේ නිතිනු අයියගේ කොන්ඩෙන් අල්ල අල්ල මොනාදෝ කියන ගමන්.. තවත් දරාගන්න බැරි තැන මං ෆුඩ් සිටි එකෙන් එලියට ආවා... ශනූ හිටියේ නැත්තම් මට මොනාවෙලා තියෙයිද දන්නෑ... මං මේතරම් එයාට ආදරෙයි කියලා අද වෙනකම් දැනන් හිටියේ නෑ...

එදා සිද්දියෙන් පස්සේ අයිය මට තනියම ගෙදර එන්න දුන්නේ නෑ... අයියට අද එන්න විදිහක් නෑ කියපු නිසා මං ශනූ ලගේ ගෙදර ගියේ... බස් එකේ යනකනුත් ශනූගේ උරහිසට ඔලුව තියාගෙන ආවේ..

කලුතර බෝදිය ලගින් බැහැලා ටිකක් ඇතුලට යන්න ඕනේ ශනූලගේ ගෙදරට... ශනූගේ තාත්තා ශනූට බත් කවන

ගමන් මටත් බත් කැව්වා..... මට තාත්තිව මතක් උනා... කවදාවත් නැති ලොකු පාලුවක් මගේ ලොකෙ වෙලාගෙන වගේ මට දැනුනේ.. අයියා එනකම් මං හිටියේ බොහොම අමාරුවෙන්.. ඇස් රිදෙනකම් මග බලන් ඉන්නැති.. අයියා වෙනදට වඩා පරක්කු වෙලා නිසා තට්ටුවක් දැම්මත් අඩන ගානට මං වැටිලා හිටියේ... වෙනදට වගේ අයියට ඉස්සරහ ශීට් එකේ වාඩි වෙන්න යද්දී අය්යව පිටිපස්සෙ ශීට් එකට ගෙන්නගත්තා..

"ඇයි සුදූ... මූනත් එක්ක මැලවිලා.. මොකක් හරි ප්‍රශ්නයක් උනාද ඔයාට.. ආ කියන්න පැටියෝ... "

මං එයාගේ පපුවට තුරුල් වෙලා හය්යෙන් ඉකිගගහා ඇඩුවා...

"අ..ද ශ..නුගේ තාත්තා අපිට බත් කැව්වා... ම..ම..ට තාත්ති මතක් උනා... පාලුයි.. ඇය් ඔයා පරක්කු උනේ"

"අනේ සුදූ පොඩි වැඩක් වැටුනා.. ඒකය් පරක්කු උනේ.... අපි තාත්ති බලන්න ගිහින් සති දෙකක්වත් නෑනේ පැටියෝ... ගෙදර ගිහින් අපි තාත්තිට වීඩියෝ කෝල් එකක් ගමු හාද.. අයියා ඉන්නවනේ මිම් අඩන්නෙපා.. අය්යටත් දුකය් නේ.. හොද බබා වගේ අඩන්නැතුව ඉන්නකෝ... "

අයියා මොනා කිව්වත් මගේ හිත හැදුනේ නෑ... මං කොහොමද හිත හදගන්නේ නිතිනු අයියා වෙන කෙනෙක්ගෙ කියලා මතක් වෙද්දිත් පපුව රිදෙනවා.... අයියා ලග ඉන්න නිසා මට ලොකු හයියක් දැනුනා.. ඒ නිසාමයි එයා ලග අඩලා දුක තුනී කරගන්න ඕනෙ උනේ....

# 16 කොටස

බාත් රූම් එකට ගිහින් මං මගේ මූන දිහා බැලුවා.... මට මැව්ලා පෙනුනේ නිතිනු අයියත් එක්ක හිටපු ගර්ල්ව.. හිතෙන් එයාවයි මාවයි කම්පෙයා කරලා. බැලුවා.....

එයාගේ මැචුවල් ලුක් එක වෙනුවට මට තියෙන්නේ ඉස්කෝලේ යන පොඩි ලමයෙක්ගේ වගේ පෙනුමක්.. ස්ට්‍රේට් කරපු කොන්ඩේ වෙනුවට සැලෝන් එකකට ගියපුවත් නැති ගොඩේ කොන්ඩයක්... ඇයි ඇදුම්.. එයා ඇදලා හිටපු ඇදුම් නිසා ඒ ගතේ සරාගී හැඩතල ඉස්මතුවෙලා පේනවා ,ඒත් මං අදින ඇදුම් වලින් මාව තවත් පොඩි ලමයෙක් වගේ පේන්නේ... මං කවදාවත් හය් හීල්ස් දලා නෑ සැන්ඩ්ල් විතරයි යූස් කරන්නේ... ඇත්තටම මගේ තියෙන්නේ ආදරෙන් කිස් කරන්න ඕනෙ හිතෙන පෙනුමකට වඩා

ඔලුව අතගාලා හුරතල් කරන්න හිතෙන පෙනුමක් කියලයි මට හිතෙන්නේ.... ඉතින් කවුද කැමති ඒ වගේ කෙල්ලන්ට.. ෆිල්ම් වල ඉන්න නිලියන්ට පවා තියෙන්නේ සරාගී ලස්සනක්.. ඒකනේ එයාලට පිරිමි ළමයි ගොඩක් කැමති.. ඒ කියන්නේ කොල්ලෝ ආස ඒ වගේ කෙල්ලන්ට.. සමහරවිට මං ඒ වගේ උනොත් නිතිනු අයියා මට කැමති වෙයි..

බොලද සිතුවිලි වලින් ඔලුව පිරිලා.. කිසිම දෙයක් මට පැහැදිලිව හිතන්න බෑ... මත් අන්තිමේදි තීරනය කරා ඒ ගර්ල් වගේ වෙන්න.. සමහරවිට ඒක මෝඩ වැඩක් වෙන්න ඇති ඒත් උත්සහ නොකර අතාරින්න මට බෑ...

මගේ වෙනස් වීම ඉස්සල්ලාම පටන් ගත්තේ කොන්ඩෙන්... කොන්ඩේ කොට කරන්නවත් ස්ට්‍රේට් කරන්නවත් අය්යා ඉඩ දෙන්නේ නෑ... ඒ නිසා පිටිපස්සෙන් යූ ශේප් වෙන්න කොන්ඩේ කපාගත්තා.. ඉස්සරහින් පොඩි කෑලි දෙකක් කැපුවා... ටිකක් තද පාටින් නේල් පොලිශ් එකක් ඇප්ලයි කරා... දැන් අබියෝගයකට තියෙන්නේ ඇඳුම තමයි...

අල්මාරියම අවුස්සල ගවුමක් හොයාගත්තා.. දම් පාට කොට ගවුමක්.. ඒක ගොඩක් කොට නිසා මං මෙච්චර කල් ඇන්දේ නෑ... දනිස්සෙන් අගල් තුන හතරක් උඩින් තියෙන්නේ.. අනික ඒක ටිකක් හිර නිසා ඇග හැඩට පේනවා... උදෙන්ම ඒ ගවුම ඇඳගෙන බම්ප් එක තියලා පෝනි ටේල් එක දලා කපපු පොඩි කොන්ඩ කෑලි දෙක

ඉස්සරහට දැම්මා..... තාමත් පේන ළමා පෙනුම නැති කරගන්න ටිකක් තදට ලිප්ස්ටික් ගෑවා.... දැන්නනම් පොශ් කෙල්ලෙක් වගේ ඉන්නවා... කන්නාඩියෙන් මටම ඇහැක් ගහලා සාලෙට ගියා... තේ එකක් බිබී හිටපු අයියටට කැස්සකුත් ආවා මාව දැක්කාම..

"සුදූ මොක්කද ඔය ඇදන් ඉන්නේ යන්නේ කෝස් එකටද නැත්තම් මොඩිලින් ශෝ එකකටද? මගෙන් ගුටි නොකා ඇග වහෙන එකක් ඇදන් එනවා... "

මං හිතපු විදිහටම.. අයියා කෑ ගැහුවා...

"අනේ අයියෙ දැන් මෙහෙම තමයි හැමෝම අදින්නේ.. මට ගොඩයා වගේ යන්නද කියන්නේ... "

"එතකොට මාස ගානක් ගිහින්ද ඒක මතක් උනේ.... විකාර නැතුව වෙන එකක් ඇදගන්නවා.. අනික මේ කොන්ඩේට මොනාද කරලා තියෙන්නේ රුවන්වැලි සෑය ඔලුව උඩ ගහල වගේ... "

අයියා එහෙම කියද්දි මට තරහ ගියා... හැමෝම මට සලකන්නේ පොඩි ළමයෙක්ට වගේ...

"මට දැන් අවුරුදු 21 ය්... මට කැමති ඇදුම් මං අදින්නේ.. "

මං එහෙම කිව්වේ අයියටට ඔරෝගෙන.. අයියා පුදුම වෙලා බලන් හිටියා... මොකද කවදාවත්ම මම එයා කියන දෙයක් නොහා ඉදලා නැති නිසා.. ඒත් මට එවෙලේ ඒ ගැන ගානක් ගියේ නෑ... මට ඕනෙ උනේ මගේ අලුත් පෙනුම නිතිනු අයියට පෙන්නන්න..

නිතිනු අයියා සාලෙට ඇවිත් ඇසුත් ලොකු කරන් මං දිහා බැලුවා..... සමහරවිට එයාට මං ලස්සනයි කියලා හිතෙන්නැති.. සියුම් සතුටක් මට දැනුනා.. ඒත් එයා එතනින් එහාට බැල්මක්වත් මන් දිහාට එන්නැති වෙන්න වග බලාගත්තා.....

"හැබැයි ආරු ඔය මගුල ඇදන් ගිහින් මොකක්හරි ප්‍රශ්නයක් දාගෙන මට කියනවකෝ බලන්න.. ගෙදරම යවනවා.."

අයියා කියන්නේ කාර් එකේ ඉස්සරහ ඉදගෙන.. මං අද ඉදගෙන හිටියෙත් කකුලක් උඩින් කකුලක් දාගෙන.. මං මවාගත්ත චරිතෙට උපරිම සාදරනයක් කරන්නයි මට ඕනෙ උනේ....

"එහෙම නෑ අයියා.. මං විතරක් නෙවෙයි කොච්චර කෙල්ලෝ මෙහෙම අදිනවද.. අනික මට මං ගැන බලාගන්න පුලුවන්.."

මං එහෙම කිව්වාම අයියා විතරක් නෙවෙයි නිතිනු අයියත්

හැරිලා මං දිහා බැලුවා... සමහරවිට මං කතා කරපු විදිහ නිසා වෙන්න ඇති.... මොකද මං අද අයියත් එක්ක කතා කරේ වෙනදා කතා කරන හුරතල් විදිහෙන් නෙවෙයි.. ටිකක් ටෆ් විදිහටම.. මං කාගෙන්වත් ඩිපෙන්ඩ් වෙන්නෑ කියන එක නිතිනු අයියට පෙන්නන මට ඕනෙ උනේ අයියට ආදරේ නැතුව නෙවෙයි....

කෝස් එකට ආවහමත් වෙනදාට වඩා මට ප්‍රතිචාර හම්බුනා.... ගොඩක් පිරිමි ලමයි බලෙන් වගේ කතා කරන්න හදනවා... ඉතින් මගේ අලුත් රූපෙ තමයි මට ගැලපෙන්නේ කියලා මට තේරුනා... ඒත් ශනුනම් මගේ වෙනසට පොඩ්ඩක්වත් කැමති උනේ නෑ... එයා මොන මොනාදෝ දෙඩෙව්වත් මං ඒවා ඇහුවේ නෑ... මට අහන්න ඕනෙ උනේ නෑ... මං ශනුවත් ඇදගෙනම ගිහින් එක එක විච්චූරන ඇඳුම් ගොඩක් ගත්තා... මං ඉතිරි කරගෙන තිබ්බ සල්ලි ඔක්කොම ඒ වෙනුවෙන් වියදම් කරා...

එදයින් පස්සෙ අයියා මගේ ඇඳුම් වලට මුකුත් කියපු නැති නිසා මගේ වෙනස් රූපෙ දිගටම පවත්වා ගන්න මට පුලුවන් උනා... දින සති ගෙවිලා ගියේ මාව සම්පූර්ණයෙන්ම වෙනස් කරලා... අඩුම ගානේ මං කාටූන්වත් බැලුවේ නෑ.. මදි නොකියන්න පිරිමි ලමයින්ගෙන් ආදර ඇරයුම් ලැබුනත් මං බලාපොරොත්තු වෙච්ච කෙනාගේ ආකර්ශන මට හම්බුනේ නෑ... එයා එන්න එන්නම පරන තත්වෙට වැටෙනවා වගේ තමයි මට පෙනුනේ... ගොඩක් දුරට එයා ගෙදර ආවේ කෙලින්

හිටගන්නවත් බැරුව.. ඒ ඇස් වල ගොඩක් දුරට තිබ්බේ වේදනාවක් කලකිරීමක්.. දිගෙන් දිගට එයා මාව ගනන් ගත්තේ නැති එක මගේ රූපෙ තව තවත් වෙනස් වෙන්න බලපෑවා..

එක දවසක් උදේ මං කෝස් එකට යන්න ලෑස්ති වෙද්දී අය්යා කාමරේට ආවා...

"සුදූ මට පොඩ්ඩක් කතා කරන්න ඕනෙ.. මෙතනින් ඉදගන්නකෝ.."

අයියා ලගින්ම ඇද උඩින් වාඩි උනා... එයා මගේ නලලට හාදුවක් දීලා මාව තුරුලු කරගත්තා....

"සුදූ.. ඕනෙම මනුස්සයෙක්ට තමන් කැමති ඇදුමක් අදින්න අයිතියක් තියනවා... ඒක ඔයාටත් එහෙමයි.. මං ඔයාට මුකුත් කියන්නේ නෑ... මනුස්සයෙක්ට හිත පාලනය කරගන්න බැරිකම තවත් මනුස්සයෙක්ගේ වැරැද්දක් වෙන්න බෑනේ... අනික ඔයා ලස්සනට ඇග වැහෙන්න ඇදන් යද්දිත් ඔයාට කරදර කරන්න ආවේ... ඒ නිසා ඇදුමට වැරැද්දක් කියන්න බෑ... කොහොම ඇන්දත් මගේ නංගි ගොඩක් ලස්සනයි.. ඒත් සුදූ ඔයාට එකපාරටම මොකක්ද උනේ.... කලින් දවසේ මගේ තුරුලට වෙලා තාත්ති ඕනෙ කියලා අඩපු කෙල්ල පහුවදා හිතාගන්න බැරි තරම් වෙනස් වෙලා.. හේතුවක් නැතුව එහෙම වෙන්න විදිහක් නෑ... ඔයා මන් ලගම ඉදලත් මං ගාව මගේ චූටි නංගි නෑ කියලා

හිතෙන තරමට ඔයා වෙනස් වෙලා.. ඇයි ඒ.."

මං අයියගේ මූන දිහා බැලුවා එයාගේ මූන අඳුරු වෙලා.. මගේ වෙනස වැඩියෙන්ම දැනෙන්න ඇත්තේ එයාට.. මොකද ගොඩක් දවසකින් මං හුරතලෙන් එයාට වචනයක් කතා කරේ නෑ... මුකුත් නොකියා එයාට හේත්තු වෙලා මං හිටියා...

"අයියට කියන්න බැරිද.... අයියා ඔයාට එච්චර දුරයිද සුදූ..."

මට ඒ වෙලාවේ නම් ඉකිගගහා ඇඩුනා... අයියගේ හිත ඒ තරම් රිදිලා ඇති කියලා මත් හිතුවේ නෑ...

"අයියෙ... මං... කෙනෙක්ට ආදරේ කරනවා"

ඇත්ත කියන්න තීරනය කරේ තවත් එයාට වේදනා දෙන්න බැරි නිසා.. අනික හැමදේම හිරකරගෙන ඉදලා මට මහන්සියි..

"එයා මට කැමති නෑ... එයාට ගෑනු ලමයෙක් ඉන්නවා... එයා දැන් මම වගේ... ඒකයි මං වෙනස් උනේ.... එතකොට එයා මට කැමති වෙයි කියලා.... "

මං අයියගෙන් බලාපොරොත්තු වුනේ බැනුමක් උනත් මට ලැබුනේ සිපුමක්.. ඇස් ලොකු කරලා මං එයා දිහා

බැලුවා.....

"එයා ඔයාට කැමති උනාට ඔයා ඔයාට කැමතිද සුදූ... " එයාගේ ප්‍රශ්නේ හමුවේ මන් අසරන උනා...

"මන් දන්නවා..... දැන් ඉන්න ඔයාට මං කැමති නෑ වගේම ඔයත් කැමති නෑ කියලා.... වෙනස් උන ඔයාට බැරි වෙලාවත් එයා කැමති උනොත් ඔයා මොකද කරන්නේ සුදූ... ජීවිත කාලෙම රගපානවද.. එයාවටි රවට්ටලා ඔයත් රැවටෙනවද?? ආදරේ කරන එක වැරැද්දක් නෑ... හැබැය් එයාව නැති කරගන්න බැරිකමට ඔයා ඔයාවම නැති කරගන්න එපා... වෙනස් උන ඔයාට කවුරුහරි කැමති උනානම් ඒ ආකර්ශනයක් කවුරුහරි ඉස්සර හිටපු චූටි කෙල්ලට කැමති උනානම් ඒක ආදරයක්... කොහොම හිටියත් ඔයාගේ ලස්සනේ අඩුවක් නෑ ඉතින් කවුරුවත් කැමති කරගන්න ඔයා වෙනස් වෙන්න ඕනේ නෑ... සමහරවිට ඔයාට ගොඩක් දුක ඇති ඒත් ඔයාම දන්නවනේ මේ කරන වැඩේන් දුක නැතිවුනාද කියලා.... ඔයා ඔයාම වෙන්න.. ලෝකෙටම ඔයා වගේ ඉන්නේ එක්කෙනය්.. ඉතින් ඔයා කාගෙවත් හෙවනැල්ලක් යට ජීවත් වෙන්න ඕනේ නෑ... අයියා කියපු දේවල් ගැන පොඩ්ඩක් හිතලා බලන්න.. ඒත් තවමත් ඔයාට එයාව ඕනෙ නම් මට කියන්න කවුද කියලා.. මං අතපය ගැටගහලා හරි එයාව ඔයාට ගෙනත් දෙනවා... ඔයාට පුලුවන් නම් මගේ පරන නංගිව ගෙනත් දෙන්න.."

මං අයියට තුරුල් වෙලාම හිටියා එයාට යන්න දෙන්නෙ නැතුව.. යටහිතේ ජීවත් වෙන ඇත්ත ආරුට ඕනේ හුරතල් වෙන්නමයි..

"ආ දැන් මොකෝ මේ.. අත අරිනවා මට යන්න... "

අයියා නැගිටපු කත් ඉදලා බෑග් එකත් අරන් එයාගේ පිටට පැන්නා... කාර් එකට යනකන් මං ගියේ එයාගේ කරේ....

කෝස් එකට ගිහිල්ලත් මං කල්පනා කරේ අයියා කියපුවා.. වොශ් රූම් එකේ මිරර් එකෙන් මං දැක්කේ මාව නෙවෙයි වෙන කෙනෙක්.. අයියා කිව්වේ ඇත්ත දැන් ඉන්න මට මංවත් කැමති නෑ...

අද ප්‍රොෆෙසර් කෙනෙක් ගෙන්නලා අපිට මොනෝ විද්‍යාව ගැන දේශන වගයක් දුන්නා.... මට නම් ඒ කිසි දෙයක් ඇහුනේ නෑ... තාමත් මං අයියා කියපු දේ ගැන හිතෙනවා... දේශනේ ඉවරවෙලත් මං හිටියේ වෙන ලෝකෙක... මං ගැස්සිලා ගියේ පිටිපස්සෙන් කවුරුහරි මට කතා කරපු නිසා..

# 17 කොටස

"එක්ස්කියුස් මී ඔයා ආරු නේද... "

මගේ පිටිපස්සෙන් ඉදන් කතා කරපු කෙනාව දැක්කමනම් මගේ ඇස් රිදෙන තරමට ලොකු උනා... එතන හිටියේ එද නිතිනු අයියගේ අතේ එල්ලිලා හිටිය ගර්ල්.. එයා මගේ උඩ ඉදලා පහලට යනකම් ඇස් අරන් ගිහින් මගේ මූන දිහා බැලුවා.....

"අය් මීන් ආරධ්‍ය ගේ නංගි ආරාධ්‍යා නේද... "

මං එයා දිහා බලාගෙනම කටුස්සෙක් වගේ ඔලුව උඩට පහලට කරා...

"පැටියෝ මට චුට්ටක් ඔයත් එක්ක කතා කරන්න ඕනේ.... ඔයාට පුලුවන් ද තව ටිකකින් සන්සෙට් කැෆේ එකට එන්න.."

මං එයා පැත්තේ ඉන්න ශනූ දිහා බැලුවේ මොකක්ද දෙන්න ඕනේ උත්තරේ අහන්න..

"කමක් නෑ පැටියෝ ඔයාගේ බඩීවත් එක්කන් එන්න.. මං බලන් ඉන්නවා හොදේ අනිවාර්යයෙන්ම එන්න.."

ලස්සනට හිනා වෙලා එයා එහෙම කියලා යන්න ගියා... එයා වගේම එයාගේ කටහඬත් ලස්සනයි.. මං කොල්ලෙක් උනා නම් එයාව මගේ කෙල්ල කරගන්නවා.. ඒත් හිත යටින් ලොකු බයක් දැනෙනවා... සමහරවිට එයා මං ගැන දැනගෙන මට බනියද් .. නැත්තම් මට නිතිනු අයියගෙන් ඈත්වෙලා ඉන්න කියයද්?

"මොකක්ද බන් ඒ උනේ.... ඒ අක්කා කොහොමද උබව දන්නේ.. ප්‍රොෆෙසර් එක්ක ඉන්නවා දැක්කට මං හිතුවේ මට පේන හැටි කියලා.. ඒත් බලද්දි එයාම තමයි... "

ප්‍රොෆෙසර් එක්ක ආව කියන්නේ එයා මනෝ වෛද්‍යවරියක්ද.. එහෙමනම් එයාව හොදට ගැලපෙනවා නිතිනු අයියට... හොදට ඉගෙනගත්ත ඒ වගේ කෙනෙක්ට නිතිනු අයියා කැමති වෙච්ච එක පුදුමයක් නෑ...

"මොනාද තවත් උබ කල්පනා කර කර ඉන්නේ... වරෙන් යන්න"

"මට බයයි ශනු.. එයා මට මොනා කියයිද දන්නෑ..."

"ඒවානම් මං දන්නෑ... හැබැය් මන් එක දෙයක් නම් දන්නවා..... "

"මොකක්ද..?

"ඔය කැෆේ එකේ කොෆී පට්ට ගනන්... "

මං ශනූ දිහා ඔරවලා බැලුවා.....

"විහිලුවට නෙවෙයි බන් උබ ඔතෙන්ට ගියාට කමක් නෑ මුකුත් ඕඩර් කරන්නේ එහෙම නෑ... උබට වකුගඩු විකුනලා තමයි ගෙවන්න වෙන්නේ... "

එතනදිත් මට මතක් උනේ අපි අතර පරතරය.. එයාලට ඒ වගේ තැන්වලින් කෑම බීම ගන්න එක සාමාන්‍ය දෙයක් වෙන්න ඇති.... ඒත් අපිට එහෙම නෑ... ඉතින් කොහොමද මන් නිතිනු අයියට ගැලපෙන්න හිතන්නෙවත්..

අපි කැෆේ එකට යනකොට එයා කෙලවරේ ටේබල් එකක වාඩි වෙලා එයා(ර්) පෝඩ් දෙකත් කනේ ගහගෙන.. අපිව දැකලා ලස්සනට හිනා වෙලා එයා පෝඩ් දෙක ගැලෙව්වා..

"හායි.. අය් ඈම් අහසි.. නය්ස් ටූ මීට් යූ... "

මං එයාට හිනාවෙලා හෑන් ශේක් කරා... "

"ඔයා හරි ලස්සනයි නේ පැට්ටෝ.. මෝ දෑන් අය් එක්ස්පෙක්ට්.. එත් මං ඔයා ගැන අහලා තිබ්බේ කියුට් චය්ල්ඩිශ් ගර්ල් කෙනෙක් කියල.. ඒක නිසා මුලින්ම දැක්ක වෙලාවේ මට කතා නොකරත් ඉන්න හදලා නිකමට වගේ

කතා කරේ... "

"අක්කි කොහොමද මාව දන්නේ.."

"මං ඔයාව දැනගෙන දැන් ටිකක් කල්.. ඔයා ඉතිම් එයාගේ ලිට්ල් බනී නේ(පුංචි හා පැටියා) මං ඔයා ගැන ගොඩක් දේවල් දන්නවා..... "

මං පුදුම වෙලා බලන් හිටියේ ඒ අක්කි දිහා... කියන මුකුත් මට තේරුනේ නෑ...

"ලිට්ල් බනී ?? "

"ම්ම් ඔව් තව ගොඩක් නම් තියනවා... කියූට් ඩෝල්, රපුන්සල්, චූටි පැටියා ඔය වගේ ගොඩක් තියෙය්..."

"ඒත් කවුද මට එහෙම කතා කරන්නේ..."

"මගේ පේශන්.. නිතිනු සෙහංස"

"නිතිනු අයියා.. ??"

"හ්ම්ම් ඔව් එයා මගේ තාත්තගේ පේශන් කෙනෙක්.. අර ඔයාලට ලෙක්චර් එක දුන්නේ.... පොඩි කාලේ ඉදන්ම එයා තාත්තගෙන් තමයි ට්‍රීට්මන් කරේ.. ඒ නිසා නිතිනු මගේ

හොද යාලුවෙක්... මං ඩිග්‍රිය කරන්න ඔසී ගිහින් ආවේ දැන් මාස 2 කට විතර කලින්.. දැන් මත් තමයි එයාට ට්‍රීට්මන්ට් කරන්නේ... "

"ට්‍රීට් මන්ට් ??? මො.. මොකක්ද එයාට තියෙන ලෙඩේ.."

එයා හොද හුස්මක් අරන් ශනූ දිහා බලලා.. මං දිහා බැලුවා.....

"අපේ ජොබ් එකේ හැටියට පේශන්ගේ තොරතුරු පිටට දෙන්න බෑ... ඒත් මං ඔයත් එක්ක මේ ගැන කතා කරන්නේ හේතුවක් නිසා.. නිතිනු කියලා තියෙන තොරතුරු එක්ක මං ඔයාව ට්‍රස් කරනවා.. මට කියන්න ඔයාට ඔයාගේ බඩීව විශ්වාසයි නේද... අය් මීත් මේ දේවල් පිටට ගියොත් නිතිනු ගේ ඉමේජ් එකට හානියක් වෙන්න පුලුවන්"

"නෑ අක්කි මට එයාව විශ්වාසයි.. මගේ හැමදේම එයා දන්නවා..... "

"ම්ම් හරි එහෙනම මං කියන්නම්.. ඔයාලා අහලා තියනවද පෝබියා(phobia) ගැන.."

මං ඔලුව හෙල්ලුවේ ඩ්‍රාමා එකක එහෙම එකක් දැකලා තිබ්බ නිසා..

"ඔව් අක්කි මං බලපු වෙබ්සිරීස් ඩ්‍රාමා එකක හිටියා... ජර්ම් ෆෝබියා හැදිච්ච බෝයි කෙනෙක්"

"අන්න හරි පැටියෝ ෆෝබියා එකක් කියන්නේ සාමාන්‍ය මට්ටමට වඩා ගොඩක් වැඩියෙන් කිසියම් දේකට ඇති වෙන බය.. එක එක ජාතියේ ෆෝබියා තියනවා... වතුර වලට, උස තැන් වලට, විසබීජ වලට, එක එක සත්තුන්ට ඔයාලා දන්නවද බෙලි බටන් එකට නිවුස් පේපර් වලට පවා බය මිනිස්සු ඉන්නවා... ඉතින් නිතිනුටත් තියෙන්නේ ඒ වගේ ෆෝබියා එකක්... ඒත් එයා බය මං කලින් කිව්වා වගේ දේවල් වලට නෙවෙයි.. එයාගේ අම්මගේ මර්ඩර් එක වෙච්ච වෙලාවේ එතන තිබ්බ සිටුවේශන් එකට ආසන්න සිටුවේශන් එකකට, නැත්තම් ක්වුරුහරි ඒ ගැන කියනවට, මර්ඩර් එක අවට තිබ්බ මොනාහරි බඩුවකට අන්න ඒ වගේ දේවල් වලට.."

මම ඒ අක්කා කියන දේවල් අහන් හිටියේ හීනෙන් වගේ... එයාට එහෙම ලෙඩක් තියනවද... දෙය්යනේ... එතකොට එදා කාමරේදි එහෙම හැසිරුනේ ඒකද..

"අනික එයාට ඉස්සෙල්ලාම තිබ්බේ ඒ ලෙඩේ විතරයි.. පස්සෙ එයාගේ එක්ස් ගර්ල් ෆ්‍රෙන්ඩ් දලා ගියාට පස්සේ එයා තවත් මානසිකව කඩන් වැටුනා.. එයාට හැමවෙලේම සූසයිඩ් කරගන්න හිතෙන, තමන්ටම හානි කරගන්න හිතෙන වගේ ගොඩක් මානසික තත්ව ඇති උනා...

ඇත්තටම කිව්වොත් මමයි තාත්තයි තමයි එයා මෙන්ටල් හොස්පිටිල් එකකට දන තත්වෙන් මුදව ගත්තේ... ඒත් එයාව යතා තත්වෙට ගන්න අපිට ගොඩක් අමාරු වුනා.. මොකද පැටියෝ ඇගට ලෙඩක් උනහම මෙඩිසින් දීලා හොද කරගන්න පුලුවන් උනාට මනසට ලෙඩක් උනාහම ඒක එහෙම ලේසියෙන් හොද කරන්න බෑ... ඒත් දැන් ටික දවසක ඉදන් එයා නෝමල් වීගෙන එනවා වගේ දැනුනා.. එයාගේ මූන පවා එලිය වැටිලා එයා සතුටින් ඉන්නෙ කියන එක මටයි තාත්තටයි තේරුනා... ඒ වගේම සාමාන්‍යයෙන් එයා පෝබියා එකෙන් බලපෑමට පත්වුනාම දවසක් දෙකක් කන්නෙ බොන්නෙ නැතුව කාමරේට වෙලා ඉන්නවා.. අනික් එක එහෙම කාමරේ ඉදලා කෙලින්ම එයා එන්නේ අපේ ක්ලිනික් එකට.. ඒත් ලගදි එයා පැනික් ඇටෑක් එකට පස්සෙ දවසෙම සාමාන්‍ය විදිහට ක්ලිනික් එකට අවා.. අපි පුදුම උනා.. දන්නවද ඇයි එයා එහෙම නෝමල් විදිහට හිටියේ කියලා.. ඒ ඔයා නිසා"

"මං නිසා.. "

"හ්ම්ම්.. මං මේක කියනවට වඩා නිතිනු අයියගේ කටහඩින්ම අහගන්නකෝ.. මේ රෙකෝඩ්ස් ටික අහන්න.."

මම අක්කි දුන්න එයාපොඩ් දෙකෙන් එකක් ශනූ ට දීලා අනික මං ගත්තා... සාමාන්‍යයෙන් මනෝ වෛද්‍යවරු පේෂන්ලා එක්ක කතා කරද්දි රෙකෝඩ්ස් ගන්නවා මන් ෆිල්ම් වල දැකලා තිබ්බා... මේ එ වගේ එකක්

වෙන්නැති...

————————————————

"මට ජීවිතේ එපා වෙලා.. මන් ආදරේ කරන හැමෝම මාව දලා යනවා... ඉතින් මට මේ හැමදේම අතෑරලා යන්න ඕනේ.... එතකොටවත් සැනසීමක් දැනෙය..

ආරාද්‍ය මාව එයාගේ ගෙදර එක්කන් ගියා... හරිම වෙනස් පරිසරයක්.. ඒ මුලු ගෙදරම මගේ කාමරේ තරම්වත් ලොකු නෑ... ඒත් අනේ මන්ද මට ලොකු සැනසීමක් දැනුනා.. ඒත් ආරාධ්‍යගේ නංගි මාව දැක්ක ගමන් දුවලා ගිහින් හොදට ඇදගෙන එහෙම සංවර විදිහට එලියට ඇවිත් මට හිනා උනා... මට ඒ කෙල්ලව අල්ලන්නේ නෑ... හරියට බලෙන් එල්ලෙනවා වගේ... මං එහෙම ගෑනුන්ට කැමති නැති උනත් ආරාධ්‍ය ගේ බලකිරීමට එහෙ නතර උනා...

ආරු මගේ අතින් ඇදන් සෝෆා එකෙ වාඩි කරවගෙන මගේ ඔඩොක්කුවෙන් ඔලුව තියාගත්තා... මට තරහ දරාගන්න බැරිව එයාව තල්ලු කරලා දැම්මා.. මං හිතුවේ එයා මගේ ඇගේ එල්ලෙන්න එනවා කියලා.... ඒත් එහෙම නෑ... එයා හිතලා තියෙන්නේ ආරාධ්‍ය කියලා.... පව් චූටි කෙල්ල අරාද්‍යගේ තුරුලට වෙලා හය්යෙන් ඇඩුවා... මට ගොඩක් දුක හිතුනා... කාටවත් මං එහෙම හර්ට් කරලා නෑ... බෙහෙත් එකක් අරන් එයාට ගෙහින් දෙද්දිත් ආරාධ්‍ය

ලග ගුලි වෙලා හිටියේ ලිට්ල් බනී කෙනෙක් වගේ...

ආරූ හරිම ලස්සනයි.. දනිස්ස ලගට විතර දිග ලස්සන කොන්ඩයක් තියෙය්... ඒ වගේම හරිම දගයි.. එක දවසක් මට හද පෙන්නලා ලොකු ලෙසන් එකක් දුන්නා.... එයා පේන්න ඉද්දි මට ජීවත් වෙන්න ආස හිතෙනවා... කියුට් ඩෝල් කෙනෙක් වගේ එයාට මෙහාට දුවද්දි ආස හිතෙනවා...

චූෆි එක්කත් ආවාට පස්සෙ කෙල්ල එයා පස්සෙන මය් චූටි බබලා හොදයි ඊට වඩා... ඉරිසියාකාරියක් චූෆි මං ලග ඉන්නවටවත් කැමති නෑ... ආ කියන්න අමතක උනා... චූෆිටත් නම දැම්මේ එයා.. කාටූන් චරිතෙක නමක් ලූ.. එයාගේ වැඩේ කාටූන් බලන එකමය්.. "

"අරුට මිනිස්සු වගයක් කරදර කරන්න යද්දි මං බේරගත්තා... පව් චූටි පැටියා බය වෙලා මට තුරුල් වෙලාමය් හිටියේ... කාර් එකේ යනකොටත් මගේ අත බදන් ගියේ... ඒ පපුව වේගෙන් ගැහෙන කොට මට අරුන්ව මරන්න හිතුනා... අරාද්‍ය ආවම කෙල්ලව මගේ තුරුලෙන් යවන්න මට පුදුම ලෝබකමක් දැනුනේ.. සනුදි ගැනවත් එහෙම ලෝබකමක් දැනිලා නෑ...

ආරාධ්‍යලාගේ ගමට ගියාම තමයි මට ජීවත් වෙනවා කියන්නේ මොක්කද කියලා තේරුනේ... ඒ වගේම මං ආරුට ආදරෙයි කියලාත් තේරුම් ගත්තා... ඒ වගේ

හුරතල් කෙල්ලෙක්ට ආදරේ නොකර ඉන්න පුලුවන් කාටද..

අම්මගේ ඩෙත් ඇනිවසරි එක නිසා මං ගෙදර නතර උනේ වැඩකරන්න තරම් මානසිකත්වයක් නැති නිසා.. එත් එහා ගෙදර වෙච්ච රන්ඩුව නිසා මට පැනික් ඇටෑක් එකක් ආවා... මං දගලන සද්දෙට ද කොහෙද ආරූ කාමරේට ආවා... එයා දැක්ක ගමන් මට පුදුම ආරක්ශාකාරී හැගීමක් දැනුනේ.. මං දෙපාරක් හිතන්නෙ නැතුව එයාගේ පපුවට තුරුල් උනා.. අම්මගෙන් පස්සෙ දැනුන ලොකුම සැනසීම දැනුනා එයා ලග.. තව තවත් එයා ලගට වෙලා මං අවුරුදු 18 කින් පස්සෙ සැනසීමෙන් නිදගත්තා... ඒත් මං කරේ වැරැද්දක් එයා තාම චූටි කෙල්ලෙක් අපි අතරේ ඒජ් ගැප් එකම අවුරුදු 7 ක් ඉතින් එයාට මාව ගැලපෙන්නෙ නෑ... අනික මං වගේ කරුමක්කාරයෙක් එක්ක ඉදලා එයාගේ ලස්සන ජීවිතේ නැති වෙනවට මං කැමති නෑ... එයා මලක් වගේ... පොඩ්ඩක්වත් තැලෙන්නේ නැති වෙන්න ලස්සනට පිපිලා තියෙන්න ඕනෙ.. කොච්චර අමාරු උනත් මං එයාගෙන් ඈත් වෙනවා..

රෙකොඩ්ස් 8 ම අහලා මං එයාපොඩි දෙක අහසි අක්කට දුන්නේ අඩ අඩ.. මෙච්චර මට ආදරේ කරලත් එයා මගේ සතුට වෙනුවෙන් මාව අතෑරලා..

"මං වැදගත්ම කොටස් ටිකක් තමයි ඔයාට අහන්න දුන්නේ.... පැයගනන් එයා ඔයා ගැන කියවනවා.. මං එයාගේ යාලුවෙක් නිසා මාත් එක්ක හැමදේම කියනවා..

ඔයාට මං මේ දේවල් කිව්වේ ඔයා නිසා එයාට හොද වෙන්න තියෙන චාන්ස් එක ගොඩක් වැඩි නිසා.. ඔයාට පුලුවන්ද එයාව හොද කරගන්න අපිට හෙල්ප් කරන්න.. ඔයත් එයාව දලා ගියොත් එයාගේ තත්වේ තවත් සීරියස් වෙන්න පුලුවන්.. ඔයාට ඔයාගේ බෝය්ෆ්‍රෙන්ඩ්ගෙන් අහන්න ඕනෙ නම් අහලා මට පස්සෙ ආන්ස එකක් දෙන්න.."

අහසි අක්කා අවසානෙට කියපු දේටනම් මටයි ශනූටයි දෙන්නටම කොරි එකත් හිරවුනා...

"අක්කි මට බෝයි කෙනෙක් නෑ..."

"ලැජ්ජ වෙන්න දෙයක් නෑ පැටියෝ මත් දන්නවා ඔයා කාට හරි ආදරේ කරනවා.. නැත්තම් ඔයා කොහොමද චූටි ලමයෙක් වගේ ඉදලා පොශ් කෙල්ලෙක් වගේ උනේ.. අනික අමතක උනාද මගේ ජොබ් එක මොකක්ද කියලා.... "

ශනූ ඒකටනම් උඩ පැන හිනා උනා... මං බිම බලාගෙන ලේන්සුව ඇබරුවා..

"මොකද නංගියෝ හිනාවෙන්නේ... මං කියපු දේ වැරදිද "

"අනේ නෑ අක්කියෝ... නිකමට වගේ බලන්නකෝ මෙයාගේ ඇදුම දිහා... දැකලා පුරුදු නැද්ද... "

ශනූ කියන්නේ මගේ ගවුම පෙන්නන ගමන්... මත් ඇදන්

හිටියේ එදා ඒ අක්කා ඇදන් හිටපු ගවුමේ තිල්පාට එකක්... දැන්නම් වලක් කපන් වැලලෙන්න හිතෙනවා...

"දැකලා පුරුදු..... ආ මටත් ඔය වගේ පපල් කලර් එකක් නම් තියෙනවා"

"එක දවසක් අපි දෙන්නා ඔයාව තිතිනු අයියා එක්ක ෆුඩ් සිටි එකේදී දැක්කා.. ඉතින් මේ මෝඩි හිතුවේ ඔයා එයාගේ ගර්ල් ෆ්‍රෙන්ඩ් කියලා.... හොදටම අඩලා අඩලා එයා පොඩි ලමයෙක් වගේ නිසා තිතිනු අයියා කැමති නැත්තේ කියලා හිතාගෙන ඔයා වගේ වෙන්න තමය් මෙහෙම වෙන උනේ "

"ඕ මය් ගෝඩ්.. ඒ කියන්නේ නංගා තිතිනුට කැමතිද.. අය්යෝ ඔය දෙන්නම හරිම මෝඩයි නේ දරුවෝ.... දෙන්නගෙන් එක්කෙනෙක් හරි ඕක කිව්වනම් මුකුත් ප්‍රශ්නයක් නෑනේ... මං හිතන්නේ තිතිනු හිතන් ඉන්නෙත් ඔයාට බෝයි කෙනෙක් ඉන්නවා කියලා.... ඒකයි මේ දවස් වල ඔච්චර ඩ්‍රින්ක්ස් ගන්නවා ඇත්තේ... ඔය දෙන්නා දෙපැත්තේ ඉදන් විදවලානේ... දැන් ඔයාටම තමයි පැටියෝ මේක හරිගස්සන්න වෙන්නේ.. ඔයා පරන ආරුම වෙලා එයා ලගට ගිහින් එයාට හෙමින් පැහැදිලි කරලා දෙන්න වයස සමාජ තත්වේ මේ මුකුත් ආදරේට බලපාන්නේ නෑ කියලා.... අනික අවුරුදු 7 මොකක්ද.. එයාට ජීවිතේ දෙන්න නංගා... ඔයාට පින් සිද්ද වෙයි"

මං ඉන්නෙ කොහෙදවත් නොබලා අහසි අක්කිව බදාගත්තා.. නිතිනු අයියා මට ආදරෙයි... ඉතින් මට වෙන මොනාද ඕනේ.... එයාට එයාගේ සතුට මං ආපහු ගෙනත් දෙනවා... මේ හැමදෙයක්ම අහසි අක්කා නිසා.... එයා නැත්තම් අපි දෙන්නා හැමදාම දෙපැත්තටම වෙලා විදවයි.. මං අහසි අක්කිගේ කම්මුලට හාදුවක් දීලා සතුටටද දුකටද කියලා දන්නෙ නැතුව වැටෙන කඳුලු පිහදන ගමන්...

"නිතිනු කිව්වා හරි ඔයා හුරතල් තමයි... "

අහසි අක්කි හිනාවෙවී කියන්නේ...

"තැන්ක්‍යූ අක්කි ඔයාට.. මන් දන්නෑ කොහොම ස්තුති කරන්නද කියලා.... මං දැන් යන්න ඕනේ නිතිනු අයියත් එක්ක අපෙ අයියා ඇවිත් ඇති.... මට එයාව බලන්න හදිස්සිය"

මං අක්කිටත් සමුදීලා ශනුවත් ඇදගෙන කැෆේ එකෙන් එළියට ආවේ තටු ලැබුන කුරුල්ලෙක් ගානට..

# 18 කොටස

නිතිනු අයියගේ කාර් එක දැක්කාම මට දැනුනේ කියාගන්න බැරි සතුටක්... ඒත් ඒ සතුට එහෙමම තිබ්බෙ පොඩි වෙලාවකට විතරයි.. කාර් එකේ හිටියේ අයියා විතරයි කියලා දැක්කම මගේ හීන මාලිගා ඔක්කොම කඩන් වැටුනා.. කවදාවත් නැතුව නිතිනු අයියගේ කාර් එක අරන් අයියා ඇවිත් හිටියේ තනියම.. කාර් එකේ ඉස්සරහින් වාඩි වෙලා මං බැලුවේ අයියගේ දිහා...

"කෝ අද නිතිනු අයියා.. "

"අනේ මන්ද සුදූ.. උෟට ආයෙත් මොන පිස්සුවක් ගහලද කියලා.. පහුගිය ටිකේ හොදට ඉදලා එකපාරටම හිටියටත් වඩා අන්තවුනා.. දැනුත් ඇත්තේ කොහේහරි ක්ලබ් එකක.. ඔයාව දාලා මං හොයන් එන්නම්.."

"ක්ලබ් එයා ක්ලබ් යනවද.. "

"හ්ම්ම් ක්ලබ් ගිහින් බොනවා විතරයි.. එහෙම ගෑනු සීන් නම් නෑ... "

මං සැනසුම් සුසුමක් හෙලුවා.. අද තමයි නිතිනු අයියා දැනගන්නේ මගේ හැටි... හපනවා පතුරු යන්නම.. දැන්

බය වෙන්න දේකුත් නෑ මගේනේ..

මාව ගෙදරින් දලා අයියා නිතිනු අයියව හොයන්න ගියා... ඇත්තමයි මේ මෝඩයගේ මෝඩ වැඩ නිසා මගෙ අයියා පවු..

වොශ් රූම් එකට ගිහින් මං බැලුවේ මගේ මූන දිහා... දැක්කම මටම හිනා යනවා... වරදවා වටහා ගැනීමක් නිසා මං කොච්චර දුක් වින්දද.. ඒත් අන්තිමේට එයා ආදරේ කරලා තියෙන්නේ මගේ ඇත්ත පෙනුමට.. අහසි අක්කි අහන්න දුන්න රෙකෝඩ්ස් මතක් වෙද්දී මාව ලැජ්ජාවෙන් රතු වෙනවා.. මගේ පලවෙනි ආදරේ.. හීනයක් වෙයි කියලා බයේ හිටපු ආදරේ.. මගේම වෙන්න හොදටම ලගයි... එයාට මගේ ආදරේ කියලා, එයාගෙන් ආදරෙයි කියලා අහගෙන අපේ කතාව පටන් ගන්න විතරයි තියෙන්නේ.. එතකොට නවල් වල තියනවා වගේ ලස්සන ආදරයක් මට හම්බවෙයි.. එයා සනුදි අක්කට ආදරේ කරා වගේ මටත් ආදරේ කරයි...

හීන ලෝකෙ පාවී පාවී මං පැයකටත් වඩා වැඩියෙන් නෑවා... ඇගහෝදන්න කියලා ආවත් දන්නෙම නැතුව නාලා.. කන්ඩිශනර් ගාලා කොන්ඩේ ඇගිල්ලෙන් කරකව කරකව හැදුවා... එහෙම කරාම මගේ කොන්ඩේ මුදු මුදු වගේ වෙනවා.. නාලා ඉවරවෙලා මිකී මවුස් ඉන්න ලා රෝස පාට ටීශර්ට් එකක් ඇදගත්තා ශෝටකට... පහුගිය දවස් වල මං ගෙදරටවත් කාටුන් චරිත ඉන්න ඇදුම් ඇන්දේ

නෑ.. ඔඩිකොලෙන් ටිකක් ගාගෙන සාලෙට ගිහින් කාටූන් එකක් දාගත්තා... කාලෙකින් කාටූන් බලන්නේ.. ඇත්තටම මං ගෙවපු ව්‍යාජ ජීවිතේට වඩා මෙහෙම ඉන්න එක ගොඩක් පහසුයි...

අයියා නිතිනු අයියාව එක්කගෙන එන්න ගියපු කාලේ මට දැනුනේ කල්පයක් වගේ... ඒත් ඇරුන දොරෙන් දැක්ක නිතිනු අයියා නිසා මගේ හීන ඔක්කොම බොඳවෙලා ගියා...

නිතිනු අයියා ආවේ අයියගේ ඇගට වාරු වෙලා.. නැගිටගන්නවත් බැරි තරම් වෙරිද කොහෙද... ඉතින් කොහොමද වැදගත් දෙයක් කතා කරගන්නේ.. මං සෙටියෙ ඉඳන් එයා දිහා බලන් හිටියේ බලාපොරොත්තු සුන් වෙච්ච බැල්මකින්..

අයියා එයාවත් වත්තම් කරගෙන කාමරේට යන්න ගිහින් මග නැවතුනේ මං දිහා බලාගෙන.. පුදුමෙන් වගේ එයා මන් දිහයි ටීවි එක දිහයි මාරුවෙන් මාරුවට බැලුවා..... මං අයෙත් කලින් වගේ හිටපු නිසා වෙන්න ඇති.... අයියා නැවතුනේ ඇය් කියල බලන්න වගේ නිතිනු අයියා අයියගේ ඇස් කෙලින්ම මන් දිහා බැලුවා.....

"චූටි පැටියා ඇවිත්.. "

නිතිනු අයියා ඇස් රබුටන් ගෙඩි සයිස් කරගෙන මන් දිහා බලන් කිව්වේ හරියට අවුරුදු ගානකින් අම්මව දැක්ක මොන්ටසෝරි බබෙක් වගේ... අයියයි මමයි දෙන්නම ගැස්සිලා එයා දිහා බැලුවා... අයියවත් තල්ලු කරගෙන වැනු වැනි වැනීම එයා මං ලගට ඇවිත් මගේ අස්සෙන්ම වාඩි වුනා.. වාඩි වුනා කිව්වට කඩන් වැටුනා..

මගේ හදවත ගම හරහා දුවනවා වගේ වේගෙන් ගැහෙන්න ගත්තා... ඇය් දෙය්යනේ තනියම හිටියනම් මොනා හරි කරගන්න තිබ්බා... ඒත් අයියා ඉස්සරහ එයා මොනාහරි කිව්වොත් අයියා මට මොනවා කරයිද දන්න්නෑ..

"මගේ සෝස මල ඔයා ආවද... කෝද ගියේ.. මං පාලුවෙන් හිටියේ ඔයා නැතුව.. ඇයි ඔයා මාව දලා ගියේ... "

වෙරි පිට නිසාද්‍රෝ නිතිනු අයියා පොඩි බබෙක් වගේ මන් දිහා බලන් කියවනවා... ඒත් එක පාරටම මුලින් කපපු කෙසෙල් කදක් ගානට එයා මගේ පපුවට වැටුනා.. මං කෙල පිඩක් ගිල්ලේ අයියා දිහා බලාගෙන.. අයියට හිතාගන්න බෑ මෙතන මොනාද වෙන්නේ කියලා... කටත් ඇරන් බලන් ඉන්නවා හුස්මක් වත් ගන්නේ නැතුව...

"ඇය් ඔයා මාව දලා ගියේ... මං පාලුවෙන් හිටියේ මගේ චූටි මැනික නැතුව.. ආයේ මාව දලා යන්න එපා... මං ආදරෙයිනෙ මගේ පැටියට.. ගොඩක් ආදරෙයි..

අහස තරම්.. නෑ ඊටත් වඩා... මං කියන්න දන්නෑ ගොඩාරියක් ආදරෙයි.. "

නිතිනු අයියා මට රිදෙන තරම් තදට බදාගෙන කියන්නේ... ඒ හඩ බොද වෙලා.. අඩන්න ඔන්න මෙන්න වගේ.. එයා කියපු වචන වලට පුලුවන් උනා මට ඉන්න තැනත් අමතක කරවන්න.. පෙරුම් පුරාගෙන හිටපු අකුරු හතර එයාගේ කටෙන් ඇහෙද්දි තවත් කොහොමද ඉවසන් ඉන්නේ.. හදවත ඉටිපන්දමක් වගේ දියවෙලා වැක්කෙරෙද්දි මට ඕනෙ උනේ එදා වගේ එයාව තුරුලු කරගෙන ආදරෙයි කියන්න.. ඒත්..

"නිතිනු ඕක නවත්තපන්.. ඔය සනුදි නෙවෙයි මගේ නංගි.. උබට මොනාද වෙලා තියෙන්නේ"

අයියා නිතිනු අයියට කෑ ගැහුවේ පියවී සිහියට ආපු වෙලාවෙම වෙන්නැති... ඒත් නිතිනු අයියා පපුවෙ තිබ්බ මූන අරන් මගේ උරහිසයි බෙල්ලයි අතරේ රන්ද ගත්තා මිසක් අයින් වෙන්න නම් අදහසක් තිබ්බෙ නෑ...

"මට සනුදි එපා... එයා හොද නෑ... මගේ චූටි පැටියා හොදයි... එයා මගේ.. මගේ විතරමයි.. ඉක්මනටම මං එයාව මැරි කරනවා.. එතකොට මටත් පවුලක් තියෙයි.. මගේ රපුන්සල් ඔයා මට පවුලක් දෙනෝ නේද... "

පුංචි පූස් පැටියෙක් වගේ කුරු කුරු ගගා එයා තව තවත් මගේ ඇගේ දැවටෙනවා.. ඉතින් ආදරේ නොහිත ඉන්නේ කොහොමද එයා ගැන.. උතුරන ආදරේ එක්ක , දුක , සතුට , බය ඔක්කොම මිශ්‍ර වෙච්ච අමුතු හැඟීමක් මාව අක්‍රමනය කරලා... ප්‍රතිචාරයක් දෙන්න බැරි විදිහට මගේ වචන විතරක් නෙවෙයි අතපයත් ලොක් වෙලා... කඳුලු විතරක් ඔහේ ගලන් ගියේ ඇස් වලට අගුලු වැටෙන්න අමතක වෙච්ච නිසා වෙන්න ඇති.... ඒත් ඒ කඳුලු අයියටට තේරුනේ වැරදි විදිහට ..

"නිතිනු ඔය විකාරේ නවත්තපන්.... ඔය උබ හොයන එකී නෙවෙයි.. ඔය ඉන්නේ ආරු.. මගේ නංගි... උබ පොඩ්ඩක්වත් කැමති නැති කෙල්ල.. දැන්වත් නැගිටපන්... සිහියට වරෙන් යකෝ.. "

අයියා හය්යෙන් කෑ ගහන්න ගත්තේ නිතිනු අයියාව නැගිට්ටවන්න උත්සහකරන ගමන්... ඒත් එයා කොහොල්ලෑ බබාගේ ඇලුන හාවා වගේ මගේ ඇගේම එල්ලිලා හිටියේ...

"බෑ.. මට යන්න බෑ... මට එයාව ඕනේ.... මං ආදරෙයි.. ආරුට මන් ආදරෙයි.. මං එයාව දලා යන්නේ නෑ... ආරු මගේ.. මට ඉන්න දෙන්න කියන්නකෝ... මට කවුරුත් නෑ ඔයා විතරයි ඉන්නේ... හැමෝම මාව දලා යනවා ඔයත් මාව දලා යනවද.. මං මැරෙයි මාව දලා යන්න එපා... මං අවාසනාවන්තයි මට කවුරුත් නෑ... මං තනිවෙලා... මට ඔයාගේ ආදරේ ඕනේ... අඩුම ගානේ මට ආදරෙයි

වගේ රගපාන්න... මං ඔයාට ඕනෙ දෙයක් දෙන්නම්.... පන උනත් දෙන්නම්.... මට ආදරේ කරන්න ප්ලීස්... මගේ පපුව රිදෙනවා... මං මැරෙයි... මටත් ආදරයක් ඕනේ.... ඔයා කිව්වා නේද චූටිට කවුරුත් නැති නිසා එයා පව් කියලා.... මටත් කවුරුත් නෑ චූටි.... චූටි කියලා හිතලවත් මට ආදරේ දෙන්නකෝ.."

තවත් ඒ වචන අහන් ඉන්න බැරි තැන පුලුවන් තරම් තදට එයාව බදාගෙන මං ඉකිගගහා ඇඩුවා... පිරිමියෙක් වෙච්ච එයා මගේ උරහිස තෙමෙනකන් අඩ අඩ මං සතෙක්ට දෙන ආදරේ මගෙන් ඉල්ලද්දි කොහොමද ඉවසන් ඉන්නේ... ආදරේ මිනිස්සුන්ව මෙච්චර අසරන කරනවද දෙවියනේ... එයාගේ ඔලුව අතගාන ගමන් එයාව තවත් තදට තුරුලු කරගත්තේ අයියා මෙතන ඉන්නවා කියන එකත් අමතක කරලා...

"ආදරෙයි දෙවියනේ මමත් ඔයාට.. ගොඩක් ආදරෙයි... ගොඩා...රියක්. මං ඔයාව දාලා යන්නේ නෑ කොහෙවත්.. මට මුකුත් ඕනෙත් නෑ ඔයාගෙන්.. මං ආදරෙයි... ඔයා තනිවෙලා නෑ... මං ඉන්නවා ඔයාට"

කොන්ඩේ අතින් අදගන්න ගමන් අයියා පුටුවකට කඩන් වැටුනෙත් නිතිනු අයියා මගේ මූන දිහා බැලුවෙත් එකම වෙලාවේ...

"ඇත්තමද කියන්නේ... මගේ චූටි මැනික මට ආදරෙයිද.. බොරු නෙවෙයි නේද... මට මට දරාගන්න බෑ චූටි... ඒ කියන්නේ ඔයා මගේද... මගේ සෝස මල මගේ නේද... ඔයා මාව බදිනවා නේද..."

චූටි ළමයෙක් වගේ මගේ බෙල්ල පාමුල මූන තියාගෙන එයා හය්යෙන් අඩන්න ගත්තා...

"අනේ.. අයියේ අඩන්න එපා... ප්ලීස් හොද ළමයා වගේ අඩන්නේ නැතුව ඉන්නකෝ... මටත් ඇඩෙනවා.."

කරන්ට් එකක් වැදිලා වගේ එයා මගේ දිහා බැලුවා.....

"චූටි පැටියා අඩනවා.... අනේ... මට සමාවෙන්න මැනික මං ඔයාව ඇඩෙව්වා.. ප්‍රොමිස් ආයෙ මං බබාව අඩවන්නේ නෑ... සතු වෙලා.. "

කඳුලු පුරෝගත්තු ඇස්වලින් මං දිහා බලාගෙන එයා එහෙම කියලා මගේ මූනම හාදු වැස්සකින් තෙත් කරා... කුළුදුලේම ලැබුන හාදු වර්ශාවට නතුවෙමින් මගේ ඇස් පියවුනේ මටත් නොදැනීම... කොච්චර වෙලාවක් ගියාද කියලා දන්නේ බිත්තියේ එල්ලලා තිබ්බ ඔරලෝසුව විතරයි.. ඇස් ඇරලා බලද්දී අයියා පුටුවේ හිටියේ නෑ... එකපාරටම මතක් උනේ අපි දෙන්නා මෙතන නටපු නාඩගම... අයියාට කේන්ති යන්න ඇති....

හිතට බයක් දැනෙන්න ගද්දිම එහෙමම අමතක වෙලා ගියේ නිතිනු අයියා කුරු කුරු ගගා ඇගේ එතෙද්දි...

එයා මගේ උරහිසට ඔලුව තියාගෙන මගේ කොන්ඩෙත් එක්ක සෙල්ලමක.. පොඩි කොන්ඩ කැල්ලක් අරන් ඒක ඇගිල්ලෙන් කරකව මොනාදෝ කරන ගමන් තනියම හිනාවෙනවා... ඒ ගමන් කොන්ඩේ ඔක්කොම අල්ලන් ඉබිනවා... එක කෝලමක්..

"සූදය්..."

එයා ඒක කියපු හැටියට මට හිනානොවී ඉන්න බැරි උනා... වෙරි උනාම මිනිස්සු මෙච්චර වෙනස් වෙනවා කියලා මං දැනන් හිටියේ නෑ... වෙන මිනිස්සු නපුරු වෙනවා මෙයා බබෙක් වෙලා...

ටික වෙලාවකින් බෙල් එක වැදෙද්දි මං ඒ පැත්ත බැලුවේ කවුද බලන්න.. ඒත් එක්කම අයියා එලියට ගිහින් ආවේ පාර්සල් වගයක් අරන්... දැන් කෑම උයන්න වෙලාවක් නැති හින්දද කොහෙද එයා කෑම ඕඩර් කරලා... කෑම පාර්සල් ටික මේසෙන් තියලා නපුරු බැල්මකින් මන් දිහා බැලුවා..... බය වෙච්ච පාර නැගිටින්න හැදුවත් හෙල්ලෙනනවත් බැරි උනේ ඒ තරම් තදින් නිතිනු අයියා මාව බදන් හිටපු නිසා..

" මිම්ම්ම්ම් යන්න එපා... කොහෙද යන්නේ... ඉන්නකෝ"

ලැජ්ජාවයි බයයි දෙකෙන්ම අසරන වෙලා මං බැලුවේ අයියා දිහා... ප්ලේට් එකකට ලොකු බත් එකක් බෙදලා ස්ටූල් එක උඩින් තිබ්බා දමලා ගහනවා වගේ... මං බිම බලාගෙන හිටියේ වෙන කරන්න දෙයක් නැති නිසා.. තිතිනු අයියට නම් ලෝකෙ පෙරලුනත් ගානක් නෑ වගේ මගේ ඇගට ස්ටිකර් වෙලා තනියම හිනාවෙනවා...

"ඕකටත් කවනවා... "

අයියා මට ඔරවලා කුස්සියටම ගියා...

"තිතිනු අයියෙ නැගිට්ටින්නකෝ අපි බත් කමු"

"මට තිනූ බබා කියන්න අම්මි කිව්වෙත් එහෙම "

කට හද හද එයා කියන්නේ... මරු බබා අලි බබා..

"හරි හරි තිනූ බබා නැගිට්ටින්න කෝ හබුන් කන්න"

අමාරුවෙන් හිනාවත් තදකරගෙන කිව්වා විතරයි.. ක්ශනිකව නැගිටලා ඇස් පියාගෙන ඉන්නවා කටත් ඇරගෙන... මං ජීවිතේ පලවෙනි වතාවට කෙනෙක්ට කවන්නේ.. හැමදම මට කැව්වා මිසක මං කාටවත් කවලා

නෑ... බොහොම අමාරුවෙන් කවන්න පටන් ගත්තා... කෙලින් හිටපු කෙනා ටික ටික මගේ උරහිසට ම ඔලුව තියාගත්තා... තාමත් ඇස් පියාගෙන කන්නේ... මොනාද කන්නේ කියලවත් යා දන්නේ නෑ...

"සසය් ඔයා කවද්දි අම්මි කවනවා වගේ..."

එයා හිනාවෙවී එහෙම කිව්වත් මට නම් කාපු ටිකත් පිච්චුනා වගේ ඒ කතාවට... පව්.. ඒක තමයි එදා අම්මා කවද්දිත් ඇඩුවේ.. මං මුකුත් නොකීවේ කියන්න ගියොත් මට ඇඩෙන නිසා.. මේ ඉන්න විදිහට මං ඇඩුවොත් මෙයා බිම පෙරලි පෙරලි අඩන්න බැරි නෑ... ඒතරම් ශොට් එකේ පවර් එක..

කාලා අතහෝදන්න වත් මට යන්න දුන්නේ නෑ එයා.. ඒ නිසා ආයෙත් අයියගේ පිහිට පතන්න සිද්ද උනා... පුච්චලා අලු කරන බැල්මක් දලා අයියා වතුර ජොග්ගුවක් ගෙනත් දුන්නා.... කාපු පිගානටම අත හෝදලා එයාටත් පොවලා මාත් බීලා මං එහෙමම හිටියා... එක විදිහටම ඉදලා කකුල් අතපය ඔක්කොම හිරි වැටිලා.. ඒත් ඉතින් හෙලවෙන්නවත් බෑ...

නිතිනු අයියට නින්ද යනකම් ඉදලා අයියගෙත් උදව්වෙන් යන්තන් මට එයාගෙන් මිදෙන්න පුලුවන් උනා... අයියා මාව කාමරේට ඇදගෙන ගියේ...

"මං තමුසෙව උදේට අල්ලගන්නත්... නැත්තම් මං තමුසෙට කෑ ගහලා තමුසේ අඩන්න ගත්තොත් අරුව නලවන්න මට තොවිලයක් නටන්න වෙන්නේ... උදේ වෙනකම් කාමරෙන් එලියට එන්න බෑ... මොකා උනත් දැන් ඒකා බීලා ඉන්නේ... තේරුනානේ.. මං කාමරේ යතුරත් අරන් යන්නේ.... තමුසෙට වොශ් රූම් යන්න ඕනෙ නම් මට කෝල් එකක් දෙනවා..."

අයියා මට බැනලා දඩාස් ගාලා දොර වැහුවේ මට ගහන්න බැරි වෙච්ච එකේ පලිය ගන්න වගේ...

## 19 කොටස

සතුට වැඩි කමටද බය වැඩිකමටද මන්ද මට රෑ නින්ද ගියේ නෑ... උදේට අයියා මොනා කියයිද දන්නෑ... අපි දෙන්නව වෙන් කරයිද මාව ගෙදරම යවයිද දන්නෑ...

නින්ද යන්නේ නැති නිසා 6 ය් ගානකට විතර නැගිට්ටා.. අයියා දොරේ ලොක් එක ඇරලා.. කාමරෙන් එලියට තියපු කකුල ආයෙත් ඇතුලට ගත්තේ සෝෆා එකේ වාඩි වෙලා ඉන්න අයියා දැකලා... නිතිනු අයියා නම් තාම නිදි සෝෆා එකේම... එතන ඉස්සරහටම වෙලා අයියා ඉදන් ඉන්නේ

හරියට ගොදුරක් ඩැහැගන්න බලන් ඉන්න කොටියෙක් වගේ... දැන්නම් පපුව රේස් දුවනවා.. අපේ ආදරේ පටන් ගන්නත් කලින් අයියා විලන් වෙයිද? අනේ දෙවියනේ එහෙම නම් වෙන්න එපා...

බැරිවෙලාවත් දෙන්නගෙන් එක්කෙනෙක් තෝර ගන්න උනොත්.. ඊට වඩා හොදයි මං මැරිලා ගියා නම්..

නිතිනු අයියා පොඩ්ඩක් හෙලවෙනවා දැක්ක නිසා මං කාමරේට නොයා දොර රෙද්ද අස්සෙන් බලන් හිටියා... නිතිනු අය්යා ඔලුවත් අල්ලන් සෝෆා එකේ ඉදගත්තා.... අය්යා උගුර පාදනවා වගේ සද්දයක් දැම්මේ එයාගේ අවදානය ගන්න..

"ගුඩ් මෝර්නින් ආරාධ්‍ය "

නිතිනු අයියා ලස්සනට හිනා වෙලා එහෙම කිව්වේ හරියට ඊයේ කිසිම දෙයක් මතක නෑ වගේ... අර ෆිල්ම් වල වගේ එයාටත් බිව්වම ඔක්කොම අමතක වෙනවද දන්නෑ... එහෙම උනොත් නම් විනාසයි..

"ගුඩ් මෝර්නින්.. මං හිතනවා උබට ඊයෙ නටපු නාඩගම මතකයි කියලා.... "

අයියා කිව්වේ එයාගේ ඇස් දිහා බලාගෙනම.. කටහඩේ නම් කිසිම සුබවාදී බවක් තිබ්බේ නෑ...

නිතිනු අයියා වටපිට බලල දනිස් දෙක උඩින් අත් දෙක තියාගෙන එයාගෙම කොන්ඩේ අදින්න පටන් ගත්තා...

"මං දන්න විදිහටනම් උබට බිව්වට පස්සෙ අමතක වෙන ලෙඩක් නෑ... ඒ කියන්නෙ ඊයේ වෙච්ච හැමදේම මතකයි.. ඒ නිසා මට කියපන් මොකක්ද ඊයේ නටපු නාඩගමේ තේරුම.. උබ ඇත්තටම මගේ නංගිට ආදරෙයි ද එහෙම නැත්තම් වෙන ගෑනියෙක් කියලා එයාව වරදවා වටහගත්තද, එහෙමත් නැත්තම් උබ මගේ නංගිගේ ජීවිතේ එක්ක සෙල්ලම් කරනවද.. "

අයියා අවසානෙට කියපු ටිකට නිතිනු අයියා වගේම මමත් ගැස්සුනා.. එයාගේ හොදම යාලුවට අයියා කොහොමද එහෙම කියන්නේ... නිතිනු අයියා එහෙම නරක කෙනෙක් නෙවෙයි..

"ආරාධ්‍ය මොනාද මේ කියවන්නේ"

"අයෑම් රියලි සොරි මචන්.. බට් ශී ඊස් මයි සිස්ටර්.. මයි එවුරිතින්ග්.. මං මේ ලෝකේ බලන්න අකැමැතිම දේ තමයි ආරුගේ කදුලු.. ඉතින් එයාගේ ප්‍රශ්නෙකදී මට මගේ හොදම යාලුවව උනත් සැක කරන්න වෙනවා.. ගෑනුන්ට හේට් කරපු උබ එකපාරටම නංගිට ආදරෙයි කිව්වම මං කොහොමද විශ්වාස කරන්නේ... අනික එද උබ එයාව

තල්ලු කරලා දැම්මා පොඩ්ඩක් ඇගේ ගෑවුනා කියලා.. එහෙම එකා ඊයෙ ඇවිත් එයාව බදගත්තා.. මං කොහොමද මේවා විස්වාස කරන්නේ... මං පිලිගන්නවා ආරු අමාරුවේ වැටිච්ච වෙලේ උබ බේරගත්තා... නව වූෆිවත් එයාට දුන්නා.... ඉතින් එයාගේ පැත්තෙන් ආදරයක් ඇති වෙන එක සාධාරනයි.. මොකද ඒකි බොලදයි.. ඒත් උබ එහෙම නෑ උබ මැචුවල් පිරිමියෙක්.. අනික උබ කැමැත්තෙන් හිටපු ටයිප් එකයි ආරුගේ ටයිප් එකයි සම්පූර්ණයෙන්ම වෙනස්.... සෝ හව් කැන් අයි ට්‍රස්ට් යූ..."

"උබ හොදටම දන්නවා මං කවදවත් කෙල්ලන්ගේ ජීවිත එක්ක සෙල්ලම් කරලා නෑ කියලා.. කොහොමද උබ එහෙම දෙයක් හිතුවෙවත් මගේ ටයිප් එක කියලා මං ඒ දවස් වල කිව්වේ සනුදි ගැන.. මං බලෙන්ම ඔලුවට දගෙන හිටියේ ඒයාගේ ගතිගුණ තමයි මගෙ ඔලුව ඇතුලේ ඇදිලා තිබ්බ රූපෙ කියලා.... මාව හැමෝටම වඩා දන්න උබ කොහොමද එහෙම හිතුවේ... මං ඇත්තටම ආරුට ආදරෙයි"

"කෙල්ලෙක්ට පුලුවන් නරක මිනිහෙක් හොද එකෙක් කරන්නත් හොද එකා අන්ත තිරිසනෙක් කරන්නත්.. මට උබව විශ්වාසයි.. ඒත් සනුදි විනාස කරපු නිතුනුව විශ්වාස කරන්න අමාරුයි.. ඔෆිස් එකේ අහිංසක කෙල්ලෝ කීයක් උබ ජොබ් එකෙන් අස් කරාද... නිකම්ම නිකන් උදේ උබේ මූන ඉස්සරහට ගියා කියලා.... සමහර අය වැදවැටුනා පවුලේ මිනිස්සුන්ව ජීවත් කරවන්න විදිහක් නෑ කියලා..

ඒත් උඹ අස්කරා.. එහෙම කරේ හිගන්නෙක් දැකලවත් කවදවත් අහක බලන් නොගියපු, වැඩිහිටි නිවාස වලට ළමා නිවාස වලට දන දුන්න උඹම තමයි... "

"උඹ කියන කතාව ඇත්ත.. ගෑනියෙක්ට පුලුවන් මරන්නත් උපද්දවන්නත්.. ඉතින් එහෙනම් ඇයි ආරුට බැරි සනුදි මරපු මගේ හදවතට පන දෙන්න... අනික උඹ හිතනවා වගේ මං එක සැරේ එයාට ආදරේ කරේ නෑ... ටිකෙන් ටික ආදරේ කරන්න පටන් ගත්තේ... නංගිට තියෙන්නේ ලස්සන හදවතක්.. හරියට මගේ අම්මට වගේ... ඒ ලස්සන දකින්න මං ටිකක් පරක්කු වුනා.. ඒත් ඒක හොයාගත්තට පස්සේ ආදරේ නොකර ඉන්න බැරි තරමට මං අසරන උනා... මං දන්නවා අපි දෙන්නා මොන පැත්තකින්වත් ගැලපෙන්නෑ කියලා.... මං උත්සහ කරා කොහොමහරි මාව පාලනය කරගන්න... ඒත් මට බෑ බන්... මට ආරුව ඕනේ.... ප්ලීස් ආරාධ්‍ය මාව තේරුම් ගනිං.. මාත් ආසයි සතුටින් ජීවත් වෙන්න...

නිතිනු අයියගේ වචන වලට මගේ කදුලු නම් තවත් ඇස් වල ඉන්න කැමති උනේ නෑ... මටත් නොදැනී කදුලු වැල් පිටින් ගලන් ගිහින් කම්මුල් තෙමලා දැම්මා..... අයියා ලොකු හුස්මක් අරන් නලල දෙපැත්ත ඇගිලි තුඩුවලින් තෙරපනවා..

"ආරු.... ඔය දෙර අස්සේ රිංගන් ඉන්නේ නැතුව ඇවිත් මෙතනින් වාඩි වෙනවා.. "

අයියා කෑ ගහපු පාර මං උඩ විසි උනා... හතර වටේම කැරකිලා බැලුවේ අයියා කොහොමද මං මෙතන ඉන්නවා කියලා දැනගත්තේ බලන්න.. මොකද එයා ඉන්නේ මට පිටුපාලා.. වටයක් කැරකිලා මං නිතිනු අයියා ඉන්න පුටුවේ ටිකක් ඈතින් ඉදගත්තේ තවමත් ඒ ප්‍රශ්නේ හිතේ තියාගෙනමයි..

අපි දෙන්නා අයියා ඉස්සරහ කරබාගෙන හිටියේ හරියට හෝම් වර්ක් කරන් ආපු නැති ළමයි දෙන්නෙක් ටීචර් ඉස්සරහ ඉන්නවා වගේ...

"ආරු තමුසේ නිතිනු අයියට ආදරෙයිද.. "

අයියා අහපු ප්‍රශ්නෙට මං බිම බලාගෙනම ඔළුව උඩට පල්ලෙහාට වැනුවා...

"කොහොමද දන්නේ.."

මං ඇස් ලොකු කරන් අයියා දිහා බැලුවා... උත්තරයක් දෙන්න පුලුවන් ප්‍රශ්නයක් ද ඇහුවේ

"නිතිනු අයියා කලින් ආදරේ කරලා තියනවා... තමුසේ ආදරේ කරලා නෑනේ.. ඉතින් තමුසේ කොහොමද දන්නේ

මූට ආදරේයි කියලා.... "

මං එක අතකින් අනිත් අත කොනිති ගගහ නිතිනු අයියා දිහා බැලුවා... එයා ඇස් දෙක බල්බ් දෙකක් වගේ කරන් මං දිහා බලන් ඉන්නවා මගේ උත්තරේ අහගන්න.. ඇස් යටින් අයියා දිහත් බලලා ආයේ බිම බලාගත්තා.....

"එයා ලග ඉද්දි ඔයය් තාත්තිය් ලග ඉන්නවා වගේ දැනෙනවා.. එයා දුකින් ඉන්නවට මං කැමති නෑ.. මං එයා දිහා බලන් ඉන්න ආසයි.. කවුරුහරි එයා දිහා බලනකොට ඉරිසියයි.. තව ගොඩක් තියෙයි මට මතක නෑ... නව කතාවල හැටියට ආදරේ නිසා තමයි එහෙම දැනෙන්නේ..."

"නිතිනු උබට තවමත් විශ්වාසද ආරුව උබට ගැලපෙනවා කියලා.. "

අයියා එහෙම කියද්දි මට දුක හිතුනා... එයා මාව අවතක්සේරු කරනවා.. ඒත් මං උත්තර දුන්නේ මං දන්න විදිහටනේ... ඇඩෙන්න ඔන්න මෙන්න ඇස් වලින් මං බැලුවේ නිතිනු අයියා දිහා... එයා නම් මගේ දිහා බලන් ඉන්නවා දිලිසෙන ඇස් වලින්

"ආරුට මන් ආදරෙයි.. එයා තමයි මට ගැලපෙනම කෙනා.. කවදවත් මන් මේ තීරනේ ගැන පසුතැවෙන්නේ නෑ... "

"පොඩ්ඩක් හිතපන් ආරූ තාම පොඩි ළමයෙක් වගේ... උබට ළමයෙක් අරන් හදාගත්තා වගේ තියෙයි.. අඩුම ගානේ බීම බෝතලයක් වත් තනියෙන් ඇරගන්න බෑ එයාට.. තේරුම් ගනින් උබලා ගැලපෙන්නෙ නෑ... අනිත් එක මං උබගේ යාලුවා බව ඇත්ත.. ඒත් ඒක අපි දෙන්නගේ දෙයක් විතරයි.. හැබැයි මැරේජ් එකක් කියන්නේ පවුල් දෙකක් අතර දෙයක්.. ඒකට අපි ඉන්න තත්වේ බලපානවා.. ඇත්තම කතාව මං උබේ කම්පැනි එකේ වැඩකරන එකම එක මැනේජර් කෙනෙක් විතරයි.. බලපන් අර එළියේ තියන වාහන දෙක උබේ අවුඩියයි මගේ බය්ක් කටුවයි.. අන්න ඒක තමයි එළියේ මිනිස්සු දකින්නේ.. කුරුල්ලෙක් වගේ උඩ පැන හිටපු මගේ නංගිව හයක්ලාස් සමාජේට දාන්න බයයි බන් මට.. අඩුම ගානේ උබත් එක්ක පාටි එකකට යන්න හිල්ස් දෙකක් දාන්නවත් ඒකිට බෑ.."

මං කලින් හිතපුවාට මටම වයිර කරගන්න තරමට ඒ වචන බලවත් උනා... අයියා මාව අවතක්සේරු කරන්නේ නෑ... එයා මට ආදරෙයි.. මං දුක් නොවිද ඉන්නයි එයාට ඕනේ.. එයා කියන කතාව ඇත්ත. හය් හීල් තියා පොඩි හීල් එකක් තියන ශූ එකක්වත් මට දාන්න බෑ... එතකොට කොහොමද මං එයාගේ තත්වෙට ගැලපෙන විදිහට ඉන්නේ... ඒත් මං ආදරෙයිනේ දෙවියනේ... එයා නැතුව මට ඉන්න බෑ.

"මං මොනාද කරන්න ඕනේ... මට මට ඕනෙම දෙයක් කරන්න පුලුවන් ආරුව මගේ කරගන්න.. මං මේ බිස්නස් ඔක්කොම අතෑරලා දන්නම්.. උබ වගේ ජොබ් එකක් හොයාගන්නම්.. උබ බලාගත්තා වගේ මං එයාව බලාගන්නම්... සල්ලි මොනාද බං.. මට සල්ලි වැඩක් නෑ... මට ඕනේ මගේ කියලා පවුලක්.. ආදරය සැනසීම.. හරියට උබලගේ ගෙදර වගේ.. තවත් මෙහෙම හිටියොත් මට පිස්සු හැදෙයි.. දැනටත් මං බෙහෙත් බොන නිසා බේරිලා ඉන්නේ... මට මගේ ආදරේ දීපන් ආරාධ්‍ය මං වැදලා ඉල්ලන්නේ.. "

නිතිනු අයියා අයියට එහෙම කියලා එයාගේ කකුල ලග දනගහගත්තේ මටයි අයියටයි දෙන්නටම ඉබේම නැගිට්ටවෙද්දි..

"නිතිනු උබට පිස්සුද යකෝ මොනාද මේ කරන්නේ නැගිටපන්.."

අයියා කොච්චර නැගිට්ටවන්න හැදුවත් එයා හිටියේ තදට කකුල බදාගෙන.. මං අත් දෙකත් මූනෙ තියාගෙන එයා දිහන් බලන් හිටියේ මොකක්ද උනේ කියලා හිතාගන්න බැරුව.. ආත්ම ගරුත්වය පොඩ්ඩක් වත් මායිම් නොකර තමන්ගේ යාලුවාගේ කකුල් ලග දන ගහන්න තරම් මාව වටිනවද

"ප්ලීස් ප්ලීස් මට එයාව දීපන්... මට වෙන මුකුත් එපා... ප්ලීස් ප්ලීස් "

අයියා බොහොම අමාරුවෙන් එයාව නැගිට්ටවලා ඉන්දෙව්වා.. තාමත් ඒ ඇස් වලින් කඳුලු ගලනවා. අයියා හිටගෙන එයාගේ උරහිස් දෙකෙන් අත තියලා මූනට එබුනා....

"මගේ නංගිගේ ඇහෙන් එක කඳුලක් හරි වැටුනොත් මං උබව මරනවා.. කවදාවත් උබට සෙකන්ඩ් චාන්ස් එකක් හම්බවෙන්නේ නෑ... උබ මගේ යාලුවා නොවුනනම් මං කීයටවත් උබට කැමති වෙන්නේ නෑ... "
අයියා තර්ජනේ කරනවා වගේ එහෙම කියලා එතනින් යන්න ගියේ නිතිනු අයියාගේ පිටටත් තට්ටුවක් දලා... නිතිනු අයියයි මමයි අයියා ගියපු දිහා බලන් හිටියේ වුනේ මොනාද හිතාගන්න බැරිව.. එයා නොකියා කිව්වේ අපි දෙන්නට කැමතියි කියලා නේද...

තාමත් අයියා ගියපු දිහා බලන් ඉන්න නිතිනු අයියා ලගින් වාඩි වෙලා එයාගේ පපුවට තුරුලු වුනේ එයා ගැස්සිලා පියවී සිහියට එද්දි...

"මට එච්චර ආදරෙයිද අයියෙ ඔයාගේ ආත්ම ගරුත්වේ ගැනවත් නොහිත කොහොමද එහෙම කරේ ඔයා.. ඇය් එහෙම කරේ.... ? මේ මෝඩ මාව එච්චර වටිනවද ඔයාව.."

"බබා ඇය් පැටියෝ මේ අඩන්නේ.. ම්ම්ම් අයියා අපි දෙන්නට කැමති උනානේ.... බලන්නකෝ මූන රතු වෙලා... අනික උදේ පාන්දර අඩන්න හොද නෑ මැනික... කෝ අඩන්න එපා."

ටිකකට කලින් වෙච්ච දේ ගානක් වත් නැතුව එයා මගේ කදුලු පිහදනවා...

"උදේම අඩන්න හොද නැත්තම් ඇය් ඔයා ඇඩුවේ.. "

"කදුලු මට ආගන්තුක නෑ මැනික... ඒත් ඔයාට එහෙම නෑ... මේ ඇස් තියෙන්නේ හිනාවෙන්න විතරයි.. "

මගේ ඇස් අස්සෙ කිම්දෙන ගමන් එයා මගේ කොන්ඩ කෑලි අතරින් මූන පාදනවා... ඒත් එයා කියපු දේට මන් පොඩ්ඩක් වත් කැමති නෑ... ඒ ඇස් වලටත් කදුලු එපා... හිනාව විතරයි ලස්සන... එයා දිහාම බලන් ඉදලා එකපාරටම එයාගේ ඇස් දෙකම ඉබලා මං ඒ පපුව අස්සෙ හැංගුනා.. එයා ශොක් වෙන්නැති... රතු වෙච්ච මූන එයාට පේනවට එයාගේ පපුවට තව තවත් තුරුල් වුනා.. තාමත් එයාගේ ඇගෙන් ඇල්කොහොල් ගද ආවත් එයාගෙන් අයින්වෙන්න ඒක නම් හේතුවක් උනේ නෑ... එයා සැරෙන් සැරේ මගේ හිස් මුදුන ඉබිනවා... සනීපෙට ඇසුත් පියවීගෙන එනකොටමයි එයා කතා කරේ...

"චූටි මැනික... දෙය්ද පැටිටෝ... අයියා එයි බබෝ නැගිටින්නකෝ... "

මං එයා දිහා බලලා ඔරවලා අයෙත් පපුවට තුරුල් උනා... මට එහෙම ඉන්න ඕනේ.. ඒකට එයාවත් බාදු කරනවට මන් කැමති නෑ... එයා මගේ නේ

"හිතුවක්කාර නොවී නැගිටින්න මැනික.. අයියා දැන් නාලා ඉවරවෙලා එයි... දැක්කොත් දෙන්නටම ගුටි කන්න වෙයි.. කෝ නැගිටින්න... වෙන වෙලාවක බබාව ගොඩක් වෙලා තුරුල් කරන් ඉන්නම්.."

මං ගස්සගෙන නැගිට්ටා.. මං ආස උනාට එයා ලග ඉන්න එයා කැමති නෑ මං ගාව ඉන්න.. සමහරවිට ලොකු අය එහෙම වෙන්නැති... මං බබෙක් වගේ හැසිරුනාට එයා මැචුවල් පිරිමියෙක්නේ..

ඇස් වලට කදුලු උනද්දි මං දුවන් ආවේ කාමරේට... කොට්ටෙට මූන ඔබාගෙන මං ඇඩුවා... මං දන්නවා එයා මට ආදරෙයි කියලා.. ඒත් මට දුකයි නේ...

කොට්ටෙ ඔලුව ඔබාගෙන හිටිය මාව එක පාරට වැටුනේ ඔඩොක්කුවකට.. මං ඇස් ඇරලා බලද්දිම තිතිනු අයියා මාව තුරුලට ගත්තේ හරහට බබෙක් වඩා ගන්නවා

වගේ... ඊට පස්සේ මට ලැබුනේ සිහියෙන් ඉද්දි එයා දුන්න පලවෙනි හාදුව... හිස් මුදුන ඉම්බට මූන කිස් කරේ නෑනේ... ඒක ආදරය ආරක්ශාව කැටි වෙච්ච ෆෝ හෙඩ් කිස් එකක්... ලෝකෙම අමතක කරන්න පුලුවන් මැජික් බලයක් තියන එකක්...

"තරහයි ද චූටි හා පැටියා... ඔයාව තුරුල් කරන් ඉන්න ආස නෑ කියලා හිතුවා නේ? එහෙම නෑ පැටියෝ.. ජීවිත කාලෙම බබාව තුරුලූ කරන් ඉන්න ඕනෙ මට... ඒත් අයියා අපි එහෙම ඉන්නවා දැක්කොත් මාව මේ ගෙදරනුත් එලවයි.. එහෙම උනොත් මං ඔයාව නොදැක ඉන්නේ කොහොමද.... ම්ම්... ඒකයි අයියා ඔයාට නැගිට්න්න කිව්වෙ... ආදරේ නැතුව නෙවෙයි... පනටත් වඩා ආදරෙයි මං"

ඇස් පියාගෙනම මං අහන් හිටියා එයා කියන ඒවා.... ලස්සන ආදරනීය වචන.. නවල් වලවත් නැතුවැති ඒ වගේ ලස්සන වචන...මං ඇස් පියාගෙනම හිටපු නිසාමද කොහෙද්දෝ එයා පිලිවලින් නලල, ඇස්බැම්, ඇස්, නහය, කම්මුල් කිස් කරා... තොල ඇරෙන්න මුලු මූනෙම හිස් තැනක් නැති වෙන්න ඒ දෙතොලින් තෙත් කරන්න ඇති....

මං තරහ නෑ කියලා එයාට දැනෙන්න ඇති.... ඒ නිසා මාව ආයෙත් ඇදෙන් හාන්සි කරලා එයා යන්න

ගියා. ලස්සන හීනයක් බලද්දි කවුරුහරි ඇහැරෙව්වා වගේ හැඟීමෙන් මං සිව්ලිමට එරෙව්වා..

----------------

අයියගේ බලකිරීමට නිතිනු අයියා ඔෆිස් යන්න ලෑස්ති උනා... බලකිරීම කිව්වට ඒක එක්තරා විදිහක තර්ජනයක්... අයියා කෙනෙක් හැටියට එයා හරි..

මගේ වගකීම සම්පූර්ණයෙන්ම එයාට වැටිලා තියෙද්දි කොච්චර විශ්වාස උනත් නිතිනු අයියයි මාවයි තනියම ගෙදර තියලා යන්න එයා මෝඩයෙක් නෙවෙයි.... ඒත් මට නම් එයාට යන්න දෙන්න ලෝබයි... දැනෙන්නේ හරියට පිටරටකට යනවා වගේ...

## 20 කොටස

අයියලා ගියාට පස්සේ පුදුමාකාර තනිකමක් දැනුනේ... ඊයේ රෑත් එයා ලග ඉදලා අද උදෙත් ඉදලා ගියාම හරි පාලුයි... චූෆී ඉන්න නිසා හොදයි.. මං කියන ඒවට නැට්ට හරි වනනවනේ..
උදේට උයන්න ක්මිමැලි නිසා කොත්තු මී එකක් හදා ගත්තා.. චූෆීට බලූ කෑම එකකුත් හදලා එයාගේ පිගානට දලා තමයි මූන හෝදන්න ගියේ..

මූනවත් හෝදපු නැති මගේ වහුටු මූන නේ එයා හිරිකිතක් නැතුව ඉම්බේ.. පව් එයා.. බාතෲම් එකෙන් එලියට එද්දි වූෆිනම් කාලා ඉවරයි.. සාලෙ මැද් දිගා වෙලා ඉන්නවා.. කොත්තු මී එකත් අරන් වූෆි ලගින්ම හාන්සි උනා.. එයාගේ ඇගෙන් ඔලුව තියාගෙන කොත්තු මී එක කැවේ හරියට නැගිටගන්න බැරි තරම් ලෙඩක් තියෙන මිනිහෙක් කෑම කනවා වගේ..
කන එකත් පැත්තක දලා ෆෝන් එක අතට ගත්තේ කෝල් එකක් ආපු නිසා.. අන්නෝවන් නම්බර් එකක් නිසා කට් කරලා දැම්මා.. ඒත් ආය අය ගන්නවා.. බැරිම තැන ආන්ස කරා..

"හෙලෙව් කවුද මේ.."
බබා මේ මම... මොකද කරන්නේ ඔයා...
එහා පැත්තෙන් ඇහුනේ නිතිනු අයියාගේ ආදරනීය කටහඩ..

"මං කනව.. "
ඔන්ලයින් එන්නකෝ.. මට ඔයාව බලන්න ඕනේ..
එයා එහෙම කියලා මන් උත්තරයක් දෙන්නත් කලින් ෆෝන් එක කට් කරා.. දැන් කොහොමද වීඩියෝ කෝල් එකක් ගන්නේ.. ලැජ්ජයිනේ

තවත් හිතන්න තත්පරයක්වත් නොතියා එයා කෝල් එකක් ගත්තා... මං කැම් එක අතික් පැත්ත හැරවලා කෝල් එක අන්ස කරා... ඔෆිස් වෙයා එකට හේත්තු වෙලා එයා ෆෝන් එක දිහා බලන් ඉන්නේ... ගෙදරින් ඇදන් ගියේ ටීශර්ට් එකක් උනාට දැන් ඉන්නේ ලා නිල් පාට ශර්ට්

එකක් ඇදලා ටය් එකක් දලා කලු පාට බ්ලෙසර් එකකුත් ඇදලා. ඇස් අහකට කරන්න බැරි තරම් හැන්ඩ්සම්.. මේ කඩවසම් රූපෙ මගේ නේද කියලා මතක් වෙනකොට පුදුම සතුටක් දැනෙන්නේ...

"පැටියෝ මට ඔයාව පේන්නේ නෑනේ... කැම් එක අනික් පැත්ත හරවලාද. තියෙන්නේ?? කෝ අනික් පැත්ත හරවන්නකෝ මැනික... අයියට ඔයාව බලන්න ඕනේ.... "

"අනේ.. මට ලැජ්ජයි.."

"ඒ මොකද... උදේ එද්දිත් මං බබාව කිස් කරලනේ ආවේ.. මොකෝ මේ දැන් ලැජ්ජ හිතිලා.. අනේ පැටියෝ කැම් එක හරවන්නකෝ.. ඔයාව දලා ඇවිත් අවුරුදු ගානක් වගේ දැනෙනවා මට.. ප්ලීස් ඕක හරවන්න.. ආදරෙයි නේ මං.. "
එයාගේ වචන මග හරින්න බැරි නිසාම මං කැම් එක මගේ පැත්තට හැරෙව්වේ ලැජ්ජාවෙන් බිම බලාගන්න ගමන්...

"බබා බ්ලශ් වෙලා.. සෝ කියුට්.. කෝ මගේ දිහා බලන්නකෝ.. "
මං හිමීට එයා දිහා බැලුවා... ආදරේ ඇස්වල පුරෝගෙන එයා මන් දිහා බලන් ඉන්නවා.. මුලු ලෝකෙම අමතක කරලා මං ඒ මූනට වශී උනා... ඒ දිලිසෙන ඇස් නම් ඉනාවක්මයි..

"ඔය ඔයාගේ පිලෝ එකද බබා.. ඒක හරි වෙනස් නේ"

මගේ අවදනේ බිඳුනේ එයා කතා කරපු නිසා.. හැබැයි එයා අහපු දේට නම් මට හිනා නොවී ඉන්න බැරි උනා... මං ෆෝන් එක තියන් ඉන්න විදිහට එයාට චූෂිව පේන්නේ බාගෙට.. චූෂි ව තමයි එයාට පිලෝ එකක් වගේ පෙනිලා තියෙන්නේ..

"හය්යො ඒ පිලෝ එකක් නෙවෙයි අලේ.. අපෙ චූෂි බබානේ.. චූෂි ඔයාගේ ඩැඩීට හායි කියන්න"
චූෂිව පේන විදිහට මං ෆෝන් එක හැදුවම චූෂී බව් බව් ගාලා කෑගහන්න ගත්තා... එයාට මාවත් අමතකයි නිතිනු අයියව දැක්කම.. නිතිනු අයියා මූනෙ වල ගැහෙන විදිහට ලස්සනට හිනාවුනා...

"දැන් මගේ බබාලා දෙන්නා මොනාද කරන්නේ දෙයිද.."

"චූෂි බබා නම් දෙයි... මේ බබානන් හබුන් කනෝ.."
හුරතල් මූනක් හදගෙන මං කිව්වේ එයා ගාව බබෙක් වගේ හැසිරෙන්න ආස නිසා..

"දැනද දරුවෝ කන්නේ... මෙච්චරවෙලා මොනාද කරෙ.. අතික ඔයා නිදගෙන නේ ඉන්නේ ඔහොම කොහොමද කන්නේ... "

"මෙන්න මෙහෙම.."
මං එයාට කාලා පෙන්නුවා... ලස්සන මූන නපුරු කරන් රවලා බැලුවා මන් දිහා...

"ගුටි දෙන්නේ... ඔහොම කනවද.. හිර උනොත් එහෙම ගෙදර කවුරුවත් ඇත්තෙත් නෑ...කෝ නැගිටින්න.. මං බලන් ඉද්දි ඉදගෙන කන්න ඕනෙ"

මං මූන දෙක කරන් ගිහින් සෝෆා එකෙන් වාඩි වෙලා නූඩ්ල්ස් එක කෑවේ හරියට එයාව කනවා වගේ...

"බබා ලෑස්ති වෙන්න ගමනක් යන්න... අයියා පුළුවන් තරම් ඉක්මනට එනවා පැටියව ගන්න.. මට මෙහෙම ඉන්න බෑ ඔයා ලගට එන්න ඕනේ... "

"ඒත් අපි කොහෙද යන්නේ.... අපේ අයියා බනියි.. "

"බය වෙන්න එපා මං අයියගෙන් පර්මිශන් ගන්නම්... බබා ලෑස්ති වෙන්නකො අපි බීච් යං හොදද.."

ඒක කියපු ගමන්ම එයා කෝල් එක කට් කරා... කන එකත් පැත්තක දලා මං දිව්වේ වොශ් රූම් එකට... දඩි බිඩි ගාලා වොශ් එකක් දන් කාමරේට ආවා... අල්මාරියම ඇදලා යන්තම් ඇදුමක් හොයා ගත්තා... ත්‍රී ක්වාටර් එකට තද රෝස පාට ටීශර්ට් එකක්.... ඒක ඇදගෙන කොන්ඩේ චුට්ටක් අල්ලලා කටුවක් ගැහුවා... කලින් වගේ තදට ලිප්ස්ටික් ගාන්නේ නැතුව ලාවට චුට්ටක් ගා ගත්තා... පවුඩර් ටිකකුත් දගෙන රවුමක් කැරකිලා බැලුවා... කලින් හිටිය ආරු මය්...

සාලෙට ගිහින් චූෆිව බදගෙන ඉබගෙන ඉබගෙන ගියා.. මොකක්දෝ අමුතු සතුටක් හිතපුරාම පැතිරිලා.. උඩ පැනලා

නටන්න හිතෙනවා... තියන හදිස්සියට ඇඳගත්තාට මොකද එයා කොලඹ ඉදලා එනකන් ඉන්නත් එපැය්...
මමයි චූටියි දෙරත් ඇරගෙන බිම වාඩි වෙලා බලන් හිටියා එයා එනකම්... වාහනයක් එන ගානේ ගේට් එකේ එල්ලිලා බලනවා එයා එනවද කියලා.. 14 වෙනි වතාවටත් එබිලා බලද්දි තමයි එයාගේ කාර් එක ආවේ... සතුටට ගේට්ටුව අල්ලන් දෙපාරක් තුන්පාරක් උඩපැනලා තමයි ගේට් එක ඇරියේ.. එහෙම්මම මාවත් දන් යයි කියලා හිතුවට එයා ගේට්ටුවෙන් ඇතුලට කාර් එක දැම්මා.....

කාර් එකෙන් බැහැලා ආපු එයා මාව බදගත්තේ මට හිතාගන්නවත් ඉඩක් තියන්නේ නැතුව.. පොලොවෙන් අගල් කීපයක් උඩට ඉස්සෙන්න එයා මාව බදගත්තේ රිදෙන තරම් තදට... බිමින් තියපු තත්පරේම එයාගේ දේනට මැදිවෙච්ච මූන හාදු වැස්සකින් තෙමිලා ගියා...තාමත් ගල් පිලිමේ වගේ ඇසුත් ලොකු කරන් හිටපු විදිහටම හිටියා...

"චූටි මැනික හරිම හුරතල් අද.. තුරුල් කරන් ඉබින්නේ නැතුව යන්න ලෝබ හිතුනා... ඒත් කොච්චර ඉම්බත් ඇතිවෙන්නේ නෑනේ... "
එයාගේ කටහඬට පියවී සිහියට ආවත් රතුවෙච්ච මූන හංගන්න මං බිම බලාගෙනම හිටියා..

"මං දිහා බලන්නකෝ බබා.. ඇයි මේ රතුවෙලා... ලැජ්ජ හිතුනද මගේ පැටියට.. කෝ එන්න අපි ගෙට යමු.."
එයා මගේ ඉනවටේ අත දාගෙන ගේ ඇතුලට ආවා... චූටිත් නැට්ට වන වන අපේ පස්සෙන් ආවා...

"වතුර එකක් ගෙනත් දෙන්නකො මැතික.. මහන්සියි.. "
කූල් වතුර එකකට නෝමල් වතුර ටිකක් දලා ග්ලාස් එකක් එයාට ගෙනත් දුන්නා.... ග්ලාස් එක අතට අරන් එයා අනික් අතෙන් මාව එයාගේ ඔඩොක්කුවෙන් වාඩි කරව ගත්තා... ඉනවටේ එයාගෙ අත දාගෙන තවත් මාව එයාට ළං කරගෙන තමයි වතුර බොන්න පටන් ගත්තේ .. ලැජ්ජාවෙන් ඇබරී ඇබරී මං ඒ උරහිසේ මූන හංගගත්තා...

"බබාට කොහෙද යන්න ඕනේ.... බීච් යමු කිව්වට ඔයා කැමතිද කියලා ඇහුවේ නෑනෙ... මේක මගේ මැතිකගේ ෆස්ට් ඩේට් එකනේ.. ඉතින් ඔයාට ඕනෙ විදිහ කියන්න.."

වතුර වීදුරුව ස්ටූල් එක උඩින් තියලා ඒ අතිනුත් මාව තුරුල් කරගන්න ගමන් එයා අහන්නේ.. මට එයා ලග ඉන්නවනම් කොහේ හිටියත් එකයි... ෆස්ට් ඩේට් එක කියලා හැමදාටම මතක තියෙන්න විශේෂ තැනක් ඕනේ නෑ... ඒත් බීච් එකට යන්න නම් මං ආසයි... එතනදි ලැබෙන මානසික සුවය කොහෙදිවත් ලැබෙන්නේ නෑ... සමහර විට තිතිනු අයියගේ මනසටත් හොඳ වෙයි ඒක..

"අපි බීච් යමු.. මං ආසයි බීච් එකේ ඉන්න.."

තාමත් උරහිසේ මූන හංගගත්ත ගමන් මං කිව්වේ... හීමිට මගේ ඔලුව අතගාලා එයා හිස් මුදුනෙන් හාදුවක් තිබ්බා... සනීපෙට ඇස් පියවුනා මගේ.. දැන්නම් බීච් යන්න ඕනෙ නෑ වගේ… මෙහෙම ඉන්න ආසයි...

"බබා අපි යමු නේද... වෙලා යනවනේ.. හවසට කොලඹ යන්නත් එපැය් අයියව ගන්න මිම්මි... "
එයා එහෙම කිව්වත් ඇහුනෙ නෑ වගේ මං ඇස් පියාගෙන එහෙමම හිටියා...

"කම්මැලීද මගේ චූටි පැටියට.. වඩාගෙන යන්නද මං.."
අකුනක් ගැහුවා වගේ මං කෙලින් වෙලා මං එයා දිහා බැලුවේ ඇසුත් ලොකු කරලා...

"මොකෝ මේ බෝල ඇස් ලොකු කරන්.. බෝනික්කියක් වගේ බබා ඔහොම කරද්දි.. හපන්න හිතෙනවා මට මේ පිම්බිච්ච කම්මුල්.. ඔයා හරිම කියුට් බබා.. යූ ආර් ද කියුටස් ගර්ල් අය් හැව් එවර් සීන් "

මගේ කම්මුලක එයාගේ අතක් තියාගෙන මහපට ඇඟිල්ලෙන් කම්මුල් අතගාන ගමන් එයා කියන්නේ...
ලැජ්ජාවෙන් මං ආයෙත් එයාගේ උරහිසේ මූන හංගාගත්තා... ඒත් මට එහෙම ඉන්න බැරි වුනේ පුලුන් කෑල්ලක් වගේ සැහැල්ලුවට එයා මාව ද්‍රෝනට ගත්ත නිසා..

කිව්වට මොකද එහෙම කරයි කියලා මං කීයටවත් හිතුවේ නෑ... හුස්ම පහලට දන්න තරම්වත් සිහියක් මට තිබුනේ නැතත් එයා කිසි ගානක් නැතිව මාව උස්සන් ගිහින් කාර් එකේ ඉස්සරහ ශීට් එකෙන් වාඩි කෙරෙව්වා...
ශීට් බෙල්ට් එකත් දාලා වූෆිවත් පිටිපස්සට දාගෙන එයා කාර් එකට නැග්ගේ මත් දිහා බලලා ලස්සනට හිනාවෙන ගමන්...

බීච් එකට යන්නේ නැතුව එයා වෙන පැත්තකට ගියත් මං ඒ ගැන ප්‍රශ්න කරන්න ගියේ නෑ.. මගින් කාර් එක නවත්තලා එයා කොහෙද ගිහින් ආවේ පොඩි බෑග් එකක් අතේ තියාගෙන..

බීච් එක ලගට ගිහින් කාර් එක පාර්ක් කරලා එයා අතට ගත්තේ අර බෑග් එක.. එකෙන් එලියට ගත්තේ සන් ක්‍රීම් එකක්... ඒකෙන් ටිකක් අතට අරන් එයා මන් ඉන්න පැත්තට නැවුනා... මූන පුරාම තිත් තියලා ඇගිලි තුඩුවලින් මූන පුරාම තැවරුවා ක්‍රීම් එක.. මූනට ලගින්ම තියන එයාගේ මූනෙ කඩවසම් බවට වශී වෙලා මම හිටියේ මෙලෝ සිහියක් නැතුව..

"මගේ බෝනික්කි තවත් රතුවෙයි අව්වට.. දවල් වෙන්න ලග නිසා අව්ව වැඩී... "

මම එයාගේ මූන දිහාම බලාගෙන එයාගේ අතේ තිබ්බ ක්‍රීම් එක අරන් ඒ මූනෙ තිත් තිත් තිබ්බා... නහය මැදින් ලොකු තිතක් තියලා බටන් එකක් ප්‍රෙස් කරනවා වගේ නහය ඔබ ඔබ මං හය්යෙන් හිනා වුනා.. එයාත් ලස්සනට හිනාවෙන ගමන් මගේ මූනටම ලන් වෙලා එයාගේ නහය මගේ නහයේ ගෑවා.. මං ඇස් ලොකු කරන් බලද්දී එයා දබරැගිල්ලෙන් මගේ නහයේ ගෑව්ව ක්‍රීම් ටික වටේට පැතිරෙව්වා.. හරියට චිත්‍ර ශිල්පියෙක් චිත්‍රයක සියුම් කොටසක් අදිනවා වගේ පරිස්සමට...

කාර් එකෙන් බැහැපු මටයි චූටිටයි නිතිනු අයියව අමතක වෙන්න තත්පරයක්වත් ගියේ නෑ... ඇතින් රැලි නගින නිල් පාට මුහුද දකිද්දි මං වේගබට්ටා වගේ වේගෙන් මුහුද දිහාට දිව්වේ චූටිත් පස්සෙන් එද්දි... චූටියි මමයි අල්ලන සෙල්ලම් කරා... දවල් වෙන්න ලග නිසා වැඩිය කට්ටිය නෑ... මං රැල්ල පැගුවා... චූටි නම්. රැල්ලක් එද්දි අමුතු සද්දයක් දගෙන පිටිපස්සට ගිහින් රැල්ල ආපස්සට එද්දි ඒ පස්සෙන් දුවන් එනවා... ගොඩක් වෙලා දුවලා පැනලා මහන්සි උනාම තමයි මට එයාව මතක් උනේ....
හැරිලා බලද්දි එයා වැල්ලේ බිම වාඩි වෙලා නිකටෙන් අතත් තියාගෙන මං දිහා බලාගෙන ඉන්නවා... බ්ලෙසර් එකයි ටයි එකයි ගලවලා නිල්පාට ශර්ට් එක විතරක් ඇදන් ඉන්නේ එයා.. බිම බලාගෙනම ඇවිත් මං එයා ගාවින්ම වාඩි උනා... තාමත් මූන දෙන්න ලැජ්ජයි.. මං කරපු පිස්සු වැඩ ඔක්කොම එයා බලන් ඉන්නැති.. නිකට යටින් එක ඇඟිල්ලක් තියලා එයා මගේ මූන ඉස්සුවා.. මූන පුරාම ඇස් යවලා ලස්සනට හිනා වුනා.. ඊටපස්සෙ සාක්කුවෙන් ගත්ත සුදු පාට ලේන්සුවකින් මගේ මූනම පිහදැම්මා හෙමීට.. දඩිය දලා නිසා.... එහෙමම බෙල්ලට එද්දි නම් මං කිතියට ඇකිලුනා..

"මගේ දගකාරී.. ඇති උනාද සෙල්ලම් කරලා මිම්.. ඔච්චරම ආසද මුහුදට.. මාවත් අමතක කරලා දුවලා ගියේ... "

නලලට හාදුවක් දීලා එයා අහද්දි මං එයාගේ පපුවට තුරුලු උනා... අනපේක්ෂිතව මං එහෙම කරපු නිසාද්‍ දෝ එයා හිටියේ තාමත් අත් දෙක දෙපැත්තට කරන්... එයාගේ

ප්‍රශ්නෙටත් උත්තරයක් දෙන්න මට ඕනේ නෑ... නිහඬව එයාගේ පපුව ගැහෙන සද්දෙ අහන්න තමයි මං ආසම... ටික වෙලාවකින් එයා අත් දෙකෙන් මාව තුරුල් කරගත්ත නිසා මාව තවත් ඒ පපුවට ස්ටිකර් වුනා.. ඒ සුවද නම් මායාවක් වගේ... මාව ත තවත් එයාට ආකර්ශනය කරවනවා.. සැරෙන් සැරේට හිස් මුදුනට හාදු තිය තියා ඒ ඇගිලි මගේ හිසකෙස් වල රටා මවනවා...
සනීපෙට මගේ ඇස් ලාවට පියවෙනවා... මේ වගේ සනීපයක් දැනෙන වෙන තැනක් මේ ලෝකෙ වෙන කොහෙහරි තියනවද කියලා මට සැකයි..

"චූටි මැනික... දෙයිද බබා.. දෙය්යන්න එපා... කෝ නැගිටින්න.. "
සනීපෙට ආපු නින්ද එයා කඩලා දැම්මා.. මං තොලත් නොපිටට පෙරලලා එයා දිහා බැලුවා දුක හිතෙන මූනක් දගෙන..

"දෙයි මතයි.. ඔයානම් ඊයේ හොදට දෙයිය ගත්තා... මට දෙයි ආවේ නෑ... "
මම හුරතල් විදිහට එහෙම කියද්දි එයා මගේ ඇස් දිහා බලන් හිතා වුනා.. සමහරවිට මගෙ වචන වලට වෙන්න ඇති...

"අනේ... මගේ බබා දෙයිය ගත්තේ නැද්ද ඊයේ හරි හරි අපි දෙයියමුකෝ.. කෝ එන්න තුරුලට අයියා ඔලුව අතගාන්නම් මගේ මැනික දෙය්යන්න.. උම්මා"
පොඩි දරුවෙක් හුරතල් කරන තාත්තෙක් වගේ මට එහෙම කියලා එයා මාව ඒ තුරුලට හිර කරගත්තා...

ආයෙත් නින්දත් නොනින්දත් සීමාවෙදි මං ඇහැරුනේ එයාගේ කටහඬට..

"ඔයා හරි මැජික... ඒයේ මන් කාලෙකට පස්සෙ හරියට නිදාගත්තා... හරියටම එදා මං අසනීප වෙලා බබා මාව තුරුලු කරගත්ත දවසට පස්සෙ ඒයේ තමයි හරියට නිදාගත්තේ... බබාගේ පපුවේ තියෙන මැජික් එකට විතරයි පුලුවන් මාව නිදි කරන්න.."

මට නිදාගන්න නොදීම ගැන පොඩි තරහක් ඇති උනත් ඒ වචන වලට පුලුවන් උනා මගේ තරහ දුකකට පෙරලන්න... එයාට කියන්න ඕනේ මොනවද කියලා මන් දන්නේ නෑ.. ඒ නිසාම මන් එයාගේ පපුවෙන් හාදුවක් තියලා ඇඟිලි තුඩුවලින් පපුව පිරිමැද්දා.. හොදින් වැඩුනු ඒ පිරිමි පපුවේ කොච්චර දුකක් හංගගෙන ඉන්නවද..

එයා මගේ හිස් මුදුනෙන් හාදුවක් තිබ්බේ හරියට මං පපුවෙන් තිබ්බ හාදුවට පිලිතුරු හාදුවක් වගේ... එක අතකින් මාව තුරුල් කරන් එයා අනෙක් අතේ පිටි අල්ල මගේ අත පුරා ඇදන් ගියා වෙල්වට් සබන් ඇඩ් එකක විදිහට..
"බබා හරිම සොෆ්ට්.. ගෑවුනත් සනීපයි.. ඇත්තටම බනී කෙනෙක් වගේ.. මිරිකන්න හිතෙනවා මට.. "

ආයෙමත් මූන හංගගන්න වෙන කතාවක් එයා කියපු නිසා මං මූන පපුව අස්සෙ ඔබාගත්තා.. හරිබරි ගැහිලා මං ඇස් පියාගත්තේ නිදගන්න හිතාගෙන... විනාඩි 05 ක් වත් යන්නෙ නැතුව මට ඒ තුරුලෙම නින්ද යන්නැති..

හීනෙන් වලකට වැටුන නිසා මං ගැස්සිලා ඇහැරුනා.. නැගිටලා වටපිට බලද්දි තමයි කොහෙද ඉන්නේ කියලා මතක් උනේ.... එයා හිනාවෙවී මන් දිහා බලන් ඉන්නවා...

"බබා දන්නවද වෙලාව කීයද කියලා.. "
එක අතකින් මාව එයාට ලන් කරන ගමන් එයා අහද්දි මං ඔලුව දෙපැත්තට වැනුවා...

"වෙලාව 1.10 යි... "
මං ඇස් ලොකු කරලා එයා දිහා බැලුවා... අපි ආවේ 10 ට විතර.. ඒ කියන්නේ පැය දෙකටත් වඩා වැඩිය මං නිදාගෙන තියනවා...
"මොකෝ ඇස් බෝල කරන්නේ... පැය දෙකක් විතර දෙය්ය බබා කිව්වා තමයි... "

"මාව ඔයාට එච්චරම විශ්වාස ද බබා ඔයාට..? "
මම තවත් ඇස් ලොකු කරලා බැලුවා එයා දිහා...

"මං අහලා තියනවා ගෑනු ළමයට නින්ද යන්නේ ලග ඉන්න කෙනා ගොඩක්ම විශ්වාසයි නම් විතරයි කියලා.... ඔයාට මාව එච්චර විශ්වාසයි ද මැනික."

හැඟීම්බර හඬකින් එයා අහන්නේ ඇස් දිහා බලාගෙන

"මොනාද අහන්නේ ඔයා අය්යේ.. මටත් වඩා විශ්වාසයි ඔයාව මට.. නැත්තම් අරම ගෙදර තනියම ඉදියිද මං ඔයත් එක්ක මිම්"
එයාගේ කම්මුලක් උඩින් අතක් තියලා මං කියද්දි එයා මගේ අත සිප ගත්තා...
"මට ඔයාට තුරුල් වෙන්න ඕනෙ බබා.."
මං ඇස් ලොකු කරලා එයා දිහා බැලුවා..... මේ වගේ තැනක මං කොහොමද එහෙම කරන්නේ..

"බයවෙන්න එපා මැනික මං මේ වෙලාවේ එහෙම කරන්නෑ.. කෙල්ලෙක් කොල්ලෙක්ගේ තුරුලේ ඉන්නවා වගේ නෙවෙයි කොල්ලෙක් කෙල්ලෙක්ගේ තුරුලේ ඉන්න එක මිනිස්සු දකින්නේ කැත විදිහට.. එතන තියෙන්නේ රාගය කියලා විතරයි එයාල හිතන්නේ.... පිරිමියෙක්ටත් සෙනෙහස ඕනේ කියලා කවුරුත් හිතන්නේ නෑ.. මං කැමති නෑ බබා ගැන කවුරුත් වැරදියට හිතනවට.."

මට ඒ වෙලාවෙ හිතට ආවේ එකම ප්‍රශ්නයක් විතරයි.. සනුදි කොහොමද මේ වගේ හිතක් තියන මනුස්සයෙක් දාලා යන්න තරම් මෝඩ උනේ.... ඒත් එක අතකට එයා මෝඩ උනේ නැත්තම් මට තිත්තු අය්යව හම්බවෙන්නෙත් නෑනේ...

"චූටි මැනික අපි කොහෙද ලන්ච් ගන්න යන්නේ... ප්ලේස් එකක් කියන්න අපි ඕනෙ තැනකට යන්.."

"මන් දන්නෑ අනේ... කොහේ හරි යන් ඔයා කැමති තැනකට... "

මං කිව්වේ ඕනෙවට එපාවට.. කෑම පෙරේතියක් උනත් මං රෙස්ටුරන් ගැන දන්නේ හරිම අඩුවෙන්.. ඉතින් එතනදි එයාගේ අදහසට එකග වෙන්න තීරනය කරා මං.. එයා පුදුමෙන් වගේ මං දිහා බලලා ලස්සනට හිනා වුනා..
"බබා මං ඔයාගෙන් දෙයක් ඉල්ලත්තම් දෙනවද මට.. බැරිනම් බෑ කියන්න මං මුකුත් හිතන්නෑ"

"මොකක්ද.."

"ඔයාගේ අතින් මට මොනා හරි උයලා දෙනවද.. මහන්සියි නම් ඕනෙ නෑ... "
එයා එහෙම කිව්වාම කවදාවත් නැති ආසාවක් මට ආවා උයන්න.. රෙස්ටුරන්ට් එකකට යනවට වඩා මගේ අතින්ම උයලා එයාට කවන්න මට ආස හිතුනා...

"කියන්නකෝ බලන්න ඔයාට මොනාද උයලා ඕනි කියලා.... "
එයා දිලිසෙන ඇස් වලින් මන් දිහා බලාගෙන ඉදලා ඇගිල්ලෙන් වැල්ලේ මොනාදෝ අදින්න ගත්තා...

"මෙන්න මේවා උයන්න පුලුවන්ද බබාට.. සුදු පාටයි මේවා.. "
එයා ඇදලා තිබ්බේ කවුපි ඇටයක් කියලා මන් දැනගත්තේ සුදු පාටයි කියපු නිසා.. එයා වගේ කෝටිපතියෙක් කවුපි ඇටේ දන්නෙ නැති එක පුදුමයක් නෑ... මං බයේ හිටියේ එයා මන් දන්නේ නැති කෑමක් කියයි කියලා.... ඒත් කීයටවත් හිතුවෙ නෑ කව්පි උයලා ඉල්ලයි කියලා.... පේනවට වඩා ගොඩක් සිම්පල් චරිතයක් එයා..

"මිම් ඔව් මට කව්පි උයන්න පුලුවන්.. මං උයලා දෙන්නම්... තව මොනාද ඕනේ.... "
ඊට පස්සෙ එයා ඇදලා පෙන්නුවේ හත්තක්..
"හරි යමු අපි ගෙදර හැබැයි හතු නම් ගෙදර නෑ කවුපි විතරයි තියෙන්නේ.. යන ගමන් ෆුඩ් සිටි එකට ගිහින් එමු.."
එයාට තිබ්බ හදිස්සියට තව පොඩ්ඩෙන් අපි යන්නෙ වූෆිවත් දලා .. ෆුඩ් සිටි එකට ගිහින් මං හතු පැකට් එකක් ගද්දි නම් එයාගේ කට දෙල් වුනා..

"මේවා නෙවෙයි නේ.. මේ කෑලි කෑලි නේ තියෙන්නේ.. මං කාපු ඒවා අර ඇදපුවා වගේ... "
මට ඔලුව ගහගන්න හිතුනා කොහේ හරි.. මං කොහෙන් ගම් වල හැදෙන හතු හොයන්නද මේ ටවුන් එකේ.. කොහෙන්ද දන්නෑ ඒවා කෑවේ...

"අය්යෝ මෝඩයෝ ඒවා ගම් වල හැදෙන්නේ.. මෙහෙ ඒවා හොයන්න බෑ... මෙහෙ තියා අපෙ ගමේවත් අවුරුදු ගානකින් මං ඒවා දැකලා නෑ.. මේ වගා කරපු හතු.. රසේ ලොකු වෙනසක් නෑ..."

එයා පොඩි එකෙක් වගේ ඔලුව දෙපැත්තට වැනුවා... හතු පැකට් දෙකක් අරගෙන සේරා පොල්කිරි එකකුත් ගත්තා මං.. දැන් වෙලා ගිහින් නිසා.. නිතිනු අයියා නෙක්ටෝ එකකුයි තව ස්නැක් ගොඩකුයි කූඩෙකට දන් තවත් මොනාදෝ ගන්න ගියපු නිසා මම එයාට ඉස්සල්ලා කැශියර් ලගට ගිහින් බඩු ටික බිල් කරගත්තා.... කාඩ් එක දුන්නේ

දෙවියෝ සිහිකර කර.. මොකද ඒකේ මේ බඩු තුන ගන්න තරම්වත් සල්ලි තියනවද කියලත් සැකයි.. චොක්ලට් එකක් කන්න තියන ආසාවත් මං පාලනය කරගත්තේ ඒකයි.. යන්තම් ප්‍රශ්නයක් නැතුව බිල් එක පේ කරගන්න පුලුවන් උනා... කූඩයක් පුරෝගෙන එක එක කෑම ජාති අරන් එයා ආවේ මං බිල් එක පේ කරලා ඉවර වෙලා ඩෝ එක ලගට යද්දි.. එයා බිල් කරගෙන එනකන් මං එතන ඉන්න හිටියේ.. හිනාවෙලා මං ගාවට ආපු එයාගේ හිනාව අතුරුදහන් උනා මගේ අතේ තිබ්බ බෑග් එක දැකලා...
"ඔයා බිල් කරාද... "

"ඕ.."

"කොහෙන්ද සල්ලි.... "

"මං කාඩ් එක අරන් ආවේ... "

"මං එනකන් කාර් එකට වෙලා ඉන්න.. ආ කී එක.."

සුසුමක් පිට කරලා එයා කැශියර් එක ලගට ගියා... ඒත් මූන නම් කලකිරුනු පෙනුමක් තිබ්බේ... ඇයි කියලනම් මන් දන්නේ නෑ...
කාර් එකට වෙලා මං හිටියා එයා එනකන්.. පිටිපස්සෙන් බඩු ටිකත් දලා එයා කාර් එකේ ඉස්සරහින් වාඩි උනා මන් දිහා බලන්නෙවත් නැතුව..
ගෙදර ගියපු ගමන් මන් උයන්න පටන් ගත්තා... මූන කට විතරක් පොඩ්ඩක් හෝදගෙන.. හතුයි කව්පියි කවදාවත් මන් එකට කාලා නෑ... අඩුම ගානේ ඒදෙක එකට කන්න

පුලුවන්ද කියලවත් මන් දන්නේ නෑ... එයා කොහෙන්ද දන්නෑ ඒ දෙක එකට කාලා තියෙන්නේ..
ලූනු ගෙඩිය කපන්න යද්දිම එයා මගේ ඉනවටේ අත් දෙක දලා උරහිසෙන් ඔලුව තියාගත්තා..

## 21 කොටස

"අම්මට පස්සෙ කවුරුහරි මං වෙනුවෙන් දෙයක් උයලා දෙනවමයි මේ... අවුරුදු 9 ඉදන් මේ වෙනකන් මං කැමති අකැමැති දෙයක් අහන්නවත් කවුරුත් හිටියේ නෑ... මං හුගක් තනි වුනා.. පුංචි කාලේ අම්මා ආච්චිලාගේ ගෙදර ගියාම අම්මි මේවා හදලා දුන්නා.... එයා හතු කඩන්නත් ගියේ මාත් එක්ක.. ගොඩක් කල් ඉදන් කන්න ආස හිතුනා... අම්මි හදලා දුන්න අනිත් කෑම ඔක්කොම මන් කොහොමහරි හොයාගත්තා.. ඒත් මේවා හොටෙල්ස් වල බැලුවත් හම්බුනේ නෑ... ඒකයි ඔයාට කිව්වේ... ඔයාගේ අතින් හැදුවහම අම්මි ඉව්වා වගේ රසට තියෙයි..."

මම මුකුත් කියන්නේ නැතිව හිමින් සැරේ ලූනු ගෙඩිය කැපුවා... ගොඩක් හැගීම්බර වෙලා ඉන්නේ මං.. දරාගන්න බැරි තරම් හැගීම් හිර උනාම මං කරන්නේ ඒවා කඳුලු කරලා වට්ටන එක.. මට බයයි එයාව සනසන්න ගිහින් මං එයාටත් වඩා හය්යෙන් අඩයි කියලා.. එහෙම උනොත් එයාට දුක හිතෙයි... ඒත් එයා මං දිහා බලන් හිටියේ මගෙන් උත්තරයක් බලාපොරොත්තුවෙන් වගේ නිසා මං

එයා දිහාට හැරුනා... නැත්තම් එයාට ඊට වඩා දුක හිතෙන්න පුලුවන්..

"දැන් ඔයාට මත් ඉන්නවනේ මිම්මි... ඔයා කැමති අකැමැති දේවල් ඔයාගේ ප්‍රශ්න ඔයාට හිතෙන දේවල් හැම දේම මට කියන්න.. ඔයාට මම ඉන්නවනේ... ඔයාට කැමති කෑමක් මට කියන්න මං උයලා දෙන්නන්ම්.. අම්මි තරම් නම් රසට මට උයන්න බැරි වෙයි ඒත් මං පුලුවන් උපරිමෙන් කරලා දෙන්නම්.. ඔයාගේ ප්‍රශ්න වලට උත්තර දන්නෙ නැති උනත් අහන් ඉන්න පුලුවන් මට.. ඔයාගේ හැමදේකටම මත් ඉන්නවා... ඕනේ දෙයක් මට කියන්න..."

කදුලු හංගගෙන මං කිව්වේ එයාගේ ඇස් දිහා බලාගෙන... එයාගේ ඇස් දිලිසෙනවා... මත් කිව්වේ එයාට අහන්න ඕනෙ වෙච්ච දේමයි කියලා මට තේරුනේ ඒ ඇස් වලින්..

"මං ඉල්ලන ඕනෙ දෙයක් මට දෙනවද බබා?"

මං ඇස් හීනි කරලා එයා දිහා බැලුවා...

"දෙන්න පුලුවන් දෙයක් නම් දෙනවා... "

"එහෙනම් මට මෙතන්ට කිස් එකක් ඕනේ.... "

ඩිම්පල් එන කම්මුල පෙන්නලා එයා කියන්නේ... මං ලැජ්ජාවෙන් බිම බලාගත්තා..... එයා මගේ මූන දෝතින් අරන් ඇස් වලට එබුනේ ඇස් වලින් ආයෙත් ඒ ආයාචනාවම කරලා.. ඇගිලි තුඩුවලින් හිටගත්තත් මං උස

උනේ එයාගේ තිකට ලගට විතරයි.. ඒකත් එයා මන් දිහාට නැව්ලා හිටපු නිසා..
තිකටට උඩින් කම්මුල පැත්තට වෙන්න තැනක තොල් තද කරලා මං එහෙමම අතික් පැත්ත හැරුනා... ඒත් එයා මාව පිටිපස්සෙන් එයාගේ පපුවට තුරුල් කරගෙන සැරෙන් සැරේ උරහිස උඩින් හාදු තියනවා... ඉතින් කොහොමද මං උයන්නේ...

"අයියෙ.. හොදටම පරක්කු වෙලා.. ඔයාට පුලුවන්ද බත් එක උයන්න.."

මං ඇහුවේ එයාව මෙතනින් යවාගන්න ඕනේ නිසා.. එයා ලග ඉන්න ආස නැතුව නෙවෙයි.. එයා මන් ගාව ඉන්නකොට වෙන දේකට අවදානය යොමු කරන්න අමාරු නිසා.. සැරෙන් සැරේ මාව ඉබිද්දි මං කොහොමද හිත හදාගන්නේ උයන්න.. අනික එයා මගෙන් ඉල්ලපු පලවෙනි දේ නිසා මට ඕනේ පුලුවන් තරම් රසට හදලා දෙන්න..

"ම්ම්ම් අනේ මං දන්නෑ බත් උයන්න.. මෙහෙම ඉන්න දෙන්නකෝ.. "

තවත් මාව පපුවට හිර කරගන්න ගමන් එයා මුමුනනවා.. අතාරින්න පොඩි අදහසක්වත් නෑ...

"අපෙ අම්මා කිව්වා නේද පොඩි පොඩි කෑම හදන්න ඉගෙන ගන්න කියලා.. එදා අම්මා කිව්වා වගේ කවදහරි මං අසනීප උන වෙලාවකට ඔයාට උයන්න වෙයි.. මං කන්නෑ වෙන කවුරුත් උයන ඒවා.... ඔයා උයලා දුන්නේ

නැත්තම් මං අපේ ගෙදර යනවා.. ඒ නිසා මත් කියලා දෙන්නත් ඉගෙන ගන්න"

කටත් බෙරි කරන් එයා මගෙන් ඈත් උනා...

"මේ බාජනේ අරන් අරක ඇතුලේ තියන කප් එකෙන් දෙකක් හාල් අරන් තුන් පාරක් හෝදලා රයිස් කුකර් එකට දාලා ඇඟිලි පුරුකක් වතුර තියලා පියන වහල ස්විච් එක ඔන් කරලා බටන් එක ප්‍රෙස් කරන්න.. එච්චරයි තියෙන්නේ... "

එයා ඔලුවත් හොල්ලලා හාල් ටිකත් අරන් හෝදන්න පටන් ගත්තා... ඒ අතරේ මං හතු එක හදලා ඉවරවෙලා කව්පි එකත් ලිපෙන් තිබ්බා... එයා හාල් ටික රයිස් කුකර් එකට දාලා මගේ ලගට ආවා... මං සින්ක් එක ලගට යද්දිත් මගේ පස්සෙන්ම ඇවිත් මට අත හෝදන්න දෙන්නැතුව අත් දෙක අල්ල ගත්තා...
මගේ අත එයාගේ අත් දෙකෙන් වහගෙන එයා අත හෝදවනවා.. එයාගේ ලොකු අත් එක්ක බලද්දි මගේ අත ගොඩක් චූටියි.. හෑන්ඩ් වොශ් ටිකක් අතට අරන් මගේ අත් දෙකෙත් ගාලා අත සේදෙව්වා උරහිසේ තිකට තියාගෙන.. අත් දෙක පිහදාගෙන එයා මාව උස්සලා තිබ්බේ පැන්ට්‍රිය උඩින්.. කකුල් දෙක අතරින් හිටගෙන මගේ පපුවට මූන තද කරගත්තා...

"සනීපයි ඔයා ලග.. මේ රස්නෙට මං ආසයි... ඉක්මනට ලොකු වෙන්න.. ඔයාව මැරිකරන්න ඕනෙ මට... හැමවෙලාවෙම ඔයා ගාව ඉන්න ආසයි මත්.."

හෙම්ට මුමුනනවා එයා තවත් තුරුලු වෙන ගමන්... ආදරේ කරන්න ගත්ත පලවෙනි දවසෙම කවුරුත් මැරිකරන්න ඕනේ කියන්නේ නැතුව ඇති.... ඒත් එයාට ඕනෙ මාව ඉක්මනට එයා ලගට ගන්න.. එයාට තනිකමක් දැනෙනවා ඇති.... කසාදයක් කියන දේ ගැන හිතන්නවත් බය වෙලා හිටපු මට එයා නිසා පලවෙනි වතාවට ඒ ගැන ආසාවක් ඇති උනා...

"ඇයි මුකුත් කියන්නේ නැත්තේ බබා.. ඔයා කැමති නැද්ද මාව මැරි කරන්න.. මැනික දන්නවද හොස්පිට්ල් ඇඩ්මිට් කරද්දිවත් බාරකාරයෙක්ට දන්න කවුරුත් නෑ මට.. ඔයාගේ අයියා හරි මගේ කසින් හරි තමයි ඒවට සයින් කරන්නේ... මට හරි තනියි මැනික... තමන්ට කවුරුත් නෑ කියන හැඟීම තරම් මැරෙන එකවත් වේදනාකාරි නෑ බබා.. මට ඕනේ අනික් අය වගේ සතුටින් ඉන්න.. ලස්සන චූටි පවුලක් ඕනෙ මට.. මමයි ඔයයි තව ඔයා වගේ චූටි රෝස මලකුයි... ලස්සන හීනයක් ඒක... පවුලක්.. මගේම කියන.. ඒත් බබා කැමති නැත්තම් ඕනේ නෑ මට.. ජීවිතේ කිසිම දෙයක් නොලැබුන මට ඔයාගේ ආදරේම මහමෙරක් වගේ... එතනින් එහාට මුකුත් ඕනෙ නෑ... "

එයාගෙ ඒ වචන එක්ක දැනුනා මට මගේ ටීශර්ට් එක තෙමෙනවා.. ඒත් එක්කමයි මගේ ඇස් වලින් ආපු කදුලුත් කම්මුල් තෙමුවේ... විවාහයක්, දරුවෙක් මේවා හරි බර වචන උනාට ඒ වෙලාවේ එයාට ලස්සන පවුලක් දෙන්න මං මටම අධිෂ්ඨාන කරගත්තා.... මං එයාට ආදරෙයි ඇයි ඉතිම් මට එයාගේ වෙන්න බැරි... පනින්න පෙර සිතා

බලනු කිව්වට පතින්නේ නැතුව ඇත්ත තත්වේ බලාගන්න බෑ...

"මට බෑ මං ඒකට කැමති නෑ... "

එයා ගැස්සිලා මගේ පපුවෙන් අයින් උනා... අසරන හිනාවක් මට පෙන්නලා... බිම බලාගත්තා එයා කදුලු හංගන්න...

"කමක් නෑ බබා කැමති විදිහකට ඉන්න.. පුලුවන් තරම් කාලයක් ආදරේ දෙන්න මට.. "

බිදුන හඩින් එයා එහෙම කියලා යන්න හදද්දිම අතින් අල්ල ගත්තා මං.. එයා ආපහු හැරිලා මං දිහා බැලුවා ආයෙත් ඒ අසරන හිනාවත් එක්කම.. හදවත් පුච්චලා දන්න පුලුවන් හිනාවක් ඒක..

"මං කැමති නෑ කෙල්ලෙක්ට මට ඕනෙ ඔයාගෙ වගේ ඩිම්පල් තියන කොලු බබෙක්"

ලැජ්ජාව පැත්තකින් තියලා මං කිව්වේ අත් දෙකෙන්ම එයාගේ අත පහුරු ගාන ගමන්... ඊලග ලග තත්පරේ මං තෙමුනා එයාගේ රිදෙන තරම් තද හාදු වැස්සකට.. විනාඩි ගානක් ගත වුනත් එයාට ඕනෙ උනේ නෑ නවතින්න.. එයාගේ ඇස් වලින් කදුලු බේරෙනවා... සතුටු කදුලුද කොහෙද... මගේ වචන දෙක තුනකට එයාව එච්චර සතුට්ට කරන්න පුලුවන් උනාද...

"ඒ වචනම මට ඇති මැනික... මගේ වටේට ආදරේ පිරිලා වගේ මට දැනෙනවා... බය වෙන්න එපා මගේ හීන නිසා ඔයාගේ හීන වලට බාදවක් වෙන්න මන් ඉඩ දෙන්නේ නෑ... බබා තව ටිකක් ලොකු උනාම අපි මැරි කරමු.. දැනට ඔයාගේ ඩිග්‍රි එක කරගන්න.. තාම මගෙ මැනිකට ඔය දේවල් තේරෙන්නේ නෑ... දැන් උනත් මෙහෙම කිව්වේ මාව දුකින් තියන්න කැමති නැති නිසා කියලා මන් දන්නවා..... දන්නවද ආරාධ්‍ය ට මන් ගොඩක් නයයි... එයා නැත්තම් මට මේ සුරංගනාවිගේ මැජික් ආදරේ හම්බෙන්නේ නෑනෙ... "

මගේ අතක් ඉබ ඉබ එයා එහෙම කියලා ආයෙත් මගේ පපුවටම තුරුල් වුනා.. මං හෙමීට එයාගේ ඔළුව අතගෑවා... මට දුකයි එයා ගැන... එයා මට පිස්සුවෙන් වගේ ආදරේ කරනවා.. එයාගේ හදවත පුරාම ඉන්නේ මං.. ඒත් මගේ හතරට බෙදිච්ච හදවතේ හතර වෙනි තැන තමයි එයාට තියෙන්නේ.. අයියගේ තැනට එන්න පුලුවන් උනත් එයාට කවදාවත් තාත්තගේ තැනට නම් එන්න බැරි වෙයි.. ඒත් එයාගේ මුලු හදවතේම අයිතිකාරි වෙච්ච එක ගැන ආත්මාර්තකාමී සතුටක් නැතුවාම නෙවෙයි....

එන්න එන්න එයාගේ ග්‍රහනය තද වෙනවා ඇරෙන්න මගෙන් මුදෙන්න නම් එයාට අදහසක් නෑ... කොහොමහරි අත දිගෑරලා මං කප් එකට පොල් කිරි ටික දාගත්තා... රයිස් කුකර් එක නම් වර්ම් එකටත් වැටිලා.. තාමත් නිතිනු අයියා එහෙමමයි.. නිදිද මන්දා මෙයා හිටගෙනම..

"අය්යේ නැගිට්ටින්න කෝ... කන්නේ නැද්ද ඔයා.."

කතා කරත් එයා අනික් පැත්ත හැරිලා ඇස් පියාගත්තා. ඇරෙන්න නැගිට්ටෙ නෑ.. වෙනසක් නෑ එයත් මං වගේ.. මමත් එයා ලග ඉද්දි එහෙමනේ.. කතාකරලා කතා කරලා කොහොමහරි නැගිට්ටව ගත්තා... කෑම එකක් බෙදාගෙන මං මේසෙන් ඉදගත්තා.... ලොකුම ලොකු බත් එක දැක්කම එයා හිනාවෙලා මං දිහා බැලුවා... එයාට තේරෙන්න ඇති මත් දෙන්නටම එකට බෙදාගෙන ආවේ කියලා.... පුටුව මගේ ලගට අරන් එයා බත් එකත් අතට ගත්තේ මගේ ඇස් දෙක නලලට යද්දි..

"මගේ චූටි මැනික මහන්සි වෙලා ඉව්වනේ.. ඉතින් මං කවන්නම්.."

එයා ඉස්සල්ලාම කට කාලා මන් දිහා බැලුවේ ඇස් වල කඳුලුත් පුරවගෙන...

"අම්මා උයපුවා වගේමයි මැනික... "

වේදනාත්මක ස්වරයකින් එයා එහෙම කියලා ඉක්මනින් ඉක්මනින් බත් කටවල් පහ හයක්ම කෑවා මාවත් අමතක කරලා.. මං කම්මුලට අතක් තියාගෙන බලන් හිටියේ එයා කන හැටි... ලෝකේ හොදම කෝකියට හිමි සම්මානේ ලැබුන වගේ සතුටක් දැනෙන්නේ මට.. මෙච්චර වෙලා වද දුන්න බඩගින්නත් නැතිවෙලා දැන් නම්..

"ඔහ් අයෑම් සොරි පැටියෝ... මට ඔයාට කවන්නත් අමතක උනා... රසම රසයි මැනික... "

එයා මත් දිහා බලලා එහෙම කියලා දික් කරේ ලොකුම ලොකු බත් කටක් මට.. ඒක ලොකු වැඩි නිසා දෙපාරකට කෑවේ මත්.. ඒකෑවෙත් පුලුවන් තරම් කට ඇරලා... එයා වම් අතෙන් මගේ කම්මුල් මිරිකුවා..

"කුරුලු කටක් නේ තියෙන්නේ මගේ කෙල්ලට"

මං එයා දිහා බලලා බොරුවට එරෙව්වා.. ලොකුම ලොකු බත් පිගන් දෙකක්ම අපි දෙන්නා ඉවර කරා... එයානම් හිටියේ රජ බොජුන් වැලදුවා වගේ සතුටින්.. බත් එක පොඩ්ඩක් බෙරි වෙලා තිබ්බට ලොකු අවුලක් තිබ්බේ නෑ... ඒ අතින් එයා ගොඩක් දක්ශයි.. මං පලවෙනියට උයපු බත් එක අම්මා විසි කරලා දැම්මා කන්න බෑ කියලා.. නිතිනු අය්යගේ පලවෙනිම බත් එක ලොකු ප්‍රශ්නයක් නැතුව කන්න පුලුවන්.. ඒවා මේවා හිත හිතා මං සෝෆා එකෙන් ඉදගත්තේ ඉස්මුරුත්තාවටත් එන්න එන බඩත් බොහොම අමාරුවෙන් උස්සන්.. මං ඉදගත්ත ගමන් නිතිනු අය්යා මගේ ඔඩොක්කුවෙන් ඔලුව තියන් හාන්සි උනා...

ෆෝන් එක අරන් එයා මගේ අතට දුන්නා ගැලරි එක ඕපන් කරලා... ඒකෙ තිබ්බේ ලස්සන ගෑනු ලමයෙක්ගෙ පරන ෆොටෝ එකක්... ඒ ඇස් වලිනුයි ඩිම්පල් වලිනුයි නිතුනු අය්යගේ අම්මා කියන්න මං තේරුම් ගත්තා...

"ලස්සනයිද එයා..."

"හ්ම්ම් එයා ලස්සන නැත්තම් කොහොමද මෙච්චර හැන්ඩ්සම් පුතෙක් ඉන්නේ... "

"ඔයා කොහොමද දන්නේ ඒ මගෙ අම්මි කියලා"

"මේ ඇස් මේ ඩිම්පල්ස් ඔක්කොම ඔයාගේ වගේ... ඔයා අම්මා වගේමයි.. "

මං කියද්දි එයා ඇස් වලිනුත් හිනාවෙවී මං දිහා බලන් ඉන්නවා... මටත් තාත්ති වගේ කියනවනම් ඊට වඩා දෙයක් නෑ... එයත් එහෙම වෙන්නැති... ඒත් ඒ හිනාව මොහොතකින් නැති උනා... සුසුමක් හෙලලා පටන් ගත්තා එයා කතාවක්..

"එයා ඩොක්ටර් කෙනෙක්.. හරි ලස්සන හදවතක් තිබ්බා එයාට.. මං මේ ලෝකෙ දැක්ක ලස්සනම චරිතේ... මට ගොඩක් ආදරෙයි එයා.. මං අම්මිගේ පනලූ... මට උනක් හැදුනත් එයා අඩනවා.... ඉස්සර හැමදාම පන්තියේ පලවෙනියා මම.. අනිත් ළමයින්ට වඩා ගොඩක් දක්ශයි ලූ.. එක පාරක් දැක්කොත් ඒක අමතක වෙන්නැති අමුතු හැකියාවක් තිබ්බා මට.. අදටත් එක එක ලෙඩ වලට අම්මි දෙන බෙහෙත් මට කටපාඩම්.. පේපරේ ලකුනු ගානට එයා මට උම්මා දෙනවා.. ඉතින් මං ගොඩක් පාඩම් කරනවා ඒ කාලේ.. උම්මා ගොඩක් ගන්න.. එතකොටත් මං මේ වගේ ගොඩක් ආදරේ හොයනවා... මොකද තාත්තගේ ආදරෙත් මට ලැබුනේ නැති නිසා.. අම්මයි තාත්තයි දෙන්නම උනේ අම්මි.. මගේ ලෝකෙ එයාට එහා දෙයක් දැනන් හිටියේ නෑ.. ඒත් එක මූසල

දවසක.. මගේ ජීවිතේ වෙනුවෙන් ඒ.. එයා ජීවිතේ පූජ ක..රා..
එයාට.. ඕනෙ වෙන්නැති.. එයාගේ ලෝ..කෙ. වෙ..ච්ච මාව බේරගන්න.. ඒත් එයා.. දන්නෙ නෑ... ඒකෙන්.. මට මගේ.. ලොකෙම නැති වුනා කියලා.. මං තනි වුනා.. කෑගහලා ඇඩුවා.. ඒත් එයා සුදු පාට ලස්සන ඇදුමක් ඇදන් සාලෙ මැද නිදා ගෙන හිටියා... මාව.. සැනසුවේ නෑ... තිනු බබා කියලා කතා කරේ නෑ... එයා කතා කරේ නෑ.. කතා කරේ නෑ මට.. "

හිනාවෙවී පටන් ගත්ත කතාව එයා නැවැත්තුවේ කදුලු වලින් අනෝරා වැසි වස්සමින්.. උකුල උඩ තිබ්බ මූන පපුවෙන් තියාගෙන එයා හුස්ම හිරවෙන තරම් හූල්ල හූල්ල ඇඩුවා.. එයාව සනසන්න වචන මන් දැනන් හිටියෙ නෑ... මේ වගේ වෙලාවක එයාගේ හිතට සහනයක් වෙන විදිහට කතාකරන්න ඕනෙ උනත් මං කරේ එයාටත් වඩා හය්යෙන් අඩපු එක.. අවුරුදු නවයක පුන්චි දරුවෙක්. එයාගේ ඉස්සරහ අම්මව මරලා දද්දි කොහොම දරා ගන්න ඇත්ද... අහසි අක්කා කියපු හැටියට ඒක මර්ඩර් එකක්.. ඒත් කවුද එයාව මැරුවේ.. එතකොට නිතිනු අය්යගේ තාත්තා කෝ.. කතාවේ ගොඩක් හිස් තැන් තිබ්බත් මං ඒවා ගැන අහන්න ගියේ නෑ... තවත් එයාගේ හිත රිද්දන්න බැරි නිසා..

හුස්ම ඉහල පහල යන රිද්මෙන් මට තේරුනා එයාට නින්ද ගිහින් කියලා.... පච් අඩලා අඩලා හෙම්බත් වෙලා ඇති.... උදේ නිදා ගත්ත නිසා මට නම් නිදි මත නෑ...

එයා ඇහෙරෙනකම්ම මං එයාගේ ඔලුව අතගෑවා... ටී ශර්ට් එකේම කොනකින් එයාගේ මූන පියදැම්මා.. එක කම්මුලක විතරයි පිහදන්න පුලුවන් අනිත් කම්මුල පපුවට තියන් ඉන්නේ එයා..

පැයකට විතර පස්සෙ එයා ඇහැරුනේ මං ඒ මූන දිහා බලන් ඉද්දිමය්.. ලස්සනට හිනාවෙලා එයා මං දිහා බැලුවා කිසිම දෙයක් මතක් නෑ වගේ... ඔලුව උස්සලා මගේ නලලට කෙටි හාදුවක් තියලා එයා මගේ කොන්ඩෙ මූනට වැටිච්චා කන ලගින් රැන්දුවා..

"ඔයාට පින් මැනික මං කියන ඒවා අහන් මගේ දුක බෙදාගත්තාට.. මිනිස්සු කියන කතාව හරි හිතේ තියන දේවල් කාත් එක්ක හරි කිව්වහම හිත නිදහස් වෙනවා.. සැහැල්ලුවක් දැනෙනවා මට දැන්.. මෙච්චර කල් මට මගේ දුක කියන්න කවුරුත් හිටියේ නෑ... ඒත් ඔයා මගේ ලගට ඇවිත් සැනසීමත් අරන්... මට විශ්වාසය් ඔයා මං ගාව ඉන්නකම් කවදාවත් මට තනිකමක් දැනෙන එකක් නෑ... ආදරෙය් පනටත් වඩා මන්.."

මං එයාගේ නලලෙන් හාදුවක් තියලා එයා දිහා බැලුවා...ඇස් පියාගෙන ගොඩක් වෙලා ඉදලා තමයි එයා ඇස් ඇරියේ..

"බබාගේ ටීශර්ට් එක තෙමලා මං ගිහින් ඇදුමක් මාරු කරන් එන්න මැනික අපි යමු අයියව ගන්න.. තව ගොඩක් දේවල් තියනවා ඔයාට කියන්න.. මං හෙමීට කියන්නම්

හැමදේම.. සමහර දේවල් කියන්න ඕනෙ වුනත් මට කියන්න අමාරුයි.. පුලුවන් වෙච්ච වෙලාවක කියන්නම් මං.. තරහ නෑ නේද මගේ පැටියා.. "

එයාගේ ඇස් දිහා බලාගෙනම ඔලුව දෙපැත්තටම වැනුවා මං.. මගේ අත් දෙකම එකට අරන් මත් දිහාම බලන් ඉබලා එයා රූම් එකට ගියා...

වෙන ඇඳුමක් දන් මං කාර් එකට නැග්ගා... එයානම් ඒ ඇඳුම පිටින්මය්.. ඒ මදිවට ටයි එකත් දගත්තා... අයියා වැරදියට හිතලා ගෙදරින් යවයි කියලා බයයි එයා...

## 22 කොටස

අද මං කෝස් එකට යන්න ඕනෙ දවසක්... තිතිනු අයියා ඊයෙ රෑ ඉදලම මූන එල්ලගෙන හිටියේ ඒ නිසා.. කෝස් එකට ගියාම කෝල් එකක්වත් ගන්න වෙන්නෙ නෑනෙ... ඒ නිසා ඊයෙ රෑ මට හුස්මවත් ගන්න බැරි තරම් තදට තුරුල් කරන් හිටියේ මාව.. අයියට නොපෙනී ඉන්න පුදුම මහන්සියක් දරන්න වුනා මට.. නිදගන්න ආවෙත් බොහොම අමාරුවෙන්...

තාම 6 වත් වෙලා නැති නිසා මං හිටියේ එයාව මතක් කර කර තනියම හිනාවෙවී... ආදරේ කොච්චර සුන්දරයිද

කියලා දැන් තමයි තේරෙන්නේ... ඒකනේ ආදරේ ගැන මෙච්චර කවි සින්දු තියෙන්නේ..
කල්පනා කර කර හිටපු මාව ගැස්සිලා ගියේ කවුරුහරි ඇදෙන් වාඩි වෙච්ච නිසා.. මූන ඉදන්ම පෙරවන් හිටපු ශීට් එක අයින් කරලා බලද්දි මගේ මූනටම එබිලා හිටියේ වෙන කවුරුත් නෙවෙයි මගේ කුමාරයා... බෙල්ලත් පැත්තට කරන් මං එයාගේ කඩවසම් රූපෙ රස වින්ද... උදේ පානදර නිසා තාමත් පරිසරය අඳුරුයි.. ඒත් මගේ හිත පුරාම ඒ රූපෙ ඇදිලා තියෙන නිසාද්දෝ එයාව දකින්න කලුවර බාදුවක් උනේ නෑ...

දබරැගිල්ලෙන් එයාගේ ඇහි බැමෙන් පටන් ගෙන නිකට දක්වා චිත්‍ර ඇන්ද මං.. ඒත් තොල් පෙති නම් ස්පර්ශ නොකරන්න මං වග බලා ගත්තා... මොකක්දෝ බයක් තිබ්බා මට ඒ ගැන... ඒ තොල් ගැන අවදානය යොමු කරද්දි මට මතක් වෙන්නේ ෆිල්ම් වල දැකලා තියෙන සමහර කොටස්... එයිටීන් ප්ලස් මූවි එකක් වත් බලල නැති මට දෙතොල් සිප ගැනීමක් කියන්නේ වැඩිහිටියන්ට පමනයි ජවනිකාවක් වගේ හිතෙන්නේ..

ලගදි කපපු රැවුල නිසා රැවුල් කොට ඇනෙනවා... මං ආසයි අලුත කපපු කොන්ඩ රැවුල අතගගා ඉන්න.. පුන්චි කාලේ ඉදන්ම ඒ වගේ දවසට අය්යයි තාත්තිටයි ඉන්න දෙන්නේ නෑලු.. අදත් ආසාවට එයාගේ කම්මුලක් අතගෑවා... එයා මගේ අත උඩින් එයාගෙ ලොකු අත තියලා ඒ පැත්ත හැරිලා තොල් තද කරා අල්ලට.. උදේ පාන්දර සීතලත් එක්ක ඒ තොල් පහස දැනෙද්දි හිරිගඩුත් පිපුනා ඇගේ.. සීතල මකා ගන්න ඒ තුරුලට යන්න ඕනෙ උනත්

නැගිට්ටින්න කම්මැලි නිසා මං එහෙමම හිටියා එයා මාව තුරුල් කරගන්නකන්..

"සීතලයි... ළගට ගන්නකෝ... "

බලන් ඉදලා ඉදලා බැරිම තැන මං කිව්වේ... එයා ලස්සනට හිනා වෙලා ඇද විට්ටමට හේත්තු වුනේ මාවත් උස්සලා ළගට ගන්න ගමන්... සීතල මැකෙන්නත් එක්ක මං පුලුවන් තරම් එයාගේ පපුවට ගුලි ගැහුනා.. එයා පෙරවන රෙද්දත් ඇදලා මගේ ඇග වැහෙන්න දැම්මා.. තුරුලට ගත්තත් මට සීතල දැනෙයි කියලා වෙන්නැති...

"හොර කෙල්ල මගේ.. ළගට එන්න ඕනෙ වෙලත් නිදාගෙනම හිටියා නේ කම්මැලි කමට"

හිස් මුදුනට කිලෝමීටරයක් විතර දිග හාදුවක් දීලා එයා කියන්නේ... උත්තරයක් විදිහට පොඩ්ඩක් කුරු කුරු ගාලා මං ඇස් පියා ගත්තා... කතා කරන්න කම්මැලියි.. ඇස් දෙකත් තදට පියාගෙන ලොකු හුස්මක් අරගත්තේ එයාගේ සුවද හිතේ පුරවන් නිදාගන්න හිතාගෙන...

"චූටි මැනික..... වස්තු නැගිට්ටින්නකෝ... වෙලා ගිහින් තියෙන්නේ.. අනේ බබා ඇහැරින්නකෝ... "

හීනෙන් වගේ ඇහුනේ කවුරුහරි කතාකරන සද්දේ.. දෙපාරක් හිතන්නේ නැතුව කට ඇරලා අහු වෙච්ච තැනක් හැපුවා මන්... මාව ඇහැරවන්න හදපු තරහට... හපද්දි කතාකරන සද්දේ නැති වුන හින්ද හපාගෙනම ආය

නිදාගත්තා මන්.. නින්දත් නොනින්දත් අතර හිටපු මාව ගැස්සිලා ඇහැරුනේ නිතිනු අයියව මතක් වෙලා... දෙවියනේ... මං ඒ හැපුවේ නිතිනු අයියව නේද

ඇස් ඇරලා බලද්දි තාමත් මන් හිටියේ එයාව හපාගෙන... ඇස් වල කඳුලු පුරෝගෙන එයාව අතෑරලා මූන දිහා බැලුවා මන්... ආදරනීය හිනාවකින් මූන පුරවන් එයා මන් දිහා බලන් ඉන්නවා හරියට මන් වෙන කෙනෙක්ව හැපුවා වගේ...

"අනේ සොරි අයියේ... මන් හීනෙන් හැපුවේ.. රිදෙනවද ඔයාට... මං හිතලා කරේ නෑ"

"අනේ ඇය් මැනික අඩන්නේ.. අයියට රිදුනේ නෑ බබා.. ම්ම් කෝ දැන් අඩන එක නවත්තන්නකෝ.. ඔයාගේ අයියත් එයි අඩන සද්දෙට... ඇත්තමයි මට රිදුනේ නෑ... මේ චූටි දත් වලට පුලුවන්ද මාව රිද්දන්න ම්ම්ම්... "

"ඇත්තටම රිදුනේ නැද්ද ඔයාට.. තරහයිද මන් එක්ක"

"නෑ පැටියෝ.. රිදුනේ නෑ... තරහත් නෑ... මං කොහොමද මගේ පැටියා එක්ක තරහ වෙන්නේ... කෝ එන්න මූන පිහදන්න.. උදේ පාන්දරම ඔහොම අඩන්න හොද නෑ මැනික... "

එයාගේ අතෙන්ම මගේ මූන පිහදලා මගේ කම්මුල් දෙකට හාදු දෙකක් දුන්නා....

"මේ දවස් ටිකට මං තේරුන් ගත්ත දෙයක් තමයි බබා මගේ තුරුලට ඉන්නකොට කවුරුත් කරදර කරනවට කැමති නෑ... අඩුම මං වත් ඔයාට කතා කරනවට ඔයා කැමති නෑ... දැන් හීනෙන් උනත් බබා මාව හැපුවේ මගේ තුරුලේ ඉන්න දෙන්නැතුව කරදර කරා කියලා.... ඉතින් ඒකට මන් මොකටද තරහ ගන්නේ... සතුටු වෙනවා මිසක්... මන් ලග ඔයාට කොච්චර සැනසීමක් තියනවද කියලා තේරෙනවා මට.. ඒ තරම් සතුටක් මට මෙ ලෝකෙ නෑ බබා.. "

මගේ මූන අත් දෙකට මැදි කරන් ඇස් වලට එබිලා එයා කියද්දි මට දැනුනේ මගේ හදවත ඇතුලේ එයාගේ නමට ආදරේ ද්‍රේරෙ ගලනවා වගේ... කදුලු අතරින් හිනාවෙලා මං මුලු මූනම හාදු වලින් තෙමුවා.. ඊටපස්සේ සුපුරුදු පරිදි ඒ පපුවේ මූන ඔබාගත්තා.. ඒත් මං ඉන්න විදිහේ වෙනසක් දැනුන නිසා මං එයාගෙන් ඈත් වෙලා බැලුවේ.. නිදගන්න පටන් ගත්ත වෙලේ හිටියේ මෙට්ටෙ උනාට දැන් මං හිටියේ එයාගේ කකුල් දෙක උඩ..

" ඔව් ඔව් මගේ කකුල් දෙක උඩ තමයි ඉන්නේ... නින්දෙන් පුදුම විදිහට දැගලුවේ ඔතනට එන්න.. හා පැටියෙක් වගේ ගුලි වෙලා ඉන්නකොට මට ලෝබ හිතුනා... ඒ නිසා හිර කරගෙන හිටියා මන් පපුවට"

හීනෙන් දගලනවා කියලා දැනගෙන හිටියත් මං මෙච්චර දගලනවා කියලා දැනගත්තේ අද තමය්... එයාගේ කකුල් දෙකෙන් බැහැලා කොට්ටේ අස්සේ මූන ගහගත්තා ලැජ්ජාවට...

"මං කාමරේට යනවා බබා.. දවසෙම ලග ඉන්න නැති වෙන හින්දා උදේ පාන්දරම කාමරේට ආවේ.. තව චුට්ටක් දෙයියන් ඉදලා වෙනදා වගේම අයියා කතා කරද්දි නැගිට්න්න.. නැත්තන් එයාට දුක හිතෙයි ඔයා වෙනස් වෙලා කියලා.... උම්ම්ම්මා.. ආදරෙයි මං "

කන් පෙත්තකට ලං වෙලා රහසින් මුමුනලා එයා යන්න ගියේ මගේ අතත් ඉබගෙන.. බැදීම් ගැන එයා ගොඩක් හිතනවා... සමහරවිට එයාට අහිමි වෙච්ච බැදීම් ගාන වැඩි නිසා වෙන්න ඇති.... මගේ බැදීම් පවා ආරක්ෂා කරන්න හදන්නේ ඒකයි..

වෙනදා වගේම අයියගේ එලාම් එක වැදුනට පස්සේ මං නැගිට්ටේ... වොශ් එකක් දාගෙන ඇවිත් කාමරේට ඇවිත් කල්පනා කරා මොනවද අදින්නේ කියලා වෙනදා වගේ රෑ ඇදුම් ලේස්ති කරලා තියන්න අමතක වුනා නිතිනු අයියගේ සිහියෙන් හිටපු නිසා.. එයා නම් ඇදගෙනත් ඉවර ඇති දැන්.. මං වගේ කම්මැලියෙක් නෙවෙයිනේ...

එක පාරටම ආපු අදහසකට මං ගියේ නිතිනු අයියගේ කාමරේට... වටපිට බලබල හෙමින් සැරේ එයාගේ කාමරේට එබුනේ අයියා දකියි කියලා බයේ.. නිතිනු අයියා හිටිය විදිහ දැක්කම මගේ ඇස් දෙක නලලට නෙවෙය් හිස්මුදුනටම ගියාද කොහෙද... කලුපාට ඩෙනිම් කලිසමක් විතරක් ඇදන් හිටිය එයාගේ ඇග හරියට හොලිවුඩ් නලුවෙක්ගේ වගේ... කටත් ඇරන් මං බලන් හිටියා...

පියවී සිහිය ලද තත්පරේම මට ඕනෙ වුනේ කාමරෙන් එලියට යන්න... මොකද මං කරපු වැඩේ වැරදියි.. පිරිමියෙක්ගේ කාමරේට කතා කරන්නේ නැතුව යන එක වැරදියි.. එහෙම හිතලා ආපහු හැරෙද්දිම මන් දැක්කේ කන්නාඩියෙන් එයාගෙම ඇග බලන් හිනාවෙන එයාගේ මූන..

ඒත් පේන්නෑ මට එයා මොනා දිහාද බලන් ඉන්නේ කියලා.... කුතුහලය නිසාම හොරෙන් එබිලා බැලුවා මන්.. පපුවේ මොනා හරි ගාන ගමන් එයා හිනා වෙන්නේ... තවත් ටිකක් එබිලා බලනකොට තමයි දැක්කේ එයාගේ පපුව.. ඇස් වල කඳුලු බේරෙන්න තත්පරයක් වත් ගියේ නෑ... පපුවේ තිබ්බේ දම්ම දම් පාට වෙච්ච මගේ දත් පාර.. එයා ඒකේ බෙහෙත් ගාන ගමන් මෝඩයෙක් වගේ හිනා වෙනවා.. කට අතින් තද කරගෙන මං කාමරේට දුවලා ඇඩුවා හයියෙන්.. ඒත් සද්දේ නෑහෙන්න මං වග බලාගත්තා.. මොකද නිතිනු අයියගේ සතුට තියෙන්නේ මගේ හිනාව එක්ක කියන එක දැන් මට රහසක් නෙවෙයි....

වොශ් රූම් එකට ගිහින් මූනත් හෝදන් ඇවිත් දම්පාට ගවුමක් ඇඳගෙන ලේස්ති වුනා.. සාලෙට එද්දි නිතිනු අයියා වශී වෙලා වගේ බලන් හිටියා... අයියා එයාගේ ඇස් ඉස්සරහින් අත එහාට මෙහාට කරද්දි තමයි මේ ලෝකෙට ආවේ... යන ගමනුත් එයා සැරෙන් සැරේ මන් දිහා බල බල ගියේ ඉස්සරහ කන්නාඩියෙන්... මං ඒක දැක්කේ ගෙදර ඉඳන්ම ඇස්පිය නොහෙලා එයා දිහා බලන් හිටපු නිසා.. බහින තැනට ඇවිත් නිතිනු අයියගේ කම්මුලට

හාදුවක් දුන්නා කාර් එකෙ පිටිපස්සේ ඉදලා ඉස්සරහට නැව්ලා.. එහෙමම අයියටත් කිස් එකක් දුන්නා...
නැත්තම් දුක හිතෙයි එයාට..

දවසම උගන්වපු මේලෝකෙ දෙයක් මගේ කනට වැටුනේ නෑ... නිතිනු අයියවමයි මතක් වෙන්නේ.. එයාගේ පපුවේ තිබ්බ දත් පාරවල් මතක් වෙනවා.. දුකයි මට.. ශනූටත් මං ඒ ගැන කිව්වේ අඩ අඩා... එයානම් හිනාවුනා... එයා කියනවා හිතලත් කපල්ස් ඒ වගේ හපන නිසා ඒක හිතන්න එපාලු.. ඒවට කියන්නේ ලව් බයිට්ස් කියලලු... තව තව මොනාදෝ කිව්වා එයා.. මට තේරුනේ නැති නිසා බැන්නා.... නිකමටවත් එයිටීන් ප්ලස් සීන් තියන ඉන්ග්ලිශ් මූවි එකක් බලන්නලු... නිතිනු අයියා වගේ හොද කෙනෙක් නිසා හොදයිලු නරක කොල්ලෙක් එහෙම සෙට් වුනා නම් මාව රවට්ට ගනියිලු... එයා කියන කතාවේ ඇත්තක් නැත්තෙම නෑ... 10 වසරේ විද්‍යාව පොතේ තියන දේවල් ඇරෙන්න මං මෙලෝ දෙයක් දන්නේ නෑ... ඒත් මං හැදුන පරිසරයත් එක්ක එයිටීන් ප්ලස් කියන නමටත් බයයි මං.. එහෙම රාමුවක් ඇතුලේ තමයි අම්මයි තාත්තයි මාව හැදුවේ....

කල්පනා කර කර ගේට් එකෙන් එලියට ආපු මන් දැක්කේ කාර් එකට හේත්තු වෙලා වෙලාව බල බල ඉන්න නිතිනු අයියව... ලා දම්පාට ශර්ට් එකෙ අත් වැලමිට ලගට නවලා ඉන්න එයා දිහා බලන් හිටියේ මගේ ඇස් දෙක විතරක් නම් නෙවෙයි.. ගේට් එකෙන් එලියට එන ගෑනු ලමයි හැමෝගෙම මාතෘකාව වෙලා තිබ්බේ එයාව...

දැනුනේ මට එසේ මෙසේ ඉරිසියාවක් නම් නෙවෙයි....

ශනුවත් අතෑරලා දුවත් ගිහින් එයාගෙ අතේ එල්ලුනේ හැමෝටම එයා මගේ කියලා පෙන්නන්න ඕනෙවට.. එයාට නම් ගානක් නෑ හිනාවෙවී ඉන්නවා.. කාර් එක ඇතුලට වෙලා හිටියනම් ඉවරයි නේ එලියට ආවා මෙතන කෙල්ලෝ බලන්න.. හිතින් බැන බැන හිටිය ඔක්කොම අමතක උනා එයාගේ අතේ තිබ්බ තඩිම තඩි චොක්ලට් එක දැක්කම... පැන්න ගමන් චොක්ලට් එක අරන් අත් දෙකෙන්ම බදාගත්තා.. ඒත් ඒක දැකපු එයාගේ මූනෙ හිනාව එහෙමම වේලිලා ගියා...

"අනේ පැටියෝ.... ඕක ඔයාට නෙවෙයි.. "

මූනෙ තිබ්බ හිනාව එහෙමම මැකිලා ගියා එයාගේ වචන වලට... දරාගන්න බැරි අපහසුතාවයක් දැනුනා මට... චොක්ලට් එක ආපහු එයාට දික් කරේ මූනට හිනාවක් ගන්න අසාර්ථක උත්සහයක් ගන්න ගමන්...

"ඕක ඔයාගේ යාලුවට... එද ගෙදර ආව වෙලාවේ මන් හායි කියලවත් කිව්වේ නෑනේ... අඩුම ගානේ හිනා වුනේවත් නෑ... ඉතින් ඔයාගේ හොදම යාලුවට මන් එහෙම සලකන එක හරි නෑනේ... ඔයාගේ යාලුවා කියන්නේ මගෙත් යාලුවෙක් වෙන්න එපැයි... ඒ නිසා මේක දීලා එයාට කියන්න මන් සොරි කිව්වා කියලා.... "

නැතිවෙච්ච හිනාව එසැනින් ආවා මගේ මූනට ආවා ඒක ශනුට කිව්වහම.. එයාවත් ඇදගෙනම මන් ශනු ලගට දුවත්

ගියා... ශනු ඇස් ලොකු කරන් බලන් ඉන්නවා මේ මොකද වෙන්නේ කියලා....
චොක්ලට් එක එයාගේ අතට දුන්නහම ඇස් දෙක තවත් ලොකු උනා...

"මේක උබට ගෙනත් තියෙන්නේ.. එදා උබත් එක්ක හිනාවුනේවත් නැති නිසා.. කෝ දැන් දෙන්නම හෑන්ඩ් ශේක් කරමු අලුතින් හම්බුනා වගේ... "

මං හිනාවෙලා එහෙම කිව්වහම ශනුත් හිනාවෙලා අත දික් කරේ අනිත් අතින් චොක්ලට් එක ඇදලා ගන්න ගමන්...
එයත් මං වගේ චොකලට් පෙරේතියෙක් නේ.. ඉතිං මැනස් මුකුත් නෑ චොකලට් එක දැක්කම..

ශනු අත දික් කරත් නිතිනු අයිය නම් සාක්කුවට අත් දෙක දන් ඉන්නවා මිසක අත දෙන්නම් අදහසක් නෑ... ඒ නිසා මන්ම එයාගේ අත සාක්කුවෙන් එලියට අරන් දිගැරියේ ඔරවන ගමන්... ඊටපස්සේ නම් එයා හෑන්ඩ් ශේක් කරා... ශනු නම් හිටියේ හිනාව හිරකරන් පුපුරන්න ඔන්න මෙන්න... ඇයි ඉතින් ඒ තරම් ලස්සනයි නිතිනු අය්යගේ මූන..

"බබාට කොහෙද යන්න ඕනෙ.. ම්ම්.. හවස් වෙලා අය්යවත් අරන්ම ගෙදර යන්.."

කාර් එක ලගට ආපු තත්පරේ එයා ඇහුවේ....

"ගෝල් ෆේස් යන්.."

"ගෝල් ෆේස් ?? මිම් එහෙනම් යමුකෝ.."

කාර් එකට නැගලා අපි ආවේ ගෝල් ෆේස්.. හැබැයි ඉතින් සැරින් සැරේ මට අර චොක්ලට් එක මතක් වුනා.. මං හිතන්නේ ටිකක් ගනන් එකක් ඒක.. කවදාවත් ඒ ජාතියේ චොක්ලට් එකක් කාලා තිබ්බේ නෑ...

වාහනේ නවත්තලා එයා ෆෝන් එක ඔබන ගමන් කාර් එකේ පිටිපස්සේ තිබ්බ වතුර බෝතලේ ගන්න කියලා කියපු නිසා මත් පිටිපස්සේ ඩෝර් එක ඇරියා.... වතුර බෝතලේ ලගම තිබ්බා අර ජාතියේම චොක්ලට් දෙකක්.. කැශූ නට් එකයි ආමන්ඩ් ෆ්ලෙවර් එකයි... මත් වතුර එක විතරක් අරන් ඩෝර් එක වැහුවා.. ඒ චොක්ලට් දෙකත් වෙන කාට හරි වෙන්නැති... නැත්තම් එයා මට දෙනවානේ.. සියුම් දුකක් දැනුනා හදවතට.. චොක්ලට් නැතුවට නෙවෙයි.... එයාට මාව මතක් නොවෙච්ච නිසා.. සමහරවිට එයා දන්නේ නැතුව ඇති මං චොක්ලට් කන්න ආසයි කියලා..

හිතේ ඔක්කොම හංගන් එයාට වතුර එක දීලා හිනාවුනා.. එයා වතුර බෝතලෙයි මං දිහායි පුදුමෙන් වගේ බැලුවා... ටික වෙලාවක් ඉදලා එයා ලොකු හුස්මක් පාතට දාලා මාව බදාගත්තා.. පාර කියලවත් බලන්නේ නැතුව නලලට කිස් එකක් දෙද්දි මං හිටියේ ඇසුත් ලොකු කරන්.. මගේ ඔලුව අතගාලා වතුර බෝතලෙත් අරන් එයා කාර් එක ලගට ගිහින් වතුර බෝතලේ ආපහු තියලා ආවේ චොකලට් එකකුත් අරන්... තාමත් ලොකු කරගත්ත ඇස් වලින් බලන්

හිටියේ මං එයා දිහා... මගේ ලගට ඇවිත් ඉනවටේ අතදාගෙන වැඩිය කට්ටිය නැති තැනකට ආවා... කැරකි කැරකි වටපිටාව බැලුවේ ඉදගන්න තැනක් වෙන්න ඇති.... මං එතන බැම්මෙන් වාඩි වෙලා බෑග් එකෙන් ටිශූ එකක් අරන් බැම්ම උඩින් එලලා එයා දිහා බැලුවා... එයා එතන්ට ඇවිත් ටිශූ එක අයින් කරලා වාඩි උනා... වාඩි වෙලා මාව ලගට ගත්තා ඉනවටේ අත දාලා... ඊටපස්සේ අර චොක්ලට් එක කඩලා ඒකෙන් එක කොටුවක් කට ලගට කරා... මං ඒකත් කන්නේ නැතුව එයා දිහා බලන් හිටියා...

"මන් හිතුවේ කාර් එකේ ඩෝර් එක ඇරපු ගමන් මාවත් අමතක කරලා චොකලට් දෙක අරන් උඩ පනියි කියලා.. ඒකයි බොරුවට වතුර බෝතලේ ගේන්න කියලා බොරුවක් කිව්වේ.. සප්‍රයිස් කරන්න.. ඒත් ඔයා වතුර බෝතලේ දික් කරද්දි මගේ පපුව පිච්චිලා ගියා.. හිතුවා නේද ඒකත් වෙනකාටහරි කියලා.. ඔයාව අමතක කරලා මන් වෙන අයට ඒවා ගත්තා කියලා මිම්.."

එයා එහෙම කියද්දි මං බිම බලාගත්තා කට ලග තිබ්බ චොක්ලට් කෑල්ලත් කටට අරන්... වෙරලේ ඇවිත් හැප්පෙන මුහුදු රල දිහා බලාගෙන එහෙමම එයාගේ උරහිසට හේත්තු වුනා.. චුට්ටි වෙලාවකටවත් එයා ගැන එහෙම හිතපු එක ගැන තරහය් මං මං එක්කම.. කෑල්ලෙන් කෑල්ල කඩලා එයා චොක්ලට් එක කවනවා... ටික වෙලාවකින් කවන එක නවත්තපු නිසා මං එයා දිහා බැලුවා...

"දැන් ඇති බබා.. ඔයා මේකෙන් බාගයක්ම කෑවා... ඔයිට වඩා කන්න හොද නෑ මත් වෙයි.. ඒ නිසා ඇති ගෙදර ගිහින් ඉතිරි ටික කන්න..."

"අනේ මදි... දෙන්නකූ මත් වෙන්නෑ.."

"කියන දේ අහන්න දරුවෝ.... ඔච්චර පැනි රහ කන්න හොද නෑ... අනික චොක්ලට් කෑවම පිම්පල්ස් එනවා.. එදා මං ස්නැක් ගොඩකුත් අරන් දුන්නනේ ඔය ඔක්කොම එකතු වෙලා බබා ලෙඩ වෙයි.. ඕන්නම් වෙන මොනාහරි අරන් දෙන්නම්.... "

"එහෙනම් මට අයිස්ක්‍රීම් ඕනේ.."

මූන දෙක කරන් කියද්දි එයාගේ මූනත් හතරැස් වුනා..

"ඒවත් පැනිරහයි නේ පැටියෝ..."

"බෑ බෑ මට අය්ස්ක්‍රීම් ඕනේ.... "

"අම්මෝ හරි හරි මන් ගේන්නම්.. මොන ෆ්ලේවර් එකක්ද ඕනේ බබාට.. "

"ෆෘට් ඇන්ඩ් නට්... එලිෆන්ට් හවුස් එකෙන් ගේන්න.. මැජික් එක රහ නෑ... "

"හරි එහෙනම් මෙතන්ටම වෙලා ඉන්න මං අර අතෙන්ට යන්නේ... කවුරුහරි ආවොත් දුවගෙන එන්න.."

නිතිනු අයියා උපදෙස් දීලා ගියේ කිලෝ මීටර් ගානක් දුර යනවා වගේ... ටික වෙලාවකින් එයා ආවේ වොන්ඩර් කෝන් දෙකක් අතේ තියන්.. ෆෘට් ඇන්ඩ් නට් එකයි වැනිලා එකයි... කොලේ අයින් කරලමයි ඒක මට දුන්නේ.. ටිකක් අයිස් එක කාලා මන් ඇහැදැම්මේ නිතිනු අය්යගේ අයිස් එකට... ටික වෙලාවක් ඒක දිහා බලන් ඉදලා දත් තිස් දෙකම පෙන්නලා එයාට හිනා වුනා.. මාව තේරිලද කොහෙද එයා එයාගේ අයිස් එක මට දික් කරා.. මගේ එක එයාට දීලා එයාගේ එක මන් ගත්තා... මං කාලා ඉවරවෙද්දිත් එයා කාලා තිබ්බේ බාගයක් විතර.. එයා ඒකත් මට දික් කරපු නිසා මං ඒකත් තත්පරේට ඉවරකරා.. ලාවට පෘතුවියේ බ්‍රමන වේගය වැඩි වෙනවා වගේ දැනුනත් ලොකු අවුලක් නෑ... තව දුන්නොත් තව කනවා කියන මානසිකත්වේ තමය් හිටියේ නම්..

එකපාරටම නිතිනු අයියා මාව තුරුලට අරන් යටි තොලේ දිගේ මහපට ඇගිල්ල තද කරලා අරන් ගියේ මාව තෘශ්නිම්භූත කරලා... ඊටපස්සේ ඒ ඇගිල්ල එයාගේ තොල්දෙකෙන් සූප්පු කරේ මට උන්හිටි තැනුත් අමතක කරලා... තාමත් අයිස් ක්‍රීම් රහ යටි තොල හපාගෙන මං ඔඩොක්කුවට හිනා උනා.. හිනා වෙච්චි අනික් පැත්ත බැලුවෙ එයාට මූන දෙන්න දැනුන අපහසුතාව නිසා.. ඒත් ඈත දැක්ක සුපුරුදු මූනක් නිසා මගේ ඇස් එතන නතර වුනා.. ඔව් ඒ මන් හිතපු කෙනා තමයි.. හිටපු තැනින් නැගිටලා මං දුවන් ගිහින් එයාව බදගත්තා..

"අහසි අක්කි"

“omg මේ නිතිනුගේ. ලිට්ල් බනී නේ.. අඳුරගන්නවත් බැරි වුනා පැටියෝ... ගොඩක් වෙනස් නේ ඔයා... දැන්නම් නිතිනු කලින් කියපු චූටි කෙල්ලමයි.. යූ ආර් සෝ කියුට්.."

අහසි අක්කි එහෙම කියද්දි මං ලැජ්ජාවෙන් බිම බලාගත්තා.. කෙල්ලෙක් කෙල්ලෙක්ගේ රූපෙ අගයන්නේ කලාතුරකින් උනත් එයා ලෝබ නැතුව මාව වර්නනා කරනවා.. කතාකරන්නේ ද්වෙනි වතාවට උනත් මට දැනෙන්නේ එයා මගේම සහෝදරියක් වගේ...

"ඔයා කොහේ යන ගමන්ද අක්කි.."

"පොඩ්ඩක් රිලෑක්ස් වෙන්න කියලා ආවේ පැටියෝ... සන්සෙට් එක බලන්නත් පුලුවන්නේ... ඔයා කාත් එක්කද ආවේ"

අහසි අක්කා අහද්දි නිතිනු අයියා එතන්ට ආවේ ඇස් නලලේ තියන්.. එයා දන්නේ නෑනේ අපි අඳුරනවා කියලා....

"ඕ.... ලව් බර්ඩ්ස්ලා ඩේට් එකකට ඇවිත්නේ.. ඒක තමයි මෙයා ක්ලිනික් එකටවත් ආවේ නැත්තේ..... මේකටනම් පාර්ටි එකක් ඕනෙමයි නිතිනු හොදේ... අය්ම් සෝ හැපි.."

නිතිනු අයියා අහසි අක්කට හිනාවෙලා බැලුවා මන් දිහා...

තාමත් එයාගෙ මූනෙ තියනවා කුතුහලය

"පැටියෝ කිව්වේ නැද්ද ඔයා අපි මීට් වෙච්ච විදිහ.. දෙන් ලෙට් මී ටෙල් යූ... මන් තමය් ඔයාගේ ලිට්ල් බනීට කිව්වේ ඔයාගේ ෆීලින්ග්ස් ගැන... ඒක නිසා තමයි ඔය දෙන්නා එකතු වුනා.. එතකොට මන් තමයි ඔය දෙන්නගේ මල් සරා "

අහසි අක්කා කියවගෙන යද්දි නිතුනු අයියා පුදුමෙන් වගේ අහන් හිටියා...

"ආ ඒක නෙවෙයි.. මට ඔය දෙන්නගේ ෆොටෝ එකක් ඕනේ... ඩැඩීට පෙන්නන්න.. කෝ දෙන්නා ලගට එන්න "

අහසි අක්කි අපි දෙන්නව ලං කරලා පිටිපස්සට ගියා ෆොටෝ එකක් ගන්න..

"පැටියෝ ඔයාගේ කොන්ඩෙන් පොඩ්ඩක් ඉස්සරහට දාන්න.. ලස්සන කොන්ඩේ ඇය් හංගන් ඉන්නේ... අය්යෝ පොඩ්ඩක් රොමැන්ටික් වෙන්නකෝ.. නිතිනු නංගී දිහා බලන්න.. පැටියෝ අය්යා දිහා බලන්න.."

අහසි අක්කා එක එක තාලෙට අපිව තියලා ෆොටෝ ගොඩක් ගත්තා..

"ඔය දෙන්න හරිම ලස්සනයි අනේ.. දෙන්නම හැමදම සතුටින් ඉන්න ඕනේ... පැටියෝ අය්යව හොදට බලාගන්න.. මේ මගේ කාඩ් එක.. ඕනෙවෙලාවක මට කතා කරන්න..

ෆොටෝ ටික එවන්නම් නිතිනුට එයාගෙන් ඉල්ලගන්න... මන් යනවා.. එන්ජෝය් යුවර් ඩේට්.. "

අහසි අක්කි ගිරව්යක් වගේ කියවලා යන්න ගියේ මගේ ඔලුවත් අතගාලා... එයා ගියාට පස්සේ අපි ආපහු හිටපු තැනින් වාඩි වුනා.. ඒත් නිතිනු අයියගේ කිසිම කතාවක් නෑ... මූනත් හරි අමුතුයි..

"බබා මන් ඔයාගෙන් දෙයක් අහන්නද.."

## 23 කොටස

“බබා.. මන් දෙයක් අහන්නම් මට ඇත්තම කියනවද..."

"ම් මොකක්ද "

"ඔයා ඇත්තටම ආදරෙයිද මට.. "

"මොනාද අයියෙ අහන්නේ.. ආදරේ නිසානේ මං ඔයා ලග මෙහෙම ඉන්නේ... "

"ඔයා මට අනුකම්පා කරනවා නෙවෙයි නේද... මං ලෙඩෙක් නිසා.. "

"ඔයාට විකාරද.. ලෙඩෙක් නෙවෙයි ඔයා.. ඇයි ඔහොම

කියන්නේ... විශ්වාස නැද්ද මාව.."

"කාලයක් ඔයා වෙනස් වෙලා ඉදලා එක පාරටම පරන ආරු උනේ අහසි හම්බුනාම නේද... කෙල්ලෙක් එකපාරටම නිකම්ම වෙනස් වෙන්නේ නෑ... ඔයා ඒ දවස් වල වෙන කාට හරි ආදරය කරා... ඒත් අහසි මන් ගැන කිව්වහම මං ඔයාට ආදරෙයි කියලා කිව්වාහම , සමහරවිට මන් මානසික ලෙඩෙක් කිව්වහම ඔයාට දුක හිතුනා... මන් ගැන අනුකම්පා කරා... ඒකයි නේද මට ලං වුනේ... කියන්න... ඒක නේද වුනේ... හැමෝටම වගේ මං ඔයාටත් බරක් වුනාද.."

වේදනාවෙන් රතු වෙච්ච ඇස් මුහුද දිහාට හරවන් බිදිච්ච හඩින් එයා කියන්නේ... දුකක් කේන්තියක් එක් වෙච්ච අමුතු හැගීමක් දැනුනේ මට.. ඒකද එයා මන් ගැන තේරුම් ගත්ත තරම... පිස්සුවෙන් වගේ මාත් එයාට ආදරෙයි. එයා නැතුව හුස්මක් වත් ගන්න බැරි තරම් ආදරෙයි මං.. ඒත් එයාට දැනුනේ නැද්ද ඒ ආදරේ.. එච්චර දුර්වලයද අපේ බැදීම.. සිතුවිලි ගොන්නක් හිතපුරා කැලතෙද්දි ලොකු කදුලු කැටයක් වැටුනා ඔඩොක්කුවට.... හිතත් එක්ක පොරබදලා මං එයාව තේරුම් ගන්න උතසහ කරා...

එයාගේ ජීවිතේ ලැබිච්ච අත්දැකීම් එක්ක එයා එහෙම හිතෙන එකේ වැරැද්දකුත් නෑ... ගොඩක් සංවේදී මනුස්සයෙක් එයා... ඒ නිසාම මන් තීරනය කරා මගේ කේන්තියයි දුකයි පැත්තකින් තියලා එයාව සනසන්න.. ඇස් වලින් කදුලු ආවේ නැති උනාට හිත ඇතුලෙන් ගොඩක් බයෙන් ඇත්තේ මාව නැති වෙයි කියලා.... එයාගේ

හදගැස්ම පවා අඳුනන්න පුලුවන් මට.. ඒ නිසාම එයාගේ අතින් අල්ලගෙන ඒ අත පපුවට හිර කරගත්තා මං..

"මතකයිද ගිය මාසේ දවසක ඔයා ෆුඩ් සිටි එකට ගියා අහසි අක්කිත් එක්ක.. එයා ශැම්පු එකක් එහෙම ගත්තා එද.."

එයා ඇස් ලොකු කරලා බැලුවා මන් දිහා... එයාගේ උරහිසෙන් ඔලුව තියාගෙන ඔලුව හරවලා හාදුවක් තිබ්බා...

"ඒ වෙනකොටත් මං ඔයාට ආදරේ කරන්න පටන් අරන්... මං හිතුවේ අහසි අක්කා ඔයාගේ ගර්ල් ෆ්‍රෙන්ඩ් කියලා.... එද ශනු ලගේ ගෙදර ඉදන් එද්දි මං අයියව බදගෙන ඇඩුවේ ඔයා වෙන කෙනෙක්ගේ කියලා දැනගත්තම දැනිච්ච දුකට.. අයියට බොරු කිව්වේ තාත්ති මතක් වුනා කියලා.... ඔයා කැමති ඇත්තේ ඒ වගේ ගෑනු ලමයින්ට කියලා හිතලා මන් අහසි අක්කා විදිහට වෙනස් වුනා.. මං මෝඩයෙක් වගේ හිතුවා එතකොට ඔයා මට කැමති වෙයි කියලා.... ඒත් එක දවසක් එයාගේ ඩැඩී එක්ක අහසි අක්කි ආවා අපිට ලෙක්චර් එකක් දෙන්න.. එතකොට මාව අඳුරගෙන එයා ඔයාගේ විස්තර ඔක්කොම කිව්වා මට.. දන්නවද... මට පිස්සු හැදුනේ නැති ටික විතරයි ඔයාත් මට ආදරෙයි කියලා දැනගත්තම.. ඒ සතුට දෙගුන තෙගුන උනා ඔයා ඇවිත් මට තුරුලු වෙලා ආදරෙයි කිව්වම........ මං ඔයාට ආදරෙයි... ගොඩාක් ආදරෙයි... මගේ පනටත් වඩා.. මාව අවිශ්වාස කරන්න එපා දුක හිතෙනවා මට..."

අන්තිම ටික කියද්දි ඇඬුනා මට.. එයා මගේ දිහාට හැරිලා මාව බදාගත්තා ඇටකටු කුඩුවෙන තරම් තදට...

"සමාවෙන්න මැනික... මගේ චූටි පැටියව ඇඩෙව්වා මං.. මට ඔයා ගැන අවිශ්වාසයක් නෑ මැනික... ඒත් මට මගේ දෛවය විශ්වාස නෑ බබා.. කවදාවත්ම ලැබිලා නැති තරම් ආදරයක් දැනෙද්දි බය හිතෙනවා මට.. හැමදේම කවුරුහරි උදුරගනී කියලා හිතෙනවා... මං මං පිස්සෙක් බබා.. මට තේරෙන්නෑ මට ගොඩක් බයයි.. මගේ අසනීපෙ ගැන වුනත් මන් කිව්වේ නැත්තේ ඒක අහලා ඔයා මාව දාලා යයි කියලා.... දන්නවා ඒක හංගන්න හදපු එක වැරැද්දක්.. ඒක ඔයා අහසිගෙන් දැනගත්තේ නැත්තම් මං ඔයාට කරලා තියෙන්නේ ලොකු ද්‍රෝහි කමක්.. මං පිස්සෙක් කියලා දැන දැනත් ආදරේ කරනවා කියන එක අදහන්න බැරි වුනා.. ඒකයි මන් එහෙම ඇහුවේ.... මාව ඒ තරම් වටිනවද ඔයාට.. ."

එයාගේ තුරුලෙන් මිදෙන්න බැරි තරම් තදට බදාගෙන ඉන්න නිසා එයා කියවන විකාර ඔක්කොම මට අහන් ඉන්න වුනා.. දගලලා දගලලා එයාගෙන් මිදිලා එයාගේ ඇස් දිහා බැලුවෙ කේන්තියෙන් පුපුරන ගමන්..

"පුංචි පෝබියා එකක් තිබ්බා කියලා පිස්සෙක් වෙනවද මෝඩයෝ.. ඇඟ ලෙඩ වෙනවා වගේ මනසත් ලෙඩ වෙනවා ඒකට බෙහෙත් කරා නම් එච්චරයි... පිස්සෙක් පිස්සෙක් කියලා තමන්ටම කියාගත්තාම ඔක්කොම හරි යනවද.. මතක තියාගන්නවා ඔයා මගේ.. මගේ විතරයි අඩුම ගානේ ඔයාටවත් බෑ ඔයාව අවතක්සේරු කරන්න... මගේ

නිතිනු අයියා පිස්සෙක් නෙවෙයි.. අනික ඔයාව පහත් කරලා හිතන්න එපා... මට ඔයාව හොඳ වැඩිත් එක්ක.. මාව නෙවෙයි හොලිවුඩ් ඇක්ට්‍රස් කෙනෙක් වුනත් මැරි කරන්න පුලුවන් ඔයාට.. දැක්කේ නැද්ද මාව ගන්න එද්දි පැනිහලාගෙන හිටපු කෙල්ලෝ ගොඩ.. ආය ඔය කතාව කියලා අහු වුනොත් ඔයාට සදහටම මාව අමතක කරලා දන්න වෙයි.. "

එයාගේ කොලර් එකෙනුත් අල්ලන් මන් බැනගෙන බැනගෙන ගියා... එයාගෙන් කාර් එකේ කී එකත් අරන් ගිහින් කාර් එකේ පිටිපස්සේන් වාඩි වුනා.. තාමත් කේන්තිය නැති වුනේ නෑ මගේ.. ඇය් මේ මිනිස්සු හැමෝම මානසික ලෙඩක් කිව්වම පිස්සු කියලා හිතන්නේ.... ඒක පුන්චිම පුන්චි ලෙඩක් විතරයි.. ඇය් එයා එහෙම හිතන්නේ.... වෙන කවුරුහරි ඔය කතාව කිව්වනම් මන් ඒ මිනිහගේ ඔලුව පලනවා.. එයාම උනත් එයා ගැන එහෙම කියන එක දරාගන්න අමාරුයි මට...

නිතිනු අය්යත් කාර් එකට ඇවිත් මාව ලගට ගන්න හැදුවට මං ඒකට ඉඩ දුන්නේ නෑ..

"චූටි මැනික මට සමාවෙන්න... මං ආය එහෙම මෝඩ කතා කියන්නෑ.. ප්ලීස් මට සමාව දෙන්නකෝ.. ප්‍රොමිස් වෙනවා ආය එහෙම කියන්නේ නෑ කියලා.... පිලීස් බබා.. තරහ වෙන්න එපා මාත් එක්ක.. ලගට එන්නකෝ.. මට කිස් කරන්න ඕනෙ ඔයාව.. ප්ලීස් "

එයා මොනා කිව්වත් මං බැලුවෙවත් නෑ... මගේ

හිතුවක්කාර හිත කිව්වෙම එයාට දැන්මම සමාව දෙන්න එපා කියලා.... එයාගේ වචන එක්ක හිත උනු වෙන්නේ නැතුව නෙවෙයි.... ඒත් මං එයත් එක්ක තරහ වුනාම ඒක මතක තියෙනකම් ආය මෝඩ කතා කියන එකක් නෑ... ඒ නිසාම මං අනික් පැත්ත බලාගෙනම හිටියා...

මට කතා කරලා කරලා බැරිම තැන එයා ඉස්සරහට ගිහින් කාර් එක ස්ටාට් කරගෙන ගිහින් නතර කරේ තට්ටු ගානක් උස බිල්ඩින් එකක් ලග.. එතන ඉදලා අයියා කාර් එකට එද්දි තමය් මන් තේරුම් ගත්තේ ඒක නිතිනු අයියගේ කම්පැනි බිල්ඩින් එක කියලා.... ඇත්තටම බය හිතුනා මට.. කම්පැනි බිල්ඩින් එක විතරක් මෙච්චර ලොකුයි නම් එයාට සල්ලි කොච්චර ඇද්ද... එයා අහස නම් මං පොලොවේ තියෙන වැලි කැටයක් වගේ... ඒත් එහෙමය් කියලා මට නිතිනු අයියව අතාරින්නත් බෑ... කලකිරුනු හිතත් එක්ක මං පිටිස්සට බරවෙලා ඇස් පියාගත්තා...

"මොකෝ උබ නිකන් මිනිහා මැරිච්ච ගෑනි වගේ මූන එල්ලගෙන.."

අයියා නිතිනු අයියගෙන් අහන්නේ..

"ආරු තරහා වෙලා බන්.. "

"හම්මටසිරි පවුල් ප්‍රශ්න... මට නම් ඕවට මැදිහත් වෙන්න බෑ... උබලම විසදගනින්.. මට ඩ්‍රය්වින් ශීට් එක දීලා පිටිපස්සට ගිහින් යාලු කරගනිම්... "

අයියා නිතිනු අයියට කියනවා මං අහන් හිටියේ ඇස් පියාගෙන.. මට දැනුනා නිතිනු අයියා ඇවිත් මගේ ලගින්ම වාඩි වුනා.. ඇගේ ඇලවිලා වගේ... අත අල්ලන්න ගියත් අත ගසල දැම්මා..... තාමත් ඇස් ඇරලා බැලුවෙ නෑ මං..

ගෙදරට ලං වෙද්දී නින්ද ගිහින් තිබ්ලා ඇහැරුනා... හිටියෙ නම් නිතිනු අය්යගෙ උරහිසට ඔලුව තියන්.. මන් එයා දිහා බලලා ඔරවලා ගේට් එක ලගින්ම බැහැලා ගේට් එකත් ඇරන් ඇතුලට ගියා...හැබැය් චොක්ලට් එක ගන්න නම් අමතක කරේ නෑ...

නිතිනු අය්යව මග ඇර ඇර කාමරේට වෙලා ඉදලා කුස්සියට අවේ උයන්න හිතාගෙන... චොක්ලට් එකෙනුත් බාගයක් අරන් ආවා අය්යට දෙන්න.. අය්යව පිටිපස්සෙන් බදාගෙන එයාට චොක්ලට් එක දුන්නා....

"මොකෝ නිතිනු අයියා එක්ක තරහ වුනේ... "

චොක්ලට් කෑල්ලක් කන ගමන් අයියා ඇහුවේ....

"එයා මෝඩ කතා කියනවා.. ඒකය්.."

"තරහ වුනාට කමක් නෑ සුදූ.. ඒත් ඉක්මනට යාලු වෙන්න... එයා අපි වගේ නෙවෙයි.... පොඩි දෙයක් පවා බරපතල විදිහට හිතනවා... ඌ ආදරේ කරන්නේ පිස්සුවෙන් වගේ... ඉස්සරත් සනුදි පොඩි දේකට තරහ

වුනත් අත කපාගන්න හදනවා... ඒ නිසා බලාගෙන.. "

"බය වෙන්න එපා මන් ඉක්මනටම යාලු වෙනවා.. බොරුවට තරහ වුනේ... "

අයියටට එහෙම කිව්වට මං හිටියෙත් හිත යටින් බය වෙලා.. අහසි අක්කා කිව්ව විදිහට තාමත් එයා මෙන්ටලි ස්ටේබල් නෑ...

ටික වෙලාවකින් නිතිනු අයියා කුස්සියට ආපු නිසා මගේ බය අඩු වුනා.. ඇස් මානෙත් ඉන්න නිසා ප්‍රශ්නයක් නෑ... ෆ්‍රිජ් එක ලග බිත්තියට හේත්තු වෙලා මන් දිහාම බලන් ඉන්නවා... මන් ෆ්‍රිජ් එක ලගට යද්දි ෆ්‍රිජ් එක ඇරලා දෙනවා... සින්ක් එක ලගට යන්න යද්දි එතන්ට දුවන් ගිහින් ඒකත් ඇරලා දෙනවා... ලූනු ගෙඩියක් අරන් ඒක සුද්ද කරන්නත් හැදුවා... ආදරේ හිතෙනවා එයාගේ වැඩ වලට.. අය්යා හිටියේ නැත්තම් පාඩමක් උගන්න එක පැත්තක තියලා මුලු මූනම කිස් කරනවා මං..

අපි රෑට කෑවට නිතිනු අයියනම් කෑවේ මාව.. මන් දිහා බලාගෙනම කරපිංචා කොලත් කෑවා..... අයියා අතින් කට තද කරන් බඩත් අල්ලන් හිනාවෙනවා... ඒත් එයාට නම් ඒවගේ වගක් නෑ...

පිගන් කෝප්ප ටිකත් හෝදලා කාමරේට ගිහින් එහාට මෙහාට ඇවිද ඇවිද හිටියා අය්යට නින්ද යනකම්.. නැත්තම් කතා කරපු ගමන් නිතිනු අය්යා මාව බදගෙන ඉබින්න ගත්තොත් අය්යා ඉස්සරහ පොලොව පලන් තමය්

යන්න වෙන්නේ... ඊටත් වඩා නිතිනු අයියට මේ ගෙදර තත්පරයක්වත් ඉන්න දෙන එකක් නෑ...

අයියගේ කාමරේ ලයිට් ඕෆ් වෙලත් පැය බාගයක් විතර යනකම් බොහොම අමාරුවෙන් මාව පාලනය කරගත්තා.... ඊටපස්සේ අයියගේ කාමරේට එබිලා බලලා එයා නිදි නිසා නිතිනු අයියගේ කාමරේට ගියා ඉගිලිලා.. ඒත් එයා කාමරේ හිටියේ නෑ... දුක හිතුනාම එයා එලියට වෙලා ඉන්නවා කියලා දන්න නිසාම මං ගියා කුස්සිය දොරෙන් එලියට...

වෙනදා වගේම එයා හිටියා චූටිත් එක්ක සිගරට් එකක් බිබී... ඒ ඇස් වල කඳුලු.. මං එයා ලගට ගිහින් සිගරට් එක විසිකරලා චූටියි එයයි මැදින් වාඩි වුනා.. එයා මන් දිහා බලාගෙනම ඉන්නවා...

"බබා... මං ඔයාව තුරුලු කරගත්තට කමක් නැද්ද... "

එයා අහද්දිම මං අත් දෙක දෙපැත්තට දික් කරා... කඳුලු අතරින් හිනා වෙලා මාව හරහට හිටින විදිහට තුරුල් කරගත්තා... එයා මාව කිස් කරන්න තැවෙද්දිම මං එයාගේ කට අතින් වැහුවා..

"ඇයි මේ... තාමත් කිස් කරන්න දෙන්න බැරිද මට.."

"එපා මාව කිස් කරන්න සිගරට් බීපු තොල් වලින්.. "

"අනේ ප්ලීස් බබා.. මෙච්චර වෙලා මන් හිටියේ බොහොම

අමාරුවෙන් ඔයාව ලගට ගන්නේ නැතුව.. මට ඔයාගේ කම්මුල් දෙක විතරක් කිස් කරන්න දෙන්න"

"දෙන්නම් හැබැයි මට පොරොන්දුවක් වෙන්න ඕනේ.... එකක් නෙවෙයි දෙක තුනක්ම තියනවා... "

"කියන්න මැතික... ඔයා වෙනුවෙන් මට ඕනෙ දෙයක් පොරොන්දු වෙන්න පුලුවන්"

"හරි එහෙනම් මගේ ඔලුවේ අත තියලා පොරොන්දු වෙන්න ආය සිගරට් බොන්නේ නෑ... ආයෙ ඔයාවම පහත් කරලා කතා කරන්නේ නෑ... කිසිම හේතුවක් නිසා ඔයාගේ ජීවිතේට හානියක් වෙන විදිහේ වැඩක් කරන්නේ නෑ කියලා.... "

"මන් පොරොන්දු වෙනවා මැතික මං ආය කවදාවත් සිගරට් බොන්නෙත් නෑ... අද කිව්වා වගේ මෝඩ කතා කියන්නෙත් නෑ... ඔයා මගෙ ගාව ඉන්නකන් ජීවිතේට හානියක් කරගන්නෙත් නෑ... දැන්වත් මට අවසරයද බබා.."

"එහෙම බෑ... අන්තිම එකට ඇය් ඔයා වැඩියෙන් කෑලි දැම්මේ... මං ඔයා ගාව නැති උනත් ඔයාට එහෙම දෙයක් කරන්න බෑ කෝ පොරොන්දු වෙන්න.."

"මට ඒක නම් කරන්න බෑ මැතික... ඔයා නැති ජීවිතයක් මට එපා... ඔයා මං ගාව නැත්තම් තත්පරයක්වත් ජීවත් වෙන්නෑ මං"

"ඔයාට පිස්සුද අය්යේ.. කොච්චර අමාරුවෙන්ද මනුස්ස ජීවිතයක් ලැබෙන්නේ.. ඇය් ඔයා හැමවෙලාවෙම ඒක නැති කරගන්න හදන්නේ.."

"ඇය් ඔයා මගෙන් එහෙම ඉල්ලන්නේ.. ඔයාටත් ඕනෙ මාව දාලා යන්නද... මෙච්චර කල් නැති වෙච්ච දේවල් හොදටම ඇති.... ඔයාවත් නැති කරන් මන් ජීවත් වෙන්නේ නෑ... ජීවිතේ ලැබෙනවටත් වඩා අමාරුයි තනියම ජීවත් වෙන එක... ඔයාට මාව දාලා යන්න ඕනෙ නම් මාව මරලා දාලා යන්න... ඒ නැත්තං මං ජීවත් වෙන්නේ නෑ... "

"මේ අහන්නකෝ මගේ අය්යේ.. මං ඔයාව දාලා යන්නේ නෑ කවදාවත්... ඔයාම යන්න කියනකම් මං කුඩැල්ලෙක් වගේ ඉන්නවා එල්ලිලා.. මං කියන්නේ එහෙම දෙයක් නෙවෙයි.... ජීවිතේ කියන දේ විස්වාස නෑනේ... ඔයාට කලින් මට යන්න උනොත් මොකද කරන්නේ... "

මං එහෙම කියද්දි හිරට මාව බදාගත්තා එයා.. වේගෙන් හුස්ම ඉහල පහලා දානවා... ඒ පපුව වේගෙන් ගැහෙනවා මට දැනෙනවා...

"නෑ එහෙම වෙන්නේ නෑ... ඔයාට එහෙම මාව දාලා යන්න බෑ... ඇය් ඔහොම කතා කියන්නේ... මන් දන්නවා ඔයා මට කලින් යන්නේ නෑ... "

"අයියේ.. රිලැක්ස්... හරි හරි මං කොහෙවත් යන්නෑ..... අනික ඔයාට විශ්වාසය් නේ මට මුකුත් වෙන්නෑ කියලා.... ඉතිං ඇය් ඒ පොරොන්දුව දෙන්න බැරි... ඔයාට විශ්වාස

නැද්ද මං ඔයාව හොදට බලා ගනියි කියලා.... "

මං එයාගෙම වචන එයාට විරුද්දව යෙදුවෙත් කොහොමහරි ඒ පොරොන්දුව ගන්න ඕනෙ නිසා.. මොකද එයා ඉන්න මානසික තත්වෙ එක්ක මගේ අතින් වෙන අත් වැරැද්දක් පවා ලොකු හානියක් බවට පත් වෙන්න පුලුවන් හින්ද...

"මං පොරොන්දු වෙනවා.. "

එයාගෙන් වචනේ එලියට එද්දිම වගේ මං ඒ මුලු මූනම කිස් කරා... කම්මුලත් පොඩ්ඩක් හපලා තමයි අතෑරියේ.... එයා මාව තුරුළු කරගත්තා හරියට මේ ලෝකෙ වටිනම වස්තුව හම්බුනා වගේ... මං ඒ පපුවත් දහසැරයක් විතර කිස් කරා... බැනියමක් වගේ එකක් ඇදන් ඉන්න නිසා ඒ හැඩිදැඩි සිරුර ගොඩක් නිරාවරනය වෙලා තිබ්බෙ...

"මට සමාවෙන්න පැටියෝ... හවස කිව්ව මෝඩ කතා වලට.. මං පොඩි කාලේ ඉදන්ම ඇහුනේ ඒ වගේ වචන මට.. පිස්සා, පච්කාරයා, බයගුල්ලා ඔය වගේ නම් මගේ කලින් ගර්ල් ෆ්‍රෙන්ඩ් පවා කිව්වා.... ඔයා ඇරෙන්න කවුරුත් ආදරෙන් කතා කරලා නෑ... ඉතින් ඒ වචන සාමාන්‍යයි මට.. "

පපුවමම ඇවිලලා ගියා ඒ වචන වලට.. බොරුවට හරි එයත් එක්ක තරහ වෙච්ච එක ගැන පසුතැවෙනවා මං...

"ආය කවුරුත් ඔයාට එහෙම කියන එකක් නෑ...

කිව්වොත් මං ඒ මනුස්සයගේ දත් ඇන්ද ගලවලා අතට දෙනවා බල බල ඉන්න... මෙච්චර පිටි ඇගක් තියන කොල්ලෙක් මට ඉන්නවනේ... බය නැතුව වැඩේ කරනහැකි.. අනිත් එක මං ගමේ හිටපු චන්ඩි කෙල්ලෙක්... කොල්ලොත් එක්කත් මං වලි දන් තියනවා... "

එයාට හිනා මත් කියන ඒවට.. ඇත්තටම එයාව හිනාගස්සන්න ඕනෙ කමටම තමයි මං ඒවා කිව්වේ...

"ආදරෙයි මගේ මැනිකට... "

"මාත් ආදරෙයි මගේ තිනූ බබාට"

එයාගේ ඇස් තරු දෙකක් වගේ දිලිසෙන්න ගත්ත ඒක කිව්වම... තිනූ බබා කියපු නිසා.. ඇස් මගේ මූන පුරාම යවලා නතර වුනේ මගේ දෙතොල් පෙති ලග.. මහපට ඇගිල්ලෙන් තොල පිරිමද්දි මං හිටියේ රේස් දුවන හදවත නවත්තගන්න බැරුව.. ඒ මූන ළං ළංව පෙනෙද්දි හදවත වේගෙ වැඩි කරනවා.. ඒ දෙතොල් පෙති මගේ දෙතොල් වල ගෑවෙද්දි ඇස් පියා වුනා මගේ.. තරු පිරිච්ච අහස යට හද එලියේ කිම්දෙන ගමන් මට ලැබුනා මගේ පලවෙනි දෙතොල් හාදුව... ඒ දෙතොල් මගේ දෙතොල් මත රටා මවද්දි මට ඕනෙ වුනේ නෑ වෙලාව ගැන අවදානය යොමු කරන්න... මං හිටියේ එයත් එක්ක වෙන ලෝකෙක.. ටික වෙලාවකින් එයා මගෙන් මිදුනේ මට වගේම එයාටත් හති නිසා වෙන්න ඇති....

තවත් වතාවක් එයා මගේ තොල් වලට බර වෙන්න

හදද්දිම අකුනක් වැදුනා වගේ කෙලින් වෙලා කාමරේ ඇතුලටම ඇවිත් දෙර වහගත්තා... තාමත් හදවත රේස් දුවලා ඉවර නෑ... කන්නාඩියෙන් පේන මගේ රූපෙ දැක්කාම ලැජ්ජ හිතුනා මට.. තොල් දෙක රෝස පාට වෙලා... මැවී මැවී පේනවා ඒ මොහොත.. මගේ පලවෙනි ආදරේ පලවෙනි කිස් එක..

## 24 කොටස

එක්ස්සෑම් ලග නිසා මං පාඩම් කරන්න පටන් ගත්තා.. ඒත් පහුගිය ටිකේ අවදානයෙන් හිටපු නැති නිසා කිසිම දෙයක් තේරෙන්නේ නෑ... අයියාගෙන් අහගන්න කියලා මං එයාගේ කාමරේට ආවේ.. ඒත් එයා වැඩක් වගේ...

"අයියේ.. ලොකු වැඩක්ද.."

මං ඇහුවේ කමර්ශල් ක්‍රෙඩිට් ඇඩ් එකේ පොඩි ගෑනු ලමයා වගේ.. අයියට නම් ඒක ගානක් ගියේ නෑ..

"ඔව් සුදූ.."

"මොකක්ද.."

"මේල්ස් වගයක් චෙක් කරනවා.. ඇයි.."

මේල්ස් ගැන කියන්න ඒ ඇඩ් එකේ වගේ එකක් හොයාගන්න බැරිවෙච්ච නිසා ඒක අතෑරලා දැම්මා..

"මේ ප්‍රශ්න වගයක් තියනවා ඒක අහගන්න.."

"අදම ඕනෙද.."

"ඔව්.. හෙට එක්සෑම්.. මේ වගේ ප්‍රශ්න වලට උත්තර ගන්න තේරෙන්නෑ... මැනේජ්මන්ට් වල ඇයි අනේ මැත්ස් තියෙන්නේ.. "

"මට අද නම් බැරිවෙයි සුදූ මේ ටික ඉවරවෙද්දි 12 වත් වෙයි.."

"මොකක්ද අනේ ගෙදර ඇවිල්ලත් වැඩ.. අර මෝඩයගේ බෙල්ලෙන් අල්ලලා මුල්ලෙන් තියන්න ඕනේ.. වැඩකරන මිනිස්සුන්ට ගෙදර ඇවිත්වත් ඉන්න නොදෙනවට.."

"එහෙම තමයි සුදූ ජොබ් එකක් කරද්දි.. බෙල්ලෙන් අල්ලලා මුල්ලෙන් තියන වෙලේ ඒකගෙන් ගිහින් ඔය ටික අහගන්නවා.."

"හෑ... එයාට මේවා පුලුවන්ද "

"අනේ ඇත්තමයි ගහන්න හිතෙනවා බෙල්ල ගැලවෙන්න.. මහලොකුවට ඒකගේ ගර්ල්ෆ්‍රෙන්ඩ් නේද... ඇය් දන්නේ නැද්ද ඌට කලම්බු යුනිවසිටි එකේ ෆස්ට් ක්ලාස් මැනේජ්මන්ට් ඩිග්‍රියක් තියනවා කියලා.. ඌ NC එකේ

චෙයාර්මන් අනික CEO ඒකාට ඕවා කජු කනවා වගේ ඇති.. ගිහින් අහගන්නවා මට වද නොදී.."

අයියටත් ඇද කරලා මං කාමරෙන් එළියට ආවා.. ඇත්තමයි මට නිතිනු අයිය ගැන අමතක වෙච්ච හැටි.. එයා ලග ඉද්දි මූන දිහා කන්න වගේ බලන් ඉන්නවා ඇරෙන්න මෙලොව දෙයක් මට මතක් වෙන්නේ නෑනේ.... අඩුම ගානේ එයාගේ කම්පැනි එකේ නම Nc කියලා දැනගත්තෙත් අද.. අනික CEO ත් එයා කියලා... ලොකු ආඩම්බරයක් වගේම බයකුත් දැනුනා මට... මොකද දවසින් දවස අපි දෙන්නගේ නොගැලපීම් වැඩිවෙනවා...

කල්පනා කර කර නිතිනු අයියගේ කාමරේ ලගට ආවා... කතා කරන්නේ නැතුව ආයෙත් එයාගේ කාමරේට යන්නෑ කියලා හිතාගත්තට ඒක මතක් උනේ කාමරේ ඇතුලට ආවට පස්සේ.. ඇදේ හාන්සි වෙලා එයා ඉන්නේ ෆෝන් එකෙන් මොනාද බල බල... හීමීට අඩි තිය තිය මං ගියේ තනියම හිනාවෙවී බලන්නේ මොනාද බලන්න... කෙල්ලෙක් ගේ ෆොටෝ එකක් දැක්ක නිසා ෆෝන් එක ඇදලා ගත්තා මන් ඒ කවුද බලන්න... එහෙම වෙන කෙල්ලන්ව බලන්න දෙන්න පුලුවන් ද

ඒත් ඒකේ හිටියෙනන් මං ම තමයි... පලවෙනි දවසේ බීච් ගියපු වෙලාවේ එයා ෆොටෝ අරන්... මගේ ෆොටෝ ගොඩක් එයා ලග තිබ්බා... මං ගාවවත් නැතුව ඇති එච්චර... සමහර ඒවා කවදා කොතනදි ගැහපු ඒවද කියලා හොයාගන්නවත් බෑ... ෆොටෝ වලින් බාගයක් බැලුවා මං ලැජ්ජාවෙන් හිනාවෙවී... ඒවා හරිම ලස්සනයි.. ලස්සන

වෙන්නත් එපැය් අය්ෆෝන් එකකින් ගැහුවාම.. මන් හිතන්නේ ලෙවන් එකෙන් උඩ..

ෆෝන් එක එයාට දික් කරද්දි එයා ඉන්නවා බෙල්ලත් නවන් මන් දිහා බලාගෙන.. ෆෝන් එකත් එක්කම අතෙන් අල්ලලා එයා මාව ලගින් වාඩිකරවගත්තා... වෝල් පේපර් එකට දලා තිබ්බෙත් අපි දෙන්නගේ ෆොටෝ එකක් කියලා මන් දැක්කේ එයා ෆෝන් එක පැත්තකින් තියද්දි... මගේ පිට පපුවට හේත්තු කරගෙන එයා උරහිස උඩින් ඔලුව තියාගත්තේ එකපාරක් උරහිස උඩින් හාදුවක් තියලා...

"දැක්කද මගේ කෙල්ලව..."

"ම්ම්ම්..."

"මට නම් කොච්චර බැලුවත් ඇතිවෙන්නේ නෑ... මගේ බෝනික්කි... සුරංගනාවියක් එයා... දැක්කත් ඇති ප්‍රශ්න ඔක්කොම අමතක වෙලා යනවා... හැමවෙලාවෙම තුරුල් කරන් ඉන්නමය් හිතෙන්නේ.. "

"ම්ම්ම්ම්"

"බබා...."

"ම්ම්ම්ම්"

"මොකද මගේ පැටියා ම්ම්ම් ම්ම්ම් ගාන්නේ.."

"ලැජ්ජයි නේ මට.."

"ඈ ඒ මොකද ඒ..."

"දන්නේ නෑ ඉතිම්... මට ලැජ්ජයි."

"කියන්න බලන්න මගේ ලැජ්ජකාරි පොතකුත් අරන් මං ගාවට ආවේ ඇය් කියලා.... ආපු ගමන් කාමරේ ඇතුලතේ.... මං පාලුවෙන් හිටියේ... අයියා ඉන්න නිසා කාමරේට එන්නත් බෑනේ... "

"පාඩම් කරනවා මන්.. හෙට එක්සෑම්.. "

"අනේ ලමයෝ එක්සෑම් එකට කලින් දවසෙද පාඩම් කරන්නේ... කෝ එහෙනම් ගිහින් පාඩම් කරන්න... හුරතල් වෙවී ඉන්න වෙලා නෑ... "

"මං ගානක් අහගන්න ආවේ... හුරතල් වෙන්න නෙවෙයි.... "

"ගානක් ??? කෝ දෙන්න බලන්න..... "

"මෙන්න මෙතනින් පස්සේ මෙලෝ දෙයක් තේරෙන්නෑ මට..."

"ආ... මේකද.. ඕක හරි ලේසියි පැටියො ඉන්න කියලා දෙන්න..."

එයා ගාන කියලා දෙනකම් මින් හිටියේ එයා දිහා බලන්... කතාකරද්දිත් සමහර වෙලාවට එයාගේ කම්මුල් වල ගැහෙනව.. මං හරි ආසයි එයාගේ ඩිම්පල්ස් වලට... ඔක්කොම අමතක කරලා මං එයාගේ ඩිම්පල් හැදෙන තැනින් ඇඟිල්ල තිබ්බා තනියම හිනාවෙවී... එයා බයවෙලා වගේ මන් දිහා බැලුවා... මං එයාපැත්තට හැරිලා එයාගේ කම්මුල තත්පර 10 ක් විතර හපාගෙන ඉදලා අතෑරියා.. ඒත් මදි වගේ නිසා කම්මුල් දෙක අත් දෙකෙන් මිරිකලා දෙපැත්තට හෙලෙව්වා.. එතකොට එයා හරි කියුට්.. එයාගේ කලුවෙච්ච තොල් දෙක විතරයි ඒ කඩවසම් පෙනුමට බාදෘ වුනේ... ඒත් එක්කම මතක් උනේ කලින් දවසක වීඩියෝ එකක් බලලා මං ලෑස්ති කරගත්ත බඩු ටික... දඩබඩ ගාලා ඇදෙන් පැනලා මං දිව්වා මගේ කාමරේ පැත්තට...

"බබා... මේ ගාන.."

නිතිනු අය්යා කෑ ගැහුවත් ගනන් ගන්නේ නැතුව මං කාමරේට ආවා... කලින් දවසක අරගත්ත මී පැනි කුප්පියයි ,ඊ විටමින් කාඩ් එකයි, ටිශූ එකකුයි අරන් කුස්සියට ඇවිත් දීසියකට සීනි ටිකක් අරන් මී පැනි ටිකක් දාලා කවලම් කරා... ඔක්කොම ටිකත් අරන් මං ආවා එයාගේ කාමරේට... කටත් ඇරන් බලන් ඉන්නවා එයා...

"ඔය මොනාද බබා.. "

"ඉන්නකෝ බලාගෙන.."

දීසිය පැත්තකින් තියලා එයාගේ කකුල් දෙක ඇඳෙන් බිමට දැම්මා... ඊට පස්සේ කකුල් දෙක උඩින් වාඩිවුනා දීසියත් අතට ගන්න ගමන්.. ඇඳෙන් ඉදගත්තා නම් මට උඩ බලාගෙන ඉදලා බෙල්ලෙ අමාරුව හැදෙනව.. ඒකයි කකුල් දෙක උඩින් වාඩි වුනා.. දැන් තියන්නේ මිශ්‍රනය හොඳින් තොල් වල ආලේප කොට ස්ක්‍රබ් කිරීමය... තොල් දෙකේ සීනියි මී පැනියි ගාලා හොදට ස්ක්‍රබ් කරා... එයා මගේ ඇස් දිහාම බලන් ඉන්නවා... මං එයාගේ තොල් අල්ලද්දි එයා බෙඩ් ශීට් එක අත් දෙකෙන් ගුලිකරන් ඉන්නේ කිචි නිසා කියලා මං හිතුවේ... ඒත් ඒක වැරදියි කියලා තේරුනේ මං පීරිසිය තියලා ටිශූ එක අතට ගන්න තප්පරේ..

එයා මාව ඇදට පෙරලගත්තා ඇදත් මාත් අතරින් අත් තියාගෙන මාව තදට තුරුලු කරගන්න ගමන්.. ඒ පැනි රස තොල් වලින් මගේ තොල් ආක්‍රමණය කරන්න එයාට තත්පරයක්වත් ගියේ නෑ.. සීනි මී පැනි වලින් රස වෙච්ච දෙතොල් හාදුවක් වින්ද අපි දෙන්නා විනාඩි ගානක්ම.. සමහරවිට මගේ තොල් දෙක ස්ක්‍රබ් වෙන්න ඇති එයාගේ තොල්වලටත් වඩා හොදට..

එයා මගේ අත අරන් දබරැල්ලේ තිබ්බ පැනි ටික සූප්පු කරලා අල්ලට හාදුවක් තිබ්බා... ආයෙත් තොල් වලින් පුංචි හාදුවක් තියල එයා හිනාවෙනවා... දැන්නම් ඒ තොල් වල කිසිම දෙයක් නෑ... නැගිට්න්න හදද්දිම වගේ මං එයාගේ බෙල්ල වටේ අත් දෙක දාලා නතර කරගත්තා....

"දැන් නැගිටින්න මැතික... හෙට එක්සෑම් තේ පාඩම් කරන්නේ නැතුව ලියන්නේ මොනාද මිමි.. කෝ නැගිටින්න.."

"අනේ තව චුට්ටක් ඉන්නකෝ... "

"ගුටි දෙන්නේ මං.. කෝ නැගිටින්න.."

එයා නැගිටලා මාව උස්සලා වාඩි කෙරෙව්වා... මං මූන දෙක කරගෙන ඊ විටමින් එකත් අරන් කටුවකින් ඇනලා ඒකෙන් පොඩ්ඩක් ගෑවා එයාගේ තොල් වල.. ඒක ඉක්මනට කරලා දැම්මේ ආපහු අරම දෙයක් වෙයි කියලා බයට..

"මේක හැමදම රෑට ගාන්න.. උදේට මං ලිප් බාම් එකක් දෙන්නම් හැමදම උදේට ඒක ගාගෙන යන්න එතකොට ආපහු තොල් රෝස පාට වෙයි"

"ඕකේ මැම්"

මං ආයෙත් එයාට ඔරවලා පොත අතට ගත්තා... එයාගේ තරවටු කිරීම් නිසා මං ආයෙත් විකාර වැඩ කරේ නෑ... හැබැයි පාන්දර 3 වෙනකම් එයා පාඩම් කෙරෙව්වා... සේරම දේවල් කටපාඩම් වෙනකම් ප්‍රශ්න දුන්නා කරන්න... ඒ ලෙවල් වලටවත් මං එච්චර වෙලා පාඩම් කරලා නෑ... එයා දුන්න වැඩ කරේ නැත්තම් දවස් තුනකට එයා යනවා

කිව්වා එයාගේ ගෙදර... ඒ බයටම මට ඔක්කොම ටික කරන්න වුනා..

උදේ ඇහැරගත්තෙත් බොහොම අමාරුවෙන්.. අයියා මූනෙ වතුරත් ගෑවා.... නිතිනු අයියා නම් කිසි ප්‍රශ්නයක් නැතුව උදේම ඇහැරලා තිබ්බා... ඩෙනිමට අතට අහුවෙච්ච ටී ශර්ට් එකක් දාගෙන වැනී වැනී ගිහින් හිටගෙන හිටියා එලියෙන් අය්යා එනකම්.. එක්සෑම් එකට යනකොට ගෙදර අය විශ් කරලා උම්මා එකක් දෙන්න ඕනේ ඒක එකවසරේ වාර විභාගේ ඉදලා ඒක මගේ නීතියක්... උම්මා එක ගන්න තමයි මං අයියා එනකම් බලන් හිටියේ... හොදවෙලාවට අය්යට මතක තිබ්බා... නැත්තම් මං මෙතන යකා නටනවා..

"හොදට ලියන්න.. රිපිට් උනොත් එහෙම නිතිනු අයියව ගෙදර යවනවා... "

නලලට හාදුවක් දීලා අයියා කියන්නේ හිනාවෙවී... මං තොල නොපිටට හරවලා බිම බලාගත්තා..

"මචං කාර් එක පාරට ගනින්කෝ මං ලැප් එක අරන් එන්නම්..."

අයියා ආයෙත් යතුර අරන් ගියේ ලැප් එක අමතක වෙච්ච නිසා.. ඒ අතරේ මං පාත්තයෙක් වගේ ඇවිදන් නිතිනු අය්යා ලගට ආවේ ගුඩ් ලක් කිස් එක ගන්න හිතන්... ලගට ඇවිත් දත් තිස් දෙකම පෙන්නලා විරිත්තුවාම එයා මාව තේරුම් ගත්තා.. කම්මුල් දෙකට දදු දෙකක් තියලා

තලලෙන් දිගම දිග හාදුවක් තිබ්බා එයා...

"හොදට කල්පනා කරලා ලියන්න.. දෙපාරක් තුන්පාරක් කියවන්න තේරෙන්නැති වචන එතකොට ප්‍රශ්නේ තේරුම් ගන්න පුලුවන් බබාට"

ඔලුව අතගාන ගමන් නිතුනු අයියා කියන්නේ එයා අඳුරගත්ත මගේ දුර්වල තැන ගැන... ඔක්කොම ඉන්ග්ලිශ් වලින් තියන නිසා සමහර ප්‍රශ්න තේරුම් ගන්න අමාරුයි මට.. ගොඩක් දුරට සිංහලෙන් ඇහුවොත් ආන්ස් එක දන්නවා උනත් ඉන්ග්ලිශ් වලින් ඇහුවාම මට බෑ...

———————————————————

එක්සෑම් එක ඉවරවෙලා ටුක් එකක් ගන්න හිතාගෙන මං ගේට් එකෙන් එලියට ආවේ... නිතිනු අයියා බලෙන් පාඩම් කරවපු නිසා පේපර් එක ලේසියි.. තුන හතරක් ඇරෙන්න අනික් සේරම එක හුස්මට කරගෙන ගියා... ඒ තුන හතර බැරි වුනෙත් තේරුම් ගන්න අමාරු වෙච්ච නිසා.. එක ප්‍රශ්නයක් නම් ශනුගෙන් කොප්ප ගහගන්න පුලුවන් වුනා.. අයියටයි නිතිනු අයියටයි අද ඉම්පෝටන් මීටින් එකක් තියන නිසා එන්න විදිහක් නැහැලු.. ශනු මලගෙදරක යන නිසා එයාලගේ ගෙදරත් යන්න විදිහක් නෑ... ඒ නිසා කම්පැනි එක ලගට එන්න කියලා ඒ දෙන්නා කියලා ගියේ... ඔක්කොටම වඩා අද මට අපහසු දවසක්... මාසික දීමනාව දීමට සැරසෙන මූලික ලක්ශන උදේ පෙන්නුම් කරත් අද එක්සෑම් නිසාමයි ආවේ... නැත්තම් මන් ඒ දවස් වලට කොහෙවත් යන්නේ නෑ... කලන්තේ හැදෙන

තරම් අමාරුවෙනව මට..

ශනු මාව ට්‍රුක් එකකටත් දාලා තමයි ගියේ... NC එක ගාවින් බහිද්දි මාව ගැහෙනවා... නිතිනු අය්යා හරි ඇවිත් හිටියේ නැත්තම් මත් මොනාද කරන්නේ... අය්යා මීටින් එකට එලියට යනවා කියලා කිව්වේ... ඒ නිසා නිතිනු අය්යාම එනකම් ඉන්න ඕනෙ.. ට්‍රුක් එකෙන් බැහැලා බෑග් එක පටිය අබර අබර හිටියේ කරන්න දෙයක් නැති නිසා.. අසනීප ගතියයි ඊයෙ රෑ නිදි මරපු නිසයි මං හිටියේ හෙම්බත් වෙලා...

විනාඩි පහක් විතර ඉස්සරහ හිටගෙන හිටියා දෙන්නගෙන් එක්කෙනෙක් එනකම්.. ඒත් ආවේ නෑ... සිකියුරිටිලා දෙන්නා මං දිහා අමුතු විදිහට බලන නිසා හිතට හයිය අරන් ඇතුලට ආවා... හිතට හයිය තිබ්බට මොකද ඇගට නම් පන කියන නාමයක් නෑ ඒ මදිවට බඩ රිදෙනවා.... කකුලුත් පන නෑ වගේ... කෑ ගහලා අඩන්න හිතෙන තත්වෙක මං හිටියේ...

ඇතුලට ආවම මට දැනුනේ වෙනම ලෝකෙකට ආවා වගේ... කවදාවත් එහෙම තැනකට ඇවිත් නෑ මං.. තට්ටු ගාන්ක් උස බිල්ඩින් එකක මං කොහෙන් එයාව හොයන්නද.. පුදුම අසරන කමක් දැනුනේ මට.. ෆිල්ම් වල වගේ රිසෙප්ශන් එකෙන් ඇහුවත් හරි කියලා හිතුනු නිසා මං එතන්ට ගියා... ලස්සන ගර්ලා දෙන්නෙක් හිනාවෙලා හිටපු නිසා මගේ බය ටිකක් අඩු වුනා..

"එක්ස්කියුස් මී.."

"යෙස් "

"මට නිතිනු අය්... සොරි... මිස්ටර් නිතිනු හම්බෙන්න පුලුවන්ද.. "

වචන ටික බොහොම අමාරුවෙන් ගලපගෙන කිව්වා.... ඔෆිශියල් විදිහට එයාගේ නම කියන එක හොදයි කියලා මට හිතුනා... මොකද අපේ රිලේශන්ශිප් එක ඔෆිස් එකේ අයට දැනගන්න දෙන එක හොද නෑ කියලා මට හිතුනා... ඒ ගර්ල් මගේ උඩ ඉදලා පල්ලෙහාට අමුතු විදිහට බැලුවා... සමහරවිට මන් කැශුවල් ඉන්න නිසා වෙන්නැති...

"ම්ම් එපොය්මන්ට් එකක් තියනවද මිස්.."

"එපොය්මන්ට් එකක් නම් නෑ... ඒත්...."

"ආම් සොරි එපොය්මන්ට් එකක් නැත්තම් හම්බවෙන්න බෑ... "

මං කියන්න ගියපු දේ කියන්න කලින් එයා එහෙම කිව්වේ ටිකක් රළු ස්වරයෙන්

"ඒත් මං එයාව දන්නවා... ප්ලීස් මට එයා ඉන්න ෆ්ලෝ එක කියන්න.."

"ආම් රියලි සොරි බට් අදූරනවා කිව්ව පලියට යන්න දෙන්න මිස්ටර් නිතිනු මෙතන ක්ලීනින් කරන කෙනෙක්

sinhalaebooks.com

නෙවෙයි නේ.. වෙයාමන්ට හම්බෙන්න නම් එපොය්මන්ට් එකක් ඕනේ....
ඒත් මං හිතන්නෑ ඔයාට නම් කවදාවත් එපොයිමන්ට් එකක් හම්බෙයි කියලා.. "

කටත් ඇද කරන් එයා කිව්වේ මගේ ඇඳුම දිහා බලන්.. මං බිම බලාගෙන ගිහිම් එතන තිබ්බ සෙට්යෙන් වාඩි වෙලා 20 වෙනි වතාවටත් නිතිනු අයියට කෝල් එකක් ගත්තා... ඒත් ෆෝන් එක ඕෆ්.. කදුලු හංගගත්තේ බොහොම අමාරුවෙන් මං.. ආයෙත් වතාවක් නැගිටලා අර ගර්ලා දෙන්නා ලගට ගියා...

"මිස්.. ඔයාට එක සැරයක් කිව්වහම තේරෙන්නැද්ද... එහෙම ඕනෙ ඕනෙ අයට ඇතුලට යන්න දෙන්න බෑ... කරුනාකරලා අපිට වද නොදී යන්න... "

"මං එයාව අදුනනවා එයා මට මෙතන්ට එන්න කිව්වා.... එයා එන්නම් කියලා.. ආවේ නෑ... ප්ලීස් එයාගේ ඔෆිස් ලයින් එකට කෝල් කරලා කියන්න ආරු ඇවිත් ඉන්නවා කියලා.... "

"මං හිතන්නේ ඔයාව කාව හරි රවට්ටලා.. අපේ සර්ට ගෑනු ලමයින්ව පේන්න බෑ... අඩුම ඇහැක් ඇරලවත් බලන්නෑ ගර්ල්ස්ලා දිහා... ඒ නිසා ප්ලීස් මෙතනින් යන්න.... වදනොදී.... "

රස්සව නිසා සුහදශීලි වචන වලින් කතා කරත් ඒ ඇස් කේන්තියෙන් දැවෙනවා කියලා මට තේරුනා... පරාජය

බාරගෙන ආයෙත් ඇවිත් වාඩි වුනා.. දඩිය බේරෙනවා ඇගේ.. ශක්තියක් නැති නිසා.. වමනේ යන්නත් එනවා... වටේ පිටේ සද්ද ඇහෙන්නෙත් හිමීට...
මං හිටියේ දරාගන්න පුලුවන් උපරිමෙන් මගේ ශරීරය දරාගෙන... ඉක්මනට ෆෝන් එක අරන් නිතිනු අයියට කෝල් කරේ කලන්තේ දාලා වැටෙන්න කලින්.. ඒත් තාමත් ෆෝන් එක ඕෆ්.. අයියටත් කෝල් දෙකක් ගත්තා එයාට කියලවත් රිසෙප්ෂන් එකේ අයට කතා කරවන්න.. ඒත් එයා ආන්ස කරෙත් නෑ... රිසෙප්ෂනිස් ලා දෙන්නා මන් දිහා බලාගෙන මොනාදෝ කියනවා පේනවා මට.. ඕනෙ දෙයක් වෙච්චාවේ කියලා මං නැගිට්ටේ ඇත්තම කියනවා කියලා හිතාගෙන...

"කොච්චර වෙලා ඉදගෙන හිටියත් වැඩක් නෑ... සර්ව හම්බෙන්න බෑ... ඒ නිසා යන්න... නැත්තම් අපිට සිකියුරිට්ලා ගෙන්නන්න වෙයි.. පෙනුමෙන් පොඩි ලමයෙක් වගේ පේන නිසා තමයි මෙච්චර වෙලා ඉවසුවේ.."

"අනේ ප්ලීස් නිතිනු අය්යට කතා කරලා කියන්නකෝ මං ආව කියලා.... මං මං අමාරුවෙන් ඉන්නේ... මට සනීප නෑ... ප්ලීස්... "

"සනීප නැත්තම් හොස්පිට්ල් යන්න අපෙ සර් ඩොක්ටර් කෙනෙක් නෙවෙයි නේ"

"මං මං එයාගේ ගර්ල්ෆ්‍රෙන්ඩ්.. එයා දන්නවනම් ඔයාලා මාව මෙහෙම තියන් ඉන්නවා කියලා.... බනී ඔයාලට එයා..."

ඇත්තම කියන්න හිතුවේ එතකොටවත් යන්න දෙයි කියලා හිතාගෙන... ඒත් ඒ දෙන්නා හය්යෙන් හිනාවුනා මට..

"පෙනුමෙන් පොඩියට හිටියට කපටි අම්මන්ඩි කෙනෙක් නේ බලන් යද්දි.. පොඩ්ඩක් ලස්සන උනා කියලා හිතන්න එපා අපේ බොස්ව අල්ලගන්න.. තමුන්ට සිංහල තේරෙන්නේ නැතේ... ඉන්නවකෝ"

එක්කෙනෙක් හය්යෙන් මට බැන්නේ මන් ගැස්සිලා යද්දී... කඳුලු බේරුනා ඇස් වලින්.. අනික් එක්කෙනා කෝල් එකක් අරන් මොන මොනවදෝ කිව්වා.... ටික වෙලාවකින් එතන්ට ඉස්සරහ හිටපු සිකියුරිටිලා දෙන්නා ආවා...

"මෙන්න මේ පිස්සු ගෑනිව එලියට දානවා... "

එතන හිටපු එක්කෙනෙක් කෑ ගැහුවා... මට එතනින් එලියට යන්න ඕනෙ වුනත් යන්න තරම් පනක් නෑ... ආයෙත් මොකෙක්ටහරි අහුවුනත් කමක් නෑ තනියම ගෙදර යන්න හිතුනා මට... සිකියුරිටිලා දෙන්න දෙපැත්තෙන් මාව අල්ලගත්දිම

"නවත්තනවා ඕක... "

පිටිපස්සෙන් ඇහුනේ නිතිනු අය්යගේ හඩ... හින්දි ෆිල්ම් එකක් හීරෝයින්ව බේරගන්න එන හීරෝ වගේ එයා වෙලාවටම එතන්ට ආවා... දුවගෙන එයා ලගට යන්න ඕනෙ වුනා මට.. ඒත් දුවන්න තියා හිටගෙන ඉන්නවත්

මට බෑ.. එයාව පේන්නෙත් බොද වෙලා... රිසෙප්ශන් එකේ ගර්ලා දෙන්නා එයා ඉස්සරහට දුවන් ගියා...

"සර්.. මේ කෙල්ල සර්ගේ ගර්ල් ෆ්‍රෙන්ඩ් කිය කිය බොරු කියලා මෙතන විකාරයක් නැටුවා.. ඒකයි එළියට දන්න හැදුවේ.... "

ඒත් එක්කම ඔක්කොම කැරකෙනවා වගේ දැනෙද්දි මං ලග තියන බිත්තියක් අල්ලා ගත්තා බොහොම අමාරුවෙන්.. නිතිනු අයියා දුවගෙන ඇවිත් මාව වත්තම් කරගත්තා....

"මැනික... ඇයි මේ... බබාට සනීප නැද්ද... අනේ... කතා කරන්නකෝ.. "

එයාගේ පපුවට ඔලුව හේත්තු කරන් මං ඇස් පියාගත්තා... දැන් නම් ඉවසගන්න බැරි තරම් බඩ රිදෙනවා....

"බ... ඩ... රි..දෙ..න..වා. හා..න්..සි වෙ..න්න. ඕනේ ම..ට.."

"හරි මැනික අපි යමු.. අමාරුයිද පැටියෝ... කතා කරන්නකෝ... බය කරන්න එපා මාව... "

"තමුසෙලාව මං මරලා දානවා"

මට කතා කරන ගමන් එයා අර දෙන්නටද කොහෙද බනිනවා.. තවටිකක් තුරුල් වෙලා මං තදට ඇස් පියාගත්තා... එයා මාව වඩාගන්නවා වගේ දැනුනා ඊට පස්සේ කිසිම දෙයක් මතක නෑ...

# 25 කොටස

දඩු අඩුවකට හිරවෙලා අපහසුවක් දැනෙද්දි මන් හැදුවේ ඇස් අරින්න... ඒත් ඇස් අරින්න අමාරුයි තාමත් ඔළුව රිදෙනවා.... දැනෙන උනුසුමෙන් මං ඉන්නේ එයාගේ තුරුලේ කියන එක මට තේරුනා... නැවතුමක් නැතිව මුලු මූනම කිස් කරනවා එයා... ගොඩක් වෙලා උත්සහ කරලා මං ඇස් ඇරියා....

"මැනික... ඇස් ඇරියද පැටියෝ... මගේ වස්තුව.. බය වුනා මං ගොඩක්... ඇස් පියාගෙන ඉද්දි.. අමාරුයි ද පැටියට.. වතුර ඕනෙද... බඩගිනියි ද.. වොශ් රූම් යන්න ඕනෙද... තාම බඩ රිදෙනවද... කතා කරන්නකෝ වස්තු.. මි ඔහොම ඉන්න එපා මට බය හිතෙනවා... "

අත් දෙකෙන් ම මූන අල්ලන් එයා ආරූඪ වෙලා වගේ කියාගෙන යනවා... එයාගේ ඇස් රතුවෙලා... ඒ ඇස් වලත් තියෙන්නේ ලොකු බයක්... මාව තද කරගෙන ඉන්නේ හරියට කවුරුහරි උස්සන් යයි වගේ... අසාමාන්‍ය බයකින් එයා ඉන්නේ...

"ව.. තු... ර.."

වතුර ඕනේ නැති වුනත් ඉල්ලුවේ එයාව සංසුන් කරන්න හිතාගෙන...

"පොඩ්ඩක් ඉන්න මැනික මං අරන් එන්නම්..."

එයා ඇදෙන් බැස්සා නෙවෙයි පැන්නා වගේ... තිබුන හදිස්සියට කකුලත් වැදුනා ඇදේ... ඒක පොඩ්ඩක් වත් ගනන් නොගෙන එයා කාමරෙන් එලියට ගියා... අපි හිටියේ ලොකුම ලොකු කාමරේක... බ්ලැක් ඇන්ඩ් වයිට් තීම් එකට හදපු කාමරයක්... ටීවි එකක් සෙට් එකක් වගේම ලොකු බ්ලැක් කලර් දොරකුයි ග්ලාස් වලින් වෙන්වෙච්ච බාත් රූම් එකකුයි තිබ්බා... සෙට් එක කලු පාට බිත්තියි ටයිල්සුයි සුදු පාටයි.. ඇදේ කොට්ට කලුපාටයි බෙඩ් ශීට් එක සුදු පාටයි බ්ලැන්කට් එක කලු පාටයි.. තව බිත්තියේ ගහපු ලොකු කන්නාඩියක් ලග කලුපාට ටේබල් එකක් තිබ්බා පර්ෆියුම් අනම් මනම් එක්ක.. ඒකේ උඩ තිබ්බ වාස් එක සුදු පාටයි.. එක පැත්තක බිත්තියක් වැහෙන්නම තිබ්බේ කලු කර්ටන් එකක්...

මාරම ලස්සනක් ඒ රූම් එකේ තිබ්බේ... සමහරවිට එයා මාව අරන් හොටෙල් රූම් එකකටවත් එන්නැති... මගේ අවදානය බිදුනේ එයා එන සද්දෙට වතුර වීදුරුවකුයි හැන්දකුයි අරන් ෆෝන් එකත් කනේ ගහන් එයා ආවා...

"ඕකේ ඩොක්ටර්.. හරි මං කරන්නම්... නෑ තාම නෑ... ඕකේ... තැන්ක් යූ... "

කතා කරපු දේවල් වලින් මට තේරුනා ඩොක්ට කෙනෙක්ට කතාකරන්නේ කියලා.. ඒකෙන් මට වැඩක් නෑනේ... මට තිබ්බ ප්‍රශ්නේ හැන්දක් මොකටද කියලා.... කෝල් එක කට් කරලා කොට්ටයක් පිටට හේත්තුවෙන්න තියලා මාව ඉන්දුවා.. ඊටපස්සේ අර හැන්දට වතුර ටිකක් අරගද්දි මං බලන් හිටියේ කටත් ඇරන්.. වතුර බොන්න බැරි තරම් හෙනයක් නෑ මට.. අනික මේක පොඩි කලන්තයක් නේ...

"ඩොක්ටර් කිව්වා ඉස්සල්ලාම වතුර පොඩ්ඩක් දෙන්න කියලා.... ඒ නිසා මෙහෙම බීලා ඉන්න.."

"ඩොක්ටර්..??"

"බබා සිහිය නැතිවෙච්ච වෙලාවේ මං ඩොක්ටර්ව ගෙන්නුවා... එයා බලලා ගියේ... "

හපොයි මේ පොඩි කලන්තෙට මෙයා ඩොක්ටර්ස්ලත් ගෙන්නලා... හරි ඉතිං එයා දන්නවැයි මට මොකක්ද තිබ්බ අසනීපෙ කියලා.. ඩොක්ටර් කිව්වද දන්නෑ ඒ ගැන.. ලැජ්ජාවේ බෑ...

හැන්දෙන් දෙකයි එයා මට පෙව්වේ.. හරියට ඔපරේශන් කරපු අමාරු ලෙඩෙක්ට වගේ.. ඊටපස්සේ වතුර එක

පැත්තකින් තියලා ආයෙත් හිරට මාව බදාගත්තා..

"සොරි මැනික... මට වෙලාවට ඔයාව ගන්න බැරි වුනා.. ෆෝන් එක තිබ්බේ සකට්ටු ලග... මගේ මැනික බය වුනා නේද... හිතාගන්න බැරි වෙන්නැති මෙතන්ට ආවම මාව හොයාගන්නේ කොහොමද කියලා.... මං සිසීටීවී බැලුවා... බබා පව්.. මං හරි නරකයි නේද බබා.. ඔයාව ඇඩෙව්වා.. අමාරුවෙන් ඔයා එතන අඩද්දි මං සැප පුටුවක වාඩි වෙලා හිටියා... සමාවෙන්න මට.. මේ ඔක්කොම මගේ වැරදි... "

"එහෙම නෑ... ඔයා වැරදි නෑ... දන්නේ නැතේ මං ආවා කියලා ඔයා... ප්ලීස් අඩන්න එපා... ඇය් මේ.."

"මගේ චූටි කෙල්ලට අර ගෑනු දෙන්නා බැන්නා.... අරුන් දෙන්නා එලියට ඇදලා දන්න හැදුවා... මගේ මැනිකව අල්ලන්න හැදුවේ උන්.. උන්ට කොහෙන්ද හය්යක් එහෙම කරන්න.. ගෑනු නෙවෙයි නම් මැරෙන්න ගහනවා මත්... අනිත් උන් දෙන්නටත් යහතින් ඉන්න දෙන්නෑ... උන් දන්නෑ මගේ හැටි.. මංවත් සැරකරන්නේ නැති මගේ කෙල්ලට උන් කොහොමද එහෙම කතාකරන්නේ... පිස්සු ගෑනි කිව්වා මගේ මැනිකට... උන්ට කොහොමද මගේ සුරංගනාවිව එහෙම පෙනුනේ... උන්ට කොහෙන් ආපු හය්යක්ද එහෙම කියන්න.... මේ නිතිනු සෙහංසගේ කෙල්ලට උන් එහෙම

කිව්වේ... අපායක් කරනවා මන් උගේ ජීවිත.. අපායක් කරනවා.. අපායක් කරනවා.. "

නිතිනු අයියා කේන්තියෙන් වෙව්ලනවා එයාගේ ඇස් යකෙක්ගේ වගේ රතු වෙලා බයහිතෙනවා මූන දැක්කමත්... අත මිටිකරගෙන ඉන්නේ... අතේ නහර පිම්බිලා.... ඇත්තටම මං හොඳටම බය වුනා..

"අ ආ අය්යේ.. ඇ ඇය් මේ.. අනේ ම..ට බ.ය.හිතෙ.න.වා"

එයාගේ පපුවට අත තියලා කැඩී කැඩී කතා කරද්දි එයා මං දිහාට හැරුනා... බයවෙලා ඉන්න මාව දැක්කම එයා ක්ශනිකව සාමාන්‍ය තත්වෙට පත් වුනා..

"චූටි මැනික... බය වුනාද මගේ වස්තු.. අයියා ඔයාට සැර නෑනේ බබා.. බබා මගේ පනනේ... සොරි මැනික මාව කන්ට්‍රෝල් නැති වුනා.. කෝ එන්න උම්මා එකක් දෙන්න.. ආදරෙයි මගේ මැනිකට... ආදරෙයි ගොඩක්... ගෙදර අයට ඇරෙන්න කාටවත් රවන්නවත් දෙන්නෑ මං ඔයාට... සතුට විතරය් තියෙන්න ඕනේ ඔයාගාව.. මගේ චූටි පැටියා... "

එක පාරට වෙස් පෙරලුනා වගේ එයා මාව හුරතල් කරනවා.. ඒ තොල් වලට නැවතීමක් නෑ.. මගේ මූන පුරාම දුවනවා.. මාත් සේරම අමතක කරලා එයාගේ පපුවට ගුලි වුනා.. ඊට වඩා සැනසීමක් දැනෙන තැනක් තියනවා නම් ඉතින් අප්පච්චි ගාව විතරයි.. ඇස්

පියවීගෙන එද්දි එයාට කෝල් එකක් ආපු නිසා නින්ද කැඩුනා...

"ගවුමක් බලන්න කියන්න... දනිස්ස ගාවට විතර එකක්.. උඩින් ගොඩක් ඕපන් නැති නෝමල් එකක්.. ඉස්සල්ලාම ෆොටෝ ටිකක් එවන්න..."

........................,,..

"නෝමල් රයිස් ඇන්ඩ් කරි... ෆ්‍රයිඩ් දේවල් එපා... වැඩිය ස්පයිසි නැති හෙල්දි තැනකින් ගන්න.. තව ෆෲට්ස් මොනාහරි.. සදීශට කියන්න අනිත් ඕනෙ දේවල් මතක් කරලා ගන්න කියලා.... "

..................

"ඕකේ.... "

එයා කාත් එක්කදෝ කතා කරලා ෆෝන් එක දිහා බලන් ඉන්න නිසා මන් එයා දිහා බලලා ෆෝන් එක දිහත් බැලුවා... වට්ස්ඇප් එකේ ගවුම් වල ෆොටෝ වගයක් බලනවා.... මං ආයෙත් එයා දිහා බලද්දි ෆෝන් එක කනෙන් තියාගත්තා...

"පින්ක් කලර් දෙකයි... බ්ලූ කලර් එකයි... පීච් කලර් එකයි... මෙරූන් කලර් එකයි ඒ ටික ගන්න... ඔව් ඔක්කොම..."

එහෙම කියලා කෝල් එක කට් කරා... කට් කරලා ආයෙත් මාව තදට තුරුල් කරගත්තා... බඩේ කැක්කුම කොහෙන් ගියාද නෑ... සිද්ධාලේප අසමෝදගම් වගේ...

"මොනාද ඒ ගවුම්... "

"බබාට.."

"මට ??? "

"හ්ම්ම් වොශ් එකක් දගමු.. හොඳටම දඩිය දාලා"

"කවුද ඒ කෝල් කරේ.... "

"මගේ සකට්‍රි..."

"එයා පිරිමි කෙනෙක් නේද... කොහොමද ගෑනු ඇඳුම් තෝරන්නේ..."

"බබා කොහොමද දන්නේ එයා බෝයි කෙනෙක් කියලා...."

"අය්යා කිව්වා කලින් හිටපු ගර්ල්ව අයින් කරලා බෝයි

කෙනෙක් ගත්තා කියලා.... "

"ම්ම්ම්... ඒ කලින් ගර්ල් තමයි එයාගේ ගර්ල්ෆ්‍රෙන්ඩ්.. දෙන්නවම යැව්වේ.."

"හ්ම්ම්ම්... ඇයි ඉතිං ගවුම් ගොඩක්... "

"ඒවා බබාට ලස්සන වෙයි කියලා හිතුනා... "

"ඒත් ඇය් එච්චර "

"හේතුවක් ඕනෙද මට ඔයාට මොනාහරි අරන් දෙන්න"

"නැද්ද.???"

"තමන්ගේ නොවෙන අයට තමයි හේතුවක් ඕනේ මොනාහරි අරන්දෙන්න... තමන්ගෙ අයට හේතු ඕනේ නෑ..."

මං එයාගේ පපුව කිස් කරලා එතනින් කම්මුල තියන් ඇස් පියාගත්තා... ටික වෙලාවකින් කවුරුහරි ඩෝර් බෙල් එක ගහපු නිසා එයා කාමරෙන් ගිහින් ආපහු ආවේ අතින් කටින් බෑග්ස් එල්ලන්... ඒවා එකින් එක බලලා ගවුම් ටික ඔක්කොම එලියට අරන් හැඩ බලනවා.... අන්තිමේදි මෙරූන් කලර් ගවුම අරන් තව බෑග් එකක් එක්ක මගේ අතට දුන්නා....

"අපි වොශ් එකක් දගමු"

එයා එහෙම කියලා මාව වඩාගත්තා.. මං ඇසුත් ලොකු කරන් එයා දිහා බලන් ඉද්දිම මාව ගෙනත් තිබ්බා බාත්තබ් එකෙන්.. ඊටපස්සේ එයාම මගේ කොන්ඩේ තිබ්බ කට්ට ගලවලා කොන්ඩෙ වටේට කරකවලා කට්ට ගැහුවා... අබරපු ඇබරිල්ලට් රිදුනත් එක්ක..

"බෑග්ස් ටික මං මෙතනින් තියනවා... අතන ටවල් එක තියනවා... අලුත්ම එකක් ඒක... මේ බොඩිවොශ් එකයි , ෆේස් වොශ් එකයි මෙතන.. මං එළියෙන් ඉන්නම් ඉවරවෙලා කතාකරන්න.."

එයා මොනා කිව්වත් මං බලන් හිටියේ බොඩි වොශ් එකයි ෆේස් වොශ් එකයි දිහා... මං ගාන ජාතියමයි..

"ආ මේකෙ දිහාද බලන් ඉන්නේ... මං ගෙන්නගත්තා මේවා... මං ගාව තියෙන්නේ පිරිමි අයගේ ඒවනේ... බබාගේ ඇගට හරි යන එකක් නෑ... ඒකයි... මං දැකලා තියනවනේ මේවා බාතෲම් එකේ තියනවා... "

එයා මගේ ප්‍රශ්නේ විසදුවේ එහෙම... හැබැයි තව ප්‍රශ්නයක් තිබ්බා මට.. වීදුරු පෙට්ටියක් ඇතුලේ ඉදන් වොශ් දන්නේ කොහොමද කියලා.... එයා කාමරේට යනවට වඩා හොදයි මෙතනම හිටියනම්.. කිසි වෙනසක් නෑ...

එයා නම් කිසි ගානක් නැතුව එළියට ගියා... මං ඇඟිලි දෙකත් පටල පටල හිටියේ මොනාද කරන්නේ කියලා හිතාගන්න බැරුව.. හැබැයි ගියපු කෙනා අනික් අතට හැරිලා ආවා...

"සොරි බබා.. මට අමතක වුනා.. "

එහෙම කියලා එය එතන තිබ්බ බටින් එක ප්‍රෙස් කරා... එතකොටම වීදුරුව සුදු පාට වුනා.. කටත් ඇරන් මං බලන් හිටියා ඒ මොකක්ද වුනේ කියලා.... ෆිල්ම් එකකවත් එහෙම එකක් දැකලා තිබ්බේ නෑ... හොද වෙලාවට ඒක කරපු ගමන්ම එයා එතනින් ගියේ... නැත්නම් වස ලැජ්ජාව..

ටික වෙලාවක් ඒක දිහා බලන් ඉදලා මං ඇදුම් අයින් කරලා වොශ් එකක් දගත්තා... බෑග් එකේ යට ඇදුම් , අද වගේ දවසකට ඕනෙවෙන අනික් දේවලුත් තිබ්බා... ලැජ්ජාවෙන් මගේ මූනම රතුවෙලා ගියා... කොහොමහරි ඇදුම් ටිකත් ඇදගත්තා.. උඩින් පටි ගැටගහන ගවුමක් ඒක... හුරුබුහුටියට පේනවා මාව ඒකට... දොර ඇරන් එළියට එද්දි එයා දොර ලගම හිටගෙන ඉදලා මාව හරහට වඩාගත්තා..

"බිමින් තියන්න මාව... මට අමාරු නෑ දැන්.."

මං දැගලුවට එයා බිමින් තිබ්බේ නෑ... ගිහින් ඇදෙන්ම

හාන්සි කරා... මන් නැගිටලා ඇද ලග උඩ බිත්තිය බැලුවේ මන් දැක්ක දෙද් ඇත්තක්මද කියලා බලන්න... විශ්වාස කරන්න එතන තිබ්බේ බ්ලැක් ඇන්ඩ් වයිට් පේයින්ටින් එකක්... ඒකෙ හිටියේ වෙන කවුරුත් නෙවෙයි මං..

"ලස්සනයිද..."

කන ලගින් ඇහුනේ එයාගේ කටහඩ...

"ඒ මං නේද... "

"නෑ ඒ ඉන්නේ මගේ ෆියුචර් වයිෆ් "

එයා එහෙම කිව්වම මගේ හදවත මොනාදෙ වුනා.. මං යටි තොලත් හපන් බිම බලාගත්තා..... එයා මගේ කම්මුල ඉබලා මාව අයෙත් හාන්සි කෙරෙව්වා...

"කාට කියලද ඇන්දෙව්වේ.."

"මං මය් ඇන්දේ.."

"හෑ... ඔයාට චිත්‍ර අදින්න පුලුවන් ද.. "

"හ්ම්ම්... අම්මිටත් පුලුවන්... එයාගෙන් තමය් මට ඇවිත් තියෙන්නේ.. "

"අනේ ශෝය් නේ... එහෙනම් මට ගොඩාක් චිත්‍ර ඕනේ මගේ ඒවා.... එක එක විදිහට ඕනේ.... මට වෙන කොන්ඩයක් දලා... එතකොට මට ඩිම්පල්ස් දලා... ආ තව මල් වත්තක සමනල්ලු ගොඩක් එක්ක ඉන්න එකකුත් ඕනේ.... චූටිගෙයි මගෙයි එකකුත් ඕනේ....

අපි දෙන්නගේ එකකුත් ඇඳිමු... "

ඇගේ අමාරු ඔක්කොම අමතක කරලා මං කිව්වේ එයාගේ බෙල්ලේ එල්ලීගෙන.. එයා මගේ කම්මුලක් මිරිකුවා..

"ඇඳලා දෙන්නම් ඔයා කියන ඕනෙ ගානක්.. බබාගේ තව ගොඩක් පේන්ටින් තියනවා අපේ ගෙදර... වෙලාවක එහේ එක්කන් යන්නම්කෝ.."

"මගේ පේන්ටින් ??"

"අපෙ එරොයා එක පටන් ගන්න කලින් ඇන්ද ඒවා.... අපි කාල ඉමු බබා.. බඩගින්නේ ඉන්න හොඳ නෑ ඔයාට.. "

"අනේ කන්න බෑ මට.. අප්පිරියයි... "

"එහෙම කියලා බෑ බබා.. ඉන්න මං කවන්නම්"

මේ වගේ දවස් වලට මට කන්න අප්පිරියයි... වමනෙත් යනව සමහර දවසට... ඒත් එයා කවපු නිසා කටවල් පහ

හයක් කෑවා..... ඒත් වමනේ යන්න ආපු නිසා දුවගෙන ගියා බාත්රූම් එකට... මං වමනේ දනකම් එයා මගේ පිට අතගගා හිටියා... ඉවරවෙච්ච ගමන් එයා අත තෙමලා මගේ කට පිහදලා මාව වඩන් ආවා කාමරේට... එයාගේ අත් වෙව්ලනවා...

"බ... බා අපි යමු හොස්පිට්ල් "

එයාගේ කටහඬත් වෙව්ලනවා... අසාමාන්‍ය විදිහට බය වෙලා එයා.. එයාගේ හැසිරීම සාමාන්‍ය පිරිමියෙක්ගේ හැසිරීමට වඩා වෙනස්.... කිසිම පිරිමියෙක් තමන්ගේ ගර්ල්ෆ්‍රෙන්ඩ්ට වමනේ ගියා කියලා ඔච්චර බයවෙන්නෑ කියලා මට විශ්වාසයි..

"අය්යේ.. හැමදම මට මෙහෙම තමයි... ඒක සාමාන්‍යයි.. කලබලවෙන්න එපා... "

"නෑ ඒක අසාමාන්‍යයි.. පීරියඩ්ස් හැදුනම වෝමේට් වෙනවා කියල මන් අහලා නෑ... අපි යන් ඩොක්ටර් කෙනෙක් ලගට.. "

එහෙම කියලා එයා මාව තද කරලා බදා ගත්තා හරියට මං පැනලා දුවයි වගේ... එයාගේ ඇග සීතල වෙලා... හදවත එලියට පනින්න තරම් වේගෙන් ගැහෙනවා...

"අයියේ රිලෑක්ස්... ඇයි මේ බය වෙලා.. මං හොඳින්

ඉන්නවනේ... අනික මං මේකට බෙහෙත් ගන්න ගියා... ඒත් නෝර්මල් කිව්වා... පේන්කිලස් මොනාහරි ගන්න කිව්වා විතරයි.. ප්ලීස් බයවෙන්න එපා... "

"මං බයයි මැනික... ගොඩක් බයයි මට.. ඔයා සම්බන්ද දේවල් වලදී මං මහ බයගුල්ලෙක් වෙනවා.. ඔයාට ඉදිකටු තුඩක් ඇනුනත් මට බය හිතෙනවා... බය විතරක් නෙවෙයි පාලනය කරගන්න බැරි තරම් තරහ යනවා... කවුරු හරි ඇවිත් මාව මරලා ගියත් මට කේන්ති යන්නේ නෑ... ඒත් ඔයාට වචනයක් හරි කිව්වොත් මට ඌව මරන්න හිතෙනවා... මන් දන්නෑ ඇයි කියලා.... ඒත් මට ඔයා ලගදි සාමාන්‍ය හැඟීම් සිය දහස් ගුනයෙන් වැඩි වෙලා දැනෙන්නේ... "

එයා මගේ පපුවට තුරුල් වෙලා අඩනවා.... හරියට මන් මරෙන්න යනවා වගේ එයා අඩන්නේ.. ඇගට කිසිම පනක් නැති වුනත් මං එයාගේ ඔලුව අතගෑවා... මේ ගැන අනිවාර්යයෙන්ම අහසි අක්කා එක්ක කතා කරන්න වෙනවා.. සමහරවිට එයාට ලෙඩක් වෙන්නත් පුලුවන්...

"අයියේ මට බඩගිනියි... "

තවත් එයාව දරාගන්න තරම් ශක්තියත් නැති නිසයි එයාට කතා කරේ.... කාපු සේරමත් වෝමේට් වෙච්ච නිසා හොදටම තෙහෙට්ටුයි මට.. එයා නැගිටලා ආයෙත් බත් කටවල් දෙක තුනක් කැව්වා... එයිට වඩා කන්න බෑ

කියපු නිසා එයා කිරි පැකට් එකක් ගෙනත් දුන්නා.... බොහොම අමාරුවෙන් ඒක බීලා තවත් ටික වෙලාවක් නිදාගත්තා...

නැගිට්ටනකොට හොඳටම හවස් වෙලා.. නිතිනු අය්යත් මගේ ලඟින්ම හාන්සිවෙලා හිටියේ... මූනත් ආපහු ටිකක් හෝදගෙන ලෑස්ති වුනා ගෙදර යන්න... වුෆී ඉන්න නිසා ගෙදර යන්න කැමති කරගත්තේ එයාව... නැත්තම් අය්යත් ගෙන්නගෙන ඉන්නමය් හැදුවේ එයා... ඒ වෙලාවේ තමය් මන් දැනගත්තේ අපි මෙර් ඉන්නේ කම්පැනි බිල්ඩින් එකේමය් කියලා.... මේ උඩම තට්ටුවලූ... සතියේ දවස් වලට එයා මෙහෙලූ ඉන්නේ...

එයා පහලට එන්න හැදුවොත් මාව වඩාගෙන...බොහොම අමාරුවෙන් නවත්තගත්තා... ඒත් මගේ ඉනවටේ අතදගෙන තමය් ලිෆ්ට් එකේ ආවෙත්... ලිෆ්ට් එකේන් එලියට එද්දිම අපිට ඇහුනේ රිසෙප්ශන් එකේ හිටපු ගර්ල්ස් දෙන්නගේ කටහඩ...

"අනේ ආරාධ්‍ය සර්.. නිතිනු සර්ට කියලා අපේ ජොබ් එක බේරලා දෙන්නකෝ ප්ලීස්... "

"ප්ලීස් සර් අපේ ගෙදර මිනිස්සු ඔක්කොම ජීවත් වෙන්නේ මගේ සැලරි එකෙන්.. ප්ලීස් සර් අපිව අස් කරන්න එපා කියන්න"

ඒ දෙන්නා කියන්නේ අපේ අය්යටද... තිතිනු අය්යා අතමිට් කරගෙන එතන්ට යන්න හදද්දි මං එයාගේ අතින් අල්ලගත්තා...

"ඇය් ඒ පාර මොකද වුනේ... බොස්ට ආයෙමත් ගෑනු පෙන්නන්න බැරි වෙලාද.."

අය්යා අහන්නේ බැරෑරුම් පෙනුමක් මූනට අරන්... අපිට එයාලව පෙනුනට අපිව එයාලට පේන්නේ නෑ...

"නෑ සර්.. දවල් කෙල්ලෙක් ආවා... ඇවිත් සර්ව හම්බෙන්න ඕනෙ කිව්වා.... පෙනුමෙන් වැදගත් පාටක් තිබ්බේ නෑ... ක්ලාස් යන ළමයෙක් වගේ... ඉතින් අපි එයාට ටිකක් තදින් කතා කරා... "

එයාලා එහෙම කියද්දි නම් අය්යගේ මූන ටිකක් වෙනස් වුනා.. සමහරවිට එයාට සැක හිතෙන්නැති ඒ මං කියලා....

"ඉතින්..?"

"අපි බැන්නා ඒ කෙල්ලට ඒත් ගියේ නෑ... "

"මොනා කියලද බැන්නේ.. "

"එච්චර දෙයක් කිව්වේ නෑ සර්.. පිස්සු ගෑනි කිව්වා....

ආයෙ කපටි අම්මන්ඩි කිව්වා.... ඒත් ගියේ නැති නිසා සිකියුරිට්ලා දෙන්නා ගෙනත් එළියට දම්මන්න හැදුවේ.... එතකොටම තිතිනු සර් ආවා... බලද්දි ඉදලා තියෙන්නේ සර්ගේ ගර්ල්ෆ්‍රෙන්ඩ්.. ඒ මදිවට ඒ කෙල්ල එවෙලෙම කලන්තේ දාලා වැටුනා.. විනාඩි පහක් යන්න කලින් අපි දෙන්නවයි සිකියුරිට්ලා දෙන්නවයි අස්කරලා දාලා... ප්ලිස් සර් මොනාහරි කියලා ජොබ් එක හදලා දෙන්නකෝ.. අපි දැනන් හිටියේ නෑ ඒ බොස්ගෙර් ගර්ල්ෆ්‍රෙන්ඩ් කියලා.... දැක්කම එහෙම කියලා හිතන්න බෑ... "

කතාව අහන් ඉද්දි අය්යගේ ඇස් රතු වෙලා අත් වල නහරත් පිම්බුනා...

"තමුසෙලා දන්නවද ඒ කවුද කියලා.... "

අය්යා කතා කරේ උපරිම පාලනය කරගත්ත කටහඬකින්...

"බොස්ගේ ගර්ල්ෆ්‍රෙන්ඩ් ???? "

"බොස්ගේ ගර්ල්ෆ්‍රෙන්ඩ් වෙන්න කලින් ඒ මගේ නංගි යකෝ.. පුලුවන් නම් තවත් දඩුවම වැඩි කරනවා මිසක් මගේ නංගිව අඩවපු උන්ට සමාව ඉල්ලල දෙන්න මට පිස්සු නෑ... තමුසෙලා දෙන්නා කරපු වැඩවල හැටියට මට හිතාගන්න පුලුවන් එයා කොච්චර බයවෙන්න ඇත්ද කියලා.... "

අය්යා සද්දෙන් එහෙම කියලා ඒ ගර්ලා දෙන්නාට ලං වෙන්න යද්දි මං දුවගෙන ගිහින් එයාගේ අතින් අල්ලගත්තා... අම්මටවත් මට හය්යෙන් කෑගහන්න දෙන්නෙ නැති කෙනා මෙහෙම දෙයක් ඉවසන්නෑ කියලා මං දන්නවා.....

"සුදූ... ඔයා හොදින් නේද... "

අය්යා මාව බදාගන්න ගමින් අහන්නේ.. මං ඔලුව උඩට පල්ලෙහාට වැනුවා... එතකොටම නිතිනු අය්යත් එතන්ට ආවා...

"දැන්වත් වද නොදී යනවා මෙතනින් "

නිතිනු අය්යා කාගහද්දි ඒ දෙන්නට සද්දෙට ඇඩුනා... මං හැරිලා බැලුවා ඒ දෙන්නා දිහා... හොදටම අඩනවා.... ඇත්තටම එයාලට රස්සාව ගොඩක් වටිනවා ඇති....

"අනේ සර්.. ප්ලීස් අපි දැනන් හිටියේ නෑ.. එක චාන්ස් එකක් දෙන්න.."

ඒ දෙන්නා පිංසෙන්ඩු වෙනවා.. මට දුක හිතුනා ඒ දෙන්නා ගැන... එයාලගේ වැරැද්දක් කියන්නත් බෑ... මාව දැක්කාම කාටවත් කියන්නබෑ මං නිතිනු අය්යගේ ගර්ල්ෆ්‍රෙන්ඩ් කියලා.... අපොය්මන්ට් එකක් නැතුව වෙයාමන්ව හම්බෙන්න දෙන්න බැරි නිසානේ යැව්වේ නැත්තේ..... මං නිතිනු

අය්යගේ අතින් අල්ලන් එයාගේ ඇස් දිහා බැලුවා...

"බබා ඔයා කියන්නේ මේ දෙන්නට සමාව දෙන්න කියලනම් ආම් සොරි මට ඒක කරන්න බෑ... "

"ප්ලීස්... එයාලා වැරැද්දක් කරේ නෑ... එයාලා කරේ එයාගේ ඩියුටි එක..."

"මොනාද කියන්නේ බබා.. ඔයා අසනීපයි කියලා කියද්දිත් හිතක් පපුවක් නැති ගානට ඔයාව එලියට දන්න හැදුවා... වෙන ඕනෙ දේකට සමාව දෙන්න පුලුවන් ඒත් මේකට බෑ... එයාලා හර්ට් කරා වගේ 10 ගුනයක් වැඩියෙන් එයාලා විදවන්න ඕනේ.... "

"ඔව් සුදූ... එයාලට තිබ්බා අඩුමගානේ වෙයාමන්ට කෝල් එකක් දීලා බලන්න... සමහරවිට ඉම්පෝටන් ක්ලයන්ට් කෙනෙක් ආවත් මෙයාලා එහෙම සලකන්න පුලුවන්... ඒ නිසා සමාව ඕනේ නෑ... "

"ප්ලීස්.. මන් කියන නිසා.. "

"බබා ම......... "

ප්ලීස් ප්ලීස් ප්ලීස්... ඕන්නම් අපි මාසයක පඩි කපමු.."

නිතිනු අය්යා කොන්ඩේ අතින් අදින ගමන් සැරෙන් සැරේට මං දිහා බලනවා.... අය්යනම් ඉන්නේ මාව අමුවෙන්ම කන සයිස් එකේ... හැටහතර මායම් වලින් තුන හතරක් දගෙන මං නිතිනු අය්යා දිහා බලන් හිටියා... මන් දන්නවා මන් දෙයක් ඉල්ලුවොත් එයා නොදී ඉන්නේ නෑ කියලා..

"හරි... මං අන්තිම වතාවට සමාව දෙන්නම් ආය අහුවුනොත් බේරුමක් නෑ... "

එයා කිව්වේ අර දෙන්නා දිහා බලන්... මන් ආයෙත් එයාගේ අතේ එල්ලිච්ච නිසා එයා ඔරවලා මන් දිහා බැලුවා.....

"මාසෙක සැලරි කපන්නත් එපා ඉතිම් "

"බබා ගුටි කනවා මගෙන්.."

එයා ටිකක් සැරෙන් වගේ කියපු නිසා මං මූනත් එල්ලගෙන එළියට ආවා... අයියයි නිතිනු අයියයි කාර් එක ගන්නකම් මං එතනට වෙලා හිටියා... අර ගර්ල්ස් ලා දෙන්නා මං ලගට ආවේ අත් දෙකත් එකතු කරන්.. මන් කටත් ඇරන් බලන් හිටියේ මොකක්ද මේ වෙන්නේ කියලා....

"ගොඩක් ස්තූතියි මිස්... මිස් අපිව බේරගත්තේ නැත්තම්

අපේ ජොබ් නැති වෙනවා.. මේ කාලේ කොච්චර අමාරුද ජොබ් එකක් හොයාගන්න... මිස්ට ගොඩක් පින්.."

"ඔව් මිස්... අපි මිස්ට වැරැද්ද කරලත් අපිව බේරගත්තා... වෙනකෙනෙක් නම් රස්සාවෙන් අස් කරලවත් නිකන් ඉන්න එකක් නෑ... තැන්ක් යූ සෝ මච්.."

එයාලා මට ස්තූති කරද්දි තිහතමානී ආඩම්බරයක් දැනුනා මට.. ඒත් එයාලට මුකුත් කියන්න බැරි වුනා මට නිතිනු අයියා හෝන් එක උඩ නැගගෙන හිටපු නිසා.. මන් දුවන් ඇවිත් කාර් එකට නැග්ගා... එයාට තිබ්බ කේන්තියට මතක නෑ මට සනීප නෑ කියලවත්..

ගෙදර ආපු ගමන් මන් කාමරේට ඇවිත් අහසි අක්කට කෝල් එකක් ගත්තේ නිතිනු අයියගේ අසාමාන්‍ය හැසිරීම ගැන කියන්න...

## 26 කොටස

"හෙලෝව් "

"හෙලෝව් අහසි අක්කි... මං ආරු කතා කරන්නේ... "

"ආ.. පැටියෝ... මොකද මේ මාව මතක් වෙලා .. මුකුත් ප්‍රශ්නයක් නෑ නේද... "

"අක්කි.. මට චුට්ටක් කතා කරන්න ඕනේ.... ඔයා වැඩක්ද..."

"මත් මේ වෙලාවේ ෆ්‍රී... කියන්න මොකක්ද ප්‍රශ්නේ... "

"අක්කි.. නිතිනු අයියගේ හැසිරීම හරි වෙනස්නේ... හරි අසාමාන්‍යයි.. වගේ... "

"ඒ කියන්නේ... "

"අද මං කලන්තේ දලා වැටුනා.. පුංචිම පුංචි කලන්තයක් ඒක... ඒත් මං ඇහැරෙනකොට එයාගේ ඇස් රතුවෙලා... ඒ තරම් අඩලා එයා.. හුස්ම ගන්නවත් බැරි තරම් තදට මාව බදාගෙන හිටියා... ආපහු සැරයක් වෝමේට් වුනාම එයා හොඳටම බය වුනා.. දඩියත් දලා ඒසී එකේ... වෙව්ලනවත් එක්ක... මට බයයි අක්කි.. එයාට මොකක් හරි ප්‍රශ්නයක් ද"

"ම්ම්ම්ම්ම්... මෙහෙමයි පැටියෝ... ඕක ලෙඩක් වෙන්නත් පුලුවන් නැති වෙන්නත් පුලුවන්... සෝ අය් තින්ක් පොඩ්ඩක් චෙක් කරලා බලන්න වෙයි... ඔය ගැන මුකුත් නිතුනුට නොකියා එයාව ක්ලිනික් එකට එක්කන් එන්න...

ඩෝන්ට් වොරි ඩාලින්.. එයාට අසනීපයක් තිබ්බත් හොද කරන්න පුලුවන්... "

"තැන්ක් යූ අක්කි.. මං එහෙනම් තියනවා... හෙටම එක්කන් එන්නම් එයාව... "

"ඕකේ ස්වීට්.. ගුඩ් නයිට් "

අහසි අක්කගේ කෝල් එක කට් කරලා සිවිලිම දිහා බලන් කල්පනා කරා... ඇත්තටම එයාට ලෙඩක්ද.. ලෙඩක් වුනත් කමක් නෑ... මං එයාව හොද කරගන්නවා.. ඒක කරන්න මට පුලුවන්...

කල්පනා කර ඉදලා වොශ් එකකුත් දාන් කෑම කන්න මේසෙට ආවා... එන ගමන් කෑම අරන් ආවේ අපි.. තිතිනු අයියා නම් මාත් එක්ක තරහ වෙලාද කොහෙද බලන්නෙවත් නෑ... ඒවා කොහෙද මාත් එක්ක... කාලා ඉවරවෙලා වැඩ පටන් ගන්න ඕනේ.. එක මායමක් දැම්මනම් ඇති එයාට.. නිකම්ම අහුවෙනවා.. මෝඩකම නෙවෙයි එයාගේ... අසීමිතව මට ආදරේ කරන නිසා..

කෑම කාලා ටික වෙලාවක් ඉදලා හොරෙන් ඔලුව දාලා බැලුවා එයාගේ කාමරේට... ජනේලෙන් එලිය බලාගෙන ඉන්නවා එයා... ලගට ගිහින් මමත් අහස දිහා බැලුවා... හද පායලා තියනවා සම්පූර්න වෙන්න ටිකක් අඩුවෙන්..

"ලස්සනයි නේද අහස"

මං එයාගෙන් ඇහුවත් එයා මන් දිහා බලලා අහක බලාගත්තා ඇරෙන්න මුකුත් කිව්වේ නෑ... තාමත් තරහයි වගේ...

"හඳද ලස්සන... මමද ලස්සන.."

ආයෙත් එයා මන් දිහා බලන් හිටියා ටික වෙලාවක්.. ඊටපස්සේ අහස දිහා බලාගත්තා... තරහ ටිකක් දරුනුයි වගේ...

"බඩ රිදෙනවා ඉන්න බෑ... ඔයා ලග ඉද්දි අඩු වෙන නිසා ආවේ... කමක් නෑ ඔයාට මාව එපානේ.. මං යන්නම් චූෆි ලගට.. අයියත් මාත් එක්ක තරහයි නේ.. චූෆි ලගින් නිද ගන්නවා.. කමක් නෑ සීතලට බඩ රිදෙන එක වැඩිවෙච්ච දෙන්... කවුරුත් මට ආදරේ නෑනේ... මං පවු.."

අදිනාත්වික රංගනයක යෙදුනා මං හිනාව බොහොම අමාරුවෙන් තද කරන්.. බඩේ කැක්කුම නැතුව නෙවෙයි ඒත් ලොකු අමාරුවක් නෑ... අඩන්න වගේ මූනත් හදන් මං කාමරෙන් යන්න යද්දිම එයා හරහට මාව වඩාගත්තා.. මිශන් සක්සස්ෆුල්..

මාව වඩාගෙන ගිහින් ඇදෙන් හාන්සි කරලා තොල් උල් වෙන විදිහට කට මිරිකලා හාදුවක් තිබ්බා... මං එයාගේ

බෙල්ලේ එල්ලිලා ඒ නහය හැපුවා..

"කපටි කෙල්ල... මගේ වීක් පොයින්ට්ස් හොදට දන්නව නේ.. විනාඩියෙන් මාව යාලු කරගත්තා... මට තමයි පැයගානක් ගියේ... "

"නපුරා... මාත් එක්ක තරහ වුනා.. මාත් තලහයි දැන්.."

"ම්ම්ම් තලහයිද මගේ චූටි මැනික... යාලුවෙන්නෙම නැද්ද..."

"යාලු කරගන්න ඔයා.."

"යාලු කරගන්නනම් මොනාද ඕනේ පැටියට.. "

"උම්මා ගොඩා....ක් ඕනේ.... "

"අනේ ඉතිම් මගෙ හුරතලේ.. ආදරෙ වැඩි වෙනවා ඔහොම කරද්දි "

"මං ගොඩක් තරහයි.."

"අනේ ඒ මොකෝ වස්තු.."

"ආදරේ වැඩි වෙනවා කියලා කිව්වේ... "

"ඉතින්.?"

"ඉතින් එහෙම වැඩි වෙන්න බෑ... මෙතන තියන ඔක්කොම ආදරේ මගේ.. වැඩිවෙන්න ඉඩක් නෑ එතකොට... ඒ කියන්නේ ඔයා මට අඩුවෙන් ආදරේ කරන්නේ... "

"රත්තු කෙක්ක මගේ.. හරි හරි ආදරේ ටිකක් වැඩිවෙලා එලියටත් වැටුනලු.. ම්ම්ම් දැන් හරිද.."

"හලි..."

මගේ බොලද කතාවලට එයත් බොලද උත්තර දෙද්දි අපි දෙන්නම හයියෙන් හිනාවුනා... හිනාවෙද්දි බඩ රිදෙන නිසා හිනාවෙන එක නතර කරලා බඩ අල්ලගත්තා...

"ඇයි මැනික බන්ඩිය රිදෙනවද..."

"හ්ම්ම්"

"අතගාන්නද මං "

ඒකට නම් මගේ ඇස් පොල් ගෙඩි විතර වුනා..

"ඇයි ම්ම්ම්... කෝ එන්නකෝ අතගාන්න.."

එයා මාව එයාගෙ අතක් උඩට අරන් අනික් අනික් අත ටීශර්ට් එකට යටින්. මගෙ බන්ඩිය උඩින් තිබ්බා... පලවෙනි වතාවට පිරිමි ස්පර්ශයක් මගේ බඩට දැනෙද්දි හදවත වේගෙන් ගැහැන්න ගත්තා... එහාට මෙහාට ඇඹරිලා මං එයාගේ පපුව අස්සේ හැංගුනා..

ටික වෙලාවක් යද්දී ඒ ස්පර්ශට ඉබේම හුරු වුනා මන්.. පොඩ්ඩක්වත් අත එහෙ මෙහෙ කරන්නේ නැතුව එයා ඇඟිලි වලින් හිමීට පිරිමදිනවා... ඒ අතට මගේ බන්ඩියම වැහෙනවා... ඇත්තටම සැහැල්ලුවක් දැනෙන නිසා තවත් ඒ උනුසුමට ගුලිවුනා...

"මොකද මේ මගේ පපුව අස්සටම රිංගන්න හදන්නේ ම්ම්... "

"දෙයි මතයි මට"

"දෙයියන්න නම් එපා මැනික... ඇහැරිලා ඉන්න ඕනේ.... නැත්තම් මං ආයෙ තුරුල් කරගන්නේ නෑ... "

ඒක ට නම් මට තරහ ගියා... හැමදම මං නිදගන්න හදද්දි මාව නවත්තනවා... එයාටත් ඕරවන් මං හැදුවේ එතනින් නැගිට්ටන්න...

"අනේ මැනික.. මොකද මේ.. ආයෙත් තරහ වෙලාද මන්

sinhalaebooks.com

එක්ක... බබා.. "

"අල්ලන්න එපා මාව... ඔයා හැමදම ඔහොමයි මට ඉන්න දෙන්නේ නෑ ලග... බොරු කියන්නේ ඔයා... ඔයා කැමති නෑ මං ලග ඉන්න... මං යනවා කාමරේට.."

ඒත් එයා මට යන්න නොදී තද කරලා අල්ලගෙන හිස් මුදුනෙන් හාදුවක් තිබ්බා... මං ඔරවගෙන හිටියා...

මාව හරහට වඩාගෙන එයා මගේ කාමරේට ආවේ... මාව මගේ ඇදෙන් තියලා මාව තුරුලු කරගත්තා....

"මේ වගේ දවසට ගෑනු ලමයින්ට කේන්ති යනවා කියලා අහලා තිබ්බට අද තමයි දැක්කේ.. තරහ ගන්නේ නැතුව ඔහොම දෙයියන්න... හවස වෙච්ච දේ නිසා අයියා තාමත් මාත් එක්ක තරහින් ඉන්නේ... ඒකයි මගේ කාමරේ තියාගත්තේ නැත්තේ... දගලන්නේ නැතුව දෙයියන්න.. නින්ද ගියාම මං යන්නම්"

මට දගලන්නක් බැරිවෙන්න තදට තුරුල් කරගත්තා එයා.. මාත් ඉතින් බොරුවට තමයි දැගලුවේ.. නම්බුවට හරි නෑනේ නැත්තම්

"බබා ඉස්සල්ලා අහපු ප්‍රශ්නෙට මං දැන් උත්තරේ දෙන්නම්.... "

"මොන ප්‍රශ්නෙද.. "

"හදද ලස්සන ඔයාද ලස්සන ඇහුවේ.... "

"ඉතිම්.."

"බබා දන්නවද කවියෝ හදට කාන්තාව උපමා කරේ ඇය් කියලා.. මිනිස්සු හිතුවට ලස්සනට කියලා එහෙම නෙවෙයි... හදෙන් හිතට දැනෙන සෞම්‍ය ගුනය වගේ කාන්තාවකට පුලුවන් කෙනෙක්ගේ හිත නිවන්න... ප්‍රශ්න අමතක කරලා දුන්න.. සැනසීමක් අරන් දෙන්න.. ඉතින් ඔයාත් මට ඒ වගේ... හදවත සැනසෙනවා ඔයාව දැක්කත්.. ලස්සන ගැන කියනවනම් අහසට හද ලස්සනය් වුනත් මගේ මැනිකගේ මූනට කීයටවත් සමාන කරන්න බෑ... ඔයත් එක්ක බලද්දි හද කියන්නේ නිකම්ම නිකම් එලිය විහිදෙන ගෝලයක් විතරය්.. "

මං විහිලුවට අහපු ප්‍රශ්නෙට එයා දුන්නේ ඒවගේ උත්තරයක්... මං දන්නවා සමහර පිරිමි කියනවා වගේ ඒවා නිකම්ම වචන විතරක් නෙවෙය් කියලා.. හැඟීම් ගොන්නක් ඒ කතා කරේ....

"සොරි."

"ඒ මොකද"

"බොරුවට තරහ වුනාට.. රත්ඩු වුනාට.."

"මං දන්නවා මගේ මැතික තරහ ගත්තට ඒවා හිතේ නෑ කියලා.... කෝ දැන් දෙය්යන්න.. "

උදේ ඇහැරෙද්දි නිතිනු අයියා ලග හිටියේ නෑ... මට නින්ද ගියාම යන්නැති.. අද ඉරිදා නිසා තුන්දෙනාම ගෙදර.. 9 ට විතර මමයි නිතිනු අයියයි ලෑස්ති වුනේ අහසි අක්කව හම්බෙන්න යන්න.. නිතිනු අය්යට මං කිව්වා අහසි අක්කා එන්න කිව්වා කියලා.. අයියනම් අද යාලුවෙක් හම්බෙන්න යනවලු... නිතිනු අයියා කියපු නිසා මං රෝස පාට ගවුමක් ඇද ගත්තා... එයා මං ගවුම් අදිනවට තමය් කැමතිම.. එතකොට මං හුරතල් පාටයි ලූ..

10.30 ට විතර අපි අහසි අක්කගේ ක්ලිනික් එකට ආවා... හරිම නිස්කලංක තැනක් ඒක.. දැක්කත් හිත සැනසෙන විදිහට පරිසරය හදලා තිබ්බා... ඇතුලෙත් ලොකු මාලු ටැංකියක් එක්ක තැනින් තැන පොඩි පොඩි ගස් තිබ්බා... මං නිතිනු අයියාගේ අතේ එල්ලිලා වට පිට බල බල ආවා...

දෙරක් ලගට ගිහින් නිතිනු අය්යා තට්ටු කරාම ඇතුලෙන් අහසි අක්කා අපිට කතා කරා... ටේබල් එකක් ලග ඉදලා එයා ඇවිත් එතන තිබ්බ සෙට්යෙන් මට වාඩි වෙන්න කිව්වා....

"පැටියෝ ඔයා මෙතනින් වාඩි වෙලා ඉන්න.. මං නිතිනු අය්යව පොඩ්ඩක් චෙක් කරන්න ඕනේ.... "

අහසි අක්කා නිතිනු අය්යට කතා කරලා එතන තිබ්බ දොරකින් ඇතුලට ගියා... නිතුනු අයියා මගේ ඔලුව අතගාලා ඇතුලට ගියා... මගේ වෙලාවට එතනත් පොඩි මාලු ටැංකියක් තිබුන නිසා මං මාලු බැලුවා.. මගේ හිතේ තිබ්බ නොසන්සුන් කම එයාලා දිහා බලලා නැති කරගන්න පුලුවන් වුනා.. සාරියක් වගේ පලල පෙන්දක් තියන පාට පාට මාලුවට තමය් මට වැඩියෙන් ආස හිතුනේ... මං කොච්චර වෙලා එයාලා දිහා බලන් හිටියද කියලා මන් දන්නේ නෑ... නිතුනු අය්ය මං දිහා බලන් ඉන්නවා වගේ දැනිච්ච නිසා තමය් මං පිටිපස්ස බැලුවේ.. එයා මන් දිහා හිනාවෙවී බලන් ඉන්නවා...

"මේ වගේ මාලුවෙක් ඕනේ මටත් ඕනේ.... එයා ලස්සනයි.."

මං කිව්වේ එහාට මෙහාට පීනන මාලුවා පෙන්නලා...

"දෙන්නෙක්ම ගෙනත් දෙන්නන්ම් කෝ මං බබාට.. "

ඔලුවත් අතගාලා එයා කියද්දි මං හිනාවුනා... ෆෝන් එකක ෆ්ලෑශර් එකක් වැදුන නිසා නිසා තමයි අපි දෙන්නා අපි දෙන්නගේ ඇස් වලින් අයින් වුනේ...

"ඕ ශිට් ෆ්ලෑශර් ඔන් වෙලානේ... "

අහසි අක්කි අපි දෙන්නගේ ෆොටෝ එකක් අරන්...

"ආ නිතිනු කැන් යූ ස්ටේ අවුට්සයිඩ් ෆෝ අ වයිල්.. අයි වෝන්ටු ටෝක් විත් හර්"

"බට් වයි.. මොනාද මට කියන්න බැරි දේවල් තියෙන්නේ.."

"ජස් ගර්ල් ටෝක් අනේ... බලන්නකෝ පැටියෝ මෙයාට දැන් විනාඩි 5 ක් වත් ඔයා නැතිව බෑ... "

අහසි අක්කාටත් ඔරවලා නිතිනු අයියා එලියට ගියා... මං තාමත් රතුවෙලා...

"පැටියෝ මෙතනින් වාඩි වෙන්නකෝ.. මට ඔයාට කියන්න වැදගත් දෙයක් තියනවා... "

මං අහසි අක්කි ඉස්සරහින් වාඩි වුනේ එයා දිහා කුතුහලෙන් බලාගෙන..

"ඔයා දන්නවද මනුස්සයෙක්ගේ මානසික සෞඛ්‍යයට ගොඩක්ම බලපාන්නේ වෙන්නේ එයාගේ පොඩි කාලේ

කියලා.. තරුණ වයසෙදි මොනවගේ මනුස්සයෙක් වෙනවද කියන එක තීරනය වෙන්නේ පොඩි කාලේ ඇහෙන දකින දේ වලින්.. ඉතින් පුන්චි කාලෙදි වෙච්ච දේවල් නිසා ලොකු වෙනකොට එක එක මානසික රෝග හැදෙන්න පුලුවන්... එදා කියපු ලෙඩ වලට අමතරව නිතිනුට තවත් ලෙඩ තියනවා... හී ඊස් සෆරින් ෆ්‍රොම් තැනටෝ ෆෝබියා..."

"තැ.. තැනටෝෆෝබියා..?? ඒ ඒ මොකක්ද අක්කි.. එයාට දැනටමත් ෆෝබියා එකක් තියනවනේ... ඉතින් මේ තවත් අලුත් එකක්?? එහෙම වෙන්න පුලුවන්ද"

"තැනටෝෆෝබියා කියන එකේ සරල තේරුම fear of death or dying process(මරනයට හෝ මරනයේ ක්‍රියාවලියට ඇති බය) කියලා කියන්න පුලුවන්.. සාමාන්‍යයෙන් ඒකේ මීනින් එක ගන්නේ එහෙම.. ඒත් නිතුනුට තියෙන්නේ fear of lost(යමක් නැති කරගැනීමට ඇති බය) ඒක තැනටෝෆෝබියා කියන රෝගයේ කොටසක්.. එගෙම අය තමන් ආදරේ කරන දේවල් නැති කරගන්න බයයි.. අනිත් එක එක්ම පේශන් ෆෝබියාස් දෙක තුනකින් සෆර් කරන්න පුලුවන්... මට පේන හැටියට මේක එයාට කලින් ඉදලා තිබිලා තියනවා... ඒත් මට තියෙන ප්‍රශ්නේ සනුදි වෙන්වෙච්ච වෙලාවේ එයාට ඒ තත්වේ ආපු නැති එක... සමහරවිට ආදරේ කියලා හිතන් හිටියට එතන තිබ්බෙ ඇට්‍රැක්ශන් එකක් වෙන්නත් පුලුවන්"

"ඒ..ඒක බ..බයානකයි ද අ.ආක්කි.."

"ඒක එහෙමම බයානකයි කියලා කියන්නත් බෑ... බයානක නෑයි කියලා කියන්නත් බෑ... නිතිනුට නම් ඔයා ලග ඉන්නකම් ඔයාට කිසිදෙයක් නොවෙනකම් ලොකු ප්‍රශ්නයක් නැතිවෙයි.. මොකද නිතුනු ආදරේ කරන දේකට මේ ලෝකෙ තියෙන්නේ ඔයා විතරක් නිසා.. මොකද අපි දෙන්නම දන්නවා එයා එයාගේ ජීවිතේටවත් ආදරේ කරන්නේ නෑ කියලා.... ඒත් පැටියෝ හැම බැදීමක්ම සදකාලික නෑනේ...

මත් ඔයාව සැක කරලා කියනවා නෙවෙයි.. ඒත් රිලේශන්ශිප් එකක් කියන්නේ ගොඩක් සංකීර්ණ දෙයක් නේ... ඉතින් කවදහරි ඔයා එයාව දලා ගියොත් එයා ගොඩගන්න බැරි තරම් මැන්ටලි ඩවුන් වෙන්න පුලුවන්... ඒ නැතත් එයා ෆියුනරල් එකකට යන්න එහෙම නැත්තම් මොනා හරි ඩෙත් සයින් දැක්කම පැනික් වෙන්න පුලුවන්... නැත්තම් ඔයාට කරදර කරන්න ආපු කෙනෙක්ට මැරෙනකම් ගහන්න වුනත් පුලුවන්... "

"ඉතින් ඒකට බෙහෙත් නැද්ද අක්කි.. "

"බයවෙන්න එපා ඒකට ට්‍රීට්මන්ට්ස් තියනවා... හැබැයි ටිකක් කල් යයි... වෙලාවට ට්‍රීට්මන්ට්ස් කරන් ගියොත් සම්පූර්ණයෙන්ම හොද කරගන්න පුලුවන්... හැබැයි ඔයාගේ අතින් වෙන්න ඕනෙ දේවල් ටිකකුත් තියනවා... "

"මොනවද මං කරන්න ඕනේ.... ඕනේ දෙයක් කරන්න පුලුවන් මට එයා වෙනුවෙන්... කියන්න මං අනිවාර්යයෙන්ම කරන්නම්"

"ලොකු දෙයක් නෙවෙයි.... එයාව රිලැක්ස්.. කරන්න.. ස්ට්‍රෙස් අඩු කරන්න පුලුවන් දේවල් කරන්න.. තව මිනිස්සු මැරෙන එක මිනිස්සුන්ට දේවල් නැතිවෙන එක ස්වාභාවිකයි කියලා පෙන්නන්න.. හැබැයි ඒ කිසිම තැනකදි ඔයා එයාව දාලා යනව කියන අදහස දෙන්න එපා...

ජීවිතය කොච්චර වටිනවද තමන්ට තමන් වටිනවද කියන එක දැනෙන දේවල් කියන්න.. කිසිම වෙලාවක ෆෝබියා දෙකම එක සැරේ ඇතිවෙන්න දෙන්න එපා... තේරුනාද?"

"ඔව් අක්කි මට තේරුනා... "

"හ්ම්ම් දැන් එහෙනම් යන්න... නැත්තම් අරයට සැක හිතෙයි... "

අහසි අක්කටත් සමුදීලා මං දොර අරින්න තල්ලු කරා විතරයි නිකම්ම ඇරුනා.. නිතිනු අයියා දොර ලගටම වෙලා බලන් ඉදලා මන් එනකම්. ඒ මූන දැක්කම තිබ්බ ප්‍රශ්න ඔක්කොම අමතක වෙනවා... මගේ ඉනවටේ අත දාගෙන එයා එතනින් එලියට ආවා...

"විනාඩි 23 ක් ගියා මොනාද එච්චර වෙලා කතා කරේ...."

"මුකුත් නෑ අනේ.. "

"බබා.. මට ඇත්ත කියන්න... මට තව මොනාහරි ලෙඩක් තියනවද... ඒ ගැනද ඔයාලා කතා කරේ"

"අනේ නෑ මෝඩයෝ.. එයා ගොඩක් උපදෙස් දුන්නා මට ඔයාව බලාගන්න විදිහ ගැන... ඔයාව ආදරෙන් බලාගන්න කිව්වා... ඔයාට ස්ට්‍රෙස් වෙන්න දෙන්න එපා කිව්වා.... "

"ඒවා එයා කියන්න ඕනේ යැයි මගේ මැනික දන්නව මාව බලාගන්න.."

ඔරෝගෙන වගේ එහෙම කියලා එයා මාව් කාර් එකට නග්ගවලා එයත් කාර් එකට නැග්ගා... දවල් වෙලා තිබ්බ නිසා ලන්ච් ගන්න එයා මාව එක්කන් ආවේ බීච් එක අයිනේ තියන හොටෙල් එකකට... එයා මාවත් අතින් අල්ලන් එකේ උඩම තට්ටුවට ආවා... හරිම ලස්සනයි එතන එක පැත්තකින් ලස්සනට මුහුද පේනවා.. මං වැට අයිනට වෙලා මුහුද දිහා බලන් හිටියා... නිතිනු අයියා ඕඩර් එක දලා මං ලගට ආවා... මගෙන් ඇහුවෙවත් නෑ මොනාද ඕනේ කියලා.. මං ඕනෙ දෙයක් කන නිසා හොදයි...

"කාලා යමු බීච් එකට... එතකන් ඉවසලා ඉන්න මිම්මි"

මගේ හිත කියෙව්වා වගේ එයා කිව්වේ... මට ඕනෙවෙලා තිබ්බෙත් බීච් එකට යන්න තමයි...

එයා ඕඩර් කරලා තිබ්බේ සීෆුඩ් රයිස්... මන් ආසම කෑමක්... එයා කන්න පටන් ගත්තේ මට හැන්දක් කවලා ඉවරවෙලා...

කෑම කාලා හොටෙල් එකේ බීච් එකට ආවා...

එයාගේ අතින් අල්ලගෙන රැල්ල පාගද්දි ෆොරිනස්ලා වගයක් අපි දෙන්නා දිහා බලාගෙන හිටියා... එතනින් කැමරාවක් අතේ තියන් හිටියකෙනා අපි ලගට ආවා... එයත් එක්කම තවත් ලංකාවේ කෙනෙක් කියලා කියන්න පුලුවන් කෙනෙක් ආවා... ෆොරිනර් වෙන භාශාවකින් අනිත් එක්කෙනාට මොනාද කියපු එක එයා අපිට ට්‍රාන්ස්ලේට් කරා...

"එයා ෆොටෝග්‍රැෆර් කෙනෙක්.. ලෝකේ හැමතැනම ගිහින් ලස්සන ලස්සන ෆොටෝ ගන්නවලු.. ඔයාගේ ගර්ල්ෆ්‍රෙන්ඩ් ලස්සන නිසා එයාගේ ෆොටෝ එකක් ගත්තට කමක් නැද්ද අහනවා.. මුහුදත් එක්ක දිග කොන්ඩයක් තියන ගෑනු ලමයෙක්ගේ ෆොටෝ එකක් එයාගේ කලෙක්ශන් එකට ලස්සන වෙයලු.."

ඒක ඇහුවමනම් නිතිනු අයියගේ කට දෙක වුනා..

"එයාට කියන්න මං කැමති නෑ කියලා.. මගේ වයිෆ්ගේ ෆොටෝ එකක් වෙන කවුරුත් ලග තියනවට මං කැමති නෑ..."

කිසිම තෙතමනයක් නැතුව එයා කියලා දැම්මා..... පුදුම ඉරිසියාවක් තියෙන්නේ.. හැබැයි ඉතින් මං ඒකට ආසයි... මට වයිෆ් කියලා කියපු එකට ඊටත් වඩා ආසයි... හදවත මොනාදෝ වෙනවා..

"එහෙනම් මූන පේන්නේ නැතිවෙන්න මුහුද දිහා බලන් ඉන්න එකක් ගන්නද අහනවා.."

බල කරලා බල කරලා ඒ දෙන්නා නිතිනු අයියව කැමති කරවගත්තා... හැබැය් මූන පේන්නේ නැති ඒවට.. මට එක එක ඇන්ගල් වලට ඉන්න කියලා ෆොටෝ ගැහුවා... ඒ මනුස්සයා මගේ කොන්ඩේ හදන්න ගිහින් තව පොඩ්ඩෙන් ගුටිත් කනවා... ඒ වෙලාවේන් පස්සේ මනුස්සයා කොන්ඩේ තියෙන විදිහ අනම් මනම් නිතිනු අයියට තමයි හදන්න කිව්වේ... ෆෝටෝ පහ හයක් අරන් ඒ මනුස්සයා වැඩේ නැවත්තුවා මන් හිතන්නේ නිතිනු අයියගෙන් බැනුම් අහන්න බැරිවටද කොහෙද... කපල් ෆොටෝ එකක් ගමුද කියල ඇහුවම නම් එයා මං ගාවට ආවේ පියබලා වගේ... එයත් එක්ක ඉන්න ඒවනම් මූන පේන්න ගන්න දුන්නා.... කපල් ෆෝටෝස් ගොඩක් අරන් ඒ මනුස්සයා අපට තෑන්ක්

කරලා යන්න ගියේ නිතුනු අයියගේ ඊ මේල් ඇඩ්‍රස් එකත් ඉල්ලන්..

"ඇයි තනියෙන් ඉන්න ඒවගේ මූන පෙන්නන්නේ නැතුව ගහලා කපල් ෆොටෝ වල මූන පෙන්නන්න දුන්නේ.... "

මං ඇහුවේ ට්‍රැෆික් එකේ කාර් එක නවත්තලා තියන වෙලාවක...

"එතනදි කිව්වා වගේ.. මං ගාව ඇරෙන්න කාගෙ ලගවත් ඔයාගේ ෆොටෝ තියනවට මං කැමති නෑ...

මට ඉරිසියයි.. කපල් ෆොටෝ එකේ මූන තිබ්බට කමක් නෑ... මට ඕනේ ලෝකෙටම පේන්නන්න ඔයා මගේ කියලා.... "

මගේ අතක් ඉබින ගමන් එයා කියන්නේ... එයාට මන් ගැන තියෙන්නේ තන්හාවක්.. ආදරයත් එක්ක තන්හාව ඇති වෙන එක සාමාන්‍යය් කියලා මන් තේරුම් ගත්තේ එයාගෙන්මයි..

අපි ගෙදර එන මගදි එයා මාව එක්කන් ගිහින් අරවගේම ලස්සන මාලු ජෝඩුවම අරන් දුන්නා.... මන් නිකමට ඉල්ලුවේ උනත් එයා ඒක මතක තියාගෙන ඉදලා අරන් දුන්නා.... තෑග්ගටත් වඩා මට වටින්නේ එයාගේ සිතුවිලි...

ලස්සන රවුම් මාලු ටැංකියකුත් ගත්තා එයා... ඒකට දැම්මම ඒ දෙන්නා හරිම ලස්සනයි..

## 27 කොටස

ගෙදර ඇවිත් මාලු ටැංකිය දිහා බලන් මං කල්පනා කරේ නිතිනු අයියගේ හිත සංසුන් වෙන්න මොනාද කරන්න ඕනේ කියලා.... අන්තිමේට මං තීරනය කරා කොහේ හරි ට්‍රිප් එකක් යන්න... මගේ අදහස කියන්න හිතාගෙන අයියවයි නිතිනු අයියවයි හොයාගෙන ගියා... දෙන්නම හිටියේ නිතිනු අයියගේ කාමරේ...

"එක්ස්කියුස් මී බෝයිස්... ඔයාලා වැඩක්ද... මට තියනවා වැදගත් කතාවක්.."

නිතිනු අයියනම් කියපු පමාවට අතේ තිබ්බ ලැප් එකත් පැත්තකින් තියලා මං දිහා බැලුවා... අයියගේ අතේ තිබ්බ ලැප් එකත් අයින් කරලා මං එයාගේ ඔඩොක්කුවෙන් වාඩි වුනා..

"අපි ට්‍රිප් එකක් යමුකෝ..."

"බබාට යන්න ඕනෙ නම් යන්.."

නිතිනු අයියනම් කියපු ගමන්ම කැමති වුනා.. සතුටට මං අත්පුඩියකුත් ගැහුවා...

"අයියා ඔයත් කැමතියි නේද..."

"මේකා මට නිවාඩු දෙනවනම් ඉතින් මාත් කැමතියි.. "

"හරි එහෙනම් නුවරයි නුවර එළියෙයි යමු.. හෝර්ටන් තැන්නෙයි , පේරාදෙනියෙයි , මාලිගාවෙයි ගිහින් අපි කැම්ප් ගහමු... "

මං කිව්වේ උඩ පැන පැන

"සුදූ අපි අහසිටත් එන්න කියමු..."

අයියා කිව්වහම මං කටත් ඇරන් බලන් හිටියා එයා දිහා...

"ඔයා කොහොමද අහසි අක්කව දන්නේ.. "

"ආ මේ එයා මගේ යාලුවගේ ඩොක්ටර් නේ.. ඉතින් දන්නවා..... නිතිනු ගේ වගේම මගෙත් යාලුවෙක්.."

"ඒත් අහසි අක්කා පලවෙනියට හම්බෙච්ච දවසේ කිව්වනේ ඔයාව දන්නේ නෑ කියලා.... "

මං එහෙම කිව්වම නිතිනු අයියට බකස් ගාලා හිනා ගියා... අයියා එයා දිහා ඔරවලා බැලුවා...

"ලගදි අඳුරගත්තේ.. "

අයියා මූන හංගගෙන එහෙම කියලා කාමරේට ගියා... අයියා ගිය දිහාම බලන් මන් කල්පනා කරේ එයාගේ හොරේ මොකක්ද කියලා.. නිතිනු අයියා මගේ ලගට ඇවිත් මගේ පිට ඒ පපුවට තුරුල් කරගත්තා..

"බබා..."

"මට ඉරිසියයි.. "

"ඒ මොකද ඒ..."

"බබා අයියගේ ඔඩොක්කුවෙන් ඉදන් හිටියනේ.. මට ඉරිසියයි.. "

"අනේ මෝඩයෝ ඒ මගේ අයියනේ.."

"මං දන්නවා.. ඒත් මට ඉරිසියයි.. "

"කෝ ඉන්නකෝ එහෙනම්"

මං එයාගේ ඔඩොක්කුවෙන් වාඩි වෙලා නලලට හාද්දක් දුන්නා....

"ම්ම් දැන් හරිද මගේ තිනු කොල්ලට.."

"නෑ.. එකක් මදි ගොඩක් ඕනේ... "

"අනේ යනෝ යන්න හොර කොල්ලා.. මං අහසි අක්කිට කතා කරන්න ඕනේ... "

"එයාට අයියා කතා කරයි ඔයා ඔහොම ඉන්න.. මං ගාව"

එහෙම කියල එයා මගේ පපුවට කම්මුල තියාගත්තා...

"අපේ අයියා මොනාද හංගන්නේ.. ඇයි එයා කලබල උනේ.... ඔයා දන්නවද.."

"ම්ම්ම් මං දන්නේ නෑ අනේ ඉන්න දෙන්නකෝ මට.. "

"ඔයා දන්නව ඔය බොරු කියන්නේ... "

"ඔලුව අතගාන්නකෝ මැනික සනීපයි ඔයා ගාව.."

එයා මාතෘකාව වෙනස් කරනවා.. ඒ කියන්නේ මොකක් හරි හොරයක් තියනවා කියන එක.. කමක් නෑ මං හොයාගන්නන්ම් කෝ..

ට්‍රිප් එක යන දවසේ උදෙන්ම නැගිටලා ඩෙනිමට කොට ටීශර්ට් එකක් ඇදලා උඩින් ඩෙනිම් පැකට් එකක් දලා ශූස් දලා ලේස්ති උනා... ඔක්කොම අරන් දුන්නේ තිතිනු අයියා තමයි.. මන් එපා කියද්දි ලක්ශෙක විතර ඇදුම් අරන් දුන්නා.. එයා ආසාවෙන් අරන් දුන්න නිසා ගත්තා මිසක් මට එච්චර ගානක් වියදම් කරන්න හිතුනේ නෑ... මට දැනෙන්නේ හරියට මං එයාගෙන් සල්ලි කඩා ගන්නවා වගේ...

ලොකුම ලොකු බෑග් එකත් අරන් මං අමාරුවෙන් සාලෙට එද්දි තිතිනු අයියත් කාමරෙන් එළියට ආවා... එයත් මගේ පාටම ඇදුම් ඇදලා... එද මටයි එයාටයි එක වගේ ඒවා තමයි ගත්තේ... එයා හිනාවෙලා මගේ අතේ තිබ්බ බෑග් එක අතට ගත්තා...

"ලස්සනයි බබා අද... ගොඩක් පරිස්සන් කරගන්න වෙයි මට.. "

"ඔයත් ගොඩක් හැන්ඩ්සම් අද.. තලුවෙක් වගේ... හොද වෙලාවට එක වගේ ඇන්දේ.. එතකොට ඔයාට අයිති කාරයෙක් ඉන්නවා කියලා පෙනෙයි නේ.."

එයා හිනාවෙලා බෑග් එකත් අරන් එලියට යන්න හදද්දි මාත් එයාගේ පස්සෙන් ආවා... එලියට එද්දි අයියයි අහසි අක්කයි කතාවක.. එයා ආවා කියලා මත් දන්නෙත් නෑ... මං නිතිනු අයියට ඉස්සරහට යන්න නොදී අතින් අල්ලගත්තා...

"ඔයා තාමත් නංගිට කිව්වේ නැද්ද ආරාධ්‍ය "

අහසි අක්කි අපේ අයියට කියද්දි මං අහන් හිටියේ එයාලා මොනා ගැනද කියන්නේ කියලා දැනගන්න... නිතිනු අයියනම් හදන්නේ අයියට අපි මෙතන ඉන්නවා කියලා කොහොමහරි අගවන්න.. එයාගේ කට අතින් වහන් එයාව පාලනය කරගත්තා...

"තාම කිව්වේ නෑ... "

"එයා පොඩි ළමයෙක් නෙවෙයි බබා.. ඉක්මනට දැන ගනී... ඊට කලින් ඔයා කියන එක හොදයි නේද... නැත්තම් එයාට දුක හිතෙයි... "

අහසි අක්කා කිව්ව කතාවෙන් මං තේරුම් ගත්තා එයාලා මොනාද හංගන්නේ කියලා.. නිකම්ම නිකම් කෙල්ලෙක් කොල්ලෙක්ට බබා කියන්නේ නෑනේ... මට දුක හිතුනා... ටිකක් නෙවෙයි ගොඩක්...

මං නිතුනු අයියගේ අතින් කාර් එකේ යතුරයි බෑග් එකයි උදුරන් ඒ දෙන්නා මැදින් ගිහින් කාර් එකට නැග්ගා... මං දැක්කා අයියා ගැස්සෙනවා.. පිටිපස්සේ ශීට් එකෙන් ඉදගත්තේ.. නිතිනු අයියත් එක්කත් තරහයි මට.. එයාවත් කිව්වේ නෑ... අයියට නිතිනු අයියා මොනාද්‍රේ කිව්වට පස්සේ අපේ අයියා කාර් එකට නැග්ගා...

"සුදූ.. අහන්නකෝ... මං කියන්න හිටියේ......."

"ඕනෙ නෑ මට කියන්න... මං ඔයාගේ කවුරුත් නෙවෙය් නේ.. යන්න එයා ලගට.. "

බොහොම අමාරුවෙන් කඳුලු පාලනය කරන් මන් හිටියේ... මට ඇහුනේ නැත්තම් එයා අද වුනත් කියන්නේ නෑනේ...

"සුදූ.. අහන්නකෝ දරුවෝ.... "

"ඕනෙ නෑ... ඕනෙ නෑ... යන්න මෙතනින්..."

මං කෑගහලා ඉයර්ෆෝන් එක ගහගත්තා... ටික වෙලාවක් ඉදලා අයියා යන්න ගියා... ඊට පස්සේ ආවෙ නිතිනු අයියා..

"බබා... අයියට පොඩ්ඩක් ඇහුන්කන් දෙන්නකෝ.. එයාව පොඩ්ඩක් තේරුම් ගන්න බලන්න.."

මගේ ඉයර්ෆෝන්එක ගලවලා එයා කියන්නේ... මන් එයා දිහා බලලා එයාට එරෙව්වා.. ආයෙත් ඉයර්ෆෝන් එක ගහගන්න හදද්දි එයා මගේ අතින් අල්ල ගත්තා...

"ඇයි ඔයා ඔහොම හැසිරෙන්නේ.. චුට්ටක් එයාලව තේරුම් ගන්න බලන්න.. හිතුවක්කාර වෙන්න එපා... "

"ඔව් මං හිතුවක්කාරයි තමයි.. අද වුනත් මගේ කනට ඇහුනේ නැත්තම් එයා කියන්නේ නෑ මට.. ඔයා උනත් දැනගෙන මට කිව්වේ නෑ... කවුරුත් ඕනේ නෑ මට ඔය තුන් දෙනා තනියම යන එකයි ඇත්තේ... "

හය්යෙන් කෑ ගහලා මන් කාර් එකෙන් බැස්සා මගේ බෑග් එකත් අරන්ම.. නිතිනු අයියා මගේ අතින් අල්ලන්න හදද්දි ඒ අත ගසලා දාලා මං ගෙට එන්න ආවේ... ඒත් මගදි අයියා මාව අල්ලගත්තා...

"ආරු මොකද මේ ආ.. මං වැරැද්දක් කරා මං ඒක පිළිගන්නවා.. ඒකට සොරි... ඔයා හිතනවා වගේ ඒක නොකියා ඉන්න හැදුවේ නෑ මං.. ඒකට ඔච්චර නටන්න ඕනේ නෑනේ... ඇයි අරූටත් කෑ ගහන්නේ.. විකාර නැතුව කාර් එකට නගිනවා... "

"මට බෑ ඔය තුන් දෙනා යන එකයි ඇත්තේ... මං තනියෙන් ඉන්නවා ගෙදර.. කාටවත් ඕනෙ නෑ මට.. පාඩුවෙ ඉන්න දෙන්න.."

"ආරු මගෙන් ගුටි නොකා නගිනවා වාහනේට... තමුසේ මගේ නංගි මිසක අම්මා නෙවෙයි නේ ඔහොම කෑ ගහන්නේ... නිතිනු මෙන්න මෙයාව කාර් එකට දගනින්.."

"මං කිව්වනේ මං යන්නේ නෑ... "

ඇස් දෙකත් ලොකු කරලා මං හය්යෙන් කෑ ගැහුවා... මට ඉක්මනටම කේන්ති යනවා... ඒ වෙලාවට මට මාවම පාලනය කරගන්න බෑ... බෑග් එකත් අරන් මං ගෙට යන්න හද්ද්දි අය්යා ඉක්මනට දෙර ලොක් කරලා යතුර අතට ගත්තා... මං කොච්චර දැගලුවත් යතුර ගන්න බැරි වුනා..

"යතුර දෙන්න..."

"බෑ මගේ ගෙදර යතුර තියෙන්න ඕනෙ මන් ලග මිසක් තමුසේ ලග නෙවෙයි නේ.."

ඒ කතාවට නම් ගොඩක් හිත රිදුනා මගේ.. අහසි අක්කා එයාගේ ජීවිතේට ආපු ගමන් එයාට මාව පිට කෙනෙක් වෙලා..

"ආරාධ්‍ය ස්ටොප් ඉට්.."

අහසි අක්කා අයියට කෑ ගහනවා ඇහුනා...

"බබා අයියා අදහස් කරේ ඔයා හිතන දේ නෙවෙයි"

නිතිනු අයියා මාව සනසන්න හදනවා... මං කඳුළු පිරිච්ච ඇස් වලින් අයියා දිහා බලන් ඉදලා බෑග් එකේ ශිප් එක ඇරලා ඒකේ තියන ඒවා විසි කර කර පර්ස් එක හොයාගත්තා.. පර්ස් එක අයියා අරන් දුන්න එකක්.. ඒකත් බිමට දලා අය්ඩෙන්ටියයි සල්ලියි කාඩ් එකයි විතරක් අතට ගත්තා... බෑග් එකේ තියන ඇඳුම් නිතිනු අයියා අරන් දුන්න ඒවා.... ඒ නිසා බෑග් එකත් එතනින්ම දලා මං අයියා දිහාට හැරුනා...

"ගොඩක් ස්තූතිය් මාව මෙච්චරකල් බලාගත්තට.."

වෙව්ලන හඩින් කතා කරලා මං හැදුවේ එතනින් යන්න.. ටවුන් එකට ගිහින් ගෙදරට යන බස් එකක් හොයාගන්න පුලුවන් මට.. බැරි වුනොත් ශනූ ලගෙ ගෙදර යනවා... ඒත් නිතිනු අයියා මාව තද කරලා බදගත්තා..

"මැනික ඇයි මේ.. සංසුන් වෙන්න.. ඔයා කේන්තියෙන් ඉන්නේ... පස්සේ පසු තැවෙයි ඔයා මේ ගැන ප්ලීස් කාම්ඩවුන්.. මගේ හොද බබා නේ ඔයා.. මගෙ පැටියා... ප්ලීස් ඔහොම හැසිරෙන්න එපා... දරාගන්න බෑ මට.. "

මාව තුරුල් කරන් එයා මගේ ඉස්මුදුන ඉබින ගමන් මගේ පිටට තට්ටු කරනවා..

මං ටික වෙලාවක් දගලලා එයාගේ පපුවේ මූන ඔබාගෙන ඉකිගගහා ඇඬුවා... ඒත් එක්කම අයියා මාව ඇදලා අරන් තුරුල් කරගත්තා.... මත් එයාව තල්ලු කර කර ගැලවෙන්න දැගලුවා.. ඒත් අයියා මාව තදට බදාගෙන හිටියේ...

"අයියව දලා යන්නද හැදුවේ.... පුලුවන් ද අයියත් එක්ක තරහ වෙලා ඉන්න.. ඈ සුදූ පුලුවන් ද අයියත් එක්ක තරහ වෙලා ඉන්න... තමුසේ මගේ පනතේ සුදූ... අයියා වැඩිපුරම ආදරේ ඔයාට කියලා දන්නවා නේද... කාවවත් ඔයාව තරම් වටින්නේ නෑ මට... "

අයියගේ හඩ බොද වෙලා.. මාත් දගලන එක නතර කරලා එයාව හපාගෙන හැඬුවා... ටික වෙලාවක් හපාගෙන ඉදලා මංම එතන අතගෑවා... අයියා මගේ නලලෙන් හාදුවකුත් තිබ්බා...

"එච්චර කල් නෑ අපේ සම්බන්දේට.. ඉස්සල්ලාම ඔයාට තමයි කියන්න හිටියේ.. අද කියන්න ඕනේ නිසයි අහසිව ගෙන්න ගත්තේ... "

අයියා මගේ ඔලුව අතගාන ගමන් කිව්වේ.. මට පසුතැවීමක් වගේ ලැජ්ජාවකුත් දැනුනා මන් හැසිරිච්ච විදිහ ගැන...

"සොරි.."

"ඒ මොකටද..."

"මෝඩ විදිහට හැසිරුනාට.. දුක හිතුනා මට.. ඔයා දන්නවනෙ දුක හිතුනාම මට කේන්ති යනවා කියලා.... "

"හරි හරි ඒකට කමක් නෑ... නිතිනු අයියට කතා කරන්න... එයාට මං කිව්වා කියන්න එපා කියලා.... ඒකයි කිව්වේ නැත්තේ... යාලූ කරන් එන්න මමයි අහසි අක්කයි ඉස්සරහින් යන්නම්"

මං අයියට ඔලුව වනලා නිතුනු අයියා දිහා බැලුවා... එයා මං විසි කරලා දාපු රෙදි ටික එයා ආයෙත් බෑග් එකට දානවා... පේමන්ට් එක වගේ කොටසේ නිසා වැලි ගෑවෙන්නේ නෑ... එයා පව්..

අහසි අක්කත් මගේ පිටට තට්ටුවක් දැම්මත් මං එයා දිහා බැලුවෙවත් නෑ... මොනා උනත් අයියා මට බැන්නේ එයා නිසා.. කවදාවත් නැති තරම් හිත රිදෙන කතා එයා නැත්තම් මට අහන්න වෙන්නේ නෑ... ගනන් ගන්නේ නැතුව නිතිනු අයියා ලගට ආවා... අයියයි අහසි අක්කයි අහසි අක්කගේ කාර් එකට නැග්ගා... අයියට කාර් එකක් නැති එක ගැන මට දුක හිතුනා... එයාට අනුන්ගේ ඒවගේ යන්න වෙලා... කමක් නෑ එන මාසේ එයා කාර් එකක් ගන්නනේ ඉන්නේ...

"බබා අයියගෙන් යතුර ඉල්ලගන්න.. ඔයා මේවට කැමති නෑනේ... අපි වෙන ඒවා ටිකක් ගමු "

ඇඳුම් බෑග් එක දිහා බලන් එයා කියන්නේ... කාලය හරහා යන්න පුලුවන් වුනා නම් කියලා හිතුනා මට.. තව චුට්ටක් ඉවසුවනම් මෙතන කාගෙවත් හිත රිදෙන්නේ නෑ... හිත නිදහස් කරන්න ට්‍රිප් එකක් යන්න ලෑස්ති වෙලා තිබ්බටත් වඩා එයාගේ හිත කඩලා දැම්මා මං.. මං එයාගේ අතේ තිබ්බ බෑග් එක අරන් කාර් එකට දාලා එයා ලගට ආවා... ඒ වෙලාවේම වගේ තමයි අයියලා කාර් එක පාරට දැම්මේ...

නිතුනු අයියගේ බෙල්ලෙ එල්ලිලා බොහොම අමාරුවෙන් මං කකුල් එයාගේ ඉනවටේ බැදගත්තා.. එයා ඉන්නවා ඇස් ලොකු කරන්.. දෙපාරක් නොහිතා මං එයාගේ තොල් දෙක මගේ දෙතොලින් අල්ලගත්තා... වැඩි වෙලාවක් යන්න කලින් නිතිනු අයියා මාව ඇගටම තද කරන් මගේ දෙතොල් පහස වින්ද... පලවෙනි වතාවට මං කිස් කරේ එයාව... ලැජ්ජාවෙන් මං එයාගේ උරහිසේ මූන ගහගත්තා... මං එයාගෙ තොල්වලට උස නැති නිසයි එයාගේ ඇගේ එල්ලුනේ.. වඳුරු පැටියෙක් වගේ මං ඒ තුරුලේ ඉද්දි එයා දෙපත්තට පැද්දෙනවා.. එහෙම්මම මාව වඩාගෙන කාර් එක ඇතුලෙන්ම තිබ්බා...

කාර් එකට නැගලත් එයා එයාගේ තොල් අල්ලල හිනා වෙනවා..

දැන්නම් එයා ඉන්නේ හිටියටත් වඩා 10 ගුනයක් සතුටින් වගේ... ටික වෙලාවක් තනියම හිනාවෙවී ඉදලා එයා වෙල් ටිශූ එකක් අරන් මගේ මූන පියදැම්මා.. මං එයාගේ අත අල්ලගෙන කිස් එකක් දුන්නා අතට.....

"මට කේන්ති ගියාම පාලනය කරගන්න බෑ... ඒ වෙලාවට මගේ පැත්ත ගත්තෙ නැති වුනාම තවත් කේන්තිය වැඩි වෙනවා.. ඒ වෙලාවට මාව හග් කරන්න දගලන්න බැරි තරම් තදට ඉස්සල්ලා කරා වගේ... එතකොට හරියනවා.."

එයාගේ අතක් මගේ කම්මුලට තියන් මන් කිව්වේ... එයා මගෙ මූන පුරාම හාදු තියලා වාහනේ ස්ටාට් කරා...

මගින් බහින හැම තැනකදිම මං හිටියේ අය්යගේ අත බදන්.. අහසි අක්කා අය්යා ලගට එනවට ඉරිසියයි මට.. සමහර තැන්වලදි ඒ දෙන්නා අත් අල්ලන් ඉන්නවෙලාවට අත් දෙක මැදින් කඩලා මං අය්යගේ අතේ එල්ලුනා හිතක් පපුවක් නැති ගානට..

ඇඩිශන් බංගලාවට යන ගමනුත් මං කරේ ඒ වැඩෙමයි.. කාර් එක නවත්තපු ගමන් දුවලා ගිහින් අයියගේ අතේ එල්ලුනා අහසි අක්කව තල්ලු කරන්.. එයා අපිට ටිකක් ඈතින් අපිට සමාන්තරව ආවා... අයියා මන් දිහා බලලා හිනා වුනත් මට මුකුත් කිව්වේ නෑ...

"ආ...හ්"

නිතිනු අයියගේ සද්දෙට අපි තුන් දෙනාම හැරිලා බැලුවා..... එයා කකුලක් අල්ලන් හිටපු නිසා මං අයියගේ අත අතෑරලා දුවන් ආවා එයා ලගට..

"අනේ.. ඔයාට මොකද වුනේ... තුවාල වුනාද ඔයාට.. කොහෙද තුවාල වුනේ... ගොඩක් තුවාලද.."

මං එයාගේ කකුල් දෙක ලග නැව්ලා එයාගේ තුවාලේ හෙව්වා.... ඒත් තුවාලයක් තිබ්බෙ නෑ... එයා මාව උස්සලා ගලක් උඩින් තිබ්බා... ඈතින් අයියලා යනවා... නිතිනු අයියා බොරුවක් කරේ කියලා තේරුන නිසා මන් හැදුවේ ආයෙත් අයියලා ඉන්න තැනට දුවන්න...

"මන් ගාව ඉන්න කැමති නැද්ද"

එයා අහපු නිසා මන් නතර වුනා.. එයා මගේ දිහාම බලාගෙන කොන්ඩ කැලි හදනවා...

"බබා.. බලන්නකෝ අර කපල් එක දිහා... "

එයා පෙන්නුවේ ෆොරිනර් කපල් එකක් ඒ බෝයි ගර්ල්ට චූටි මලක් කඩලා දුන්නා.... එයා හිනාවෙවී ඒක අරන් කන ලගින් ගහගත්තා... හරිම ලස්සනයි ඒ දෙන්නා එකට ඉද්දි...

"ආදරේ කරන දෙන්නෙක් එකට දකින එකත් ලස්සනයි නේද බබා.. "

"හ්ම්ම් ඒ දෙන්නා කියුට්"

"බැරි වෙලාවත් ඒ දෙන්නා වෙන් වුනොත් අපිට පේන්නම ඔයාට දුක හිතෙයිද.."

"මොනාද අනේ කියන්නේ... එහෙම කියන්නවත් හොද නෑ... ඇයි එහෙම දෙයක් කිව්වේ ඔයා"

"එතකොට අහසි අක්කියි අයියයි වෙන් වුනොත් විතරක් ඔයාට සතුටු හිතෙයිද බබා.. ඒ දෙන්නත් අපි වගේ ලස්සනට ආදරේ කරනව ඇති.... නිකමට හිතන්න මගේ කවුරුහරි ඇවිත් මං ඔයාට කිව්වොත් මං එයාට ඔයාටත් වඩා ආදරෙයි එයා අපි දෙන්නා එකතු වෙනවට කැමති නෑ ඒ නිසා අපි වෙන්වෙමු කියලා ඔයාට මොනා හිතෙයිද.."

මං නිහිනු අයියව තද කරලා බදාගත්තා.. එයා එහෙම කියන එකවත් මට දරාගන්න බෑ...

"අහසි අක්කිටත් එහෙම නේද ඇත්තේ බබා.. මේක අහලා බලන්නකෝ.. "

එයා මට අහන්න රෙකෝඩ් එකක් දුන්නා....

ඒකේ තිබ්බේ අයියගෙයි අහසි අක්කගෙයි වොයිස් රෙකෝඩ්ස් වගයක්...

"මට සමාවෙන්න අහසි මං එයොයා එක පටන් ගද්දිම කිව්වානේ මට ආරු තරම් ඔයාව වටින්නේ නෑ කියලා.... එයා කැමති නැත්තම් මට මේක නවත්තන්න වෙනවා.. මොකද එයා එයාගේ නෑනට කැමති නැති වුනොත් සහෝදරකම පවා ඈත් වෙන්න පුලුවන්... මට එහෙම ඉන්න බෑ... ආම් සොරි අපිට මේක නවත්තන්න වෙයි.. "

"ඔයාට පුලුවන් ද බබා මාව අතාරින්න... අපි ආරුට තේරුම් කරලා දෙමු.. නංගි එච්චර නපුරු කෙනෙක් නෙවෙයි.. අනික එයා මට ඉස්සර හරි ආදරෙයි... දැක්ක තැන හග් කරනවා මාව..."

"ඔව් එයා නපුරු කෙනෙක් නෙවෙයි... මමයි මෙතන වැරැද්ද කරේ.. මන් අද එයාට බැන්න නිසයි මේ සේරම.. එයා හිතන්නේ ඔයා නිසා මං වෙනස් වෙලා කියලා.... එයා සෙන්සිටිව් කෙනෙක් ඉක්මනට ආදරය කරුනාව දැනෙනවා වගේම ඉක්මනට දූක තරහත් දැනෙනවා... තමන්ගේ අයගේ ආදරේ ලග එයා ආත්මාර්තකාමීය්.. එයාට පුරුදු නෑ මගේ ආදරේ බෙදගෙන.. එද ඉදන්ම මං එයාට විතරක්ම ආදරෙ කරපු නිසා එයා හිතන්නේ ඔයා මාව එයාගෙන් උදුරගනියි කියලා.... ඒකයි එහෙම හැසිරෙන්නේ.."

"මට තේරෙනවා ආරාධ්‍ය සහෝදරයෝ දෙන්නෙක් අතරට ඇවිත් ඒ සම්බන්දේ කඩන වැඩේ මං කීයටවත් කරන්නේ නෑ... අපි තව ටිකක් ට්‍රයි කරමු.. බැරි වුනොත් අපි ඒ තීරනය ගමු.. මගේ ජොබ් එක මතකයි නේ.. මට හිත හදාගන්න බැරි වෙන එකක් නෑ... "

නිතිනු අයියා රෙකොඩින් එක ඕෆ් කරද්දි මං එයාට හේත්තු වෙලා කදුලු පියදගත්තා.. මගේ අයියා මට මේ තරම් ආදරෙයි කියලා මං දැනන් හිටියේ නෑ... මං වෙනුවෙන් එයාගේ ආදරේ කැපකරන්න තරම්..?? දෙවියනේ මං මොන පහත් වැඩක්ද ඒ කරන්න ගියේ...

"ඔයා වොශ් රූම් ගියපු වෙලේ එයාලා කතා කරනවා මට ඇහුනේ.. ආදරේ කරන අය අතරින් එක්කෙනෙක් තෝර ගන්න එක මහම මහ වේදනාවක් බබා.. අය්යා ඔයාව තෝර ගනියි.. ඒත් එයා සතුටින් ඉන්න එකක් නෑ... අනික හැමදාටම එයාට ඔයාගේ අයියා විතරක් වෙලා ඉන්න බෑනේ එයාටත් අනාගතයක් තියෙන්න එපැයි.. ඒ නිසා හොදට හිතන්න.. ඔයාට පව් පිරෙයි ඒ දෙන්නව වෙන් කරොත්... "

නිතිනු අයියා මගේ ඔලුව අතගාන ගමන් මට පැහැදිලි කරලා දුන්නා.... ටික වෙලාවක් කල්පනා කරලා මං බිමට පැනලා අයියලා යන දිහාවට දුවන් ගියා... අහසි අක්කා අය්යගේ අතක එල්ලිලා උරහිසට ඔලුව තියන් යනවා... මං දුවගෙන එතන්ට ගිහින් ඉස්සරහට පැන්නා...

අහසි අක්කා ගැස්සිලා වගේ පැත්තකට වුනා..

"අයියේ මට ඔය දෙන්නට කියන්න දෙයක් තියනවා... "

"මො.. මොකක්ද සුදූ කියන්න.."

"මං අහසි අක්කා මගේ නෑනා වෙනවට කැමති නෑ... "

## 28 කොටස

මං ඒ දෙන්නා දිහා මාරුවෙන් මාරුවට බල බලා කියද්දි මන් දැක්කා ඒ දෙන්නගෙම මූනු වෙනස් වුනා..

"නෑනලා ආවම අයියලා වෙනස් වෙනවලු.. මගේ යාලුවෙක්ගේ අයියා කෙනෙක් මුළු පවුලම දලා ගියාලු නෑනා නිසා.. ඒ හින්දු මන් නෑනලාට කැමති නෑ... "

"සුදූ... අයියා එහෙම නෑ... "

අයියා කියන්නේ වේදනාත්මක ස්වරයකින්... මං එයා ගනන් ගන්නේ නැතුව අහසි අක්කා ලගට ආවා... නිතිනු අයියත් මගේ ලගට ආවා...

"අහසි අක්කි මං ඔයාව මගේ නෑනා කරගන්න කැමති නෑ... "

"බබා... නෝ... මොනාද ඔයා කියන්නේ..."

තිතිනු අයියා පිටිපස්සේ ඉදන් කෑ ගහනවා... අහසි අක්කි කදුලු හිරකරගෙන මං දිහා බැලුවා හිනාවක් මවාගෙන..

"ඉට්ස් ඕකේ පැටියෝ... මං............"

"මං නෑන කෙනෙක්ට කැමති නෑ ඒ නිසා ඔයා මගේ අක්කි වෙන්න..."

එයා කියන්න හදපු එක නවත්තලා මං කියද්දි ඇස් පොල් ගෙඩි තරම් ලොකු කරන් එයා මන් දිහා බැලුවා.....

"මො... මොකක්ද පැටියෝ... "

"නෑනා කෙනෙක් ඇවිත් මගෙන් අයියා උදුරගන්නවට වඩා අක්කි කෙනෙක් ආවොත් මට මගේ අය තවත් වැඩිවෙයි.. කවදාවත් මට අක්කියෙක් ඉදලා නෑ... නෑදෑ වෙන කෙනෙක්වත් නෑ... කියන්න ඔයා මගේ අක්කි වෙනවා නේද... අයියව මගෙන් උදුරගන්නේ නැතුව මාත් එක්ක යාලුවෙක් වගේ ඉන්නවා නේද... "

"ඔව් පැටියෝ... මං මං ඔයාගේ අක්කි වෙන්නම්.. කවදවත් ඔය දෙන්නව වෙන් කරන්නේ නෑ... ඔයාගේ අයියව පන වගේ බලාගන්නම්... තැන්ක් යූ පැටියෝ... මං දැනන් හිටියා ආරාධ්‍ය ගේ සුදු නංගි නපුරු නෑ කියලා.... කොහොමත් මට ආරාධ්‍ය විතරක් නෙවෙයි පවුලේ අයවත් ඕනේ.... "

අහසි අක්කි මාව බදාගෙන හයියෙන් අඩන්න ගත්තා... මටත් ඇඩෙනවා.... අහසි අක්කිගෙන් මිදුනු තත්පරේම මං හිරවුනා අයියගේ පපුවේ.... මාව අගල් දෙකතුනක් උඩට ඉස්සුනා...

"තැන්ක් යූ සුදූ... මං බයේ හිටියේ කැමති වෙන්නැති වෙයි කියලා.... කවුරු මගේ ජීවිතේට ආවත් ඔයාගේ තැන වෙනස් වෙන්නෑ... ඔක්කොටම කලින් මං ඔයාගේ අයියා උනේ.... "

"මෝඩයා.. මෝඩයා... කෙල්ලන්ට බලාපොරොත්තු දීලා අතාරින්න නේ හැදුවේ.... ඉන්නවා මං අම්මට කියන්න... මහලොකු පුතාගේ වැඩ..."

දගලලා දගලලා අය්යගෙන් මිදිලා මං එයාගේ පපුවට ගැහුවා... අය්යා මගේ අත්දෙක අල්ලගන්න හදනවා... මං දගලාලා අත් ලිහාගෙන එයාට ගැහුවා...

"නිතිනු මෙන්න මේකව ගනින්කෝ බන්... මන් අද ගුටි කාලා ඉවරයක් වෙනවා.. බේරගනින් මාව... "

අයියා කෑ ගහනකොට නිතිනු අයියා ඉනවටේ අතක් දලා මාව තනි අතින් උස්සගත්තා... කකුල් දෙක ගස ගස මන් දගලද්දි එයා මාව එහෙමම තියන් හිනාවෙනවා...

"හරි හරි ඕකිව බිමින් තියලා යමන් ආපු ගමන යන්න... මෙතන ඩ්‍රාමා පෙන්නුවා ඇති නේ.."

අයියා අහසි අක්කිගේ උරහිසෙන් අත් දාගෙන කියන්නේ... අහසි අක්කා එයාගේ අත අස්සට වෙලා තාම අඩනවා.. සතුටට... එයා ගොඩක් ආදරෙයි අයියට... අයියා සතුටින් ඉන්න ඕනෙ නිසානේ එයාව අතාරින්න උනත් කැමති උනේ.. මගේ අයියට හම්බෙන්න ඕනේ ඒවගේ ලස්සන හදවතක් තියෙන කෙනෙක් තමයි...

"නිතිනු අය්යේ.. මගේ ප්ලෑන් එක සක්සස්.. දැන් අපිට ඔයාගේ ට්‍රීට්මන්ට්ස් නොමිලේ කරන්න පුලුවන්... ඔන්න මං ඔයාට මාසෙකට ලොකු ගානක් ඉතිරි කරලා දුන්නා.... "

අහසි අක්කව හිනස්සන්න හිතන් මං එහෙම කිව්වේ... හිතුවා වගේ එයා හිනාවුනා...

"මෝඩි.. මෝඩි මාව බයකලා.."

අඩන ගමන් හිනාවෙවී එයා මගේ උරහිසට ගහනවා... ගහනවා කිව්වට පවන් ගහනවා වගේ.. අයියත් හිනාවෙවී අහසි අක්කිව ලගට ගත්තා...

"උබලා දෙන්නා පලයල්ලා තව ටිකකින් අපි දෙන්නා එන්නම්.."

නිතිනු අයිය එහෙම කියද්දි අයියලා විතරක් නෙවෙයි මාත් කට ඇරන් එයා දිහා බැලුවා.....

"ඒ මොකද ඒ "

"උබලා දෙන්නා මාරුවෙන් මාරුවට මගේ කෙල්ලව බදගත්තා.. ඉතින් මං ඔටුවද... මටත් ඕනේ බදගන්න.."

මාව බිමෙන් තියන ගමන් නිතිනු අයියා කිව්වේ... බිමෙන් තිබ්බ ගමන් ම මං එයාගේ අතක් අස්සේ හැංගුනා.. මොනාකියනවද මන්ද අය්යලත් එක්ක...

"හරි හරි බදගනින්කෝ... සුදූ අපි ගියාට අවුලක් නෑ නේද... "

අයියා හිනාව හිරකරන් නිතිනු අයියා දිහා බලලා මගෙන් ඇහුවා.. මං බිමට මූන නවාගෙනම ඔලුව හෙල්ලුවා.... අයියා මගේ කොන්ඩෙ අවුල් කරලා අහසි අක්කිත් එක්ක ඉස්සරහට ගියා... ඒ දෙන්නා එකට ඉද්දි හරිම ලස්සනයි.

අහසි අක්කි අයියගේ ඇගේ දැවටි දැවටි යද්දි පොඩි ඉරිසියාවක් නැතුව නෙවෙයි... ඒත් එහෙමයි කියලා හැමදාටම අයියට තනියම ඉන්න බෑනේ... අයියා නැවිලා අහසි අක්කිට කිස් එකක් දුන්නා.. ඒක දැක්ක ගමන්ම මන් බැලුවේ නිතිනු අයියා දිහා...

"මටත් ඕනේ.... "

"මොනාද පැටියෝ... ??"

"ඇයි දැන් අයියා අහසි අක්කිට දුන්නේ.... "

"ආහ් සොරි බබා මන් දැක්කේ නෑ... මං ඔයා දිහා බලන් හිටියේ... "

"අයියා අහසි අක්කිට කිස් එකක් දුන්නා.... ඉතින් මටත්..."

මං එයාගේ අතක කුරුටු ගගා හොර බැල්මක් දැම්මා...

"ඉතිම්..."

"ඉතිම් මටත් ඕනේ.... "

"මොනාද මගේ චුටියට ඕනේ.... "

"නෑ මුකුත් මට එපා... "

මං ගස්සගෙන ඉස්සරහට ගියා... මාව බදගන්න කියලා ලග තියාගත්ත එක්කෙනා අන්තිමට බදගැනිලීත් නෑ මුකුත් නෑ...

"අය්යෝ බබා මොකද මේ.. විහිළුවක් කරේ.... අම්මේ මගේ කොච්චිකරල... කෝ එන්න කිස් එකක් දෙන්න..."

මාව ඇදලා ලගට අරන් මූන පුරාම කිස් කරා... එතනින් ගියපු ෆොරිනස්ලා අත්පුඩිත් ගහන් ගියා... ලැජ්ජාවේ බෑ... ලංකාවේ ඇන්ටිලා ටිකක් එහෙම ආවා නම් හොද ඒවගෙන් අහගන්න තිබ්බා...

"ම්ම්ම් ඇති ඔය.. අතාරින්නකෝ මාව... "

"බබා... ඔයා ඇඩිශන් බංග්ලෝ එකට ගිහින් තියනවද... "

"ම් ඔව් ඇය්... "

"අසයිද ඒකට... "

"ඔව් ඉතින් ලස්සනයි නේ... රෝසමල් ගොඩායිනේ... දැකලවත් නැති ඒවා තියෙය්..."

"ම්ම්ම්ම් එහෙනම් යන්කෝ බලන්න.."

"ඇයි එහෙම ඇහුවේ.... "

"නිකම් චූටි.... යන් අපි..."

"බෑ බෑ බොරු කියන්නේ ඔයා.. ඇයි එහෙම කිව්වේ කියන්න.."

"ඔයාව වෙනතැනකට අරන් යන්න හැදුවේ.... බබා මේක බලන්න ආසයි නේ ඒ නිස අපි මේක බලමු.."

"කමක් නෑ ඔයා කිව්ව දිහා යන්.. මේක බලලා තියෙයි නේ.."

"ඕන්නෑ බබා ඔයා අසයි නේ අපි මෙහෙ යමු.. "

"බෑ කිව්වනේ.. මට ඔයා කියපු තැනට යන්න ඕනේ.... "

එයා ඉස්සරහට යද්දි මං මග නැවතුනා.. අත් දෙකත් බැදන්.. නිතිනු අය්යා මත් දිහා බලලා ලගට ඇවිත් නහය මිරිකුවා..

"මගේ හුරතලේ.. මාව පිස්සු වට්ටනවා මැනික ඔයා... යන්කෝ එහෙනම්... මං කිව්ව තැනට..."

මාගේ ඉනවටේ අතදන් කාර් එකට එක්කන් ගියා එයා..

ටික දුරක් ඇවිත් පොඩි අතුරුපාරකින් ඇතුලට ඇවිත් කාර් එක නැවැත්තුවා... මාවත් එක්කන් ආවේ පුංචි වතුරපාරක් තියන තැනකට... ඒ හරියේ හරි නිස්කලංකයි.. කවුරුත් නෑ... කැලේට වෙන්න වගේ තියෙන්නේ.. මං විතර උස චූටි දියඇල්ලක් තියෙයි එතන.. හරිම ලස්සනයි.. මං දුවලා ගිහින් එතන තිබ් ගල් තලාව උඩට පැන්නා... .. ගලින් ගලට පැන පැන අහල පහල තියෙන චූටි චූටි මල් කඩා ගත්තා... නිතිනු අයියා මගේ ෆොටෝ ගන්නවා.. මං එයා දිහාට හැරිලා බෙල්ල පැත්තට හරවලා එක එක විදිහට හිටියා... එයා ෆොටෝ ගොඩක් අරන් මං හිටපු ගල උඩට ඇවිත් ඉදගත්තා.... මමත් එයාගේ අස්සටම වෙලා ඉදගත්තා.... එයාගේ මූන මගේ පැත්තට හරවන් කම්මුලක් හැපුවා.. නහයත් හැපුවා.. ඊටපස්සේ කෙලින් වෙලා අත් දෙක දිගෑරන් ඔලුවෙන් කිව්වා එයාට මගේ ලගට එන්න කියලා.... කියන පමාවට එයා ඇවිත් නැවතුනේ මගේ තුරුලේ...

"කවුරුත් නැති මේ වගේ ලස්සන තැනක ආදරේ පිරිච්ච මේ පපුවට තුරුල් වෙලා ඉන්න එක හීනයක් වගේ මැනික... හැමදම මෙහෙම ඉන්න ඕනේ මට.. ඔයා මේ මල් වලටත් වඩා සුවදය් බබා.. මං ආසය් මේ සුවද විද විද ඉන්න.. මට ජීවත් වෙනවා කියන හැඟීම දෙන්න පුලුවන් මේ සුවදට විතරයි.."

මගෙ තුරුලේ ඉදන් මුමුනනවා එයා.. තද කරලා බදන් මාව... ඔලුව අතගාද්දි තවත් ගුලිවෙනවා...

"මගේ පර්ෆියුම් එකේ සුවඳ තමයි ඉතින් ඔය"

මං හිනාව හිරකරන් කියද්දි එයා උරහිසක් හැපුවා.. මං වගේ හය්යෙන් හපන්නේ නෑ එයා..

"පර්ෆියුම් වලට වඩා සුවඳයි මගේ මැනිකගේ සුදද.."

"මගේ සුවඳ බලන්නද මාව තනියෙන් මෙතන්ට එක්ක ආවේ... "

"නිදහසේ ඉන්න ඕනේ උනා ඔයාගේ ආදරේ විදින ගමන් වදයක්ද මේම ඉන්න එක.."

"මොනාද කියන්නේ මෝඩයෝ.. මන්මනේ එන්න කිව්වේ තුරුලට.. හැමවෙලේම ඔහොම හිතන්න එපා... මං ඔයාගෙනේ... ඇයි ඉතිම් ඔයාව වදයක් කියලා හිතන්නේ...."

"හැම ආත්මෙකම මට ඔයාව ඕනේ.... හැමදම ඔයාගේ ලගම ඉන්න ඕනේ මට.. අය් ලව් යූ... අය් ලව් යූ මෝ දැන් ඉව්රිතින්ග්.."

"අය් ලව් යූ ටූ.. කවදාවත්ම දලා යන්නේ නෑ මං.. "

එයා නැගිටලා මගේ දෙතොල් අල්ලගත්තා.. දෙතොල් ලේ රස වෙනකම් සිපගත්තා එයා.. මගේ නලලට නලල තියන් වේගෙන් හුස්ම ඉහල පහල දලා ඔඩොක්කුවෙන් ඔලුව තියාගත්තා... මගේ අතත් පපුවට ගුලිකරන් ගල් තලාවේ දිගෑරිලා ඇස් පියාගත්තා... දැන් ඒ මූන හරි ලස්සනයි.. මගේ සත්කාර නිසා ඒ තොලුත් රෝසපාට වෙලා.. ඉස්සර මූනෙ තිබ්බ වේදනාවක සලකුනක්වත් මූනේ නෑ... එයාගේ මූන දිහ බලන් ඉදලා වතුර දිහා බලද්දි මන් දැක්කේ චූටි කූබියෙක් වතුරට වැටිලා ඉන්න හැටි... කැරකි කැරකි කෝටුවක් හොයද්දි එයා ඇස් ඇරලා මන් දිහා බැලුවා..... එතන තිබ්බ පොඩි පැලයක් කඩලා අරන් නිතිනු අයියට දීලා කූබියාව පෙන්නුවා... එයා ඒක අරන් කූබියව බේරගෙන ගල උඩින් තියලා ඌ යන හැටි දැකලා ලාවට හිනාවුනා...

"ඇයි ඔයා ඌව බේරගත්තේ... "

මං අහද්දි එයා ඇස් ලොකු කරන් මං දිහා බැලුවා...

"බබා ඇයි ඔයා එහෙම අහන්නේ.. බේරගත්තේ නැත්තම් ඌ මැරෙනවා.. අනික ඔයාමනේ මට ඌව පෙන්නුවේ.."

"මං පෙන්නුවට බේරගන්න කිව්වේ නෑනේ... අනික ඌ චූටිම චූටි කූබියෙක්.. මැරුනා කියලා දුක්වෙන්න කවුරුත් ඉන්නවා කියලැය්..."

"පැටියෝ ඔයාට මොනාද වෙලා තියෙන්නේ.. කූබියෙක් උනත් උගේ ජීවිතේ වටිනවනේ.. එහෙම කියන්න එපා... "

"චූටි කූබියෙක්ගේ ජීවිතේටත් වටිනාකමක් තියනවනම් ඔයාගේ ජීවිතේට කොච්චර වටිනාකමක් තියනවද අය්යේ.. බුදු හාමුදුරුවෝ කියලා තියනවා කන කැස්බෑවා වියසිදුරෙන් අහස බලනවා වගේ කලාතුරකින් ලූ මනුස්ස ජීවිතයක් හම්බවෙන්නේ ... ඉතිම් කොච්චර වටිනවද ජීවිතේ.. මතක තියාගන්න ඔයාව මේ ලෝකෙට වටින කෙනෙක්.. අච්චර ලොකු කම්පෙනි එකක් හැඩල් කරන ඔයා වැඩකට නැති කෙනෙක් නෙවෙයි... කොයිම වෙලාවකවත් ඔයාගේ ආත්ම ශක්තිය නැති කරගන්න එපා... කිසි දේකට බය නැති කාටවත් බය කරන්න බැරි ශක්තිමත් හස්බන් කෙනෙක් මට ඕනේ.... ඔයාට පුලුවන් නේද එහෙම වෙන්න... ඒ වෙනුවෙන් උත්සහ කරන්න... මං වෙනුවෙන්... "

කූබියව පෙන්නලා මට ඕනෙ උනේ එයාගේ වටිනාකම පෙන්නලා දෙන්න... මං කියපු දේවල් එයා හොදට අහන් හිටියා... මගේ උරහිසට ඔලුව හේත්තු කරන් දිය ඇල්ල දිහා බලන් ගොඩක් වෙලා කල්පනා කරා එයා..

"මටත් එහෙම වෙන්න ඕනේ බබා.. ඒත් මගේ ලෙඩේ නිසා ඒක අමාරුයි මට..."

" ඔයාට පුලුවන් අය්යේ.. ට්‍රීට්මන්ට් කරනවනේ අපි..

ඉක්මනට හොද වෙයි... විශ්වාසය තියාගන්න ඒ ගැන විශ්වාසය නැත්තම් කිසි දෙයක් හරියන්නේ නෑ... "

"ඔයා ලග ඉන්නවනම් මට ඕනෙ දෙයක් කරන්න පුලුවන් බබා.. මං එක්කම ඉන්න මං පුලුවන් තරම් උත්සහ කරන්නම්.."

"මං ඉන්නවා ඔයාට.. අපි ඉක්මනටම මේ හැමදෙයක්ම හරිගස්සගමු.. ඊට පස්සේ සතුටින් ඉමු අපි..ම්ම්ම්"

එයා මං දිහාම බලන් ඉන්නවා...

"දන්න්වද මං හිතුවේ "මං ඔයාට ආදරෙයි "කියන වචන තුන තමයි ලෝකේ තියන ලස්සනම වචන ටික කියලා.. ඒත් "ඔයාට මං ඉන්නවා "කියන වචන තුන ඊට වඩා ලස්සනයි වූටි.... මට විශ්වාසයි අම්මි තමයි ඔයාව මන් ලගට එවන්න ඇත්තේ... මගේ ජීවිතේ ලස්සන කරන්න..."

මගේ නලලෙන් හාදුවක් තියලා ආයෙත් මගේ ඔඩොක්කුවෙන් හාන්සි වුනා...

කාලය ගෙවිලා ගියේ හිතන්නවත් බැරි වේගෙන්.. එද ට්‍රිප් එකෙන් පස්සේ ගොඩක් වෙනස් වුනා එයා.. ට්‍රීට්මන්ට්ස් වලට වරද්දන්නේ නැතුව ගියා... මාවත් අරන් වීකෙන්ඩ්ස් වල පන්සල්වලට නිස්කලංක තැන්වලට ගියා...

අහසි අක්කා කියපු හැමදෙයක්ම මං හෙමින් එයත් එක්ක කතා කරා... හැබැයි එක දවසක් මන් මැරෙන කතාවක් කියලා ඒකට නම් හොදටම බය වුනා එයා... අහසි අක්කා කියන විදිහට එයා ටික ටික නෝමල් වෙනවා කියලා.... හැබැයි එයාට පෝබියා එක ඉස්මතුවෙන විදිහේ දෙයක් උනොත් ආපහු මුල ඉදන් ට්‍රීට්මන්ට් කරන්න වෙයලු.. ඒ නිසා එයාව බලාගන්න කිව්වා....

.....................................................................................

ඉන්ටවල් එකේ මන් හිටියේ ශනූ එක්ක නිතිනු අයියා ගැන කියව කියව... ඒත් එක්කමයි අය්යගෙන් කෝල් එකක් ආවේ... කවදාවත් මේ වෙලාවට ගන්නේ නැති නිසා මන් ඉක්මනට ආන්ස කරා...

"හෙලෝ අය්යේ.."

සුදූ ඉක්මනට ඔෆිස් එකට එන්න හදිස්සියක්..

"ඇ ඇ ඇය් අය්යේ... මො..මොකක්ද ප්‍රශ්නේ"

පරිස්සමෙන් ඉක්මනට එන්නකෝ සුදූ නිතිනු අයියට පොඩි ප්‍රශ්නයක්...

අයියා එහෙම කියද්දිම එහා පැත්තෙන් මොනා හරි බිදෙන සද්දයක් ඇහුනා...

ඒත් එක්කම අයියා නිතිනු කියලා කෑගහන සද්දෙකුත් ඇහුනා... ෆෝන් එක බිමට වැටෙන කම් මට දැනුනේ නෑ... ඇගම සීතල වෙලා ගියා...

"ආරු මොකද උනේ.... ආරු කතා කරපන්.. මොකද උනේ.... "

"නි... නිතිනු අ..ය්යට ප්‍ර..ප්‍රශ්නයක් ලූ.. ස..ද්ද වගයක් ඇ.ඇහුනා මට බයයි ශනූ.."

"බය වෙන්නෙපා ආරු නිතිනු අයියට මුකුත් වෙන්නෑ... වරෙන් යන්න මන් ටුක් එකක් දලා දෙන්නම්.... "

ශනූ මගේ බෑග් එක අරන් ඇවිත් මගේ කරේ එල්ලලා මාව එක්කන් ගිහින් ටුක් එකේ ඉන්දවනකම්ම මං හිටියේ සිහියෙන් නෙවෙයි.... ටුක් එක නවත්තනකොටම වැඩියෙනුත් සල්ලි දීලා මං දුවගෙන ගියා ඇතුලට..

"නිතිනු අයියගේ ඔෆිස් එක කී වෙනි ෆ්ලෝ එකේද.."

“8th ෆ්ලෝ එකේ මැඩම්"

රිසෙප්ෂන් එකේ ගර්ලා දෙන්නා මාව ඇතින් දකිද්දිම කටපුරා හිනාවේගෙන බලන් හිටියා... ඒත් මට ඒ දිහා බලන්න ඕනෙ උනේ නෑ.. ෆ්ලෝ එක අහන් ලිෆ්ට් එකට දිව්වා අසිහියෙන් වගේ...

ලිෆ්ට් එක උඩට යනකම් ලිෆ්ට් එකේ අඩි හප්ප හප්ප මං හිටියේ... හදවතගැහෙන වේගේ මටම දැනෙනවා.

## 29 කොටස

ලිෆ්ට් එකෙන් එලියට ඇවිත් වටපිට කැරකිලා බලද්දි ලගම දෙරක් තිබ්බා... ඒක අරින්න හැදුවත් අරින්න බෑ ඇතුලෙන් ලොක් කරලා... දෙරට දෙතුන් වතාවක් අතින් ගහලා වැඩක් උනේ නැති නිසා ෆෝන් එක ගත්තා අතට..... අත වෙව්ලනවා මගේ... බිම වැටිච්ච පාර ටෙම්පර්ට් එකටත් යටින් ඩිස්ප්ලේඑකේ ඉරී ගිහින්... සමහර තැන් ටච් වෙන්නේ නැති කොට ෆෝන් එක පොලොවේ ගහන්න හිතුනා මට... බොහොම අමාරුවෙන් අයියට කෝල් එකක් ගත්තා...

"අ අයියේ.. තිතිනු අයියා කෝ... එයාට මොකද.. මං ඉන්නේ 8 වෙනි තට්ටුවෙ මේ දෙර අරින්නකෝ... "

"හරි සුදූ ඔතනම ඉන්න මං එනවා... "

අයියා දුවගෙන වගේ ඇවිත් ඒ දෙර ඇරල මාව ඇතුලට අරන් ලොක් කරා...

"සර් ප්ලීස් ඕක නවත්තන්න"

"නිතිනු..."

අහසි අක්කියි තවත් බෝයි කෙනෙකුයි කෑ ගහන සද්දෙට මං ඒ පැත්තට දුවන් ගියා... අදහන්න මං දැක්ක දසුන නිසා මගේ කකුල් දෙකම පන නැති වෙලා ගියා...

ඔෆිස් රූම් එකම පිස්සන් කොටුවක් වගේ... ෆයිල්ස් අනම් මනම් ඔක්කොම සීසීකඩ... මල් වාස් කුඩු කරලා හැමතැනම වීදුරු කටු... නිතිනු අයියා කාමරේ මුල්ලක ඉදගෙන අත්දෙකෙන් කන් දෙකත් වහන් වෙව්ලනවා... මන් ඇතුලට යන්න හදද්දිම අයියා මගේ අතින් අල්ලා ගත්තා...

"සුදූ ඇතුලට යන්න එපා... එයාගේ තත්වේ හොදනෑ මේ වෙලාවේ... කවුරුහරි ලගට යද්දි අහුවෙන දේකින් ගහනවා එයා.."

"එ එයාට තුවාලවෙයි අයියේ.. මට එයා ලගට යන්න ඕනේ.... මුකුත් කරන්න්නෑ එයා මට.. "

"මේ වෙලාවේ හොද සිහියෙන් නෙවෙයි ඉන්නේ ඌ... කාවවත් අදුරන්නේ නෑ... අපි හැමෝම ට්‍රයි කරා... කියන දේ අහලා මෙහෙන් ඉන්න.. අහසි අක්කා මොනාහරි කරයි...

ඔයාට එන්න කිව්වේ මේ තත්වෙන් පස්සේ ලග ඉන්න එක හොද නිසා.... "

"කවුරු අදුරගත්තේ නැත්ත් එයා මාව අදුනනවා අයියේ.. මට විශ්වාසයි එයා මුකුත් කරන්නෑ මට.. ඔයාලා බලන් හිටියට මට බෑ එයා එහෙම ඉන්නවා බලන්න.."

අයියව එහාට තල්ලු කරලා මං ඇතුලට ගියා දොරත් වහගෙන... එයා මං එන සද්දෙට බාගෙට කැඩිච්ච බෝතලයක් විසි කරා මත් ඉන්න පැත්තට... හොද වෙලාවට මං ඉන්න තැනට ආවේ නෑ... මං එහෙම හිතන්න අකැමැති උනත් එයා හැසිරුනේ උමතු පුද්ගලයෙක් වගේ... අතින් කට තද කරන් මං ඉකිය පාලනය කරගෙන එයා ලගට ලං වුනා.. මූන කකුල් දෙක අතරේ ගහන් ඉන්නේ එයා... එහෙමම ඉදන් අතගාලා එයා ගත්තේ අර බෝතලේ අනිත් කෑල්ල... මට ගහන්න වෙනනැති... අය්යා කෑගහනවා එන්න කියලා.... ග්ලාස් වලින් රූම් එක වෙන්වෙලා තියන නිසා එයාට පේනවා... මං දන්නවා මගේ මූන දැක්කනම් නිතිනු අයියා ගහන්නේ නෑ කියලා....

"ආඅ..ව්ව්.."

බෝතල් කටුවක් ඇනුන නිසා මට කෑ ගැහුනා.. පොඩි කෑල්ලක්.. මං ඒක ගලවන්න නැවෙද්දිම නිතිනු අයියා ඔලුව ඉස්සුවා.. එයාගේ ඇස් රතු වෙලා මං දිහා බලන් ඉන්නේ මරන්න කේන්තියෙන් වගේ...

එහෙමම එයා අර බෝතල් කෑල්ලෙන් මට ගහන්න හැදුවේ....

"මගේ කකුල තුවාල වුනා.. රිදෙනවා මට.. ඔයා තවත් මට රිද්දන්නද හදන්නේ... ඔයාගේ චූටි පැටියට රිද්දනවද ඔයා... "

කඳුලු පෙරාගෙන මං එහෙම කියද්දි එයා සංසුන් වුනා.. එයාට නොදැනීම බෝතලේ කෑල්ල බිමට වැටුනා.. ඇස් වලින් කඳුලු ගලද්දි එයා දනගාගෙන වගේ ඇවිත් මගේ පපුවට තුරුලු උනා...

"චූටි මැනික... මාව දාලා යන්න එපා... මාව දාලා යන්න එපා... අම්මි වගේ ඔයත් යන්න එපා... මට තනියෙන් ඉන්න බෑ... "

මාව හිරට බදාගෙන එයා කෑ ගහලා ඇඬුවා.. වෙව්ල වෙව්ල තව තවත් මට තුරුල් වෙනවා.. මූනෙන් පවා දාඩිය බේරෙනවා එයාගේ...

"මං යන්නෑ අයියෙ කොහෙවත් යන්නෑ මං.. මගේ රත්තරංව දාලා මං කොහේ යන්නද... අඬන්නෙපා අයියෙ.. මං මං ඔයා ගාවම ඉන්නවා... "

ඉකිගගහා අඩ අඩ එයාව මගේ පපුවට තද කරන් කිව්වේ මං.. එයාගේ කඳුලු මාව අමු අමුවේම පුච්චනවා....

"එයා ඔයාවත් උදුරගන්නවා කිව්වා.... ඔයාව මට නැති කරනවලු.. අම්මි වගේම ඔයාවත් මගෙන් උදුරගන්න ඕනෙ එයාට... මට බෑ මගේ චූටි මැනික නැතුව ඉන්න... මට ඔයා නැතුව ඉන්න බෑ... ඉන්න බෑ මට.."

"එහෙම වෙන්නෑ... මං ඔයාව දලා යන්නේ නෑ කොහෙවත්.. කාටවත් ඔයාගෙන් මාව උදුරගන්න බෑ... "

මං මොනාකිව්වත් එයා සංසුන්වුනේ නෑ... තව තවත් වැඩිවෙනවා විතරය්.. පුලුවන් තරම් මගේ පපුව අස්සටම රිංගන් අඩනවා.... තාමත් වෙව්ලනවා එයා... ඒ හැඩි දැඩි අත් වලට හිරවෙලා මට රිදෙනවා.... ඒත් ඊට වඩා දහස් ගුනයක් පපුව රිදෙනවා මගේ..

ග්ලාස් ඩෝර් එක කඩාගෙන අයියයි අහසි අක්කියි අනික් පිරිමි ලමයයි ඇතුලට ආවා... මං ගාව ඉන්න හින්දද කොහෙද නිතිනු අය්යා කලබල කරේ නෑ... අහසි අක්කා ලගට ඇවිත් එයාට ඉන්ජක්ශන් එකක් විද්දා.. විනාඩියක් යන්නත් කලින් එයාට සිහිය නැති වුනා.. සිහිය නැති කරලා අයියායි අනික් එක්කෙනයි එයාව අරන් උඩම තට්ටුව්වෙ ගෙදරට ආවා...

"ඕහ් ශිට් මේකේ පාස්වර්ඩ් දන්නේ නෑනේ... "

එක අතකින් නිතිනු අයියාව වත්තම් කරන් අයියා හය්යෙන් දෙරට ගැහුවා...

"දැන් මොකක්ද සර් කරන්නේ... "

අනෙක් පිරිමි ලමයා අහද්දි අයියා කල්පනා කරනවා.. ඒත් එක්කම මට මතක් වුනේ එයා මට පාස්වර්ඩ් එක කිව්වා නේද කියලා.... ඒත් මතක් වෙන්නේ නෑ මට.. හිත කලබලයි..

"මං දන්නවා පාස්වර්ඩ් එක.. ඒත් මතක නෑ... "

"ඉක්මනට මතක් කරන්න සුදු... මෙහෙම තියන් ඉන්න අමාරුය් මේකව"

"මතක් වෙන්නේ නෑනේ "

"පැටියෝ කලබල වෙන්න එපා... හෙමීට හිතන්න.. ඉස්සල්ලා ඔය අඩන එක නවත්තන්න.."

අහසි අක්කි පිටට තට්ටු කර කියද්දි බිත්තියට ඔලුව තියන් කල්පනා කරා... විනාඩි පහකට විතර පස්සේ මට මතක් වුනේ... ඉක්මනට දෙර ඇරන් ගිහින් කාමරේ ඇඳ පැත්තට දිව්වා... මං ඇර කවුරුත් මේ ගෙදරට කලින් ඇවිල්ලා නෑ... අයියා ඇවිත තියෙන්නෙ ලිවින් රූම් එකට විතරයිලු..

අයියයි අනිත් කෙනයි නිතිනු අයියව ඇඳෙන් දලා හති අරිනවා.. මං එයාගේ ඔළුව කොට්ටෙ උඩින් තියලා සපත්තු දෙක ගැලෙව්වා... තාමත් ඇඩෙනවා මට... හැමවෙලාවෙම මාව හුරතල් කර කර ඉන්න එයා මෙහෙම ඉන්නකොට කොහොමද මන් දරාගන්නේ.. සපත්තුයි ට්‍රවුසර් එකයි නිසා කකුල් වල තුවාල මුකුත් නෑ ඒත් අත් දෙක හොඳටම තුවාල වෙලා.. දුවගෙන ගිහින් ෆස්ට් ඒඩ් බොක්ස් අරගෙන ආවා... මේ ගෙදර අස්සක් මුල්ලක් නෑර නිතිනු අය්යා පෙන්නුවා එදා මට.. ඒ නිසා හැමදේම ගැන දන්නවා මං..

සිහිය නැති වුනත් එයාට බෙහෙත් දන්න බයය් මට.. රිදෙය් කියලා හිතෙනවා... ඒ නිසාම අහසි අක්කට දුන්නා බෙහෙත් දන්න.. ශර්ට් එකේ අත් වැලම්ට ලගට උස්සලා බෙහෙත් දැම්මා..... ටයි එකත් ගලවලා උඩ එක බටන් එකක් විතරක් ගැලෙව්වා... ශර්ට් එකම ගලවලා දන්න් හිතුනත් අහසි අක්කි ඉන්න නිසා ඒක හරි නෑ කියලා හිතුනා... අපිත් එක්ක ආපු අනෙක් බෝයි නම් ගියා... එක බිත්තියක තිබ්බ ලොකු කර්ටන් එක එහාට කරලා එතන තිබ්බ ග්ලාස් ඩෝර් එකත් ඇරලා දැම්මා වාතාශ්‍රය ඇතුලට එන්න... පිස්සුවෙන් වගේ එහාට මෙහාට දුවද්දී අයියා මාව ලගට ඇදලා ගත්තා...

"සුදූ ප්ලීස් ඔහොම හැසිරෙන්න එපා... නිතිනු අයියට මුකුත් වෙන්නෑ... "

අයියා ඔලුව අතගාලා කියද්දි මං එයාගේ පපුවට තුරුල් වෙලා හය්යෙන් ඇඬුවා...

"ඇයි එහෙම උනේ එයාට... කවදාවත් එහෙම හැසිරිලා නෑ එයා.. කලින් සැරේ මෙච්චර ප්‍රශ්නයක් වුනේ නැතේ... මට බයයි අයියේ.. "

"අහසි අක්කි ඉන්නවනේ... එයා බලාගනියි මේ ගැන... බයවෙන්න එපා... අපි බලමුකෝ මොනාද කරන්න පුලුවන් කියලා ම්ම්ම්... "

"එයාට මොනාද වුනේ අයියේ.. හොදට හිටියනේ මෙච්චරකල්.. ඉක්මනට හොද වෙය් කියලනේ කිව්වේ එයාට.. "

"දන්නේ නෑ සුදූ... හැබැයි කවුරුහරි අද එයාගේ ඔෆිස් රූම් එකට ඇවිත් තියනවා... ඊටපස්සේ තමයි මෙහෙම වෙලා තියෙන්නේ.. මටත් කිව්වේ ශෙහාර.. ඇවිත් බලනකොටත් ඔහොම හිටියේ... මන් දෙර ලොක් කරා කවුරුහරි දැනගත්තොත් කියලා.... "

"සමහරවිට එයාගේ අම්මිගේ මර්ඩර් එකට සම්බන්ධ කෙනෙක් වෙන්න බැරිද අයියේ.. "

"එහෙම වෙන්නත් පුලුවන් පැටියෝ ඒත් මෙතන ඊට වඩා දෙයක් තියනවා මට පේන්නේ... "

අහසි අක්කි කියද්දි මං අයියා ලගින් ඇවිත් එයා ලගින් වාඩි වුනා..

"ඇ.. ඇයි අක්කි එහෙම කියන්නේ.."

"මේ පාර එයා හැසිරිච්ච විදිහ වෙනසැරවලට වඩා වෙනස්... ඔයාට මතකද එද එයා ගෙදරදි හැසිරිච්ච විදිහ.... අන්න එහෙමයි එයාගේ සාමාන්‍යය විදිහ.. ඒත් මේ සැරේ ඊට වඩා ලොකු බලපෑමක් වෙලා තියනවා... ඒක දන්නේ නිතිනු විතරයි.. ඒත් එයා කවදාවත් ඇත්ත කියන්නේ නෑ... හැමදාම ප්‍රශ්නේ මගහරිනවා... ඒකමයි හරියට ට්‍රිට්මන් කරන්නත් බැරි... "

මං අහසි අක්කා කියන දේ අහගෙනම නිතිනු අයියගේ මූන අතගෑවා... මූන ඉදිම්ලා... පව් මගේ අහිංසකයා.. මං එයාගේ අතක් අරන් ඉම්බා.. ඒත් එක්කම මං දැක්කේ ඒ අත ගුලි වෙලා තියෙන හැටි... හෙමීට අත දිගෑරලා බලපුවම ඒකේ තිබ්බේ පොඩි වෙච්ච ෆොටෝ එකක් වගේ දෙයක්.. ඒක් දිගෑරලා බලපු ගමන් මගේ හුස්මත් හිරවුනා... අදහන්න ඒකේ තිබ්බේ ඩෙඩ් බොඩි එකක ෆොටෝ එකක්... ඒකේ මූන වෙනුවට තිබ්බේ මගේ මූන...

මගේ ඇතින් වැටුන ෆොටෝ එක අහසි අක්කා අතට ගද්දි අයියත් නැගිටලා එතන්ට ආවා...

"what the f$$"
අයියා කේන්තියෙන් කෑගහනවා...

"ඕ මයි ගෝඩ්.. ඒකයි එහෙනම් වෙලා තියෙන්නේ.. ආරාධ්‍ය මෙතන ඔයාලා දකින දේට වඩා දෙයක් තියනවා... මේක කාගේ හරි ලොකු ප්ලෑන් එකක්... දන්න්වද මේ ඩෙඩ් බොඩි එක නිතිනු ගේ අම්මගේ..."

ඒ වචන හෙනයක් ගැහුවා වගේ මට දැනුනේ.. ඒ ෆොටෝ එකෙන් පවා කියන්නේ එයාගේ අම්මව වගේ මාවත් මරනවා කියලා නේද... ඒකයි එයාට මෙහෙම වෙලා තියෙන්නේ... ජීවිතේ තියන ලොකුම බයවල් දෙකම එකපාර දැනෙද්දි කොහොම දරාගන්න ඇද්ද එයා... එයාගේ මූන පුරාම ඉබ ඉබ මං ඇඩුවා...

"මං සිසීටීවී චෙක් කරලා එන්නම්.. මොකා උනත් අපි ලගින් ඉන්න කෙනෙක් වෙන්න ඕනේ.... නැත්තම් අපි ලගින් ඉන්න කෙනෙක් උදව් කරනවා වෙන්න ඕනේ... ඒකනේ නිතිනු ගැන හැම විස්තරයක්ම දන්නේ.. මට අහුවුනොත් නම් බෙල්ල ගලවනවා ඕකගේ..."

"යං මමත් එන්නම්"

"ඔයා ඉන්න අහසි.. මේ දෙන්නව තනියම තියලා යන්න බෑනේ... සිහිය ආවොත් එහෙම.."

"නංගිට නිතිනුව හැඩල් කරන්න පුලුවන් බබා... අපි යන්..."

අහසි අක්කි අයියත් එක්ක ගියේ මට නිතිනු අයියත් එක්ක තනියම ඉන්න ඉඩ දීලා... සමහරවිට එයාට මගේ හැඟීම් තේරෙන්නැති... එයාලා ගියාට පස්සේ නිතිනු අයියගේ බෙල්ට් එක ගලවලා ශර්ට් එක ගලවලා දැම්මා..... බැනියමත් අයින් කරලා බේසමකට වතුර එකක් අරන් ඇවිත් ඇග පිහදලා දැම්මා..... ඒ ටිකත් අස් කරලා ඇවිත් ඒ නිරුවත් පපුව උඩින් හාදු තවරගෙන ගියා... වෙන කරන්න දෙයක් මට තේරෙන්නේ නෑ...

"එ...පා. අ.ම්..මි. එයාව අ..ර..න්. ය..න්න... එපා... "

කැඩි කැඩී ඇහුනේ එයාගේ හඩ..

"බබා... මාව. දලා යන්න එපා... අම්මි එයාව තියලා යන්න... "

එක පාරටම හය්යෙන් කෑගහන් එයා නැගිට්ටා...

"එපා යන්න එපා... බබා.. යන්න එපා... එපා.........."

ආයෙත් එයා කලින් වගේ වෙව්ලනවා..... එහාට මෙහාට. දගලනවා... මාව දැකපු ගමන් පුංචි දරුවෙක් බයවුනාම අම්මගේ තුරුලේ හැංගෙනවා වගේ තුරුල් වුනා..

"අම්මි ඔයාව අරන් ගියා... ඔයා ආවද ආයේ මාව හොයන්... දලා යන්නෙපා මාව... බයයි මං.. යන්න එපා..."

"අඬන්න එපා රත්තරන්... මං ඔයාගාව ඉන්නවා... අම්මි අම්මි මාව එව්වා ඔයාව බලාගන්න කියලා.... ඔයා ලගම ඉන්නවා... මගේ හොද පැටියනේ.. අනේ අඬන්නෙපා රන්.. "

එයාගේ හිස් මුදුනට හාදු දිදී පිටට තට්ටු කරද්දි එයා ටිකක් සංසුන් වුනා..

"ගොඩක් ආදරෙයි මං මගේ තිනූ බබාට.. අපි ඉක්මනටම මැරී කරමු.. ඊට පස්සේ ඔයාවගේ ඩිම්පල් තියන දූවෙකුයි පුතෙකුයි ගේමු.. එයාලත් එක්ක අපි සෙල්ලම් කරමු.. හැබැයි ඔන්න බබාලා ආවත් මත් තමයි ඔයාගේ ලොකු බබා.. මට වඩා කාටවත් ආදරේ කරන්න බෑ ඔයාට.. හරිද.."

මං එයා ආසම කතාවක් පටන් ගත්තේ එයාගේ හිත වෙනස් කරන්න හිතාගෙන... හිතුවා වගේම එයාගේ දැගලිල්ල නැති වුනා..

හෙමීට එයාව ඇදෙන් හාන්සි කරලා එයාගේ ඇගට බරවෙලා කම්මුල් පිරිමැද්ද.. නලලෙ ඉදන් පිලිවට කිස් කරන් එද්දි එයාගේ වෙව්ලන එකත් හෙමීට අඩු වුනා.. මං ඒ තොල් අල්ලගන්න හදද්දිම එයා මාව පෙරලන් මගේ දෙතොල් අල්ලගත්තා... උමතුවෙන් වගේ එයා මාව සිපගත්තේ.. වෙනදා වගේ නෙවෙයි රලු විදිහට එයා සිපගත්තේ... දෙතොල් ලේ රස ගැන්වුනත් එයා නැවතුනේ නෑ... විනාඩි ගානකට පස්සේ තොල් වලින් මිදිලා මගේ පපුව උඩින් හාන්සි වුනා.. දෙතොල් පුපුරු ගහන තරම් රිදෙනවා.... වේදනාව දරාගෙන මං ඒ හිස අතගෑවා... මගෙන් පිටකරන්න ඇත්තේ එයාගේ ආවේගය..

ඒ නිරුවත් උඩුකය පුරාම මං අතැගිලි අරන් ගියා... මූන විතරක් නෙවෙයි එක අතකුය් කකුලකුය් මගේ ඇග උඩ තියෙන්නේ.. අමාරුවෙන් පැත්තට හැරිලා එයාව පපුවට හිරකරගෙන ඔලුව අතගෑවා... අය්යගෙය් අහඝි අක්කිගෙය් කටහඩට මට ඇහැරුනේ... එයත් එක්කම මටත් නින්ද ගිහින්...

එයාව ඇදෙන් තියලා ශීට් එකත් පෙරවලා මං ලිවින් රූම් එකට එන්න ආවේ අයියගෙන් අර මනුස්සයා ගැන අහගන්න හිතාගෙන... ඒත් අයියා පටන් ගත්ත කතාව නිසා මං එතනම නතර වුනා..

"වෙලාවකට මට හිතෙනවා නිතිනුගෙයි සුදූගෙයි එෆෙයා එකට මන් කැමති උනේ අපරාදේ කියලා අහඝි.. "

"ඇයි බබා එහෙම කියන්නේ... "

"මගේ නංගි දුක් විදියි කියලා මට බයයි.. අම්මලා නිතිනු ගේ මේ ලෙඩේ ගැන දැනගත්තොත් කීයටවත් කැමති වෙන්නේ නෑ... "

## 30 කොටස

"මගේ නංගි දුක් විදියි කියලා මට බයයි.. අම්මලා නිතිනු ගේ මේ ලෙඩේ ගැන දැනගත්තොත් කීයටවත් කැමති වෙන්නේ නෑ... මම සුදූව දෙන්න හිටියේ මලක් වගේ එයාව බලාගන්න පුලුවන් කෙනෙක්ට ඒත් එයාට නිතිනුව බලාගන්න වෙලා... දැක්කද පිස්සුවෙන් වගේ එහෙට මෙහෙට දුවපු හැටි... හැමදාම එයාට අඩන්න වෙයිද කියලා හිතෙනවා... අනික මටත් වඩා තාත්ති ඒ දේවල් හොයලා බලයි... ඉතින් එයා කැමති වෙයිද අහසි නිතිනුට... පිටින් බලන කෙනෙක්ට ඒක මහා ආත්මාර්තකාමී දෙයක් වගේ පේන්න පුලුවන් ඒත් තමන් ආදරේ කරන දෙයක් ලගදී මිනිස්සු හැමෝම ආත්මාර්තකාමීය්.. ඒකය් ඇත්ත.."

අයියා එහෙම කියද්දි මට ඇත්තටම බය හිතුනා... අනාගතේ දුක් විදින්න වෙය් කියලා නෙවෙයි... අපේ සම්බන්දෙට තාත්ති අකමැති වෙයි කියලා....

"මොනාද ඔයා මේ කියන්නේ ආරාධ්‍ය... අපි හැමෝම දන්නවා නිතිනු නංගිට කොච්චර ආදරෙයි ද කියලා.... අතදරුවෙක් බලාගන්නවා වගේ එයා නංගිව බලාගන්නේ... මං නම් හිතන්නේ නෑ නංගිට ඒ්ට වඩා ආදරේ කරන කෙනෙක් හම්බෙයි කියලා.. අනික මේක පොඩි ලෙඩක් විතරයි.. හරියටම වුන දේවල් දැනගත්තානම් ට්‍රීට්මන්ට් කරන්න පුලුවන්... ඔයා හිතනවද නංගි නිතිනුව අතාරියි කියලා කීයටවත්... මං නම් හිතන්නේ නෑ එයාට නිතිනු නැතුව ඉන්න පුලුවන් කියලා.. "

"දැන් නම් කීයටවත් ඒ දෙන්නා වෙන් කරන්න බෑ කියලා මන් දන්නවා.. අනේ මන්ද අහසි මං මොනා කරන්නද කියලා.. මගේ නංගි සතුටින් ඉන්නයි ඕනෙ මට... වෙනමුකුත් ඕනේ නෑ... ඒ වෙනුවෙන් ඕනෙම දෙයක් කරන්න පුලුවන් මට.. "

"මට ඔයාව තේරෙනවා බබා.. ඒත් දැන් කරන්න තියන හොදම දේ කොහොමහරි අද ආපු මිනිහව හොයාගන්න එක.. ඒ මනුස්සයගෙන් තියන තර්ජන නැති වුනා නම් හෙමීට ආයෙත් ට්‍රීට්මන්ට් පටන් ගන්න පුලුවන් අපිට... තේරුනාද ඔයාට.. "

" හ්ම්ම් අපි එහෙම කරමු.. ආදරෙයි අහසි.. "

අයියා එහෙම කියද්දි මං බිම බලන් හිනාවෙලා ආයෙත් ඇද උඩින් වාඩි වුනා.. මේ වගේ වෙලාවකට එතන්ට යන එක හොඳ නෑ... නිතිනු අයියානම් ආදරෙයි කියන වෙලාවට මාව ගොඩක් වෙලා කිස් කරනවා.. අයියත් එහෙමද දන්නේ නැතේ...

අහසි අක්කා මගේ පැත්තට කතා කරපු එක ගැන මට තිබ්බේ ලොකු ගෞරවයක්... අයියා ගැනත් තරහක් නෑ මට.. සහෝදරයෙක් විදිහට එයා හරි... ඒත් මට කීයටවත් නිතිනු අයියව අතාරින්න බෑ... මුලු ලෝකෙම මං කියලා හිතාගෙන එයා මට ආදරේ කරන්නේ... ඒ ආදරේ නැතුව හුස්මවත් ගන්න බැරි වෙයි මට..

මං නිතිනු අයියගේ ඔලුව අතගෑවා... ඒ අහිංසක මූන දකිද්දි කිස් කරගෙන කරගෙන යන්න හිතෙනවා... මායාවක් වගේ ඒ රූපේ... කන්නේ බොන්නේ නැතුව බලන් ඉන්න පුලුවන්... එයාගේ තිරුවත් පපුව හිතට මොනාදෝ කරනවා වගේ... ආසයි එහෙම තුරුල් වෙලා ඉන්න... ඒත් එයා ඇහැරෙන්න පුලුවන් එහෙම කරොත්..

නින්දෙන් ඇහැරිච්ච වෙලාවේ ඉදන් මට එයා ලගින් හෙලවුනේ වත් නෑ... කොයි වෙලෙත් මාව ඉබ ඉබ හිටියේ... අහසි අක්කි දුන්න බෙහෙත් ටික පෙව්වට පස්සේ ටික වෙලාවකින් එයාට නින්ද ගියා...

බෙහෙත් සැරට වෙන්න ඇති.... අහසි අක්කිව ගෙදර ඇරලවලා අයියා සාලේ සෙට් එකෙන් නිදාගත්තතා... කාමරෙය් ලිවින්ග් රූම් එකය් කිචන් එකය් විතරය් මේ ගෙදර තියෙන්නේ.. කිචන් එකත් තියෙන්නේ ලිවින් රූම් එකටම වෙන්න...

දවසම එකම ඇඳුමෙන් ඉඳලා මට මාවම අප්පිරියයි... නිතිනු අයියගේ අල්මාරියම ඇඳලා බැලුවා අඳින්න පුලුවන් ඇඳුමක්.. ඒත් එකක්වත් නෑ... එයාගේ ටී ශර්ට් මට කිසි ප්‍රශ්නයක් නැතුව ගවුමක් විදිහට අඳින්න පුලුවන්... එහෙමය් කියලා ඒක විතරක් ඇඳන් හිටියොත් උදේට අයියටයි නිතිනු අයියටයි නූල් බඳින්න වෙයි මගේ දැගලීමේ හැටියට... අන්තිමේට හොයාගත්තා කොට ශෝට් එකක්... මං හිතන්නේ එක්සසයිස් කරනකොට අඳින එකක්... එයාගෙ නම් ඉනට පොඩ්ඩක් පහලට ඇත්තේ මට නම් දනිස්ස ලගටම තියනවා ඒක...ටැග්ස් වත් කඩලා නෑ... ඒකට ගවුම වගේ ටීශර්ට් එකකුත් අරන් මන් වොශ් දාලා ඇඳගත්තා.. එයත් එක්ක එක ඇඳේ රැයක් නිදාගන්න බැරි නිසා මං කාමරේ සෙටියෙන් නිදාගත්තා... රෑ මැද බයවෙලා ඇහැරුනොත් කියලා මන් ලය්ට් එක ඕෆ් කරේ නෑ...

රෑ මැද එකපාරටම ඇහැරුනේ එයාගේ අත්වලට හිරවෙච්ච නිසා.. එක්කෙනෙක්ටවත් නිදාගන්න බැරි සෙට් එකේ එයාත් ඇවිත් නිදාගන්න හදනවා...

"අයියේ ඇයි මේ... මේකෙ දෙන්නෙක්ට නිදාගන්න බෑනේ... හොඳ ළමයා වගේ ඇදෙන් නිදාගන්නකෝ මිම්ම්... මං මෙතන ඉන්නවනේ... "

"මට සීතලයි තුරුල් කරගන්න මාව... "

මගේ ඇඟ උඩින් අතක් දාලා නිදාගන්න හදන ගමන් කියන්නේ... දෙවියනේ ඇඟ ගිනිදර වගේ රස්නෙයි.. වෙව්ලනවා එයා... හොඳටම උන..

"අනේ රත්තරන් ඔයාට හොඳටම උනනේ..."

"සී.... ත..ල.යි... "

"නැගිට්ටන්නකො සුදු අයියේ අපි පෙනඩෝල් එකක් බොමු... කෝ නැගිට්ටන්නකෝ හොඳ ළමයා වගේ... "

"ම්හු ම්හු සීතලයි මට ඉන්න දෙන්නකෝ.. "

මාව පුටුවට හිරවෙන විදිහට එයා තව තවත් මට කිට්ටුවෙනවා...

"අහන්නකෝ මං කියන දේ... අපි නැගිටලා පෙනඩෝල් එකක් බීලා.. ආයෙත් දෙය්යගමු ඇදෙන්... ම්ම්ම්... හොඳ ළමයනේ නැගිට්ටන්නකෝ..."

ඒ සැරේ නම් කුරු කුරු ගගා නැගිට්ටා.... ඒසි එකත් ඕෆ් කරලා මං පෙනඩෝල් දෙකකුත් පොවාගත්තා... එයාව වත්තම් කරගෙන ඇවිත් ඇඳෙන් හාන්සි කරා... උන හොඳටම... වෙව්ලනවා තාමත්... මං කරන්න ඕනෙ මොනාද කියලා දන්නෙත් නෑ... නවකතාවල නම් ඕඩිකොලෙන් දලා රෙදි පටියක් නලලෙන් තියනවා... එත් ඕඩි කොලෝන් කොහෙන් හොයන්නද මං.. බයටම මට ඇඩෙනවත් එක්ක.. අය්යව ඇහැරවන්නත් බෑ දවසම එහාට මෙහාට දුවලා මහන්සි ඇති එයාට.. කොන්ඩෙත් ඇද ඇද කල්පනා කරද්දි තමය් මතක් උනේ ෆෝන් එක... ගූගල් කරලා බැලුවා මොනාද කරන්න ඕනේ කියලා....

හොට්වෝටර් ශවර් එකෙන් උනුවතුර බේසමකුය් ටවල් එකකුය් අරන් ඇවිත් එයාගේ ඇග තෙමුවා.. ගූගල් එකේ තිබ්බ හැටියට එහෙම කරාම අඩු වෙනවලු.. ඔක්කොමත් කරලා ඇවිත් එයා ගාවින් ඇල වුනා..

"බබා අය් ලව් යූ... මගේ පැටියට ගොඩක් ආදරෙය් මං.. මගේ චූටි අම්මි... වස්තුව..."

උන විකාරෙන් එයා දෙඩවන්නේ... මං එයාගේ නලලට හාදුවක් දීලා උඩ්බැලි අතට ඉදන් ඇස් පියාගත්තා... ටික වෙලාවකින් අතක් මගේ බද හරහා වැටුනත් මං එච්චර ගනන් ගත්තෙ නෑ... ඒත් ඒ අත සීමාවක් නැතුව මගේ සිරුරේ දිග පලල මනිද්දි මං ගැස්සිලා ඇස් ඇරියා....

පැත්ත හැරිලා බලද්දි එයා අමුතුම විදිහට මං දිහා බලන් ඉන්නවා... කවදාවත් දැකලා නැති බැල්මක් ඒක.. ඒ ඇස් අඩවන් වෙලා මට මොකක්දෝ කතාවක් කියන්න හදනවා...

"නිතිනු අය්යේ මේ........."

මගේ වචන ගොළුවුනේ ඒ දෙතොල් මගේ දෙතොල් ආක්‍රමණය කරපු නිසා.. විනාඩි ගානකට පස්සෙත් වෙනදා වගේ මගේ ඇගෙන් අයින් වුනේ නෑ එයා.. දෙතොල් මූන පුරාම දුවලා කන්පෙත්තක් ලඟ නතර වුනා.. මන් කිතියෙන් ඇඹරෙද්දි එයා මාව දෙතොල් වලින් හැපුවා.. ඒ හිතුවක්කාර අතැඟිලි තාමත් මගේ සිරුර පුරා දුවනවා.. ඒ දෙතොල් ගෙල පාමුල රටා මවද්දි දැනුනා මට තත්වය බයානකයි කියලා.... හොද සිහියෙන් හිටියනම් මං කීයටවත් බය නෑ... ඒත් එයා දැන් ඉන්නේ උන විකාරෙන්... අයාලේ යන මගේ හිතට වැටකොටු දාලා මං එයාව තල්ලු කරා... ඇදේ එයා පැත්තට වැටිලා එයා එහෙට මෙහෙට දඟලනවා...

"ම්ම්ම්ම්ම් චූටි.... මට ඕනේ.... "

බොහොම අමාරුවෙන් අත් දෙක අල්ලන් පපුවට තට්ටු කරා... ටික වෙලාවකින් එයාට නින්ද ගියා.....

--------------------------------

කවදාවත් නැතුව මං උදේන්ම නැගිටලා කිචන් එකට ගියා... එයාට උන හැදිච්ච නිසා මට නින්ද ගියේ නෑ රෑ පුරාම... ආයෙත් වෙව්ලන්න ගනියි කියලා බයේ හිටියේ... මං කිචන් එකට යද්දී අය්යා තේ හදනවා... මං දැක්ක ගමන් එයා උඩ පැන පැන හිනාවුනා...

"අම්මෝ සුදූ... සෝමාලියන් හිගන්නෙක් වගේ... "

"අනේ යනෝ යන්න මෝඩයා... "

මං අයියට ඔරෝගෙන ගිහින් එයාවම බදාගත්තා..

"මහන්සියි ද සුදූ... "

"ම්හු.."

මහන්සි වුනත් නෑ කියලා කිව්වේ අයියා ඊයේ අහසි අක්කා එක්ක කිව්ව කතාව මතක් වෙලා..

"මං හිතුවා ඔයාටත් වගේ අයියා.. ඔයාට නින්ද ගියාද අර පුටුවේ..."

ඕක මොකක්ද සුදූ... මට නම් හොඳට නින්ද ගියා... ඔයාත් පුටුවේ නේද හිටියේ... නින්ද ගියේ නෑ නේද... ඇස් යටත් කලු වෙලා..

"නෑ අයියේ.. ඊයෙ රෑ නිතිනු අයියට උන හැදිලා මාව හොයාගෙන ආවා... ඒ නිසා ඇදේ හිටියේ මාත්.. උන වැඩිවෙයි කියලා බය හිතුන නිසා නින්ද ආවේ නෑ... "

මං අයියට ඇත්තම කිව්වා....

"උන හැදුනා..??? ඇයි මෝඩියේ මට කතා කරේ නැත්තේ..... "

"ඔයා දවසෙම එහාට මෙහාට දුවලා මහන්සි වුනානේ එකයි... දැන් අඩුයි "

අයියා සුසුමක් හෙලලා නලලට හාදුවක් දුන්නා....

"මේ කුක්කු එක බීලා පුලුවන් නම් නිතිනු අයියට මොනාහරි හදලා දෙන්න.. අයියා ඔෆිස් එකට යනවා එහේ වැඩ බලන්නත් එපැයි... මොනා හරි උවමනාවක් උනොත් මට කෝල් කරන්න.. තනියෙන් හිතුවක්කාර වැඩ කරන්නෑ හරිද... මං ගෙදර ගිහින් ඇඳුමක් දාගෙන එන්නේ.. අහසි අක්කිගේ කාර් එක තියාගත්තා මන්.."

අයියා මට කුක්කු එකක් හදලා දීලා ඔලුවත් අතගාලා යන්න ගියා... උන හැදුන නිසා නිතිනු අය්යට බත් කන්න බැරිවෙයි... ඒ නිසා මන් සුප් එකක් හදන්න ගත්තා... ටික වෙලාවකින් මගේ බඳ වටා එතුනේ එයාගේ උනුසුම් අත්දෙක…

"චූටි මැනික..... උයනවද මගේ බබා.. "

එයාගේ වචන වලින් මට තේරුනා එයා ටිකක් සනීපයි කියලා.... එලවලු කප කප හිටපු පිහිය පැත්තකින් තියලා මං උඩ බලාගෙන කඳුලු පාලනය කරගන්න අසාර්ථක උත්සහයක් දැරුවා... බැරිම තැන එයාගේ පැත්ත හැරිලා එයාගේ බෙල්ලේ එල්ලිලා ඉනවටේ කකුල් බැදන් හයියෙන් ඇඩුවා...

"පැටියෝ... ඇය් මැනික මේ අඩන්නේ.. අනේ ඇය් වස්තු මේ... මාව පිච්චෙනවා ඔය කඳුලු වලට.. ඊයේ ගොඩක් වද දුන්නද මං.."

"ඇයි ලෙඩ වුනේ... ඇය් මෝඩයෝ ලෙඩ වුනේ... දන්නේ නැද්ද මං බයවෙනවා කියලා.... ඉහි ඉහි ඉහි මං බයවුනා... ආයේ එහෙම ලෙඩ වෙන්නෙපා.. මං බයයි.. ඔයා එහෙම ඉන්නවා බලන් ඉන්න බෑ මට..."

"මට සමාවෙන්න මැනික.... මගේ චූටි පැටියට දුකක් දෙන්න මට ඕනේ උනේ නෑ... ආම් සොරි... මං ඉක්මනට හොඳ වෙන්නම්.. අයෙත් බබාට දුක් විඳින්න දෙන්නේ නෑ මං.. "

වඳුරු අම්මගෙ එල්ලිලා ඉන්න වඳුරු බබෙක් වගේ මං එයාගේ ඇගේ එතිලා ඉද්දි තවත් මාව තුරුල් කරන් එයා

දෙපැත්තට පැද්දෙනවා.. මන් ගොඩක් වෙලා එහෙම හිටියා... ඒයේ තිබ්බ දුක , බය මාව දාලා යන්න තත්පර දහයක් යන්න නැතුව ඇති....

එකපාරටම එයා අසනීපෙන් ඉන්නේ කියලා මතක් වෙච්ච නිසා මන් බහින්න හැදුවෙ...

"ඇයි වස්තු.. හිටියා ඇතිද මං ගාව මගේ බබාට.. "

"ඔයා අසනීපෙන් ඉන්නේ... මාව තියන් ඉන්න අමාරුයි ඔයාට..."

"එහෙම නෑ බබා දැන් හොදයි මට.. ඔහොම ඉන්න බබාට ඇති වෙනකම්... "

"මං දන්නවා ඔයා බොරු කියන්නේ කියලා.... ඊයේ රෑ උන හැදිලා හිටියේ ඔයා.. ඉතිම් තාම ඇගට අමාරුයි ඔයාගේ... ඒකයි හයියෙන් හයියෙන් හුස්ම ගන්නේ.. මට දැනෙනවා ඔයාව... බිමෙන් තියන්න මේ සූප් එක හදන්න.."

මං එහෙම කිව්වම එයා මාව බිමෙන් තිබ්බේ හිනා වෙවී... දඩියත් දාලා එයාට.. ඇගට පන නැතුව ඇති.... මං බිමෙන් තියන්න කිව්වේ නැත්තම් වැටෙනක්ම්ම තියාගෙන ඉදියි.. මගේ මෝඩයා

සුප් එකත් හදලා අපි දෙන්නම බිව්වා... ඒක බීලා ඉවර වෙලා සාලෙ සෝෆා එකේ තුරුල් වෙලා අපි හිටියා... එයා මගේ ඇඳුමෙන් ඇද ඇද හිනා වෙනවා..

"මගේ ඇඳුම් ඇඳලා ලස්සනයි චූටි මැනික..."

"බොරු කියන්නෙපා අය්යා කිව්වා සෝමාලියන් හිගන්නෙක් වගේ කියලා.... "

"අයියට පිස්සු මගේ කෙල්ලට මොනා ඇන්දත් ලස්සනයි.."

මං මූන රතු කරන් බිම බලාගත්තා.....

"අපි ඔයාගෙන් අහන්නේ නැතුව ගෙට ආවා... අය්යයි මායි ඔයාගේ ඇඳුම් ඇන්ද.. ඔයාගේ කුස්සියේ ඉව්වත් එක්ක. සොරි අය්යේ.. ඒ වෙලාවේ කරන්න දෙයක් තිබ්බේ නෑ... "

"මොනාද චූටි කියන්නේ... මේක ඔයාගෙත් ගෙදරනේ... දන්නවද ඔයා මගේ ඇඳුම් ඇදන් මගේ කිචන් එකේ උයද්දි මට කොච්චර සතුටුද කියලා.... ඇත්තටම මේක සිමෙන්ති ගොඩක් නෙවෙයි ගෙදරක් කියලා හිතුනා මට...මං පිට කෙනෙක්ද ඔයාට ඒකද ඔහොම අහන්නේ.. "

"අනේ මං එහෙම හිතලා කිව්ව නෑ සොරි... ආයේ මං මෙහෙ ඇවිත් ගේ අනික් පැත්තටම පෙරලලා යනවා...

මගේනේ"

මං හුරතල් විදිහට එහෙම කියද්දි එයා හිනාවෙවී මාව ඉබිනවා

"ඇය් හැමවෙලාවෙම එතනම ඉබින්නේ..."

මං ඇහුවේ එයා හැමවෙලාවෙම බෙල්ලෙ එකම තැන ඉබින නිසා.. මට කිව් එතන..

"එතන ඊයේ මං කරපු දග වැඩක පාරක් තියෙය් ඒකය්.."

"මොකක්"

"හ්ම්ම්.. සතුවෙලා එතන.."

මට එතකොටය් මතක් උනේ එයා හැපුවා කියලා.... දෙවියනේ අයියත් ඒක දකින්න ඇති....

"කොයි වෙලේද මං එහෙම කරේ බබා මට මතක නෑනේ... "

එයා එහෙම කියද්දි ඇස් ලොකු කරලා එයා දිහා බැලුවා... අච්චර දෙයක් කරලා දැන් එයාට මතක නැද්ද... සමහරවිට අසිහියෙන් වගේ හිටපු නිසා මතක නැතුව

ඇති....

"නිදා ගන්න යනකොට.."

ඇත්ත වසත් කරා මත් නැත්තම් එයා ගොඩක් පසුතැවෙයි.. එයා තවපාරක් එතන කිස් කරලා හිනාවෙනවා...

"තැන්ක්‍යූ චූටි මැනික ඊයේ දවසම අම්මා කෙනෙක් වගේ මාව බලාගත්තට... ඇත්තටම අම්මි ගාව ඉන්නවා වගේ දැනුනා මට.. ඒකයි මෙච්චර ඉක්මනට හොඳවුනේ... ඔයාට අම්මා කිව්වත් පව් නෑ මැනික... මං ඔයාගෙන් අම්මිව දකිනවා.. වෙලාවකට හිතෙනවා ඔයාගෙ රූපෙන් අම්මි මත් ගාව ඉන්නවද කියලා.... හැමදාමත් මට මේ ආදරෙ ඕනේ චූටි අම්මි.."

එයාට කියන්න දෙයක් මට මතක් වුනේ නෑ මට.. එයාගේ අම්මට මාව සමාන කරේ මාව... ඒ වගේ චරිතයකට සමාන වෙන්න මං කවදාවත් හිතලා නෑ... ඒ සිතුවිලි හරි බරයි මට.. අම්මි කියලා කතා කරන්න තරම් ගෞරවයක් මං ගැන තියෙයි කියලා මට හිතාගන්න බෑ... කඳුලු අතරින් හිනාවෙලා එයාව තුරුල් කරගත්තා මන්...

අහසි අක්කිගේ මහන්සියට පින්සිද්ද වෙන්න සතියක් ඇතුලත බාහිරෙන් එයාව යතා තත්වෙට පත් කරගන්න පුලුවන් උනා... ඒත් ඉන්සොම්නියා(insomnia ,නින්ද නොයෑම) වගේ පොඩි පොඩි අසනීප තත්ව හොද වුනේ නෑ... තාමත් එයාගේ හිත යට ඒ බය තියනවා... ඔෆිස් ගියත් හැමදම පැයෙන් පැයට කෝල් කරා... කෝස් එකේ ඉන්නවනම් මැසේජ් දනවා... ඒ වෙලේට මං එක අකුරක හරි රිප්ලයි එකක් දන්න ඕනේ නැත්තම් එයා බය වෙනවා..

දවසක් රෑ මන් ගැස්සිලා ඇහැරුනේ මූනට දැනුන ස්පර්ශයට... මං කෑගහන්න හදද්දිම මගේ කට රලු අතකට හිරවුනා... මන් ටිකක් සංසුන් වුනේ ඒ නිතිනු අය්යා කියලා දැනුන නිසා..

"නින්ද යන්නේ නෑ මැනික... ඔයා ගාවට ආවෙ ඒකයි... "

කනගාව මුමුනලා මාවත් තුරුල් කරන් එයා හාන්සි වුනා..

"සුදු අයියේ.. මට කියන්න පුලුවන් ද ඔයාගේ කතාව සම්පූර්ණයෙන්ම කිසිම දෙයක් හංගන්නේ නැතුව.. "

එයාගේ පපුවේ කුරුටු ගාන ගමන් මං ඇහුවේ.... මොකද අහසි අක්කා කියන විදිහට මේ බයට මූලික වෙන මනුස්සයා ගැන දැනගත්තොත් ට්‍රිට්මන් වලට ලේසියි... ඒත් එයා මුකුත් නොකියා මගේ ඔලුව අතගානවා...

"කියන්නකෝ අයියේ.. ඔයාට මාව විශ්වාස නැද්ද... ඒකද කියන්නේ නැත්තේ..."

"අනේ නෑ බබා.. ඔයාව විශ්වාස නැතුව මේ ලෝකේ කාව විශ්වාස කරන්නද මං.. ඔයාට කියන්න ඕනේ නැතුව නෙවෙයි වස්තු.. මං ඒවා මතක් කරන්න බයයි.. ඒකයි කිව්වේ නැත්තේ.. ඒත් ඔයාට දැනගන්නම ඕනෙ නම් මං කියන්නම්... සමහරවිට ඔයා ළඟ ඉන්නකොට මගේ බය අඩුවෙයි... හැබැයි දැන් කියන්න බෑ.. හෙට ඔයාව ගමනක් එක්කන් ගිහින් එහෙදි කියන්නම්... "

"හ්ම්ම්ම් "

මං එයාගේ තුරුලට වෙලා ඇස් දෙක පියාගත්තා.. මට සමාවෙන්න රත්තරන් ඔයාට ඒ වේදනාකාරී අතීතේ මතක් කරන්න මට ඕනෙ නෑ... ඒත් මං ඇත්ත දැනගන්න ඕනේ..

# 31 කොටස

උදේම නැගිටලා ලෑස්ති වුනා නිතිනු අයියා එක්ක එයා කිව්ව ගමන යන්න... ලස්සනට ලෑස්ති වුනාට මොකද හිතට බයයි.. එයාට මොනාහරි වෙයි කියලා.. සාලෙට එද්දි එයා බලන් ඉන්නවා මං එනකම්.. හැමදාමත් වගේ මං දකිද්දි ඒ මූනේ ඇදෙන ලස්සන හිනාව ඇඳුනා... මාව බිත්තියට හේත්තු කරලා හැඩ බලලා කිස් එකකුත් දීලා කාර් එකට නැග්ගුවා...

පැයකට විතර පස්සේ අපි ආවේ ලොකුම ලොකු ගේට්ටුවක් ලගට.. උස තාප්පෙට උඩින් මල් අතු වැටිලා හරි ලස්සනයි.. නිතිනු අයියා හෝන් එක ගහද්දී අපේ තාත්තාගේ වයස විතර මාමා කෙනෙක් ගේට් එක ඇරියා.... ඒ මනුස්සයා යටහත් පහත් විදිහට අයියගේ කාර් එක දිහා බැලුවේ.. කාර් එක ගේට් එකෙන් ඇතුලට දද්දි අපේ ඉස්සරහ තිබ්බේ ෆිල්ම් එකකවත් දැකලා නැති ලොකුම ලොකු ගෙයක්... ගෙයක් කිව්වට මාලිගාවක් වගේ... මං ඇස් ලොකු කරන් ඉද්දි නිතිනු අයියා වාහනේ නැවත්තුවා... අපේ ඉස්සරහින් තව වාහන හතරපහක්ම තිබ්බා...

අගහරු ලෝකෙන් පෘතිවියට ආපු ජීවියෙක් වගේ මං වට පිට බැලුවා... නිතිනු අයියා බැහැලා ඇවිත් මගේ පැත්තෙන් දොර අරිද්දි තමයි මං පියවී සිහියට ආවේ... කාර් එකෙන් බැහැලා එයාගේ අත තදට අල්ලගත්තා...

"ඇයි බබා.. බයවෙලාද ඉන්නේ මැනික... බයවෙන්න එපා මේ අපි දෙන්නගේ ගෙදර... මැරි කරලා අපි මෙහෙ තමයි ඉන්නේ... "

මං ඇස් ලොකු කරලා එයා දිහා බැලුවා... මේච්චර ලොකු ගෙදර අයිති කාරයා එයාද..? අපේ ගෙදර වගේ දහගුනයටත් වඩා ලොකුයි.. මගේ අතින් එයාගේ අත අතෑරුනේ ඉබේටමය්.. අමුතු බයක් දැනුනා මට.. උගුර කටත් එක්ක වේලිලා ගියා...

"මැනික... මොකද මේ.... ඔයා කැමති නැද්ද ගෙදරට... කැමති නැත්තම් අපි ඔයාට ඕනෙ විදිහට වෙනස් කරගමු.."

මං ගේ දිහා බලන් ඉද්දි එයා මගේ කම්මුල් මිරිකගෙන කියනවා.. මගේ බද වටේ අතක් දගෙන මාව දොර ලගට එක්කගෙන ආවේ මන් දෙගිඩියාවෙන් වටපිටබලා ඉද්දි...

"අනේ චූටි මහත්තයා.... දැකපු කල් දෙවියනේ... මේ මනුස්සයා කිව්වට මං විශ්වාස කරෙත් නෑ ආවා කියලා...."

ගේ ඇතුලේ ඉදන් ගෑනු කෙනෙක් කෑ ගහන් එද්දි මන් ගැස්සුනා.. ඒ ගෑනු කෙනා නිතිනු අයියගේ අත් දෙක අල්ලගෙන මූන අතගානවා...

"චූටි මහත්තයා තවත් ලස්සන වෙලාද කොහෙද... හරියට කන්න බොන්නේ නැතුව ඇති කියලා බයේ හිටියේ.. ගෙදරම පාලුයි මහත්තයා නැතුව.. "

"හරි හරි සුමනම්මේ මං ආවනේ.. කෝ ඔය අඩන එක නවත්තන්නකෝ.. මේ බලන්න මං තව එක්කෙනෙක් එක්කන් ආවා සුමනම්මට පෙන්නන්න.. "

නිතිනු අයියා දිහා බලාගෙන අඩන ඒ ගෑනු කෙනාගේ ඔලුව අතගාන ගමන් මාව පෙන්නුවා... මං ඒ ගෑනු කෙනා දිහත් බලලා නිතිනු අයියා දිහත් බැලුවා..

"කවුද චූටි මහත්තයෝ මේ සීදේවි නෝනා... මන් දැකලා නෑනේ... "

"සුමනම්මේ මේ ආරාධ්‍ය ගේ නංගි.. ඒ විතරක් නෙවෙයි අද ඉදන් සුමනම්මගේ චූටි නෝනත් මෙයා තමයි... "

නිතිනු අයියා මාව තවත් ලංකරන් කියද්දි මන් ඒ නැන්දට හිනාවුනා...

"අනේ වාසනාවන් සිරියාවන්ත පාටයි නෝනා... අර කලින් සක්කර වට්ටම වගේ නෙවෙයි.... අපේ සුදු නෝනේ වගේ... "

ඒ නැන්ද එහෙම කියලා මාව බදාගන්න වගේ ඇවිත් නැවතුනා..

"බයවෙන්න එපා සුමනම්මේ මෙයා එහෙම නෑ... අම්මි වගේ... කාටවත් බනින්නෙ නෑ... "

අයියා එහෙම කියද්දි මත් දෙන්නා දිහා මාරුවෙන් මාරුවට බැලුවා... මොනා කියනවද කියලා දන්නේ ඒ දෙන්නම තමයි... එ නැන්ද හිනාවෙලා මගේ මූන අතගෑවා... මං හිනාවෙලාම එයා දිහා බලන් හිටියා...

"ඇස් වහක් නම් වදින්න එපා... අපේ චූටි මහත්තයටම ගැලපෙන නෝනේ... අපේ සුදු නෝනිගේ හිනාව වගේ... දැක්කත් ඇති... චූටි මහත්තයටයි නෝනටයි කිරි උතුරන්නා වගේ හරියන්න ඕනේ.... "

සායට උඩින් ඇදන් ඉන්න චීත්තේ කොනකින් ඇස් දෙක පියලා අපේ අත් දෙකම අල්ලන් කියන්නේ එයා... අනේ මන්ද ඒ කවුරු වුනත් එයා අඩනවට මං කැමති නෑ...

"එයාට අඩන්න එපා කියන්නකෝ.... "

මං නිතිනු අයියට විතරක් ඇහෙන්න මිමුනුවා.. එයා හිනාවෙලා මගේ ඔලුව අතගෑවා...

"ඔන්න සුමනම්මේ චූටි නෝනේ කියනවා අඩන්න එපාලු.. එයා කවුරුත් අඩනවට කැමති නෑ... "

එයා හිනාවෙවී කියද්දි ඒ නැන්දත් හිනාවෙලා මගේ ඔලුව අතගෑවා...

"කතා කර කර හිටියා මිසක මේ නෝනෙට බොන්න මොනාවත් දෙන්නවත් බැරි වුනානේ... එන්න නෝනේ ගෙට... චූටි මහත්තයා මොනාද බොන්නේ.. තේ හදන්නද.. කූල් මොනාහරි හදන්නද.. "

"ඔරේන්ජ් ජූස් එකක් එකක් ගේන්න සුමනම්මේ... මෙයා තේ බොන්නේ නෑ... "

අයියගෙන් උත්තරේ ලැබුන සැනෙන් ඒ නැන්ද දූවගෙන දූවගෙන වගේ ගේ ඇතුලට ගියා... නිතිනු අයියත් මාව එක්කන් ආවා ගේ ඇතුලට... අය්යගේ ඔෆිස් එකේ ගෙදර වගේම මේ ගෙදරත් බ්ලැක් ඇන්ඩ් වයිට් හදලා තියෙන්නේ... ඊටවඩා ටිකක් පරන පාටයි.. මං කැරකි කැරකි මාලිගාවක් වගේ ගෙදර හැඩ බැලුවා..... දැන් තමයි දැක්කේ මිදුලේ තියන රෝස මල් ටික... මං ඉන්නේ කොහෙද කියන එකත් අමතක කරලා දූවන් ගියා මල් බලන්න... පාට පාට රෝස මල් තිබ්බා...

ඩේලියා , සමන් පිච්ච ,බාබත්ඩේසියා , බෝගන්විලා තව නම් දන්නැති ගොඩක් මල් තිබ්බා... හරියට මල් වත්තක් වගේ... ලොකු පොකුනක මානෙල් මල් ගොඩක් පිපිලා තිබ්බා... ඒකෙ මාලුත් ඉන්නවා... බිම තනකොල වවලා.. තව ඔන්චිල්ලාවක් තිබ්බා... අර කතාවල තියනවා වගේ ලොකු දිග පුටුවක් වගේ එකක්... ඒකෙ දෙපැත්තේ කනු දෙකේ මල් වැල් යවලා.

පාට ගොඩක් තියන සමනලයෙක් පස්සේ ගිහින් මං පියවී ලෝකෙට ආවේ ඌ පියබලා ගියාට පස්සේ.. මූන දෙක කරන් සමනලයා ගිය දිහා බලන් ඉදලා අනෙක් පැත්ත බලද්දි නිතිනු අයියා අත් දෙකත් බැදන් හිනාවෙවී බලන් ඉන්නවා... සුමනම්මත් පිටිපස්සෙන් හිනාවෙවී ජූස් දෙක තියන් ඉන්නවා... ලැජ්ජාවට මූන රතු වෙන්න ඇති.... බිම බලාගෙන ඇගිලි දෙක අඹර අඹර ඉද්දි නිතිනු අයියා ජූස් දෙකත් අරන් මං ගාවට ආවා... ඇහෙන් මටත් සංඥා කරලා එයා ගිහින් ඔන්චිල්ලාවෙන් ඉදගත්තා.... මාත් ඇගිලි අඹර අඹර එතනින් වාඩි වුනා.. අනේ අම්මපා මලක් සනෙක් මුහුදක් දකින්න බෑ මට සිහිය නැති වෙනවනේ...

"ආ මේක බොන්න බබා.. සමනල්ලු පස්සේ ගිහින් මහන්සිත් ඇතිනේ මැනිකට... "

බීම වීදුරුව දික් කරද්දි ලැජ්ජාවෙන් ඇබරි ඇබරි ඒක අරන් බීගෙන බීගෙන ගියා... එයා හිනාවෙවී මං දිහා බලන් ඉන්නවා...

"මගේ පිස්සු කෝලම... රතුවෙනකම් ඉබින්න හිතෙනවා මට... දග කරන්න නම් දන්නෙම නෑනේ... "

කම්මුලක් මිරික මිරික එයා කියද්දි මං ලැජ්ජාවෙන් එයාගේ පපුව අස්සේ හැංගුනා

"සූමනා අම්මා කියනවා චූටි ලමයෙක් වගේලු ඔයා.. මං කිව්වා ඉතිම් මගේ බබා තමයි ඒ කියලා.. "

එයා එහෙම කියද්දි මන් තවත් මූන වහගත්තා එයාගේ පපුවෙන්..

"සූමනා අම්මා කියන්නේ කවුද ඔයාගේ.... එතකොට සුදු නෝනා කියන්නේ කවුද.."

මෙච්චරවෙලා මට තිබ්බ ප්‍රශ්නේ එයාගෙන් ඇහුවේ තුරුල් වෙලා ඉන්න ගමන්...

"සූමනා අම්මා තමයි අපේ ගෙදර වැඩ කරේ ඒකාලේ ඉදලා.. අර ගේට් එක ඇරපු ගුනදාස මාමගේ වයිෆ් එයා.. අම්මා නැති වුනාට පස්සේ ලොකු අම්මා මාව බාරගත්තට සූමනා අම්මා තමයි මාව බලාගත්තේ.. ලොකු අම්මලා මගේ බාරකාරයා උනේ මගේ සල්ලි නිසා.. මාව බලාගත්ත නිසා සූමනා නැන්ද සූමනා අම්මා වුනා.. එයා අම්මිට කිව්වේ සුදු නෝනා කියලා.. ඔයා අම්ම වගේ කියලා

කිව්වේ එයා.."

"ආ තව පොඩ්ඩෙන් අමතක වෙනවා එන්නකෝ මාත් එක්ක බඩ්ඩක් පෙන්නන්න ..."

එයා නැගිටලා මාවත් එක්කන් ආවේ ලොකු කාමරේකට.. ඒකේ පේන්ටින් ගොඩක් තිබ්බා... හරිම ලස්සනයි ඒවා.... ගොඩක් පේන්ටින් අතරින් ඇවිත් සුදු රෙද්දකින් වහලා තිබ්බ ඒවා ටිකක් ඇරියා.... මං අත් දෙකෙන් කටත් වහන් ඇස් ලොකු කරන් ඒවා දිහා බලන් හිටියේ... ලස්සන පේන්ටින් පහක් තිබ්බා මගේ.. බිත්තියට හේත්තුවෙලා අහස දිහා බලන් ඉන්න එකයි, වතුරේ එබිලා ඉන්න එකයි, චූෆිත් එක්ක එකයි , කොන්ඩේ බදින එකකුයි , නිදාගෙන ඉන්න එකකුත් තිබ්බා.. පුදුම ලස්සනක් ඒවා.... හරියට ෆොටෝස් වගේ... මං ඒවා බල බල ඉද්දි එයා පිටිපස්සෙන් මාව බදාගත්තා..

"ලස්සනයිද ඒවා.... "

"අනේ ඔව් අයියෙ මං පනපිටින් ඉන්නවා වගේ... "

මං හිනාවෙවී කියද්දි එයා මාව එක්කන් ආවා තවත් ලොකු පේන්ටින් එකක් ලගට.. ඒක දැක්කමනම් මට මගේ කදුලු පාලනය කරගන්න බැරි වුනා.. එයාගේ අම්මයි එයයි එකට ඉන්න විදිහට ඇදපු එකක්..

"මේක තමයි මන් ආසම එක... පොඩිකාලේ මාත් එක්ක ගහපු මේ වගේ ෆොටෝ එකක් තියනවා... ඒකට මං ලොකු කාලේ මාව දලා ඇන්ද.. "

කැඩුනු වචන වලින් එයා කියද්දි මට ඇඩුනා... එයත් මාව බදගෙන ටික වෙලාවක් ඇඩුවා...

"මං ඔයාව අම්මිව හම්බෙන්න එක්කන් යන්නද බබා.. "

කදුලු පියදද එයා අහන්නේ.. මං කදුලු අතරින් හිනාවෙලා. ඔලුව වැනුවා... මාව එක්කන් එයා ආවේ ලස්සන සොහොන් කොතක් ලගට.. එතන ලස්සනට මල් හිටවලා තිබ්බා... සුදු රෝස මල් දෙකක් අරන් එයා එතනින් දනගහගත්තා... මමත් එයා ලගින්ම වාඩි වුනා..

"අම්මි ඔයා හොදින් ඉන්නවා නේද... සමාවෙන්න මට ගොඩක් කාලෙකින් බලන්න ආවේ නැති එකට... දුක හිතුනද ඔයාට.. බලන්නකෝ මං ඔයාගේ ලේලිව අරන් ආවා... ලස්සනයි නේද එයා.. එයා ඔයා වගේම හොදයි... අම්මි කැමතියි නේද එයාට.. "

සොහොන් කොතේ තියෙන ෆොටෝ එක අතගගා එයා අම්මිත් එක්ක කතා කරනවා.. හදවතට ඉදිකටු තුඩු වලින් අනිනවා වගේ දැනුනේ මට... මද සුලගක් එක්ක ලග තිබ්බ සුදු අරලිය ගහෙන් මලක් වැටුනා මං ලගටම... හරියට අම්මගේ ආශිර්වාදය මට ලැබුනා වගේ...

එයත් ඒක දිහා බලලා හිනාවුනා...

"අම්මි ඔයා මත් දිහා බලන් ඉන්නවා කියලා මත් දන්නවා.. තැන්ක්‍යූ එයාව පිලිගත්තට... මාව වගේම එයාවත් බලාගන්න... දැන් එයා නැතුව මට ඉන්න බෑ අම්මි... ඔයාගේ තිනූ බබාගේ සතුට තියෙන්නේ එයාගාව විතරයි.. "

කවදවත් හොල්මන් මියගිය ආත්ම ගැන විශ්වාස නොකරපු මන් මොකක්දෝ හේතුවකට තිතිනු අයියගේ කතා විශ්වාස කරා... සමහරවිට මෙතනදී මට දැනෙන අමුතු හැඟීම ඒකට හේතු වෙන්නැති... ඒක මගේ හිතේ ඇඳුන මායාවක්ද කියන්න මත් දන්නේ නෑ... ඒත් මට ඒ පරන සොහොන ලග අමුතු ජීවී බවක් දැනුනා... ෆියුනරල් එකකට ගිහින් ඩෙඩ් බොඩි එක බලන්න බය මට මෙතනදි පොඩ්ඩක් වත් බයක් දැනුනේ නෑ..

සුදු රෝස මලක් එතනින් තියලා එයා දනගහලා සොහොනට වැන්ද... මමත් සුදු රෝස මලක් තියලා ඒ විදිහට වැන්ද...

"ඔයා දන්නවද අම්මේ... ඔයාගේ පුතා ගොඩක් හොද මනුස්යෙක්... අනුන්ගේ දූක දන්න ආදරේ හිතේ පුරෝගත්ත චරිතයක්... වචනයෙන් පර්සමාප්තර්තයෙන්ම පිරිමියෙක්.. සාර්තක බිස්නස්මන් කෙනෙක්.. ඇයි තව කලාකාරයෙක්... එයාව ඒ වගේ ලස්සන මනුස්සයෙක් කරන්න ඇත්තේ ඔයා

පොඩි කාලේ උගත්තපු දේවල් වෙන්නැති... ඔයාට සතුටුවෙන්න පුලුවන් විදියේ පුතෙක් එයා... ඔයා වගේ බැරි වුනත් මං පොරොන්දු වෙනවා එයාව බලාගන්නවා කියලා.. එයාට හැමදම ආදරේ කරනවා කියලා.... "

නිතිනු අයියා විදිහටම මං ඒ සොහොන් කොත උඩ අත තියන් කියද්දි නිතිනු අයියා හය්යෙන් අඩාගෙන මාව තුරුල් කරගත්තා.... අඩලා අඩලා එයා එතනම බිමෙත් වාඩි වුනා මගේ උරහිසෙන් ඔලුව තියන්..

"එතකොට අම්මිට අවුරුදු විසි එකයි ලු.. පේරාදෙනිය මෙඩිකල් ෆැකල්ටි එකේ ඉගෙන ගෙන තියෙන්නේ.. ඒත් ඒක එයාගේ කැමැත්ත නෙවෙයිලු... අම්මිට ඕනේ උනේ පේන්ටින් කරන්න... ඒත් එයාගේ අම්මාගේ බලකිරීමට මෙඩිසින් තෝරගත්තලු.. අම්මිගේ මාමා කෙනෙක් හිටියලු බිස්නස් ගොඩක් තියෙන... එයා නැතිවෙද්දි ඒ බිස්නස් ඔක්කොම අම්මිට ලියලලු තිබ්බේ... නැතිවුනේ කොහොමද කියලනම් මන් දන්නේ නෑ... කැම්පස් එකේදි තමයි අම්මිට දිනේශ් කියන මනුස්සයා හම්බෙලා තියෙන්නේ.. ඒ මිනිහා ආට් ෆැකල්ටි එකේ ඉදලා තියෙන්නේ..

අම්මි ඒ මිනිහට රැවටිලා ආච්චිලාට පවා විරුද්ද වෙලා මැරි කරලු... ඒත් මැරි කරාට පස්සේ තමයි දැනගෙන තියෙන්නෙ ඒ මිනිහා සේරම දේවල් කරලා තියෙන්නේ අම්මගේ බිස්නස් ටික අතට ගන්න කියලා.. ඒත් අම්මි වෙනසක් නැතුව ඒ මිනිහට ආදරේ කරාලු..

මගේ අම්මි ගොඩක් අහිංසක කෙනෙක් එයාට ඒ මිනිහා ගොඩක් වද දුන්නලු..."

එයා කතාව මගින් නවත්තලා කඳුලු පිහගත්තා... ආයෙත් හොද හුස්මක් අරන් කතාව පටන් ගත්තේ...

"අම්මි එයාට ගොඩක් ආදරේ නිසා සේරම දරාගත්තලු... ඒත් එක දවසක් එයා දැනගෙන තිබ්බා ඒ මිනිහට තව ගෑනියෙක් ඉන්නවා කියලා.. එදා අම්මි ගොඩක් ඇඩුවලු.. අඩලා අඩලා දරාගන්න බැරි තැන ආච්චිලාගේ ගෙදර ගියාලු.. ඒත් සීයා බාරගෙන නෑ... ඒ නිසා ආපහු ආවලු ගෙදරට... ළමයෙක් ආවොත් සේරම දේවල් හරියයි කියලා යාලුවෙක් කියපු නිසා අම්මි තනි කැමැත්තට මාව හදුගෙන තියෙන්නේ.. ඒත් ඒකෙන් ඒ මනුස්සයා තවත් අම්මිට වදදෙන්න පටන් ගත්තලු... මාව ඇබෝශන් කරන්න කිව්වලු... ඉපදෙන්නත් කලින් මාව මරන්න හැදුවලු ඒ මිනිහා.. ආ...ආඅ.ආඅ"

නිතිනු අයියා මගේ තුරුලටම ඇවිත් හය්යෙන් අඩනවා.... ඔලුව අතගානවා ඇරෙන්න මට වෙන කරන්න පුලුවන් දෙයක් තිබ්බේ නෑ... පැයබාගයක් විතර අඩලා තමයි එයා අයෙත් කාතාව පටන් ගත්තේ...

ගොඩක් සැරයවල් වල අම්මට එක එක බෙහෙත් දුන්නලු මාව නැති කරන්න... ඒත් අම්මි ඩොක්ටර් කෙනෙක් නිසා ඒවගෙන් බේරිලා තිබ්බා...

ඒ වෙනකොටත් අම්මගේ බිස්නස් ඔක්කොම ඒ මිනිහා විනාස කරලලු තිබ්බේ... ඊටපස්සේ තමයි එයා NC එක පටන් අරන් තියෙන්නේ.. දිනේශ්ට හොරෙන් තමයි ඔක්කොම කරලා තියෙන්නේ.. NC කියන්නේ මගෙයි අම්මිගෙයි නම් දෙකේ මුල් අකුරු දෙක.. අම්මිගේ නම චාරුනී.. අම්මි ලස්සනට ජුවලරි ඩිසයින් කරා... ඒ නිසාම ඉක්මනටම NC එක දියුනු උනාලු.... මං ඉපදුනාට පස්සේ අම්මි ජොබ් එකෙන් අයින් වෙලා NC එකේ මේන් ඩිසයිනර් විදිහටයි වෙයාර්මන් විදිහටයි වැඩකරන්න පරන් ගත්තලු...

කොච්චර වැඩ තිබුනත් එයා මට ආදරෙන් අඩු පාඩුවක් කරේ නෑ... මාව සතුටින් තියන්න එයා නොකරපු දෙයක් නෑ... ඒත් මං ඉස්කෝලෙ යන වයසෙදි තාත්ති ගැන අහලා එයාට වද දුන්නා.... ගොඩක් වෙලාවට මං තාත්තා ගැන අහද්දි එයා කදුලු හැලුවා මිසක උත්තරයක් දුන්නේ නෑ... ඒ අතරේ එක දවසක් මත් දැගත්තා මාසෙකට සැරයක් ගෙදර ඇවිත් අම්මිට තුවාල කරලා යන සැර අන්කල් තමයි මගේ තාත්තා කියලා.. එදා ඉදන් මං තාත්තා කියන නමටත් වයිර කරා...

එක දවසක් අම්මි හොදටම ඇඩුවා.. වෙනදා වගේ නෙවෙයි හයියෙන් කෑ ගහලා ඇඩුවා... මං බයට මුල්ලකට වෙලා ඇඩුවා.

ඒ කාලෙදි තේරුමක් තිබ්බේ නැති වුනත් පස්සේ අම්මිගේ ඩයිරිය කියවනකොට තමයි දැනගත්තේ එයා අඩලා තියෙන්නේ අර මිනිහට තව ළමයෙක් ඉන්නවා කියලා දැනගෙන කියලා..

මට අවුරුදු නවය විතර වෙනකොට දිනේශ් දැනගෙන තිබ්බා NC එක ගැන... ඒ නිසා ඒක අයිති කරගන්න ගොඩක් දගලලා තිබ්බා... ගොඩක් දවසට අම්මිට ගැහුවා... ඇඟ නිල් පාට වෙච්ච තැන් මං අතගාද්දි එයා කියනවා මට රිදෙන්නේ නෑ තිනූ බබා කියලා.... දිගෙන් දිගට තර්ජන ආවත් අම්මි NC එක නොදී හිටියේ තන්හාවට නෙවෙයි.... එයා ඒක ගොඩනැගුවේ මන් වෙනුවෙන් නිසා.. මගේ අනාගතේ වෙනුවෙන් නිසා..

ඒත් එක මූසල දවසක මං දවල් ස්කූල් වෑන් එකෙන් බහිද්දි අම්මි පාරට ආවේ නෑ... ගේ ඇතුලට දුවන් එද්දි අර මනුස්සයා අම්මිට බෙල්ට් එකකින් ගහනවා... පුංචි කමට මං ඒ මිනිහට පොත් බෑග් එකෙන් ගැහුවා... ඊටපස්සේ ඒ මිනිහට තදවෙලා මගේ බෙල්ල මිරිකුවා.. අම්මි කොහොමහරි මාව බේරගෙන තුරුල් කරගත්තා.... මං හොඳටම බයවෙලා හිටියෙ.. අම්මිගේ තුරුලට වෙලා හයියෙන් ඇඬුවා... ඒත් ඒ මනුස්සයා මාව ඇදලා අරගත්තා අම්මිගේ තුරුලෙන්.. බිඳිච්ච බෝතල් කටුවක් අරන් ඒ මනුස්සයා මට අනින්න හැදුවේ.... මොකද අම්මි දේපල මගේ නමට ලියලා තිබ්බ නිසා.... ඌට ඕනෙ වුනේ දේපල ඔක්කොම එයාගේ අනෙක් පුතාට ලියන්න..

ඒකට තිබ්බ එකම බාදකය මම...

බෝතලේ අතට අරන් ඒ යක්ශ ඇස් වලින් බලන් ඉද්දි මං බයෙන් වෙව්ල වෙව්ල ඇඬුවා... ඒ අත මගේ දිහාට එද්දි මං ඇස් දෙක පියාගත්තා... මං හිතුවේ මගේ බඩ හිල් කරන් ඒ බෝතල් කටුව බහී කියලා.... ඒත් එහෙම උනේ නෑ චූටි.... ඒ වෙනුවට.. ඒ වෙනුවට මගේ අම්මි බඩ අල්ලගෙන මන් දිහා බලලා හිනාවුනා... ලේ බේරෙන අත් වලින් මාව ඒ තුරුලට අරන් මැනිකක් වගේ ආරක්ශා කරා මාව... පිටහරහා දෙතුන් පාරක් බෝතල් කටු පාර ඇනුනත් ඒ හිනාව මැකුනේ නෑ... මාව ඒ ඇගෙන් වහගෙන ඔක්කොම වේදනාවල් දරාගත්තා එයා... ලෝකේ දරුනුම වේදනාව විදලා මාව මේ ලෝකෙට ගෙනාපු එයාට මාව බේරගන්න ඒ පාරවල් එච්චර රිදෙන්න නැතුව ඇති....

පොලිසියෙන් ආවත් අම්මිව බේරගන්න බැරි වුනා.. ආදරේ පිරුව්ච ඇස් වලින් මන් දිහා බලාගෙන එයා අවසන් හුස්ම හෙලුවේ... ලේ ගොඩක් මැද එයා වැටිලා හිටියේ... එයාව අල්ලගෙන ඉන්න තරම් ඒ කාලේ මට හය්යක් තිබ්බේ නෑ... අන්තිම මොහොතෙදිත් එයා කිව්වේ අම්මි ඔයාට ආදරෙයි කියලා.... එහෙමම මන් දිහා බලාගෙන හිටියා... ඒ වෙලාවෙත් ඒ ඇස් වල තිබ්බේ මන් ගැන ආදරේ විතරයි.. එයා මාව දලා ගියා... හැමදේම මට ඉගැන්නුවත් එයා නැතුව ඉන්න හැටි ඉගැන්නුවේ නෑ මට.. මන් ගොඩක් තනිවුනා... එයා මාව දලා සදහටම යන්න ගියා... එයා මාව දලා යන්න ගියා ආ..රූ...

මගේ ඇස් ඉස්සරහම මං වෙනුවෙන් ජීවිතේ පූජා කරා... ආ... ආඅ... ආ..."

මගේ පපුවටම තුරුල් වෙලා හුස්ම හිරවෙනකම් එයා ඇඬුවා... නාඩා ඉන්න පුලුවන් කාටද ඒ කතාව ඇහුවාම... නිතිනු අයියගේ ඔලුව අතගාන ගමන් මං සොහොන් කොත උඩින් අත තිබ්බේ හදපුරාම පිරිච්ච ගෞරවයෙන්... ඒ මං දැක්ක ශ්‍රේෂ්ටතම ගැහැනියගේ සොහොන.. ගෞරව නොකර කොහොමද.. වෛර නොකර ආදරේම පතුරපු බිරිදක් , සාර්තක ව්‍යවසායකයෙක් , තමන්ගේ දරුවා වෙනුවෙන් ජීවිතේම පූජ කරපු උතුම් අම්ම කෙනෙක් ඉතින් මේ සොහොන වටේට ඒ සෙනෙහස දැනෙන එක පුදුමයක් නෑ...

## 32 කොටස

අඩලා අඩලා හෙම්බත් වෙලා නිතිනු අයියා මගේ තුරුලේ නිදි... මං සොහොන් කොතට ඔලුව තියන් අහස දිහා බලන් හිටියේ... ජීවිතය හරි පුදුමාකාරයි... මිනිස්සුන්ට දෙන්නේ පුදුමාකාර පරීක්ෂණ... ආදරනීය මිනිස්සුන්ටම ඇයි දෛවය නපුරුකම් කරන්නේ... පපුවට තුරුල් වෙලා ඉන්න නිතිනු අයියගේ හිස උඩින් හාදුවක් තිබ්බේ හරි පරිස්සමට... එයා බයවෙච්ච නැති එක මට ලොකු පුදුමයක්...

සමහර විට එයාගේ අම්මයි මමයි දෙන්නම ලග ඉන්න නිසා වෙන්න ඇති....

ලාවට හුලගක් හමනවා... මට දැනුනේ නිතිනු අයියාව සනසන්න එයාගේ අම්මා එයාවටේ දැවටෙනවා වගේ... නිතිනු අය්යටත් ඒක දැනෙන්න ඇති ඒ නිසාමද කොහෙද එයා හීනෙන් හිනාවුනා... කඳුලු වලින් තෙත් වෙච්ච මූනේ හිනාවක් ඇදෙන කොට හරිම ලස්සනයි.. ආදරේ හිතෙනවා හුගක්... භාවනාවක් වගේ එයා දිහා බලන් හිටියා ඇහැරෙනකම්ම... එයාට මෙහාට මූන හරවලා එයා මන් දිහා බලලා හිනාවුනා..

"ම්ම්ම්ම් චූටි මැනික... සනීපෙට දෙයි ආවා මෙතන..."

එයා කියද්දි මං අත් දෙකෙන්ම ඔලුව අතගාලා එයාගේ නලල ඉම්බා..

"ඇය් මැනික ඔහොම බලන් ඉන්නේ... ඔහොම බලද්දි හිත මොනාදෝ වෙනවා වස්තු .."

"ආදරේට නේ මෝඩයෝ.. ආදරේ හිතුනා පූස් පැටියෙක් වගේ ගුලිවෙලා ඉන්නකොට.."

ඒපාර එයා ඇගේ ඇතිල්ලෙනවා පූසෙක් වගේ... බෙල්ල වටේ රැවුලෙන් කිති කවනවා... එක විකාරයයි...

"මේ මොකද මේ... "

"ඇය් ඔයානේ කිව්වේ මත් පූස් පැටියෙක් වගේ කියලා.. පූස් පැටව් මෙහෙම ඇතිල්ලෙනවනේ..."

"අනේ මේ කෝලන් නැතුව නැගිටිනෝ හොර කොල්ලා.."

"කිස් එකක් ඕනේ මට.. "

"පිස්සුද මෝඩයෝ අම්මිත් ඉන්නවා මෙතන"

"ම්ම්ම්ම් දෙන්නකෝ.. එයා බලන්නෑ.. නැත්තම් මං මෙහෙමම ඉන්නවා රෑ වෙනකම්... "

"හොර කොල්ලා... මට බබා කිය කිය එයා බබා වෙලා.. කෝ එනෝ මෙහෙට දෙන්න..."

මං හිනාවෙවී එයාගේ නලලට හාදුවක් දුන්නා.. ඇස් පියාගෙන ඒ හාදුව විදලා එයා ඇස් ඇරියේ විනාඩියක් විතර ගියාට පස්සේ.. එයා හැමදාම එහෙමයි හාදුවක් දුන්නහම ගොඩක් වෙලා ඒක හිතෙන් විදිනවා...

"කෝ දැන් නැගිටින්න..."

"ම්හු ඒක මදි මෙතන්ට එකක් ඕනේ"

ඇස් පියාගෙන එයා දෙතොල් පෙන්නනේ... අද එයා වෙනදට වඩා හුරතල් වෙනවා.. සමහරවිට අම්මව මතක් වෙන නිසා එයාගේ ආදරේ මගෙන් හොයනවා ඇති... මුකුත් නොකියා පුන්චි හාදුවක් තිබ්බා තොල් මතින්... ලස්සන හිනාවක් ඇදුනා ඒ මූනේ... ඒ හිනාවෙන්ම නැගිටලා මගේ කම්මුලක් හැපුවා මගේ..

"මගේ සෝස ඇපල් ගෙඩිය හපන්නමයි හිතෙන්නේ මට..."

මූන අතගගා එයා කියන්නේ... මං බිම බලාගෙන හොරෙන් එයා දිහා බැලුවා...කටත් මොනාද්ෝ කරගෙන මගේ කම්මුල මිරිකලා එයා අම්මගේ සොහොන් කොතට අත තිබ්බා...

"අම්මි මං සතුටින්... ගොඩාක් සතුටින් එයා ගාව ඉන්නේ... තැන්ක්‍යූ මන් ලගට එයාව එව්වට... අපි යනවා.. ඉක්මනට ඔයාව බලන්න එනවා... බයවෙන්න එපා ඔයාගේ මේ ලේලි පොඩ්ඩත් අරන් එන්නේ.. ආදරෙයි අම්මි...."

හැඟීම්බර හඩකින් එයා කියලා නැගිට්ටා.... මං එයාට අත් දෙක දික් කරා මාවත් නැගිට්ටවන්න කියලා.. එයා අත් දෙක යටින් අත් දෙක දාලා මාව ඉස්සුවා.. මං හිනාවෙවී නැගිට්ටා විතරය් එයා මාව හරහට වඩාගත්තා..

"මේ මොකද මේ... බිමින් තියන්න මාව... කවුරුහරි දකියි අනේ... "

"කවුරු දකින්නද බබා.. අනික දැක්කත් මොකද... මගේ ගෙදර.. මගේ වත්ත.. මගේ වයිෆ්.. ඉතින් කාටවත් මුකුත් කියන්න බෑ... "

"මගේ වයිෆ්" කියන කොට නම් මං පොඩ්ඩක් මෙල්ල වුනා.. මූන එයාගේ බෙල්ල පාමුල මූන හංගත්තා මත්... ඉබ්බා දියට දනකොට ඇත්තෑවේ කිව්වලු... බොරුවට දැගලුවට මත් ආසයි එයා මාව වඩත් ඉන්නවට.... ඒ නිසා එහෙමම හිටියා දගලන්නේ නැතුව... එයා මාව වඩාගෙන ගේ ඇතුලට ඇවිත් ලිෆ්ට් එකකට ආවා... ගේ ඇතුලෙත් ලිෆ්ට් තියෙයි.. මාව නිකත් කොහෙටද අතෑරියා වගේ... එයා ගිහින් නතර වුනේ ලොකු කාමරයක් ලගට...

කාමරේ ඇතුලේ තිබ්බ බෙඩ් එකෙන් මාව තියලා එයා කර්ටන් එක ඇරියා... ඒත් එක්කම මන් දැක්කේ ඇඳ ලගම ටේබල් එකේ තිබ්බ නිතිනු අයියගෙයි සනුදි අක්කගෙයි ෆොටෝ එක... සනුදි අක්කව පිටිපස්සෙන් බදාගෙන එයා කම්මුලට කිස් එකක් දෙනවා... හිත නොරිදුනා කිව්වොත් බොරු... ඉදිකටු තුඩින් ඇනගෙන ඇනගෙන යනවා වගේ...

හම්බෙලා මාස ගානකට මට මෙච්චර ආදරෙයි නම් අවුරුදු ගානක් ආදරේ කරපු එයාව අමතක කරන්න බැරි එක පුදුමයක් නෑ... එයා තාමත් සනුදි අක්කට ආදරේ ඇති... ඒකනේ ෆොටෝ එකත් තියන් ඉන්නේ... බිමට වැටෙන්න දගලන කදුලු හිරකරන් මං ෆොටෝ එකෙන්

අහක බලාගත්තා.. එයා මන් ලගට ආවා විතරයි මගේ දරාගැනීමේ සීමාව බිදිලා ගියා... එයාගේ ඔඩොක්කුවට පැනලා පපුව බදාගෙන හය්යෙන් ඇඩුවා මන්...

"ඇයි මැනික මේ... අනේ ඇය් වස්තු අඩන්නෙ... කියන්නකෝ.... මාව පුච්චන්න එපා ඔහොම... ඇයි මැනික අඩන්නේ.. මං මං මොනාහරි වැරැද්දක් කරාද... "

"මාව දාලා යන්නේ නැනේද ඔයා... මාව දාලා යන්න එපා... මට ඔයා නැතුව ඉන්න බෑ... ඉහි ඉහි ඉහි ඔයා මගේ විතරයි නේද... මගේම විතරයි... එයා ආපහු ආවොත් ඔයා මාව දාලා යනවද.. එතකොට මාව එපාද ඔයාට.."

"මොනාද මැනික අහන්නේ මේ... ඔයා නැතුව හුස්ම ගන්නවත් මට බෑ... ඇයි වස්තු ඔහොම කියන්නෙ... මගේ මැනිකට කොච්චර ආදරෙයි ද මන්... මගේ පනනේ ඔයා...කවුරු ගැනද මේ කියන්නේ... ආ මැනික.. දන්නවනේ ඔයා නැතුව ඉන්න බෑ කියලා.. "

මගේ මූන පුරාම ඉබ්න ගමන් එයා කියන්නේ ඇස් වල කදුලු පුරෝගෙන... මං ඇඩුවා මිසක් මුකුත් කිව්වේ නෑ...

"ඕහ් ශිට්.. ඇම් සොරි මැනික මට මට ඒ ෆොටෝ එක අයින් කරන්න අමතක උනා... අනේ වස්තු මන් ඒක හිතලා තියාගත්තේ නෑ මැනික.. "

මාව තුරුලෙම තියාගෙන තැව්ලා එයා ඒ ෆොටෝ එක අරන් වීදුරු ව අයින් කරලා ෆොටෝ එක එක කෑලි කෑලි වලට ඉරලා දැම්මා... ෆොටෝ එක ගැන වෛරයෙන් වගේ ඒක චූටි චූටි කෑලි වලට ඉරලා දන හැටි මන් බලන් හිටියේ කටත් ඇරන්..

"මො... මොකක්ද ඒ ඔයා කරේ.... ඇයි ඒක ඉරුවේ...."

"මගේ මැනිකගේ ඇස් වලින් කඳුලු එන කිසිම දෙයක් මේ ලෝකේ තියෙන්න බෑ... ඒක ෆොටෝ එකක් උනත් මනුස්සයෙක් උනත් එච්චරයි... ඉවරයක් කරලා දනවා... "

කේන්තියෙන් වෙව්ලනවා එයා.. ඇසුත් රතු වෙලා... දැක්කම බය හිතෙනවා

"අය්යේ.. ඇයි මේ අනේ සංසුන් වෙන්නකෝ.. "

මං පපුවට අත තියලා කියද්දි එයා සන්සුන් වුනා..

"සොරි මැනික... මං උවමනාවෙන් ඒක තියන් හිටියේ නෑ... ගොඩක් දවසකින් මේ කාමරේට ආවේ මං.. එයාට පොඩිම ඉඩක් වත් මගේ හිතේ නෑ බබා.. දිව්‍ය ලෝකේ ඉදලා කවුරුත් අපායට යන්න කැමති නෑ... ඔයාගේ ආදරේ මට දිව්‍ය ලෝකේ වගේ... ඔයාගේ ආදරේ එක්ක බලද්දි සනුදි මට දශමයක් වත් ආදරේ කරලා නෑ කියලා හිතනවා බබා.. මගේ චූටි කෙල්ල තමයි මට හරියටම ආදරේ

කියලා දුන්නේ.... ඉතින් කොහොමද ඔයාව දාලා යන්නේ මන්..... එයා ආපහු ආවත් මට එයාව එපා... මැනික් ගලක් ලග තියන් ගල්කැට අහුලන්න මන් මෝඩ නෑ... "

එයා එහෙම කියද්දි මන් සතුටට එයාව පෙරලන් කිස් කරා... එයා මාව ඇගටම හිර කරන් මගේ දෙතොල් පහස විදිනවා... විනාඩි ගානක් එයාව ඉම්බට පස්සෙ තමයි මට මතක් උනේ මං ඉන්නේ එයාගේ ඇගඋඩ කියලා... එයාගේ මූන දිහා බලාගෙන ඉදලා ටක් ගාලා මූන පපුව අස්සේ හංගගත්තා... ලැජ්ජ උනාට මොකද එයාගේ ඇග උඩින් බහින්නනම් මට අදහසක් තිබ්බේ නෑ... ගොඩක් වෙලා මං එහෙම ඉන්නැති.. එයා සනීපෙට ඔලුව අතගානවා...

"බබා... මගේ කතාවේ ඉතිරි ටිකත් අහනවද ඔයා..???"

"හ්ම්ම්ම් කියන්න... මං අහන් ඉන්නේ... "

එයා සුසුමක් පිටකරලා කතාව පටන් ගත්තා......

"අම්මි නැති වුනාට පස්සේ අවුරුදු දෙකක් විතර මං ඔහේ බලාගත්ත අත බලන් හිටියා... අම්මව මරලා දිනේශ් කියන මිනිහා පැනලා යද්දි පොලිසියෙන් අල්ලගත්තා... අවුරුදු 20 කට හිරේ ගියා ඒ මිනිහා.. මගේ සාක්ෂිත් තිබ්බනම් ජීවිතාන්තය දක්වා හිරේ දාන්න තිබ්බා... ඒත් මං අසනීපෙන් හිටපු නිසා කෝට් එකට ගියේ නෑ...

ඊටපස්සේ ලොකු අම්මා මාව බාරගත්තා... එයා අම්මත් එක්ක තරහෙන් හිටියේ මාමගේ දේපල ඔක්කොම අම්මිට හම්බෙච්ච නිසා..

මගේ දේපල ඔක්කොම බුක්ති විදින ගමන් එයාලා මට සතෙක්ට වගේ සැලකුවා... සුමනාඅම්මා නැති නම් මට මොනාවෙලා තියෙයිද දන්නෑ... ඒත් මට එක හිතෙන් සුමනාඅම්මාට ආදරේ කරන්න බැරිවුනා... මොකද සුමනා අම්මා අම්මිගේ මර්ඩර් එක ගැන සේරම දේවල් දැනගෙනත් උසාවියේදි එයා කිව්වේ කිසි දෙයක් දන්නෑ කියලලු... ඒ නිසා එයාගේ සැලකිලි මට දැනුනේ වන්දි ගෙවීමක් වගේ...

මට අවුරුදු 18 ක් වෙද්දි මගේ දේපල වලින් වැඩි කොටසක් ලියන් ලොකු අම්මලා මෙහෙන් යන්න ගියා... ඒකාලේ මං ආදරේ හොයද්දි තමයි මට සනුදිව හම්බුනේ... මං එයාට ගොඩක් ආදරේ කරා... එයා නිසා පේන්ටර් කෙනෙක් වෙන හීනේ අතෑරලා කොමස් කරලා කැම්පස් ගියා... එයා වෙනුවෙන් නොකරපු දෙයක් නෑ මන්.. අපාර්ට්මන්ට්එකක් අරන් දීලා එයාගේ සේරම වියදන් මන් දැරුවා...

එයාට හැමවෙලාවෙම ඕනේ උනේ ෆැන්සි රෙස්ටුරන්ට් වලට යන්න එක්ස්පෙන්සිව් තැන් වලින් ශොපින් කරන්න.. වැකේශන් වලට ඕවර් සී ටුවර් කරන්න.. ඒ වගේ දේවල්...

මන් හිතුවේ ගෑනු ළමයි ඔක්කොම එහෙමයි කියලා.... එයාගේ හැම ආසාවක්ම මට කියන්නේ මට ආදරේ නිසා කියලා හිතුවා... මං ගැන එයාට අයිතියක් තියෙන නිසා කියලා හිතුවේ... එදා අපේ ෆස්ට් ඩේට් එක දවසේ බීච් යමු කියලා කියද්දි මං කැමති රෙස්ටුරන්ට් එකකින් කමු කියද්දි මං පුදුම උනේ ඒකයි...

ඒ අතරේ කවුද මිනිහෙක් මට අම්මගේ ඩෙඩ් බොඩි එකේ ෆොටෝ එකක් පෙන්නන පෙන්න මාව බ්ලැක් මේල් කරලා මගෙන් සල්ලි ගත්තා... අම්මිගේ ෆොටෝ එක පෙන්න පෙන්න එකින් එක වෙච්ච දේවල් මතක් කරනකොට මං කන් වහන් කෑ ගැහුවා... ඒ මිනිහා යවාගන්න ඕනෙවට මන් චෙක් සයින් කරනවා.. ඒ දවස් වලට සනුදි ළගට ගියාම එයා මට බනිනවා මට පිස්සු කියලා.... එතකොට මං කාමරේ මූල්ලකට වෙලා තනියෙන් අඩලා හිතහදගත්තා...

මං අපේ රිලේශන්ශිප් එකට සීමාවන් දගෙන හිටියෙ.. මට ඕනෙ උනේ කවදහරි ලස්සන මනමාලියක් කරලා එයාව මගේ කරගන්න... ඒත් එයාට ඕනේ උනා ඒ සීමාවන් බිදලා දාන්න... මං ඒ දේවල් වලට අකැමැති උනාම මට පො$$& කියලා බැන්නා.... ඒත් මං ඉවසන් හිටියා එයාට ආදරේ නිසා.. ඔයාගේ අයියා එහෙම සනුදි වෙන කොල්ලෙක් එක්ක ඉන්න ෆොටො පෙන්නුවත් මං ඒවා විශ්වාස කරේ නෑ... මොකද මං එයාට ආදරේ කරේ පිස්සුවෙන් වගේ

ඒත් එක දවසක් මං ඇස් දෙකෙන්ම දැක්කා එයා තව පිරිමි ලමයෙක් එක්ක රූම් එකකට යනවා... පස්සේ මං පිස්සුවෙන් වගේ ඇඩුවා... බීලා බීලා නාස්ති වුනා.. මාසෙකින් විතර සනූදි මත් ලගට ඇවිත් කකුල බදන් ඇඩුවා එයාව බාරගන්න කියලා.... හැමෝම බනිද්දි මං එයාව බාරගත්තා.. අවුරුද්දක් විතර ඉද්දි අයෙත් එයා වෙනස් වුනා.. මගේ පිරිමිකම පහත් කරලා මට අපහාස කරලා එයා වෙනත් මිනිහෙක් එක්ක ගියා මගේ ඉස්සරහම...ඒ වෙන කවුරුත් නෙවෙයි දිනේශ්ගේ අනිත් පුතා... එයා මට කිව්වා මගේ හැමදේම උදුරගන්නවා කියලා.... කවදාවත් මට සතුටින් ඉන්න තියන්නෑ කියලා.... තාත්තා හිරේ ගියපු එකට මගෙන් පලිගන්නවලූ...

ඒ කතාව අහලා මට ජීවිතේ එපා උනා... මගේ ජීවිතේ කවදාවත් සතුටක් නැති වෙයි කියලා හිතුනා ඒකයි මත් මැරෙන්න හිතුවේ... ඒත් ආරාධ්‍ය ඇවිත් මාව බේරගත්තා... පස්සේ ඔයාව හම්බුනා... මගේ ජීවිතේට සතුට ලැබුනා... මං හිතුවේ හැමදේම හරියයි කියලා.. ඒත් එද සුපුරුදු විදිහට මැසේජ් එකක් ආවා කෝටි 10 ක් ඕනේ කියලා... ඒත් මත් යැව්වේ නෑ... ඒ නිසා අර ෆොටෝ එකත් අරන් මනුස්සයෙක් ආවා මගේ ඔෆිස් එකට... වෙන කවුරුත් නෙවෙයි අර දිනේශ් කියන මනුස්සයා... කලින් ආපු මිනිහව එවලා තියෙන්නෙත් දිනේශ් කියන මිනිහම තමයි... ජේල් එකෙන් රිලීස් වෙච්ච නිසා ඒ මිනිහම ඇවිත් තිබ්බේ එද...

මං මං... ඒ වෙලාවේ ගොඩක් බයවුනා බබා.. මට මැව්ලා පෙනුනා ඒ මිනිහා අම්මිව මරපු හැටි... චෙක් එකක් දීලා මට අත්සන් කරන්න කිව්වා... බයටම අත්සන් කරා... යන ගමන් ඒ මිනිහා කිව්වා අම්මි වගේම ඔයාවත් මගෙන් උදුරගන්නව කියලා.... මගේ දිහාට ෆෝටෝ එකක් විසි කරලා ඒ මිනිහා යන්න ගියා... මං වෙව්ල වෙව්ල ඒකේ බැලුවේ... අම්මිගේ බොඩි එකට ඔයාගේ මූන දලා තිබ්බේ මැනික... මං ගොඩක් බයවුනා... මං හිතුවේ මට පිස්සු හැදෙයි කියලා.... මට ඔයා නැතුව බෑ... මට ඔයා නැතුව ඉන්න බෑ චූටි අම්මි.."

මාව පපුවට හිරකරන් එයා අඩනවා.... දඩිය දලා වෙව්ලන ගතිය ආපු නිසා එයාගේ පපුවෙන් බැහැලා එයාව මගේ තුරුලට ගත්තා... දැන් සේරම දේවල් පැහැදිලියි... මේ ඔක්කොටම මුල ඒ දිනේශ් කියන මිනිහා.. නිතිනු අයියා වගේම මත් කැමති නෑ ඒ මිනිහව එයාගේ තාත්තා විදිහට හඳුන්වන්න... ඒ උතුම් අකුරු තුනටම ඒක අපහාසයක්... දේපල වෙනුවෙන් තමන්ගේ පුතා තියා මදුරුවෙක්වත් මරන්න බෑ මටනම්...

පැයකට විතර පස්සේ නිතිනු අයියා යතා තත්වෙට පත්වුනා... ඊට පස්සේ එයා මාව උඩම තට්ටුවට එක්කන් ගියා... ඒකේ තිබ්බේ ස්විමින්ග් පූල් එකක්... ස්විමින්ග් පූල් එකට කකුල් ඔබන් අපි ගොඩක් වෙලා තුරුල් වෙලා හිටියා...

ස්විමින්ග් කරන්න ඇඳුම් ගෙනාවේ නැති නිසා කකුල් විතරක් ඔබන් හිටියා... එක කාමරයක් ඇරෙන්න ගෙදර අනික් හැමතැනම එයා මට පෙන්නුවා.. ඒ කාමරේලූ අම්මිගේ මර්ඩර් එක වුනේ... එයා බය නිසා ඒක හැමදම වහලලූ තියෙන්නේ..

හවස ගෙදරින් ඇවිත් අපි මග කාර් එක නවත්තලා ටිකක් ඇවිද්ද අත් අල්ලන්... ඒත් එක පාරටම කොහෙන්ද්‍ෙ ආපු වෑන් එකක් අපි දෙන්නාවම ඇදලා ගත්තේ කිසිදෙයක් හිතාගන්න වෙලාවක් නොතියා... නිතිනු අයියා උන්ට ගහන්න හැදුවත් තුන් දෙනෙක් තුන් පැත්තෙන් අල්ලන් හිරකරගත්ත නිසා එයාට මුකුත් කරගන්න බැරි වුනා.. ඒත් එක්කම නහයට අල්ලපු ලේන්සුවෙන් දැනුන අමුතු ගඳත් එක්ක මගේ ඇස් පියවුනා...

## 33 කොටස

උස්සගන්න බරි තරම් ඔලුව රිදෙද්දි බොහොම අමාරුවෙන් මන් ඇස් ඇර ගත්තා... බොදවෙච්ච රූප අතරින් ඉස්සරහ ඉන්න නිතිනු අයියව අඳුරගන්න මට පුලුවන් වුනා.. එයා බිත්තිය ලග බිම වැටිලා හිටියේ... අපි හිටියේ ලොකු කාමරයක් ඇතුලේ... හරියට නිතිනු අයියගේ කාමරේ වගේ... අපි දෙන්නගෙන් එක්කෙනෙක්වවත් බැදලා තිබ්බේ නෑ... දනගාගෙන මන් නිතිනු අයියා ගාවට ආවා...

"අය්යේ නැගිට්ටින්න.... ඔයාට ඇහෙනවද මාව... අනේ නැගිට්ටින්නකෝ... මට බයයි.. නැගිට්ටින්නකෝ... "

මං කම්මුලට තට්ටු කර කර කතා කරද්දි එයා හිමීට ඇස් ඇරියා....

"බ..බා ඔ..යා හොඳින් ද"

"මං හොඳින්... ඔයාට මුකුත් ප්‍රශ්නයක් නෑ නේද අයියේ.."

"මන් හොඳින් මැනික.... කොහෙද මේ අපි ඉන්නේ... "

මගේ කම්මුලක් අල්ලන් එයා වටේට කැරකිලා බැලුවා... එයාගේ ඇස් වෙනස් වෙන්න තත්පරයක් වත් ගියේ නෑ... දඩිය පෙරාගෙන වෙව්ලන්න ගත්තා... කාමරේ එක තැනක් දිහා බලාගෙන ඉන්නේ එයා... සැරෙන් සැරේට අත්දෙක පිහදනවා...

"අනේ අයියෙ මොකද මේ... තිනු මන් දිහා බලන්න.. මොකක්ද වුනේ ඔයාට.. "

"අම්මි අම්මි... යන්න එපා... අම්මි....අම්මි... "

බිත්තියටම හේත්තුවෙලා කකුල් දෙක අස්සේ ඔලුව ගහන් එයා අඬනවා....

මං තව ටිකක් කාමරේ වටේ බැලුවේ ඇයි එයා එහෙම හැසිරෙන්නේ කියන එක ගැන අදහසක් ගන්න... ජනේලෙන් එලිය දැක්කම මට තේරුනා අපි ඉන්නේ නිතිනු අයියලාගේ ගෙදර කියලා.. ඒකියන්නේ මේ අපි ඉන්නේ එයාගේ අම්මි නැති වෙච්ච කාමරේ වෙන්න ඕනේ.... ඒකයි එයා එහෙම හැසිරෙන්නේ..

මං එයා ලගට ගිහින් එයාව පපුවට තුරුල් කරගත්තා... එයා මාව තදට බදගෙන අඩනවා.... ඒත් එක්කමයි වැහිලා තිබ්බ දොර ඇරන් ආවෙ කොල්ලෙක්... එයා නිතිනු අයියා දිහා බලලා කට කොනින් හිනා වුනා..

"අනේ පවු... නොත්ත බබා අම්මගේ තුරුලේ අඩනවා...."

"කවුද තමුන්...ඇයි අපිව මෙහෙට අරන් ආවේ කියනවා.."

හිතට හය්ය අරන් මන් හය්යෙන් කෑ ගැහුවා...

"බටු ඇට දෙකක් උස නෑ කට බලන්නෙපැය්... මේ පිස්සගේ හයිය අරන්ද කෑ ගහන්නේ... තමුසෙව මං දැන් මූගේ ඉස්සරහම රේප් කරත් ඌ බේරගන්න එන්නෙ නෑ... බයගුල්ලා බිත්තිය මුල්ලට ගුලිවෙලා ඉදියි..."

"කටවහගනින් තිරිසනා... මගේ නිතිනු අය්යට පිස්සු නෑ... තමුසෙට කොහෙන් ආපු හයියක්ද එහෙම කියන්න... "

නිතිනු අයියවත් තුරුලු කරන් මන් කෑ ගැහුවේ කේන්තියෙන් පුපුර පුපුර... කවුරුවත් එයාට අපහාස කරනවා මට බලන් ඉන්න බෑ...

"ශහ් මේ සැරේ නම් මේ පිස්සා හොද කෙල්ලෙක් හොයාගෙන තියනවා... කලින් එකී මං ඇහැක් ගහපු ගමන් පස්සෙන් ආවානේ... මොකද කියන්නේ කෙල්ලේ මාත් එක්ක පැයක් හිටියොත් තමුන්ගේ නිතිනු අයියව මං පනපිටින් අතාරිනවා... මේකා එක්ක හිටියා කියලා මෙලෝ දෙයක් හම්බවෙන්න නැතුව ඇතිනේ... ඔව් ඉතින් පිරිමින්ටනේ එහෙම දෙයක් දෙන්න පුලුවන්... පො$$@න්ට පුලුවන් ඇය්... ?"

පහත් වෙලා නිතිනු අයියගේ ඔලුවට ඇගිල්ලෙන් අනින ගමන් ඒ මිනිහා කියවන්නේ... එයාට ඒ දේවල් ගැන ගානක් නෑ... තාමත් බයේ වෙව්ලනවා... නිතිනු අයියව අතෑරලා මං ඒ මිනිහගේ බෙල්ලෙන් අල්ලාගත්තා... කලින් කියපු දේවලුත් එක්ක මට විශ්වාසයි මේ දිනේශ් ගේ පුතා කියන එක...

"මොකක්ද තමුන් කියන්නේ... දකින දකින ගෑනු ඇදට ගන්න තෝ පිරිමියෙක් කියලද කියන්නේ... කසාද බදිනකම් තමන්ගේ කෙල්ලව ආරක්ෂා කරන එකයි පිරිමි කම.... ගෑනියෙක් එක්ක නිදා ගත්ත පලියට ඒකා පිරිමියෙක් වෙන්නෑ ඕයි... රවට්ටලා කසාද බැදන් ලමයෙකුත් දීලා ඒ ලමයව මරන්න හදපු උබේ තාත්තයි නිතිනු අයියව

බ්ලැක්මේල් කරලා ගත්තු සල්ලි වලින් ජීවත් වෙන තමුසෙයි පිරිමි කියලද මට කියන්නේ...ගවුමක් ඇදගන්නවා.. ඒකයි තමුසෙලාට ගැලපෙන්නේ...."

කොහෙන්දෝ ආපු හයියක් හිතට අරන් මං කෑහගලා ඒ මිනිහව තල්ලුකරලා දැම්මා... බිමට වැටිච්ච ගැම්මෙන්ම නැගිටලා ඒ මිනිහා මගේ කොන්ඩෙන් අල්ලා ගත්තා...

"බැ@@ තොට කොහෙන් ආපු හයියක්ද මාව තල්ලු කරන්න... බලපන් තොට කරන වැඩේ... පිරිකම පෙන්නනම් තොට මං.. තොගේ මේ පිස්සු මිනිහා ඉස්සරහම මන් තෝව විනාස කරනවා.. "

"අතෑරපන් තිරිසනා අතෑරපන් මාව... මගේ මල මිනිය තමයි උබට හම්බෙන්නේ... මට මොනාහරි කරොත් නිතිනු අයියා තමුන්ව ඉවරයක් කරලා දයි... අතෑරපන්.."

වියරුවෙන් වගේ ඒ මනුස්සයාගේ අත පහුරුගෑවා මන්... මොකක්දෝ හේතුවකට මට බය හිතුනේ නෑ... ඒත් එක්කමයි දොර ඇරන් තව මනුස්සයෙක් ආවේ...

"පුතා මොකෝ මේ ගෑනුන්ගෙන් ගුටිකන්නේ.. මටත් එක්ක ලැජ්ජයි.. "

"නෑ ඩැඩි මේකි මට ලොකු කම් දැම්මා... මං මේකිව මෙල්ල කරන්න හැදුවේ මගේ ක්‍රමේට... හැමදම හොට්

කෙල්ලෝ යූස් කරලා ඇති වෙලා... මං බැලුවේ කියුට් කෙල්ලෙක් ට්‍රයි කරන්න.. මොනා නැතත් ඩැඩ් ඔයාගේ කෙල්ලෝ තෝරගැනීමේ හැකිවානම් මේ පිස්සට ඇවිත් තියනවා... "

"ඔව් ඔව්. ඒක විතරයි.. අනිත් ඔක්කොම අර මෝඩ ගෑනිගේ ඒවා ඇවිත් තියෙන්නේ"

තාත්තයි පුතයි මහ හය්යෙන් හිනාවෙනවා... තමන්ගෙම ලේ නේද කියලා නිකමටවත් හිතෙන්නැද්ද දෙවියනේ... නිතිනු අයියා අයෙත් බිත්තියට හේත්තුවෙලා වෙව්ලනවා... දිනේශ් ආපු ගමන් එයාගේ තත්වේ තවත් බරපතල වුනා..

ඒ මිනිහා නිතිනු අයියා ලගට ගිහින් එයාට පයින් ගැහුවා... මං මගේ කොන්ඩේන් අල්ලන් හිටිය අත හපලා නිතිනු අයියා ලගට ආවා... එයාව වැහෙන විදිහට තුරුල් කරගත්තේ ගහන එකක් මට වැදෙන්න කියලා හිතාගෙන... ඒ මිනිහා ගහපු ඊගාව පයින් පාර වැදුනේ මගේ කොන්දට...

"නැගිට්ටින්නකෝ අයියේ.. පේන්නැද්ද මට රිදෙනවා කියලා.. මගේ ඇහෙන් කදුලක් වැට්ටුවොත් ඒ මිනිහව ඉතිරි කරන්නෑ කිව්වා නේද... බොරුද ඒ කිව්වේ... ආ.. නැගිට්ටින්න... මේ මිනිහා ඔයාගේ අම්මිව මැරුවා... ඔයා ඒ මිනිහට බයේ ඉන්නවද... ආඅ.... ඒකද ඔයාගේ අම්මට ඕනේ... නැගිට්ටින්නකෝ... "

මන් නිතිනු අයියගේ උරහිස් වලින් අල්ලන් හය්යෙන් හෙලෙව්වා.. තව තවත් බිත්තියට හිරවුනා මිසක් එයා ප්‍රතිචාරයක් දැක්වුවේ නෑ..

"මොනා නැතත් මූටත් අම්මා වගේම මෝඩ ගෑනියෙක් හම්බෙලා තියෙනවා... අනේ මෝඩ කෙල්ලේ උබ කොච්චර කෑ ගැහුවත් ඔය පිස්සා නැගිට්ටින්නේ නෑ... මේක ෆිල්ම් එකක් නෙවෙයි කෙල්ල කෑ ගහද්දී කොල්ලා වටේ උන්ට නෙලාගෙන යන්න "

"ඔහ් ඔයාට වැරදුනා ඩෑඩ්... කොහෙද මෙතන කොල්ලෙක් ඉන්නේ... මෙතන ඉන්නේ අපේ නංගි මල්ලිනේ... "

ඒ මිනිස්සු දෙන්නා මහ හය්යෙන් හිනාවෙනවා... මගේ කේන්තිය උපරිමේටම ගිහින් තිබ්බේ... ඒත් මං කෙල්ලෙක් කොහොමද සද්දන්ත පිරිමි දෙන්නෙක් එක්ක හැප්පෙන්නේ... ඒ නිසාම මං නිතිනු අයියාගේ කොලර් එකෙන් අල්ලලා හෙලෙව්වා..

"නැගිට්නවා මෝඩයෝ.. ඇහෙන්නේ නැද්ද මූන් කියන ඒවා.... ඔයාගේ පිරිමිකම හෑල්ලු කරන්නේ මූන්... උන් කියන දේවල් ඔප්පු කරන්නද ඕනේ.... නැගිට්නවා... මූන් ආවේ තමුන්ගේ අම්මගේ දේපල හූරගෙන කන්න... ඒකට කටපියන් ඉන්නවද තමුන්... ආ....... කියනවා.. එහෙමද අම්මට කලගුන සලකන්නේ.... මෙහෙම බයගුල්ලෙක් වගේ

හැංගෙන්නද අම්මා ජීවිතේ දීලා තමුන්ව බේරගත්තේ..."

මං කෑ ගහනකොට එයා මත් දිහා බලන් හිටියා මලානික විදිහටම.. මූන කකුල් අස්සේ ඔබාගෙන ඉන්නවට වඩා මට බලාපොරොත්තුවක් ගෙනාවා ඒ හැසිරීම...

"ඒය් කෙල්ලේ දැන් ඇති ඔය ඩ්‍රාමා එක.. මොනා කිව්වත් ඔය පිස්සා නැගිට්ටින්නේ නෑ... බල්ලෙක් වගේ අම්මා මැරිච්ච තැනම මැරිලා යයි තව ටිකකින්... එතකොට ඉතින් සදහටම නැගිට්ට එකක් නෑ... "

හිතක් පපුවක් නැති ගානට ඒ මිනිහා හිනාවෙනවා... මිනිස්සුන්ට මේ තරම් තිරිසන් වෙන්න පුලුවන්ද... දේපල වෙනුවෙන් තමන්ගේ පුතා මරන්න තරම්..

"තමුසේ මහ තිරිසනෙක් ඕය්... තමුන්ගෙම ලේ නේද මේ.. දේපල වෙනුවෙන් තමන්ගෙම පුතාව මරන්න පුලුවන් ද මනුස්සයෙක් ට... තමුසෙට තිරිසනා කියන එකත් හොද වැඩී... "

"හහ් මගේ පුතා? මේ ඉන්නේ මගේ පුතා... ඔය ඉන්නේ මේ ලෝකේ ඉන්න ඕනේ නැති එකෙක්.. සම්පූර්ණයෙන්ම අත්වැරැද්දක්... පොඩි පෙත්තකින් විසදන්න තිබ්බ කේස් එක අර මෝඩ ගෑනි දුර දිග අරන් ගියේ... ඒ ගෑනිගේ පවු වලට මත් කරගහන්න ඕනෙද... කොහෙද යන DNA ටිකක් නිසා මේ සැප ජීවිතේ නැති කරගන්න තරම් මං

මෝඩ නෑ... "

නෝන්ඩියට හිනා වෙන ගමන් ඒ මිනිහා ඉනෙන් ගත්තේ ගන් එකක්... ඒ වෙලාවෙනම් මට බය හිතුනා... ජීවිතේට ගන් එකක් සියැසින් දැකලා තිබ්බේ නෑ මං.. ඒ ගන් එකේ ඉලක්කේ වෙලා තිබ්බේ නිතිනු අයියා.. බයටම උගුර කටත් වේලිලා ගියා...

"අය්යෝ ඩෑඩ්... මේක හරි බෝරින්ග් නේ... එකපාරයි මූ ඉවරයි... අපි මීට වඩා ෆන් විදිහට මේක ක්ලෝස් කරලා දාමු... අනේ ලේ ගෑවෙන්නෙත් නෑ... අය් මීන් ගොඩක් ගෑවෙන්නේ නෑ... "

"ම්ම්ම් දැන් මොනාද ඉලන්දරියට වෙන්න ඕනේ.... "

"ඩෑඩ් නිකමට හිතන්න අම්මා මැරිච්ච තැනම පන වගේ ලව් කරන කෙල්ල දෙන්නෙක්ගේ අතින් රේප් වුනාම මූට කොහොම දැනෙයිද... අයේ ඉතිම් මොන ලෝකේ ගියත් හොදකරගන්න වෙන්නේ නෑ... අපිට තියෙන්නේ පිස්සන් කොටුවට ගිහින් දාන්න.. බුලට් නාස්ති නොවීම වැඩේ වෙනවා.. ෆුල් ෆන් එකක් ගන්නත් පුලුවන්... "

"වාහ් උබ නම් මගේ පුතාම තමයි... "

මං ඇස් ලොකු කරන් ඒ මිනිස්සු දෙන්නා දිහා... ලෝකේ තියන අසික්කිතම වචන ටික කියලා

කරටත් අතදගන්නවා... පුතෙක්ට තාත්තෙක් එක්ක කියන්න පුලුවන් දෙයක්ද ඒ කිව්වේ... තාත්තත් ඒකට එකග වුනා.. තිරිසන් සත්තුවත් මෙහෙම දේවල් කරන්නේ නැතුව ඇති.... මගේ හිතේ තිබ්බ ධෛර්ය ඔක්කොම ක්ශනිකව හිදිලා ගියා... මං අසරන විදිහට තිතිනු අයියා දිහා බැලුවා..... එයා හිටපු විදිහටම ඉන්නවා... මේ ගෙදර ලොකු නිසා කෑ ගහලා වැඩක් නෑ කියලත් මං දන්නවා..... මේ ගෙදරට ආවා කියන්නේ මේ මිනිස්සු දෙන්නා සුමනා අම්මලාටත් මොනා හරි කරලා ඇත්තේ...

එකපාරටම මං ගැස්සිලා ඉස්සරහ බැලුවේ අත දිගේ දැනුන ස්පර්ශෙට... දිනේශ් ඇදේ ඉදගෙන ඉද්දි අනිත් මනුස්සයා මාව අල්ලන්න හදනවා... මං ඉක්මනට එතනින් එහාට උනා... ඒත් ඌ කොන්ඩෙන් ඇදලා අරන් ආව ඒ ඇගටම හිරකරගත්තා.. මට දැනිනේ පුදුමාකාර පිලිකුලක්.. මං දගලද්දි තවත් හිර කරන් ඒ මිනිහා මාව අල්ලනවා...

"අතෑරපන් මාව... අතෑරපිය..."

"ඕ ස්විට් බය වෙන්න එපා ඩාර්ලින්.. ලෙට්ස් එන්ජෝය්.."

බෙල්ලේ දත් පාරවල් තිය තියා මට මාව අප්පිරියා කෙරෙව්වා ඒ මිනිහා.. මං කොච්චර අතට ගැහුවත් හීරුවත් ඒ මිනිහට ගානක් නෑ... තත්පරයක් යන්නත් කලින් මගේ ගවුම කර ලගින් ඉරිලා ගියා... දගලලා දගලලා තවත් හයියක් නැති තැන

මං නිතිනු අයියට කතා කරේ මං වෙනුවෙන් ඉන්න එකම ආරක්ෂකයා එයා නිසා..

"නිතිනු අය්යේ නැගිටින්න... පේන්නැද්ද මට මේ මිනිස්සු කරන දේ.. ඔයාව විශ්වාස කරලා නේද මං ආවේ... ඔයාට අයිති දේවල් මුත් ගත්තොත් මන් තවත් තත්පරයක් වත් ජීවත්වෙන්නේ නෑ... ඔයාට ඇහෙනවද... නැගිටිනවා..."

මං කෑ ගහද්දි ඒ මිනිහා මාව උස්සලා ඇඳ උඩින් අතෑරියා... මගේ සිරුර මත ඉදන් දෙතොල් හපා කනවා... මල් පෙත්තක් වගේ නිතිනු අයියා කිස් කරපු මගේ දෙතොල් ඒ අපිරිසිදු තොල් වලින් අල්ලද්දි රිදුනටත් වඩා මන් ඇඩුවේ පිලිකුල දරාගන්න බැරුව..

ඒත් එක්කම ඒ මිනිහා මගේ ඇග උඩින් ඇදිලා ගියේ උනේ මොනාද කියලා මට හිතාගන්න බැරි වෙද්දි... ඒත් පිටිපස්සෙන් දැකපු කේන්තියෙන් වෙව්ලන රුව නිසා මගේ මූනේ ඇදුනේ හිනාවක්...

# 34 කොටස

යකෙක් වගේ ඇස් රතුකරන් නිතිනු අයියා අර මිනිහාගේ බෙල්ලෙන් අල්ලන් හිටියේ... අතපය වෙව්ලනවා එයාගේ... දැක්කම බය හිතෙන බැල්මක් ඒක... ඒ මිනිහගේ බෙල්ලෙන් අල්ලලා බිත්තියට තියලා තනි අතින් ඉස්සුවා.. නිතිනු අයියාගේ අතට ගහන ගමන් ඒ මිනිහා දගලනවා හුස්ම ගන්න බැරුව..

"නිතිනු අයියෙ.. ඔය මිනිහව අතාරින්න.. මැරෙයි... කියන දේ අහලා අතාරින්න.. මේ මිනිහාව මරල හිරේ යන්නද ඕනෙ ඔයාට.. එතකොට මට මොනාද වෙන්නේ... "

මන් කෑ ගහනකොට නිතිනු අයියා පොඩ්ඩක් බෙල්ල ලිහිල් කරා... යන්තම් බිමට අඩිය තියාගෙන ඒ මිනිහා හති අරිනවා.. දිනේශ් කාමරේ හිටියේ නෑ... කොයි වෙලාවේ ගියාද කියන එක අපි දැක්කේ නෑ...

"අය්...."

නිතිනු අයියට කතාකරන්න හදපු මං එහෙමම නතර වුනේ එයාගේ රවුද්‍ර ඇස් මං ගාව නැවතුන නිසා.... මගේ වචන ගොලු කරන්න තරම් ඒ බැල්ම බලවත් උනා... ඒ ඇස් මගේ තොල් ගාව නතර වුනා..

ඒ ඇස් තවත් කේන්තියෙන් රතුවෙලා ගියා... මගේ ඉරිච්ච ඇඳුම දිහයි හපා කාලා තියන බෙල්ල දිහයි එයා මාරුවෙන් මාරුවට බැලුවේ අත මිටි වෙද්දී... ඒත් එක්කම පිටිපස්සෙන් ඒ මිනිහා එල්ල කරපු පහර තිතිනු අයියා වලක්ව ගත්තේ ටැමිල් මූවි එකක හීරෝ වගේ...

ඒ අත අනික් පැත්තට අඹරලා අත මිටි කරපු පහරක් කටට එල්ලකරේ මගේ තොල් තුවාල වෙච්ච එකේ පලිය ගන්න කියලා මට තේරුනා... ඒ මිනිහා කෑ ගහන තරම් හය්යෙන් අත අනික් පැත්තට ඇඹරුවා.. ඒ ඇස් වල තිබ්බේ "මේ අතින් නේද උඹ මගේ කෙල්ලව ඇල්ලුවේ " වගේ දෙයක්.. එහෙම්මම ලග තිබ්බ මල් වාස් එකක් අරගෙන ඔලුව මැදටම ගැහුවේ මං අත් දෙකෙන් කටත් වහගද්දි... ලේ බේරී බේරී දගලන ඒ මනුස්සයා දැක්කම මගේ ඇග හිරිවැටිලා ගියා... ඔලුවත් අල්ලන් ඇද උඩින් වාඩි වුනේ මට තවත් ඒ වගේ දරුනු දර්ශනයක් බලන්න බැරි නිසා.... කොච්චර නරක මිනිහෙක් වුනත් එහෙම ඉන්නවා මට බලන්න බෑ...

තිතිනු අයියට ඇති වීමක් නෑ... බෙල්ලෙන් අල්ලන් දනිස්ස නවලා යටි බඩට ගහනවා... ඒ මනුස්සයා අත් දෙක එකතු කරලා තිතිනු අයියට වැන්දා එයාගෙන් බේරෙන්නම බැරි තැන... ඒත් තිතිනු අය්යට ගානක් නෑ එයා හැසිරෙන්නේ වියරුවෙන් වගේ... එක වචනයක්වත් පිට නොකර අතින් පයින් එයා කතා කරේ.... තිතිනු අයියගේ පාහරවල් දරාගන්න බැරුව ඒ මනුස්සයා සිහිය නැතුව

ඇදන් වැටුනම තමයි එයා නතර වුනේ... සිහිය නැති වුනාද මැරුනද දන්නේ නෑ...

තවත් පයින් පාරක් ගහලා එයා බැලුවේ මං දිහා... කවදාවත් නැතුව එයා මන් දිහා බලද්දි මට බයක් දැනුනා.. ඇද දිගේ ඇදි ඇදී පිටිපස්සට ගියේ ඒ නිසාමයි... එයා ඇද උඩට ඇවිත් මගේ ඇග උඩ ඉදන් දෙතොල් අල්ලගත්තේ රළු විදිහට... අර මනුස්සයාගෙන් ඉදුල් වෙච්ච පාරවල් මැකෙන්න වගේ එයා මාව කිස් කරනවා.. දෙතොල් පුපුරු ගහන තරම් රිදුනත් මට ඒ පහසෙන් මිදෙන්න ඕනේ උනේ නෑ... ඒ මං පන වගේ ආදරේ කරන කෙනාගේ ස්පර්ශය.. ඉතින් කොහොමද මං මගහරින්නේ...

දෙතොලින් නොනැවතී බෙල්ල වටේ ඒ තොල් අරන් ගියේ කලින් තිබ්බ දත් පාරවල් මැකෙන විදිහට එයාගේ දත් පාරවල් තියමින්... මගේ සිරුර ඒ හැඩිදැඩි අත් වලින් පොඩි වුනා.. එයාට ඕනේ අයිතිය කියාපාන්න... මාව අයිති එයාට විතරයි කියලා පෙන්නන්න.. හිස අතගාමින් මං එයාට ඉඩ දුන්නේ ඒ කේන්තිය මගේ මතින් නිවාගන්න දීලා... දන්නවා මං එයාගේ හැම හැගීමක්ම පාලනය කරන්න පුලුවන් මට විතරයි කියලා.. ඒත් කාමරේ දෙර ලග ඉදන් කෑ ගහන් ආපු දිනේශ් නිසා අපි දෙන්නගෙම අවදානය බිදුනා...

"පුතා පුතා මොකද මේ ඇස් අරින්න... පුතා... බල්ලා තෝ මොනාද මගේ පුතාට කරේ.... "

දිනේශ් කෑ ගහගෙන ඉනේ තිබ්බ පිස්ටල් එක අරගත්තා.... ඒත් නිතිනු අයියගේ ඇස් වල නම් බයක සේයාවක්වත් තිබ්බේ නෑ... තාමත් ඒ මූනෙ තිබ්බේ කලින් තිබ්බ වියරුවමයි... ඇඳ උඩින් පෙරලිලා කකුලෙන් පිස්ටල් එකට ගැහුවා විසි වෙලා බිත්තියේ වදින්නම... ඊටපස්සේ ඒ මිනිහගේ බෙල්ලෙන් අල්ලගත්තා කලින් වගේම... මං ඇඳේ කොනට ගුලි වෙලා බලන් හිටියේ වෙන්න යන දේ දිහා... මට අත තිබ්බ එකට අරහෙම ගැහුවනම් අම්මා මරපු මිනිහට මොනා නොකරයිද...

එයාව නවත්තන්න ඕනේ උනත් මට හයියක් තිබ්බේ නෑ... මං බයයි එයා දැන් ඉන්න විදිහටම.. දිනේශ් හොඳටම බය වෙලා බලන් ඉන්නවා නිතිනු අයියා දිහා... රෙද්දක් ගලේ ගහනවා වගේ දිනේශ්ගේ ඔලුව මේසෙ ගැටිටේ ගහගෙන ගහගෙන ගියේ මං බයවෙලා කෑ ගහද්දී...

"නිතිනු අයියේ ඕක නවත්තන්න... අනේ ඕක නවත්තන්න... ඔය මනුස්සයා මැරෙයි... මට බය හිතෙනවා.. අනේ නවත්තන්නකො..."

මගේ කෑ ගැහීම ගනන් නොගෙන නිතිනු අයියා තවත් මල් වාස් එකක් මේසේ ගහලා එකෙන් කෑල්ලක් අරන් අරන් ඒක දිහා බලලා දිනේශ් දිහා බලලා කට කොනින් හිනා වුනා..

"එපා......................"

මං හයියෙන් කෑගහද්දි නිතිනු අය්යා වීදුරු කෑල්ල ඒ මිනිහගේ බඩ ලගින් නතර කරා... මං සිව්ලිම දිහා බලලා සැනසුම් සුසුමක් හෙලුවා.. ඇස් වලින් කදුලුත් එනවා බය වෙච්ච පාර.. මං හිතුවේ ඒ වීදුරු කෑල්ල දිනේශ් ගෙ බඩ හිල් කරන් යයි කියලා..

"ආආආආආආ..................................."

නිතිනු අයියා පිටිපස්ස හැරිලා ඔලුව බදාගෙන හයියෙන් කෑ ගැහුවා... මං එයා ලගට යන්න කකුල බිම තියන්න හද්දිම ඒ හිස හරහා වැදුනේ අර මිනිහා ලොකු ෆොටෝ එකකින් ගහපු පාර... ගන ෆ්‍රේම් එකක් තියන ලොකු ෆොටෝ එකේ වීදුරු කෑලි කෑලි වෙලා කාමරේ පුරා විසිරුනා... නිතිනු අයියගේ ඔලුවෙන් ලේ ගලන් ගියා තත්පරයක් යන්නත් කලින්... මට දැනුනේ මගේ හදවත නැවතුනා වගේ... තත්පර ගානක් හදවතත් එක්ක මුලු ලෝකෙම නවතින්න ඇති.... හිටපු තැනම මං ගල් වෙලා හිටියේ මොලේ ප්‍රතිචාර දක්වන ක්‍රියාවලියත් නතර වෙච්ච නිසා වෙන්නැති... ඇස් පිල්ලන් නොගහ මන් වෙච්ච දේ තේරුම් ගන්න උත්සහ කරා... මන් පියවී සිහියට ආවේ මුලින් කපපු කෙහෙල් කදක් වගේ නිතිනු අයියා බිමට වැටෙද්දි...

# 35 කොටස

දිනේශ් වැනී වැනී දෙර ලගට යද්දී සිහිය නැතිවෙලා බිම වැටුනා.. කකුල උස්සගන්න පුලුවන් වෙච්ච තත්පරේම මන් නිතිනු අයියා ගාවට දිව්වා... එයා ගාවින් ඉදගත්තත් එයාව අල්ලන්න බයයි මට... අත පය වෙව්ලනවා... ඇස් වලින් කඳුලු බේරෙනවා... ලේ විලක් මැද එයා හිටියේ...

"චූ...චූටි. මැ... නි...ක.... "

අඩවන් වෙච්ච ඇස් වලින් මං දිහා බලාගෙන මගේ මූනට අත තියන්න හදනවා එයා... මන් දන්නවා මගේ කඳුලු පිහදන්නයි ඕනෙ එයාට.. මං අත් දෙකෙන් කඳුලු පිහදගෙන එයාව මගේ ඔඩොක්කුවට ගත්තා... බොහොම අමාරුවෙන් එයා හිනා වුනා මාත් එක්ක... එයාට ගොඩක් රිදෙනවා ඇති...

"බ.....බා..... අ...ඩ..න්..න.. එ....පා... ම....ට. ගො....ඩ...ක්. රි.... දෙ..න්..නේ.. නෑ... මං අ.... මි...මි. ගා... ව....ට. ය....න්...නේ... එ...යා.... ම...ට. ක...තා.... ක...ර...න..වා..."

"මොනාද රත්තරන් මේ කියන්නේ... ඔයාට මුකුත් වෙන්නේ නෑ.. අහන්නකෝ මුකුත් වෙන්නේ නෑ... මං මං ඉන්නවනේ... ඔයාට මුකුත් වෙන්න දෙන්නේ නෑ...

පොඩි තුවාලයක් තියෙන්නේ.. අපි බෙහෙත් දමු... ඔහොම ඉන්න මං කාව හරි කතා කරන් එන්නම්..."

එයාව බිමින් තියලා මං දුවගෙන ආවා කාමරෙන් එලියට... කකුල් දෙකත් එක්ක වෙව්ලනවා... කොන්ඩෙත් ඇද ඇද මං එහාට මෙහාට දිව්වේ පිස්සුවෙන් වගේ... කරන්න කිසිම දෙයක් සිහි වුනේ නෑ මට.. ඒත් එක්කමයි මුල්ලක ගැටගහලා ඉන්න ගුනදාස මාමයි සුමනා අම්මවයි දැක්කේ... දුවගෙන ගිහින් ගුනදාස මාමා ගැටගහලා තියෙන ලනුව ලිහන්න උත්සහ කරා... ඒත් අත් වෙව්ලන නිසා ලිහන්න අමාරුයි.. මන් ඉකිගගහා අඩ අඩ ලනුව දෙපැත්තට ඇද්දා... අත තුවාල වෙනකන් ලනුව කඩන්න හැදුවත් හරිගියේ නෑ... බැරිම තැන කටින් හැපුවා මන්... ඒත් එක්කම දගලලා දගලලා ගුනදාස මාමා කට ලිහාගත්තා...

"චූටි නෝනා... කලබල වෙන්න එපා... කුස්සියට ගිහින් පිහියක් අරන් එන්න.."

ගුනදාස මාමා කියද්දි තමයි මට පිහිය මතක් උනේ.... කුස්සියට ගියත් කලබලේට පිහිය හොයාගන්න මට ගොඩක් වෙලා ගියා... ඉක්මනට පිහියෙන් ලනුව කපලා නිතිනු අය්යා ලගට දුවන් ආවා... එයා ඇස් ඇරන් හිටියේ ගොඩක් අමාරුවෙන්..

ගුනදාස මාමා දුවගෙන ඇවිත් ගොඩක් අමාරුවෙන් නිතිනු අයියව අරන් වාහනේට දගත්තා...

මන් පිටිපස්සෙන් වාඩි වෙලා එයාව ඔඩොක්කුවෙන් තියාගත්තා... ඒ ඇස් මන් දිහාම බලාගෙන හිටියේ...

"කි... කි... ස්. එ...ක...ක්. දෙ... දෙ...න්..න...කෝ..."

බොහොම අමාරුවෙන් වචන ගලපන් එයා කිව්වේ... රතු පාට වෙච්ච අත් දෙකෙන් එයාව පපුවට තුරුල් කරන් එයාගේ මූල මූනම කිස් කරා මන්.. එයා ලාවට හිනාවෙලා මගේ ඇස් දිහාම බලන් හිටියා...

"බ...බා.... ස...මා...වෙ...න්..න... ම...ට. ගො....ඩ....ක්. ආ..... ද... රෙ...ය්. මං.. "

ඇහෙන නෑහෙන හඩින් මුමුනලා එයා නිශ්ශබ්ද උනා... ඒ ඇස් සම්පූර්ණයෙන්ම පිය වෙලා... හිතට දැනුන බය මෙච්චරයි කියන්න බැරි තරම්

"අයියේ... අයියේ.. අනේ අයියේ..ඇස් අරින්නකෝ... අයියේ.... අනේ මාමේ.... ඉක්මනට යන්කෝ... එයා ඇස් අරින්නෑ... තිනූ නැගිටින්නකෝ රත්තරන්... මං බයයි.. ඔහොම ඉන්න එපා... කතා කරන්න මං එක්ක... කතා කරන්නකෝ.. තව ටිකයි හොස්පිටල් එකට තියෙන්නේ.. බෙහෙත්දමු අපි.... අනේ ඇස් අරින්නකෝ... පේන්නැද්ද මං අඩනවා.... ආ...ආඅ. නැගිටින්නකෝ මට බය හිතෙනවා...

මං කොච්චර කතාකරත් එයා ඇස් ඇරියේ නෑ...

හොස්පිට්ල් එකට ආපු ගමන් එයාව ට්‍රොලියක දාගෙන තල්ලු කරන් ගියා... මන් එයාගේ අත අල්ලන් පස්සෙන් දුව දුව එයාට කතා කරා... ඒත් එයා හෙලවුනේවත් නෑ... ඉමජෙන්සි යුනිට් එකට ඇතුලට අරගත්තේ මාව එලියෙන් තියලා... කොච්චර දෙරට ගැහුවත් මාව ඇතුලට ගත්තේ නෑ... ගුනදාස මාමා මාව වත්තම් කරගෙන ඇවිත් පුටුවකින් වාඩි කරා... ඇහිපිල්ලමක් වත් නොගහා මන් දෙර දිහා බලන් හිටියා කවුරුහරි එලියට එනකම්.. කවුරුහරි එලියට එන්න දෙර අරිද්දිම මන් දුවන් ගිහින් දෙර ලගින් හිටගත්තා... එලියට ආවේ ඩොක්ටර් කෙනෙක් කියලා හිතන්න පුලුවන් කෙනෙක්...

"දැන් ගෙනාපු පේශන්ගේ බාරකාරයා කවුද"

"ම..මං ඩොක්ට... එ.. එයාට දැන් හොදයිද.. ඇස් ඇරියද එයා..."

"තත්වෙනම් ටිකක් සීරියස්... පාර වැදිලා තියෙන්නේ ඔලුවේ පිටිපස්සට නිසා ඩැමේජ් එක වැඩියි... ඒ නිසා එයාට දැන්මම ඔපරේශන් එකක් කරන්න වෙනවා.. ඒකට සයින් කරන්න එයාගේ බාරකාරයෙක් ඕනේ.... "

"මං සයින් කරන්නම් ඩොක්ට.. මං එයාගේ වයිෆ්.."

"හරි දැන් නර්ස් කෙනෙක් පේපර්ස් ටිකක් අරන් එයි... ඉක්මනට සයින් කරන්න..."

මගේ උඩ ඉදන් පහලට ඇස් අරන් ගිහින් ඩොක්ටර් එලියට ගියා... නර්ස් කෙනෙක් ගෙනාපු කොල ටික සයින් කරලා මං බිත්තියට හේත්තු වෙලා බිම ඉදගත්තා.... එක එක විකාර හිතෙනවා මට... කකුල් දෙක අස්සෙ මූන ගහන් ඇඩුවා.... හදවත ගැලවිලා යන්න තරම් බය වෙලා ඉන්නේ මන්..

"සුදූ........."

මං කකුල් දෙකෙන් මූන ඉස්සිවේ අයියගේ කටහඩට.. එයා කොහොම ආවද කොයි වෙලේ ආවද මට හිතන්න ඕනෙ වුනේ නෑ... එයාගේ කරේ එල්ලිලා හය්යෙන් ඇඩුවා...

"ති..තිතිනු අයියා ඇතුලේ... එ එයාට අර මිනිහා ගැහුවා... ලේ ගොඩක් ආවා... අනේ එයාට මුකුත් වෙන්නේ නෑ නේද අයියෙ.. ඩොක්ටර් කිව්වා එයාට අමාරුයි ලූ.. ඔපරේශන් එකක් කරන්න ඕනේලූ.... කියන්නකෝ එයාට මුකුත් වෙන්නේ නෑ කියලා.... මට බයයි අයියේ.. එයා කිව්වා අම්මි ලගට යනවා කියලා.... ඒ බොරුවට නේද කියන්නැත්තේ... මං ඉන්නවනේ එයාට... මං ගාව ඉන්නකොට අම්මා ලග ඉන්නවා වගේ කිව්වනේ එයා... ඉතින් ඇය් අම්මි ගාවට යන්නේ.... කියන්නකෝ එයා මාව දාලා යන්නේ නෑ කියලා.... මට බයයි....... "

"නෑ සුදූ... නිතිනු අයියට මුකුත්ම වෙන්නේ නෑ... එයාට හොඳවෙය්... නැගිටින්නකෝ දැන් ඔතනින් බලන්නකෝ ඔයාගේ ඇඳුමත් ඉරිලනේ... කෝ නැගිටින්න... අපි ගෙදර ගිහින් වොශ් එකක් දාගෙන එමු... එනකොට නිතිනු අයියා නැගිටලා තියෙයි... "

"බෑ... අනේ බෑ මං යන්නෑ මට බෑ... එයා එයා නැගිටලා මාව හොයයි... බයවෙයි එයා මන් නැතිකොට... මන් යන්නෑ..... "

"හරි හරි සුදූ අපි ඉමු... කෝ දැන් හොඳ ලමයා වගේ නැගිටින්නකෝ... අපි අතනින් ඉඳගෙන ඉමු.. නිතිනු අයියාගේ ඔපරේශන් එක ඉවරවෙනකම්.. ම්ම්ම්... කෝ එන්න..."

අයියා මාවත් අරන් ඔපරේශන් කාමරේ ඉස්සරහ පුටුවකින් වාඩිවුනා... එයාව බදාගෙන මන් කලින්ටත් වඩා හය්යෙන් ඇඩුවා...

"සුදූ අඩන්න එපා පැටියෝ... නිතිනු අයියට මුකුත්ම වෙන්නේ නෑ... ම්ම්ම් එයා ඇහැරෙනකොට ඔයා ඔහොම අඩ අඩා හිටියොත් එයාට දුක හිතෙය්... ඔයා අඩනවට එයා කැමති නෑ නේද... කෝ කඳුලු පිහදාගන්න... "

"අයියේ එයාගෙන් ලේ ගොඩක් ආවා... එයාට ගොඩක් රිදෙනවා ඇති නේද... පව් එයා... එයා ඔළුව මහයි...

එතකොට රිදෙයි එයාට.. පොඩි කාලේ මැහුන් දෙකක් ගොඩක් රිදුනා මට.. එයාට ගොඩක් මැහුන් දැම්මම ගොඩක් රිදෙයි... ඇය් එයාටම එහෙම වෙන්නේ... ඇයි එයාට එච්චර දුක් දෙන්නේ... පව් මගේ නිතිනු අයියා..... ඉහි ඉහි ඉහි "

මං පිස්සුවෙන් වගේ එක එක ඒවා දෙඩෙව්වා... අයියා කියන දේවල් ඇහුනත් ඒ එකක්වත් මොලේට ගියේ නෑ... මට මැවී මැවී පේන්නේ නිතිනු අය්යා හිටපු හැටි... තියටර් එකේ දොර ඇරුන නිසා මන් ගැස්සිලා නැගිට්ටා.. නර්ස් කෙනෙක් එලියට එද්දි මන් දුවගෙන ආවා එයා ලගට..

"පේශන්ගේ ගොඩක් ලේ ගිහින් තියෙන්නේ ඉක්මනට ලේ දෙන්න ඕනෙ.. එයාට ඕනේ ලේ වර්ගේ අපි ගාව නෑ... කවුරුහරි රිලේශන් කෙනෙක් ඉන්නවද ලේ ගන්න පුලුවන්..."

"ම... මගෙන් ගන්න මිස් මං ඕ පොසිටිව්... ඒක නිසා ඕනේ කෙනෙක්ට ගැලපෙනවනේ... මගෙන් ගන්න... ඔක්කොම හරි අරන් එයාව බේරලා දෙන්න.."

"අහන්නකෝ දරුවෝ.... ලේ දෙන්න නම් බර කිලෝ 50 ට වැඩි වෙන්න ඕනේ.... ඔයාට දෙන්න බෑ... "

"අනේ මං 45 ක් ඉන්නවා... පොඩ්ඩයිනේ මදි... මං එයාට ලේ දෙන්නම්.... "

"සුදූ... නවත්තන්න ඕක... ඔයාට ලේ දෙන්න බෑ... "

"අනේ අයියේ මට පුළුවන්... මට මූකුත් වෙන්නෑ... නිතිනු අයියට අමාරු ඇති.... "

"හරි සුදූ අයියා ඉන්නවනේ... අයියා නිතිනු අයියට ලේ දෙන්නම්... මං එනකම් ඔතනින් ඉදගෙන ඉන්න අඩන්නැතුව..."

මාව එලියෙන් තියලා අයියා ඇතුලට ගියා... එයා ගියාම තවත් දුක වැඩිවුනා මගේ.. හූල්ල හූල්ල මං එතනම බිමින් ඉදගත්තා.... අනේ මට ඕනෙ එයා ලගට යන්න... එයාට තුරුල් වෙලා මගේ බය නැති කරගන්න ඕනේ.... ඒත්.. ඒත් යන්න විදිහක් නෑනේ...

ටික වෙලාවකින් අයියා එලියට ආවා... ආයෙත් මාව අරන් පුටුවෙන් ඉදගත්තා.... පැය ගානක් දොර දිහා බලන් හිටියා... ඒ වෙලාව දැනුනේ කල්පයක් වගේ... ආයෙත් දොර ඇරෙද්දි කලින් වගේම මං ඉස්සරහට දුවගෙන ගියා... මේ සැරෙ නම් ඩොක්ටර්මයි එලියට ආවේ...

"ඩොක්ටර්.. එයාට කොහොමද ඩොක්ට.. දැන් හොදයි ද එයාට.. සිහිය ආවද... මාව හොයනවද එයා...."

ඩොක්ටර් මන් දිහා බැලුවේ අනුකම්පාවෙන් වගේ... ඒ බැල්ම තවත් මගේ බය වැඩි කරා... බැරෑරුම් මූනක් හදන් එයා බැලුවේ අයියා දිහා...

"ඩොක්ට නිතිනුට කොහොමද දැන්..."

"මේ මිස්ටර්....?"

"ආරාද්‍ය සේනාදීර... මන් පේශන්ගේ හොදම යාලුවා... මේ ඉන්නේ මගේ නංගි.. එයාට කොහොමද දැන්..."

"මෙහෙමයි මිස්ට ආරාධ්‍ය අපි පුලුවන් තරම් ට්‍රයි කරා බට් අපිට පේශන්ගේ ජීවිතේ ගැන බලාපොරොත්තු තියාගන්න අමාරුයි.. "

ඒ වචන මට ඇහුනේ හීනෙන් වගේ... මොනවද දෙවියනේ මට ඇහෙන්නේ... එයා එයා කොහොමද මාව දාලා යන්නේ.... නෑ ඒක වෙන්න බෑ... එහෙම වෙන්න බෑ... කොහොමද එහෙම වෙන්නේ... මන් කොහොමද එයා නැතුව ඉන්නේ... එයාට තුරුල් වෙන්නැතිව කොහොමද දවසක්වත් ඉන්නේ... ඒ හිනාව ඒ වලගැහෙන කම්මුල් බලන්නැතුව කොහොමද මං ඉන්නේ... එයාගේ රස්නේ නැතුව මට තත්පරයක්වත් ඉන්න බෑ...

අඩියක් පස්සට තියවුනේ මටත් නොදැනීම..

අයියා ඇවිත් මාව අල්ලගත්තා... සේරම දේවල් බොඳවෙලා පෙනුනේ මට... අයියා මොන මොනාදෝ කිව්වත් මට ඒවා තේරුනේ නෑ... මට මැව් මැවී පෙනුනේ නිතිනු අයියව... මාව තුරුල් කර ගන්න හැටි.. ආදරෙන් චූටි මැනික කියන හැටි... ඒ ලස්සන ඇස් වලින් මන් දිහා බලන් ඉන්න හැටි... මාව පිස්සුවෙන් වගේ කිස් කරන හැටි... හදවත කෑලි කෑලි වලට බිඳිලා යනවා වගේ දැනුනේ.. පපුවත් අල්ලගෙන අයියගේ ඇගට කඩන් වැටුනේ ඇස් දෙකත් ලාවට පියවෙලා යද්දී...

## 36 කොටස

ඇස් අරිද්දි මන් හිටියේ හොස්පිට්ල් එකේ ඇදක් උඩ.. ඇගේ තිබ්බ තුවාල වලට බෙහෙත් දලා ඇඳුමක් අන්දලා තිබ්බා මට.. ඔලුව හරවලා බලද්දි අයියා අහසී අක්කත් එක්ක කතා කර කර ඉන්නවා... මං ඔලුව හොල්ලනවා දැකලා අයියා ලගට ආවා...

"සුදූ.... දැන් කොහොමද පැටියෝ... "

"අයියේ නිතිනු අයියා.... ???? කෝ එයා එයාට සිහිය ආවද... "

මං අයියගෙන් අහද්දි එයා බිම බලාගත්තා..... ඒත් එක්කමයි මට මතක් වුනේ ඩොක්ටර් කියපු කතාව..

"නෑ.... එහෙම වෙන්නේ නෑ... එයා මාව දාලා යන්නේ නෑ... එයාට මන් නැතුව ඉන්න බෑ... අයියේ ඩොක්ට බොරු නේද කිව්වේ... කියන්න බොරු නේද කිව්වේ... එයා මාව දාලා ගියේ නෑ නේද..."

හය්යෙන් කෑ ගගහා මන් ඇඳ උඩ දැගලුවා.. අයියා මාව බදාගෙන සන්සුන් කරන්න හැදුවත් මං සන්සුන් වුනේ නෑ... පුලුවන් තරම් හයියෙන් දැගලුවා..

"නිතිනු අයියට මුකුත් වුනේ නෑ ආරු.. "

අයියා කාමරේ දෙදරන්න තරම් හයියෙන් කෑ ගහද්දී තමයි මං සන්සුන් වුනේ... හිතට දැනුන සතුට මෙච්චරයි කියන්න බෑ... මං දගලන එක නවත්තලා අඩ අඩා හිනාවුනා...

"මං දැනන් හිටියා... එයාට මන් නැතුව ඉන්න බෑ කියලා.... එයාට මන් නැතුව ඉන්න බෑ අයියෙ.. එයා මේ ලෝකෙන්ම මට විතරයි ආදරෙ කරන්නේ... ඉතින් කොහොමද මන් නැතුව ඉන්නේ... නේද... ඔයා ඔයා දන්නවද අය්යේ.. ඔෆිස් ගියාම පැයෙන් පැය කෝල් ගන්නවා එයා මට.. ඒ ටිකවත් ඉන්න බෑ එයාට මන්

නැතුව.. ඉතින් කොහොමද මාව දාලා යන්නේ.... නේද අයියේ.. එයාට මත් නැතුව බෑ නේද අයියේ.. එයා මාව දාලා යන්නේ නෑ නේද අයියේ.. මට එයා නැතුව ඉන්න බෑ කියලා එයා දන්නවා..... අපි යන් එයාව බලන්න... එයා මත් එනකන් බලන් ඇති.... යමුකෝ.."

ඇගට අමාරු උනත් මං හිතට හයිය අරන් නැගිට්ටේ නිතිනු අයියව බලන්න යන්න හිතන්... ඒත් අයියා මත් දිහා අනුකම්පාවෙන් වගේ බලන් ඉන්නවා...

"ඇයි ඔහොම බලන් ඉන්නේ... අපි යන්කෝ... අක්කි.. අපි යමුකෝ.."

"සුදූ... නිතිනු අයියට තාම හොදටම හොද වෙලා නෑ පැටියෝ අපි එයාව වෝඩ් එකට දැම්මම බලමු.."

අයියා මාව ආයෙත් ඇදේ හාන්සි කරවලා ඔලුව අතගානවා...

"වෝඩ් එකට... ??? දැන් කොහෙද එයා ඉන්නේ... "

"icu එකේ සුදූ... "

"icu ?? ඒකට දන්නේ අමාරු ලෙඩ්ඩුන්ට නේද... ඒ කියන්නේ ඒ කියන්නේ එයාට අමාරුයි ද.. කියන්නකෝ.... එයාට අමාරුයි ද... "

හිතට දැනුන සැනසීම එහෙම්මම පැනලා ගියා... ආයෙත් හදවත පුරාම පැතිරිලා තිබ්බේ බය විතරය්.. කලබල වෙලා ආයෙත් දගලද්දි අයියා මාව හිරකරලා බදාගත්තා..

"එයාට තාම සිහිය නෑ සුදූ... ඒකයි අය් සී යූ එකේ ඉන්නේ... ඉක්මනට සනීප වෙයි කියලා ඩොක්ටර් කිව්වා.... සන්සුන් වෙන්නකෝ සුදූ... ම්ම්ම් ඔහොම හැසිරෙන්න එපා... අයියට ගොඩක් දුක හිතෙනවා... "

බිදිච්ච හඩින් අයියා කියද්දි මත් සන්සුන් වුනා.. අයියා ඇත්ත කිව්වද බොරු කිව්වද මත් දන්නෑ... ඒත් එයා කියපු දේවල් මත් ඉස්මුදුනෙන් පිලිගත්තා.. කවුරුහරි දොර ඇරන් ඇතුලට ආපු නිසා අපි තුන් දෙනාගෙම අවදානය ඒ පැත්තට යොමු උනා... ඇවිල්ලා හිටියේ පොලිසියෙන්.. පුන්චි කාලේ ඉදලම වැරැද්දක් නොකරත් මං පොලිස් මාමලාට බයයි.. ඒක නිසාම මං අයියගේ පිටිපස්සේ හැංගුනා..

"අපිට මිසිස් ආරාධ්‍යා ගෙන් කට උත්තරයක් ගන්න තියෙනවා... "

"මිසිස් ආරාධ්‍යා....???"

"ඔව් මිස්ට නිතිනු සෙහංසගේ වයිෆ් නේද මේ ඉන්නේ... "

පොලිසියේ අය අහද්දි අයියා මන් දිහා බැලුවා..... මං බිම බලාගෙන හිටියේ...

"සර් අපිට පස්සේ ඒක කරන්න බැරිද.... නංගි ඉන්න මානසිකත්වේ එච්චර හොද නෑ... "

"අපිට තේරනවා මිස්ට ඒත් මේක අපේ ඩියුටි එක..."

අයියා හුස්මක් පහතට දලා මන් දිහා බැලුවා..... ලගට ඇවිත් ඔලුව අතගානකොට මං බලාගෙන හිටියේ එයාගේ මූන දිහා...

"මොකක්ද උනේ කියලා මේ මාමලාට කියන්න සුදූ... අයියා ඉන්නවනේ බයවෙන්න එපා... ම්ම්ම්"

අයියා දන්නවා මන් පොලිසියට බයයි කියලා.... ඒකයි එහෙම කියන්නේ... මං අයියා ලගටම වෙලා පොලිස් මාමාලා දිහා බැලුවා... දැක්කමත් බයහිතෙනවා..

"එයාලා.. එයාලා මාවයි නිතිනු අයියවයි කිඩ්නැප් කරා..."

මං කිව්වේ අයියා දිහා බලන්

"එයාලා කියන්නේ කවුද.."

ඉස්සරහම හිටපු පොලිස් එක්කෙනා ඇහුවේ

සැරෙන් වගේ... මං අයියගේ අතින් අල්ලගෙන එයා දිහා බැලුවා... එයා ඇස් වලින් කිව්වේ මට කියන්න කියලා..

"දිනේශුයි එයාගේ පුතයි.."

"මොකක්ද එයාටයි ඔයාගේ හස්බන්ටයි තියෙන සම්බන්දේ.."

"දි..දිනේශ් තමයි නිතිනු අයියගෙ අම්මිව මැරුවේ.. "

මං එහෙම කියද්දි අයියත් ඇස් ලොකු කරලා බැලුවා මන් දිහා... ඒ කිසිම දෙයක් එයා දන්නේ නෑනේ...

"හරී ඊටපස්සේ මොනාද උනේ.... "

"එයාලා අපිව කිඩ්නැප් කරලා අරන් ගියේ නිතිනු අයියගේ ගෙදර එයාගේ අම්මි මැරිච්ච කාමරේට... එයා එතන්ට ගොඩක් බයයි.. දිනේශ්ට ඕනෙ උනෙ නිතිනු අයියව මරලා එයාගේ දේපල ගන්න..."

"ඒ කියන්නේ ඔය දිනේශ් කියන මනුස්සයා මොනාහරි සයින් කරන්න කිව්වද හස්බන්ට"

"නෑ නිතිනු අයියා නැති වුනොත් දිනේශ්ට තමයි දේපල හම්බවෙන්නේ... එයා නිතිනු අයියගේ අම්මිගේ ලීගලි හස්බන් නිසා.. "

"ඒ කියන්නේ... දිනේශ් කියන්නේ මිස්ට නිතිනු සෙහංසගේ තාත්තද..."

"නෑ....... ඒ මිනිහා එයාගේ තාත්තා නෙවෙයි "

මං කිව්වේ ටිකක් රළු ස්වරයෙන්..

"ඒ කියන්නේ මිස්ට නිතිනු වෙන එෆෙයා එකක ළමයෙක්ද.."

"නෑ...... "

"මේ අහන්න මිසිස් ආරාධ්‍යා අපිට නාස්ති කරන්න වෙලාවක් නෑ කරුනාකරලා හරියට විස්තරේ කියන්න.."

පොලිස් එක්කෙනා කිව්වේ සැරෙන් වගේ...

"බයෝලොජිකලි තාත්තා තමයි... "

මං හෙමින් මිමිනුවේ... ඒ වගේ තිරිසනෙක් එහෙමවත් නිතිනු අයියගේ තාත්තා කියන්න මත් කැමති නෑ...

"හරි ඊටපස්සේ මොකද වුනේ... "

"දිනේශ් කියන මිනිහට ඕනෙ එයාව මරන්න ඒත් දිනේශ්ගේ පුතාට ඕනෙ වුනා මට කරදර කරලා නිතිනු අයියට රිදවන්න... එයා මට කරදර කරන්න යද්දී නිතිනු අයියා ඒ මිනිහට ගැහුවා... දිනේශ්ටත් ගැහුවා... ඒ වෙලාවේ තමයි දිනේශ් නිතිනු අයියගේ ඔලුවට ෆොටෝ එකෙන් ගැහුවේ.... "

බොහොම අමාරුවෙන් කතාව කියලා මන් අයියව බදාගෙන ඇඩුවා... පොලීසියේ අය තව මොනාද අහන්න හැදුවත් අහසි අක්කා මොනාදෝ කියලා එයාලව එලියට යැව්වා...

අයියට බලකරලා බලකරලා මන් icu එක ලගට ආවා... එතන සිදුරෙන් ඇතුල බලද්දි අඩියක් පස්සට තියවුනේ නිරායාසයෙන්මයි... ඇදක් උඩ නිතිනු අයියා හිටියේ මැශින් ගොඩකට යට වෙලා... ඇග හැමතැනම බට ගහලා... ඒ දිලිසෙන ඇස් පියවිලා තිබ්බේ... පපුවත් අල්ලන් අයියගේ ඇගේ එල්ලිලා මන් කෑ ගගහා ඇඩුවා... අයියා අමාරු නෑ කිව්වට ඔහොම මැශින් ගහලා තියෙන්නේ අමාරු ලෙඩෙක්ට කියන එක නොතේරෙන්න මං මෝඩයෙක් නෙවෙයි....

දවස් දහයක් ගෙවිලා ගියේ ඉබිගමනින්... ඒත් මගේ නිතිනු අයියා ඇස් ඇරියේ නෑ... මන් දකින දකින පන්සල් කෝවිල් ගානේ ගිහින් බාර වුනා.. කලුතර බෝදියට ගිහින් මන් පැයගනන් මලුවේ වාඩි වෙලා බුදුහාමුදුරුවන්ගෙන් ඉල්ලුවා එයාව...

බුදු හාමුදුරුවෝ බැඳීම් සඳහටම අතෑරලා දාපු බෝගහ යට ඉඳන් මත් ඒ බැඳීම වෙනුවෙන් ඇඬුවා... මට වෙන පිහිටක් තිබ්බේ නෑ මේ වෙලාවේ... රුවන්වැලි සෑයට , ශ්‍රී මහා බෝදියට , කතරගම දේවාලෙට මං හිතෙන් බාර නොවිච්ච තැනක් නෑ...

ඊයේ රෑ හොස්පිට්ල් එකේ නතර වෙලා දවල් වෙලා මං ආවේ නිතිනු අයියගේ ගෙදරට... ඒත් ගේ ඇතුලට යන්න තරම් හයියක් නෑ මට.. ඒ නිසාම අම්මගෙ සොහොන ලගට ඇවිත් එතන තන කොල ගොල්ලෙන් වාඩි වුනා..

"මන් හිතුව තරම් ඔයා හොදකෙනෙක් නෙවෙයි අම්මා.. "

සොහොන් කොතට අතතියාගෙන මන් කිව්වේ ඇස් වලින් වැටෙන කඳුලු වලට නිදහස දීලා...

"ඇයි ඔයා නිතිනු අයියව මගෙන් උදුරගන්න හදන්නේ... මං දන්නවා ඔයා එයාට ගොඩක් ආදරෙයි... ඒත් ඔයාට අයිතියක් නෑ එයාව මගෙන් උදුරගන්න... මට එයාව ඕනෙ අම්මා.. මං ගාවට එවන්න එයාව... ප්ලීස්... මං පොරොන්දු උනා නේ ඔයාට එයාව හොදට බලාගන්නවා කියලා.. ඇයි ඉතින් ඔයා ගාවට ගන්න හදන්නේ එයාව... ප්ලීස් එයාව දෙන්න මට.. එයා නැතුව ඉන්න දන්නෑ මං.. මං එයාට ඇබ්බැහි වෙලා... "

සොහොන ලගම අඩ අඩා හිටපු මට බිමම නින්ද ගියා...

දවස් ගානක් හරියට නින්දක් ලැබිලා තිබ්බේ නැති නිසාද කොහෙද මට හොදටම නින්ද ගියා... හීනෙන් නිතිනු අයියගේ අම්මා මං ගාවට ආවා... එයා ඇදන් හිටියේ නිතිනු අයියා අර චිත්‍රෙ ඇදලා තිබ්බ ඇදුමමයි... එයා නිතිනු අයියගෙයි මගෙයි අත් දෙක එකට කරලා මගේ ඔලුව අතගාලා එකපාරටම අතුරුදහන් උනා... මං ඇස් අරිද්දි දැනුනේ කවදාවත් නැති තරම් ප්‍රබෝධමත් ගතියක්.. එදා වගෙම අදත් අමුතු සැනසීමක් දැනුනා මෙතන.. මං අම්මගේ ෆොටෝ එක දිහ බලන් හිටියා... කෝල් එකක් ආපු නිසයි මගේ අවදානය බිදුනේ..

"හෙලෝ සුදූ... කොහෙද ඉන්නේ ලමයෝ... මන් කී පාරක් කෝල් ගත්තද ආ.. ඇගේ ලේ වතුර වෙලා හිටියේ මං.. "

"මං මං නිතිනු අයියගේ අම්මිව බලන්න ආවා... "

"ඉතින් කියලා යන්න බැරි ඇයි සුදූ... අයියා බයවෙනවා කියලා දන්නවනේ... පහුගිය දවස් ටිකේම ඔයා ඔහොමය්.."

"සොරි.."

"හරි හරි ඉක්මනට හොස්පිට්ල් එකට එන්න නිතිනු අයියව වෝඩ් එකට දානවලු.."

"වෝඩ් එකට... ???"

"ඔව් සුදූ දැන් එයාට ටිකක් හොදයිලු.."

"හරි අයියේ මං එනවා... දැන්මම එනවා... "

ෆෝන් එක කට් කරලා මං සොහොන දිහා බැලුවා සතුටු කදුලු බේරෙන ඇස් වලින්.. සමහරවිට අහම්බයක් වෙන්නැති ඒත් මට දැනුනේ නිතිනු අයියගේ අම්මා අපහු එයාව මට දුන්නා වගේ...

"තැන්ක් යූ අම්මා.. "

ෆොටෝ එක උඩින් අත තියලා එයත් එක්ක හිනාවෙලා මං දුවන් ආවා ගේට් එක ලගට..

"චූටි නෝනා යන්නද... ?? මං නෝනව ගිහින් දන්නම් ඒ ගමන් චූටි මහත්තයාව බලාගෙන එන්නත් පුලුවන් නේ.."

ගුනදස මාමා එහෙම කියද්දි මාත් ඔලුව හොල්ලලා ඒකට එකග වුනා.. මට ඉක්මනට හොස්පිට්ල් එකට යන්න ඕනෙ වෙලා තිබ්බේ...

වාහනේ නතර කරපු ගමන් අයියා කිව්ව කාමරේට මං ආවේ ඉගිලිලා වගේ... දවස් ගානකින් දැක්ක නැති ඒ මූන හිතේ හැටියට දැකගන්න, අඩුමගානේ එයාගේ අතක් වත් අල්ලන් ඉන්න මට තිබ්බේ නොඉවසිල්ලක්...

කඩාගෙන බිදගෙන ඇතුලට යද්දී ඩොක්ටර්යි අයියයි බයවෙලා වගේ බලන් හිටියේ...

"ආහ් මේ එන්නේ වයිෆ්... මං ඒත් අයියගෙනුත් ඇහුවා කෝ කියලා... අපි බලාපොරොත්තුත් අතෑරලා තිබ්බේ ඔයාගේ හස්බන් ගැන... ඒත් පුදුමාකාර විදිහට එයා බෙහෙත් වලට රියැක්ට් කරා... දැන් ටික ටික නෝමල් වේගෙන එන්නේ.. හෙට අනිද්දම සිහිය එයි... වයිෆ්ගේ ආදරේ නිසාම දලා යන්න ලෝබ හිතෙන්නැති හස්බන්ට..."

ඩොක්ටර් හිනාවෙලා එහෙම කියලා යන්න ගියා... අයියත් මගේ පිටට තට්ටුවක් දලා එලියට ගියා... මං බැලුවේ ඔක්සිජන් මාස්ක් එකක් දලා සේලයින් බට මූත්‍රා බට ඔක්කොම දලා තියෙන ඒ දේහදරි රූපෙ දිහා... කොන්ඩේ ඔක්කොම අයින් කරලා ප්ලාස්ටර් ගහලා තිබ්බට ඒ කඩවසම් බවේ අඩුවක් පෙනුනේ නෑ මට..

ඇද උඩින් වාඩිවෙලා ඒ පපුවට ඔලුව තියාගෙන ඇදුම තෙත් වෙනකම් කදුලු ගලාගෙන යන්න දුන්නා.... ඒ පපුව ගැහෙන සද්දේ ඇහෙද්දි දැනන සැනසීම වචනෙන් කියන්න බැරි තරම්.. ඇදන් හිටපු ශර්ට් එකේ බොත්තම් එහෙ මෙහෙ කරලා මුලු පපුවම ඉම්බා මන්.. පෙනහලු පිරෙන්නම ලොකු හුස්මක් ගත්තා ඒ සුවදින් මාවම සනස ගන්න... එයාගේ අතක් අරන් මගේ කදුලු පියදන් ඒ අතත් ඉබලා එයාව බදගෙන හාන්සි වුනා..

පහුවදා වෙනකම්ම මන් එයාගේ ලගට වෙලා නිදාගත්තා... ඒ වෙනකනුත් එයා ඇහැරියේ නැති නිසා මට දැනුනේ බයක්...

"තිනූ... ඇස් අරින්නකෝ රත්තරන්... ඔහොම ඉන්න එපා... ඇයි ඇස් අරින්නැත්තේ... මාත් එක්ක තරහයිද ඔයා... ම්ම්ම්... ඇස් අරින්නකෝ තිනූ බබා.. මං උම්මා ගොඩක් දෙන්නම් ඔයාට.. රිදෙන නිසාද ඇස් අරින්නේ නැත්තේ... මං ඔයාව තුරුල් කරන් ඔලුව අතගාන්නම්.. එතකොට රිදෙන එකක් නෑ... මුරන්ඩු නොවී නැගිට්ටින්න වස්තු.. නැගිටලා චූටි පැටියෝ කියන්නකෝ.... ඔයා දන්නවද එහෙම කියනවට මන් ආසයි... නැගිට්ටින්නකෝ... "

මූන පුරාම අතගගා මන් එයත් එක්ක කතා කරා... ඊයේ ඉදන්ම මං එයත් එක්ක මෙහෙම කතා කරනවා.. ඩොක්ටත් කිව්වා එහෙම කරන එක හොදයි කියලා....

එයාගේ අතක් අරගෙන ඉබිද්දි එයාගේ ඇගිලි හෙලවනවා වගේ දැක්ක නිසා ඇස් පිය නොහෙලා ඒ දිහා බලන් හිටියා... දෙවියනේ... මන් දැක්ක දේ ඇත්තක්... එයා ඇගිලි හොලවනවා.... සතුට වැඩි කමට මට කිසිම දෙයක් මතක් උනෙත් නෑ... පිස්සුවෙන් වගේ එයාව කිස් කරගෙන කරගෙන ගියා... විනාඩියක් දෙකක් ගිහින් තමයි ඩොක්ටර් ව මතක් උනේ.... කලබලෙන් එලියට දිව්වේ ඇතුලේ බටන් එකක් තියනවා කියන එකත් අමතක කරලා...

# 37 කොටස

ඩොක්ටර් එයා ගාවට ඇවිත් චෙක් කරද්දි නැට්ට වගේ පස්සෙන් ගියා... ඩොක්ටර්ත් මත් දිහා බලලා හිනා වුනා..

"ඔන්න හස්බන්ට සිහිය එන්නයි යන්නේ... හී ඊස් අවුට් ඔෆ් රිස්ක්... දැන් එයා ඇස් අරියි... ළඟටම වෙලා ඉන්න.. ආසාවෙන් ඇත්තේ එයත් වයිෆ්ව බලන්න... "

මගේ ඔළුවත් අතගාලා ඩොක්ටර් කිව්වේ හරියට තාත්තා කෙනෙක් වගේ... මං කඳුලු අතරින් හිනාවුනා... නිතිනු අයියා ලාවට ඇහි පිල්ලම් හොලවනවා දැක්ක නිසා මත් එයා ළඟට ගිහින් ඔළුව අතගෑවා...

"ඩොක්ට... මත් එයාගේ ඇස් වල වතුර ටිකක් ගාන්නද... එයාට අමාරු ඇති ඇස් අරින්න... "

"ආ ඒකට කමක් නෑ දරුවෝ.... "

ඩොක්ටර් කිව්වේ හිනාවෙවී... මං අතේ වතුර ටිකක් ගාලා එයාගේ ඇස් පිහදැම්මා..

"අ.............ම්...........ම්..."

එයා ඇස් ඇරපු ගමන් කතා කරේ අම්මට... එයාගේ කටෙන් වචනයක් ඇහෙද්දි මට දැනෙන සතුට කියලා නිම කරන්න බෑ... එයා ඇස් හරවලා බලද්දි මං ඒ ඉස්සරහට ගියේ එයාට පේන්න... මාව දකිනකොට ඒ මූනේ එන ආදරනීය හිනාව විදගන්නයි ඕනෙ උනේ.... ඒත් ඒ ඇස් මන් ගාව නතර උනේ නෑ... එයා බැලුවේ ඩොක්ටර් දිහා... මං ඩොක්ටර් ලගින් ගිහින් හිටගත්තේ එයා මාව දකින්නැතිව ඇති කියලා හිතලා... ඒත් එයා මාව ගනන් ගත්තේ නෑ... එයාට තාම අමාරු ඇති කියලා හිතලා මන් හිත හදගත්තා...

ඩොක්ටර් එයත් එක්ක කතාකරන්න උත්සහ කරත් කතා කරන්න තරම් ශක්තියක් එයාට තිබ්බෙ නෑ... ඩොක්ට උපදෙස් ගොඩක් දීලා කාමරෙන් එලියට ගියා... මන් හිනාවෙලා තිනිනු අය්යා ගාවට ආවා... ඒත් එයා මන් දිහා බැලුවේ නෑ... හොද හුස්මක් අරන් මං වතුර ටිකක් බෝල් එකකට දලා පුලුන් කෑල්ලක් පොගව ගත්තා... ඩොක්ටර් කිව්වා වතුර දෙන්න එපා පුලුන් කෑල්ලෙන් කට තෙමන්න කියලා....

"තිනූ බබා.. වතුර තිබහයිද ඔයාට.. කෝ මේ පැත්ත බලන්නකෝ.. අපි මේකෙන් තෙමමු.."

තිනූ බබා කිව්ව ගමන් එයා ඇස් ලොකු කරලා මන් දිහා බැලුවා... මං එයාගේ තොල් අල්ලන්න යද්දී එයා අහක බලාගත්තා..

"හොද බබා වගෙ බලන්නකෝ මන් දිහා... ඇයි ඔයා මට ඔහොම කරන්නේ... මං හිතුවේ සිහිය ආපු ගමන් මාව හොයයි කියලා.. මං ලග ඉදලත් ඇය් ඔයා මාව මගහරින්නේ... ආ අය්යේ.. ඒ මිනිහා මට මුකුත් කරේ නෑ... මාව ඒ මිනිහා අල්ලපු නිසා අප්පිරියයිද ඔයාට.. ඒකද ඔහොම මගහරින්නේ... "

අවසානයක් නැතුව ගලන කදුලු අතෙන් පිහදද ඇහුවේ මන්... කොච්චර ආසාවෙන්ද හිටියේ එයාට සිහිය එනකම්.. මගේ තුරුලෙම ඉදිය් කියලා හිතුවේ... කදුලු එයා අතින්ම පිහදාවි කියලා හිතුවේ... ඒත් එයා මන් දිහා බලන්නෙවත් නෑ...

"ඔ..ඔ..යා. ක..ක...වු..ද. ???"

ඔලුව උඩ හෙන හත අටක් පිපිරුවා වගේ ඒ වචන ඇහුනේ මට... අතේ තිබ්බ බෝල් එක බිම වැටිලා කුඩු වෙලා ගියා...

"මො.. මොනවද අහන්නේ අයියේ මේ.. මං ආරු.. ඔයාගේ චූටි මැතික... ඇය් ඔහොම අහන්නේ.. කියන්න... ඔයාට මාව මතක නැද්ද... "

එයාගේ මූන අත් දෙකට මැදිකරන් මන් අහද්දි එයා මගෙන් මිදෙන්න දැගලුවා..

වෙනදා මගේ ස්පර්ශයක් වෙනුවෙන් මග බලාගෙන හිටපු කෙනාට මගේ ස්පර්ශේ පිළිකුල් වෙලා... මං හැදුවේ බලෙන් එයාව කිස් කරන්න... මගේ බොළඳ හිත කිව්වා එතකොට සේරම දේවල් හරි යයි කියලා.... ඒත් එයා දඟලන්න පටන් ගත්තා... උමතුවෙන් වගේ දැඟලුවේ මට එයාව පාලනය කරගන්න බැරි විදිහට.. බැරිම තැන මත් දුවන් ගිහින් ඩොක්ටර්ව එක්කන් ආවා... එයාටත් කන්ට්‍රෝල් කරගන්න බැරි නිසා සිහිය නැතිවෙන්න ඉන්ජෙක්ශන් එකක් ගැහුවා... කැනියුලා එක ගැලවිලා ලේ ගලන අත දිහා මං බලන් හිටියේ හදවත දැවෙන වේදනාවෙන්.... අප්‍රාණික වෙච්ච සිරුර පුටුවට බර දීලා අත් දෙකෙන් මූන වහන් ඇඩුවා මන්...

"මොකක්ද උනෙ දරුවෝ... හස්බන්ට එකපාරටම මෙහෙම වුනේ ඇය්... "

"මං දන්නේ නෑ ඩොක්ට.. මං එයාගේ මූන ඇල්លුවා විතරයි.. එයා.. එයා මගෙන් ඇහුවා මන් කවුද කියලා.. අඩුම ගානේ අඩුමගානේ මාත් එක්ක හිනාවුනේ වත් නෑ ඩොක්ට... මාව එයාට පිළිකුල් වගේ එයා හැසිරුනේ.. ඒ ඇය් ඩොක්ට.. ඇයි එයා මාත් එක්ක කතා කරන්නේ නැත්තේ... අර මනුස්සයා මාව අල්ලපු නිසා එයාට මාව අප්පිරියද්ද..."

"අහන්නකෝ දරුවෝ... සමහරවිට ඔලුවට වැදුන පහර නිසා මෙමරි ලොස් එකක් වගේ වෙලා ඇති.... අඩන්නෙපා

දැන්.. ඔයා ඔහොම වැටුනොත් කවුද එයාව බලාගන්නේ..."

"මෙමරි ලොස්ට්... ?? අනේ ඩොක්ට කොහොමද එහෙම වෙන්නේ... එයාට බෑ මාව අමතක කරන්න... එයාට ඉන්නේ මන් විතරයි.. කොහොමද මාව අමතක කරන්නේ..."

"හරියටම කියන්න බෑ... සිහිය ආවම තමයි කියන්න වෙන්නේ... එතකන් ඔය දරුවා අඩන්නැතුව ඉන්නකෝ... එයාට අමතක උනත් ඉක්මනට මත්ක් වෙයි.. "

ඩොක්ටර් කාමරෙන් යනකොටම වගේ අයියා කාමරේට ආවා... තනියම නම් නෙවෙයි හේශන් අයියත් එක්ක(නිතිනුගේ කසින්) මන් දුවගෙන ගිහින් අයියව බදගෙන පොඩි ලමයෙක් වගේ කෑ ගහලා ඇඩුවා...

"එයාට මාව එපාලු අයියේ.. මන් අල්ලද්දි එයා අහක බලාගත්තා.. මං මං කවුද කියලා ඇහනවා එයා... ඇයි අයියෙ ඒ.. ඩොක්ටර් කියනවා එයාට මෙමරි ලොස් එකක් ඇතිලු... ඒත් එයා කොහොමද මාව අමතක කරන්නේ... ඒක වෙන්න බෑ නේද අයියේ.. මගේ පපුවත් රිදෙනවා... ඇයි එයා මට එහෙම කරන්නේ... ඉහි ඉහි ඉහි.. ආඅ... "

"සුදූ... පැටියෝ ඔහොම අඩන්න එපා... එහෙම මුකුත් වෙලා නැතුව ඇති අපි බලමුකෝ.. අඩන්න එපා... ප්ලීස්... බලන්නකෝ හේශාන් අයියත් ඇවිත් ඉන්නවා... එයා ඔයාට

චොක්ලට් එහෙමත් ගෙනත්.. ඔයා චොක්ලට් කන්න ආසයි නේද... ම්ම්ම් කෝ කදුලු පියදගන්නකෝ..."

"මට චොක්ලට් එපා... මට නිතිනු අයියව ඕනේ.... අනේ එයාට කතා කරන්න කියන්නකෝ මාත් එක්ක... මට එයාව ඕ.....නේ... එයා නැතුව ඉන්න බෑ මට..."

අයියා මාව හිරට බදාගත්තා.. ආයෙත් නිතිනු අයියට සිහිය එනකන් මං අයියව බදාගෙන හූල්ල හූල්ල ඇඩුවා... සිහිය එන්න අතපහ හොලවද්දි මත් දුවන් ගියා එයා ලගට.. ඇස් ඇරියත් එයා මන් දිහා බැලුවේ නෑ... එයාගෙ ඇස් නැවතුනේ අයියයි හේශාන් අයියයි ගාව.. කලින් වගේම මන් එතන්ට ගිහින් මාව පේන්න ගොඩක් දේවල් කරත් මන් ගාව ඒ ඇස් නතර වුනේ නෑ...

"ආ... ආ..රා...ධ්‍ය්..."

වචන එකතු කරලා එයා අයියට කතා කරද්දි දැනුනේ මට පුදුම සතුටක්.. ඒ කියන්නේ එයාට මතකේ අමතක වෙලා නෑ... ඒත් එයා ඊගාවට අහපු දෙයින් මගේ හීන මාලිගා ඔක්කොම බිදිලා ගියා...

"ස...ස...නු...දි. කෝ.. "

අයියයි හෙශාන් අයියයි මූනෙන් මූන බලාගත්තා..

"සනුදි?? සනුදිව හොයන්නේ ඇයි උඹ... මොනාද වෙලා තියෙන්නේ උඹට.."

එයා ලගට ගිහින් කතා කරේ අයියා..

"ම..... ම....ගේ. ස....නු.....දි....ට. එ.....න්...න. කි...... ය.....ප.... න්"

මන් නිතිනු අයියා ලගට ඇවිදන් ආවේ හීනෙන් වගේ... මේ ඇහෙන දේවල් විශ්වාස නෑ මට.. දෙතුන් පාරක් තුවාල වෙනකම්ම අත කොනිත්ත ගත්තා මේක හීනයක්ද කියලා බලන්න... මගේ අවාසනාවට ඒක ඇත්තක්... මගේ ඇස් ඉස්සරහ මං පනවගෙ ආදරේ කරන කෙනා වෙනකෙනෙක්ව හොයනවා...

"මොනාද රත්තරන් මේ කියන්නේ... ඔයාට මං ඉන්නවනේ... ඇයි සනුදි අක්කව ඉල්ලන්නේ.. එයා කොහොමද ඔයාගේ වෙන්නේ... මං නේ ඔයාගේ... ආ ඔයාම නේද කිව්වේ මගේ ඇහැට කදුලක් ආවොත් මේ ලෝකෙම උනත් විනාස කරනවා කියලා.... ඉතින් ඇයි... ඇයි මාව මෙහෙම අඩවන්නේ... පේන්නේ නැද්ද මං අඩනවා.... මගේ පපුව ගොඩක් රිදෙනවා අයියේ.. කවදවත් මෙච්චර දුකක් මට දැනිලා නෑ... ප්ලීස් ඔයා කරන්නේ විහිළුවක් නම් ඒක නතර කරන්න.. මං මැරෙයි දෙවියනේ... මං මැරෙයි..."

මං ඒ අත පපුවට තුරුල් කරන් අඬද්දි හිතක් පපුවක් නැති විදිහට එයා අත මගෙන් මුදව ගත්තා...

"ක..ක....වුද. ඔයා....."

ආයෙත් ඒ ප්‍රශ්නෙම අහද්දි මට හිතුනේ මං මැරිලා ගියා නම් කියලා.. දරාගන්න බෑ ඒ වේදනාව... ඒක නිසාම මං නැගිටලා කාමරෙන් එලියට දිව්වා... කොරිඩෝවේ බිම ඉදගෙන මං ඇඩුවා... අයියත් මගේ පස්සෙන් ඇවිත් මාව නැගිට්ටව ගත්තා... ඒත් එක්කමයි ඩොක්ටත් එතන්නට ආවේ... මට ඩොක්ට එක්ක කතා කරන්න තරම් මානසික තත්වයක් තිබ්බෙ නැති නිසාම අයියා විස්තරේ කිව්වා.... අය්යා කිව්ව විස්තරේත් අහලා කාමරේ ඇතුලට ගියපු ඩොක්ටර් එලියට ආවේ නලලත් අත ගගා...

"මට කනගාටුයි දරුවෝ.... ඔයාගේ හස්බන්ට මෙමරි ලොස් එකක් වෙලා තියනවා... එයාගේ මතකේ අවුරුදු 5 ක් විතර ආපස්සට ගිහින්... ඒකයි එයාට මතක නැත්තේ..... "

"ඒකට බෙහෙත් නැද්ද ඩොක්ට.. හැමදාටම එයාට මාව අමතක වෙලා යයිද..?? කවදාවත් එයා මන් ගාවට එන්නේ නැතිවෙයි ද"

"අපි බලමු දරුවෝ.... සමහරවිට අදහෙටම හොදවෙන්න පුලුවන් සමහරවිට සදහටම මතකේ නැතිවෙන්න පුලුවන්...

අපි ට්‍රීට්මන්ට් කරලා බලමු... ඔයාගේ ආදරේ ගැන විශ්වාසෙ තියාගන්න.. "

"ආ තව දෙයක්... තාම එයා ස්ටේබල් තත්වෙක නෑ... ඒ නිසා පුළුවන් නම් එයාව බලන්න යන්න එපා... ආයෙත් එයා කලබල වෙන්න පුළුවන්... හෙට උදේ වගේ ගිහින් එයාට කතා කරන්න.."

ඩොක්ට ගියාට පස්සේ මන් බිත්තියට හේත්තුවෙලා සිවිලිම දිහා බලන් හිටියා... තාලෙකට කඳුලු මූන දිගේ කඳුලු ගලන් යනවා... දැන් ඇස් දෙකත් දැවිල්ලයි අඩලම.. ඒත් කඳුලු නවත්ගන්න තරම් මං හිත හයිය කෙනෙක් නෙවෙයි.... අය්යා හේශාන් අය්යා එක්ක කතාවක... මන් හෙමීට දොරෙන් එබිලා බැලුවා නිතිනු අයියා දිහා... එයා ඔහේ බලාගෙන ඉන්නවා... අනේ මට ඒ පපුවට තුරුල් වෙන්න තිබ්බනම්... ඉස්සර වගේ හුරතල් වෙන්න තිබ්බනම්... අලුත් වෙච්ච කඳුලු අත් දෙකෙන් පිහ පිහ මන් ආයෙත් අයියව බදාගෙන ඇඩුවා... හේශාන් අය්යත් මාගෙ ඔළුව අතගානවා මට දැනුනා..

මැරිච්ච මලකදක් වගේ රෑ 10 ට විතර මන් ගෙදර ආවේ හේශාන් අයියා නිතිනු අයියට සූප් එක පොවනවා බලන් හිටියට පස්සේ.. වොශ් එකක්වත් නොදා මං නිතිනු අය්යගේ ඇඳේ නිදාගත්තා... කොට්ටෙකට එයාගේ ටීශර්ට් එකක් දාගෙන බදාගත්තා.. තාමත් ඒ සුවඳ දැනුනා මට ටීශර්ට් එකෙන්..

පාන්දර වෙනකම් නින්ද ගියේ නෑ මට.. කොහොම නිදගන්නද එයාව මතක් වෙද්දී... මට නින්ද යන්නේ නැති දවස් වලට මගේ කාමරේට ඇවිත් මාව තුරුල් කරන් නින්ද යනකම් ඉබ ඉබ හිටපු හැටි මතක් උනා මට.. මුලු රෑම කඳුලු වලින් කොට්ටේ තෙමුනේ බැදීම් කොච්චර දුකක්ද කියන එක මට ඒත්තු ගන්වමින්...

උදේ වොශ් එකක් දන්න බාත්‍රෑම් එකට ගියාම මගේ රූපෙට මන්ම බයවුනා... රෑ පුරාම අඬලා ඇස් ඉදිමිලා රතුවෙලා... ලොවි ගෙඩි වගේ... ඇස් යට කලු වෙලා මූනේ පිම්පල්සුත් දාලා... සුසුමක් හෙලලා මන් සබන් ම ගාලා මූනත් හෝදගත්තා... නිතිනු අය්යා ආසම රෝස පාට ගවුම ඇදලා ලෑස්ති වෙලා මන් සාලෙට ආවා... හිතේ කොනක පොඩි බලාපොරොත්තුවක් තිබුනා දැන් නිතිනු අයියට මාව මතක ඇති කියලා....

## 38 කොටස

මමයි අයියයි හොස්පිට්ල් එකට එද්දි හේශාන් අයියා කාමරේ දොර ලග එහාට මෙහාට ඇවිදිනව... නලලත් අතගගා...

"හේශාන්... ඇයි උඹ මෙ එලියේ... මොකක් හරි ප්‍රශ්නයක් ද..."

“ආ.... මෙ.. මේ උබලා කාලා එහෙමද ආවේ.. වරෙන්කෝ මොනාහරි කාලා එන්න... සුදූ එන්නකෝ.. "

හේශාන් අයියා බයෙන් වගේ කතා කරේ... මමයි අයියයි මූනෙන් මූන බලාගත්තෙ එයාගේ හැසිරීමට...

"අපි පස්සේ කන්නනම් අයියේ.. ඉස්සල්ලාම මට එයාව බලන්න ඕනේ... එයා හොදින් නේද... දැන් දැන් එයාට මාව මතකද..."

"නි.. නිතිනු හොදින් සුදූ... එන්නකෝ අපි මොනාහරි කාලා එමුකෝ.. මටත් බඩගිනියි... "

හෙශාන් අයියා අපෙන් මොනාහරි හංගන්න හදනවා කියලා තේරුන නිසා මට බය හිතුනා... අයියගේ බැල්මෙත් තිබ්බේ ඒ වගේ දෙයක් තමයි...

"උබට විකාරද හෙශානයා.. මෙතන්ටම ආපු එකේ සුදූට අරූව බලන්න දීපං.. කොයි වෙලේ කන්න බැරිද.... "

"ආ මේ ඌ වොශ් දනවා බත් ඉතින් නංගිට යන්න බෑනේ ඒකයි... "

"උඹට පිස්සුද බන් ඌ කොහොමද වොශ්දන්නේ තුවාල පිටින්.."

"නෑ... මේ... නර්ස් කෙනෙක් ඌව පිහදනවා... "

හෙශාන් අයියා රටේ නැති බොරු කියන්නේ කියලා දැන්නම් හොදටම පැහැදිලියි...

"යකෝ නර්ස් ඉන්නවන්ම් සුදූ ගියාම මොකද... මේකි උගේ කෙල්ලනේ... විකාර කරන්න එපා බන් මෙයා තව බය වෙනවා.. "

අයියා මොනා කිව්වත් හෙශාන් අයියට ඕනෙ උනේ මං ඇතුලට යන එක නවත්තන්න... ඒත් එක්කම ඇතුලින් ඇහිච්ච හිනාවක සද්දෙ නිසා මං දොර ඇරියේ හේශාන් අයියවත් තල්ලුකරන්.. ඒත් මගේ ඇස් ඉස්සරහ තිබ්බේ කිසිම පෙම්වතියක්ට දකින්න පුලුවන් දර්ශනයක් නෙවෙයි. නිතිනු අයියා සනුදි අක්කගේ දෙතොල් සිප ගන්නවා.. ඒ නිරුවත් උඩුකය දිගේ දුවන අතැගිලි දිහා මන් බලන් හිටියේ හදවත අමුඅමුවේ ගලවලා දනවා වගේ දැනෙද්දි...

නිතිනු අයියගේ ඇස් පියවිලා සනුදි අක්කගේ දෙතොල් පහස විදිනවා... දවස් කීපෙකට කලින් මගේ වෙලා තිබ්බ ඒ දෙතොල් වෙනකෙනෙක්ගේ තොල්වල පැටලිලා... කොහොමද බලන් ඉන්නේ මං..

කකුල් පන නැතුව වැටෙන්න යද්දී හේශාන් අයියා මාව අල්ලගත්තා... කඳුලු බේරෙන ඇස් වලින් මං එයා දිහා බලලා නිතිනු අයියා දිහා බැලුවා... ඇගිල්ල දික් කරලා හෙශාන් අය්යට පෙන්නලා ඇස් වලින් ඇහුවේ ඒක ඇත්තක්මද කියලා.. විශ්වාස නෑ මට කොහොම විශ්වාස කරන්නද පන වගේ ආදරේ කරපු කෙනා වෙන කෙනෙක් එක්ක එහෙම ඉද්දි... හේශාන් අයියගෙන් පිළිතුරක් නැති තැන මන් අත කොනිත්ත ගත්තා... මේක හීනයක් නෙවෙයි. මං මේ දකින්නේ ඇත්තම ඇත්ත...

කකුල් දෙකට පන අරන් මං හෙමින් එයා ලගට ලං වෙද්දී එයා සනුදි අක්කගේ දෙතොලින් මිදුනේ හති අරිමින්... එතකොට තමයි එයා මාව දැක්කේ... එයා සනුදි අක්කා දිහා බලලා මන් දිහා බැලුවා... මං එයාගේ ඇද ලගට ඇවිත් එයාගේ මූන දේතට ගත්තා.. එයා මාව තල්ලු කරන්න හදනවා...

"ඇයි අයියේ මේ... ඒ මන් නෙවෙයි.... කොහොමද ඔයා වෙන කෙනෙක්ව කිස් කරේ.... ආ.. කොහොමද වෙනකෙනෙක්ව කිස් කරේ... මේ තොල් ඒවා මටනේ අයිති රත්තරන්... එයා ඔයාගේ පපුවත් අල්ලනවා.. මං තුරුලු වෙන තැන නේ ඒ... ඇයි එහෙම වෙනකෙනෙක්ට දුන්නේ.... ඒවා මගේනේ.. ඔයා ඔයා ඒ මන් කියලද හිතුවේ... නෑ තිනු ඒ මන් නෙවෙයි... මං මං මෙතනනේ ඉන්නේ වස්තු.. මං ඒවගේ ගවුම් අදින්නෑ කියලා ඔයා දන්නවනේ... මේ බලන්න ඔයා කැමතිම ගවුම ඇදන් ආවේ

මන් ඔයාව බලන්න... එයාට යන්න කියන්න.. එයාට යන්න කියන්න.. ඔයා මගේ විතරයි.. එයාට යන්න කියන්නකෝ මට දුක හිතෙනවා.. මගේ පපුව පැලිලා යයි... ප්ලීස් ප්ලීස් එයාට යන්න කියලා මාව ගන්නකෝ ලගට.. කියන්නකෝ ඔයා මගේ විතරයි කියලා.. චූටි මැනික කියලා මාව ඉබින්නකෝ.. ප්ලීස් ප්ලීස් මට මෙහෙම දුක් දෙන්න එපා... මෙච්චර දේවල් දරාගන්න මගේ හිත ශක්තිමත් නෑ... ඉහි ඉහි ඉහි ආදරෙයි කියන්නකෝ... කියන්නකෝ..."

මං උමතුවෙන් වගේ කියව කියව ඒ දෙතොල් සිප ගන්න යද්දී එයා මාව තල්ලුකරා... අයියා ඇවිත් අල්ලගත්තේ නැත්තම් මාව බිත්තියේ වදිනවා...

"මොකක්ද බල්ලෝ කරන්නේ..ආ උබට මොනාද වෙලා තියෙන්නේ.. ආයෙත් මේ සක්කරවට්ටම කරේ දගත්තේ උබට පිස්සුද "

"මොනාද ආරාධ්‍ය මේ කියන්නේ... මේ කෙල්ලට වගේම උබටත් පිස්සුද... ආ.. උබගේ යාලුවගේ ඇගේ කොහෙද යන එකියක් එල්ලෙන්න හදද්දි ඒකිව එලවන්නේ නැතුව මට කෑ ගහන්නේ... "

මං ඇස් ලොකු කරලා බැලුවේ නිතිනු අයියා දිහා... "කොහෙද යන එකියක් " එතකොට මන් එයාට කොහෙද්ද යන එකියක්ද...

ඉස්සර බබා, චූටි මැනික වෙච්ච මන් අද එයාට කොහෙද්‍ දේ යන එකියක් වෙලා.. අතින් තද කරලා පපුව මිරික ගත්තේ වේදනාව දරාගන්න බැරි නිසා..

"කොහෙද යන එකෙක් නෙවෙයි යකෝ.. ඒ මගේ නංගි.. මේකි නිසා විනාස වෙච්ච උබේ ජීවිතේ ගොඩ ගත්තේ මගේ නංගි බල්ලෝ.. තෝ කොහොමද ඔහොම කතා කරන්නේ මගේ නංගිට... බලපන් බලපන් මේකි දිහා දවස් ගානක් තෝ වෙනුවෙන් අඩලා අඩලා මගේ නංගි පිස්සියෙක් වගේ වෙලා.. ඔය සක්කරවට්ටම එතකන් මොනාද කරේ අහපන්......... "

"ආරාධ්‍ය ප්ලීස් ඕක නවත්තපන්.. මේකා සිහියෙන් නෙවෙයි ඉන්නේ ඒකයි මූ ඔහොම කියන්නේ... ප්ලීස් නවත්තපන් ඕක තවත් නංගි බයවෙනවා.."

"ආරාධ්‍ය ආම් සොරි මේ උබේ නංගි කියලා මං දැනන් හිටියේ නෑ... ඒත් බං උබලා කියන ඒවා මට පිළිගන්න බෑ... උබලත් හොදටම දන්නවා ඉස්කෝලෙ කාලේ ඉදලම සනුදිට ආදරේ කරේ.. ඉතින් කොහොමද මං සනුදිව අතෑරලා වෙන කෙනෙක්ට ආදරේ කරන්නේ... ඒක මේ ආත්මෙ නම් වෙන්නෙ නැති දෙයක්.. සමහරවිට උබේ නංගි මට ආදරය කරන්න ඇති.. ඒත් මට ඒවා අදාල නෑනේ... ප්ලීස් ආයේ මාව අල්ලන්න එපා කියපන් මට වෙන ගෑනු මාව අල්ලද්දි අප්පිරියයි... "

කඳුලු ගලන ඇස් වලින් මං බැලුවේ මගේ අත් දිහා... මතකයි මට එයා මගේ අත් අල්ලන් එයා කිව්වා මං ගොඩක් සොෆ්ට් කියලා.. මගේ අත් අල්ලන්න ආසයි කියලා. මගේ අත් වලින් මූන අල්ලද්දි සේරම ප්‍රශ්න අමතක වෙනවා කියලා.. ඔලුව අතගාද්දි සනීපයි කිව්වා.. එහෙම කියපු එයාට මගේ ස්පර්ශේ අප්පිරියයිලු.. කොහොමද දෙවියනේ මං ඒවා අහගෙන ඉන්නේ.

"හඟ් උඹට දැන්ද තිතිනු මගේ නංගිව අප්පිරියා උනේ.. උඹට අසනීප වෙලා ඒකිට තුරුල් වෙලා ඉද්දි එහෙම දැනුන්නැද්ද බන්, ඒකිගේ අතින් උයන ඒවා ඒකිටම කියලා කවා ගද්දි උඹ අම්මාව මතක් වෙලා අඩද්දි ඒකි ඔලුව අතගානකොට උඹට අප්පිරියා උනේ නැද්ද යකෝ.."

"ආරාද්‍ය ස්ටොප්ඉට් මූට තාම හොද නෑ යකෝ ඒකයි නංගිට එහෙම කතා කරන්නේ. ඌ හිතලා නෙවෙයි බන් ඕවා කියන්නේ.. ඌට මතකයි නම් නංගිට කීයටවත් එහෙම දේවල් කියන්නෑ.. ඉවසපන් පොඩ්ඩක්.."

"ඉවසන්න, ඉවසන්න පුලුවන් ද යකෝ මේ මගේ නංගි.. ඒකිට දුක් විඳලා පුරුදු නෑ බන්.. උඹ දැක්කේ නෑ පහුගිය ටිකේ අඩපු හැටි.. ඊයෙත් හිටියේ මූගේ ටීශර්ට් එකක් බදාගෙන අඩ අඩ.. බලපන් මූනෙ හැටි අඩලම ඉදිමිලා.. මට ආදරේ කරනවටත් වඩා මූට ආදරේ කරන්න ඇති.. අපි හැමෝම ඒකිට සැලකුවේ බබෙක්ට වගේ බං.. ඒකිට මූගේ මේ වචන උහුලන්න බෑ.. උඹට තේරෙන්නෑ ඒකි

කොච්චර දුකකින්ද ඉන්නේ කියලා.. මට දැනෙනවා බන් මං ඒකිගේ අය්යා. මෙතන උබේ නංගි හිටියනම් උබ ඉවසනවද කියපන්.."

අයියා මාව තුරුල් කරන් හෙශාන් අයියට කියන්නේ ඇඩෙන්න ඔන්න මෙන්න කටහඩින්.. ඒත් මං බලන් හිටියේ නිතිනු අයියා දිහා... එයා නම් සනුදි අක්කා දිහා බලාගෙන මේ වෙන දේවල් ගැන අහනවා..

"ඕහ් ජස්ට් ස්ටොප්ඉට් ආරාධ්‍ය... දැන් ඇති ඔය අයියගෙයි නංගිගෙයි ඩ්‍රාමා එක.. ඔයාගේ බෙස්ට්ෆ්‍රෙන්ට ඔයා කොහොමද ඔහොම කරන්නේ ආරාධ්‍ය... "

කොන්ඩෙ කැල්ලක් ඇගිල්ලේ අබර අබර ඉස්සරහට ආවේ සනුදි අක්කා.. මං එයා දිහා බැලුවේ එයා මොනාද කියන්න යන්නේ කියලා..

"මොකක්ද සනුදි තමුසෙ කියන්න හදන්නේ... "

"කියන්න හදන්නේද කියන්න හදන්නේ... ඔයාලා නිතිනුගේ දේපල ගන්න ගහපු ප්ලෑන් එක ෆේල් කියලා.. මේ සනුදි ලගින් ඉන්නකම් නිතිනුට ප්‍රශ්නයක් වෙන්න තියන්නෑ.."

"මොකක්ද තමුසේ කිව්වේ... අපිද යකෝ නිතිනුගේ දේපල ගන්න හැදුවේ.. උබනේ එක එක මිනිස්සු එක්ක නටලා ඇවිත් මූගේ දේපල ගන්න දග......"

"ආරාද්‍ය ඕක නවත්තපන්.. "

අයියා කියන්න ගියපු දේ කියන්න නොදී කෑ ගැහුවේ නිතිනු අයියා.. ඒ ඇස් කේන්තියෙන් රතු වෙලා.. හරියට ඉස්සර කවුරු හරි මට මොනාහරි කියද්දි රතු වෙනවා වගේ...

"ආරාද්‍ය මං හිතුවේ නෑ උබ මේ වගේ කෙනෙක් කියලා.. උබ මගෙන් සල්ලි ඉල්ලුවනම් මං දෙනවා බන්... මෙච්චර පහත් වැඩක් කරය් කියලා කීයටවත් හිතුවේ නෑ බන්... ච්ක්.. උබ මේ උබේ පොඩි නංගිගේ ජීවිතෙත් විනාස කරන්නද යන්නේ සල්ලි වෙනුවෙන්... ඒක තමයි උබ මට සනුදි ගැන එක එක වැරදි කිය කිය මාව රවට්ටන්න හැදුවේ.... ශිට්.."

"ඒ විතරක් නෙවෙය් ඩාලිං ඔයාගේ ඔපරේශන් එකටත් වයිෆ් කියලා මේ කෙල්ල තමය් සයින් කරලා තියෙන්නේ.. මං හිතන්නේ බොරු සෙටිෆිකේට් පෙන්නලා ඔයාගේ දේපල සේරම ලියාගන්න එක තමයි මෙයාලගේ ප්ලෑන් එක.."

හිතේ කොනකවත් නොතිබ්බ්ච දේවල් කියලා මාව වැරැදිකාරියක් කරද්දි එයා සේරම දේවල් ඉස්මුදුනෙන් පිලිගත්තා.. කදුලු අත් දෙකෙන් පිහද්ද මන් ඉස්සරහට ආවේ එයා තවත් මොනවත් කියන්න කලින්..

තවත් මොනාහරි කිව්වොත් මගේ හදවත පැලිලා යයි කියලා බයයි මට..

"මං මං එහෙම කරේ නෑ අයියේ.. මට ඔයාගේ දේපල ඕනේ නෑ... මට ඕනේ ඔයාගේ ආදරේ විතරයි.. මතක නැද්ද පලවෙනියටම අපි ඇවිදින්න ගියපු දවසේ ඔයා මගෙන් පවුලක් ඉල්ලුවා.. හොස්පිට්ල් ඇඩ්මිට් කරාම අත්සන් කරන්නවත් ඔයාට බාරකාරයෙක් නෑ කිව්වා... ඒකයි මං එදා අත්සන් කරේ ඔයාගේ වයිෆ් කියලා.. වෙන අදහසක් මගේ හිතේ තිබ්බේ නෑ රත්තරන්.. කොහොමද මාව ඔයා අමතක කරේ.. මතක නැද්ද මං ගාව හිටපු හැටි... හද එළියේ මාව තුරුල් කරන් පලවෙනි කිස් එක දුන්නා මතක නැද්ද ඔයාට.. පැන්ට්‍රිය උඩින් මාව තියන් මං වගේ බබෙක් ඕනෙ කිව්වා මතක නැද්ද.. අම්මිව බලන්න එක්කන් ගිහින් මාව ඔයා ලගට එව්වා කියලා ස්තූති කරා මතක නැද්ද ඔයාට.. ඇය් ඇය් මං මෙයාගේ ෆොටෝ එකක් දැකලා ඇඩුවා කියලා ඒ ෆොටෝ එක කෑලි කෑලි වලට ඉරලා දැම්මා ඔයා.. එදා කිව්වා මේ ලෝකේ වැඩියෙන්ම වයිර කරන්නෙ මගේ කඳුලුවලට කියලා.. ඉතින් ඇය් ඔයාම මට මෙහෙම කඳුලු දෙන්නේ.. ඔයා මට ගොඩක් ආදරේ කරා අය්යේ.. මං ඔයාගේ පන කියලා ඔයා කිව්වේ. ඔයා මාව අමතක කරාට මත් තරහා නෑ... ඔයාට මතකේ එනකන් මට ඕනේ කාලයක් බලන් ඉන්න පුලුවන්... ඒත් මෙයාට යන්න කියන්න.. මාව පිච්චෙනවා රත්තරන් ඔයාව මෙයා එක්ක දකිද්දි.. මෙයානේ වෙන කෙනෙක් එක්ක ගියේ ඔයාව එපා කියලා..

ඉතින් ආයේ ආවේ ඇය් අහන්න.. මමයි අයියයි ඔයාගේ දේපල වෙනුවෙන් මුකුත් කරේ නෑ නිනු.. ඇය් ඔයා මෙයා කියන ඒවා පිළිගන්නේ... මට සල්ලි ඕනේ නෑ.. සල්ලි ඕන්නම් මට මෙහෙම රගපාන්න ඕනේ නෑ අය්යේ.. ඔයාගේ ක්‍රෙඩිට් කාඩ් ඩෙබිට් කාඩ් ඔක්කොගෙම පාස්වර්ඩ් මන් දන්නවා ඔයා මට කියලා තියෙන්නේ.. ඉතින් සල්ලි ඕන්නම් මට ගන්න තිබ්බනේ.. මට ඕනේ ඔයාගේ ආදරේ විතරය් අය්යේ වෙන මුකුත් මට එපා..."

මං එයා ලගට ගිහින් හය්යෙන් ඇඩුවා... එයා ගල් පිළිමයක් වගේ මං දිහා බලන් හිටියා ඇරෙන්න කිසිම දෙයක් කිව්වේ නෑ...

"ඕ කමෝන්... ඔය බොරුවට ඇඩුවා ඇති කෙල්ලේ.. මොනා උනත් කිව්ව කතා ටික නම් ලස්සනයි.. ඔය බොරුවලට රැවටෙන්න තරම් නිතිනු බොලද නෑ... ඔයා මොනාද කරන්නේ නිතිනු මේ කෙල්ලගේ විකාර අහ අහා.. ඔයාට මටත් වඩා මෙ කෙල්ලව විශ්වාසයි ද.. මෙයාලව එලියට යවන්නකෝ.. මට ඔයත් එක්ක තනිවෙන්න ඕනේ.."

සෙනුදි නිතිනු අයියගේ උඩුකය පුරා අතැගිලි අරන් යද්දි මට මගෙ ඇස් වලට මොනාගෙන් හරි ඇනගන්න හිතුනා... වටපිටාවේ සේරම දේවල් අමතක වෙලා වගේ නිතිනු අයියා එයාගේ ඉනට හේත්තු වෙද්දී අයියා මගේ අතින් ඇදන් ආවේ කාමරෙන් එලියට..

හෙශාන් අයියත් අපේ පස්සෙන් ආවා...

"අයියේ අයියේ මාව අතාරින්න.. මට මගේ නිතිනු අයියා ගාවට යන්න ඕනේ.... මට යන්න දෙන්න.. අරයා මගේ නිතිනු අයියව අයිති කරගනියි.. අනේ මට යන්න දෙන්නකෝ.. එයා මගේ විතරයි..."

මං අඬද්දි අයියා මාව තුරුල් කරගත්තා..

"අඬන්න එපා සුදූ... නිතිනු අයියට ඉක්මනට හොද වෙයි.. එයා දන්නේ නැතුව ඒවා කරන්නේ.. නිතිනු අයියා ඔයාගේ විතරයි.. මේ හැමදේම හීනයක් කියලා අමතක කරන්න.. ඒ ඉන්නේ ඔයාගේ නිතිනු අයියා නෙවෙයි... ඒ ඒ වෙන කෙනෙක් සුදූ... ඔයාගේ නිතිනු අය්යට තවම සිහිය නෑ එයාට ඉක්මනට සිහිය එයි.. බයවෙන්න එපා... "

"ඒ වුනාට එයා මගේ නේ.. අරයා මගේ නිතිනු අයියව අල්ලනවා.. එපා කියන්නකෝ එයාට.. මට බලන් ඉන්න බෑ දුකයි මට.. උගුරේ මොනාදෝ හිර වෙලා වගේ... අනේ මට මගේ නිතිනු අයියව ඕනේ.. එයාව ගෙනත් දෙන්නකෝ.. හෙශාන් අයියේ ඔයාවත් කියන්නකෝ එයාට සනුදි අක්කා ගාවට යන්න එපා කියලා.. මගේ ආදරේ මදිද එයාට.. මං එයාට ගොඩක් ආදරේ කරානේ.. ඊට වඩා ආදරේ කරන්න මං දන්නේ නෑ... ඉහි ඉහි ඉහි මගේ පපුව රිදෙනවා... එයාට කියන්නකෝ මට රිදෙනවා කියලා.. මං මැරෙයි.. මට දරාගන්න බෑ........ ආ....ආඅ "

"අඩන්න එපා පැටියෝ මං මං ගිහින් නිතිනුට කතා කරන්නම්... හොඳ ලමයනේ.. "

හේශාන් අයියා මගේ ඔලුව අතගාලා නිතිනු අයියා ඉන්න කාමරේට යනදිහා මන් බලන් හිටියේ බලාපොරොත්තු දල්වගෙන... අයියා මගේ ඔලුව අතගගා හිටියා හෙශාන් අයියා එනකම්ම.. ඒත් හෙශන් අයියගේ මූන දැක්කම මගේ බලාපොරොත්තු කකුල් එදිරිපිට කඩන් වැටුනා.. එයා ඇවිත් මගේ පිටට තට්ටු කරා මිසක් වෙන මුකුත් කිව්වේ නෑ... මං අයියව හූර හූර ඇඩුවේ දුක දරාගන්න අමාරු නිසා.. එයා සනුදි අක්කා එක්ක හිටිය විදිහ මතක් වෙද්ද මාව පිච්චිලා යනවා.

## 39 කොටස

මං අයියට තුරුල් වෙලා අඩද්දි ඩොක්ටර් ආවා අපි ඉන්න තැනට... මං අඩන එකත් නවත්තලා ඩොක්ටර් දිහාට හැරුනා...

"දරුවෝ... අපිට ඔයාගේ හස්බන් කම්ප්ලේන් කරලා තියනවා බලහත්කාරයෙන් ඔයා එයා ඉන්න රූම් එකට එනවා කියලා.. එයාට ඒක වදයක් කියලා..

අනිත් එක ඔයා එන්නෙ එයාට හානියක් කරන්න කියලා සැකයක් තියෙන නිසා ඔයාට එයාගේ රූම් එකට දෙන්න එපාලු.. "

"මො... මොක්කද ඩොක්ට ??? අනේ මත් එහෙම නෑ ඩොක්ට.. මං එයාගේ දේපල ගන්න නෙවෙයි එයා ගාවට යන්නේ.."

"මං දන්නවා දරුවෝ.. මන් දැක්කනේ ඔය දරුවා මේ දවස් ටිකේ කොහොමද හිටියේ කියලා.. සිහිය ආවට පස්සේ නේ අනිත් එක්කෙනා බලන්නවත් ආවේ... මං කියන්නේ ඔයා පොලිසියට යන්න.. මොකද එයාගේ වයිෆ් හැටියට එයාගේ ලීගලි රයිට්ස් තියෙන්නේ ඔයාට.. "

"මං මං එයාගේ වයිෆ් නෙවෙයි ඩොක්ටර්.. මං එයාගේ ගර්ල්ෆ්‍රෙන්ඩ් විතරයි.. "

"වට් ඒ කියන්නේ අර අනිත් ගර්ල් කියන දේවල් ඇත්තද"

"න්නෑ ඩොක්ට.. එයාගේ වයිෆ් කියපු එක විතරයි මන් මං කිව්ව එකම බොරුව.. එයාට වෙන කවුරුත් නෑ ඩොක්ට.. ඒකයි මං වයිෆ් කියලා කිව්වේ... මට වෙන අදහසක් තිබ්බේ නෑ... මාව විශ්වාස කරන්න.."

"හරි දරුවෝ මට ඔයාව විශ්වාසයි.. ඒත් අපිට ඔයාව ඒ රූම් එකට යවන්න බෑ... මොකද ඒක හොස්පිට්ල් එකේ

රූල්ස් වලට විරුද්දයි.. ආම් සොරි පුතා ඒත් ඔයාට හස්බන්ව බලන්න වෙන්නෙ නෑ... "

"අනේ ඩොක්ටර් එහෙම කරන්න එපා ඩොක්ටර්.. මට එයා බලන්නේ නැතුව ඉන්න බෑ ඩොක්ට... ප්ලීස් පිලීස් මට එයාව බලන්න දෙන්න... ප්ලීස්..."

මං ඩොක්ටගේ කකුල් දෙක අල්ලලා ඇඩුවා.. එයාව දකින්නෙත් නැතුව හිටියොත් මට පිස්සු හැදෙයි.. ඒත් ඩොක්ට කැමති උනේ නෑ... එයාට ඒක කරන්න බෑලූ.. ඒත් එයා මගේ නම්බර් එක ඉල්ලගත්තා නිතිනු අයියගේ තොරතුරු කියන්න...

ලෝකේම නැති වුනා වගෙ මං ගෙදර ආවේ... ආපු ගමන් නිතිනු අයියගේ ඇදේ හාන්සිවෙලා ඇඩුවා.. මදුරුවෙක්වත් මරන්නේ නැති මටම ඇයි මෙහෙම වෙන්නේ.. මං කාටවත් වැරැද්දක් කරලා නෑ... ඇයි මට මෙච්චර දුකක් දෙන්නේ...

සතියක් ගෙවිලා ගියේ මාව සම්පූර්ණයෙන්ම වෙනස් පුද්ගලයෙක් කරලා... දගකාර කටකාර ආරූ ගියපු දිහාවක් හොයන්නවත් නෑ... කදුලු මගේ යාලුවා වෙලා තිබ්බේ... නිතිනු අය්යට සනීපවෙලා ගෙදර ගියා... එයා සනුදි අක්කත් එක්ක හිතාවෙවී හොස්පිට්ල් එකෙන් යනහැටි මං ඈතට වෙලා හොරෙන් බලන් හිටියා...

අයියාට හැමවෙලේම වදදෙන්න බැරි නිසා මං එයාට වැඩට යන්න කිව්වා... එයත් ගියාම මගේ තනියට හිටියේ චූෆී විතරයි.. නිතිනු අයියගේ කාමරේට වෙලා එයාගේ ඇඳුමක් ඇඳන් මං චූෆීට දුක කිව්වා.. අනේ එයාට මාව හොදට තේරෙනවා... මං අඩනකොට එයා මගේ මූන ලෙවකාලා අමුතු විදිහට බුරනවා... හරියට මට අඩන්න එපා කියනවා වගේ...

සෙනසුරාදා උදේත් මන් හිටියේ චූෆීව බදාගෙන අඩ අඩා.. අයියා හිටියේ බාත්රූම් එකේ.. ගෙදර බෙල් එක ගහනවා ගහනවා බැරිතැන කඳුලු පිහදාගෙන දොර ඇරියා.. ඒත් මන් ඉස්සරහ තිබ්බේ මේ ලෝකේ මං දකින්න කැමතිම රූපේ... ඔව් දොර ලග හිටන් හිටියේ මගේ නිතිනු අය්යා.. මං එයාගේ උඩ ඉඳලා පහලට බැලුවේ කඳුලු බේරෙන ඇස් වලින්.. දෙපාරක් හිතන්නේ නැතුව මං එයාගේ බෙල්ල එල්ලුනා..

"ඔයා ආවද මාව හොයන්.. මන් දැනන් හිටියා ඔයා මාව හොයන් එනවා කියලා.. මං දන්නවා ඔයාට මාව අමතක කරන්න බෑ කියලා.. අය්යේ.. අය්යේ.. බලන්නකෝ නිතිනු අය්යා මාව හොයන් ඇවිත්.. චූෆී ඔයාගේ ඩැඩී ඇවිත්.. මෙහෙ එන්නකෝ.. මගේ තිනූ.. ඔයාට ඔයාගේ චූටි මැනිකව මතක් උනාද... මං ආදරෙයි... ආයේ මාව දාලා යන්න එපා මට පිස්සු හැදෙය්.. මං ගොඩක් ආදරෙය්.."

කඳුලු මැදින් හිනාවෙච්ච මං එයාගේ මූනට ලං වෙන්න හැදුවේ ඒ මූනම ඉබින්න හිතන්.. ඒත් මාව විසිවෙලා ගියේ වුනේ මොනාද කියලා හිතාගන්න බැරිවෙද්දි.. විසිවෙච්චපාර මාව ගිහින් වැදුනේ සෝෆා එකේ... මං අසරන විදිහට එයා දිහා බැලුවේ.. ඒ ඇස් වල තිබ්බ කේන්තිය මට කිව්වේ තාමත් එයාට මතකේ ඇවිත් නෑ කියලා..

"තාමත් ඉවරනැද්ද ඔය ඩ්‍රාමා එක.. අහන්න නංගි ඔයා මගේ යාලුවගේ නංගි නිසා මං මේ කියන්නේ... වෙන ගෑනියෙක් එහෙම නම් මං පොලිසියට අල්ලලා දෙනවා... සල්ලි නිසා තමන්ගේ වටින ජීවිතේ විනාශ කරගන්න එපා... ගෑනු ලමයෙක්ට වටින්නේ එයාගේ චරිතේ... බල්ලොවත් නොකන සල්ලි වෙනුවෙන් අනුන්ගේ මිනිස්සුන්ගේ ඇගේ එල්ලෙන්න තරම් පහත් වෙන්න එපා... "

"අනුන්ගේ මිනිස්සුන්ගේ ඇගේ එල්ලෙන්න ?? නෑ මං එහෙම නෑ... ඔයා අනුන්ගේ වෙන්නේ කොහොමද මගේනේ.. මන් මන් එහෙම නරක කෙනෙක් නෙවෙයි අයියේ.. ඔයා ඒක හොදටම දන්නවා..."

"ඔහ් දැන්වත් ඕක නවත්තගන්න.. පේන්නැද්ද සේරම දේවල් එලිවෙලා තියෙන්නේ.. තවත් රඟපාන එකෙන් තේරුමක් නෑ... මන් ආවේ මෙහේ මගේ බඩු වගයක් තියනවා කිව්වා ඒවා ගන්න.."

"ඇයි ඔයාට පේන්නැත්තේ මං ඔයාට කොච්චර ආදරෙයි ද කියලා.. මගේ පපුව පැලෙන්න තරම් මං ආදරෙයි... මේ බලන්න මගේ අත තියලා ඔයා ඉස්සර මගේ හදවතේ සද්දේ පවා ඇදිනුවා මතක නැද්ද... "

අඩ අඩා එයා ලගට ඇවිත් අත අරන් මගේ හදවත තියන තැනින් තියාගත්තා... ඒ ඇස් මොහොතකට ගැස්සුනා උනත් ඊගාව තත්පරේට මාව බිමට විසිවෙලා ගියා...

"වට්ද හෙල්... තමුසේ මාවා සෙඩියුස් කරන්නද යන්නේ.... ලැජ්ජ නැද්ද ඔිය් සල්ලි වෙනුවෙන් ඔච්චර පහතට වැටෙන්න.. තාම පොඩි කෙල්ලෙක් නේද... සනුදි කිව්වත් මං විශ්වාස කරේ නෑ ආරාධ්‍ය ගේ ගෙදර මිනිස්සු මේ වගේ කියලා.... තමුසෙගෙයි ප්‍රොස්ට්ටියුට් කෙනෙක්ගෙයි ඇති වෙනස මොකක්ද..."

"නිතිනු....... මොකක්ද බල්ලෝ තෝ කියන්නේ... "

නිතිනු අයියා කට හඬ අස්සෙන් ඇහුනේ අයියගේ රලු කටහඬ... ඒත් එක්කම නිතිනු අයියගේ කම්මුල මත නතර වුනේ අයියගේ අත "චටාස් " ගාන සද්දෙන්.. මං ඇස් දෙකත් ලොකු කරන් බලන් හිටියේ අයියා දිහා... එයා කේන්තියෙන් වෙව්ලනවා... ඇත්තටම මට තේරුනේ නෑ නිතිනු අයියා අන්තිමට කිව්වේ මොකක්ද කියලා.. ඒ වචනේ තේරුම මං දන්නේ නෑ...

"මොකක්ද බල්ලෝ තෝ කිව්වේ... මගේ අහිංසක නංගි උබට ප්‍රොස්ට්ටියුට් කෙනෙක් වගේ පේනවද තිරිසනෝ... තෝ ඇරෙන්න ඒකිගේ අතින්වත් කොල්ලෙක් අල්ලලා නෑ යකෝ.. තොගේ බල්ලොත් නොකන සල්ලි වෙනුවෙන් මගේ නංගිව පාවිච්චි කරන්න මං පො&@යෙක් කියලා හිතුවද.. ඈ යකෝ.. "

අයියා තිතිනු අයියව බිත්තියට හේත්තු කරගෙන එයාට ගැහුවා... මන් කොච්චර කෑ ගැහුවත් එයා නතර වුනේ නෑ... බේරන්න ගිහින් මාව විසිවෙලා වැටුනා විතරයි.. ටික වෙලාවකින් අයියම ගහන එක නවත්තලා බිත්තියට අතින් ගැහුවා...

"මමයි වැරදි මේ ඔක්කොටම... මමයි වැරදි.. උබව මේ ගෙදරට ගෙනාවේ නැත්තම් මගේ නංගි උබට ආදරේ කරන්නේ නෑ... එහෙනම් අද ඒකි එහෙම විදවන්නේ නෑ... කොහොමද කොහොමද මට කියපන් මගේ නංගිගේ අහිංසක මූන දිහා බලන් උබ ප්‍රොස්ට්ටියුට් කෙනෙක් වගේ කිව්වේ... ඒකි ඒකේ තේරුමවත් දන්නෑ බන්... අරන් පලයන් උබේ ඔක්කොම දේවල්... උබ නංගි එක්ක එයො එක පටන් ගද්දිම මං කිව්වා එයාගෙන් එක කදුලක් හරි වැටුනොත් උබට සෙකන්ඩ් චාන්ස් එකක් හම්බවෙන්නේ නෑ කියලා.. එක කදුලක් නෙවෙයි ඇගේ කෝටු ටික විතරක් ඉතිරි වෙනකම් ඒකි ඇඩුවා. උබට මතකෙ නැති එක නිසා ඇරෙන්න මෙලහකට මන් උබව මරලා දනවා..

මතකේ ආවත් මගේ නංගිව හොයන් ඇවිත් මං නරක මිනිහා කරගන්න එපා...

"අයියේ ඔයා මොනාද මේ කියන්නේ... එයා එයා මතකේ නැති නිසයි එහෙම කියන්නේ... "

"කට වහගනින් ආරු.. පොඩිකාලෙ ඉඳන් තමුසෙව පරිස්සමට බලාගත්තෙ එක එකාගේ කුනු කතා අහන්න නෙවෙයි.... අරන් පලයන් උබේ සේරම දේවල්... ආය උබට ආරාධ්‍ය කියලා යාලුවෙක් නෑ... හිටියෙත් නෑ කියලා හිතාගනින්... මට උබේ රෙද්දේ ජොබ් එකත් එපා... මන් හෙටම රිසයින් වෙන්නම්.. හැබැයි ආයේ උබ මගේ දෑහැට පේන්න ආවොත් මන් උබව මරනවා.. අන්න අර කාමරේ තියෙන්නේ උබේ බඩුටික.. අරන් පලයන්.."

"ආරාධ්‍ය මන් කියන දේ අහපන්... මන් කිව්වේ නෑනේ උබේ නංගි ප්‍රොස්ට්ටියුට් කෙනෙක් කියලා.. ඒත් එයා කරපු වැඩේ ඒ වගේ... පිරිමියෙක් ට කියලා ඇගට අත තියවගන්නේ නෑ හරිහමන් කෙල්ලෙක් නම්.. අනිත් එක බලහන් එයා ඉන්න විදිහ.. ඒක මං කිව්වේ... "

"ඒක තමයි බලහන් ඒකි ඉන්න විදිහ.. හරියට ඇඳුමක්වත් අඳින්න ඒකිට සිහියක් නෑ... ඔය ඇඳන් ඉන්නෙත් තොගේ ටී ශර්ට් එකක්.. අනික උබ ජරා විදිහට හිතුවට ඒකි ඒක කරේ උබව සෙඩියුස් කරන්න නෙවෙයි.. කොහොමහරි උබට ඒකිව මතක් කරවන්න ඒකිට ඕනේ උනේ.... ඒකෙන්

වැඩක් නෑ මං උබට විනාඩි පහක් දෙන්නම් මෙතනින් යන්න.. පලයන් දැන්..."

අයියා කෑගහලා බනිද්දි මං බිමට වෙලා අඩ අඩ හිටියා... අයියා ඇවිත් මාව තුරුල් කරගත්තේ මට හයියක් වෙන්න හිතාගෙන වෙන්න ඇති..

"ඇය් එහෙම කිව්වේ... දැන් එයා මතකේ ආවත් මාව හොයාගෙන එන්නේ නැතිවෙයි.. ඇයි එහෙම කිව්වේ... "

අඩ අඩා මං අයියගේ ශර්ට් එකෙන් අදින ගමන් ඇහුවේ.. එයා මාව කිට් කිට්යේ බදාගත්තා..

"මට සමාවෙන්න සුදූ මේ හැමදේම මන් නිසා.. මන් නිසයි ඔයා මෙහෙම විදවන්නේ.. ඔයාට එයාව ඕනේ නෑ... ඒ වගේ මිනිහෙක් ඔයාට ඕනේ නෑ සුදූ... "

අයියා කියන්නේ බොඳවෙච්ච හඬින්.. ඒත් එක්කම නිතිනු අයියා ආවේ එයාගේ බඩු ටිකත් එක්ක චූටිවත් අරන්... එයාගේ කරපටියෙන් අල්ලන් නිතිනු අය්යා හදන්නේ එයාවත් එක්කන් යන්න... චූටි මං දිහා බලාගෙන කෑ ගහනවා..

"අනේ චූටිව තියලා යන්න... ඔයා නැතුවාම මට ඉන්නේ චූටි විතරයි.. අනේ එයාව ගෙනියන්න එපා ප්ලීස්... එයාට මන් නැතුව ඉන්න බෑ... එයාව ගෙනියන්න එපා...

අඩුම ගානේ චූෆිවවත් මට තියලා යන්න... එයත් නැතුව මට පිස්සු හැදෙයි ප්ලීස්... ප්ලීස් එයාව තියලා යන්න... "

නිතිනු අයියගේ කකුල බදාගෙන කෑ ගැහුවත් වැඩක් උනේ නෑ... එයා චූෆිවත් අරන් කාර් එකට ගියා... චූෆි මන් දිහා බලන් කෑ ගහනවා...

"අනේ අයියේ එයාව තියලා යන්න කියන්නකෝ.... සනුදි අක්කා බව්වන්ට කැමති නෑ... ආයෙත් එයා තනිවෙයි.. අනේ එයත් නැතුව මන් ඉන්නේ කොහොමද ... තියලා යන්න කියන්නකෝ.. චූෆි යන්න එපා මං ගාවට එන්න.. යන්න එපා ඔයා..."

"සුදූ එයාට යන්න දෙන්න.. චූෆිව අයිති එයාට අපිට නෙවෙයි.... "

අයියා මාව නවත්තන්න උත්සහ කරද්දි මං එයාගෙන් මිදිලා කාර් එක පස්සෙන් ගියා අඩ අඩා.. ඒත් හිතක් පපුවක් නැතිගානට නිතිනු අය්යා චූෆිවත් අරන් යන්න ගියා... අය්යා මාව උස්සගෙන වගේ අරන් ඇවිත් දෙර වැහුවා..

"හු.... හු හුස්ම ග... ගන්න බෑ... ම.. ම..ට.."

අඩලා වැඩි කමට මට හුස්ම ගන්න අමාරුයි..

"සුදූ.. කෝ කෝ ඔය අඩන එක නවත්තන්නකෝ පැටියෝ... හෙමීට හුස්ම ගන්න අඩන්න එපා... "

"ඇ.. ඇ ඩෙනවනේ.... න..න..වත්..තන්..න... බෑ.. මට"

"සුදූ ප්ලීස් අයියා දිහා බලන්න.. කෝ අඩන්න එපා... කවුරු නැතත් අය්යා ඉන්නවනේ ඔයාට.. අපි හෙටම ගෙදර යන් අඩන්න එපා... හොඳ ළමයනේ.. "

අයියා මගේ පිටට තට්ටු කර කර මාව සැනසුවා.. විනාඩි දෙක තුනකින් මට හුස්ම ගන්න පුළුවන් වුනා.. ඒත් එක්කම මං අය්යගෙන් ඇහුවේ මෙච්චර වෙලා මගේ හිතේ තිබුන ප්‍රශ්නේ...

" ප්‍රොස්ට්ටියුට් කියන්නේ කවුද අයියේ.. "

"ඒක ඔයාට ඕනේ නෑ සුදූ... "

"කියන්න ඒක දැනගන්න ඕනේ.... "

"මං කිව්වනේ.. ඒක ඕනේ නෑ... "

"බෑ කියන්න මට දැනගන්න ඕනේ.... මට දැනගන්න ඕනෙ ඇයි ඔයා එයාට ගැහුවේ කියලා.... "

"ප්‍රොස්ට්ටියුට් කියන්නේ ගනි෴කාවට.. මට කියන්නේ

එහෙම කිව්වම නොගහ ඉන්න කියලද... ගහන්න නෙවෙයි මරනවා මන් වෙන එකෙක් උනා නම්.. "

"ඒත් ඒත් අයියේ ඇයි එයා එහෙම කිව්වේ... මං එහෙම නෑනේ... මාව ඒ වගේ පෙනුනේ කොහොමද එයාට.. ඇයි එයා එහෙම කිව්වේ මට.. මං එහෙම නෑනේ..."

ආයෙත් කඳුලු අලුත් කරන් මං ඇඩුවේ දරාගන්න බැරිතැන.. මන් පන වගේ ආදරේ කරන කෙනා මාව ඒ තරම් පහත් කරලා කතා කරද්දි මන් කොහොම ඒක දරාගන්න ද..

## 40 කොටස

එදම ගමේ යන්න හිටියට අයියට මග නවත්තන්න බැරි වැඩක් තිබ්බ නිසා රිසයින් වෙන්න පරක්කු වුනා.. මං ඇදේ නිදාගෙන ඉද්දි ෆෝන් එක රින්ග් වෙන සද්දෙට දුවල ගිහින් ඒක ආන්ස කරේ නිතිනු අයියා වෙන්නැති කියලා හිතාගෙන... ඒත් කෝල් එක අරන් තිබ්බේ නම් තාත්ති...

"හෙලෝ තාත්ති..."

"දේනි... මගේ මැනික හොදින්ද..."

"ඉහි ඉහි මං හොදින් නෙවෙයි තාත්ති.. මට දුකයි.. මං ගොඩක් දුකින් ඉන්නේ... එයා මාව දලා ගියා තාත්ති.. එන්නකෝ මං ගාවට.. මට දුකයි.."

“අඩන්න එපා දේනි.... කවුරු නැතත් දේනිට තාත්ති ඉන්නවනේ... අම්මයි මමයි අදම එන්නම් දේනි ලගට.. ඇයි කලින් කිව්වේ නැත්තේ තාත්තිට මේ දේවල්... එහෙනම් කලින්ම තාත්ති එනවනේ දේනි ලගට.. මේ අම්මට කතාකරන්න ඕනෙලු... අඩන්නැතුව ඉන්න මගේ දූ.. තාත්තියි අම්මියි අදම එනවා ඔහේ... "

"හෙලෝ චූටි.... අඩන්න එපා දේනි.... ඇයි මේ දේවල් අම්මගෙන් හැංගුවේ.. ඇයි කිව්වේ නැත්තේ.. කිව්වනම් මීට කලින්ම අම්මයි තාත්තියි එනවනේ දේනි ලගට.. අඩන්න එපා දැන්.. පුතාට මතකේ විතරයනේ නැති වුනේ... හොද උනාම දේනි හොයන් එයි එයා.. අඩන්නේ නැතුව ඉන්නකෝ... "

මං හිතුවේ මේ දේවල් දැනගත්තම අම්මයි තාත්තයි මට බනියි කියලා.. ඒත් එයාලා කතාකරපු විදිහට මගේ හිතට සැනසීමක් දැනුනා.. අම්මා තාත්තා තරම් සැනසීමක් ගේන්න පුලුවන් මිනිස්සු වෙන කොහෙද ඉන්නේ ඉතින්.. දැන් මට ඕනේ උනේ ඔක්කොම අමතක වෙනකම් තාත්තයි අම්මයි ලගට වෙලා අඩන්න...

සමහරවිට ඒකෙන් මගේ දුක අඩු උනේ නැති උනත් හිතේ තියෙන පාලු මූසල ගතිය ඇරිලා යාවි..

අම්මා කෝල් එක කට් කරලා ටික වෙලාවකින් අයියා කෝල් කරේ....

"හෙලෝ සුදූ.. ඔයා තාත්තිට මෙහෙ එන්න කිව්වද"

"හ්ම්ම්ම් ඔව්.."

"තාත්තිලා අද රෑම එහෙන් එනවා කිව්වා.... ඒකයි ඇහුවේ.. ඔයා කාලද ඉන්නේ සුදූ... "

"තාම නෑ... "

"හිතුවක්කාර වෙන්නැතුව කන්න ලමයෝ... ඔහොම ඉදලා ලෙඩ වෙයි.. දැන්මම ගිහින් කන්න.."

"හ්ම්ම්.."

අයියා තව මොනාදෝ කියන්න යද්දීම එහා පැත්තෙන් ඇහුනේ අහසි අක්කිගේ කටහඩ...

"නිතිනු ඊයේ අමාරුවෙලා හොස්පිටල් අරන් ගියාලු බබා.."

"ඉතින් මට මොකද අහසි.. සැරෙන් සැරේ ඌ ගැනම

කියව කියව මාව යකෙක් කරගන්න එපා... "

"මොනාද ආරාධ්‍ය ඔයා මේ කියන්නේ... එයා ඔයාගේ හොදම යාලුවා නේද... ඊයේ ඔලුව රිදෙනවා කියලා හය්යෙන් කෑ ගැහුවලු.. ඒ තියෙද්දිත් උදේ බලෙන් ඩිස්චාර්ජ් කරන් ගෙදර ගිහින්... චුට්ටක් හොයලා බලන්න ඒ ගැන.."

"මගේ නංගිට අර බලු කතාව කිව්ව වෙලාවෙම මං ඌව යාලුකමෙන් අයින් කරා... ආයේ මට ඕකා ගැන මුකුත් කියවන්න එපා... සුදූට ඇහුනොත් එහෙම ආයේ වැලහින්න වගේ අඩයි.. "

"ආරාද්‍ය ප්ලීස් මේ තත්වෙ තේරුම් ගන්න.. නිතිනු ඉන්නේ අසනීපෙන්.. ඔයයි මමයි හොදටම දන්නවා එයා නංගිට කොච්චර ආදරෙයිද කියලා.. මෙමරි ලොස් එකක් වෙලා තිබ්බේ නැත්තම් නිතිනු කීයටවත් නංගිට දුකක් දෙන්නේ නෑනේ... එයා ඔය කරන්නේ සනුදි කියන දේවල් මිසක් එයාට හිතෙන දේවල් නෙවෙයි.. ඇයි ඔයා ඔහොම පටු විදිහට හිතන්නේ.... ඔයා හදන්නේ මේ වගේ සිටුවේශන් එකකදි ඔයාගේ යාලුවව අතෑරලා දන්නද.."

"මන් දන්නෑ අහසී.. මට ඌව පේන්න බෑ දැන්.. මගේ යාලුවා නිසා මන් පොඩ්ඩක් හොයලා බලන්නම්.. ඒත් මං සුදූගේ ජීවිතේට නම් ආයෙ එන්න තියන්නෑ ඌට... "

"බබා ඔයාට පිස්. ........"

අහසි අක්කි මොනාදෝ කියන්න යද්දීම මං කෝල් එක කට් කරලා දැම්මා... අයියා දන්නේ නැතුව ඇති කෝල් එක කට් වුනේ නෑ කියලා.. නැත්තම් කියටවත් අයියා මේ දේවල් මට ඇහෙන්න දෙන්නේ නෑ... කොන්ඩෙ ඇද ඇද කල්පනා කරේ මං මොනාද කරන්නේ කියලා.. එයාට අසනීපයි නම් බලාගන්න කවුරුත් නැතුව ඇති... අනිත් එක මං හැමතැනම බාර හාර වුනා.. එයාට හොදවෙලත් ඒවා ඔප්පු කරපු නැති නිසාද දන්නෑ මෙහෙම වෙන්නේ... එයත් එක්ක ගිහින් ඒවා ඔප්පු කරන්න වෙයි.. නැත්තම් එයාට තවත් කරදර වෙන්න පුලුවන්... අනිත් එක සෙනුදි නිතිනු අයියව කන්ට්‍රෝල් කරනවා.. එයාට මොනාහරි කරන්න බැරි නෑ... උත්සහ නොකර පරාජය බාරගන්න මට බැහැ.. මගේ ආදරේ වෙනුවෙන් මන් ශක්තිමත් වෙන්න ඕනේ....

හොද හුස්මක් අරන් මන් ඉක්මනට ලෑස්ති වෙලා අතට ගත්තේ නිතිනු අයියගේ ෆෝන් එක.. ඒකේ ගැලරි එකට ගිහින් බැලුවේ අපි දෙන්නගේ ෆොටෝස් ටික.. දස් ගානක් ෆොටෝස් තිබ්බා අපි දෙන්නගේ ඒවා.... හැමදම මන් එයාගේ ෆෝන් එක අරන් එක එක විකාර විදිහට ඉන්න ෆෝටෝස් ගත්තා ඒ දවස් වල.. ඒ ලස්සන මතකයන් මතක් වෙද්දී කදුලු වාවගන්න හරි අමාරුයි.. බොහොම අමාරුවෙන් කදුලු පාලනය කරන් මන් එලියට බැස්සා...

එදා අර මිනිස්සු කරදර කරන්න හැදුවට පස්සේ අද තමයි තනියෙන් මේ පාරේ යන්නේ මං.. හිතේ ලොකු බයක් තිබ්බත් නිතිනු අයියව බලන්න යන්න තියෙන උවමනාව ඊට වඩා ලොකු නිසා මං බය මගහැරව ගත්තා... ටවුන් එකට ඇවිත් මං අර ෆොටෝ වලින් පනහක් විතර සූම් කරලා ප්‍රින්ටවුට් ගත්තා... එයා මාව ඉබින බදාගෙන ඉන්න වගේ ඒවා ටිකක් තමයි මන් ගත්තේ...

ඒ ටිකත් අරන් මන් බස් එකේ කොලබට ඇවිත් පික්මී එකක් දාගත්තා එයාගෙ ගෙදරය යන්න.. නිතුනු අයියගේ ෆෝන් එකෙන් ගුනදාස මාමට කෝල් කරලා ඇඩ්‍රස් එක ඉල්ලගත්තා.. ගේ ලගින් බැගැලා මන් බෙල් එක ගහන්න යද්දීම ගුනදාස මාමා ගේට් එක ඇරියා....

"මං ඒත් හිතුවා ත්‍රීවිල් එකක් නතර කරද්දි චූටි නෝනේ වෙන්නැති කියලා.... චූටි නෝනෙ ආවේ හොද වෙලාවට.. උදේ ඉදන්ම චූටි මහත්තයා අමාරුවෙන් හිටියේ නෝනේ.. ඒත් අර සක්කරවට්ටම ඇහැක් ඇරලවත් බලන්නේ නෑ නොව.. බලූනඩියටත් ගහනවා මං බලාගෙන.. ඌ ඉන්නෙත් සාංකාවෙන් වගේ... "

ගුනදාස මාමටත් හිනාවෙලා මං ඉක්මන් ගමනින් ආවේ ගේ ඇතුලට.. අනේ මන් දැකපු ගමන් චූරි කොරගගහා මන් දිහාට දුවන් ආවා... සතුටට එයා මගේ ඇග උඩට කකුල් දෙක තියන් මුලු මූනම ලෙවකනවා කුක් කුක් ගාන ගමන්... චූරිව පොඩ්ඩක් වෙලා බදාගෙන ඉදලා මන්

නැගිට්ටේ නිතිනු අයියව බලන්න යන්න හිතන්.. ඒත් මට නැගිට්ටින්න නොදී චූෆී හය්යෙන් බුරනවා... එයා එක කකුලක් උස්ස උස්ස මට මොනාදෝ කියනවා.. එයා පෙන්නනේ කොර ගගහා ආපු කකුල.. පවු දෙය්යනේ රිදෙනවා කියලද කොහෙද මට කියන්නේ...

ඇස් වලට ආපු කඳුළුත් පියදන් මං එයාගේ කකුල අතගෑවා... ඒත් එක්කමයි උඩ තට්ටුවෙර් ඉඳන් කවුරු හරි කෑගහන් ආවේ...

"ආයෙත් පටන් ගත්තද ජරා සතා කෑගහන්න.. උදේ උබට දුන්න ඒවා මදි වෙලාද.. අම්මපා මං මරනවා උබව.. "

යක්ශාවේසෙන් කෑගගහා පහලට ආවේ සනුදි.. චූෆී කුක් කුක් ගගා මන් පිටිපස්සේ හැංගුනා.. මට පුදුම කේන්තියක් ආවේ එයත් එක්ක.. සතෙක්ටවත් සලකන්න දන්නැති පුදුම දුශ්ට ගෑනියෙක්..

"වට්ද හෙල්... තමුසේ මොකද මෙහෙ කරන්නේ... තමුසෙට කවුද අවසර දුන්නේ මෙහෙට එන්න.."

සනුදි අහන්නේ කේන්තියෙන් පුපුර පුපුර..

"මට මෙහෙට එන්න අවසර දුන්නේ මගේ නිතිනු අයියා.. ඒකත් හොද සිහියෙන් ඉන්නකොට.. තමුසෙටයි මෙහෙ ඉන්න අයිතියක් නැත්තේ.....

මේ ගෙදර මගෙයි නිතිනු අයියගෙයි.. "

"ඔහ් රියලි.. නිතිනුගෙන් ඇහුවනම් කියයි කාටද අයිතියක් නැත්තේ කියලා... මෙතන ජෝක් එකක් වෙන්නැතිව යනවා ඕය් යන්න... "

"නෑ මං යන්නේ නෑ... නිතිනු අයියා මගේ.. එයාට කරදරයක් වෙන්න මං ඉඩ තියන්නේ නෑ... මං දන්නවා තමුසේ එයා ලගට ආවේ එයාගෙන් පලිගන්න කියලා.... "

"ඔව් මං පලිගන්න තමයි ආවේ... මගේ බෝය්ෆ්‍රෙන්ඩ් හොස්පිට්ල් එකේ දුක් විදිද්දි.. මෙහෙ මූට නිදහසේ ඉන්න ඉඩදෙන්න කියලද මට කියන්නේ... සේරම දේවල් උදුරගන්නවා මං මූගෙන්.. මගේ වෙලාවට මතකෙ නැති වුනේ... දැන් මේ මෝඩයා මත් කියන කියන පදේට නටනවා.. පුලුවන් දෙයක් කරලා බලනවා.. තමුසේ මොනා කිව්වත් මගේ ඇහෙන් එක කදුලක් ආවොත් නිතිනු තමුසෙව මරලා දන්න වුනත් දෙපාරක් හිතන්නේ නෑ... "

වියරු හිනාවක් එක්ක සනුදි මන් දිහා බලන් කියන්නේ... මට ඇතිවෙච්ච කේන්තිය වචනෙන් කියන්න බෑ... සනුදිගේ බෙල්ල මිරිකලා අල්ලගත්තේ කේන්තියෙන් වෙව්ල වෙව්ල..

"මොකක්ද තෝ කිව්වේ ආ... මං ඉන්නකම් එයාට මුකුත් වෙන්න ඉඩතියන්නේ නෑ මං.. මතක තියාගන්නවා නිතිනු අයියා ඇත්තටම ආදරේ කරන්නේ මට.. එයාට මතකේ

ආපු ගමන් තමුසෙට තමයි මැරුම් කන්න වෙන්නේ... ඒ නිසා දැන්මම යනවා එයාගෙන් ඈත් වෙලා.. නිතිනු අය්යාට මොනාහරි වුන වෙලාවට තමයි තමුසේ මේ ආරුගේ හැටි දැනගන්නේ... මරනවා මන් තෝව බැ&& "

"හහ්.. හිතනවද නිතිනුට මතකේ ආවත් තමුසේ ලගට එයි කියලා.... හීන දකින එක නවත්තනවා... නිතිනු ඒකාලේ ඉදන්ම මට ආදරේ කරේ... අවුරුදු 10 ක් විතර ඒ මෝඩයා මට පනයන්න ලව් කරා... එකපාරක් මන් අනෝෂ් එක්ක රූම් ගිහින් අහුවෙලත් මාව බාරගත්තා... මන් නැති නිසයි තමුන්ව තෝරගත්තේ.. ඒත් මගේ තැනට කිට්ටුවෙන්නවත් බෑ තමුන්ට.. මං වෙනුවෙන් තමුසෙව අතාරින්න එයා දෙපාරක් හිතන්නේ නෑ... අවුරුදු ගානක ආදරේ කර කෙනාට වඩා මාස දහයක්වත් ආදරේ නොකරපු තමුන්ව වටිනවා කියලා හිතන එකත් මෝඩකමක් ඕය්... "

සනුදිගෙ වචන හමුවේ මගේ ආත්මශක්තිය හීන වෙලා ගියා... එයා කියන කතාවේ ඇත්තක් නැත්තේ නෑ... නිතිනු අයියා එයා වෙනුවෙන් ජීවිතේ නැති කරගන්න පවා දෙපාරක් හිතුවෙ නෑ... එයා නිසා එයාට මානසික ලෙඩක් පවා හැදුනා.. ඉතින් එහෙම බලද්දි මට එයා ඒ තරම් ආදරේ කරාද කියන ප්‍රශ්නේ මට ආවේ... එයා නැතිවෙයිද කියන බය දැනුනා මට මොහොතකට.. සනුදි ගේ බෙල්ලේ තිබ්බ අත බිමට වැටුනේ මටත් නොදැනීම

"නිකන් හිතලා බලනවා... නිතිනුගේ මතකේ මාව දන්න කොටස විතරක් ඉතිරි වුනේ ඇයි... මොකද එයාගේ මතකේ මං වැදගත් කොටසක් නිසා.. තමුන්ව අමතක වුනේ තමුන්ව එයාට වැදගත් නැති නිසා.. "

"නෑ එහෙම නෑ... "

මං බිම බලාගෙන කියාගත්තේ මටමයි.. ලොකු දුකක් දැනුනා මට.. බැරිවෙලාවත් එයා කියන දේ ඇත්තද..?? මාව වැදගත් නැති නිසාද එයාට අමතක වුනේ...

"නිතිනුට මාව අමතක කරන්න බෑ... මොකද අපි දෙන්නගේ සම්බන්දේ දුර දිග ගියපු එකක්... එයා මාත් එක්ක ලිමිට්ස් නැතුව ආදරේ කරේ.... එහෙම බලද්දි තමුසෙට එයා ආදරේ කරලා නෑ... තමුසේ ගැන එයාට තියෙන්නේ සහෝදරියක් ගැන තියනව වගේ හැඟීමක් විතරයි.. ඒකයි තමුන් එක්ක ලිමිට්ස් ඇතුව ආදරේ කරේ.... "

"ඔය බොරු නිතිනු අයියා මට කිව්වා ඔයත් එක්ක එහෙම හිටියේ නෑ කියලා.... එයා මත් ගාව එහෙම හිටියේ නැත්තේ මට ආදරේ නිසා.. එයා මාව පරිස්සම් කරා... තමුසේ බොරු කියන්නේ... "

මන් බිදිච්ච හඩින් අකුරි ගැලපුවේ..

"ඕහ් කමෝන් ස්වීට්හාට්.. නිතිනු අයියා ඔයාව ගොඩාක් රවට්ටලා.. අවුරුදු ගානක් එකම ගෙදර ඉදලා හෙල්ති පිරිමියෙක් නිකන් ඉදියි කියලා ඔයා හිතනවද.. නැත්තම් ඔයා පිලිගන්නවද එයා අර ජාතියේ කෙනෙක් කියලා.."

"කට වහගන්නවා.. මගේ නිතිනු අයියා එහෙම නෑ... තමුසේ කොහොමද එයාට එහෙම කියන්නේ... "

එක අතකින් කදුලු පිහදගෙන් මන් ආයෙත් අල්ලගත්තේ සනුදිගේ බෙල්ලෙන්.. එයාව බිත්තියට හේත්තුකරද්දිම එයා කැහැ කැහැ බෙල්ල අල්ලගත්තේ මාවත් බය කරලා... බෙල්ලෙන් ඇල්ලුවාට මං හිර කරලා ඇල්ලුවේ නෑ... මං ඇස් ලොකු කරන් බලන් ඉද්දි සනුදි බිම ඉදගෙන පපුව අල්ලන් මන් දිහා බැලුවේ කදුලු පුරෝගෙන..

"ඇයි මෙහෙම කරන්නේ... ඇයි මටයි නිතිනුටයි සතුටින් ඉන්න දෙන්නැත්තේ... පොඩිකාලේ ඉදන්ම මගේ නිතිනු වින්දේ දුක් විතරමයි.. මං ගාව විතරයි එයා සතුටින් හිටියේ.. සල්ලි වෙනුවෙන් ඔයාලට මෙච්චර නපුරු වෙන්න පුලුවන් ද... අනේ ප්ලීස් මට මොනා කරත් කමක් නෑ මගේ නිතිනුට මුකුත් කරන්න එපා... මං මං ඕනේ තරම් සල්ලි දෙන්නම්.... ප්ලීස් ප්ලිඋස් මං වැදලා කියන්නම් මගේ නිතිනුට මොනවත් කරන්න එපා"

සනුදි මගේ කකුල් දෙක අල්ලන් කියද්දි මන් ගල් වෙලා හිටියේ කිසිම දෙයක් තේරුම් ගන්න බැරුව..

එත් වෙච්ච දේවල් මට තේරුම් ගියා නිතිනු අයියගේ ලොකු අත මගේ කම්මුල හරහා යනකොට.. කම්මුල් පාරේ සැරට මං බිම ඇදන් වැටුනා.. මගේ මූනටත් වඩා ලොකු ඒ අතින් පහරක් වැදුනාම එහෙම උනේ නැත්තන් නේ පුදුමේ... කඳුලු බේරෙන ඇස් වලින් මත් බැලුවේ එයා දිහා... කේන්තියෙන් රතුවෙලා ඒ ඇස්.. මට හයියෙන් හුලගවත් වැදෙනවට බය එයා කවදාවත් මෙහෙම රිද්දයි කියලා මත් හිතුවේ නෑ...

රිදුම් දෙන කම්මුලත් අල්ලන් මත් හෙමීට නැගිට්ටා එතනින්.. චූටි බය වෙලා මත් ලගට ඇවිත් මූන ලෙව කනවා... එයා නිතිනු අය්යට බුරනවත් එක්ක.. නිතිනු අය්යා මත් දිහා බැල්මක්වත් නොහෙලා ගියේ සනුදි ලගට එයාව තුරුලට අරන් මුලු මූනම ඉම්බා මං ඉස්සරහ...

"සනුදි මැතික ඔයාට රිදුනද.. අපි අපි හොස්පිට්ල් යමුද... හුස්ම ගන්න අමාරුද ඔයාට.. බලන්නකෝ මත් දිහා... ශ් ශ් අඩන්න එපා... "

කම්මුල් පාරට වඩා සියදහස් වතාවක් රිදුනා මට.. කෑගහලා කියන්න හිතුනා ඒ වචන , ඒ පපුව අයිති මට කියලා.. ඒත් මත් දරාගත්තා.. කෑගහලා අඩන්න ඕනෙ උනත් වැටෙන කඳුලුත් පියදගෙන මං නිහඩ වුනා.. මං හිටියේ දරාගන්න පුලුවන් අන්තෙටම දරාගෙන.. තවත් අඩන්න මට ශක්තියක් මට නෑ...

නිතිනු අයියගෙ උරහිසෙන් මූන තියන් මං දිහා සරදම් හිනා නගන සනුදි දිහා නොබලා බෑග් එකෙන් ගත්තා ප්‍රින්ටවුට් ටික..

"මන් පොලිසියට කතා කරන්න කලින් මේ ගෙදරින් එලියට..."

ගේ දෙදරන්න තරම් හය්යෙන් කෑ ගැහුවේ නිතුනු අයියා.. ආදරනීය වචන විතරක් පිටවෙච්ච ඒ දෙතොල් මං ඉස්සරහ රලු වෙලා.. ඒ අත වගේම.. තරහක් වයිරයක් දැනුනේ නෑ මට.. ආදරේ කරපු හිතෙන් වයිර කරන්න මං දන්නේ නෑ...

කම්මුලේ තිබ්බ අත ගන්නකොට ඒ ඇස් ගැස්සුනා මන් දැක්කා.. සමහරවිට කම්මුලේ පාර හිටලා ඇති.... තොලත් පැලිලද කොහෙද කට ලේ රහයි.. මං එයා දිහා බලලා ලාවට හිනාවෙලා ප්‍රින්ටවුට් ටික එයාට දික් කරා...

"දන්නවා සමහරවිට මේවා විශ්වාස කරන එකක් නෑ... ඒත් මගේ බොලද හිත කිව්වා ඔයාට මේවා පෙන්නන්න කියලා.. තාමත් හිත පිලිගන්නේ නෑ ඔයාට මාව අමතකයි කියලා.... මොනාකරන්නද තේද... මේ අපේ මතක වලින් කොටසක් විතරයි.. මේ ෆෝන් එකෙත් දස් ගානක් තියනවා අපේ මතක.. විශ්වාස නැත්තම් ඒවගේ ඩේට් එහෙම බලන්න... ඔයා චිත්‍ර අදින කාමරේට ගිහින් බලන්න ඒකේ ගොඩක් තියනවා මගේ චිත්‍ර.. එතකොට ඔයාගේ

කම්පෙනි එකේ උඩ තට්ටුවේ ගෙදරත් මගේ චිත්‍රයක් තියෙනවා... "

"මං ඔයා වෙනුවෙන් හැමතැනම බාරහාර වුනා.. ඒවාගේ ලිස්ට් එකකුත් මෙතන තියෙනවා... ඒවා ඔප්පු කරන්න නැත්තම් ඔයාට කරදරයක් වෙන්න පුලුවන්... ඔයාවත් එක්කන් ඇවිත් ඔප්පු කරනවා කියලා බාර වුනේ... ඒ නිසා මට ඒක කරන්න බෑ... තනියම හරි ගිහින් ඒවා ඔප්පු කරන්න..

"ගැහුවට මන් තරහ නෑ... මගේ නිතිනු අයියා මට හය්යෙන් හුලගක්වත් වදින්න නොදී මාව බලාගත්තේ... ඒ ඔයා නෙවෙයි කියලා මන් දන්නවා.. මගේ නිතිනු අයියට තාම සිහිය ඇවිත් නෑ... සිහිය ආවම මගේ නිතිනු අයියට කියන්න කැමති නම් මං ගාවට එන්න කියලා.. සනුදි අක්කව නම් ඕනේ එයා එක්ක හිටියත් මං තරහ නෑ කියන්න.. ආපහු එයා දලා ගියත් කමක් නෑ මං ගාවට එන්න කියන්න.. කවදාවත් මං එයාට වයිර කරන්නේ නෑ... මං වයිර කරන්න දන්නේ නෑ... ජීවිත කාලෙම මන් බලන් ඉන්නවා... හැමදාටම ආදරෙයි මං.. සතුටින් ඉන්න.."

අන්තිම වතාවට එයාගේ අතෙන් අල්ලලා ප්‍රින්ටවුට් ටික. දීලා ගෙදරින් එලියට ආවේ වූෆිවත් අරන්මයි.. මොන හේතුවකටද්දේ ඒකට නිතිනු අයියා විරුද්ද උනේ නෑ... මල මිනියක් වගේ ඔහේ එලියට බැස්සා මං ගේට් එකෙන්.. ගුනදාස මාමා මොනාද්දේ කිව්වත් මට ඒවා ඇහුනේ නෑ...

ජීවිතේම එපා වෙලා මං හිටියේ... ඒත් අම්මයි තාත්තියි අයියයි ඉන්න්වා මට.. කවුරු නැති වුනත් මගේ පවුල බලන් ඉන්නවා මං එනකන්.. ඉතින් ඒ අහිංසක හිත් වලට තවත් ගිනි දෙන්න බෑ මට...

අරමුනක් නැතුව පාර මැද ඔහේ අඩිය තියද්දි වේගෙන් ආපු කාර් එකක් දැකලා මං ඇස් දෙකයි කන් දෙකයි වහන් ඉදගත්තේ බයවෙච්ච පාර....

## 41 කොටස

ඇස් පියාගෙන හිටියත් මාව වාහනේට හැප්පුනේ නෑ... වූෆ් වාහනේ පැත්තට පැන පැන බුරනවා... එකපාරටම වූෆ් බුරන එක නැවතුනත් මං ඇස් ඇරලා බැලුවේ නෑ...

"සුදූ... ඇයි නංගා මොකද උනේ.... "

මන් දිහාවට නැවිලා උරහිසෙන් අල්ලගෙන හිටියේ හේශාන් අයියා.. මං එයා දිහා බලද්දි මූන එකපාරටම වෙනස් වුනේ කම්මුල දැක්ක නිසා වෙන්න ඇති...

"මේ මොනා වෙලාද සුදූ... ලේ එනවා තොලෙනුත්..

මොක්කද වුනේ නංගා... මූනම ඉදිමිලා.. "

"නිතිනු අයියා ගැහුවා... "

මං එයා කිව්වේ හැඟීම් විරහිත බැල්මෙන් එයා දිහා බලාගෙන..

"මොකක්.. මෙ අපේ නිතිනු ගැහුවා... ඒකත් ඔයාට.. නෝ වේ.. ඌ එහෙම එකෙක් නෙවෙයි නේ.."

යන්තම් තොල් දෙක විතරක් ඇදලා මං එයාට හිනා වුනා.. සාදරනය් එයා එහෙම හිතන එක.. මට උනත් මේ හැටි මූන රිදෙන්නේ නැත්තම් කටට ලේ රහක් දැනෙන්නේ නැත්තම් මමත් හිතයි ඒක හීනයක් කියලා..

"ඒ මගෙ නිතිනු අයියා නෙවෙයි... වෙන කෙනෙක්.. "

මං හිනාවෙන්ම එහෙම කියද්දි හෙශාන් අය්යා මාව බදගත්තා.. එයාට දැනෙන්න ඇති මගේ වේදනාව.. ඉස්සර ඉදලා එයා එයාගෙම නංගියෙක්ට වගේ මට සැලකුවා...

"ඔව් සුදූ... ඒ ඔයාගේ නිතිනු නෙවෙයි වෙන කෙනෙක්.. දුක් වෙන්න එපා ඒ නිසා.. අපි ගෙදර යන්.. අයියා අරහේ බය වෙලා.."

එයා මගේ ඔලුව අතගගා කියනකොට ආයෙත් හීනාවුනා මං.. මේ ටික දවසට කදුලු හීනාවකට පෙරලන්න මං දක්ෂ වෙලා..

මාව කාර් එකේ ඉස්සරහින් ඉන්දවලා වූරිවත් පිටිපස්සෙන් දගෙන හෙශාන් අය්යා කාර් එක ස්ටාට් කරා... මං ශීට් එකේ පිටිපස්සට ඔලුව හේත්තු කරන් ඇස් පියාගත්තා...

"හෙලෝ... ආරාධ්‍ය... "

..................

"උබල එන්න ඕනේ නෑ... මට නංගිව හම්බුනා.... ගෙදර එක්කන් එන්නම් මං "

................

"ම්ම්ම් ආවම බලපන්කෝ... මං තියනවා... "

හේශාන් අයියට කතාකරන්න ඇත්තේ අයියා වෙන්න ඇති... සමහරවිට ගෙදර ගියාම එයා මට බනීවි.. කමක් නෑ නිතිනු අය්යා හොදින් කියලා මත් දැනගත්තනේ..

ගෙදර එනකොටත් අයියා ඉස්සරහට වෙලා බලන් හිටියා මත් කාර් එකෙන් බහිද්දිම අයියා දුවන් ආවා මත් ලගට.. මගේ කම්මුල දැක්කා විතරයි අයියගේ ඇස් රතු වුනා..

"මොකාද.. අරුැද තමුසෙට ගැහුවේ සුදූ... ඌට කොහෙන් ආපු හයියක්ද මගේ නංගිට ගහන්න.. මං ඕකව ඉවරයක් කරනවා.. බල්ලා.."

අයියා කේන්තියෙන් පුපුර පුපුර බයික් එක ලගට යද්දි හේශාන් අයියා එයාව අල්ලා ගත්තා... එයාලා මොනාදෝ කියනවා ඇහුනත් මං ඒවා ගනන් ගත්තේ නැතුව නිතිනු අය්යගේ කාමරේට ඇවිත් ඇදට වැටුනා.. ගතේ විඩාවයි හිතේ විඩාවයි දෙකම නිසාදෝ මට ඉක්මනටම නින්ද ගියා...

ඇගට දැනෙන දැඩි අපහසුතාවත් එක්ක මන් ඇස් ඇරියේ.. මං ගාවට වෙලා මගේ ඔලුව අතගගා හිටියේ අම්මා.. හවස නිදගත්ත පාර මන් ඇහැරුනේ උදේ කියලා මට තේරුනේ අම්මව දැක්කම.. බොහොම අමාරුවෙන් ඔලුව උස්සන් මන් අම්මගේ ඔඩොක්කුවෙන් ඔලුව තියාගත්තා... එයා රෙදි කෑල්ලක් තෙමලා මගේ මූන තවනවා.. සමහරවිට මය උන වෙන්න ඇති.... ඇගට අමාරුවක් දැනෙන්නෙත් ඒක වෙන්න ඇති.... තාත්ති අයියාට කෑ ගහනවා මට ඇහුනා... එයා බනිනවා මාව හරියට බලාගත්තේ නෑ කියලා..

"තාත්ති... "

මං හෙමින් කෙදිරුවේ අම්මගේ මූන බලාගෙන..

"ඇයි චූටි තාත්තිට කතාකරන්න ඕනෙද... "

මං හෙමීට ඔලුව වැනුවා... අම්මා තාත්තිට කතා කරපු ගමන් එයා කාමරේට ආවා...

"ඇය් මගේ දේනි.... "

මං අත දෙක දික් කරපු නිසා මාව ඒ ඔඩොක්කුවට අරන් එයා අහන්නේ.. මගේ මූන දිහා බලද්දි ඒ පිරිමි ඇස් වලට කඳුලු ඉනුවේ නිරායාසයෙන්මයි...

"අයියට බනින්න එපා... මං එයාට හොරෙන් ගියේ... "

මං තාත්ති දිහා බලන් වචන ගැලපුවේ අයියට බනිනවට මන් කැමති නැති නිසා.. ඇරත් තාත්ති එහෙම බනිද්දි අයියා එයාගේ පිට වැරැද්ද පටවන් හිතින් දුක් විදියි...

"ඇයි දේනි අයියට හොරෙන් එහෙම ගමනක් ගියේ... අපි ඔයාව මලක් වගේ හදුගත්තේ මේ විදිහට එක එකාගෙන් ගුටි කන්න නෙවෙයි... "

"මං මං එයාට ආදරෙයි තාත්ති.. එයාට කරදරයක් වෙයි කියලා බයට ගියේ... "

තාත්ති හොඳ හුස්මක් අරන් මන් දිහා බැලුවා...

"අපි ගමේ යන් දේනි... එහෙ ගිහින් හැමදේම නරක හීනයක් කියලා අමතක කරලා දමු... කවුරු නැතත් අම්මයි තාත්තයි අයියයි ඉන්නවනේ දූට.. අදම යන් අපි.. රේනු දේනිගේ බඩු ලේස්ති කරන්න අපි අදම ආපහු යමු.."

තාත්ති කියපු දේට මත් විරුද්ධ උනේ නෑ... මං හිටියේ හොදටම හෙම්බත් වෙලා.. මුකුත් නොකියා මත් තාත්තිගේ ඔඩොක්කුවෙන් ඔලුව තියන් ඇස් පියාගත්තා...

හවස් වෙලා අපි ලෑස්ති වුනේ ගමේ යන්න.. අම්මා ඇදුමක් තෝරලා මාවත් එක්කන් බාත්රූම් එකට ඇවිත් මාව තියලා යන්න ගියේ දොර ලොක් නොකර.. මට ලා මදහසක් ආවා... පොඩි දවස් වල වගේ දොර ලගට වෙලා ඉන්නවා ඇති එයා... අම්මලා එහෙමයිනේ.. දරුවන්ට පුන්චි ලෙඩක් හැදුනත් බය වෙනවා..

අහම්බෙන් මං මගේ මූන දැක්කේ... මූන රතුවෙලා තොල නිල් වෙලා ඒ පැත්තේ ඇහත් ඉදිමිලා.. පරන හිටපු ලස්සන ආරු වෙනුවට එතන හිටියේ විරූපි වෙච්ච ආරු කෙනෙක්.. ඒත් දුකක් දැනුනේ නෑ මට.. ඉස්සර වගේ රූපෙ ගැන උනන්දුවක් හිතට දැනුනේ නෑ...

මූන සෝදන්න බෑ දනවා.. ලාවට වතුර ටිකක් ගාගෙන මං අම්මා ගෙනල්ලා දුන්න ඇදුම ඇදගත්තා..

ගවුම ටිකක් වැඩිත් එක්ක මට.. මේ දවස් ටිකට කෙට්ටු වෙලා මං.. එළියට එද්දි අයියගේ අත මිට්වෙන හැටි මන් දැක්කා.. මගෙ මූන දකින වාරයක් පාසා එයාට කේන්ති යනවා... නොකිව්වට තාත්තියි එයයි ඉන්නේ නිතිනු අයිය ගැන ලොකු කේන්තියකින් කියලා මන් දන්නවා... අම්මා තමයි දෙන්නව කන්ට්‍රෝල් කරන් ඇත්තේ...

දින සති ගෙවිලා ගියේ මන් ගමට ඇවිත් මාස 3 ක් වෙලා.. මේ කාලෙ ඇතුලත ගොඩක් දේවල් වෙනස් වුනා.. අයියා නිතිනු අයියගේ කම්පැනි එකෙන් අයින් වෙලා එයාගෙම පොඩි බිස්නස් එකක් පටන් ගත්තා... ඒක එයා කාලෙක ඉදන් දැකපු හීනයක්.. කාර් එකක් ගන්න හිතන් එයා එකතු කරපු සල්ලි වලින් ඒක පටන් ගත්තේ... ඕපතින් එක දවසේ අම්මලාට අහසි අක්කිව මීට් උනා... දැක්ක ගමන් අම්මයි තාත්තියි එයාට කැමති උනා... ඒ ගැන මට ලොකු සතුටක් දැනුනා.. මගේ ආදරේ නැතත් අයියට එයාගේ ආදරේ ලැබුන එකට ඇත්තටම මන් සතුටු වුනා..

මේ මාස තුනටම නිතිනු කියන වචනේ අපේ ගෙදර තහනම් වචනයක් වෙලා... මන් කොච්චර හෙව්වත් නිතිනු අයියා ගැන කිසිම විස්තරයක් මට ලැබුනේ නෑ... අයියත් එක්ක හේශාන් අයියා හැම වීකෙන්ඩ් එකකම වගේ ගෙදර ආවත් හෙශාන් අයියවත් නිතිනු අය්යා ගැන කතා කරේ නෑ... මං ඒ ගැන අහද්දි එයා මාතෘකාව වෙනස් කරනවා..

ගෙදර අය ඉස්සරහ ඇඩුවේ නැති වුනාට හැම රෑකම මන් එයාගේ ෆොටෝස් බල බල හීල්ලුවා... එද වගේමයි තාමත් මගේ දුක පොඩ්ඩක්වත් අඩු උනේ නෑ... එයාගේ කිසිම තොරතුරක් දැනගන්න නැතුව මන් විදින දුක මං විතරයි දන්නේ.. ඒ නිසාමද්‍දෝ මාව කෙට්ටු වෙලා ඇදිලා ගිහින් තිබුනා... අම්මා කොච්චර එක එක ඒවා කැව්වත් මං මහත් වුනේ නම් නෑ... හිතේ ප්‍රශ්න වලට ඇගට බෙහෙත් දීලා වැඩක් නැහැනේ...

මිදුලේ බංකුවට වෙලා මං ඔහේ බලන් හිටියා... ගේට් එක ලගින් ඡායාවක් වගේ දැක්කත් මං හිතුවේ මගේ හිතේ ඇදිච්ච දෙයක් කියලා.. ඒත් එක්කම අම්මා ආවේ මගේ ෆෝන් එකත් අරන්... ෆෝන් එක රින්ග් වෙනවා.. ශනුගේ නම්බර් එක නිසා මන් ෆෝන් එක ආන්ස කරා...

"හෙලෝ ශනූ..."

"හෙලේ පැටියෝ මං අහසි අක්කි.. "

ශනුගේ නම්බර් එකෙන් අහසි අක්කා කතාකරපු නිසා මං ආයෙත් ෆෝන් එක දිහා බැලුවා...

"අහසි අක්කි.. ?? ඒත් මේ ශනුගේ නම්බර් එකෙන්..??"

"අනේ කට් කරන්න එපා පැටියෝ... ප්ලීස් මට ටිකක්

කතා කරන්න ඕනේ... "

"ඇයි එහෙම කියන්නේ අක්කි මන් මොකටද ඔයාගේ කෝල් එක කට් කරන්නේ... "

"මගේ නම්බර් එකත් බ්ලොක් කරලා නිසා මන් එහෙම කිව්වේ පැටියෝ... ඔයාට කෝල් එකක් ගන්න ඕනෙ නිසයි මන් ඔයාගේ බඩී හොයාගෙන ආවේ... "

"අනේ මං හිතල බ්ලොක් කරේ නෑ අක්කි ඉන්න මං බලන්නම්.."

"හරි පැටියෝ මාව අන්බ්ලොක් කරන්නකෝ.. මට ඔයත් එක්ක කතා කරන්න ඕනේ.... මේක නිතිනු අයියා ගැන දෙයක්.. "

"අක්කි මගේ නිතිනු අයියට මොකක් හරි ප්‍රශ්නයක් ද අනේ කියන්නකෝ... "

"බයවෙන්න එපා සුදූ... දැනට ලොකු ප්‍රශ්නයක් නෑ අයියා මට කෝල් එකක් ගන්නවා.. මං ඔයාට රෑට ගන්නම්... අයියට කියන්න එපා මං කෝල් කරා කියලා.. බායි.. බුදුසරනයි.."

"අක්කි ඒත්..."

මං මුකුත් කියන්නත් කලින් අහසි අක්කි කෝල් එක කට් කරා... හිතට ලොකු බයක් දැනුනා නිතිනු අයියට මොනාවත් වෙලාද දන්නෑ කියලා.. කලබලෙන් මං කන්ටැක් ලිස්ට් එකට ගිහින් බැලුවේ අහසි අක්කිගේ නම්බර් එක.. කිව්වත් වගේම ඒක බ්ලැක්ලිස්ට් වැටිලා.. මං එයාගේ නම්බර් එක බ්ලැක් ලිස්ට් එකෙන් අයින් කරේ කොහොමද ඒක බ්ලැක් ලිස්ට් වැටුනේ කියලා කල්පනා කර කර...

## 42 කොටස

රෑ වෙනකම් මං හිටියේ නොඉවසිල්ලෙන්.. බාතෲම් එකට ගියෙත් ෆෝන් එක අතේ තියන්.. අහසි අක්කා 9 ට විතර කෝල් එකක් ගද්දි මං දොරත් වහන් කාමරේට ආවා...

"හෙලෝ අක්කි මගේ නිතිනු අයියට කොහොමද දැන්.."

"මුලින්ම කලබල වෙන්නේ නැතුව ඉන්නකෝ පැටියෝ... ගෙදර කවුරුත් නැති තැනකට යන්නකෝ.. "

"මං කාමරේ ඉන්නේ අක්කි දොරත් වහලා තියන්නේ... අනේ කියන්නකෝ මගේ නිතිනු අයියට කොහොමද

කියලා.... "

"නිතිනුට මතකේ ආවා සුදූ... "

"මො... මොකක්..?? මගෙ නිතිනු අයියට මතකේ ආවා...?? එ.. එයා මාව ඇහුවද... ඇයි එයා මාව බලන්න ආවේ නැත්තේ..... එ.. එයාට මාව එපා කිව්වද අක්කි.. මට වඩා සනුදි අක්කා හොඳයිලුද.. ඒකද මාව හම්බෙන්න ආවේ නැත්තේ..... "

"ඔයා මොනාද කියන්නේ පැටියෝ... නිතිනු අයියට කීයටවත් ඔයාව එපා වෙන්නේ නෑ... එයා ඔයාට ගොඩක් ආදරෙයි නේ.."

"එහෙනම් එයා මාව හොයන් එන්න එපැයි අක්කි.. මාව බලන්නවත් ඕනේ උනේ නැද්ද එයාට.."

"නිතිනු අයියට ඔයාට මූන දෙන්න බැරුව ඉන්නේ සුදූ... එයා ගොඩක් පසුතැවෙනවා ඔයාට කරපුවට.. කොයි වෙලේ බැලුවත් ඩ්‍රින්ක්ස් අරන් අත කපා ගන්නවා.. ලේ එද්දි ඒවා දිහා බලන් හිනාවෙනවා... හිට ගන්නවත් පන නැතුව ඔයාගේ පේන්ටින් අඳිනවා.. කන්නේ බොන්නෙත් නෑ හරියට.. එයාට මොනාහරි වෙයි කියලා අපිට බයයි පැටියෝ... ඒකයි ඔයාට කතා කරේ.... ඔයාට විතරයි එයාව කන්ට්‍රෝල් කරගන්න පුලුවන්... "

"අනේ අක්කි.. ඇයි එච්චර දේවල් වෙනකම් මට කිව්වෙ නැත්තේ මට එයාව බලන්න ඕනේ.... "

"මං කියන්න උත්සහ කරා සුදූ... අයියා මට ඉඩදුන්නේ නෑ... මං හිතන්නේ ඔයාගේ ෆෝන් එකෙන් මගේ නම්බර් එක බ්ලොක් කරන්නත් ඇත්තේ අයියා තමයි... තවත් බලන් ඉන්න බැරි නිසයි ඔයාගේ යාලුවව හම්බෙන්න ගියේ... "

"මාව එක්කන් යන්නකෝ එයා ලගට... අනේ මට එයාව බලන්න ඕනේ.... ප්ලිස්.. ප්ලීස්... මන් බස් එකෙ එන්නද.. ඔයා මාව ගන්න එන්නකෝ.. මට එයාව බලන්න ඕනේ...."

"දැන් එන්න බෑනේ සුදූ... හෙට උදේට ඔයා ඔහෙන් බස් එකක නගින්න මන් ස්ටෑන්ඩ් එකෙන් ඔයාව ගන්න එන්නම්.. මට තනියම ඔච්චර දුර ඩ්‍රයිව් කරන්න බෑනේ... නැත්තම් මං ඔයාව ගන්න එනවා... "

"මං මං හෙට උදෙන්ම එනවා අක්කි.. අනේ එතකන් එයාව බලාගන්න ප්ලීස්... "

"බය වෙන්න එපා සුදූ... හේශාන් අයියා එයා ගාව ඉන්නවා... "

"හරි අක්කි මං තියන්නම් අම්මා එනවද කොහෙද... "

අම්මා දෙරට තට්ටු කරපු නිසා මං ගිහින් දෙර ඇරියා.... එයා මට පලතුරු වගයක් කවලා කාමරෙන් යන්න ගියේ... ඇදට වැටුනට උදේ වෙනකම් මට නින්ද ගියේ නෑ... නිතිනු අය්යව මතක් වෙනවා.. මට බයයි එයා මොනාහරි කරගනියි කියලා.... සැරෙන් සැරේ ෆෝන් එකෙන් වෙලාව බල බල රෑ ගෙව්වේ...

අම්මයි තාත්තියි උදේට ස්කෝලෙට යන නිසා එයාලා ගියාට පස්සෙ මන් ඩෙනිමකුයි ටීශර්ට් එකකුයි ඇදන් ලෑස්ති වුනා.. ඩෙනිම හැලෙනවා දැන් ඒව හොදටම වැඩියි.. එ නිසා බෙල්ට් එකකුත් දලා හිරකරගත්තා.. අම්මලාගේ අල්මාරියෙන් සල්ලිත් අරන් මන් ආවේ පාරට..

මොනරාගලින් පානදුර බස් එකක නැග්ගා... යන්න ඕනේ කොලඹට උනත් මං කවදවත් කොලබින් බැහැලා නැති නිසා පානදුරේ බස් එකක නැග්ගේ.. ජීවිතේ පලවෙනි වතාවට බස් එකක මෙච්චර දුර තනියම යන්නේ.... ඒ නිසා ඉස්සරහම ශීට් එකෙන් වාඩි වුනා.. අහසි අක්කට කෝල් එකකුත් දීලා කිව්වා බස් එකට නැග්ගා කියලා.... එයාට ලොකේශන් එකත් ශෙයා කරාලා මං ජනේලෙට හේත්තු වෙලා බලන් හිටියා අපිට පහුවෙන ගස් කොලන් දිහා...

නිතිනු අය්යව බලනකම් හිතට ඉවසිල්ලක් නෑ... සමහරවිට මාව දැක්ක ගමන් බදගනියි.. මාව ඉබියි.. අනේ ඒ ලස්සන ආදරේ ආයෙත් මටම හම්බෙයිද..

සිතුවිලි ගොඩක් මැද්දේ හිරවෙලා මන් පානදුරට එනකම් ආවේ... අඩුම ගානේ බඩගින්නක්වත් දැනුනේ නෑ... උදේ කිරි එක බිව්වට පස්සේ කිසිම දෙයක් බඩට වැටිලා තිබ්බේ නැති වුනත් මට ඒ ගැන වගක් තිබ්බේ නෑ...

හවස් වෙලා මන් බස් එකෙන් බහිද්දි අහසි අක්කි මාව ගන්න ඇවිත් තිබුනා... එයාගේ කාර් එකට නැගලා අපි ආවේ නිතිනු අයියගේ ගෙදරට... කාර් එකෙන් බැස්ස ගමන් මං ගේ ඇතුලට දිව්වා... නිතිනු අයියගේ කාමරේ බැලුවත් එයා ඒකේ හිටියේ නෑ... එයා පේන්ටින්ග් කරන කාමරේ පැත්තට ආවේ ඒ කාමරේ දිහාවෙන් හේශාන් අයියා කෑ ගහනවා ඇහිච්ච නිසා..

"නිතිනු ඕක නවත්තපන්... මොන මගුලක්ද ඔය කරන්නේ... පිස්සෙක් වගේ වැඩ කරන්න එපා යකෝ.. "

"මේ අතින්... මේ අතින් මගේ අහිංසකීට ගැහුවේ බන් මං.. කොහොමද මන් ඒ අත හොදින් තියන් ඉන්නේ... මන් විදවන්න ඕනේ ඒ කරපුවට.. මෙ අතින් ලේ ගලද්දී තමයි මට සතුටු හිතෙන්නේ.... "

"විකාර කරන්න එපා හු$$ උබේ ඔය අතින් ලේ ගියා කියලා වෙච්ච දේවල් නවත්තන්න බෑනේ... "

හේශාන් අයියා කෑහහන සද්දෙට ඒ කාමරේ ලගට ගියත් මගේ කකුල් පන නැති වුනේ මන් දැක්ක දේ නිසා..

නිතිනු අයියා එයාගේ අත කපාගෙන ලේ වැටෙන දිහා හිනාවෙවී බලන් ඉන්නවා... තවත් කපාගන්න යද්දී හේෂාන් අයියා එයාව නවත්තන්න හදනවා...

මං ඇතුලට යන්න හැදුවත් අහසි අක්කි මගේ අතින් අල්ලන් ඇස් වලින් ඉගිකලේ එයා කරන දේවල් බලන් ඉන්න කියලා....

"උබ හැමවෙලාවෙම අත කපා කපා හිටියට වැඩක් නෑ... ගිහින් කෙල්ලගෙන් සමාව ගනින්... කොච්චර කල් උබලා දෙන්නා දෙපැත්තට වෙලා දුක් විදින්නද.. අර කෙල්ල හැමවෙලාවෙම හූල්ල හූල්ල ඔහේ ඉන්නවා... ගිහින් ඒකිට කතා කරපන්.."

"බෑ හේෂාන් මට ඒක කරන්න බෑ... මං කොහොමද මං කොහොමද මගේ කෙල්ලට මූන දෙන්නෙ.. මගේ මැනික මලක් වගේ... ඉස්සර හැමදම මං ඒ මූන අතගානවා... මල් පෙත්තක් වගේ සිනිදුයි එයාගේ කම්මුල්.. ඒ කම්මුලට මං තිරිසනෙක් වගේ ගැහුවා... කොච්චර රිදෙන්න ඇද්ද මගේ චූටි කෙල්ලට... විසිවෙලා බිම වැටුනා.. ඒ චූටි තොල් වලින් ලේ ආවා... මං දිහා බලන් හිටපු හැටි දැනටත් මට මැවිලා පේනවා... ඒ ඇස් මට කිව්වා අනේ නිතිනු අය්යේ මට රිදෙනවා කියලා.... ඒත් මං මං අර ජරා ගෑනිව ගිහින් බදගත්තා.. මතක් වෙද්දී මට මැරෙන්න හිතෙනවා බන්... මට මැරෙන්න හිතෙනවා... ඒ ඇස් මතක් වෙද්දී මට දරාගන්න බෑ බන්...

හදවත කෑලි කෑලි වලට වෙන් වෙනවා වගේ රිදෙනවා.... එච්චර දෙයක් කරලත් මං කොහොමද එයාගේ මූන බලන්නේ.. මට බෑ ඒක කරන්න.. "

"එහෙම කියලා උඹ හැමදම මෙහෙම ඉන්නද.. නංගි ඕවා හිතන්නෑ.. එයාට ඕනේ උඹව.. ඒ හැමදේටම සමාව දෙයි ඒකි.."

"හහ්.. මගුලේ සමාව.. මට සමාව ඕනේ නෑ... මං වගේ එකෙක්ට සමාව ලැබෙන්න හොද නෑ... මං මහ බල්ලෙක්.... මං මගෙ මැනිකට මොනාද නොකිව්වේ.. ඒ හුරතල් මූන දිහා බලන් ප්‍රොස්ටිටියුට් කෙනෙක් වගේ කියලත් කිව්වා.... ආරාධ්‍ය කිව්වා වගේ එයා එයා.. ඒකේ තේරුමවත් දැනන් ඉන්න නැතුව ඇති බන්... මං කොහොමද එහෙම කිව්වේ... ඒ චූටි කෙල්ල මට ඒ වගේ පෙනුනේ කොහොමද බන්... මට මාව අප්පිරියයි... මගේ පොඩ් එකී හාට් බීට් එක මට දැනෙන්න එහෙම කරේ.... මං.. ශිට්.. මං එයාව තල්ලු කරලා අර වගේ ජරා කතාවක් කිව්වේ...

"ආරාධ්‍ය මට ගැහුවා මදි.. ඌට තිබ්බේ මාව මරලා දන්න.. මට මැරෙන්න ඕනේ බන්... ඒත් මට මැරෙන්න බෑ... මං ආරුට පොරොන්දු වුනා මගේ ජීවිතේට හානියක් කරගන්නේ නෑ කියලා... ඇය් මං එහෙම පොරොන්දුවක් උනේ.... මට මැරෙන්න ඕනේ.... මට මෙහෙම ජීවත් වෙන්න බෑ... හැම තත්පරේම මගේ මැනිකගේ මතක මාව

පුව්චනවා..ආඅ ආආ.. ඇයි මං එද මැරිලා ගියේ නැත්තේ..... "

නිතිනු අයියා බිම ඉදගෙන බිත්තියට ඔළුව හේත්තු කරන් අඩනවා.... මෙච්චර කල් හිර කරන් ඉදපු මගේ කදුළුත් ඔහේ ගලන් ගියේ නිදහස ලැබුන සතුටට වගේ... නිතිනු අයියගේ කදුලු මට හැමදේකටම වඩා රිදුනා... ඒ නිසා මං කාමරේ ඇතුලට යන්න හැදුවත් අහසි අක්කි තාමත් මගේ අතින් අල්ලන්..

"එයාගේ හිතේ තියෙන දුක සම්පූර්ණයෙන්ම අහලා ඉන්න පැටියෝ... ඒ හැම වචනෙකම තියෙන්නේ ඔයාට තියෙන ආදරේ.."

අහසි අක්කා කිව්වේ රහසින් වගේ... ඒත් මට තවත් එයා දිහා බලන් ඉන්න බෑ... මට ඕනේ උනේ එයාගේ විසල් පපුවට තුරුල් වෙලා හිතේ තියෙන වේදනාව ඉවරයක් වෙනකම් අඩන්න..

"මට එයා ලගට යන්න ඕනේ.... අඩලා වැඩි වෙලා එයාට මොනාහරි වෙයි.. "

"දැන් මාසයක් විතර එයා ඔහොම අඩන්නේ සුදූ... ඒ නිසා බයවෙන්න එපා... "

මං අහසි අක්කා දිහා බලන් හිටියේ ඇස් ලොකු කරන්..

ඒ කියන්නේ එයාට මතකේ ලැබිලා මාසයකුත් ගිහිල්ලද..

"තිතිනු ඔය අඩන එක නවත්තපන්.. විකාර නැතුව ගිහින් කෙල්ලට කතා කරපන්.. ආරාධ්‍යට වැදලා හරි නංගිව ඉල්ල ගමු.. "

"ඕන්නෑ බන්... මං වගේ පව්කාරයෙක් නිසා ඒ පොඩ් එකී විදවන්න ඕනේ නෑ... එයාට මාව ගැලපෙන්නෑ.. ජීවිතේ සතුටම විතරක් විදපු කෙල්ල මේ මාස ගානට ඕනෙවටත් වඩා දුක් වින්ද... මගේ කෙල්ල ඇදිලා ගිහින් බන්... මගේ සුදු බෝලේ දැන් හොදටම කෙට්ටුවෙලා... පිරිලා තිබ්බ කම්මුල් මූනටම ඇලිලා.. ඉස්සර හිටපු දගකාරි නෑ දැන්.. ඒ ඔක්කොටම වග කියන්න ඕනේ මං.. ආයෙමත් මං ගාවට ආවත් එයා විදවයි.. මං වෙනුවට මගේ මැනිකව බලා ගනිත්... මත් දන්නවා..... මත් ද....ත්...න.. වා. උ..බ. ම...ගේ. මැ..නි..ක...ට. දු... ක...ක්. නො... දී. බ...ලා...ගනි..යි.. "

එයා අන්තිමට කියපු දේ නිසා මං විතරක් නෙවෙයි හේශාන් අයියත් ගැස්සුනා.. අඩන එකත් නවත්තලා මත් එයා දිහා බලන් හිටියේ ඒ කිව්ව දේ තේරුම දැනගන්න...

"මොන හු&&@ද් බන් දෙඩවන්නේ... උබට මොන්ගල් ද..?"

"මන් දන්නවා හේශාන් උබ ආරුට ආදරෙයි කියලා.... ඒ කාලේ එක දවසක් ආරාධ්‍ය ගේ ගෙදර ගියපු දවසේ ඉදන් උබ ආරු ගැන කියෙව්වා.. ඔසී ගියපු දවස් වලට උබ වෙනම චොක්ලට් අරන් ආවා ආරාධ්‍යගේ නංගිට... ඒ දවස් වලමයි දැනගත්තේ උබ ආරුට කැමතියි කියලා...."

ඔලුව උඩ හෙනයක් පිපිරුවා වගේ මට දැනුනේ.. ඒ කියන්නේ හේශාන් අයියා මට ආදරේ කරලද.. ඒකද ඒ දවස් වල ඉදන් එහෙම සැලකුවේ..

"අනේ පලයන් යන්න නිකම් වෙස්සන්තර නොවී... තොට පුලුවන් ද නංගි නැතුව ඉන්න..ආ උබට පුලුවන් ද මං සුදුව බදගෙන ඉබිනවා බලන්න.. කවදහරි ඒකිගෙයි මගෙයි වෙඩින් එකට එන්න... ලමයි බලන්න එන්න උබට පුලුවන් ද.. මට කියපන් සුදූ එක්ක මං ඉන්නවා උබට බලන් ඉන්න පුලුවන් ද"

"සු... දූ. කි.. ය..න්න එ..පා.."

නිතිනු අයියගේ වචන වලට මට වගේම අහසි අක්කිටයි හේශාන් අයියටයි තුන් දෙනාටම හිනා ගියා... මං කදුලු අතරින් හිනාවුනේ ඉස්සර එයා අයියටත් ඉරිසියා කරපු හැටි මතක් වෙලා..

"උබේ අප්පගේ ලොජික් ඒවා.... මට කෙල්ලව බාරගන්නලු... ඒත් ඒකිට සුදූ කියන එකටත් උබට

ඉරිසියයි.. නංගිව අමතක කරන්න පුලුවන් නිසාද යකෝ ඊයෙත් පිස්සෙක් වගේ දවසම අරුන්ගේ ගේ ඉස්සරහ පැල් රැකන් හිටියේ... විකාර නවත්තපන් බන්... හැමදාම උබේ අඳෝනාව අහලා මට දැන් ඇති වෙලා... අර කෙල්ල ගැන හිතලවත් ඒකිව හම්බෙන්න පලයන්.."

හේශාන් අයියා කියද්දි මට මතක් වුනේ ඊයේ ගේට් එක ලග දැකපු චායාව... ඒ කියන්නේ නිතිනු අයියා මාව බලන්න ඇවිත්.. මූනට හිනාවක් ආවේ දැනුන සතුටට..

"මං මැරෙනකම් මට එයාව අමතක කරන්න බෑ බන්... මං පිස්සෙක් වගේ ආදරය කරනවා එයාට... අම්මිගේ ආදරේ වගේ බන් මගේ මැනිකගේ ආදරේ.. ඉතින් කොහොමද අමතක කරන්න හිතන්නෙවත්.. ඒත් එයාගේ සතුට වෙනුවෙන් එයාව අතාරින්න පුලුවන් මට.. ලගට වෙලා අඩනවා බලන් ඉන්නවට වඩා දුර ඉදන් හිනාවෙන එක මට සතුටක්... මගේ මැනික හැමදාම සතුටින් ඉන්න ඕනේ.... මට පුලුවන් එයාගේ මතක එක්ක ජීවත් වෙන්න... ලස්සන මතක ගොඩාක් එයා මට දුන්නා.... මගේ පව්කාරකම් වලට අහුවෙලා ඒ අහිංසකී දුක් විදින්න්............."

නිතිනු අයියට කියන්න ගියපු දේ සම්පූර්න කරගන්න බැරි වුනේ මගෙන් ලැබ්ච්ච කම්මුල් පාර නිසා.. දුකයි කේන්තියයි දෙකම පාලනය කරගන්න බැරුව ඇස් වලින් කදුලු ආවේ...

මං එයා ගාව දනගාගෙන එයාගේ පපුවට ගගහා කෑ ගැහුවා...

"මාව දන් දෙන්න... මාව දන් දෙන්න ද ඕනේ.... ආ.. මෝඩයා... බූරුවා.. මාව දෙන්න පුලුවන් ද වෙන කෙනෙක්ට.. කියනවා.. දෙන්න පුලුවන් ද මාව... ඒකටද මං මෙච්චර දවස් මං බලන් හිටියේ... මතකේ ආපු ගමන් මාව හොයන් එයි කියලා හිතුවේ මන්.. ඇවිත් මාව තුරුල් කරගෙන චූටි මැනික කිය කිය මාව ඉබියි කියලා මං හිතුවේ... ඒත් ඒත් මං හිතුවා වැරදියි.. ඔයාට මාව එපා... කියනවා මාව එපාද?? ඉහි ඉහි ඉහි... ඔයාට මාව එපාද අයියේ.."

"මැ.... මැනික ඔ..යා..."

## 43 කොටස

"මැ.....නි...ක... මගේ චූටි මැනික... මාව හොයන් ආවද මගේ බබා.. හේශාන් ආරු මෙතන ඉන්නවාඅ නේද ම මේ හීනයක් නෙවෙයි නේද දකින්නේ.. "

"ඔව් ඔව් ඔය ඉන්නේ උබේ කිරි කෑල්ල තමයි දැන්වත් දෙය්යන්ගේ නාමෙන් මට කනක් ඇහිලා ඉන්න දීපන්.."

හේශාන් අයියා කියලා ඉවර කරන්නත් කලින් මාව ඇදිලා ගියේ නිතිනු අයියගේ ඔඩොක්කුවට... මාගේ මූන දේතින් අරන් විනාඩි ගානක් කිස් කරගෙන ගියා... ඒත් නැවතුමක් නෑ මාව ඒ පපුවට හිර කරන් වම් කම්මුල පුරා දෙතොල් තවරනවා... චුට්ටක් නැවතිලා මගේ මූන පුරාම අතගාලා ආයෙමත් මාව ඉබිනවා...

"ආයෙත් මාව දලා යන්න එපා...හ්... මට ඔයා නැතුව ඉන්න බෑ... ඉහි ඉහි.. කොහොමද හිතුවේ ඔයා නැතුව හිනාවෙන්න පුලුවන් කියලා.... මෝඩයා... මෝඩයා... මන් තරහයි"

"අනේ මැනික අඩන්න එපා වස්තුවේ... ඔය කදුලු ඇසිඩ් වගේ මාව පිච්චනවා... දලා යන්නෑ මන්... දැන්නනම් කීයටවත් දෙන්නෑ කාටවත්... මගේ චූටි අම්මි... "

කදුලු බෙරෙන ඇස් වලින් මන් දිහා බලාගෙන එයා එහෙම කියලා මාවා බිත්තියට හේත්තු කරගත්තා... එයාගේ දෙතොල් එයාගේ තොල් වලින් අල්ලගන්න යද්දීමයි හේශාන් අයියා කෑ ගැහුවේ..

"හෝ හෝ හෝ පොඩ්ඩක් ඉදපන්..."

නිතිනු අයියා හේශාන් අයියා දිහා ඔරවලා බැලුවා.....

"ඕනෙ මගුලක් කරගනින් වෙන තැනකට ගිහින්... පේන්නැද්ද ඔය වටේම තියෙන්නේ උබේ බූරු වැඩවල ප්‍රතිපල... උබට මොනා උනත් මට කමක් නෑ... ඔය කෙල්ලගේ ඇගේ බෝතල් කටු ඇනෙයි..."

හේශාන් අයියා කෑ ගහන්නේ බිම තියන බෝතල් කටු පෙන්නන ගමන්... එයා කියන්නේ ඇත්ත කාමරේ හැමතැනම බෝතල් කුඩු කරලා දලා... පිස්සන් කොටුවක් වගේ... හැමතැනම බඩු පොලේ ගහලා... තීන්ත විසි කරලා... ඒ විතරක් නෙවෙයි කාමරේ පුරාම මගේ චිත්‍ර.. ඒකත් එද එයා කම්මුලට ගහපු වෙලාවේ මන් අඩන ඒවා....

මං කාමරේ වටේට ඇස් කරකවද්දි නිතිනු අයියා මාව වඩාගත්තා හරි පරිස්සමට... හරියට පොඩි බබෙක්ව වඩා ගන්නවා වගේ... මාව අත් දෙකට ගනිද්දීම එයාගේ ඇස් වල කදුලු අලුත් උනා... මාව වඩාගෙන මගෙ බෙල්ල පාමුල මූන තියන් එයා ටික වෙලාවක් ඇඩුවා... ඊටපස්සේ සිවිලිම දිහා බලන් තොල් හපාගත්තේ කදුලු පාලනය කරගන්න වෙන්නැති... මගේ හිස් මුදුනෙන් හාදුවක් තියලා එයා කාමරෙන් එලියට එද්දි මං ඇස් පියාගෙන තව තවත් ඒ පපුවට ගුලි වුනා..

අහසි අක්කියි, හේශාන් අයියයි එතන හිටියද නැද්ද කියලවත් මං දන්නේනෑ.. කොටින්ම ඒ වෙලාවේ ලෝකේ පෙරලුනත් මං දන්නේ නැති වෙයි.. ඒ තරම් මං එයාගේ

රස්නෙට සුවදට මෝහනය වෙලා හිටියේ... මාස ගානක් පෙරුම් පිරුවා මං මේ පපුවට තුරුල් වෙන්න.. ඒ නිසාම මට දැනුනේ එයා ගැන අමුතුම තෘශ්නාවක්.. කාමරේට ගිහින් මාව ඇඳෙන් තියද්දි මගේ කට බෙරි වුනේ පොඩ්ඩක්වත් එයාගෙන් මිදෙන්න තිබුන ලෝබ කම නිසා.. කදුලු අතරින් පුංචි හිනාවක් ඇදුනා ඒ මූනේ මගේ බෙරිවෙච්ච කට දැකලා... ඒත් තප්පරෙන් ඒක මැකිලා ගියා...

මාව ඇදේ හාන්සි කරවලා එයා ඈත් වෙලා උඩ ඉදලා යටටම මන් දිහා බැලුවා... ඒ ඇස්වල තිබ්බේ පුදුම වේදනාවක්... බාගෙට පරිනාමය වෙච්ච මනුස්සයෙක් වගේ මූන පුරාම රැවුල... කොන්ඩෙත් උරහිස ලගට වැව්ලා...

"බර නෑ පොඩ්ඩක්වත්.. ඇයි මෙච්චර කෙට්ටු වුනේ මැනික... මං ඔයාය එච්චර දුකක් දුන්නද චූටි අම්මි... ඇයි මේ පව්කාරයට එච්චර ආදරේ කරේ.... මගේ මැනිකට මෙච්චර දුකක් දුන්නේ කොහොමද මන්... මගේ රෝස මල මැලව්ලා ගිහින්..."

මගේ පපුවට මූන තද කරන් එයා හයියෙන් අඩනවා.... මාව වඩාගත්ත වෙලාවේ එයා අඩන්න හේතුව තේරුනේ මට දැන්... මට එයාව සනසන්න තේරුනේ නෑ... මට ඕනෙ උනේ එයාට තුරුල් වෙලා අඩන්න.. ආයෙ ආයේ එයාට කියලා ආදරෙයි කියව ගන්න... මාව දාලා යන්නේ නෑ කියවගන්න...

"අයියෝ... ආයේ මාව දලා යන්නේ නෑ නේද... මේ තොල් මේ පපුව ඒවා මගේ නේද... ආයේ කාටවත් දෙන්න එපා... මට දුකයි එතකොට... මෙතන මෙතන හිරවෙනවා මගේ.."

මං අඩ අඩා පපුව අල්ලගෙන කියද්දි එයා මාව කිට් කිට්යේ තුරුල් කරගත්තා....

"නෑ... නෑ චූටි අම්මි... ආයේ කවදවත් කවදවත් මගේ මැනිකගේ දේවල් කාටවත් දෙන්නේ නෑ මං.. සමාවෙන්න මට.. මං මගේ මැනිකව රිද්දුවට.. ඇත් වෙන්න තමයි හැදුවේ.... ඒත් දැන්නම් බෑ... මට ලෝබයි... "

ටික වෙලාවක් මාව තුරුල් කරන් ඉදලා එයා හෙමීට මගේ කම්මුල පිරිමැද්ද..

"රිදුනා නේද ගොඩක් මෙතන... ලේත් ආවා මගේ මැනිකගෙන්... සමාවෙන්න මැනික... මං සිහියෙන් හිටියනම් කීයටවත් එහෙම දෙයක් කරන්නේ...නෑ ශිට්.. මං මහ තිරිසනෙක්.. කොහොමද මගේ රෝස මලට මන් අත ඉස්සුවේ... "

"මට රිදුන්නෑ අයියේ.. දැන් ඒක අමතක කරන්න... එතන හිටියේ මගේ තිනු බබා නෙවෙයි නේ.. ඒ වෙන කෙනෙක්.. ඒ ඔයා නෙවෙයි.... මං දන්නවනේ ඔයා මට හුලගක්වත් වදිනවට බයයි කියලා.... "

"මං මෙච්චර දේවල් කරලත් තාමත් ඔහොම ආදරේ කරන්න එපා වස්තුවේ... මට දරාගන්න බෑ... "

එයා මගේ මූන අතගගා කියද්දි මං ඒ රෝස පාට තොල් දෙක මගේ තොල් වලින් අල්ලගත්තා... එයාගේ ඇග උඩට ඇවිත් රිදෙන්නම කිස් කරා මත්... ඒ දෙතොල් වරින් වර හැපුවේ සෙනුදිව කිස් කරපු තරහට... ඒ උඩුකය පුරාම මගේ දෑත් අරන් ගියේ සෙනුදි ට වඩා අයිතියක් මට තියෙනවා මගේ හිතටම තේරුම් කරන්න ඕනෙ වෙච්ච නිසා..

විනාඩිගානක් ඒ දෙතොල් වල පැටලිලා එයාගෙ පපුව අස්සේ මූන හංගගත්තා... ඒ රළු අත මගේ කෙහෙරැලි අතරේ සැරිසරද්දි මං තවත් ටිකක් හරී බරි ගැහිලා ඇස් දෙක පියාගත්තා...

"ඔහොම අයිතිය කියාපාන්න ඕනේ නෑ චූටි.... මාව අයිති ඔයාට විතරයි.. "

එයා එහෙම කියන්නේ බිදිච්ච හඩින්.. මක් මූකුත් නොකියා ඔලුව අතික් පැත්තට හරවලා අතික් කම්මුල ඒ පපුවෙන් තියාගත්තා...

"තිනූ.... මං දෙයක් අහන්නම් මට ඇත්තම කියනවද... "

"අහන්න මැතික... මං කවදවත් මගේ වස්තුවට බොරු කියන්නේ නෑ... "

"ඔයා සනුදි එක්ක අරම හිටියද... "

"අරම කිව්වේ පැටියෝ... ??"

"එයාව ඔයාගෙම කරගත්තද ඔයා..."

මං එහෙම අහද්දිම එයා මාව ඇදෙ පෙරලන් මූනට එබුනා....

"නෑ චූටි මැතික... මං කලිනුත් ඔයාට කිව්වනේ මන් එහෙම කෙනෙක් නෙවෙයි කියලා.... කිස් කරා ඇරෙන්න කිසි දෙයක් කරේ නෑ වස්තු.. ඔලුව අත තියලා දිව්රන්නම් මං.. "

"එයා.... එයා මට කිව්වා.... ඔයා එක්ක එහෙම හිටියා කියලා... මට දුක හිතුනා එයා එහෙම කිව්වම.. එයා නැතිවෙච්ච හින්දලූ මං ගාවට ආවේ... මන් එක්ක එහෙම හිටියේ නැත්තේ මට ආදරේ නැති හිනදලූ... එහෙම නෑ නේද... ඔයා මට ආදරෙයි නේද... මාව මැරි කරන නිසා නේද පරිස්සම් කරේ.... කියන්නකෝ එහෙම නේද... "

"ඔව් මැතික... මගේ කෙල්ලට පන වගෙ ආදරෙ නිසයි මන් පරිස්සම් කරේ.... ඔයා ගැන එහෙම හැඟීම් නැතුව

නෙවෙයි.... ඒත් මත් ඒවා පාලනය කරගත්තේ ආදරේ නිසා.. ඔයාගේ තොල් මත් ඉදුල් කරෙත් ගොඩක් ලෝබ කමින්... මගේ රෝස මල එහෙම තලලා දන්න ඕනේ උනේ නෑ මට.. අනික මත් සනුදිත් එක්කවත් එහෙම ඉදලා නෑ චූටි.... ඒ ගෑනි කියපු ඔක්කොම බොරු... ඒ නිසා ඒවා හිතන්න එපා... මත් මගේ චූටි මැනිකගේ විතරයි.. "

"අය්යේ...."

"ඇය් මැනික... "

"ඔයා.. බමුනෙක් වගේ... "

එයාගේ රැවුල අතගගා මත් කියද්දි ඒ වේදනාත්මක මූනේ පුන්චි හිනාවක් මැවුනා...

"මගේ ලස්සන බලන්න වයිෆ් ලග නැති නිසා පිලිවලට ඉන්න අමතක උනා මට.. "

මගේ නලලට හාදුවක් තියලා එයා මුමුනනවා.. මූනටම ලන් වෙලා නිසා එයාගේ දිග රැවුල මූනෙ ගෑවෙනවා...

"ගොඩක් බිව්වද ඔයා..."

ඒ මූන අතගගා ඇහුවේ මත් රහසින් වගේ... එයත් මට උත්තර දුන්නේ ඒ විදිහටමයි..

"පහුගිය ටිකේ නම් බිව්වා... අද හේශාන් හිටපු නිසා වැඩිය බොන්න දුන්නේ නෑ... බබා ලග නැතුව ඉන්න බෑ මට සිහියෙන්... මැරෙන්න හිතෙනවා... ඒකයි බිව්වේ.. සිගරට් ගෙනාවත් බිව්වේ නෑ පොරොන්දු වෙච්ච නිසා.. "

"මාව බලන්න ආවද ඔයා අපේ ගෙදර..."

"හ්ම්ම්ම්.... ඉවසන්නම බැරි වුනා.. ඒකයි ආවේ බලලා යන්න... බංකුව උඩ වාඩිවෙලා කල්පනා කර කර ඉද්දි තුරුලට අරන් ඉබගෙන ඉබගෙන යන්න හිතුනා... "

"ඇයි එහෙම කරේ නැත්තේ..... "

"එන්න කියලා ගේට් එක ලගටත් ආවා... ඒත් ඔයාව හරියටම දැක්කම තීරනය වෙනස් කරගත්තා... හිටියගෙන් බාගෙටත් වැඩිය කෙට්ටුවෙලා ඇස් කලුවෙලා මේ ලස්සන ඇස් දෙක රතුවෙලා තියනවා දැක්කම මං ආපහු හැරිලා ගියා... "

"ඇයි ඒ දැන් මන් කැත හින්දද.."

"මොනාද කියන්නේ වස්තු.. කොහොම හිටියත් ඔයාව මට සුරංගනාවියක් තරම් ලස්සනයි.. ඔයා එච්චර දුක් වින්දේ මං නිසා කියලා මතක් වුනාම මට මං ගැන කලකිරුනා... මං ගාව හිටියොත් හැමදම දුක්විදියි කියලා හිතුනා...

ඒකයි ආපහු ගියේ... "

"මෝඩයා... හපනෝ මන් කට ආයේ මාව කාට හරි දෙනවා කිව්වොත්.."

"ආයේ කියන්නෑ.. ඒත් කට හැපුවටනම් කමක් නෑ... "

"යනෝ යන්න නරියා.."

"ආදරෙයි මැනික... ඔය හුරතල් කතා නැතුව මන් හිටියේ පිස්සුවෙන් වගේ... "

ටික වෙලාවක් මගේ දෙතොල් සිපගෙන එයා මගේ පපුවෙන් ඔලුව තියාගත්තා... එයාව තවත් තුරුළු කරන් ඒ ඔලුව අතගෑවා මන්... ටික වෙලාවක් එහෙම හිටියත් මන් හිටියේ ගොඩක් අමාරුවෙන්... උදේ ඉදන් කිසිම දෙයක් කාලා නැතුව ඇගට කිසිම පනක් නෑ... ඒ මදිවට බඩ දැවිල්ලයි... දරාගන්න අමාරු නිසාද කොහෙද්දෝ නිතිනු අය්යගේ කොන්ඩ ගහක් හය්යෙන් ඇදුනා මන් අතින්

"ඇයි මැනික මේ... මූනත් මැලවිලා.. දඩියත් දලා... මොකක්ද ප්‍රශ්නේ... කියන්නකෝ.... "

නිතිනු අයියා මගේ මූන දිහාවට හැරිලා අහන්නේ.. මං ඔලුව දෙපැත්තට හෙලෙව්වා..

"මුකුත් නැති වෙන්න බෑනේ බබා.. මන් ඔයාව හොදට දන්නවා..... කියන්න මොකක්ද අමාරුව.. බය නොකර කියන්න වස්තු.. "

"බ... ඩ..ගි..නි..ය්.."

මං හෙමීට කොදුරද්දි එයා ඉද්ද ගැහුවා වගේ නැගිට්ටා.... ඇදෙන් නැගිටලා යන්න හදද්දිම මන් එයාගේ අතින් අල්ලගත්තා...

"කොහෙවත් යන්න එපා... මං ගාව ඉන්න.."

"මං පල්ලෙහාට ගිහින් කන්න දෙයක් අරන් දුවගෙන එන්නම් පැටියෝ... මට තත්පරයක් දෙන්න.."

"ම්හු.. බෑ යන්න එපා... "

මං කදුලු පුරෝගෙන එයාගේ අතේ එල්ලෙද්දි එයා මගේ ලගින් වාඩිවුනේ මාවත් තුරුල් කරන්..මගේ ෆෝන් එක අරන් එයා කාටද්‍දෝ කෝල් එකක් ගත්තා...

"හේශාන්.. කාමරේට කන්න මොනාහරි එවපන්කෝ.. කෙල්ලට බඩගිනියි ලු.. "

..................................

"මට ඕන්නෑ බන්.. මගේ කෙල්ල බඩගින්නේ..."

නිතිනු අයියා ෆෝන් එක කට් කරලා මාව ආයෙමත් හාන්සි කෙරෙව්වා...

"දවල්ට කෑවේ නැත්ද බබා.. "

එයා අහද්දි මන් දෙපැත්තට ඔලුව වැනුවා...

"උදේ කීයටද කෑවේ... "

මං මූන බිමට හරෝගත්තේ කියන්න දෙයක් නැති නිසය්..

"බබා... ?? කියන්න උදේට කෑවේ කීයටද..."

"උදේට කෑවේ නෑ... "

බෙල්ල පහත් කරන් මන් කිව්වේ ඇහෙන නෑහෙන ගානට.. ඒත් එක්කම මගේ මූන මැදිවුනේ එයාගේ අත්දෙකට...

"වට්... ඒ කියන්නේ උදේ ඉදන්ම නොකාද මේ ඉන්නේ... පොඩ්ඩක් ඉන්න.. ඔයා කොහොමද මෙහෙ ආවේ.. ආ ආරු.. තනියෙන්ද ආවේ... "

"බ...ස් එකේ ආවේ... "

මං ඇඟිලි දෙක පටලව පටලෝ ඉද්දි එයා මගේ නිකටින් අල්ලන් මන් දිහා බැලුවේ කේන්තියෙන් වගේ...

"පිස්සුද ආරූ.. අච්චර දුර තනියම බස් එකේ එන්න... අනික තනියම ඇවිත් තියනවද කවදාවත්.. උදේට කාලත් නෑ... කලන්තයක් වත් හැදුනනම් එහෙම මොකද කරන්නේ තනියෙන් ඉන්නකොට.. ආ.. එහෙම වෙලා මොකෙක්හරි උස්සන් ගියා නම් එහෙනම් මට මැරෙන්න තමයි වෙන්නේ..."

කවදාවත් නැතුව අද එයා මට සැරවුනා.. මං කට බෙරි කරන් එයා දිහා බලන් හිටියේ... ඇඩෙන්න වගේ මට..

"බනින්න එපා මට..."

මං ඇඩෙන්න වගේ කියද්දි එයා මාව තදට තුරුල් කරගත්තා....

"ආදරේටනේ බනින්නේ මැනික... ඔයාට මොනාහරි වුනා නම් එහෙම මට මගේ ජීවිතේම එපා වෙයි.. අම්මලාටත් හොරෙන් නේද ආවේ... දැන් එයාලත් බය වෙලා ඇති.... හිතුවක්කාර වෙන්න එපා ඔහොම.. ගුටි දෙනවා අයෙත් ඕවා කරොත්..."

"ඔයාව බලන්නනේ ආවේ ඉතිම්... තව බැන්නොත් මං අඩනවා.... "

"හරි හරි බනින්නෑ.. කෝ බලන්නකෝ මන් දිහා... ඔය ඉතින්.. බලන්නකෝ මැනික... ආදරේටනේ බැන්නේ.."

මං එයාගෙන් මූන හංගගෙන ඉද්දි සුමනම්මා ආවා කාමරේට...

"චූටි මහත්තයත් කන්න.. මේ ටිකේම හරියට කෑවේ නෑනෙ... "

සුමනම්මා යන්න ගියේ මගෙ ඔළුවත් අතගාගෙන... මං නිතිනු අයියා දිහා බලද්දි එයා මන් දිහා බැලුවා හොර වැඩක් කරලා අහුවෙච්ච් පොඩි ලමයෙක් වගේ... එයා මගෙන් ඇස් මුදවන් බත් එක ගත්තා අතට..... ලොකුම ලොකු බත් එකක් ඒක..

නිතිනු අයියගෙ අතින් මාස ගානකට පස්සේ ආසාවෙන් බත් කටක් කෑවා... මෙච්චර කල් කෑවේ මැරෙනවට.. ඒත් අදනම් සුමනම්මාගේ බත් එක මන් රස කර කර කෑවා... නිතිනු අය්යා හිනාවෙවී බලන් ඉන්නවා මන් කන දිහා... මට දික් කරපු බත් කට මං හැරෙව්වා එයාගේ පැත්තට... එයත් හිනා වෙවී ඒක කෑවා... කවලා ඉවරවෙලා අතික් අතින් මගේ කටත් පිහදලා එයා වොශ්රූම් එකෙන් අත හෝදන් ආවා... එයා ලගට ආපු ගමන් මන් පැන්නේ එයාගේ තුරුලට...

කාලා වැඩ් වෙච්ච නිසා දැන් මට ඕනේ හොඳ නින්දක් දාන්න එයා ගාවට වෙලා.. ඊයේ රෑත් හරියට නිදාගත්තේ නැති නිසාදෝ ලොකු නිදිමතක් තිබ්බේ මට..

"දෙය් මතයි.. ම්ම්ම්... "

මං එයාගේ පපුවට වෙලා එහාට මෙහාට හැරි හැරී කොඳුරද්දි එයා මාව ඉබ ඉබ හිනාවෙනවා...

"මොකෝ ඊයේ දෙයියෝ ගත්තේ නැද්ද මගේ කෙල්ල.."

"ම්හු.."

"අනේ ඇයි මැනික දෙයියෝ ගත්තේ නැත්තේ... "

"ඔයාව බලන්න ඕනෙ නිසා දෙයියෝ ගත්තේ නෑ... වෙලාව බල බල හිටියා උදේ වෙනකම්... "

එයා සුසුමක් හෙලලා මාව තදට තුරුල් කරන් දෙපැත්තට පැද්දුනා..

"මැනික.. වොශ් එකක් දාගන්නවද.. බස් එකේ දුර ඉදන්නේ ආවේ ම්ම්ම්... "

"බෑ... බෑ... මට මෙහෙම ඉන්න ඕනේ...."

"හම්මෝ හරි හරි ඔහොම ඉන්න... කෝ දෙයියගන්න.. මන් ඔලුව අතගාන්නම්.. "

එයාගේ පපුවට වෙලා මං සැනසීමෙන් ඇස් පියාගත්තා... දිව්‍ය විමානෙක නිදාගන්නවා වගේ සනීපයි එයා ගාව... සනීපෙට ඇස් පියාගත්ත ගමන්ම මට නින්ද ආවා...

හොදට නිදාගෙන හිටපු මගේ නින්ද කැඩුනේ තිතිනු අයියා කාත් එක්කදෝ කතා කරනවා ඇහිච්ච නිසා..

"ආරාධ්‍ය ප්ලීස්... එයා නිදි.. අඩුම ගානේ ඇහැරෙනකම්වත් ඉන්න..."

"මගේ නංගිව බලාගන්න හැටි උබ කියන්න ඕන්නෑ යකෝ.. මං හොදට දන්නවා..... "

# 44 කොටස

"ආරාධ්‍ය මට සමාවෙයන් බන්... මන් හිතලා ආරුට එහෙම කරේ නෑ... ප්ලීස්... මට එයා නැතුව ඉන්න බෑ... බලහන්කෝ කෙල්ල නිදන් ඉන්න හැටි... එයාටත් මන් නැතුව ඉන්න බෑ... "

නිතිනු අයියගේ හඩට මන් හෙමීට ඇස් ඇරලා බැලුවා..... එයාගේ ඇස් කෙලින් බලද්දි මන් උඩ ගිහින් නැගිට්ටේ අයියව දැක්ක පාර... නිතිනු අයියගේ තුරුලෙන් මිදිලා මං බිම බලාගෙන හිටගත්තා...

"ආරු.... තමුසෙට අපි ඔක්කොටොම වඩා මූව ලොකු උනාද ආ... අරහෙ අම්මයි තාත්තයි හොදටම බය වෙලා තමුසෙව හොයනවා තමුසෙ මෙහෙ සැපට නිදි.. මෙහෙ එනවා ගෙදර යන්න..."

"අනේ අයියේ.. "

"ආරාධ්‍ය ප්ලීස් මන් කියනදේ අහපන්... වෙච්ච දේවල් වලට මට ඕනෙ දඩුවමක් දීපන්... ඒත් මට ආරුව ඕනෙ බන් ප්ලීස්... "

"හහ්.. ඇය් උබට මතක නැද්ද ආරු උබ ලගට ආවේ සල්ලි වලටනේ.. ප්‍රොස්ටිටියුට් කෙනෙක් වගේ කියලත්

කිව්වේ... ඉතින් එහෙම කෙල්ලෙක් උඹට මොකටද... "

අයියා නිතිනු අයියගෙන් අහන්නේ සරදම් ස්වරූපයෙන්.. ඒත් එක්කම හේශාන් අයියයි අහසි අක්කියි එතනට ආවේ... අයියා ඒ දෙන්නා දිහා බැලුවේ මරන් කන්න තරම් තරහෙන් වගේ...

"බබා... මන් කියන දේ අහන්නකෝ... නිතිනු ඒ...."

"කටවහගන්නවා අහසි.. තමුසෙත් එක්ක මට ආයෙ කතාවක් නෑ... මන් දන්නවා තමුසේ තමයි මේකිව ගෙන්න ගත්තැත්තේ... බදින්න ඉන්න මිනිහට වඩා තමුසෙගේ පේශන්ව ලොකු වුනා නේ... රස්සාවම තියන් ඉන්නවා... "

අයියා අහසි අක්කිට කෑ ගහද්දී එයා බිම බලන් පිටිපස්සට වුනා.. එයාගේ ඇස් වල කඳුලු පුරෝගෙන...

"ආරාධ්‍ය මං කරපුවට ඕනේ දඩුවමක් දීපන්... උඹට ඇතියි කියල හිතෙනකම්ම මට ගහපන්.. ඒත් ප්ලීස් ආරුව අරන් යන්න එපා බන්... මට වෙන ඕනේ දඩුවමක් දීපන්..."

"ආරාධ්‍ය ඌ හිතලා කරේ නෑනේ බන්... පොඩ්ඩක් තේරුම් ගනින්කෝ.."

"ආරු තමුසේ මාත් එක්ක එනවද නැද්ද... හැබැයි මන්

එක්ක ආවේ නැත්තම් අදින් පස්සේ තමුසෙට අයියෙක් නෑ කියලා හිතාගන්න පුලුවන්"

නිතිනු අයියයි හේශාන් අයියයි මොනා කිව්වත් අයියා ගනන් ගත්තේ නෑ... ඒ රතුවෙච්ච ඇස් බලාගෙන හිටියේ මන් දිහා... මන් නිතිනු අයියයි අයියයි දිහා මාරුවෙන් මාරුවට බැලුවෙ ඇස් වල කදුලු පුරවන්... ඒ දෙන්නගෙන් එක්කෙනෙක් තෝර ගන්න අමාරුයි මට...

"මොනාද බලන්නේ.. පොඩිකාලේ ඉදන්ම එකට හිටිය අයියට වඩා තමුසෙට මේ මාස ගානකට කලින් හම්බෙච්ච එකා ලොකු වුනාද ආරු.. අහසිගෙනුයි තමුසෙගෙනුයි එක්කෙනෙක් තෝර ගන්න මන් දෙපාරක් හිතුවේ නෑ... ඒත් තමුසෙට මට වඩා මූවද වටින්නේ.... අන්තිම වතාවට අහන්නේ.. එනවද නැද්ද... "

අයියා කෑ ගහද්දී මං හැරුනේ නිතිනු අයියගේ පැත්තට... එයා ලගට යනකොට අයියගේ ඇස් බොදවෙනවා මන් දැක්කා.. නිතිනු අයියා ලගට ඇවිත් එයාව බදගෙන ඉදලා එයාගේ මූන දෝතට ගත්තා මන්...

"ඉක්මනට එන්නම් මන්.. රැවුලයි කොන්ඩෙයි කපලා ලස්සනට ඉන්න... කන්නේ නැතුව ඉන්න එපා... බොන්නත් එපා... ආදරෙයි මං.. "

එයාගේ තලලෙනුත් හාදුවක් තවරලා මන් බිම බලාගෙන අයියා ලගට ආවා... මගේ අතින් ඇදන් එයා එළියට එද්ද හේශාන් අයියයි අහසි අක්කියි කෑ ගහනවා ඇහුනා... නිතිනු අය්යා ඔලුව උඩටයි පහලටයි කරා හරියට මන් කරපු දේ හරිය් කියන්න වගේ... අපි ඇතට යනකම්ම නිතිනු අය්යා අපි දිහා බලන් හිටියා...

අයියා පානදූරෙ ගෙදරට මාව එක්කන් ආවේ... මගේ කාමරේට ඇදගෙන ගිහින් හොදටම බැන්නා.... මං මූකුත් නොකියා බිම බලන් හිටියේ මගේ අතේ වැරැද්දක් තියෙන නිසා.. අයියා ගැන පුන්චිම තරහක් දැනුනේ නෑ මට.. ඒ හැම හැසිරීමකින්ම එයා පෙන්නුවේ මට තියෙන ආදරේ...

නිතිනු අයියා ලග ඉදලා ආපු නිසාද්‍යෝ මගේ ඇගට අමුතු පනක් ඇවිත් තිබුනා... දූවිලි වැහිලා තිබ්බ මගේ කාමරේ මන් අස් කරේ නිතිනු අයියා ගැන හීන දැක දැක.. කාමරේ අස් කරලා ඇදට වැටිලා මං මතක් කරේ නිතිනු අය්ය ගැන... එයාගේ ලග හිටපු හැටි මතක් වෙද්දී දූවගෙන යන්න හිතෙනවා ඒ තුරුලට.. මන් මාව පාලනය කරගෙන හිටියේ බොහොම අමාරුවෙන්...

ටික වෙලාවක් එහාට මෙහාට පෙරලි පෙරලි ඉද්දි තමයි ෆෝන් එක මතක් වුනේ... අයියට ෆෝන් එක අමතක වෙන්නැති... නැත්තම් කීයටවත් ඒක මං ගාව තියලා යන්නේ නෑ...

බෑග් එකෙන් ෆෝන් එක අතට අරන් මං කෝල් එකක් ගත්තේ නිතිනු අයියට... ඒත් එයාගේ ෆෝන් එක වැඩ නෑ... ඊටපස්සේ මං ගත්තේ හේශාන් අයියට..

"හෙලෝ හේශාන් අයියේ.. නිතිනු අයියට ෆෝන් එක දෙන්නකෝ.. "

"ආ සුදූ පොඩ්ඩක් ඉන්න.."

"හෙලෝ මැනික... ගෙදර ගියාද වස්තු.. අයියා බැන්නේ නෑ නේද... "

"ම්ම්ම් චුට්ටක් බැන්නා.... කෝ ඔයාගේ ෆෝන් එක.."

"දන්නෑ චූටි.. ඒක කොහෙද කියලා මතක නෑ... පොඩ්ඩක් ඉන්න මං ෆෝන් එක හොයාගෙන කෝල් එකක් ගන්නම්..."

"ඉක්මනට ගන්න.. මට පාලුයි.. "

"හරි මැනික... මං ඉක්මනට ගන්නම්.. "

එයා කෝල් එකක් ගන්න යන කාලේ මට දැනුනේ කල්පයක් වගේ... මං එතකන් කාමරේ එහාටයි මෙහාටයි ඇවිද්දා.. අයියා කාමරේට වෙලා ලැප් එකෙන් වැඩක්.. සැරින් සැරේ අම්මලාට කතා කරනවත් ඇහුනා මට..

කාමරෙන් එළියට සද්දේ ඇහෙන නිසා මන් හිටියේ දොර වහගෙන... ෆොන් එක රින්ග් වෙද්දීම වගේ මං කෝල් එක ආන්ස කරා...

"ඇයි මෙච්චර වෙලා ගත්තේ... ඔයාට මන් ගැන ගානක් නෑ... මන් බලාගෙන හිටියා... "

අනේ නෑ බබා.. ෆෝන් එක ඕෆ් වෙලා.. චාර්ජර් එකට ගහලා ඔන් කරගත්තම ක්‍රෙඩිට් තිබ්බේ නෑ.. ඒකයි වෙලා ගියේ මැනික.. කේන්ති ගන්න එපා...

"වීඩියෝ කෝල් එකක් ගන්නකෝ... ඔයාව බලන්න ඕනේ.."

"චුට්ටක් ඉන්න.. ආ හරි.."

"මට තුරුලට එන්න ඕනේ... පාලුයි ඔයා නැතුව.."

"මටත් පාලුය් මැනික... තාමත් බබාගේ සුවද දැනෙනවා මං ගාව.. ඉක්මනටම අයියගේ කැමත්ත ගමු අපි හරිද... ඊටපස්සේ තුරුල්කරන්ම ඉන්නම් මගේ මැනිකව.."

"ම්ම්ම්.. බයයි නේ.. අම්මලා කැමති නැති වුනොත්.."

"එහෙම වෙන්නෑ බබා.. විශ්වාස කරන්න අපේ ආදරේ.. අම්මලත් තේරුම් ගනියි අපි දෙන්නට අපි දෙන්නා නැතුව

බෑ කියලා.. බය නැතුව ඉන්නකෝ... "

"හ්ම්ම්ම්"

"වොශ් එකක් දාගන්නකෝ මැනික... විසබීජ ඇති ඇගේ.. ඔයා ලෙඩ වෙයි.. "

"කාමරෙන් එලියට යන්න බයයි.. අයියා බනියි කියලා.. "

"බනින එකක් නෑ වස්තු අයියා ඔයාට ආදරෙයි නේ.. බැන්නත් අහන් ඉන්න මුකුත් කියන්න එපා... ආදරෙ නිසා නේ අයියා බනින්නේ.. ම්ම්ම්"

"බා මට ඔයත් එක්ක කතා කර කර ඉන්න ඕනේ.... මට පාලුයි.. "

"ඉතින් දුවලා ගිහින් වොශ් එකක් දාන් එන්න මන් ලයින් එකේ ඉන්නම්.."

"ම්හු බෑ... "

"හොද බබානේ මගේ.. වොශ් එකක් දාන් ආවොත් කිස් එකක් දෙනවා...

"හරි එහෙනම් ඔයත් ඔය රැවුල කපන් එන්නෝනේ.. "

" හ්ම්ම්.. හැබැයි මටත් කිස් එකක් ඕනේ.... එකක් නෙවෙයි ගොඩක් ඕනේ.... "

"යනෝ යන්න මෝඩයා... "

නිතිනු අයියට තොල් උල් කරලා හාදුවක් දීලා මං අල්මාරිය ඇද්දා... ඇඳුම් ගොඩක් ගෙදර අරන් ගියපු නිසා දෙක තුනක් විතරයි තිබ්බේ... බොහොම අමාරුවෙන් ශොට් එකක් හොයාගත්තත් උඩට එකක් නම් තිබ්බේ නෑ... ඒ නිසා සාලෙ පුටුවක් උඩ දාලා තිබ්බ අයියගේ ටීශර්ට් එකක් ගත්තා... එයා හෝදපු රෙදි දාන්නේ පුටුවක් උඩ තමයි... අම්මා හරි මන් හරි අල්මාරියට දාන්න ඕනේ....

වොශ් එකක් දාගෙන මං එළියට එද්දි අයියා ඉස්සරහට වෙලා හිටියා ඔරෝගෙන.. මං බිම බලාගෙන එතනින් යන්න යද්දී අය්යා ටීශර්ට් එකේ කරේ පිටිපස්සෙන් අල්ලගත්තා...

"ඔහොම ඉන්නවා... කොහෙද මාරුවෙන්න හදන්නේ... එනවා උයන්න යන්න... රෑවෙලා අම්මලා එයි... පවු ඒ මිනිස්සු දවල්ටවත් කාලා නැතුව ඇති.... "

මං ටවල් එක පුටුවෙන් දාලා අයියගේ පස්සෙන් ගියා බිම බලාගෙන.. උයන්න ගත්තත් මන් හිටියේ සිහියෙන් නෙවෙයි... හැමවෙලාවෙම නිතිනු අයියා මතක් වෙනවා.. එයා මන් එනකම් බලාගෙන ඇති....

අයියගෙන් බැනුම් අහ අහා යන්තම් උයලා ඉවර කරා... ඉක්මනට කාමරේට පැනගන්න හැදුවත් වාහනේක හෝන් එකක් ඇහුන නිසා මගේ ගමන නැවතුනා.. තාත්තගේ කාර් එක කියලා දැක්කම මගේ උගුර කටත් වේලුනා.. තාත්ති මට ආදරේ බව ඇත්ත ඒත් කේන්ති ගියාම යකෙක් වගේ... හැබැයි ගහලනම් නෑ මට.. ඒත් බයයි මන්..

අයියා ගේට් එක ඇරියා... කාර් එක නවත්තපු ගමන් තාත්ති එලියට ආවේ මහ හඩින් කාර් එකේ දොර වහන්.. ඒ සද්දෙ මට හොදටම තේරුම් කරා එයාගේ කේන්තියේ තරම.. මං බිත්තිය මුල්ලට හේත්තු වුනේ පපුව වේගෙන් ගැහෙද්දි..

අඩි ඇතින් තිය තියා ගෙට ආපු තාත්තිගේ රතු පාට ඇස් යොමුවුනේ මන් දිහාට.. මන් තව තවත් බිත්තියට ගුලි වුනා.. අම්මා තාත්තිව පාලනය කර ගන්න හැදුවත් එයා පාලනය වුනේ නෑ...

"කාගෙන් අහලද ගෙදරින් ආවේ... කියනවා.. කාගෙන් අහලද මෙච්චර දුරක් තනියම ආවේ... "

තාත්ති යකෙක් වගේ කෑගහද්දි මන් බිම බලාගෙන හිටියා...

"මොනාහරි වුනා නම් එහෙම ඔය මොකෙක්වත් එන්නේ නෑ උබව බලාගන්න... අපි ඕනේ බලාගන්න... හදපු වඩපු දෙමාපියන්ට වඩා කොහෙවත් යන එකෙක් ලොකු වුනාද චූටි.... මතක නැද්ද වූ හැසිරිච්ච හැටි... තවත් ලැජ්ජ නැතුව ඒකව හොයන් ගියාද.. ඔච්චරම ආදරෙයි නම් මතකේ ආපු ගමන් හොයාගෙන අපේ ගෙදර එන්න තිබ්බනේ.. මොකද පාර දන්නේ නැතුව නෙවෙයිනේ.. "

"තාත්ති එයා ඇත්තටම මට ආදරෙයි.. එයාට බනින්න එපා... "

මගේ වචන අවසන් කරන්නත් කලින් තාත්තිගේ රළු අත්ල මගේ කම්මුලේ නතර වුනා.. මං කම්මුලත් අල්ලන් එයා දිහා බැලුවේ ඇස් වල කදුලු පුරවන්... මේ අවුරුදු 21 ටම එයා පලවෙනි වතාවට මට ගැහුවේ.. අම්මයි අයියයි ඇස් ලොකු කරන් අපි දෙන්නා දිහා බලන් හිටියා... තාත්ති එයාගේ අත දිහාත් බලලා සෙටියෙන් වාඩි වුනේ අත් දෙකෙන් කොන්ඩේ මිරික මිරික..

අම්මා මං ගාවට එද්දිම මං කාමරේට ගිහින් දොර වහගත්තා... ඇදට වැටිලා මන් හයියෙන් ඇඩුවා... පුපුරු ගහන කම්මුලට අත තියන් මං ෆෝන් එක අතට ගත්තේ නිතිනු අයියා කතා කරන සද්දෙ ඇහිලා.. එයා මෙච්චර වෙලා බලන් ඉදලා මන් එනකම්

"මැනික... මගේ වස්තු අඩනවාද.. ඇයි මැනික මොනාද

වුනේ... අයියා බැන්නද.. අඩන්න එපා වස්තු මට කියන්න මොනාද උනේ...."

"තා..ත්..ති..හ්. ගැ...හු...වා.."

මන් අඩ අඩා කියද්දි එයාගේ මූන වෙනස් වුනා.. ඒ ඇස් වේදනාවෙන් පිරිලා ගියා...

"මට සමාවෙන්න මැනික... මන් නිසා තමයි හැමදේම... මන් නිසා මගේ කෙල්ල විදවනවා.. මන් මහ අවාසනාවන්තයෙක්.. "

"එහෙම නෑ... එයා බැන්නේ කියන්නේ නැතුව ආවා කියලා.. ඔහොම කියන්න එපා... මට තවත් දුක හිතෙනවා... "

"මං වෙන මොනාද කියන්නේ චූටි.... මං නිසා මගේ කෙල්ල කවදාවත් නැතුව තාත්තගෙන් ගුටි කෑවේ... අඩනකොට නලවන්නවත් මං ලග නෑ... ඉතින් මං අවාසනාවන්තයි තමයි ආරු"

එයා ඇස් වලට උනන කඳුලු වලක්කගන්න වගේ උඩ බලන් ඉදලා මන් දිහා බැලුවා.....

"මැනික... මං එන්නද ඔයාලගේ ගෙදර.. ඇවිත් තාත්තිත් එක්ක කතා කරන්නම්... කොහොමහරි එයාව කැමති

කරගන්නම්.. ගැහුවත් කමක් නෑ මට.. ඔයාට බනින්නේ නැතුව.. "

"දැන් එන්න එපා එයා තරහින් ඉන්නේ... වෙන වෙලාවක එන්න.."

"අනේ වස්තු මට ඔයා අඩනවා බලන් ඉන්න බෑ... මාව පිච්චෙනවා.. මං එහෙනම් හොරෙන් එන්නද ඔයා ගාවට.."

කඳුලු අතරින් හිනා ගියා මට.. වෙන මොකටවත් නෙවෙයි හොරෙන් ගෙදරට පනින්න හදනවා මට මැවිලා පෙනිච්ච නිසා.. ඒත් මං ඒ අදහසට කැමති වුනේ මේ වෙලාවේ ගොඩක් එයාව ඕනේ වෙච්ච නිසා.. එයාට තුරුල් වෙලා මට අඩන්න ඕනෙ නිසා..

"මගින් කාර් එක නවත්තලා මට කෝල් එකක් ගන්න.. මං අම්මලා නිදා ගත්තාම පාරට එන්නම්.."

"හරි බබා.. මන් දැන්මම එනවා... මගේ වස්තු අඩන්නේ නැතුව ඉන්න.. ම්ම්ම්"

රෑට කවුරුත් කෑවේ නෑ... මට නම් කන්න උවමනාවක් තිබ්බේ නෑ... ඕනේ උනේ තිතිනු අයියට තුරුල් වෙලා දුක නිවාගන්න..

රෑ දෙළහ විතර වෙනකම් අම්මලා නිදගත්තේ නෑ... දෙළහ හමාරට විතර මං කාමරෙන් එළියට ආවේ කවුරුත් සද්ද නැති නිසා.. කලුවරේම හෙමීට දොර ඇරන් එළියට එද්දි නිතිනු අයියා ගේට් එක ලඟ හිටියා... ඇදලා වහන්න තියන ගේට්ටුවක් නිසා සද්දෙ ඇහෙන්නෙ නැතිවෙන්න අරින්න අමාරුයි.. ඒ නිසා මත් ගේට් එක උඩට නැග්ගා... නිතිනු අයියා මාව එයාපැත්තෙන් උස්සලා ගත්තේ හිනාවෙවී...

එයාට මාව බිමින් තියන්න නොදී බෙල්ලේ එල්ලිලා ඉනවටේ කකුල් දෙක ඔතාගත්තා...

## 45 කොටස

නිතිනු අයියා මාවත් උස්සගෙන ඉස්සරහට ඇවිදගෙන යනවා... මං එයාගේ බෙල්ල පාමුල මූන තියාගෙන ඇස් පියාගෙන හිටියේ... එයා කොහෙ යනවද කියලා මත් දන්නෑ... මට එයාව මටත් වඩා විශ්වාස නිසා කොහේ එක්කගෙන ගියත් මට ප්‍රශ්නයක් තිබ්බේ නෑ...

ටිකක් දුර ගිහින් එයා නැවතුන නිසා මත් ඇස් ඇරලා බැලුවා... පාරට හැරෙන තැන එයාගේ කාර් එක නවත්තලා තිබ්බා... එතනදිවත් මත් බැස්සේ නැති නිසා

මාවත් අරන් බොහොම අමාරුවෙන් කාර් එකට නැග්ගා... මාව එහෙමම තියන් එයා කාර් එක ස්ටාට් කරේ.... මං ඉන්න විදිහට ඩ්‍රයිව් කරන්න අමාරු නිසාද්දෝ එයා හෙමීට කාර් එක ගෙනිච්චේ.. බීච් එක පැත්තට වෙන්න නිස්කලංක තැනක එයා කාර් එක නැවත්තුවා... ශීට් එක ටිකක් පහත් කරලා එයා අත් දෙකෙන්ම මාව බදගත්තා..

"චූටි මැනික... ගොඩක් සිදුනද මගේ පැටියට.. "

"ම්ම්ම්.. තාම සිදෙනවා.. "

එයා ඒ ගැන මතක් කරපු ගමන් මගෙ ඇස් වලට කඳුලු ආවා.. ඒ වෙලාවේ තාත්ති මන් දිහා බලන් හිටපු විදිහ මතක් වෙද්දී ගොඩක් දුක හිතෙනවා...

"තාත්ත්.. මටත්.. කවදාවත් ගහලා නෑ... බනිනවා විතරයි.. බැන්නත් පස්සේ ඇවිත් මාව සනසනවා... ඒත් අද මන්... ලගට ආවේ වත් නෑහ්.. මන් බලන් හිටියා එයා කාමරේට එයි කියලා.... "

"මට සමාවෙන්න චූටි.... මං නිසා මගේ කෙල්ල දුක් විදිනවා... ඒකයි ඈත් වෙන්න හැදුවේ... ඒත් මට එච්චර පරාර්තකාමී වෙන්න බෑ වස්තු.. ඔයාගේ ආදරේ ලග මං ගොඩක් ආත්මාර්තකාමීය්.. "

"ඔයා මාව දලා ගියොත් මං මීට වඩා දස් ගුනයක් දුක් විදියි... ඒ නිසා ඔයාගේ ආත්මාර්තකාමී ආදරේට මං ආස.. චුට්ටක් මට අඩන්න දෙන්න.. ඔයා ගාව ඇඩුවම මට දුක අඩු වෙනවා.. "

"එහෙනම් මේ පාර විතරක් අඩන්නකෝ.. ආයේ කවදවත් මගේ කෙල්ලට අඩන්න තියන්නේ නෑ මං.. ප්‍රොමිස්.. සතුටින් පුරවනවා ඔයාගේ ලෝකෙම..."

නිතිනු අයියගේ පපුවට මූන තද කරන් ගොඩක් වෙලා ඇඩුවා මං.. එයා මගේ ඔලුව අත ගගා හිමීට පිටට තට්ටු කරනවා..

"අයියේ...."

"ඇයි මැතික... "

"උම්මා එකක් ඕනේ.... "

එයා ලස්සනට හිනාවෙලා මගේ කම්මුල ගොඩක් වෙලා කිස් කරා...

"මැතික... එද මං ගැහුවමත් ගොඩක් රිදුනා නේද... තොලෙන් ලේත් ආවනේ"

"මිහූ රිදුනේ නෑ... "

"මන් දන්නවා බොරු කියන්නේ කියලා... තාත්ති කේන්ති ගත්තත් ඒ කේන්තිය ඇතුලේ ආදරේ තියෙනවා... ඒ නිසා එයා ගොඩක් හය්යෙන් ගහන්නේ නෑ... ඒත් මන් ඔයත් එක්ක කේන්තියෙන්ම විතරයි හිටියේ එදා.. ඒ නිසා ගොඩක් රිදෙන්න ඇති මගේ මැතිකට... මතක් වෙනකොට මාව පිච්චෙනවා.. මට සමාවෙන්න බබා.. "

"ඇති... හැමවෙලේම ඕක කියවන්න එපා... මන් කැමති නෑ ඒ දවස් ගැන මතක් කරන්න.. තවත් ඔය ගැන කතා කරොත් මං යනවා යන්න..."

"හරි ඉතින් ආයේ කියන්නෑ.. කේන්ති ගන්න එපා ඔහොම.. මේ සුදු මූන කැත වෙයි.."

"යනවා යන්න මෝඩයා... "

එයාට ඔරවලා කම්මුලක් හපාගෙන ඉදලා අතාරියා මන්... හද එලියට එයා ලස්සන හිනාව පේනවා... එයා ගේ නහයත් හපලා උරහිසෙන් තිකට තියාගත්තා... බීච් එක ලග නිසා හුලං එනවා ගොඩක් සීතලයි.. ඒ නිසා මං තවත් එයාට ගුලිවුනා...

"මැතික... බලන්නකෝ අහස දිහා... හරි ලස්සනයි අද..."

මං කාර් එකේ ඉස්සරහ වීදුරුවෙන් බැලුවේ අහස දිහා...

ඇත්තටම හරි ලස්සනයි.. සම්පූර්ණයෙන්ම හද පායලා වලාකුළු අතරින් පේනවා... කවියෙක් වෙන්න හිතයි මට..

"අපි රේල් පාර දිගේ ඇවිදිමුද...?"

මං නිතිනු අයියා දිහා බලන් මං අහද්දි එයා ලස්සනට හිනා වුනා..

"යං..."

කාර් එකෙන් බැහැලා අපි දෙන්නා අත් අල්ලන් රේල් පාර දිගේ ඇවිද්ද.. හද එළියේ එයාගේ අතින් අල්ලන් ඇවිදිනවා කියන එක අමුතුම හැඟීමක්.... මන් එයාගේ අතින් අල්ලන් එයා දිහා බලන් පිටිපස්සෙන් පිටිපස්සට ගියා... අයියගේ තඩි ශර්ට් එකත් ඇදන් සෙරෙප්පු දෙකක්වත් දලා නැතුව අඬලා කැතවෙච්ච මූනෙන් ඉන්න මං දිහා එයා බලන් හිටියේ වසඟ වෙලා වගේ... ආදරේ ද්‍රෝරෙ ගලනවා ඒ ඇස් වල..

ටික දුරක් පිටිපස්සට යද්දීම වැටෙන්න ගියපු නිසා මං නිතිනු අයියා පැනලා මාව අල්ල ගත්තා... ගුලියක් ගහන් හිටපු කොන්ඩේ ලෙහිලා ගියෙත් ඒ එක්කමයි..
එයා මගේ ඇස් දිහාම බලන් හිටියා බද වටේ අතක් දගෙන.. ඒ ඇස් මගේ ඇස් වල මොනාදෝ හොයනවා...
ටික වෙලාවක් මගේ ඇස් වල කිමිදිච්ච ඒ ඇස් නතර වුනේ මගේ වෙව්ලන දෙතොල් ලඟ..

තත්පරයක් යන්නත් කලින් ඒ දෙතොල් මගේ දෙතොල් ආක්‍රමණය කරා... ඇස් පියාගෙන එයාගේ බෙල්ලෙ එල්ලිලා මං එයාට සහය වුනා..

විනාඩි ගානක් ඒ දෙතොල් පහසෙ වෙලිලා සුපුරුදු විදිහට එයාගේ පපුව අස්සෙ හැංගුනා.. කිස් කරන හැමවෙලාවකම මට පලවෙනි වතාව වගේ කෝල කමක් දැනෙන්නේ... එයා මගේ හිස් මුදුනෙන් හාදුවක් තිබ්බා...

"අයියේ..."

"ඇයි මැනික... "

"මං ආසයි කන්දක් උඩට ගිහින් මේ වගේ හද එලියේ ඔයාට තුරුල් වෙලා ඉන්න... තව කනාමැදිරියොත් ඉන්න ඕනේ.... "

"අපි හනිමූන් එකට යන් කන්දක් උඩ තියෙන හොටෙල් එකකට.. ම්ම්ම්... "

"අනේ.. මොනාද කියන්නේ මෝඩයෝ.. "

"ඇයි බබා.. මං ඇත්තටම කිව්වේ.. ලස්සන දිය ඇල්ලක් තියෙන තැනකට යමු.. දැන්නම් ඉක්මනට මැරි කරන්න ඕනේ වගේ... "

"එපා අනේ... මට ලැජ්ජයි.. "

"හරි හරි මගෙ පිස්සි.."

"මට පිස්සු නැහ්.. හූම්"

"මට නම් දැන් පිස්සු වගේ... "

"ඒ මොකෝ.."

"හද පායලා තියන ලස්සන රෑක.. සීතල හුලං එන වෙලාවක.. මගේ කෙල්ලව තුරුල් කරන් ඉද්දි.. මට පිස්සු නොහැදුනොත්නේ පුදුමේ බබා.. "

"ඇයි ඒ.."

"මුකුත් නෑ මැනිකේ.. එන්න අපි බීච් එකට යන්.."

මගේ නහය මිරිකලා හරහට වඩා ගත්තේ මං ඇස් ලොකු කරන් බලන් ඉද්දි.. බීච් එකට ඇවිත් මාව බිමෙන් තියලා එයා බිමෙන් ඉදගත්තා.... මං එයා ගාවෙන් ඉදගද්දි එයා කොන්ඩේ අගින් අල්ලගත්තා කොන්ඩේ බිම ගෑවෙනවට.. කොන්ඩේ මගේ උරහිසෙන් දාලා එයා අහස දිහා බලන් ඇස් පියාගත්තා... මත් එයාගේ අතක් වටේ අතක් දාගෙන උරහිසෙන් ඔලුව තියාගත්තා...

පාන්දර එකට දෙකට විතර ඇති වෙලාව.. බීච් එක හරිම පාලුයි.. මුහුදු රල වෙරළේ ගැටෙන හඬ මට දැනුනේ සංගීතයක් වගේ... හඳ එළිය වැටිලා මුහුදු රැලි කිරිපාටට දිලිසෙනවා... අහසේ තරු පිරිලා හරිම ලස්සනයි.. මට දැනුනේ රෝමාන්තික කවියෙක් ලියපු කවියක් ඇතුලේ ජීවත් වෙනවා වගේ... මේ මොහොතේ මේ දැනෙන සැනසීම හැමදාම ඕනේ කියලා හිත කෑගහලා කියද්දි මං තවත් නිතුනු අය්යගේ අස්සටම ගුලිවුනා...

"පුදුම සැනසීමක් දැනෙනවා නේද බබා.."

"හ්ම්ම්.. හරියට කවියක් ඇතුලේ ජීවත්වෙනවා වගේ... "

"කවියක් ඇතුලෙද කියලනම් මන් දන්නේ නෑ... ඒත් මගේ කවිය මං ගාව ඉන්නකොට දැනෙන හැඟීම කියන්න වචන නෑ මට.. ඒක හරිම ලස්සනයි.. හිතට මොනාද්දෝ වෙනවා.. මගේ ආත්මෙම මේ හුළඟ එක්ක පාවෙනවා වගේ... "

මං ආදරෙන් ඒ ඇස් දිහා බලන් හිටියා... මන් ගැන කියද්දි ඒ ඇස් දිලිසෙනවා තරු වගේ... එයාගේ උරහිසෙන් හාදුවක් තියලා මං අහස දිහා බලද්දිම දැක්කේ තරුවක් කඩන් වැටෙන හැටි...

"අන්න තරුවක් කඩන් වැටෙනවා.. මොකක් හරි ප්‍රාර්තනා කරන්න.."

මං නිතිනු අයියට කෑ ගැහුවේ ඇස් පියාගෙන මාව නිතිනු අයියටම අයිති වෙන්න කියලා ප්‍රාර්තනා කරන ගමන්... ඇස් ඇරලා මං එයා දිහා බලද්දිම වගේ තමයි එයත් ඇස් ඇරියේ.. ඒ කියන්නේ එයත් මං වගේ බොලද දේවල් විශ්වාස කරනවා..

"මොනාද ඔයා ප්‍රාර්තනා කරේ.... "

මං එයාගේ මූනටම එබිලා අහද්දි එයා හිනාවෙවී මගේ නහය මිරිකුවා..

"විශ් කරන දේවල් කියන්න හොද නෑලු... එතකොට ඒක වෙන්නේ නෑලු... "

එයා එහෙම කියද්දි මං තොලත් නොපිටට පෙරලන් එයා දිහා බැලුවා.....

"මත් දන්න්වා ඔයා මොනාද විශ් කරේ කියලා.... මාව නේද ඉල්ලුවේ.."

එයාගේ පපුවට කම්මුලක් තියන් මං අහද්දි එයා මගේ කම්මුලට හාදුවක් දුන්නා....

"හ්ම්ම්ම් ඔයා ඇරෙන්න මේ ලෝකේ මට ඕනේ වෙන මොනාද.."

මගේ ඇස් දිහා බලාගෙන එයා එහෙම කියලා මගේ ඔඩොක්කුවෙන් ඔලුව තියාගත්තා... ගොඩක් වෙලා මං එයාගෙ අලුතින් කපපු කොන්ඩෙය් රැවුලය් අතගගා හිටියා... එයාට නින්ද යාගෙන එනවා වගේ දැනෙද්දි මං හෙමීට එයාට තට්ටුවක් දැම්මේ තනියෙන් වගේ දැනුන නිසා.. පාලු බීච් එකේ අවදිවෙලා ඉන්න එකම කෙනා මං නිසා බයක් දැනුනා..

"අයියේ... නිදිද.."

"ම්ම්ම්ම්.. "ෙ

"අනේ නැගිටින්නකෝ... මට බය හිතෙනවා... "

"සො...රි බබා.. ගොඩක් කාලෙකින් ඔයා ගාව හිටිය නිසා සනීපෙට නින්ද ගියා... "

"රෑ නිසා බය හිතුනා මට තනියෙන් ඉන්න.. නැත්තම් කතාකරන්නේ නෑ මං.. "

"ඒකට කමක් නෑ මැනික... මොනාහරි කියන්න මට නින්ද යන්නේ නැතිවෙන්න.."

"අයියෙ... සනුදි අක්කාට මොනාද වුනේ... "

මං අහද්දි එයා වහගෙන හිටිය ඇස් දෙක ඇරලා සුසුමක් හෙළුවා..

"මගේ දේපල ටික ඔක්කොම ලියාගත්ත ගමන් එයා ගියා.."

"මොකක්..?? ඒ කියන්නේ එයා සේරම දේවල් ලියාගත්තද.. ඉතින් ඔයා මුකුත් කරේ නැද්ද... ඒ දේවල් අම්මිගේ නේ.."

එයා හිනාවෙලා මගේ අත ඉම්බා..

"මං ඒවා ලිව්වට එයාට ඒවා අයිති වෙන්නේ නෑ බබා.. ඒවගේ අයිතිකාරයා මං නෙවෙයි... "

"ඔයා නෙවෙයි ? එහෙනම් කවුද.."

"මගේ වයිෆ් ගේ නමට ඒ ඔක්කොම ලිව්වා මං.. "

"ව..වයි.. ෆ් ?? "

"හ්ම්ම්ම්... ආරාධ්‍ය සේමිනී සෙනෙවිරත්න.. මගේ වයිෆ්.."

"ම...මගේ න..ම...ට..??"

"දිනේශ් එද ඔෆිස් එකට ආපු දවසෙම මත් හිතුවා දේපල ගන්න මොනාහරි කරයි කියලා.. ඉතින් මං ඔක්කොම ඔයාගේ නමට ලිව්වා... බබා දන්නේ නැතුවට මං බබාගේ සයින් එකත් ගත්තා ඒවට.. ගෙදර පරන ඩොකියුමන්ට්නේ තිබ්බේ... ඒවා මොනාහරි කරලා තමයි සනුදි දේපල ලියාගන්න ඇත්තේ... ඒවා වලංගු නැති නිසා කිසිම ප්‍රශ්නයක් නෑ... "

"ඒත් ඇයි මටම ලිව්වේ.. "

මං ඇහුවේ ඇස් වල කදුලු පුරවන්... දරාගන්න බෑ මට එයා එච්චර වටිනාකමක් දුන්නා කියලා.. ඒත් මගේ ප්‍රශ්නෙත් එක්කම එයාගේ මූන අසරන පාට වුනා.. එයා මගේ ඔඩොක්කුවෙන් නැගිටලා මුහුද දිහා බලාගත්තා..

"මේ ලෝකේ මට විශ්වාස කරන්න කියලා වෙනකවුරුත් නෑනේ බබා.. හැමදේකටම මට ඉන්නේ ඔයා විතරයිනේ.. මං විශ්වාස කරා කවදහරි මට මොනාහරි උනොත් ඔයා මගේ අම්මගේ දේවල් බලාගනියි කියලා.... ඇස් දෙක පියාගෙන උනත් මට ඔයාව විශ්වාස කරන්න පුලුවන්... මං දිව්රනවා මට සනුදි ගැන එහෙම විශ්වාසයක් ඇවිත් නෑ..."

එයා කියලා ඉවරකරන්නත් කලින් මං එයාගේ පපුවට තුරුල් වෙලා ඇඩුවා... ඇය් අඩන්නේ කියලා මං දන්නේ නෑ... හිතේ තියෙන්නේ සතුටක්ද දුකක්ද කියලා දන්නෙත් නෑ... මට අඩන්න ඕනේ උනා...

විනාඩි ගානක් අඩලා මං නිතිනු අයියා දිහා බලද්දි එයා මගේ නලල ඉම්බා.. සමහරවිට මන් සතුටට අඩන්න ඇත්තේ... ඒකනේ එයා මාව සන්සන්න උත්සහ කරේ නැත්තේ... මට වඩා හොදට එයා මාව දන්නවා.....

"මැතික.. 4 ටත් ලගයි වෙලාව.. දැන් යමු අපි..."

"අනේ බෑ තව ඉමු..."

"යන් මැතික... බලන්නකෝ සීතල.. ඔයා ලෙඩ වෙයි.. කෝ නැගිටින්න.."

"තව චුට්ටක් ඉමුකෝ... විනාඩි 10 ක්"

" හ්ම්ම්... ඔන්න විනාඩි 10 ය්... ඊටපස්සේ ආවේ නැත්තම් ගුටි දෙනවා මං.. කෝ ලගට එන්න.. සීතල අල්ලයි නැත්තම්.. "

එයා මාව පපුවටම හිරකරගත්තා.. සීතල කොහෙන් ගියාද දන්නෑ... මං තව තවත් එයාටම ගුලිවුනේ ඒ උනුසුමට හිතලෝබකම් කරපු නිසා.. හිමීට එයාගේ පපුව ඉම්බේ හිත එහෙම කරන්නම කිව්ව නිසා..

"ම්ම්ම්... මැතිකහ්.. කිස් කරන්න එපා... මට කන්ට්‍රෝල් නැතිවෙයි.."

එහෙම කිව්වත් මං ටීශර්ට් එකට උඩින් ඒ පපුව හැපුවේ හිතුවක්කාර කමට.. ඒත් ඒ එක්කම එයා මාව පපුවෙන් මුදවලා දෙතොල් අල්ලගත්තේ පිපාසෙන් හිටියා වගේ... තොල් වලින් නොනැවතී මූන පුරාම ගියපු දෙතොල් ගෙල පාමුලට එද්දි මට කෙඳිරිගෑවුනා.. සැරෙන් සැරේ දත් පාරවල් තිය තිය මාව කිස් කරලා එයා කරන්ට් එක වැදුනා වගේ මගෙන් මිදුනා..

"මත් කිව්වනේ බබා දඟවැඩ කරන්න එපා කියලා.. කන්ට්‍රෝල් නැතිවෙනවා වස්තු.. බොහොම අමාරුවෙන් ෆීලින්ග්ස් හංගන් ඉන්නේ මං.. කෝ නැගිට්ටින්න දැන්නම් අපි යන්නම ඕනේ... මාව විශ්වාස කරලා ආපු ඔයාට මගෙන් වැරැද්දක් වෙයි කියලා බයයි මට.."

මං ඉද්ද ගැහුවා වගේ නැගිට්ටේ කෙල පිඩක් ගිලින ගමන්... පුංචි බයක් නොදැනුනා නෙවෙයි මට.. එයා ගැන විශ්වාසේ නිසා බය හංගගත්තා මිසක තාමත් පපුව වේගෙන් ගැහෙනවා... එයාගේ ඇස් ඒවා හරි වෙනස් අද.. මොනාදෝ ඉල්ලනව වගේ...

මගේ මූන දිහා බලාගෙන හිනාවෙවී එයා නැගිට්ටේ... ඇඟ පුරාම වැලි එයාගේ... ඇයි බිම දිගා වෙලා හිටියනේ..

ගෙදරට යනකම්ම අපි දෙන්නගේ අතරා කතාබහක් වුනේ නෑ... එයානම් තොල් අල්ල අල්ල තනියම හිනාවෙනවා...

ගේට් එක ලගට ඇවිල්ලත් එයා මාව ඉබ්බතකම් කරබාගෙන හිටියා මං.. ගේට් එක උඩින් මාව තියලා මං දෙර ලගටත් ගියාට පස්සේ තමයි එයා යන්න ගියේ...

මං උදේ ඇහැරුනේ සාලේ පැත්තෙන් උස්හඩින් ඇහෙන සංවාදේ නිසා.. වෙලාව 10 ගානක්.. ඇග මැලි කඩ කඩා මං සාලේට ආවේ මොකක්ද ඒ සද්දේ බලන්න... අදහන්න දෙර ලග තාත්තියි අයියයි බැන බැන හිටියේ නිතිනු අයියට...

## 46 කොටස

බැනුම් අහ අහා හිටපු නිතිනු අයියගේ මූනට හිනාවක් ආවා මාව දැක්ක ගමන්... ඉන්න කොහෙද කියලත් අමතක වුනා වගේ එයා මන් දිහා බලන් හිටියේ... අයියයි තාත්තියි දෙන්නම මං දිහා බැලුවේ නිතිනු අයියගේ බැල්ම දිගේ ඇවිත්.. මාත් බිම බලාගෙන ඇවිත් නතට වුනේ නිතිනු අය්යා ලග... ඇවිත් එයාගේ අතින් අල්ලන් බිම බලන් හිටියා..

"සුදූ... මෙහෙ එනවා ගෙට.. තමුසේ මොකටද ඔතන්ට ගියේ... "

"දේනි යනවා කාමරේට... ආයෙත් ගුටි කන්න ඕනේද... "

තාත්ති කෑගහද්දි නිතිනු අයියගේ අතෙන් මගේ අත තදවුනා.. මට ගහනවා කියපු නිසා වෙන්නැති...

"නිතිනු අයියා විතරක් තනියෙන් වැරදි කරේ නෑනේ... එයා බැනුම් අහන්නේ මට ආදරේ කරපු නිසා.. ඉතින් එයා විතරක් බැනුම් අහන එක අසාදූරනයි.."

පහත් හඬින් මං මිමූනුවා..

"දේනි.. තාත්තිගේ යකා අවුස්සන්න එපා යනවා කාමරේට... "

"මට බෑ..."

"සුදූ කාමරේට යනවා... තමුසෙට ඊයේ වගේ කෑම ඕනෙද... "

"කමක් නෑ මට ඇති තරන් ගහන්න.. ඒත් මං නිතිනු අයියව දාලා යන්නේ නෑ... "

"මොකක්ද කිව්වේ..."

තාත්ති මට ගහන්න අත උස්සසද්දිම නිතිනු අයියා ඉස්සරහට පැන්නා... ගහන්න උස්සපු අත එහෙමම මිට්කරගෙන තාත්ති හිටියේ කේන්තියෙන් වෙව්ල වෙව්ල..

"එයාට ගහන්න එපා තාත්තේ... එයාගේ වැරැද්දක් නෑ... වැරදි කරෙ මත් නේ... මට ගහන්න.. "

මාව එයාගේ පිටිපස්සේ හංගගෙන නිතිනු අයියා කියන්නේ තාත්තිට...

"තමුන් කවුද මට තාත්තා කියන්න.. මට ඉන්නේ ලමයි දෙන්නයි.. එකෙනුත් එක්කෙනෙක් තමයි තමුන් උදුරගන්න හදන්නේ... "

"මට ආරුව උදුරගන්න ඕනේ නෑ තාත්තේ... සොරි අංකල්.. මට මගේ කියලා ඉන්නේ එයා විතරයි.. එයාව ඔයාලගෙන් උදුරන් එයාවත් මං වගේ අනාතයෙක් කරන්නේ නෑ කවදාවත්... මට ඔයාලවත් ඕනේ.... මට වයිෆ් කෙනෙක් වගේම අම්මෙකුයි තාත්තෙකුයි සහෝදරයෙකුයි ඕනේ...."

නිතිනු අයියගේ වචන වලට තාත්ති ටිකක් මෙල්ල වුනා.. රළුයි වගේ පෙනුනට එයා ඇතුලෙන් හරිම සංවේදියි.. අම්මා නම් දැනටමත් අඩන්න පටන් අරන්... එයා නිතිනු අයියට ආදරෙයි නේ..

"මහත්තයා.. අපි ඉදගෙන කතා කරමුකෝ.. කලබල වෙන්නේ නැතුව.. "

"රේනු.. ද්‍රේනිවත් අරන් කාමරේට යන්න.. ඉදගෙන කතාකරන්න දෙයක් නෑ... ඔය ළමයා මෙතනින් ගියේ නැත්තම් පොලිසියට කතා කරනවා.. "

නිතිනු අයියා බිම බලාගෙන හිටියා මිසක් හෙල්ලුනේවත් නෑ... මමත් එයාගේ අත අල්ලන් හිටියා...

"ද්‍රේනි.. කාමරේට යනවා කියන දේ ඇහෙන්නේ නැද්ද... "

"තාත්ති ප්ලීස්... මට එයා නැතුව ඉන්න බෑ තාත්ති.. මට නිතිනු අයියව ඕනේ.... "

මං කියලා ඉවරවෙන්නත් කලින් තාත්ති මාව ඇතුලට ඇදලා අරන් මහ හය්යෙන් දොර වැහුවා.. මං කොච්චර දැගලුවත් තාත්ති මට යන්න දුන්නේ නෑ... අන්තිමට මාව කාමරේට දලා දොර වැහුවේ මං කෑ ගහද්දී... දොරට ගගහා මන් කොච්චර ඇඩුවත් තාත්ති දොර ඇරියේ නෑ...

දොරට හේත්තු වෙලා පැයගානක් මන් ඇඩුවා... නිතිනු අයියට කෝල් ගත්තට ආන්ස කරේ නෑ... පව් එයා අඩනවද දන්නෑ... කල්පනා කර කර ඉදලා මං කෝල් එකක් ගත්තේ හේශාන් අයියට..

"හෙලෝ සුදූ..."

"හේශාන් අයියෙ.. නිතිනු අයියගේ ගෙදරද ඔයා ඉන්නේ..."

"ඔව් සුදූ... ඇය් කටහඩ වෙනස් වෙලා.. "

"අනේ නිතිනු අයියට ෆෝන් එක දෙන්නකෝ.. එයා කෝල් ආන්ස කරන්නෑ.. "

"මො... මොකක්.. නිතිනු මෙහේ නෑ සුදූ... එයා ඔහේ ආවලු නේ..."

"එහෙම වෙන්නේ කොහොමද.. අනේ අයියෙ පොඩ්ඩක් බලන්නකෝ එයා ගෙදර ආවනේ.. එයාට ප්‍රශ්නයක් නැතුව ඇති නේද..."

"හරි බය වෙන්නේ නැතුව ඉන්නකෝ සුදූ... මං බලන්නම්.."

කෝල් එක කට් කරලා පපුවට අත තියාන් මං එහෙට මෙහෙට ඇවිද්දා.. හිතට ලොකු බයක් දැනුනා.. තාම එයාට හරියට හොදවෙලත් නෑ ඊටත් එලියේ හය්යෙන් වහිනවා... හදවත වේගෙන් ගැහෙද්දි මං දොර ලගට ගියේ දොර කඩාගෙන හරි එලියට යනවා කියලා හිතාගෙන... ඒත් දොර නිකම්ම ඇරුනා..

ඉක්මනට තාත්තිව හොයන් ගියේ නිතිනු අයියා ගැන කියන්න... මං දන්නවා එයා නිතිනු අය්යව හොයාගන්න මට උදව් කරයි... කාමරේට යන්න හදද්දිම ඒ දෙන්නගේ සංවාදේ ඇහුන නිසා මං දොර ගාව නැවතුනේ..

"ද්‍රෝනිගේ කාමරේ දොර ඇරියද රේනු..."

"ම..මහත්තයා ??"

"ඔයා හැරුනත් ඒ මොකටද කියලා මන් දන්නවා රේනු.."

"කෙල්ල පවු මහත්තයා.... අඩනවද කොහෙද... "

"තාමත් අඩනවද..."

"හූල්ලන සද්දෙ ඇහුනා... "

"මොකක්ද ඒ කොල්ලා ඔච්චරටම ද්‍රෝනිට දීලා තියෙන වශිය.. ඒ මත්තෙම නැහෙන්න.."

"එහෙම තමයි මහත්තයා ඔය වයසෙදි.. මතක නැද්ද අපි දෙන්නා ආදරේ කරපු හැටි... ඒ කාලේ අම්මලා අකමැති වෙද්දී අපි දෙන්නා කොච්චර දුක් වින්දද.."

"දැන් ඔයා මොනාද මට කියන්න හදන්නේ... "

"අපිට වගේ දෙමාපියන්ගෙනුයි තමන්ගේ ආදරෙනුයි එකක් තෝරගන්න තැනට අසරන කරන්න එපා කියලා.... "

"ඔයා කියන්නේ දේනි අපිව දලා මේ ලගදි ආපු මිනිහෙක් එක්ක යයි කියලද රේනු.."

"මන් කරෙත් ඒකම නේද මහත්තයා... සමහරවිට අපේ අම්මලත් මං ගැන ඔහොමම හිතන්නැති..

"ඇයි රේනු ඔයත් ඔහොම කතා කරන්නේ... හරියට මං මගේ දරුවට වරදක් කරනවා වගේ... එයා අනාගතේ හොදින් ඉන්න ඕනේ නිසයි මං මේ දේවල් කරන්නේ... ඒ කාලේ ඔයාගේ අම්මලාගේ කැමැත්ත ගන්න මන් මොනාද නොකලේ.. බැරිම තැනනේ අපි එහෙම කරේ.... ඒ එක්ක බලද්දි ඒ කොල්ලා කිසිම දෙයක් කරලා නෑ දේනි වෙනුවෙන්... එක පාරක් බැන්නම යන්නම යන්න ඇති.... මං සාලෙටත් වෙලා හිටියා ආපහු බෙල් එක ගගහා වද දෙයි කියලා... ඒත් එහෙම උනේ නෑනෙ... "

"කෙල්ලට ගහයි කියලවත් බය වෙන්න ඇති මහත්තයා... ඒ ලමයා හොද හැදිච්ච දරුවෙක්.. කිසි අඩු පාඩුවක් නෑනේ.. මං නම් හිතන්නේ ඒ දරුවට වඩා හොද කෙනෙක් දුවට හම්බවෙන්නේ නෑ... දැක්කේ නැද්ද දේනි දැක්ක ගමන් ඉන්නේ කොහෙද කියලවත් මතක නැතුව බලන් හිටපු හැටි... අනික දේනි මූන හෝදලාවත් හිටියේ නෑ..."

"ඔව් ඉතින් බලන් හිටියා තමයි... මොකෝ මගේ කෙල්ලගේ ලස්සනෙන් අඩුවක් තියනවා ඈය්... අර මිස්ට සාලියත් හැමදම අහනවා මගෙන් ජේනිව කොල්ලට දෙන්න බැරිද කියලා.... "

"ඉතින් මහත්තයා හදන්නේ කෙල්ලව එහෙට දෙන්නද..."

"ඉතින් මොකක්ද ප්‍රශ්නේ... මිස්ට සාලියලා වැදගත් මිනිස්සු... ඒ කොල්ලත් තමන්ගෙම බිස්නස් එකක් කරන් පාඩුවේ ලස්සනට ජීවත් වෙනවා.. එහෙට දුන්නොත් කෙල්ල හොදින් ඉදියි.. "

"හොදින් ඉදියි.. ඒත් සතුටින් ඉදියිද මහත්තයා... මාස ගානක් ඔහේ බලාගත්ත අත බලාගෙන හිටපු කෙල්ල එක දවසට වෙනස් වුනා ඒ ළමයව දැක්ක නිසා.. ඔයාව දැකලා බයේ බිත්තියට හේත්තු වුනාට ඒ මූනේ තිබ්බ වෙනස මන් දැක්කා නිමල්... ඔයා දන්නේ නැති වුනාට ඊයේ රෑත් කෙල්ල ඒ ළමයව හම්බවෙන්න ගිහින් තියනවා... උදේ පාන්දර මං වොශ්රූම් ගිහින් එද්දි දැක්කා ජේනි කාමරේට යනවා... මාස ගානකින් මගේ කලින් හිටපු දගකාර කෙල්ලව දැක්කේ මහත්තයා.... මං හිතන්නෑ ඒ දරුවා නැතුව ජේනි සතුටින් ඉදියි කියලා.... "

"මොනාද රේනු කියන්නේ... මහ රෑ තමන්ගේ දුව කොල්ලෙක් හම්බෙන්න ගිහින් ආවා කියලා ඔයා කොහොමද බය නැතුව කියන්නේ ආ... ඔයාට මට හරි

පුතාට හරි කියලා එයාට අවවාද කරවන්න තිබ්බා... ගෑනු ළමයෙක් ඔහොම හැසිරෙනවද.."

"අවවාද දෙන්න ඔය දෙන්නව මොකටද නිමල්... මට මගේ කෙල්ලව විශ්වාසයි.. කවදාවත් පවුලේ නම්බුවට කැළලක් වෙන දෙයක් එයා කරන්නේ නෑ... අනික අර දරුවාට මං මගේ පුතා කියලා කිව්වේ වචනෙට විතරක් නෙවෙයි... ඉතින් අම්මා කෙනෙක්ට තමන්ගේ පුතාව විශ්වාස නොකර ඉන්න හේතුවක් නෑ... "

"දැන් ඔයා කියන්නේ මං වැරදියි කියලද... "

"මං දන්නෑ නිමල්... ඔයාගෙන් ඉල්ලන්නේ මං අසරන වුනා වගේ මගේ දූවවත් අසරන කරන්න එපා... ඒ තීරනෙ නිසා මං අද පසුතැවෙන්නේ නැති වුනත් ඔයා දන්නවා ඒ කාලේ මං කොච්චර ඇඩුවද දුක් වුනාද කියලා අම්මලා දාලා ආපු එක ගැන.. මන් කැමති නෑ මගේ දූවත් එහෙම විඳවනවට... ඒ මගේ දූව මට එයාව හොඳට කියවන්න පුලුවන්... නිතිනු පුතා නැතුව එයා කවදාවත් සතුටින් ඉන්න එකක් නෑ... මං කරා වගේ එයා අපිව දාලා නම් යන්නේ නැති වෙයි.. ඒත් එයා ජීවිත කාලෙම දුක් විඳියි... අනික අර දරුවා වැරැද්දකට කියලා කරේ දූවට ගහපු එකනේ.. ඒකත් කරේ මතකේ නැතිවෙච්ච නිසානේ... ඒ දරුවගේ ඇස් වලින් පේනවා ඒ වෙනුවෙන් කොච්චර පසුතැවිලි වෙනවද කියලා... මේක ටිකක් තේරුම් ගන්න නිමල් ඒ ළමයට කාත් කවුරුත් නෑ... ඒ නිසා දූවට පිස්සුවෙන්

වගේ ආදරේ කරන්නේ එයා.. එයා නොලැබුනා කියලා මොනාහරි කරගත්තොත්... ජීවිත කාලෙම ඔයාගේ දුව ඔයාට වෛර කරාවි...

අම්මගේ වචන මට ඇහුනේ හීනෙන් වගේ.. කන් අස්සේ දෝන් කාර දුන්නා "එයා නොලැබුනා කියලා මොනාහරි කරගත්තොත් " කියන වචන ටික.. අතේ තිබ්බ ෆෝන් එකත් බිම වැටිලා කුඩුවෙද්දි ඒ සද්දෙට අම්මයි තාත්තියි කාමරෙන් එලියට ආවේ...

"අම්මේ.. එහෙම නැතුව ඇති නේද.. මගේ නිතිනු අයියට මුකුත් වෙලා නැතුව ඇති නේද... කියන්නකෝ එහෙම නැතුව ඇති නේද"

"දෝනි.. මොකද මේ.. සන්සුන් වෙන්න..."

"නි..නිතිනු අයියා ෆෝන් එක ආන්ස කරන්නෑ අම්මේ... මන් හේශාන් අයියට කෝල් කරා... එයා ගෙදර ගිහිනුත් නෑලු... හය්යෙන් වහිනවත් එක්ක... මට බයයි.. ඉහි ඉහි ඉහි..."

"හරි හරි දෝනි කලබල නොවී ඉන්නකෝ... මමයි අයියයි පොඩ්ඩක් බලන්නම්.. අඩන්නැතුව ඉන්නකො... පුතා... පුතා ඉක්මනට එන්න..."

"ම..මන් එනවා... "

අයියා එන්නත් කලින් මත් දුවලා ගිහින් දෙර ඇරියේ කාර් එකට ගිහින් දෙර වහගන්න හිතාගෙන... නැත්තම් එයාලා මාව එක්ක යන්නෑ කියලා මත් දන්නවා..... ඒත් දෙර ඇරපු ගමන් මත් දැක්ක දේ නිසා කකුල් දෙක පන නැතුව ගියා...

නිතිනු අයියා වැටිලා හිටියේ දෙර ගාව... සම්පූර්ණයෙන්ම තෙමිලා වතුර බේරෙනවා... මං ඉක්මනට එයාව ඔඩොක්කුවට අරන් තට්ටු කරත් එයාට සිහිය තිබ්බේ නෑ...

"තාත්ති... තාත්ති... අනේ එන්නකෝ.. නිතිනු අයියට මොනාද්දේ වෙලා... බලන්නකෝ.. නිතිනු අයියේ.. අයියේ.. නැගිට්ටන්නකෝ... නැගිට්ටන්නකෝ... රත්තරන්..."

"පුතා ඉක්මනට වාහනේ ගන්න.. හොස්පිට්ල් යමු.. ද්නේනි ඔයා අම්මත් එක්ක ගෙදර ඉන්න අපි එයාව හොස්පිට්ල් එකට අරන් යන්නම්.. "

"බෑ මාත් එනවා... මං නිසයි එයාට මෙහෙම වුනේ... එයාට මං ඇරෙන්න කවුරුත් නෑ... මමත් එනවා... මාව එක්ක යන්න..."

තාත්තයි අයියයි නිතිනු අයියව උස්සන් යද්දී මං පස්සෙන් දුවන් ආවා කෑ ගහගා..

පිටිපස්සේ ශීට් එකෙන් වාඩි වෙලා එයාව ඔඩොක්කුවෙන් තියන් හොස්පිට්ල් එකට යනකම්ම ආවේ ඉබ ඉබ.. එදත් මෙහෙම නිතිනු අය්යා හිටපු විදිහ මතක් වෙද්දි පපුව ගැලවිලා යන තරම් වේගෙන් ගැහෙනවා...

ඉමජෙන්සි යුනිට් එක ඉස්සරහ පිස්සුවෙන් වගේ එහාට මෙහාට ගියේ වතුර බේරි බේරි... අයියයි තාත්තියි මොනාදේ කිව්වත් ඒ කිසිම දෙයක් ඇහුනේ නෑ මට.. ටික වෙලාවක් යද්දී ඩොක්ටර් එලියට ආවා... මං ඩොක්ටර් ගාවට දුවන් ආවේ විදුලි වේගෙන්..

"ඩොක්ට... එයාට කොහොමද.... "

"මේ දැන් ගෙනාපු පේශන්ගේ කවුද..."

"මං.. මං එයාගේ වයිෆ්..."

"එයාට ලගදි මොකක් හරි අසනීපයක් වගේ තිබ්බද..."

"ඔව් ඩොක්ටර්.. එයාට ඇක්සිඩන්ට් එකක් වුනා.. "

"ඒක තමයි... ඔහොමද හස්බන්ව බලාගන්නේ... එයා තාම ෆුලි රිකවරි වෙලා නෑ පිටින් හොදට පේන්න හිටියට.... ඉතින් තාම එයාගේ ඉමියුනිටි සිස්ටම්(ප්‍රතිශක්තිකරන පද්දතිය) එක වීක්.. එහෙම තියෙද්දී එයා ඊයේ රෑ ඉදන් මුකුත් කාලා නෑ... පැයගානක් වැස්සේ තෙමිලා තියෙනවා...

ඒක නිසා තමයි කලන්තේ දාලා තියෙන්නේ.. තව ටිකකින් වෝඩ් එකට දයි... සමහර විට හය් ෆීවර් එන්න පුලුවන්... ඒ නිසා දවසක් දෙකක් හොස්පිට්ල් ඇඩ්මිට් කරලා තියන්න වෙයි.. ඔයිට වඩා ටිකක් හස්බන් ගැන හොයලා බලන්න... මොනාහරි වුනාම විතරක් බොරුවට අඩලා වැඩක් නෑ... "

ඩොක්ට මට බැනලා ගියාට පස්සේ මං එතනම බිම ඉදගත්තා... ඊයේ රෑම එයා මාව වඩාගෙන ගිටියා.. එයා කෑවද කියලවත් ඇහුවේ නෑ මං.. අදත් කන්නේ නැතුව එන්නැති මාව බලන්න තියෙන හදිස්සියට.. එහෙම වෙලත් මං එයාගේ ගැන පොඩ්ඩක් වත් ඇහුවේ නෑ... මං මහ ආත්මාර්තකාමී කෙල්ලෙක්..

දනිස්සට ඔලුව තියන් අඩද්දි තාත්ති මාව නැගිට්ටෙව්වා...

"එයා මාව ඉල්ලගන්න ඇවිත් තියෙන්නේ කන්නෙවත් නැතුව.. "

මං තාත්ති දිහා බලන් කියද්දි එයා සුසුමක් හෙලලා මාව බදගත්තා..

# 47 කොටස

"ආරු කියන්නේ කවුද...."

නර්ස් කෙනෙක් කතා කරද්දි මන් තාත්තිගෙන් මිදිලා එයා ගාවට දුවන් ආවා...

"ඔයාද ආරු කියන්නේ... ඇතුලේ ඉන්න පේශන් කලබල කරනවා.. ප්ලීස් පොඩ්ඩක් එයාව කන්ට්‍රෝල් කරගන්න පුලුවන්ද බලන්න.. අනෙක් පේශන්ස්ලටත් කරදරයක්.."

නර්ස් කිව්වේ නොරුස්නා ගතියෙන්.. මං එයාටත් ලා හිනාවක් දීලා ඉක්මනට ඇතුලට ගියා... මං යනකොටත් තිතිනු අය්යා හිටියේ කැතියුලා එකෙන් සේලයින් එක ගලවන්න හදන ගමන්... මාව දැක්කා විතරයි එයා ඒක නවත්තලා අමාරුවෙන් හිනා වුනා..

"චූටි මැනික........."

"මොනාද කරන්නේ ඔය... ඇයි ඔය සේලයින් එක ගලවන්න හදන්නේ... චුට්ටක්වත් ඔයා ගැන හිතන්නේ නැත්තේ ඇයි අයියෙ ඔයා... "

"සැරකරන්නේ ඇයි... පව් නැද්ද මං.. ඔයා ගාවට

එන්නනේ හැදුවේ.... බබා නතියෙන් තාත්තිගෙන් බැනුම් අහයි කියලා බය හිතුනා... "

පොඩි එකෙක් වගේ කුරු කුරු ගානවා... මං අනික් පැත්ත හැරිලා ඇස් වලට උනපු කඳුලු පියදගත්තා.. එයාගේ ආදරේ දරාගන්න අමාරුයි මට... මෙච්චර අමාරුවෙන් ඉද්දිත් එයා හිතන්නේ මං ගැන...

"මට ඔච්චර ආදරෙ කරන්න එපා තිනූ.. ඒක මට දරාගන්න අමාරුයි.. මං ගැන හිතන්න කලින් ඔයා ගැන හිතන්න.. ඉස්සල්ලාම ඔයාට ආදරේ කරන්න.. ඊට පස්සේ මට ආදරේ කරන්න.."

මං කිව්වේ වටපිට බලලා එයාගේ නලලට හාදුවක් දීලා... මන් කියන ඒවා ගානකටවත් නොගෙන එයා ඇස් පියාගෙන මගේ හාදුව විදිනවා...

"ම්ම්ම් එකක් මදි.. ගොඩක් ඕනේ.... මෙහෙම ඉන්න බෑ... මගේ ලගට එන්න.. සීතලයි මට..."

"තුරුල් කරගන්න බෑනේ රත්තරන්... බැනුම් අහන්න වෙනවා.. ගවමන්ට් හොස්පිටිල් එකක ඉන්නේ... මෙතන්ට උනත් මාව එව්වේ ඔයා කලබල කරපු නිසා.. "

"ගවමන්ට් හොස්පිටිල් එකක්... ??"

"හ්ම්ම් හදිස්සියට ලගම තිබ්බ හොස්පිට්ල් එකට අරන් ආවේ... "

නිතිනු අයියා වටපිට බල බලා අහද්දි මන් උත්තර දුන්නේ ඔලුව අතගාන ගමන්... මන් හිතන්නේ එයා ජීවිතේ පලවෙනි වතාවට තමයි ගවමන්ට් හොස්පිට්ල් එකකට එන්න ඇත්තේ... ඒකයි කුතුහලෙන් වගේ බලන්නේ..

"මට මොනාද උනේ චූටි.... කොහොමද මන් හොස්පිට්ල් එකට ආවේ... "

"මොනාද උනේ.... ?? දෙන්න හිතෙනවා මට හොද ගුටියක්.. ඇය් ඊයේ ඉදන් කෑවේ නැත්තේ... ඒ මදිවට වැස්සේ ගේ ඉස්සරහ ඉදන් හිටියේ ඇය්... සිහිය නැතිවෙලා ඉද්දි මන් කොච්චර බය වුනාද කියලා දන්නවද... "

"සොරි බබා.. මන් ඒක එච්චර හිතුවේ නෑ... කේන්ති ගන්න එපා... කවුද මාව අරන් ආවේ... "

"තාත්තියි , අයියයි "

මන් එහෙම කියද්දි එයා හොද හුස්මක් පිට කරලා මන් බිම බලාගත්තා..

"දැන් එයාලා තවත් මට අකමැති වෙයි නේද බබා.. "

"ඇයි එහෙම කියන්නේ... "

"පොඩ්ඩක් ඇත්තත් කලන්තේ දන මිනිහෙක් ට දුවව දෙන්න කැමති කවුද බබා.. මට ඔයාව බලාගන්න බැරි වෙයි කියලා එයාලා හිතයි.. ඒකේ වැරැද්දකුත් නෑනේ... එදත් තව පොඩ්ඩෙන් ඔයාව බේරගන්න මට බැරි වෙනවා.. "

"මොනාද කියන්නේ අයියෙ ඔයා... ඔයාට මෙහෙම උනෙත් මං නිසා.. මාව බේරගන්න ගිහින්නේ ඔයාට තුවාල උනේ... ඔයා මට පොරොන්දු වුනා නේද ආයේ ඔයාව පහත් කරලා කතාකරන්නේ නෑ කියලා.. ආයේ ඔහොම කිව්වොත් එහෙම මං යනවා යන්න... "

"සොරි මැනික... මට කියවුනා.. කියන්නකෝ දැන්ම මේක ගලවන්නේ නැද්ද... ගෙදර යන්න ඕනේ.... ඔයාගේ තුරුලට වෙලා ඉන්න.."

"ඩිස්චාර්ජ් කරනවා කිව්වේ හෙට විතර තිනූ.. ඩිස්චාර්ජ් කරත් මට ඔයත් එක්ක ගෙදර යන්න එන්න බෑනේ රත්තරන්... තාත්ති එන්න දෙන එකක් නෑ... දැන් මුකුත් හිතන්නේ නැතුව දෙය්යගන්නකෝ... ඔයාට කතා කරන්න හොද නෑ... "

"අනේ මට ලෙඩක් නෑ... මොකටද තියන් ඉන්නේ මෙහේ... අඩුම ගානේ වෝඩ් එකට දැම්මහමවත් පුලුවන් වෙයිද ඔයත් එක්ක නිදහසේ ඉන්න..."

"එහෙම බෑ තිනූ බබා.. ප්‍රයිවට් හොස්පිට්ල් වගේ එක එක්කෙනාට වෙන වෙනම රූම්ස් දෙන්නේ නෑනේ මෙහේ... වෝඩ් එකේ එක දිගට ඇදන් දලා තියෙන්නේ.. "

"මට බෑ එහෙම ඉන්න... කියලා ඩිස්චාර්ජ් කරගමුකෝ... මට ඔයා ගාව ඉන්න ඕනේ... අනේ මන්ද මන් තනිවෙලා වගේ දැනෙනවා... "

"ඔයා තනිවෙලා නෑනේ රත්තරන්... මං ඉන්නවා ඔයත් එක්ක.. රෑට හය් ෆීවර් එන්න පුලුවන්ලු... ඒකයි තියාගන්නේ.. හොද ලමයා වගේ ඉන්නකෝ... හචින්..

කියලා ඉවරවෙන්නත් කලින් මට හචින් එකක් ගියා... නිතිනු අයියා ඒ වෙලාවේ තමයි මගේ උඩ ඉදන් පහලට බැලුවේ..

"ඕ මයි ගෝට්.. බබා ඔයා හොදටම තෙමිලනේ... මාව අරන් එද්දිද තෙමුනේ.. ඇයි දරුවෝ තෙත පිටින් මෙතන හිටියේ... දැන් ගෙදර යන්න.. ලෙඩ වෙයි ඔයා.."

"මෙච්චර වෙලා මං ගාව ඉන්න ඕනේ කියලා දැන් කියනවා යන්නලු.."

"ඔයා ගාව ඉන්න ආසයි තමයි... ඒත් ඔයාට පුංචි ලෙඩක්වත් හැදෙනවට මං බයයි මැනික... හොද බබා වගේ ගෙදර යන්න... ආ මත් ඇදන් හිටිය කලිසමේ පර්ස් එක ඇති... කාඩ් එක අරන් ගිහින් ඇදුම් ටිකක් ගන්න... මෙහෙ නෑනේ ඔයාගේ ඇදුම්... "

"හ්ම්ම්.. මං ගිහින් එන්නම්.. කලබල නොකර ඉන්න ඕනේ හොදද.. බෙහෙත් බීලා හොද ලමයා වගේ ඉන්න... නැත්තම් දෙනවා මං ගුටි..."

මං එයාගේ මූන අතගගා කියද්දි මත් දිහා බලන් ඉන්නවා මූන දෙක කරන්.. එයාට කිස් එකක් දෙන්න තියෙන ආසාව බොහොම අමාරුවෙන් පාලනය කරන් මත් එලියට ආවේ නර්ස් කෙනෙක් දුන්න එයාගේ බඩු ටිකත් අරන්... බෑ කිව්වොත් ඒකටත් හිත රිද්දව ගන්න නිසා හා කිව්වා මිසක් එයාගේ සල්ලි නාස්ති කරන්න අදහසක් නම් මට තිබ්බේ නෑ...

තාත්තයි අයියයි කිසි කතාවක් නැතුව කාර් එකට ආවේ මමත් පස්සෙන් එද්දි... ගෙදර යනකම්ම කවුරුත් මුකුත් කිව්වේ නෑ... ගේ ඇතුලට යද්දීම අම්මා දුවන් ආවේ මං ලගට...

"දේනි.. අර ලමයට දැන් මොකද... ලොකු ප්‍රශ්නයක් නෑ නේද... "

"නෑ අම්මා.. එයා ඊයේ රෑ ඉදන් කාලා නෑලු... තාම හරියට සනීප වෙලා නැති නිසා පොඩ්ඩක් බොඩි එක වීක් වෙලා කිව්වා.... උන හැදෙය් කියලා හොස්පිට්ල් එකේ තියාගත්තා..."

"එහෙනම් හොදයි... මං බයේ හිටියේ ඒ දරුවට මොනාහරි වෙය් කියලා... පව්.. අම්මත් නැති අහිංසක කොල්ලා... "

අම්මා බර හුස්මක් පහලට දලා එහෙම කියද්දි අප්පච්චි සද්ද නොකරම කාමරේට ගියා... අයියනම් අපූ ගමන් බාත්රූම් එකට දුවලා සූපුරුදු පරිදි අම්මට කෑ ගැහුවා ටවල් එක ගේන්න කියලා....

කාමරේට ගිහින් මං කල්පනා කරේ මොකක්ද අදින්නේ කියලා.. ඒත් එක්කම අම්මා කාමරේට ඇවිත් මගේ අතට බෑග් එකක් දුන්නා... එකේ තිබ්බේ ගෙදරට අදින ඇදුම් දෙකක්.. එයා ගෙදරින් එද්දි අරන් ඇවිල්ලා.. මං වොශ් එකකුත් දාගෙන ඒ ඇදුම ඇදගත්තා..

කාමරේ එහාටයි මෙහාටයි ඇවිද ඇවිද මත් කල්පනා කරේ කොහොමද හොස්පිට්ල් එකට යන්නෙ කියලා... තාත්තියි අයියයි කීයටවත් යන්න දෙන එකක් නෑ... ඊයේ රෑත් එයාව බලන්න කවුරුත් ගියේ නෑ...

පවු එයා මග බලන් ඉන්න ඇති... කල්පනා කර කර ඉද්දි කාර් එකක් හෝන් කරන සද්දයක් ඇහුන නිසා මන් සාලෙට ගියේ... ඇවිල්ලා තිබ්බේ හේශාන් අයියා..

"සුදූ... ඉක්මනට ලෑස්ති වෙලා එන්නකෝ.. අරූ අරගේ ඇස් පිල්ලම් ගහන්නෙත් නැතුව බලන් ඉන්නවා එනකන්.. කන්නෙත් නෑ... "

මගේ ඇස් දෙක පොල් ගෙඩි සයිස් උනා ඒ කතාවට... කරත් ඇරන් මං බැලුවේ පත්තරේ විස්තරේ බලන තාත්ති දිහා... එයා ඇහුනේ නෑ වගේ ටීවි බලනවා... හම්බෙච්ච චාන්ස් එකෙන් උපරිම ප්‍රයෝජන අරන් මන් දුවන් ආවා කාමරේට... ගමන් අඳින්න වෙන ඇඳුම් නැති නිසා ඇදන් ආපු ඇඳුමම ඇඳගත්තා..

ඇඳගෙන එලියට එද්දි අයියා හේශාන් අයියා එක්ක කතා කර කර හිටියත් මං දිහා බැලුවෙවත් නෑ... අම්මා ඇස් දෙකෙන් ඉගිකරලා මාව කුස්සියට කතාකරගෙන අතෙන් තිබ්බේ ලොකුම ලොකු බත් පාර්සල් එකක්... මං එයාව බදගත්තා දැනුන සතුටට... නිතුනු අය්යට කන්න කලින්ම බඩ පිරෙයි අම්මා එයා වෙනුවෙන් බත් එකක් එව්වා කියලා..

බත් එකත් බෑග් එකට දාගෙන මං බිම බලාගෙන ගෙයින් එලියට ආවේ... දැන් තාත්ති කෑ ගහයි දැන් තාත්ති කෑ ගහයි කියලා බයේ ආවත් එයා හැසිරුනේ මාව දැක්කේ

නැති ගානට.. දෙරෙන් එළියට ආපු ගමන් මන් හේශාන් අය්යගේ කාර් එක ඇතුලට ගිහින් දෙර වහගත්තේ විදුලි වේගේන්.. හොද වෙලාවට ලොක් කරල තිබ්බේ නෑ... මගේ පිටිපස්සෙන්ම හේශාන් අය්යා හිනාවෙවී සාක්කුවට අතදන් බලන් ඉන්නවා... ඔලුවත් දෙපැත්තට වන වන හිනා වෙලා ඇවිත් කාර් එකෙන් වාඩි වුනා..

"ඉක්මනට යන්... තාත්ති බනින්න කලින්.."

"තාත්ති බනින්නේ නෑ මෝඩියේ.. මං එයාලගෙන් පර්මිශන් ගත්තා... "

එයා කියන්නේ මගේ නහය මිරිකන ගමන්... මං හිනාවෙද්දි එයා අතත් එහෙම තියාගෙන ටික වෙලාවක් බලන් හිටියා... මං ඇස් ඉස්සරහින් අත එහෙට මෙහෙට කරද්දි තමයි එයා ගැස්සිලා පියවි සිහියට ආවේ... එකපාරටම අනික් පැත්ත බලලා කාර් එක ස්ටාට් කරා... එයා ලොකු අපහසුතාවයකින් ඉන්න වග නම් මට හොදට තේරුනා...

"කොහෙද යන්නේ මේ... හොස්පිටල් එකට යන්නේ අර පැත්තෙන්නේ.."

මං ඇහුවේ එයා හොස්පිටල් එක පැත්තට නැතුව වෙන පැත්තකට හැරෙව්ව නිසා..

"ඇයි අයියා කිව්වේ නැද්ද නිතිනුව කොලඹ අරන් ගියා කියලා.. "

"කොලඹ..?? අනේ ඇය් ඒ එයාට අමාරු වුනාද... මොකක්ද උනේ එයාට..??"

"නෑ සුදූ... ප්‍රය්වට් හොස්පිට්ල් එකකට අරන් ගියා... "

"ආහ්.. එයාට ගවමන්ට් ඒවගේ ඉන්න අමාරු ඇති... පුරුදු නෑනේ... අපිට පුරුදු වුනාට.. "

මං කිව්වේ ඔඩොක්කුවට ඇස් යොමු කරන්..

"එහෙම නෑ සුදූ... ඒකා යන්න බෑ කියද්දි ඔයාලගේ අයියා තමයි කිව්වේ කොහොමහරි අරන් යන්න කියලා.... කෝකටත් හොදයි නේ කලින් ට්‍රීට්මන්ට්ස් කරපු හොස්පිට්ල් එකට යන එක.. ඒ නිසා යැව්වේ.. නිතිනුවා නම් කෑ ගැහුවා මේ හොස්පිට්ල් එක ළග නිසා ඔයා ඉක්මනට එන්න පුලුවන් ලු , ඒ නිසා යන්න බෑ කියලා.. බොහොම අමාරුවෙන් එක්කන් ගියේ... "

"අපෙ අයියා කිව්වා නිතිනු අයියව ඒ හොස්පිට්ල් එකට යවන්න කියලා ?? ඒත් එයා තරහයි නේ නිතිනු අයියත් එක්ක.."

"ඔයා දන්න්වනේ සුදූ... අයියට තරහ හිතේ තියන් ඉන්න බෑ කියලා.. පොඩ්ඩක් ඇත්තන් උනු වෙනවනේ.. ඌට නිතිනු ගැන හොයලා බලන්න ඕනේ ඒත් උගේ ලොකුකම වැඩියි ඔක්කොටම වඩා... ඒකයි මෙතන ප්‍රශ්නේ... "

හේශාන් අයියා හිනාවෙවී කියද්දි මාත් එයත් එක්කම හිනා වුනා.. එයා හරි අපේ අයියා හරි සංවේදි කෙනෙක්..

කොලබට යන්න තියෙන දුර මට දැනුනේ ගව් ගානක් වගෙයි.. ඒ නිතිනු අයියව දකින්න තියෙන උවමනාවටත් වඩා හේශාන් අයියගෙ අමුතු හැසිරීම නිසා.. සැරෙන් සැරේ එයාගේ බැල්ම මං ගාව නවතිනවා මං දැක්කා.. මං එයා දිහා බලද්දිම එයා අහක බලා ගන්නවා..

හොස්පිට්ල් එකට ගිහින් කාර් එක නවත්තලා එයා මන් බහින්න කලින් මගෙ අත අල්ලගත්තා... මං ඇස් ලොකු කරන් බලන් ඉද්දි එයා මට ඉදගන්න කියලා ඇස් වලින් ඉගිකරලා ලොකු හුස්මක් පහතට හෙලුවා..

"සුදූ.. මට විනාඩි පහක් දෙන්න පුලුවන් ද.. මට ඔයාට දෙයක් කියන්න තියෙනවා... "

"මො.. මො.. මොකක්ද..?"

"මන් මේ කියන දේ අහලා වැරදියට හිතන්න එපා... මේ දේවල් කියන්නේ කිසිම දෙයක් බලාපොරොත්තුවෙන් නෙවෙයි... හිතේ තියන් ඉද්දි බර වැඩි නිසා.. මට මේ දේවල් ඔයාට කියලා හිත නිදහස් කරගන්න ඕනේ.. සමහරවිට මේ දේවල් කිව්වමම ඔයාට තරහ යයි... පුලුවන්නම් මට කලින් විදිහටම සලකන්න.. "

"මො... නා ගැනද කියන්නේ... "

"මං ඔයාට ආදරෙයි සුදූ... ගොඩක් ආදරෙයි.. "

දැනුනේ මට හදවත නතර වුනා වගේ... කලින් එයා මට ආදරේ කරනවා කියලා දැනන් හිටියත් ඒක මූනටම කියද්දි මන් ගැස්සුනා..

"ඒ... ඒ..ත්... අය්යේ.. "

"මන් දන්නවා ඔයා මන් ගැන හිතන්නේ ඔයාගෙම අයියා කෙනෙක් වගේ කියලා.. ඒකට කමක් නෑ මට.. ආපිට ඔයාගෙන් ආදරයක් බලාපොරොත්තු වෙන්නේ නෑ මං.. දන්නවා ඔයා මුලු හිතෙන්ම තිතිනුගේ වෙලා ඉවරයි කියලා.. ඒත් මට මේක කියන්න ඕනේ උනා...

දන්නවද ඒ කාලේ ගොඩක් සෙල්ලක්කාර චරිතයක්.. ගෑනු ලමයි ගොඩක් හිටියා මට.. ඒත් ආදරේ ගැන ලොකු හැඟීමක් දැනුනේ ඔයාව පලවෙනියට දැක්ක වෙලේ..

මතකද මන් ඉස්සල්ලාම ඔයාලගේ ගෙදර ගියපු වෙලේ ඉස්කෝලේ ගිහින් ඇවිත් ආරාධ්‍ය කියලා හිතන් මගේ පිටේ නැග්ගා... එදා තමයි මට මුලින්ම ආදරයක් හිතට දැනුනේ.. ආරාධ්‍ය එක්ක හැමවෙලේම වගේ ඔයාලගේ ගෙදර ආවේ ඔයාව බලන්න... ඒකාලේ චූටි කෙල්ලෙක් නිසා මන් කිව්වේ නෑ... ඔසී ගිහින් ඇවිත් ආරාධ්‍යට කියනවා කියලා හිතන් හිටියේ... ඒත් මට කලින් නිතිනු ඉස්සර උනා... දුකක් නෑ කිව්වොත් බොරු.. මමත් මනුස්සයෙක් නේ මං ආදරේ කරන කෙල්ල වෙන කෙනෙක් ගාව ඉද්දි මට දුක හිතෙනවා ඉරිසියා හිතෙනවා... ඒත් ඔක්කොටම වඩා නිතිනු වගේ කෙනෙක් ඔයාට ලැබිච්ච එක ගැන සතුටු වෙනවා.. හැමදාම එයා එක්ක සතුටින් ඉන්න... ඔයාට ඕනෙම දේකට මන් ඉන්නවා... අනික් අය වගේ මන් කියන්නෑ ලබන ආත්මෙවත් මගෙ වෙන්න කියලා.. මොකද ලබන ආත්මෙටත් නිතිනු ඔයාව මට නම් දෙන එකක් නෑ... "

හේශාන් අයියා ඉස්සරහ බලාගෙන ඒ ටික කිව්වේ... ඒ ඇස් වලට උනපු කඳුලක් ඉක්මනට පිහදන් මං දිහා බැලුවා හිනා වෙලා.. මට ලොකු දුකක් දැනුනා එයා ගැන... ඒත් මට කරන්න පුලුවන් දෙයක් නෑ... එයා කිව්වා වගේ මගේ හිත පුරාම ඉන්නේ නිතිනු අයියා..

"ම..මට සමාවෙන්න අයියේ.. "

"ඇයි ඔයා සමාව ගන්නේ සුදූ... ඔයා වැරැද්දක් කරලා

නැතේ... ඒක මගේ නොලැබීම.. මත් කියපු දේවල් අමතක කරලා පුලුවන් නම් කලින් වගේ සලකන්න මට.. ඔයාගෙම අයියට වගේ.. හිතට බල කරලා හරි මං ඔයාව මගෙ චූටි නංගි කියලා හිතාගන්නම්.."

එයා එහෙම කියද්දි ඇඬුනා මට.. තමන් ආදරේ කරන කෙනා වෙන කෙනෙක්ට ආදරේ කරනකොට දැනෙන වේදනාව මං හොදටම දන්නවා.. ඒත් එයාට හොද කෙනෙක් ලැබෙන්න කියලා ප්‍රාර්තනා කරනවා ඇරෙන්න මට කරන්න පුලුවන් මොනාද...

"ඒය් මෝඩ් අඩනවද.. හය්යෝ කොයි වෙලාවෙත් හොටු පෙරනවා.. මෙන්න මෙහෙ එනවා යන්න... අරුගේ ඇස් ගෙඩි දෙක බිම වැටෙනවා බලන් ඉදලා.. යන් යන්.. මට අවුලක් නෑ... මං කොහොමත් කිසි දෙයක් ගනන් ගන්නේ නැති මනුස්සයානේ.."

හේශාන් අයියා මවා ගත්ත කටකාර කමකින් කියවලා මාවත් බස්සවන් එයත් කාර් එකෙන් බැස්සා... එයාගේ මූනේ හිනාවක් තිබ්බත් ඒක ව්‍යාජ එකක් කියලා බැලූබැල්මටම දැනුනා.. මොනාදෝ කියව කියව වෝඩ් එක ලගට වෙනකම් ආවේ... ඒත් මට ඒ දේවල් එකක්වත් හරියට ඇහුනේ නෑ... මොකද එයාගේ ව්‍යාජ හැසිරීම අස්සේ තිබ්බ දුක මත් දැකපු නිසා..

"මෙන්න උබේ කිරි කැල්ල මං අරන් ආවා... "

බෙල්ලත් හරෝගෙන දෙර දිහා බලන් ඉන්න නිතිනු අය්යට හේශාන් අය්යා කිව්වේ... නිතිනු අයියගේ මූනේ ලස්සන හිනාවක් ඇඳුනා මාව දැක්කම.. එයා නැගිටින්නත් හදපු නිසා මත් දුවන් ගියා එයා ලගට..

"සුදූ.. මත් යනවා එහෙනම්... යනකොට කෝල් කරන්න.. නිතිනුවා මත් යනවා... "

හේශාන් අයියා ගියපු දිහා මත් බලන් හිටියේ නිතිනු අයියගේ අතත් අල්ලන්.. හිතට ලොකු බරක් ඒක මට..

"ඇයි මැනික... මොකද වුනේ... "

"ත්.නෑ මුකුත් නෑ අයියේ.. "

"නැත්තේ නෑ බබා.. මං හොඳට දන්නවා ඔයා ගැන... කියන්න මොකක්ද ප්‍රශ්නේ... "

"මට.. මට දුකයි හේශාන් අයියා ගැන... "

"ඒ මොකද බබා.. "

"එයා මට ආදරෙයිලු.."

"මොකක්... ඌ එහෙම කිව්වද... "

"හ්ම්ම්"

"ඕ... ඕ.ඔයා මොකක්ද කිව්වේ... "

එයා අහන්නේ මගේ අත තද කරලා අල්ලන්..

"මන් මොනා කියන්නද අයියේ.. එයා තමයි මට ඉස්සල්ලාම ආදරේ කරලා තියෙන්නේ.. ඉතින් හරි නම් මාව අයිති වෙන්න ඕනේ එයාට නේද.."

හිනාව පාලනය කරන් මන් කිව්වේ නිතිනු අයියව පොඩ්ඩක් අවුස්සන්න හිතන්.. ඒත් උනේ මන් නොහිතපු දෙයක්..

"බෑ... බෑ... කාටවත් දෙන්නෑ... ඔයා මගේනේ.. මාව දාලා යනවද ඔයා.. මගේ අම්මිනේ ඔයා.. ඔයා නැතුව මන් ඉන්න දන්නෑ... ප්ලීස් මාව දාලා යන්න එපා... මං මැරිලා යයි... ඔයා මගේ විතරයි.."

විදුලි වේගෙන් මගෙ බඩට මූන තියන් මාව තද කරලා බදාගෙන එයා අඩන්න පටන් ගත්තේ පොඩි ලමයෙක් වගේ...

"අනේ නිනු බබා.. මොකද මේ.. මන් විහිළුවක් කරේ රත්තරන්... ඔයාව දාලා කොහෙ යන්නද මන්... ප්ලීස්

ඔහොම අඬන්න එපා...ආම් සොරි... ප්ලීස් අඬන්න එපා..."

"ඇත්තටම විහිළුවක් නේද... මාව දාලා යන්නේ නෑ නේද ඔයා.. මට බය හිතෙනවා... ආයෙමත් තනිවෙන්න බයයි මන්.."

මගේ මෝඩ වැඩේ ගැන ගොඩක් පසුතැවුනා මන්.. මන් විහිලූ කරේ එයාගේ හැඟීම් එක්ක.. මන් කියන හැමදේම එයා ඒ විදිහටම විශ්වාස කරන වග මට අමතක වුනා.. උනත් හැදිලා නිසා එයා ගොඩක් හැඟීම්බරයි අද..

ඇදෙන් වාඩි වෙලා මන් එයාව තුරුලට ගන්න කලින්ම එයා මගේ පපුවෙන් මූන තියා ගත්තා... දඩු අඩුවකට හිර කරලා වගේ තදට එයා මාව බදා ගෙන ඉන්නේ... සීතලට කදුලු කැට වැරෙනවා මට දැනුනා..

"සුදු අයියේ.. අඩන එක නවත්තන්කෝ.. ඔයා ආයේ කවදාවත්ම තනිවෙන්නේ නෑ... මන් ඔයත් එක්කම ඉන්නවා... මගේ පනතේ ඔයා.. ආදරෙයි ගොඩාරියක්.. කෝ අඬන එක නවත්තලා හිනාවෙන්න.. උම්මා එකක් දෙනෝ මං එතකොට.."

කියන පමාවට එයා මන් දිහා බැලුවා... මන් ඒ කදුලු බේරිච්ච මූනම මගේ දෙතොල් වලින් තෙමුවේ ගොඩක් ආදරෙන්.. ඇස් පියාගෙන එයා මගේ දෙතොල් පහස

විදිනවා... එහෙමම ආයෙත් මගේ පපුවට තුරුල් වෙලා හිමීට මන් දිහා බැලුවා...

"බොරුවටවත් එහෙම කියන්න එපා මට දුක හිතෙනවා.."

"මට සමාවෙන්න... මන් මහ මෝඩයි... එච්චර දුර හිතුවෙ නෑ මන්... සැරකරයි කියලා හිතුවේ... "

"සමාව ඉල්ලන්න එපා... මමයි වැරදි.. ඔයා හිතන කෙනා වෙන්න බැරි වුනා මට.. "

"එහෙම නෑ... මගේ සුදු මහත්තයා තමයි හොදම.."

"සුදු මහත්තයා.... ???"

"ඔව්නේ.. මගේ මහත්තයා සුදුයනේ.. ඉතින් සුදු මහත්තයා.... "

මං එහෙම කියද්දි එයා ලැජ්ජාවෙන් වගේ හිනාවුනා...

"චූටි මැනික... මගේ විතරයි නේද... "

ආයෙත් මූන දෙක කරන් අහන්නේ..

"හ්ම්ම්.. ඔයාගේ විතරමය්.. සොරි මෝඩ කතා කිව්වට.. ආයෙ කියන්නෑ කවදාවත්ම.."

"චූටි මැනික...  "

"හ්ම්ම්..."

"ඔයත් හිතනවද මන් ගෑනියෙක් වගේ කියලා..  "

"මොනාද අහන්නේ අයියෙ ඔයා.. මෙච්චර හැන්ඩ්සම් කොල්ලව ගෑනියෙක් වගේ පේනවා නම් ඒක මොකක් හරි ලෙඩක්.."

"පෙනුමෙන් නෙවෙයි... මං කියන්නේ හැසිරීමෙන්.. සාමාන්‍යයෙන් ඔයා කිව්ව විදිහට ඒ වගේ දේකදි පිරිමි කේන්ති ගන්නවා.. ඒත් මන් ගෑනු ලමයෙක් වගේ ඇඩුවා.."

"ඉතිම් මොකද... පිරිමින්ට අඩන්න තහනම් කිව්වේ කවුද.. මමනම් කැමති එහෙම අයට.. හැගීම් හැමෝටම පොදුයි.. කඳුලු තියෙන්නේ අඩන්න තමයි... ඇඩුවහම ඉක්මනට හිත හදගන්න පුලුවන්... දන්නවද අඩන පිරිමි අනික් අයට වඩා ශක්තිමත් ලු.. හැගීම් දැනීම් නැති ගලක් වගේ මනුස්සයෙක් එක්ක ඉන්නවට වඩා මන් ආසයි ඔයා වගේ හැගීම් ප්‍රකාශ කරන කෙනෙක්ට..  "

"ඇත්තමද.."

"හ්ම්ම්ම්.."

එයා හිනාවෙවී ආයෙත් කම්මුලක් මගේ පපුවට හේත්තු කරගෙන ඇස් පියාගත්තා... සැරින් සැරේට මූන තියෙන පැත්ත වෙනස් කරනවා.. එයා එහෙම මං ගාව හුරතල් වෙනවට මං හරි ආසයි.. ඉවගන්නම බැරිතැන ඒ මූන ඉද්තට අරන් ඉබගෙන ඉබගෙන ගියා... ඇස් පියාගෙන මූන දික් කරගෙන ඉදලා කට බෙරි කරගත්තා කිස් කරලා ඉවර වුනාම.. චූටි බබෙක් වගේ...

"මදි.. තව ඕනේ මට.."

"ඇති ඇති ඔය... දැන් නිදාගන්න.. උන හොඳටම... ගානක්වත් නැතුව ඉන්න ලස්සන.."

"බඩගිනියි මට.."

පපුවම ඇවිලිලා ගියා ඒ වචන ටිකට.. මෙච්චර වෙලා මං විකාර කර කර හිටියේ එයාව බඩ ගින්නේ තියාගෙනනේ... ඉවසගෙන ඉන්න බැරිම තැම කියන්න ඇත්තේ... පව් මගේ අහිංසකයා...

"අනේ මට අමතක වුනා අයියේ.. කෝ එන්න අපි බත් කමු.. බලන්නකෝ.. මං ලොකු බත් එකක් ගෙනාවා.."

ඇද ටිකක් කෙලින් කරලා මං එයාට බත් එක පෙන්නද්දි එයාගේ ඇස් දිලිසුනා...

"මං දැනන් හිටියා කෑම එකක් අරන් ඇවිත් මට කවයි කියලා.. ඒකයි මත් කෑවේ නැත්තේ..."

එයා මන් දිහා බලන් කියද්දි මන් එයාගේ නලලට කිස් එකක් දීලා අතහෝදන් ආවා...

"හැමදම මට ලෙඩ වෙන්න හිතයි.."

"ඒ මොකද ඒ.."

"එතකොට ඔයා මට වැඩියෙන් ආදර් කරනවා නේ.. මේ ටික වෙලාට කිස් ගොඩක් දුන්නා මට.. "

මං එයාට බොරුවට ඔරවලා නහය මිරිකුවා..

"දන්නවද.. අද ස්පෙශල් කෑම එකක් ගෙනාවේ මන්.."

"ඒ මොනාද"

"අද අම්මා එයාගේ ලොකු පුතාට එයාගේ අතින්ම උයලා පාර්සල් කරලත් දුන්නා මේ කෑම එක.."

"අම්මා...??"

## අවසානයට පෙර කොටස

"අම්මා..??"

"හ්ම්ම්ම්.. අම්මා ගොඩක් දුක් වුනා ඔයා අසනීප වුන නිසා.. උදේ මං එද්දි තාත්තිට හොරෙන් බත් එකක් දුන්නා ඔයාට දෙන්න කියලා.. "

"ඒ කියන්නේ බබා අම්මා මට කැමතියි ද ?"

"හ්ම්ම්.. මට ඇහුනා එයා තාත්තත් එක්ක ඔයාගේ හොද කියනවා.. අම්මා කැමතියි ඔයාව එයාගේ බෑනා කරගන්න... "

මන් එයාගේ කම්මුලක් අතගගා කියද්දි ඒ ඇස් දිලිසෙනවා...

"තාත්තිත් අපිට කැමති වෙයි නේද මැනික... මට ඉක්මනටම ඔයාව මගේ කරගන්න ඕනේ... ඔයා කැමතියි නේද... මැරි කරා කියලා ඔයාගේ නිදහස නැති කරන්නෑ මන්... ඔයාගේ ඉගෙනගන්න වැඩ ඔක්කොම ඒ විදිහටම කරන්න දෙන්නම් මං.. ප්ලීස් අපි ඉක්මනට මැරි කරමු.. "

"දැන්මම..??"

"ඇයි මැනික කැමති නැද්ද මගේ වෙන්න.. මං දන්නවා ඔයා නාම චූටියි කියලා.. මං හිතන් හිටියේ ඔයාට විසි පහෙන් වගේ බඳින්න.. ඒත් දැන් ඔයාලගේ ගෙදර නෙවෙයි නේ මං ඉන්නේ... එහෙම දුරින් ඉන්න බෑ වස්තු.. මට පාලුයි.. "

"හ්ම්ම් අපි මුලින්ම තාත්තිගේ අවසර අරන් ඉමුකෝ... කෝ දැන් කට අරින්න හොද බබා වගේ... "

"ඇයි බබා ඔයා මාතෘකාව වෙනස් කරේ.... ඔයා කැමති නැද්ද දැන්ම මගේ වෙන්න..? එහෙමනම් මට කියන්න.. ඔයාට බලකරන්නෑ මන්... බබාට කැමති කාලයක් ගන්න.. හැමදේකටම වඩා මට වටින්නේ ඔයාගේ සතුට.."

"අය්යෝ මෝඩයෝ... දැන් එහෙම කිව්වද මං.. මට තනි තීරනයක් ගන්න බෑනේ අයියේ.. අම්මලා මගේ වෙඩින් එක ගැන මොන බලාපොරොත්තු තියන් ඉන්නවද දන්නේ නෑනේ... ඒකයි මං එහෙම කිව්වේ... නැත්තම් මේ වගේ හැන්ඩ්සම් කොල්ලෙක්ගේ තුරුලට වෙලා ඉන්න කවුද අකැමැති.."

"ඔයා විතරයි මං හැන්ඩ්සම් කියලා තියෙන්නේ.. කවුරුත් එහෙම කියලා නෑ මට.. "

"ආඅ මන් විතරක් කිව්වහම ඇති.... හිතන් ඇති එක එක නැට්ටිච්චියන්ට කියලා හැන්ඩ්සම් කියවගන්න.. දෙන්නේ

උඩින් විසික් වෙන්න.."

"හරි ඉතිම් මං එහෙම කිව්වේ නෑනේ... මගේ රත්ඩු කෙක්ක.. කොයි වෙලාවෙත් පුපුරන්නමයි බලන් ඉන්නෙ"

"එතකොට මන් රත්ඩු කෙක්ක.. ? මට හැමවෙලාවෙම කේන්ති යනවා... ? ඒ කියන්නේ ඔයාට මාව හොද නෑනේ නේද... ඉස්සර නම් ඔයා ඔහොම කිව්වේ නෑ... දැන් මට ඒ කාලේ වගේ ආදරේ නෑ..."

බොරු ආරෝවක් අරන් මන් කිව්වේ... මාව යාලු කරගන්න එයා එක එක කෝලන් කරනවට මන් හරි ආසයි...

"අනේ එහෙම නෑ මැතික... මන් මැරුනත් ඔයාට තියෙන ආදරේ අඩුවෙන්නේ නෑ... ඔයා මගේ පනනේ... මං ආසයි ඉතින් මගේ රත්ඩු කෙක්කට.. ආදරේට එහෙම කිව්වේ... කෝ එන්න උම්මා එකක් දෙන්න.. "

තොලත් උල් කරන් එයා කියද්දි මන් බිම බලන් හිනාවුනා... මාව ඇදලා ලගට ගන්න කලින් බත් කටක් කටේ එබුවා.. මූන දෙක කරන් බත් කට කටට ගත්තේ... බත් කටවල් දෙක තුනක් කද්දිම එයාගේ ඇස් වල කදුලු පිරුනා..

"අනේ ඇයි අයියෙ මේ.. මිරිස් කරලක් වත් හැපුනද ඔයාට.. සොරි මන් දැක්කේ නෑ... ඉන්න වතුර එකක්

අරන් එන්නම්.."

"නෑ බබා.. මට අම්මිව මතක් උනා... එයා හිටියනම් මේ වගේ කෑම එකක් අරන් ඇවිල්ලා මට කවයි නේද... "

මොහොතක් බලන් හිටියා මන් ඒ ඇස් දිහා... මොනා කියන්න ඕනෙද කියලා මට තේරෙන්නේ නෑ... එයාගේ කඳුලු දැක්කම පපුවම පිච්චිලා යනවා මගේ..

"අඩන්න එපා රත්තරන්... අම්මා ඔයා ගාවම ඉන්නවා ඇති... ඔයාට මං ඉන්නවනේ මිමිමි... අපේ අම්මත් ඉන්නවනේ... ඉන්නකෝ අපි අම්මට කෝල් එකක් ගමු කාලා ඉවරවෙලා... දැන් හොඳ බබා වගේ කන්නකෝ.."

මං එහෙම කියනකොටම එයා ඇවිත් නැවතුනේ මගේ පපුවේ... එක අතක පිගාන අනෙක් අතේ ඉඳුල්. මං අත් දෙකත් දෙපැත්තට කරන් ගල් පිළිමේ වගේ හිටියා... එයා තව තවත් මගේ පපුවටම තුරුල් වෙනවා..

"තිනූ.... කාලා ඉන්නකෝ... බඩගින්නනෙ නේ ඉන්නේ.. හොඳ බබා වගේ කන්නකෝ.. ඊටපස්සේ තුරුල් කරන් ඉන්නම් මන්... "

"බෑ.. මට කන්න ඕනේ නෑ... මෙහෙම ඉන්න දෙන්න.."

"අනේ කන්නකො අයියේ.. බලන්නකෝ මාත් කාලා නෑ තාම... බඩත් දනවා.. ගෑස්ට්‍රික් ද කොහෙද "

පුංචි බඩගින්නක් තිබ්බත් එක දහගුනයකින් වැඩි කරලා කිව්වේ නැත්තම් එයාට කවාගන්න බැරි වෙන නිසා.. මං දන්නවා එයා එයා ගැන හිතනවටත් වඩා මං ගැන හිතනවා කියලා... හිතුවත් වගේම විදුලි වේගෙන් කෙලින් වුනා එයා..

"චූටි මැනික... ගොඩක් බඩ රිදෙනවද... අපි අපි ඩොක්ට කෙනෙක් හම්බෙන්න යං.. "

අමාරුකන් ඔක්කොම පැත්තකින් තියලා මගේ බඩ අතගාන ගමන් කියන්නේ එයා...

"බන්ඩිය නෑ... පිටද කොහෙද අහුවෙන්නේ... කෑවේ නැත්තේ ඇයි බබා.. මේ වයසෙදි හොදට කන්න ඕනේ... තාම හැදෙන වයසනේ.."

මට බකස් ගාලා හිනා ගියා ඒ කතාවට... ඉස්සර අපේ සීයත් ඔහොම කතා තමයි කියන්නේ. එයත් ඒක කීවේ නාකි සීයා කෙනෙක් වගේ...

"අනේ යනෝ යන්න නාකි සීයා.. මේ හොදට තියෙන්නේ මගේ බන්ඩිය... "

"විහිලු නෙවෙයි බබා.. අපි යමු ඩොක්ටර් කෙනෙක් හම්බවෙන්න.. ස්පෙශලිස්ට් කෙනෙක්ට පෙන්නමු.. මෙහෙ බැරි නම් පිටරටකට හරි යමු.. "

මන් කටත් ඇරන් බලන් හිටියේ එයා කියන දේවල්... බඩ දනවා කිව්වට රටත් අරන් ලෑස්තියි.. කලබලෙන් ඇදෙනුත් බහින්න යනවා..

"මොනාද ඔය කරන්න යන්නේ.. මෙන්න මෙහෙන් ඉඳගෙන මේ බත් ටික කන්න.. පොඩ්ඩක් බඩ දනවා විතරයි.. කැන්සර් එකක් හැදුනා වගේනේ ඔයා කලබල වෙන්නේ.. "

"මොනාද මැතික කියන්නේ... එහෙම දෙයක් නිකමටවත් කියන්න එපා... අහන්නත් බයයි මට.."

"අය්යෝ විහිලුවට කිව්වේ... කෝ හොද ලමයා වගේ අපි බත් කමු.. "

බත් කට එයාට දික් කරාට එයා ඒක කෑවේ නෑ... මගේ පැත්තට දික් කරා.. මන් ඒක කෑවට පස්සේ තමයි එයා කෑවේ... කොහොමහරි ඔක්කොම බත් ටික අපි දෙන්නා කාලා ඉවරකරා.. එයාට වතුරත් පොවලා මන් අත හෝදන් එද්දි අත් දෙකත් දෙපැත්තට දික් කරන් ඉන්නවා මාව ලගට ගන්න බලාගෙන.. මං හිනාවෙලා එයා ලගින් වාඩි වුනා..

"ලගට එන්නකෝ.. "

"ලගනේ ඉන්නේ මං.. "

"ඔහොම නෙවෙයි මෙතන්ට එන්න.."

කියන්නෙ එයාගේ පපුව පෙන්නන ගමන්...

"මං මෙහෙම ඉන්නම් තිනූ.. ඔයාට සනීප නෑනේ තවම... මවත් තියාගෙන ඉන්න අමාරුයි නේ... ඔය කැනියුලා එකේ මගේ අතවත් වැදුනොත් එහෙම.."

"මට අමාරු නෑ බබා.. ප්ලීස් ලගට එන්න... මං අත පරිස්සම් කරගන්නම්.. "

මූන බෙරි කරගන්නවා වලත් ඉන්න බැරි නිසා මං එයා ගාවින් හාන්සිවෙලා එයාගේ පපුවෙන් ඔලුව තියාගත්තා... එයා අත් දෙකෙන්ම මාව තුරුලු කරන් හිස් මුදුන කිස් කරනවා.. ටික වෙලාවක් එහෙම ඉදලා මං අම්මට කෝල් එකක් ගත්තා...

"හෙලෝ දේනි.... "

"අම්මේ නිතිනු අයියට ඔයාට කතා කරන්න ඕනෙලු... "

"මං අම්මට එහෙම කියලා නිතිනු අයියට ෆෝන් එක

දික්කරද්දි එයා ඇස් ලොකු කරන් බලන් ඉන්නවා... මං ඇස් වලින් ෆෝන් එක පෙන්නද්දි එයා ඒක අතට ගත්තේ බයෙන් වගේ... මං එයාගේ ෆෝන් එක අතට දීලා ආයෙත් එයාගේ පපුවෙන් මූන තියාගත්තා...

"අම්මා....."

එයා වචනෙ කිව්වේ හරි පරිස්සමෙන් කියලයි මට හිතුනේ... හිමීට මූන උස්සලා බැලුවා එයාගේ මූන.. හැඟීම්බර වෙච්ච ඒ මූන දිහාම බලන් මං ඒ පපුවෙන් හාදුවක් තිබ්බා...

"පුතේ.. දැන් කොහොමද.. "

"හොදයි අම්මා.. ආරු ආවනේ.. ඉතිම් මට සනීප වුනා එයා දැක්ක ගමන්... "

"දේනි ඊයේ රෑ ඉදන්ම ඉවසිල්ලක් නැතුව හිටියේ... පුතාව බලන්න එන්න.."

අම්මා එහෙම කියද්දි ඒ මූනේ ලස්සන හිනාවක් ඇදුනා.. එක අතකින් මාව ඇගටම තද කරන් මගේ නලල කිස් කරේ ඒ හිනාවෙන්මයි..

"කැවද පුතේ... "

"ඔව් අම්මා.. ආරූ කැව්වා මට.. අම්මගේ බත් එක හරිම රසයි.. ආරුටත් තියෙන්නේ ඔයාගේ අත් ගුනේම තමයි... එයාට තමයි මේ ලෝකේ රසම කෑම හදන්න පුලුවන්... සොරි ඔයාගේ කෑම රහ නෑ කියනවා නෙවෙයි... ආරුට පස්සේ ඔයා තමයි රසටම උයන්නේ... "

මං ඇස් ලොකු කරන් බලන් හිටියේ එයාගේ මූන... දෙය්යන්නේ අපේ අම්මා උයන ඒවා මං උයන ඒවාට වඩා දහස් ගුනයක් රසයි.. මං උයන මෙලෝ රහක් නැති කෑම එයාට මේ ලෝකේ රසම කෑමලු..

"සොරි කියන්න දෙයක් නෑ දරුවෝ... තාත්තටත් ඒ කාලේ මගේ කෑම තමයි රසම කෑම උනේ... ආදරේදි එහෙම තමයි... "

"අම්මා.. තාත්තා මට කැමති වෙයි නේද... මට ආරූ නැතුව ඉන්න බෑ අම්මා.. "

"බයවෙන්න එපා දරුවෝ.. තාත්තා කැමැත්ත දෙයි.. එයාට ජේනිගේ සතුට තමයි ඔක්කොටම වඩා වටින්නේ.... කෝ දැන් ජේනි.... "

"ඉන්නවා අම්මා.. එයාට ඉරිසියායිද කොහෙද මං අම්මා එක්ක කතා කරනවට.. මගේ පපුව හූරනවා.."

එයා එහෙම කියද්දි මං එයා දිහා ඔරවලා බලලා පපුව හැපුවා..

"ආ...ව්.."

"අම්මා මේ බලන්නකෝ.. මෙයා මාව හපනවා.."

මෙන්න බොලේ ඒ පාර මෙයා අපේ අම්මා එක්කම කේලන් කියනවා.. මං ආයෙත් සැරයක් හැපුවා එතනම.. ඒ පාර නම් එයා හිනාවෙනවා...

"ඔය කෙල්ල ඔහොම තමයි පුතා... පොඩි කාලෙ ඉදන් අපි තුන් දෙනාව හපනවා... ලොකු වුනා කියලා වෙනසකුත් නෑ... කතා කර කර ඉන්න ගමන් හපනවා... "

බෑනටම හරි යන්න ඒ පාර අම්මගෙත් කතාව.. මං බුම්මගෙන මූන අනික් පැත්ත හැරුනා...

"මෙයා කොහෙද ලොකු අම්මා.. මගෙන් බාගයක්වත් නෑ... පුලුන් කෑල්ල වගේ තනි අතට උස්සන්න පුලුවන්... කොහෙද කන්න කිව්වට කන්නෙත් නෑනේ... කුරුල්ලෙක් වගේ බත් චුට්ටක් කන්නේ... "

"කියලා වැඩක් නෑ පුතේ... ගුන දෙයක් කන්නෙම නෑනේ... ඒකට කඩචෝරු මොනාහරි දුන්නනම් දවසෙම උනත් කයි"

"ඒකනම් ඇත්ත අම්මා.. චොක්ලට් එහෙම ගෝනියක් දුන්නත් කයි.."

නැන්දම්මයි බෑනයි බර කයියක.. මං කියලා ජීවියෙක් මෙතන ඉන්නවා කියලවත් මතක නෑ... බිත්තියට ඔරව ඔරවා හිටියේ වෙන කරන්න දෙයක් නැතිවට...

"ඔයාට පින් අම්මා.. මං වෙනුවෙන් ආරුව මේ ලෝකෙට ගෙනාවට... එයා නිසා මං ගොඩක් සතුටින් ඉන්නේ... තැන්ක් යූ එයාව ලස්සන හදවතක් තියෙන සුරංගනාවියක් කරාට.. මං ගොඩක් වාසනාවන්තයි එයාව ලබන්න.."

"අනේ මොනාද කියන්නේ දරුවෝ... මගේ කෙල්ලයි වාසනාවන්ත ඔයා වගේ කෙනෙක් ලබන්න.. දෛනිට ගැලපෙන්නෙම ඔයා වගේ කෙනෙක්.. බය නැතුව ඉන්නකෝ මං තාත්තිත් එක්ක කතා කරලා කැමැත්ත ගන්නම්.. මං තියන්නම්... තාත්තා එනවද කොහෙද.. බුදු සරනයි.. පරිස්සමෙන් ඉන්න මගේ දරුවෝ.... "

"හරි අම්මා.. බුදු සරනයි.. "

කෝල් එක කට් කරලා එයා මාව තුරුල් කරන් කිලෝමීටරයක් විතර දිග හාදුවක් දුන්නා.. මං තාමත් හිටියේ ඔරෝගෙන..

"ඇයි මගේ චූටි මැනික ඔරෝගෙන ඉන්නේ කෝ හිනාවෙන්න මගේ වස්තුවේ... "

මාව දෙපැත්තට පද්ද පද්ද මූනටම එබිලා කියද්දි මං හිනාව පාලනය කරන් හිටියේ බොහොම අමාරුවෙන්.. ඒත් එක්කම කවුරු හරි දොර ඇරන් කාමරේට ආපු නිසා මං දඩ බඩ ගාලා ඇඳෙන් බිමට පැන්නා... කාමරේට ආවේ කලින් නිතිනු අය්යට ට්‍රීට්මන්ට් කරපු ඩොක්ටර්.. එයාගේ මූනේ ලොකු හිනාවක් තිබ්බේ... මන් හිතන්නේ එයා දකින්න ඇති අපි ඉඳපු විදිහ..

"ආ ඉලන්දරියා.. දැන් නම් හොඳටම හොඳයි වගේ නේ.. මං ඒත් බැලුවා හිනා සද්දයක් ඇහෙද්දි ඊයේ කෙදිරිගගා හිටපු කෙනාට එකපාරටම මොකක්ද වුනේ කියලා.. බැලින්නම් වයිෆ් ඇවිත් නේ.."

ඩොක්ට හිනාවෙවී කියද්දි මන් බිම බලාගත්තේ ලැජ්ජාවට... නිතිනු අයියනම් පුදුමෙන් වගේ බලන් ඉන්නවා... එයා දන්නේ නෑනේ ඒ කාලේ වෙච්ච දේවල්...

"වයිෆ්.."???

"ඕහ්.. සොරි සොරි ගර්ල්ෆ්‍රෙන්ඩ්.. හැබැයි කොල්ලෝ ඉක්මනට වයිෆ් කරගත්තා නම් හරි.. අද කාලේ මේ වගේ කෙල්ලෝ හොයන්න නෑ... පුතා අසනීපෙන් හිටපු කාලේ මේ දරුවා හරියට දුක් වින්ද... පාන්දර 2 ට 3 ට මන්

ඔයාව චෙක් කරන්න එද්දිත් ලගට වෙලා අඩ අඩ ඔයාට කතා කරනවා.. "

නිතිනු අයියා ආදරනීය බැල්මකින් මං දිහා බලලා මගේ අත අල්ල ගත්තා...

"ඔය දරුවට බැරිනම් කියන්න.. මං අපේ පුතාට බන්දලා දෙන්නම්... "

ඩොක්ට විහිලුවට එහෙම කිව්වත් නිතිනු අයියගේ මූන දෙක වුනා.. මගේ අත තදට අල්ලගත්තේ හරියට ඇත්තටම මාව ඩොක්ටර් ගේ පුතාට බන්දයි වගේ...

"අපි ලබන මාසේ බදිනවා ඩොක්ටර්.. "

නිතිනු අයියා කියද්දි මං අතින් කට වහගත්තේ හිනා යයි කියලා බයට.. පුදුම ඉරිසියාවක් තියෙන්නේ මෙයාට නම්...

"ඔහ් එහෙමද... හොදයිනේ.. මටත් කතා කරන්න ඕනේ හොදේ... අනිත් එක එනමාසේ මැරිකරනවා නම් ඔහොම ඉදලා හරියන්නෑ.. හරියට බෙහෙත් ටික බීලා හොදට කාලා බීලා එහෙම ඉන්න ඕනේ.... නැත්තම් මේ වගේ ලස්සන වයිෆ් කෙනෙක් පරිස්සම් කරගන්නේ කොහොමද..."

ඩොක්ටර් එහෙම කියද්දි නිතිනු අයියා මං දිහා බැලුවේ ආඩම්බරෙන් වගේ...

මං ලස්සනයි කියපු එකට මටත් වඩා ආඩම්බර හිතිලා තියෙන්නේ එයාට..

ඩොක්ටර් තවත් උපදෙස් ගොඩක් දීලා කාමරෙන් එලියට යද්දීම මාව ඇදිලා ගියේ එයාගේ තුරුලට.. මගේ මූන පුරාම පිස්සුවෙන් වගේ කිස් කරා එයා.. එයාගේ මූනෙන් මට තේරුනා එයාට ඕනේ උනේ මගෙන් සමාව ඉල්ලන්න කියලා.. එදා මන් ඒ ද්වස් ගැන මතක් කරන්න එපා කියපු නිසා එයා කටින් ඒ ගැන කිව්වේ නැත්තේ.....

"මැනික.. මට ඔයාට කියන්න දෙයක් තියෙනවා... "

"මොකක්ද අයියේ.. "

"මට දැන් අම්ම නැතිවෙච්ච කාමරේට යන්න බය නෑ බබා.. ඉස්සරවගේ එව් දේවල් මතක් කරත් බය හිතෙන්නේ නෑ මට.. අහසි කිව්වා එදා ඇති වෙච්ච ශොක් එක නිසා මට ඒ ලෙඩේ හොද වෙලාලු.. තව දුරටත් මං මානසික ලෙඩෙක් නෙවෙයි ලු.. තව පොඩි ට්‍රිට්මන් එකක් තියනවලු ඒක කරාම සදහටම මට ෆෝබියා එකේ බලපෑමක් වෙන්න්වෙ නැති ලු.."

මං එයා දිහා විනාඩියක් බලන් හිටියේ ඇහුනේ ඇත්තක්ද කියලා විශ්වාස නැතුව.. ඇස් වල කදුලු බේරෙනවා සතුට වැඩි කමට.. දරාගන්න බැරි සතුටක් දැනුනේ මට.. එයාව බදගෙන මුලු මූනම ඉම්බා මන්... වෙලාවකට හිනා වෙවී

වෙලාවකට අඩ අඩ පිස්සියක් වගේ මං එයාව කිස් කරා...

"ඇත්තම නේද අයියේ.. ඒ කියන්නේ මගේ තිනූ ආය කිසිම දේකට බය නැද්ද... මගේ තිනූට දැන් හොදයි... මට මේ සතුටුයි රත්තරන්... දරාගන්න බෑ මට.."

තිතිනු අයියා මාව තුරුලේ හිරකර ගත්තේ දගලන්න බැරි විදිහට.. මගේ දෙතොල් ඒ දෙතොල් වලින් අල්ල ගෙන විනාඩි ගානක් කිස් කරා මාව... කදුලු නවත්තන්න වගේ... නලලෙනුත් හාදුවක් තියලා එයා මගේ ඇස් දිහා බැලුවේ කම්මුලක් එක අතකින් පිරිමදින ගමන්...

"ආදරෙයි මගේ මැතික... ඔයා නිසයි මේ හැමදෙයක්ම... ආදරෙයි පනටත් වඩා මං.. "

"මාත් ආදරෙයි මහ ගොඩක්..."

තිතිනු අයියව දවල් ඩිස්චාර්ජ් කරපු නිසා එයාගේ ගෙදරත් ගිහින් හවස් වෙලා මත් ගෙදර ආවේ... බයෙන් බයෙන් ගෙට ආවේ තාත්තිගෙන් ගුටි කන්න බලාගෙන.. ඒත් සාලේ තාත්ති හිටියේ නැති නිසා මත් කාමරේට දුවලා දොර වහගත්තා...

පැයකින් විතර ඩෝර් බෙල් එක වදිද්දි මන් සාලෙට ආවේ කවුද ආවේ බලන්න... මං එනකොටත් තාත්ති දෙර ඇරලා... දෙර ලග හිටියේ මං කීයටවත් බලා පොරොත්තු වෙච්ච කෙනෙක් නම් නෙවෙයි....

## අවසාන කොටස

අතින් කටින් බඩු එල්ලන් දෙර ලග හිටියේ වෙන කවුරුත් නෙවෙයි ගුනදස මාමා.. තාත්තිගෙන් මොනාදෝ අහන ගමන් මාව දැකලා යටහත් පහත් විදිහට හිනා වුනා..

"චූටි නෝනේ.. චූටි මහත්තයා මෙන්න මේ බඩු ටික දෙන්න කිව්වා... මන් මේ බැලුවේ මේ චූටි නෝනගේ ගේමද කියාලා.. මේ චූටි නෝනාගේ තාත්තා වෙන්ඩැ.."

මං ඔලුව උඩට පහලට කරේ කෙල පිඩක් ගිලෙද්දි.. තාත්ති මං දිහා බලන් හිටපු හැටි මට පෙනුනේ "අද උබව අල්ලගන්නම්" කියනවා වගේ... ගුනදස මාමා තාත්තගෙනුත් අවසර අරන් අතින් කටින් එල්ලන් ආපු බෑග් ටික ගේ ඇතුලෙන් තිබ්බා...

මං සැනසුම් සුසුමක් හෙලුවේ ගුනදස මාමා ගෙයින් එලියට යනකොට.. ඒත් කාර් එක ලගට ගිහින් ආපහු හැරෙන

හැටි මන් බලන් හිටියේ කටත් ඇරන්.. ඒත් ගුනදස මාමා බොහොම අමාරුවෙන් උස්සන් එන රෝස පාට ටෙඩි බෙයා දැක්කමනම් මට තාත්ති මෙතන ඉන්නවා කියලත් අමතක උනා...

"චූටි නෝනේ මේ සතාව කොහෙන්ද තියන්න ඕනේ.... "

ගුනදස මාමා අහද්දි මන් අත් දෙකම දික් කරේ ආසාවෙන්.. ගෙදර ටෙඩි බෙයාලා ගොඩක් හිටියත් මෙච්චර ලොකු එක්කෙනෙක් ඉදලාම නෑ මට.. මං විතර ලොකුයි..

"එහෙනම් චූටි නෝනේ මං යනවා... ගිහිල්ලා එන්නම් මහත්තයා.... "

"පොඩ්ඩක් ඉන්න... දේනි මේ කවුද... "

තාත්ති අහද්දි තමයි මන් පියවී සිහියට ආවේ...

"ති... ති..නු. අයියව පො.. ඩි..කා..ලේ ඉදලා බලාගෙන තියෙන්නෙ මේ මාමලා තාත්ති.. "

වචන ගලප ගලප මන් කිව්වේ වෙව්ලන ස්වරයෙන්.. තාත්තා ගුනදස මාමාව පැත්තකට එක්කන් ගිහින් මොනාදෝ කතා කරනවා.. ටෙඩියවත් අරන් මං ඒ දිහා බලාගෙන හිටියේ මූන ඇඹුල් කරන්.. තාත්ති ගුනදස මාමට මේ බඩු අරන් යන්න කියයිද දන්නෑ...

එහෙම උනොත් පවු නිතිනු අයියට දුක හිතෙයි... ඒටත් මේ ටෙඩියව නම් දෙන්න ලෝබයි මට..

ඒත් තාත්ති පියදස මාමව යවලා ආයෙත් ගේ ඇතුලට ආවේ මගේ දිහා අමුතු බැල්මක් දන ගමන්... මං එයා දෙර ලග ඉදන් කාමරේට යන දිහා බලන් හිටියේ ටෙඩියවත් බදගෙන අංශක් 360 ටම කැරකෙන ගමන්...

එයා මුකුත් කියපු නැති සතුටට මං උඩ පැන පැන කාමරේට ආවේ නිතිනු අය්යට කෝල් එකක් ගන්න.. කෝල් එක රින්ග් වෙද්දීම එයා අන්ස්වර් කරේ හරියට ෆෝන් එක අතේ තියන් හිටියා වගේ...

"චූටි මැනික... කෝල් එකක් ගන්නකම් බලන් හිටියේ මන්... ගුනදස මාමා ආවද... "

"හ්ම්ම්ම්.. ඇය් මේ තෑගි ගොඩක්... "

"ඒවා හොදයිද.. "

"මන් තාම බැලුවේ නෑ... ටෙඩියව විතරයි දැක්කේ... එයා නම් ශෝක්.. මට එයාගේ උඩ දෙය්යන්නත් පුලුවන් "

"ආ එහෙම උනොත් නම් මට ටෙඩියා ගැන ඉරිසියා හිතෙයි... අනික් ඒවත් හොදයිද බලන්නකො මැනික... "

"හරි පොඩ්ඩක් ඉන්න.. මං වීඩියෝ කෝල් එක ගමු.. අන්බොක්ස් වීඩියෝ එකක් බලන්නයි යන්නේ ඔයා.."

මන් වීඩියෝ ඔන් කරලා දුවන් ගින් බෑග්ස් ටික ගෙනාවා.. එයා හිනාවෙවී බලන් ඉන්නවා..

එක බෑග් එකක පාට පාට ගවුම් ගොඩාරියක් තිබ්බා... මං ඒ එකින් එක ඇගට තිය තිය පෙන්නද්දි එයා අතින් පෙන්නවා නියමයි කියලා.. තව බෑග් එකක තිබ්බා මං ගෙදරට අදින වර්ගයේ ශෝට් ටිකකුයි ස්කිනර් ටිකකුයි.. තව කොන්ඩ කටු කොන්ඩ බූල් ලිප්ස්ටික් ශැම්පු ෆේස්වොශ් ටවල් එකක් පවා තිබ්බා...

"ඇයි මේ මේවා... "

මං ඇහුවේ බෑග්ස් වල තියෙන ඒවා පෙන්න පෙන්න..

"ඊයේ මං කිව්වට මගේ කාඩ් එකෙන් ඇඳුම් ගන්නේ නෑ කියලා මං දැනන් හිටියා... ඉතින් අද උදේ එදා වගේ සකට්ටු යැව්වා... ගිහින් වීඩියෝ කෝල් එකක් ගන්න කිව්වා.... ඉතින් වටේ පිටේ තිබ්බ දේවලුත් එයාට ගන්න කිව්වා... අනික් එක මට බය හිතුනා ඔයා ඇඳුම් අනම් මනම් නැති නිසා ආපහු ගෙදර යයි කියලා.. "

මං එයා දිහා බලාගෙන හිටියේ හරි ආදරෙන්.. එයා ලගට ගිහින් තුරුලු වෙන්න ඇත්නම් කියලා හිතුනා මට..

"මැතික... ඔහොම බලන් ඉන්න එපා වස්තුවේ... ෆෝන් එකෙන් එලියට ඇදලා අරන් රතුවෙන කම් ඉබින්න හිතෙනවා... "

හැඟීම්බර ස්වරයෙන් එයා කියද්දි මන් අත් දෙකෙන් මූන වහගත්තා ලැජ්ජාවට... එයා හිතාවෙනවා මං අහන්.. ඇඟිල්ලක් අතරින් එයා දිහා බලද්දිම මං දැක්කේ මහනර්ග වස්තුවක් වගේ දෙයක්..

හා කන් දෙකක් තියෙන බූල් රෙද්දෙන් හදපු හෙයා බෑන්ඩ් එකක්... මන් කටත් ඇරන් ඒක අතට අරන් ඔලුවට දාගත්තා... එයා දිහා බලන් ඔලුව දෙපැත්තට වන වන හිටියා.. එතකොට ඒකේ කන් දෙපැත්තට වැනෙනවා..

"මගේ හා පැංචි... හරිම හුරතල් බබා ඔයා ඒකට... ඕක එල්ලලා තියනවා දකිද්දිම මට හිතුනා ලස්සනට තියෙයි කියලා.. දැන්නම් මට තාත්තගේ ලග වැද වැටිලා හරි උස්සන් එන්න හිතෙනවා..."

මං තවත් එක එක විකාර කරද්දි තොල් උල් කර කර මට ෆ්ලයින් කිස් එවනවා.... එක පාරටම අම්මා කාමරේට ආපු නිසා මං ෆෝන් එක උඩින් ඇදුමක් දලා අම්මා දිහා බැලුවේ බය වෙලා වගේ...

"තාත්ති කිව්වේ අර දරුවා මොනාද්දෝ තෑගි වගයක් එව්වා කියලා.. මේ ඒවද... ඔයා මේවා ඉල්ලුවද දේනි.. බලන්නකෝ අර වලගට විතරක්ම ලොකු ගානක් යන්න ඇති.... "

අම්මා කියන්නේ මං ඇද පුරාම අතුරගෙන ඉන්න දේවල් දිහා බලන ගමන්...

"අනේ අම්මා.. ඔයා දන්නවනේ මං එහෙම කරදර කරන්නෑ කියලා.. මන් දන්නෑ එයා එවනකම්ම.."

"හරි හරි.. මං නිකම් කිව්වේ... අන්න තාත්ති කතා කරනවා.. ඔතන ඇඳුම් වලට අදිපති දේවතාවිය වගේ ඉන්නේ නැතුව ගිහින් බලන්න... "

අම්මා කිව්වා කතාවට මගේ හිතේ තිබ්බ සතුට එහෙම් පිටින්ම නැතිවෙලා බයෙන් පිරුනා..

"ඇයි අම්මා.. තාත්තා මුකුත් කිව්වද... බනින්නද දන්නෑ..."

"ඒක නම් දන්නේ නෑ දේනි.... එන්නකෝ ගිහින් බලමු.."

බයේ ගැහි ගැහී කාමරෙන් එලියට යද්දී තාත්තා සාලෙ සෙට්යට වෙලා වාඩි වෙලා හිටියේ... මං ලගට යද්දී එයා ඇහෙන් පෙන්නුවා පුටුව.. මං එක අතකින් ඇගිල්ලක් හූර හූර බිම තාත්ති දිහා බැලුවේ..

එයාගේ ඇස් තිබ්බේ මගේ ඔලුවේ.. එතකොට තමයි මට මතක් උනේ හා කන් දෙක.. දඩ බඩ ගාලා ඒක ගලවලා මං ඉදන් ඉන්න පුටුවේ පිටිපස්සෙන් දැම්මා...

"දැන් මොනාද අර එවලා තිබ්බේ... "

ඇහුනේ තාත්තිගේ රලු කටහඩ.. කවදාවත් නැතුව දැන් මං ඒ හඩටත් බයයි..

"ඇ.ඇ..දු..ම්. වගයක් තා.. ත්..ති.."

"ඇයි අපි ඇඳුම් අරන් දෙන්නෑ කියලා හිතලද.."

"අනේ එහෙම නෑ තාත්ති.. මගේ ඇඳුම් මෙහෙ නැති නිසා.."

"ඇඳුම් නැති නිසා ඉක්මනට ගමේ යයි කියලා බය වෙන්න ඇති.... "

තාත්ති අමුතු ස්වරයෙන් කියද්දි මං ඇස් ලොකු කරලා එයා දිහා බැලුවා... එයා කොහොමද හරියටම නිතිනු අයියා හිතපු දේ කිව්වේ...

"හෙට රෑ අපි ගමේ යනවා... "

"අනේ තාත්ති.."

"ඒ ළමයට සනීපයි නම් යන්න කලින් ඇවිත් හම්බවෙන්න කියන්න.. කසාද බදින්න කලින් ගෑනු ළමයි කොල්ලෝ එක්ක එහෙ මෙහෙ යන එක හොඳ නෑ... මේවා කතා කරලා පිලිවලක් කරන්න ඕනෙ.."

තාත්තිගේ වචන ඇහුනේ මට හීනෙන් වගේ... දෙවියනේ... ඒ නොකියා කිව්වේ එයාට කැමතියි කියලා නේද... මං අම්මා දෙහත් බැලුවේ මේ දේ විශ්වාස කරන්න බැරි නිසා.. අම්මාත් ඔලුව හෙල්ලුවේ ඒක ඇත්තක් කියන්න වගේ... තත්පරයක් යන්නත් කලින් මං තාත්තිට තුරුලු වෙලා හයියෙන් ඇඩුවා...

"ඇත්තම නේද තාත්ති.. ඔයා නිහිතු අයියට කැමතියි නේද... එයා ගොඩක් සතුටුවෙයි මේක ඇහුවාම... මගේ තාත්ති.. මං ඔයාට ආදරෙයි.. "

මන් ඉකිගගහා අඩද්දි තාත්ති මාව දෙපැත්තට පද්දනවා.. චූටි කාලෙ එයා මං අඩද්දි නලවපු හැටි මතක් උනා මට..

"මගේ චූටි කෙල්ල හැමදම සතුටින් ඉන්න ඕනේ... ගැහුවේ බැන්නේ ඔයා ගැන බයවෙච්ච නිසා දෝනි... ලග තියාගෙනම හදපු දූවව පිට ගෙදරකට දෙන්න කලින් දෙපාරක් නෙවෙයි දහ සැරේකටත් වඩා හිතනවා තාත්තලා.. ඒකයි එහෙම බැන්නේ..

නැතුව තරහකින් නෙවෙයි.... "

තාත්ති එයාගේ රලු අතින් මගේ කම්මුල අතගගා කියද්දි මන් කඳුලු අතරින් හිනාවුනා... කවදාවත් නැතුව එයාගේ ඇස් වල කඳුලු තිබ්බා... ඒත් ඒවා පිටට එන්නේ නැතිවෙන්න හංගන්න නම් එයා දක්ශ වුනා.. එයා මගේ කම්මුල අතගාන්නේ එදා ගහපු නිසා.. එයාට දුක ඇති.... මං ඉස්සිලා එයාගේ කම්මුලක් ඉම්බා.. පුංචි තරහක්වත් එයා ගැන තිබ්බෙ නෑ මගේ හිතේ.. පුංචි කාලේ ඉදන් ඇහේ තියන් හදපු එයාට අයිතියක් තියෙනවා කාටත් වඩා ගහන්න බනින්න..

ටික වෙලාවක් තාත්තිගේ තුරුලටම වෙලා හිටියේ එයත් එක්ක කතා නොකර හිටපු දවස් දෙක කල්පයක් වගේ දැනිච්ච නිසා.. ටික වෙලාවක් ඉද්දි යමක් මතක් වෙච්ච නිසා මන් තාත්තිගේ මූන බැලුවෙ..

"තාත්ති.. අයියා.. එයා කැමතියි ද නිතිනු අයියට.."

වෙව්ලන කට හඩින් මං ඇහුවේ අය්යගේ කැමැත්තත් මට තාත්තිගේ කැමැත්ත තරම්ම වටින නිසා..

"ආ දැන්ද මැඩම්ට මාව මතක් උනේ.... මං හිතුවේ අයියෙක් ඉන්නවා කියලා අමතකයි කියලා.. "

අයියා අහක බලාගෙන කියවන්නේ... ඉරිසියාවේ පුපුර පුපුර ඉන්න ඇත්තේ මන් තාත්ති එක්ක ඉන්නවට.... මං තාත්තිගෙන් මිදිලා අයියා ගාවට ඇවිත් එයාව බදාගත්තා.. ඒත් අත් දෙකත් සාක්කුවේ දාන් ඔහේ අහක බලන් ඉන්නවා...

"අයියේ.. කැමතියි කියන්නකෝ.... මගේ හොද අයියනේ.."

"අනේ මේ යනවා යන්න බොරුවට බටර් ගාන්නේ නැතුව.."

"අනේ කැමති වෙන්නකෝ.. "

"මට බෑ... මට ඔකට හොම්බට එකක් දෙන්න හිතෙනවා."

"එහෙනම් අපි නිතිනු අයියට හොම්බට එකක් දීලා ඉවර වෙලා කැමති වෙමු.."

මං එහෙම කියද්දි අයියා බොහොම අමාරුවෙන් හිනාව හිර කරන් ඉන්නවා... ලද අවස්ථාවෙන් ප්‍රයෝජන අරන් මං අයියගේ බඩ දෙපැත්තේ කිචි කැච්වේ එයාට එතන කිචි කියලා දන්න නිසා.. ටිකක් එහාට මෙහාට ඇබරි ඇබරි ඉදලා අන්තිමේදි හිනාව එලියට පැන්නා...

"ඔක නවත්තනවා සුදූ... "

"බෑ බෑ කැමත්ත දෙන්න.."

"ආ හරි හරි දෙන්නම්.... ඕක නවත්තනවකෝ.."

"ඇත්තමද.."

"ඔව් හැබැයි මටත් උදව්වක් ඕනේ.... "

"මොකක්ද.."

"මේ.. මේ.. අහසිව යාලු කරලා ඕනේ.... දැන් එයා මාත් එක්ක කතා කරන්නේ නෑ... "

"ආ ඕක මොකක්ද මං යාලු කරලා දෙන්නම්.... "

අයියා මාව බදාගෙන ඉන්නකොට අම්මා අපි දෙන්නා දිහා බලාගෙන ඉන්නවා... එයාගේ ඇස් වලත් කඳුලු පිරිලා..

"පුතා කාර් එකට තෙල් ගහන්න යන්න ඕනේ නේද... දැන්ම යමුද... "

තාත්තා ඉදගෙන හිටපු තැනින් නැගිට්ට ගමන් කියන්නේ... මං දන්නවා එයා හදන්නේ මේ හැගීම්බර අවස්ථාවෙන් පැනලා යන්න... එයාගෙ හැටි එහෙමයි...

තාත්තියි අයියයි එළියට යන දිහා බලන් හිටියේ මං අම්මව බදාගෙන..

"ඇය් අම්මා තාත්ති එක පාරටම නිතිනු අයියට කැමැති වුනේ... "

"එකපාරටම කැමති වුනා කියලා කිව්වේ කවුද දේනි.... ගොඩක් දේවල් හොයලා බැලලා තාත්තා කැමති වුනේ... "

"ඒ කියන්නේ..."

"එදා අපි අපු දවසේ ඉදන් තාත්ති ගොඩක් හොයලා තියනවා ඒ පුතා ගැන... මත් දන්නෙත් අද... ඔයා හිතනවද අද දවසෙම ඔයා කොල්ලෙක් එක්ක තනියම තියලා තාත්ති නිකම් ඉදියි කියලා.. නෑ අද දවසෙම ඔයාලගේ අහල පහලම තාත්ති ඉදලා තියෙනවා... ගෙදර ඇවිත් කිව්වා ඒ දරුවා තමයි දේනිට ගැලපෙනම කෙනා කියලා... මං ඇහුවා කොහොමද දැනගත්තේ කියලා.. තාත්ති කිව්වා "මමත් පිරිමියෙක් නේ.. පිරිමියෙක් ගැහැනියෙක් දිහා බලන් ඉන්න විදිහෙන් කියන්න පුලුවන් ඒ මනුස්සයාගේ හිතේ ඒ ගැහැනිය ඉන්නේ මොනවගේ තැනකද ඉන්නේ කියලා. ඒ ලමයගේ ඇස් වලින් මං ඒක දැක්කා" කියලා.... "

අම්මි එහෙම කියද්දි මට මැවිලා පෙනුනා නිතිනු අයියගෙ ඇස් දෙක.. ඔව් ඒ කතාව ඇත්ත..

නිතිනු අයියගේ ඇස් දෙක දැක්ක ඕනේ කෙනෙක්ට කියන්න පුලුවන් ඒ හිතේ මං ගැන තියෙන ආදරේ තරම...

## වසර 06 කට පසු

"අම්මි.. තාත්ති.. එලෝ.."

"තාත්ති අපිට තොකෝ ගේනො.."

වචන ගලප ගලප හුරතලෙන් කෑ ගහන්නේ වෙන කවුරුත් නෙවෙයි... නිතිනු අයියගෙයි මගෙයි පුංචි දඟකාරියි දඟකාරයයි.. ඔව් මේ වෙනකොට අපි දෙන්නා මේ බට්ටෝ දෙන්නගෙ අම්මයි තාත්තයි වෙලා අවුරුදු 03 ක්...

"නිරාධ්‍ය සේහාන්"
"නිරාධ්‍යා සේහානි"

අපි දෙන්නගේ ආදරේ සංකේත දෙක.. මට ඕනේ උනේ නිතිනු අයියා වගේ කොල්ලෙක් නිසාත් එයාට ඕනේ උනේ මං වගේ කෙල්ලෙක් නිසාත් ද කොහෙද්ද එක පාර දෙන්නෙක්ම අපිට ලැබුනා... ට්වින්ස්ලා උනත් ඒ දෙන්නා එක වගේ නෑ... හැමෝම කිව්වේ දූ මත් වගේ පුතා

නිතිනු අයියා වගේ කියලා.. හැබැයි දෙන්නටම මං ආසම නිතිනු අයියගේ ඩිම්පල්ස් නම් ඇවිත් තිබ්බා... අපි මැරි කරලා අවුරුදු දෙකකින් ඒ දෙන්නා අපිව හොයන් ආවේ හරියටම නිතිනු බර්ත් ඩේ එක දවසේ.... එදා බබාලටත් වඩා හය්යෙන් ඇඩුවා එයා මාව බදන්..

අයියයි අහසි අක්කයි මැරි කරලා එයාලටත් අවුරුදු 4 ක පුංචි සුරංගනාවියක් ඉන්නවා... එයා දැන් ලොකු බිස්නස්මන් කෙනෙක්.. අම්මයි තාත්තියි නම් තාමත් ගමේ ඉන්නේ... කොච්චර කිව්වත් මෙහෙ එන්න එයාලා කැමති නෑ... ගම දාලා එන්න බැරිලු.. අපි අයියලත් එක්ක පුලුවන් හැමවෙලේම එහේ යනවා...

ගොඩක් කල් කෝමා වෙලා හිටිය දිනේශ් සිහිය ආවට පස්සේ ආපහු හිරේ ගියා... මේ පාර නිතිනු අයියගේ සාක්ෂිත් තිබ්බ නිසා අම්මව මරපු එකටයි අපිව මරන්න හදපු එකටයි එයාට ජීවිත කාලෙටම හිර දඬුවම් නියම උනේ.... දිනේශ්ගේ පුතාට මාව දූශනයට තැත් කිරීමේ වරදට අවුරුදු 7 ක හිර දඬුවමක් නියම උනා...

දැන් නිතිනු අයියා ලෝකෙම දන්න ආර්ටිස් කෙනෙක්.. මං කෝස් එක කරලා ඉවරවෙලා නිතිනු අයියගේ කම්පැනි එකේම ජොබ් එකකුත් කරා... ඒ සල්ලි වලින් මං එයාගේ පේන්ටින් වලින් එක්සිබිශන් එකක් තිබ්බා... ඒ නිසා එයා ගොඩක් ප්‍රසිද්ද උනේ.... එයාගේ චිත්‍ර දැන් මිලියන ගනන් වලට විකිනෙනවා..

නිතිනු අයියට හැමදේම කරන්න අමාරු නිසා ඒ වැඩ බලන්නේ මං..

ලොකු කල්පනාවක හිටපු මන් පියවී සිහියට ආවේ නිතිනු අයියගේ කටහඩට..

"කෝ එන්න මගේ පැටවු දෙන්නා තාත්තිගේ ලගට.. "

ගේ ඇතුලට ආපු ගමන් නිතිනු අයියා දනක් බිම තියා ගත්තේ බබාලා දෙන්නව ලගට ගන්න ගමන්.. පැටවු දෙන්නා චූටි කකුල් වලින් තාත්ති ගාවට දුවන් යන හැටි හරිම හුරතල්.. අත් දෙකෙන්ම ඒ දෙන්නව වඩාගෙන එයා සෝෆා එකෙන් වාඩි වුනා..

"තාත්තිට මහන්සි ඇති බබාලා.. වොශ් එකක් දාගෙන එනකම් ඉන්නකෝ... "

මං කිව්වේ ආසාවෙන් ඒ තුන් දෙනා දිහා බලාගෙන ඉස්සරහින් වාඩි වෙන ගමන්...

"තාත්තිත මහන්තියි ද තාත්තියෝ.. තේහා බදු ඔළූ අත ගන්න්ත.."

ජේනි පැටියා කට උල් කරන් අහද්දි නිතිනු අයියා හිනාවෙවී කම්මුලක් ඉම්බා..

"තාත්තිට මහන්සි නෑ මැනික... තාත්තිගේ බබාලා දෙන්නා ලගට ආවම මහන්සියෙන් බාගයක් නැති වෙනොනේ.."

නිතිනු අයියත් කට උල් කර කර කියන්නේ පුතාගේ කම්මුලටත් හාදුවක් තියන ගමන්...

"තාත්ති.. අද අම්මි අපිට දෙදම් දුන්නොනේ.. මත බාදයය්... සේහා බබාට බාදයය් දුල්ලේ.. ඉතින් බාද දෙකක් තීනෝ නෝ.. තාත්තිගේ මහන්තියේ ඉතිලි බාදේ තෝ.."

පුංචි පුතා පන්ඩිතයෙක් වගේ කියවද්දි මං නිතිනු අයියගේ මූන බැලුවේ ඇසුත් ලොකු කරන්.. එයත් පුදුමෙන් මන් දිහා බලන් ඉන්නවා... බාග දෙකක් එකය් කියන්නත් මගේ පුංචි කොල්ලා දන්නවා.. එක අතකට පුදුම වෙන්න දෙයක් නෑ... එයාලා එයාලගේ තාත්ති වගේම දක්ශයි..

"මහන්සියෙන් ඉතුරු බාගේ යන්නේ අම්මි බබා ලගට ආවමනේ මැනික... "

නිතිනු අයියා පුතුගේ නහය අල්ල අල්ල කියද්දි මන් බිම බලන් හිතා වුනා.. ඔව් මන් දැන් අම්මි බබා වෙලා.. නිතිනු අයියා මට බබා කියන නිසා දූවයි පුතයිත් මට බබා කියන්න පටන් ගත්ත නිසා මං අවසානෙට අම්මි බබා උනා... සේහ බබයි, සේහා බබයි, අම්මි බබයි නිතිනු අයියට දැන් බබාලා තුන් දෙනයි..

තාමත් ඉස්සර වගේම බබෙක්ට වගේ එයා මට සලකන්නේ....

"අම්මි බදු.. එන්නකෝ තාත්ති ගාවට.. එයාගේ මහන්ති බාදේ නැති වෙනෝලු ඔවා ආවම... "

දේනි පැටියා කෑ ගහද්දී නිතිනු අයියත් ඇස් වලින් කිව්වේ ලගට එන්න කියලා.... ඒත් කෝ ඉඩක්.. කලින් මට විතරක් අයිති වෙලා තිබ්බ පපුව දැන් බබාලා දෙන්න අයිති කරන්.. මන් දේනිගේ කම්මුලත් මිරිකලා නිතිනු අය්යා ඉන්න පුටුවෙන්ම වාඩි වුනා.. නිතිනු අයියා මගේ අත අල්ලන් මහපට ඇගිල්ලෙන් අත අතගානවා...

"තාත්ති.. දැන් ඒ මහන්ති බාදේත් ඉවලයි නේ.. අපිත කතාවක් කීන්නතෝ.. අම්මි දල්ල ඔක්කොම කතා කීලා ඉවරයි... "

ආයෙත් සැරයක් සේහා බබා කෑ ගහන්නේ නිතිනු අයියගේ රැවුල් අතගාන ගමන්... ඇත්ත තමයි ඒ දෙන්නට කොච්චර කතා කියලා දුන්නත් මදි.. මං දන්න කතා ඔක්කොම කියලා ඉවරයි මේ වෙනකොට...

"ඕ තාත්ති.. කුමාලයෙක් ඉල්ල කතාවක් කීන්නකෝ.."

"බෑ බෑ මට තුලංගනාවියක් ඉන්න කතාවක් කීන්න තාත්ති.."

අයියයි නංගියි ඒකට රන්ඩු වෙනවා ඒ පාර..

"හලි හලි තාත්ති කුමාරයෙකුයි සුරංගනාවියකුයි ඉන්න කතාවක් කියන්නකෝ.... "

නිතිනු අයියා එහෙම කියද්දිම බබාලා දෙන්නා හරි බරි ගැහිලා කකුල් දෙකෙන් වාඩි වුනා කතාව අහන්න.. මමත් එයාගේ පැත්ත හැරිලා සෙටියේ ඇන්දෙන් ඔලුව තියාගත්තේ මෙයා කියන්න හදන කතාව අහ ගන්න.. මොකද එයා කතා දන්නවා කියලා මන් දැනන් හිටියේ නෑ...

"ඔන්න එකමත් එක කාලෙක අහසේ තිබ්බ ලස්සන මාලිගාවක චූටි කුමාරයෙක් එයාගේ අම්මිත් එක්ක හිටියලු... "

"අපේ අම්මි වගේ සස්සන අම්මියෙක්ද තාත්ති ඒ කුමාලයාට හිතියේ.."

පුතා ඇස් ලොකු කර කර අහද්දි නිතිනු අයියා දිලිසෙන ඇස් වලින් බැලුවේ මන් දිහා... මගේ ඇස් දිහාම බල බල එයා ගොඩක් වෙලා ඉන්නැති..

"තාත්ති... කීන්නකෝ අපි අම්මි වගේ සස්සනයි න.."

ද්‍රේනි පැටියගේ කටහඬට තමයි එයා පියවී සිහියට ආවේ...

"ඔව්නේ.. ඒ කුමාරයටත් හිටියලු අපේ අම්මි වගේම ලස්සන අම්මි කෙනෙක්.. ඉතින් ඒ ලස්සන අම්මි ඒ කුමාරයගේ මාලිගාව තියන අහසම පාට පාටින් පාට කරලා ලස්සන කරලලු තිබ්බේ... ඒත් එක දවසක් නපුරු මායාකාරයෙක් ඇවිත් ඒ පුංචි කුමාරයට තුවාල කරන්න හැදුවලු.. ඉතින් එතකොට එයාගේ අම්මි ඒ කුමාරයව බේරගන්න ගිහින් තුවාල වෙලා දිව්‍යලෝකෙ ගියාලු.. "

කතාව කියන අතරේ සැරෙන් සැරේ නිතිනු අයියා කතා කරේ බිඳුනු වචන වලින්.. ඒ නිසාම මට තේරුනා මේ එයා කියන්නේ එයාගේ කතාව කියලා.... මං එයාගේ අත අල්ලගත්තේ එයාට හයියක් වෙන්න හිතන්.. එයා මත් දිහා බලලා ලාවට හිනා වුනා.. බබාලා දෙන්නනම් ඇස් ලොකු කරන් කතාව අහන් ඉන්නවා...

"ඉතින් ඊට පස්සේ අර ලොකු මාලිගාවේ අර පුංචි කුමාරයා තනි වුනාලු.. එයාගේ අහස පාට කරන්න අම්මි නැති නිසා අහසත් කළු පාට උනාලු.... ඒ කුමාරයා අවුරුදු ගානක් අඩ අඩා හිටියලු... "

"පව් ඒ කුමාලයා.. සේහා බද්‍නනම් අම්මි නැතුව ඉන්න බා.. අම්මි නැතුව දෙය්යගත්තේ කෝමද එයා.. "

"ඒහෙම තමයි බබා.. ගොඩක් හොද අයව ඉක්මනට දෙවියෝ එයා ලගට ගන්නවා.. "

නිතිනු අය්යා සුසුමක් හෙලලා කියද්දි පුතා මහ හය්යෙන් අඩන්න ගත්තේ අපි පුදුමෙන් බලං ඉද්දි..

"ඇයි පැටියෝ මේ අඩන්නේ.. මොකද උනේ ඔයාට.. "

පුතාව අතට ගන්න ගමන් අහද්දි එයා මාව බදගෙන තවත් හය්යෙන් අඩන්න ගත්තා...

"මදෙ අම්මිත් හොදයි නේ.. එතෝට අම්මිවත් දෙය්යෝ අලන් තනවද.. තේහා බදුතය් මතය් අම්මි නැතු ඉන්න බා.."

චූටි ඇස් වල කදුලු පුරවන් අහන්නේ.. එයා ඒක කිව්ව ගමන් ද්‍යේනිත් මහ හය්යෙන් අඩන්න ගත්තා...

"අනේ නෑ පැටියෝ... අම්මි ඔයාලව දාලා යන්නේ නෑ... නපුරු මායාකාරයෙක් ආපු නිසානේ ඒ කුමාරයගේ අම්මා දිව්‍ය ලෝකේ ගියේ... අපේ තාත්ති ඉන්න නිසා නපුරු මායාකාරයෝ එන්නේ නෑ... තාත්තිට එයාලා බයයි.. තාත්ති හීරෝ නේ.."

"ඇත්තමද.."

"ඔච්චේ බලන්නකෝ තාත්තිගේ ශක්තිය.."

මං නිතිනු අයියගේ අතක් නවලා පිම්බෙන මසල්ස් පෙන්නකොට පොඩ්ඩො දෙන්නා ඇස් ලොකු කරන් බලන් ඉන්නවා... එහෙම්මම ආයෙත් නිතිනු අය්යගේ කකුල් දෙක උඩ නැගලා දෙන්නත් එක්ක නිතිනු අය්යගේ අත අතට ඇත ඇත විකාර කරනවා.. දැන් අඩපුවත් මතක නෑ...

"තාත්ති කීන්නකෝ කතාව.."

ඇති වෙනකම් අතේ හැඩ බලලා ද්‍යේනි කියන්නේ ආයෙත් කකුලක් උඩින් වාඩි වෙන ගමන්...

"හ්ම්ම් එහෙනම් අහගන්නකෝ..
ඒ කුමාරයා ටිකක් ලොකු වෙනකොට එයාගේ අහසට ආවලු සුරංගනාවියක්.. ඒත් ඒ කුමාරයා දැනන් හිටියේ නෑලු සුරංගනාවියක් විදිහට වෙස් වලාගෙන ඉන්නේ නපුරු මායාකාරියක් කියලා.... කුමාරයා එයත් එක්ක ටික කාලයක් සතුටින් හිටියලු... කුමාරයා හිතුවේ ඒ සුරංගනාවි අර අහස ආයෙත් පාට කරයි කියලලු... ඒත් ඒ කුමාරයා පස්සේ දැනගත්තලු ඒ සුරංගනාවි ආවේ අර ලස්සන මාලිගාව අයිති කරගන්න කියලා.. ඒ සුරංගනාවියක් වගේ වෙස් වලාගත්ත මායාකාරිත් යන්න ගියාට පස්සේ කුමාරයා කලින් වගේ අඩ අඩා දුකින් හිටියලු...

දවසක් ආයෙත් ලස්සන සුරංගනාවියක් ඒ කුමාරයගේ අහසට ආවලු.. එයා අපෙ අම්මි වගේ ගොඩක් ලස්සනයි ලු.. එ වගේම හරිම දගයි ලු.. ඒත් කුමාරයා හිතුවේ හැම සුරංගනාවියක්ම වෙස්වලාගත්ත මායාකාරියෝ කියලලු... ඒ නිසා කුමාරයා ඒ සුරංගනාවිට නපුරුකම් කරාලු.. "

"ඉතිම් ඒ ඇත්තතම තුලංගනාවියක් ද තාත්ති..."

"ඔව් සේහා බබා.. ඒ ඇවිත් තිබ්බෙ ඇත්තම සුරංගනාවියක් ලු.. නැත්තම් නපුරු අය අපෙ අම්මි වගේ ලස්සන නෑනේ... ඉතින් ඒ කුමාරයා නපුරුකම් කරද්දිත් ඒ සුරංගනාවි හොරෙන් හොරෙන් කුමාරයගේ අහස පාට කරන්න ගත්තලු... ඉතින් කුමාරයත් දන්නෙම නැතුව අර සුරංගනාවිට ආදරේ කරාලු.. ඊට පස්සේ ඒ කුමාරයා ඒ සුරංගනාවිව විවාහ කරන් අර මාලිගාවට එක්කන් ආවලු.. ඒ වෙනකොටත් සුරංගනාවි කුමාරයගේ අහස තිබ්බා වගේම ලස්සනට පාට කරලා තිබ්බලු.. ඉතින් ටික කාලයක් යද්දි අර සුරංගනාවි කුමාරයාට තව පුංචි කුමාරයෙකුයි පුංචි කුමාරිකාවකුයි ගෙනත් දුන්නලු.. හරියට අපෙ සේහ බබයි සේහා බබයි වගේ... ඊට පස්සේ අර කුමාරයගේ අහස තවත් ලස්සන වුනාලු.. ඉතින් ආයේ කවදවත් ඒ කුමාරයා ඇඩුව්වෙ නෑලු... හතර දෙනාම සතුටින් ජීවත් වුනාලු.. "

තිතිනු අය්යා මන් දිහා බලගෙනම කතාව ඉවර කරද්දි පොඩ්ඩෝ දෙන්නා හිනාවෙවී අත්පුඩි ගහනවා...

ඒත් එක්කම චූටි චුහ් ගාන සද්දෙට ඒදෙන්නා මූනෙන් මූන බලාගෙන ඉස්සරහට දිව්වා... බෙහෙත් විදින්න එක්කන් ගිහින් චූටි ගුනදාස මාමා දැන් එක්කන් එන්නැත්තේ.. පොඩ්ඩෝ දෙන්නට චූටි දැක්කම අපිවත් මතක නෑ... චූටිටත් එහෙම තමයි සිහිය නැතුව තුන් දෙනා සෙල්ලම් කරන්නේ...

පොඩ්ඩෝ දෙන්නා චූටි දිහාට දුවන දිහා මන් බලන් හිටියේ නිතිනු අය්යට තුරුලු වෙන ගමන්... එයත් මගේ බද වටේ අතක් දාලා මාව තුරුලු කරන් නලලෙන් හාදුවක් තිබ්බා...

"ආදරෙයි මැනික... මගේ ජීවිතේ මෙච්චර ලස්සන කරාට ඔයාට පිං.."

මං එයාගේ පපුවෙන් හාදුවක් තියලා ඒ පපුවටම ගුලි වුනා.. පොඩ්ඩෝ දෙන්නා ආවට පස්සේ මේ පපුව අස්සේ ගුලිවෙන්න තියෙන කාලේ බොහොම අඩුයි.. ඒ නිසා මන් ඉස්සරටත් වඩා ලෝබයි මේ උනුහුමට..

නිතිනු අයියා අත් දෙකෙන්ම මාව තුරුලු කරන් මාව දෙපැත්තට පද්දනවා.. සැරෙන් සැරේ හිස් මුදුනෙන් හාදු තියනවා... අපේ ආදරේ හරියට රත්තරන් වගේ.. පරන වෙන්න පරන වෙන්න වටිනාකම වැඩි වෙනවා මිසක් අඩු වෙන්නේ නෑ... සැරෙන් සැරේ අපේ ආදරේ ඔප දාලා අපි දෙන්නා තිබුනටත් වඩා ඒ ආදරේ ලස්සන කරනවා..

ඉතින් මේ මගේ ආදරේ.. එයා කියනවා වගේ මං එයාගේ හඳ නම්.. මාව දරාගෙන ඉන්න අහස එයා.. ඉතින් මට ඕනේ ඒ අහසට හැමදාම එළිය දෙන්න.. හැමදාම එයාගේ හඳ වෙන්න.. මේ ආත්මේ විතරක් නෙවෙයි හැම ආත්මෙම මට ඕනේ එයා මගේ අහස වෙනවා දකින්න

සමාප්තයි.....